# මුහුන් වලට සමාන වූ

# ධර්ම ප්‍රචාරණය

## හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය

මෙම පාඨමාලාව **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් සකස් කරන ලද පාඨමාලාවක් වේ. මෙමගින් ඇදහිලිවතුන් සාර්ථක ආත්මික අස්වැන්නක් ලබා ගැනීම සඳහා පිළියෙල කිරීමට සකස් කරන ලද්දකි.

මෙම පුහුණුවේ තේමාව නම්, යේසුස්වහන්සේ ඉගැන්වූ දේ ඉගැන්වීමයි. මෙම ඉගැන්වීම් මාළු අල්ලන්නන්, සුංගම් අයකරන්නන් යනාදී මනුෂ්‍යයන් ගෙන ශුභාරංචියේ බලය පෙන්නුම් කිරීම තුළින් ඔවුන් සිටියාවූ ලෝකය දිනාගැනීමට හැකි වූ කිතුබැතියන් ලෙසට වෙනස් කළේය.

මෙම අත්පොත මොඩියුල කීපයකින් සමන්විත විෂය මාලාවේ එක් පාඨමාලාවකි. ඇදහිලිවතුන් දර්ශනයක් තුළින් ක්‍රියාකාරී වීමෙන්, වර්ධනය වීමෙන්, සැලසුම් කිරීමෙන් හා සංවිධානය වීමෙන් එවැන්ජලිස්ත කිරීමේ ඉලක්කය කරා එළඹීම මෙහි අරමුණ වේ.

# පටුන


මෙම අත්පොත භාවිත කරන ආකාරය . . . . . . . 4

කණ්ඩායම් වැඩ සඳහා යෝජනා . . . . . . . 5

හැඳින්වීම . . . . . . . . . . 6

පාඨමාලාවේ අරමුණු . . . . . . . . . 8

**පළමු කොටස: යන්න**

පළමු කොටස සඳහා හැඳින්වීම . . . . . . . 9

1. මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය . . . . . . 10
2. ආඥාව . . . . . . . . . 20
3. පණිවුඩය . . . . . . . . . 29
4. පණිවුඩකරුවන් . . . . . . . . 38
5. පණිවුඩය සන්නිවේදනය කිරීම . . . . . . 47
6. පණිවුඩය ලබාගන්නා අය . . . . . . . 53
7. ක්‍රමවේද : නව ගිවිසුමේ ප්‍රතිපත්ති . . . . . . 63
8. ක්‍රමවේද : නව ගිවිසුමේ සඳහන් උපමා . . . . . 72
9. ක්‍රමවේද : පෞද්ගලික ධර්ම ප්‍රචාරණය . . . . . 79
10. ක්‍රමවේද : අපහසුතාවයන්ට මුහුණ දීම . . . . . 90
11. ක්‍රමවේද : සන්තෘජන ධර්ම ප්‍රචාරණය . . . . . 97
12. සාමූහික ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද . . . . . . 106
13. තිරණද? ගෝලයන්ද? . . . . . . . . 123
14. ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් කිරීම . . . . . 134
15. ධර්ම ප්‍රචාරණය උදෙසා ජාලයක් ලෙස කටයුතු කිරීම . . . . 141

දෙවන කොටස සඳහා හැඳින්වීම . . . . . . . 150

16. සුව කිරීම හා මිදීම පිළිබඳ හැඳින්වීමක් . . . . . 151
17. සුව කිරීමට බලපෑම් ඇතිකරන විචලයයන් . . . . . 175
18. ඔබ යන විට, සුව කරන්න . . . . . . . 195

තුන්වන කොටස සඳහා හැඳින්වීම . . . . . . 210

19. ඔබ යන කල, නිදහස් කරන්න . . . . . 211

20. සභා පිහිටු වීම - ආදර්ශය . . . . . . 243

21. සභා පිහිටුවීම - ක්‍රම . . . . . . . 249

22. සභා පිහිටුවීම : ගුණනය . . . . . . 265

උප ග්‍රන්ථය . . . . . . . . . 272

ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු . . . . . . 274

# මෙම අත්පොත භාවිත කරන ආකාරය

## අත්පොතේ සැකසුම

සෑම පාඩමකම පහත දැක්වෙන දේ අන්තර්ගත වේ.

**අරමුණු:** සෑම පාඩමක්ම අධ්‍යයනය කිරීමෙන් පසු ඔබ මුදුන් පමුණුවා ගත යුතු ඉලක්කයන් වේ. පාඩම ආරම්භ කිරීමට පෙර ඒවා කියවන්න.

**ප්‍රධාන පදය:** පරිච්ඡේදයක ප්‍රධාන සංකල්පය මෙම පදයෙන් අවධාරණය කෙරේ. එය කටපාඩම් කරන්න.

**පරිච්ඡේදයක අන්තර්ගතය:** සෑම කොටසක්ම අධ්‍යයනය කරන්න. අත්පොතේ මුද්‍රණය කර නොමැති යොමු කිරීම් සඳහා බයිබලය බලන්න.

**ස්වයං ඇගයීම:** පරිච්ඡේදයක් අධ්‍යයනය කර අවසන් කළ පසු මෙම ඇගයීමට පිළිතුරු සපයන්න. මෙම අත්පොත හෝ බයිබලය හෝ භාවිත නොකර ප්‍රශ්නවලට පිළිතුරු දීමට උත්සාහ කරන්න. ස්වයං-ඇගයීම අවසන් කළ පසු ඔබේ පිළිතුරු මෙම අත්පොතේ අවසානයේ දී ඇති පිළිතුරු හා සසඳා බලන්න.

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** දේව වචනය තවදුරටත් අධ්‍යයනය කිරීමටත් ඔබගේ අධ්‍යයන හැකියාවන් දියුණුකර ගැනීමටත්, ඔබ උගත් දේ ඔබගේ ජීවිතයටත් මෙහෙයටත් අදාළ කර ගැනීමටත් මෙම කොටස උපකාරී වේ.

**අවසාන පරීක්ෂණය:** ඔබ සම්මාන සඳහා මෙම පාඨමාලාවෙහි ලියා පදිංචි වූයේ නම්, පාඨමාලාව හා සමඟ අවසාන පරීක්ෂණය ද ඔබට ලැබෙන්නට ඇත. මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු මෙම පරීක්ෂණයට පිළිතුර සපයා, ඔබට ලැබී ඇති උපදෙස් අනුව ශ්‍රේණි පැවරීම සඳහා ආපසු එවන්න.

# කණ්ඩායම් වැඩ සඳහා යෝජනා

## පළමු රැස්වීම

**ආරම්භය:** යාච්ඤාවකින් හා හැඳින්වීමකින් ආරම්භ කරන්න. එකිනෙකා හඳුනාගෙන ශිෂ්‍යයන්ව ලියාපදිංචි කරන්න.

**කණ්ඩායම් ක්‍රියා පිළිවෙළ තහවුරු කරන්න:** රැස්වීම මෙහෙය වන්නේ කවුරුන්ද, කාර්යය සැසි දින, කාලය, ස්ථානය තිරණය කරන්න.

**ප්‍රශංසා කිරීම හා යාච්ඤා කිරීම:** ඔබගේ පුහුණු සැසි සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේගේ වැඩ සිටීම අයැදින්න.

**අත්පොත ශිෂ්‍යයන්ට බෙදා දෙන්න:** අත්පොතේ මුල් පිටු කිපයෙන් සපයා ඇති පොතේ මාතෘකාවද, සැකැස්මද, පාඨමාලාවේ අරමුණු ද හඳුන්වා දෙන්න.

**පළමු පැවරුම සකස් කරන්න:** ඊළඟ රැස්වීමට පෙර ශිෂ්‍යයන් ඔවුන්ට නියමිත පරිච්ඡේද කියවා ස්වයං-ඇගයීම්වලට පිළිතුරු සපයනු ඇත. එක් රැස්වීමකදී අධ්‍යයනය කරනු ලබන පරිච්ඡේද සංඛ්‍යාව, ඒ ඒ පරිච්ඡේදයේ දිග ප්‍රමාණය, අන්තර්ගතය හා කණ්ඩායමේ දක්ෂතා මත රැඳී පවතී.

## දෙවන හා ඊළඟ රැස්වීම්

**ආරම්භය:** යාච්ඤා කරන්න. අලුතින් පැමිණි ශිෂ්‍යයන් ඇතිනම් ඔවුන්ව පිළිගෙන ලියාපදිංචි කර අත්පොත බැගින් දෙන්න. පැමිණීම ලකුණු කරන්න. ප්‍රශංසා කිරීමේ හා යාච්ඤා කිරීමේ කාලයක් ගත කරන්න.

**පුනරීක්ෂණය:** පසුගිය රැස්වීමේ දී උගත් දේ කෙටි සාරාංශයකින් ඉදිරිපත් කරන්න.

**පාඩම: තද කළු අකුරින් ඇති මාතෘකා** ඉගැන්වීමේ සැකිල්ලක් ලෙස භාවිත කරමින්, පරිච්ඡේදයක එක් එක් කොටස සාකච්ඡා කරන්න. තමන් අධ්‍යයනය කළ දේ ගැන ප්‍රශ්න හෝ අදහස් හෝ ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ශිෂ්‍යයන්ට පවසන්න. ඒ ඒ පාඩම්, ඔබගේ ශිෂ්‍යයන්ගේ ජීවිතවලටත් සේවයටත් අදාළ කර ගන්න.

**ස්වයං-ඇගයීම්:** ශිෂ්‍යයන් පිළිතුරු සපයා ඇති ස්වයං-ඇගයීම් පුනරීක්ෂණය කරන්න (ස්වයං-ඇගයීම්වල පිළිතුරු ශිෂ්‍යයන් අතට යෑමට ඔබ අකමැති නම්, ඒවා සෑම අත්පොතකින්ම ගළවා ඉවත් කරන්න).

**තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා:** මෙහි ඇති ව්‍යාපෘති තනි තනිව හෝ කණ්ඩායම් වශයෙන් හෝ කළ හැකිය.

**අවසාන පරීක්ෂණය**: ඔබගේ කණ්ඩායම් සම්මාන සඳහා ලියා පදිංචි වී ඇත්නම්, පාඨමාලාව සමඟ අවසාන පරීක්ෂණය ලැබෙන්නට ඇත. පාඨමාලාව අවසන් කළ පසු සෑම ශිෂ්‍යයෙකුටම ඉන් පිටපත බැගින් දී, පරීක්ෂණයට පිළිතුරු සැපයීම අධීක්ෂණය කරන්න.

**මොඩියුලය :** ධර්ම ප්‍රචාරණය.

**පාඩමාලාව :** මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය.

# හැඳින්වීම

- ලෝක ජනගහනයෙන් තුනෙන් දෙකක් පමණ ප්‍රමාණයක් කිසිදිනක ශුභාරංචි පණිවුඩය අසා නැත.
- මිනිසුන් කණ්ඩායම් දහසකට වඩා වැඩි ප්‍රමාණයක්ම යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ළඟා වී නොමැත.
- බොහෝ ගෝත්‍ර වලට පළමු මිෂනාරීවරයා ළඟා වී නැත.
- දෙවියන්වහන්සේගේ ලිඛිත වචනය නොමැති භාෂාවන් ආසන්න වශයෙන් 1,700 ක් පමණ ඇත.
- අවුරුදු 50 කට අඩුකාලයකදී ලෝක ජනගහනය දෙගුණ වනු ඇත.

සෑම ජීවියෙකුටම දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ ශුභාරංචිය ගෙන යාම උදෙසා වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මහා ආඥාව සම්බන්ධයෙන් මෙම සංඛ්‍යා දත්ත සලකා බැලූ විට, අපට අසීරු කාර්යයක් කිරීමට ඇති බව අපට වැටහේ. මෙම පාඩමාලාව රචනා කර ඇත්තේ මෙම මහත් අභියෝගය සම්පූර්ණ කිරීමට ඇදහිලිවන්තයන් ක්‍රියාවේ යෙදවීමට හා සන්නද්ධ කිරීමටය. එය අති විශාල කාර්යයකි, නමුත් එය කළ නොහැක්කක් නොවේ.

ධර්ම ප්‍රචාරණය පිළිබඳ බොහෝ පාඩමාලාවන්ගේ අවධානය යොමු වී ඇත්තේ ශුභාරංචිය සමඟ ලෝකයට "යෑම" උදෙසා වූ ආඥාව පිළිබඳව පමණි. ඔවුන් ශුභාරංචි පණිවුඩය දේශනා කිරීම හා ඉගැන්වීම වැදගත් කොට දක්වයි. මෙම පාඩමාලාව වෙනස් වන්නේ, "ඔබ යන අතර" කළ යුතු යැයි යේසුස්වහන්සේ පැවසූ දේවල් හා "ඔබ එහි සිටින විට" කුමක් කළ යුතුද යන්න පිළිබඳ නව ගිවිසුමේ ඇති රටාවද, එමඟින් අවධානයට ලක් කරන බැවිනි. පාඩමාලාව කොටස් තුනකට බෙදා තිබේ.

**පළමු කොටස** "යන්න" ලෙස නම් කර ඇත. එහි අවධානය යොමු වන්නේ සියලු ජීවින්ට දේව රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කිරීමට යේසුස්වහන්සේ විසින් දුන් ආඥාව කෙරෙහිය. ඒ තුළ බෙදා ගත යුතු පණිවුඩය, පණිවුඩය රැගෙන යන්නන්, ශුභාරංචිය සන්නිවේදනය කළ යුතු ආකාරය, හා පණිවුඩය ලබන අය පිළිබඳ උපදෙස් ඇතුළත් වේ. නව ගිවිසුම් කාලයේදී යොදා ගත් ක්‍රමවේද පිළිබඳ විශේෂ අවධානය යොමු කරමින් ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳවද උගන්වා ඇත. අපහසුතාවයන් සමඟ ගනුදෙනු කරන ආකාරය හා අලුත් ඇදහිලිවන්තයන් බලා ගන්නා ආකාරය පිළිබඳ විශේෂ උපදෙස්ද ඇතුළුව, පෞද්ගලිකව හා විශාල ප්‍රමාණයකට ධර්ම ප්‍රචාරය කරන ක්‍රමවේද සාකච්ඡා කර තිබේ. ආත්මික සම්පත් සැළසුම් කිරීම හා ක්‍රියාවේ යෙදවීම හා ධර්ම ප්‍රචාරණය උදෙසා අන්‍යයන් සමඟ ජාලයක් ලෙස ක්‍රියා කිරීම පිළිබඳවද උපදෙස් දී තිබේ.

**දෙවන කොටස** "ඔබ යන විට" ලෙස නම් කර ඇත. නව ගිවිසුමේ ශුභාරංචි පොත් තුළ, සුවකිරීම් හා නිදහස් කිරීම් කරන ලෙස අණ කිරීමකින් තොරව ශුභාරංචිය දේශනා කිරීමට යේසුස්වහන්සේ කිසිවෙකුටත් අණ කළේ නැත. "නුඹලා යමින්...රෝගීන් සුවකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා." (මතෙව් 10:7-8) යි උන්වහන්සේ ඔවුන්ට පැවසූ සේක. සුවය ලබා ගැනීමට හා මිදීම උදෙසා සමූහයන් පැමිණෙත්ම අස්වැන්න වඩා ඉක්මනින් වැඩි වන්නට වූ අතර සේවකයන් අවශ්‍ය විය. වැඩි කල් ගත වීමට පෙර තවත් ගෝලයන් 70 ක් අවශ්‍ය වූ අතර දේශනා කිරීම, ඉගැන්වීම, සුවකිරීම හා මුදාගැනීම සඳහා පිටත් කර හරින ලදි. ලෝකය පුරා ශුභාරංචිය ඉක්මනින් ප්‍රචාරය වීම සඳහා බලපෑවේ "ඔවුන් යන කළ" වූ මෙම බලයේ ප්‍රකාශ වීමයි. මේ හේතුවෙන්, මෙම පාඩමාලාවේ දෙවන කොටස ශුභාරංචිය දේශනා කිරීම සමඟ පැවතිය යුතු සුව කිරීමේ හා මුදා ගැනීම් කෙරෙහි අවධානය යොමු කරයි.

**තෙවන කොටස** "ඔබ යන අතර තුර" කුමක් කළ යුතුද යන්න පිළිබඳව වූ නව ගිවිසුම් සභාවෙන් එළිදරව් වන රටාව පිළිබඳව අවධානය යොමු කරයි. නව ඇදහිලිවන්තයන් කණ්ඩායමක් අතර සභාවක් පිහිටුවනු තුරු ධර්ම ප්‍රචාරණය සම්පූර්ණ නොවන බව එය යෝජනා කරයි. ප්‍රාදේශීය සභාවන් පිහිටුවීමෙන් තොර වූ ධර්ම ප්‍රචාරණය, ලෝකයට දරුවන් බිහිකර ඔවුන්ගේ නිරන්තර රැකවරණය පිළිබඳ වගකීම භාර නොගැනීම හා සමානය. පුද්ගලයකු ප්‍රාදේශීය සභා සහභාගීත්වයක ක්‍රියාකාරී කොටසක් බවට පත්වන තුරු ඔහු "ධර්ම ප්‍රචාරණයට ලක්වූවකු " ලෙස නොසැලකිය යුතුය. මෙම සිදුවීම සඳහා ප්‍රදේශීය සභාවක් තිබිය යුතුය. සභාවක් ආරම්භ කරන තුරු ප්‍රදේශයක් "ධර්ම ප්‍රචාරණයට ලක් වූවන්" ලෙස සැලකිය නොහැකිය.

ධර්ම ප්‍රචාරණය වෙත වූ මෙම කොටස් තුනේ ප්‍රවේශය, මුහුන් නිසා ඇනූ පාන් පිටි පිපීමට හේතු වන ලෙස ලෝකය තුළ ශුභාරංචිය ප්‍රචාරය කිරීමට හේතුවන බැවින් එය "මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය" ලෙස හඳුන්වයි. මුහුන් සුළු හා සැඟවුණු දෙයක් විය හැකි නමුත්, එහි බලපෑම අසීමිතය.

# පාඨමාලාවේ අරමුණු

මෙම පාඨමාලාව සම්පූර්ණ කිරීම තුළින් :

- මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය නිර්වචනය කිරීමට,
- ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආඥාව පැහැදිලි කිරීමට
- ධර්ම ප්‍රචාරණයේ පණිවුඩය සාරාංශගත කිරීමට
- ධර්ම ප්‍රචාරණයේ පණිවුඩකරුවන් හඳුනා ගැනීමට
- පණිවුඩය ලබා ගන්නන් හඳුනා ගැනීමට
- ශුභාරංචිය අන්‍යයන්ට සන්නිවේදනය කිරීමට
- ධර්ම ප්‍රචාරණය පිළිබඳ නව ගිවිසුමේ ප්‍රතිපත්තීන් සාරාංශගත කිරීමට
- ධර්ම ප්‍රචාරණය පිළිබඳ නව ගිවිසුම් උපමාවන් සාරාංශගත කිරීමට
- පෞද්ගලිකව ධර්ම ප්‍රචාරණය කිරීමට
- ධර්ම ප්‍රචාරණයේදී ඔබට මුහුණ දීමට සිදුවන අපහසුතා සමඟ ගනුදෙනු කිරීමට
- පරිපූර්ණ ධර්ම ප්‍රචාරණය තුළින් සම්පූර්ණ ප්‍රදේශයකට ළඟා වීමට
- සමූහ ධර්ම ප්‍රචාරණය මෙහෙයවීමට
- අලුත් ඇදහිලිවන්තයන් පිළිබඳ දිගටම ක්‍රියා කිරීම
- ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් සකස් කිරීමට
- ධර්ම ප්‍රචාරණය උදෙසා අන්‍යයන් සමඟ ජාලයක් සේ ක්‍රියා කිරීමට
- සුව කිරීම හා මුදා ගැනීම ගැන බයිබලය පවසන දේ සාරාංශගත කිරීමට
- සුව කිරීමට බලපෑම් කරන විචල්‍යයන් පැහැදිලි කිරීමට
- “ඔබ යන විට, සුව කරන්න.”
- “ඔබ යන විට, මුදා ගන්න.”
- සභාවන් ආරම්භ කිරීම පිළිබඳ නව ගිවිසුම් ආදර්ශය පැහැදිලි කිරීමට
- සභාවන් පිහිටුවීමට නව ගිවිසුමේ ඇති ක්‍රමවේද අනුගමනය කිරීමට
- සභාවන් වර්ධනය කිරීම උදෙසා නව ගිවිසුමේ ඇති ක්‍රමවේද අනුගමනය කිරීමට

# පළමු කොටස සඳහා හැඳින්වීම

## "යන්න"

පළමු කොටස ලෝකයට "ගොස්" සෑම ජීවමාන සත්වයෙක්වම ධර්ම ප්‍රචාරණයට ලක් කිරීම උදෙසා වූ ආඥාව වෙත අවධානය යොමු කරයි.

මෙම කොටසේදී රාජ්‍යයේ ශුභාරංචිය දේශනා කිරීමට යේසුස්වහන්සේ දුන් ආඥාව පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇති අතර බෙදාගතයුතු පණිවුඩය, ශුභාරංචියේ පණිවුඩකරුවන්, ශුභාරංචිය සන්නිවේදනය කරන්නේ කෙසේද හා එය සන්නිවේදනය කළ යුත්තේ කාටද යන්න පිළිබඳව උපදෙස් ලබා ගනු ඇත.

නව ගිවිසුම් සමය තුළ පාවිච්චි කළ ක්‍රමවේද පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින් ධර්ම ප්‍රචාරණය ක්‍රමවේද බොහොමයක් ගැන ඔබ ඉගෙන ගනු ඇත. ධර්ම ප්‍රචාරණයේදී අපහසුතාවයන් සමඟ ගනුදෙනු කරන ආකාරය හා නව ඇදහිලිවන්තයන් රැකබලා ගන්නා ආකාරය පිළිබඳව විශේෂ උපදෙස් සමඟ පෞද්ගලිකව හා සාමූහිකව ධර්ම ප්‍රචාරය කරන ක්‍රමවේද සාකච්ජා කර තිබේ.

ධර්ම ප්‍රචාරණ අරමුණ උදෙසා සැළසුම් සකස් කිරීම හා ජාලයක් සේ ක්‍රියාකිරීම ගැනද උපදෙස් දී තිබේ.

එසේ නම් දැන්...ඔබ "යන්න" සූදානම්ද?

# පළමු වන පරිච්ඡේදය

## මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය" නිර්වචනය කිරීමට
- "විනාශ වන්නන්" නිර්වචනය පැහැදිලි කිරීමට
- "විනාශ වූ අයගේ ඉරණම" පැහැදිලි කිරීමට
- ක්‍රියාවලියේ පියවර හය හඳුනාගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නැවතත් උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානකරම්ද? ස්ත්‍රියෙකු විසින් පිටිනැළි තුනක් සහමුලින්ම පිපෙන තෙක් එහි දමා තිබූ මුහුන්වලට එය සමානයයි කීසේක. (ලූක් 13:20-21)**

## හැඳින්වීම

මෙම පාඩම ධර්ම ප්‍රචාරණයේ අවශ්‍යතාවය සාකච්ඡා කරයි, ධර්ම ප්‍රචාරණයේ ක්‍රියාවලිය පැහැදිලි කරයි. එසේම මෙම විෂය පිළිබඳව ඔබ ඔබේ අධ්‍යයනය ආරම්භ කරන විට ඔබ තේරුම් ගැනීම වැදගත් වන පද නිර්වචනය කරයි. පැරණි ගිවිසුම් සමයේදී දේවමාලිගාව ගොඩනැගූ විට, මිටියේ, පොරොවේ හෝ වෙනත් යකඩ ආයුධ වල ශබ්දය ඇසුණේ නැත. (1 රාජාවලිය 6:7)

එම මහත් ස්වභාවික ගල් එක් තැන් කළ නිශ්ශබ්දතාවය මහත් ආත්මික සත්‍යයක් සඳහා උදාහරණයකි. "සලමොන්ට වඩා ශ්‍රේෂ්ඨ වූවකු" දැන් ශ්‍රේෂ්ඨ ආත්මික දේවමාලිගයක් ගොඩනඟයි. මෙම ආත්මික දේවමාලිගය ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ විසින් පිළිවෙළට තබන ලද "ජීවමාන ගල්" වලින් නිර්මාණය වී තිබේ. මෙම දේවමාලිගය නිහඬව ගොඩනඟා ඇති අතර, සෑම ගලක්ම සම්පූර්ණ ලෙස එකිනෙකට බැඳී ඇත. එය නිශ්ශබ්දව නමුත් "මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය" තුළින් සිදු වේ.

## මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය

> **නැවතත් උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානකරම්ද? ස්ත්‍රියෙකු විසින් පිටිනැළි තුනක් සහමුලින්ම පිපෙන තෙක් එහි දමා තිබූ මුහුන්වලට එය සමානයයි කීසේක. (ලූක් 13:20-21)**

දෙවියන්වහන්සේගේ ක්‍රියාවන් විශාල ඝෝෂාවක් හෝ ප්‍රසිද්ධියක් සමඟ සිදු නොවන බව මෙම කොටස එළිදරව් කරයි. හමුදාවන් මැඩපවත්වා මහද්වීප යටත් කරගැනීම තුළින් රාජ්‍යය ව්‍යාප්ත වනු ඇතැයි ඔබ සිතිය හැකිය. නමුත් දේව රාජ්‍යයේ ව්‍යාප්තිය සිදුවනුයේ ඇනූ පාන් පිඩක ඇති මුහුන් ලෙසිනි. මුහුන් සුළු හා සැඟවුණු දෙයක් විය හැකි නමුත් ඒ තුළ අසීමිත හැකියාවක් ඇත. මුහුන් ලෙසම, රාජ්‍යයේ බලය බාහිර දෙයක් නොව අභ්‍යන්තර දෙයකි.

තවත් උදාහරණයකදී, යේසුස්වහන්සේ දේව රාජ්‍යය අබ ඇටයකට සමාන කළ සේක.

> **එබැවින් උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානද? ඒක කුමකට සමානකරම්ද? එක් මනුෂ්‍යයෙකු විසින් අරගෙන තමාගේ වත්තේ දැමූ අබ ඇටයකට සමානය: ඒක වැඩී ගසක් විය: ආකාශයේ පක්ෂිහු එහි අතුවල ලැග්ගෝයයි කීසේක. (ලූක් 13:18-19)**

පෙර උපමාවකදී, යේසුස්වහන්සේ ඇඳහිල්ල අබ ඇටයකට සමාන කළ සේක. කුඩා ඇඳහිල්ලක් ඇති විට වුවද කළ නොහැකි කිසිවක් නැති බව උන්වහන්සේ පැවසූ සේක. මුහුන් පැතිරී යන ආකාරයටම, කුඩා අබ ඇටයක් මහත් ගසක් ලෙස වර්ධනය වන්නේය. මෙම උදාහරණ මඟින් ද රාජ්‍ය වර්ධනය වන නිහඬ, නමුත් බලවත් හා බලපෑමක් කළ හැකි ආකාරය පෙන්නුම් කරයි.

ශුභාරංචිය ප්‍රකාශ කිරීමේදී උපකාර කරගත හැකි වන නූතන ක්‍රම රාශියක් තිබේ. මේවා "තාක්ෂණය" ලෙස හඳුන්වනු ලැබේ. ඒ තුළ මුද්‍රණාල, පරිගනක, ගුවන් විදුලිය, රූපවාහිනිය, ශ්‍රව්‍ය හා දෘෂ්‍ය පට, හා චන්ද්‍රිකා වැනි දේ ඇතුළත් වේ. නව ගමනාගමන ක්‍රමද ශුභාරංචිය ප්‍රකාශ කිරීම සඳහා මිනිසුන්ට ඉක්මනින් ගමන් කිරීමට උපකාරී වේ. මෙම නව තාක්ෂණය සියල්ලම ප්‍රයෝජනවත්ය. නමුත් ශුභාරංචියේ නියම බලය තවමත් ඇත්තේ අභ්‍යන්තරයේය. මේ මඟින් අප අදහස් කරනුයේ බලය ඇත්තේ ශුභාරංචිය තුළම වන බවයි. මුහුන් පිළිබඳ හා අබ ඇටයේ උපමාව මඟින් දක්වනු ලැබුවේ මෙයයි.

පාන් පිටි පිඬක වූ මුහුන් වලට සමාන වූ රාජ්‍යයේ අභ්‍යන්තර බලය හේතුවෙන් දේව රාජ්‍යයේ ශුභාරංචිය ලෝකය නමැති "පිටි පිඬ" තුළ වැඩි වර්ධනය වනු ඇත. මෙහි අදහස දියුණු තාක්ෂණයක් නොමැති මිනිසුන් අතර වුවද ශුභාරංචියේ පැතිරීම සීමා නොවන බවයි. කුඩා ඇඳහිල්ලක් සමඟ වුවද, රාජ්‍යය වර්ධනය වනු ඇත. මෙය මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණයයි.

## ධර්ම ප්‍රචාරණයේ නිර්වචනය

"ධර්ම ප්‍රචාරණය" යන වචනය පැමිණෙනුයේ "evangelion" නමැති ග්‍රීක වචනයෙනි. සැබවින්ම මෙම මූලික වචනයේ ආකාර හතරකි. එක වචනයක අදහස "සුබ ආරංචිය"යි, වචන දෙකක අදහස "සුබ ආරංචිය ප්‍රකාශ කිරීමයි". අනෙක් වචනය "ධර්ම ප්‍රචාරකයා" හෙවත් ප්‍රකාශ කිරීම කරන තැනැත්තා ගැන දක්වයි.

ධර්ම ප්‍රචාරණය යනු රැස්වීම් මාලාවක් හෝ සභා දේවමෙහෙයන් මාලාවක් හෝ නොවේ. ධර්ම ප්‍රචාරණය පිබිදීම හා සමාන නොවේ. පිබිදීම යනු ස්වාමීන්වහන්සේ සභාව තුළ ක්‍රියා කිරීමයි. පිබිදීමේදී, වඩා අවධානය යොමු වනුයේ තම ජනතාවගේ ජීවිත නඟා සිටුවන දෙවියන්වහන්සේගේ වැඩ සිටීමයි.

ධර්ම ප්‍රචාරණය යනු සභාව ස්වාමීන්වහන්සේ උදෙසා ක්‍රියා කිරීමයි. ධර්ම ප්‍රචාරණයේදී වැඩි අවදානය යොමු වනුයේ නව උත්පාදනයේ අත්දැකීම, ආත්මික ජීවිතයේ ආරම්භය කෙරෙහිය. පිබිදීමේ ප්‍රතිඵලයක් වන අලුත්වීම, කෙසේ හෝ, "ක්‍රිස්තුස්වහන්සේ තුළ නව ජීවින්" බිහිකරන ධර්ම ප්‍රචාරණයේ බලවේග ක්‍රියාත්මක කරවයි. එබැවින් ආත්මික ජීවිතයේදී මේ දෙක දැඩි ලෙස බැඳී පවතී.

### ධර්ම ප්‍රචාරණය යනු :

*"...මිනිසුන්ට හා කාන්තාවන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු හා ස්වාමියා වශයෙන් පිළිගෙන උන්වහන්සේගේ සභාවේ වගකිවයුතු සාමාජිකයන් බවට පත් වීමේ වටිනා අවස්ථාව ලබා දිය හැකි වන අයුරින් ශුද්ධාත්මයාණන්ගේ බලය තුළින් ශුභාරංචිය ප්‍රකාශ කිරීමයි."*

අප මෙම නිර්වචනය විස්තරාත්මකව සලකා බලමු. "ශුභාරංචිය" යනු සන්නිවේදනය කළ යුතු පණිවුඩයයි. මූලික ශුභාරංචි පණිවුඩය 1 කොරින්ති 15:1-5 දක්වා සාරාංශගත කර ඇති නමුත්, "දේවරාජ්‍යයේ ශුභාරංචිය" තුළ යේසුස්වහන්සේ ඉගැන්වූ සියලු දේ අන්තර්ගතය (මතෙව් 28:18-20). බයිබලිය අනුව දෙවියන්වහන්සේ වෙතට හැරීම ආරම්භ වී තිබෙන්නේ සත්‍ය තුළිනි. ශුභාරංචිය යනු සත්‍ය හා අධර්මිෂ්ඨකම, ක්‍රිස්තුස්වහන්සේ හා පව්කාරයන්, හා ස්වර්ගය හා නිරය යන දේවල් වල මුණගැසීමකි.

බෙදාගත යුත්තේ දේව රාජ්‍යයේ ශුභාරංචිය වන අතර, මිනිසුන්ගේ චාරිත්‍ර හෝ නිකායන්ගේ ඇදහිලි නොවේ. අරමුණ දේශපාලන පද්ධති වලට හෝ වෙනත් ආගම් වලට පහර දීම නොවේ. අරමුණ සමාජය වෙනස් කිරීම නොව, ශුභාරංචියේ බලය තුළින් මිනිසුන්ගේ ජීවිත වෙනස් වනු දැකීමයි.

අරමුණ අධ්‍යාපනික, සෞඛ්‍ය හෝ රැකවරණ හා පෝෂණ වැඩසටහන්වල "යහපත් කාර්යයන්" හෝ නොවේ. මේ දේවල් මහා ආඥාව ඉටු කිරීමේදී ප්‍රයෝජනවත් වනුයේ ඒවා ධර්ම ප්‍රචාරණ පසුබිමක් තුළ සිදු කළහොත් පමණි. ඒවායේ අවසාන අරමුණ ශුභාරංචිය ප්‍රකාශ කිරීම විය යුතු අතර එසේ නොවේ නම් ඒවා සමාජ සේවාවන් පමණක් බවට පත්වනු ඇත.

සමූහයකට ආහාර දීම, සුවකිරීම හා මුදාගැනීම තුළින් යේසුස්වහන්සේ මිනිසුන්ගේ ශාරීරික අවශ්‍යතා වලට සේවය කළ සේක. නමුත් මෙම ක්‍රියාවන් සිදු කරනු ලැබුවේ ධර්ම ප්‍රචාරණ පසුබිමක් තුළය. ඒවාත් සමඟම ශුභාරංචිය ඉගැන්වීම හා දේශනා කිරීම සිදු විය.

"ශුභාරංචිය සන්නිවේදනය කිරීම" තුළ එය මිනිසුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු හා ස්වාමියා බවට පිළිගැනීම වෙත මෙහෙයවන ආකාරයකින් බෙදාගත යුතු යැයි අදහස් වේ. ඔබ මේ ආකාරයෙන් ශුභාරංචිය බෙදාගත් විට, ඔබ කරනුයේ ධර්ම ප්‍රචාරණයයි. ඔබ එය කිරීමට නම්, පාපය තුළ ආත්මිකව විනාශ වන අය සමඟ සම්බන්ධ විය යුතුය. එමනිසා ධර්ම ප්‍රචාරණය සිදු විය යුත්තේ පව්කාරයන් සිටින තැනකදීය.

"ශුද්ධාත්මයාණන්ගේ බලය තුළින්" යන්නෙන් අදහස් වනුයේ පණිවුඩය සන්නිවේදනය කිරීම වාචිකව පමණක් නොව, බලය ප්‍රකාශ කිරීමක් තුළින් ද සිදුවිය යුතු බවයි. පාවුල් මෙසේ පැවසුවේය:

> **මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගෙන්ද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)**

"ශුද්ධාත්මයාණන්ගේ බලය තුළින්" යන්නෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීම මත ශුද්ධාත්මයාණන්ගේ ආලේපය ද පැවතිය යුතු බව අදහස්වේ. මන්ද ඇදහිලිවන්තයන් දිනා ගැනීම සඳහා ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාව අවශ්‍ය වේ :

> **මා එවූ පියාණන්වහන්සේ විසින් අඳිනු ලැබූ කෙනෙකුට මිස වෙන කිසිවෙකුට මා ළඟට එන්ට බැරිය. (යොහන් 6:44)**

"පිළිගෙන" යන්නෙන් අදහස් වන්නේ අසන්නා පණිවුඩයට ප්‍රතිචාර දැක්වීමයි. ආරාධනයකින් තොර වූ උපදෙස් යනු තොරතුරයි. එය අනුශාසනය වන නමුත්, ධර්ම ප්‍රචාරණය නොවෙයි. සැබෑ ධර්ම ප්‍රචාරණය තුළ, ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් තිබිය යුතුය. ඔබගේ ජීවිතයේ වෙනස් වීමේ සාක්ෂිය තවත් කෙනෙකුට පැවසීම සාක්ෂි දැරීම වශයෙන් හඳුන්වන ධර්ම ප්‍රචාරණයේ මාර්ගයක් වන නමුත්, එය ධර්ම ප්‍රචාරණය නොවේ. සාක්ෂි දැරීම දිනාගැනීම නොවේ. සාක්ෂිදැරීම වැදගත් වන නමුත්, එමඟින් ගැළවීම සහතික නොකරයි. සැබෑ ධර්ම ප්‍රචාරණය යනු මිනිසුන්ට පෞද්ගලික තීරණයක අවශ්‍යතාව දැනෙන පරිදි ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේ හඳුන්වා දීමයි. ධර්ම ප්‍රචාරණයේ ප්‍රතිඵලය "හැරීම" හෙවත් "ගැළවීම" ලෙස හඳුන්වනු ලබන නැවත ඉපදීමේ අත්දැකීමයි.

"යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු හා ස්වාමියා ලෙස පිළිගැනීම" යන්නෙන් අදහස් වන්නේ ගැළවීම ලබා ගැනීම උදෙසා වූ ප්‍රතිචාරයක් පමණක් නොව, එය යේසුස්වහන්සේ කෙනෙකුගේ ජීවිතයේ ස්වාමියා බවට පත්වීම දක්වා වූ ක්‍රියාවලියකි. මෙහි අදහස නව ඇදහිලිවන්තයා සභාවේ වගකිවයුතු සමාජිකයෙකු බවට පත්ව ගෝලත්වය කරා යොමු වීමයි. "උන්වහන්සේගේ සභාව" යනු, විශේෂ නිකායක් හෝ සංවිධානයක් නොව ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ ශරීරයයි.

"වටිනා අවස්ථාව" යන්නෙහි අදහස සාමාන්‍ය පුද්ගලයෙකුට තේරුම්ගත හැකිවන ආකාරයකින් පණිවුඩය ප්‍රමාණවත් තරම් කාලයක් පැවතිය යුතුය. මෙහි අදහස සන්නිවේදනය එක් එක් පුද්ගලයාගේ භාෂා, අධ්‍යාපනික හා සංස්කෘතික මට්ටම් වලට ගැළපිය යුතු බවයි. මෙහි අදහස අප එක් වරක් දේශනා කළ පමණින්ම පුද්ගලයෙකු හෝ ගම්මානයක් ධර්ම ප්‍රචාරණයට ලක් වූයේය යන නිගමනයට අපට එළැඹිය නොහැකි බවයි. තේරුම් ගැනීම හා ප්‍රතිචාර දැක්වීම සිදුවන තුරු සාක්ෂි දැරීම ප්‍රමාණවත් තරම් කාලයක් පැවතිය යුතුය. පුද්ගලයෙකු, පවුලක්, ගෝත්‍රයක් හෝ ජාතියක් ධර්ම ප්‍රචාරණයට ලක් වී ඇති බව පැවසිය හැක්කේ, ඇදහිල්ලෙන් ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලද හැකි තරම් ඔවුන් ශුභාරංචිය සමඟ සම්බන්ධ වූ විටය. මෙම "වටිනා අවස්ථාව" යන්නෙන් සුව කිරීම් හා මුදවා ගැනීම් තුළින් මිනිසුන්ට ශුභාරංචිය දෘෂ්‍ය ප්‍රකාශවීම දැක ගැනීමට අවස්ථාව සළසන බලවත් පණිවුඩයක් යන්න ද අදහස් වේ.

## ධර්ම ප්‍රචාරණයේ අවශ්‍යතාව

ලෝකය ධර්ම ප්‍රචාරණයට ලක්විය යුත්තේ ඇයි? මෙම ප්‍රශ්නයට පිළිතුරු දීම සඳහා ඔබ කරුණු දෙකක් දැනගත යුතුය. එනම් විනාශ වුවන් නිර්වචනය කරන ආකාරය හා ඔවුන්ගේ ඉරණමයි.

## විනාශ වුවන් නිර්වචනය කරන ආකාරය :

උත්පත්ති 1 හා 2 පරිච්ඡේද වල ඇති ලෝකයේ හා මිනිසාගේ මැවීම පිළිබඳව කියවන්න. ඉන්පසු උත්පත්ති 3 හි සඳහන් ලෝකයට පාපය පැමිණි ආකාරය කියවන්න. ආදම් සහ ඒව මුලින්ම මවනු ලැබූ විට, ඔවුන්ට සම්පූර්ණ පාපයෙන් තොර ස්වභාවයක් තිබිණි. ඔවුහු පව් කළ පසුව එම ස්වභාවයට හානි සිදුවිය. ආදම් සහ ඒව ප්‍රජනන කාර්යය තුළින් දරුවන් බිහි කළ විට. මනුෂ්‍ය ජාතියට මෙසේ අලුතින් එකතු වූ අය මූලික පාපී ස්වභාවය ඇතිව ඉපදුනි. මිනිසා තවදුරටත් දෙවියන්වහන්සේ ඔවුන් මැවූ යහපත් අය නොවීය. ඔවුන්ගේ ස්වාභාවික සිතුවිලි හා ක්‍රියා රටාවන් නපුරු විය.

පාපය ලෝකය පුරා පැතිරීමට පටන් ගැනීමත් සමඟ එහි ස්වභාවය උත්පත්ති 4:1-6:4 විස්තර කරයි. මෙම පරිච්ඡේද තුළ පළමු මිනීමැරුම, පළමු බොරුව හා සෑම සිතුවිල්ලක්ම මෙන් ක්‍රියාවක්ම නපුරු වන තුරු මිනිසාගේ දුෂ්ඨ බව වර්ධනය වූ අයුරු මෙම විස්තර කරයි. අවසානයේදී මුළු ලෝකයම ඉතා පාපිෂ්ට වූ අතර, දෙවියන්වහන්සේ සැබවින්ම තමන් මිනිසා මැවීම ගැන පසුතැවිලි වූ සේක. (උත්පත්ති 6:5-6)

පාපයේ ඉක්මන් පැතිරයාම නිසා, එකම ධර්මිෂ්ඨ මිනිසා වූ නෝවා සහ ඔහුගේ පවුල හැර, ලෝකයම ගං වතුරකින් විනාශ කිරීමට දෙවියන්වහන්සේ තීරණය කළ සේක. (උත්පත්ති 6:8-9:17 ඇති නෝවා සහ ජලගැල්ම පිළිබඳ කතාව කියවන්න). ජලගැල්මෙන් පසු නෝවාගේ පවුල දරුවන් බිහි කරන්නට විය. බොහෝ දුරට ඉක්මනින්ම, පාපයේ රටාව නැවත ඇති විය. සැමතැනම සිටින හැම මිනිසෙකුවම "පව්කරුවන්" ලෙස හඳුන්වනහන්නේ මේ හේතුවෙනි.

**මක්නිසාද සියල්ලෝම පව්කොට දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනව සිටිති. (රෝම 3:23)**

පාපය උදෙසා පසුතැවිලි වී නොමැති හා යොහන් 3 යේසුස්වහන්සේ විස්තර කළ නැවත ඉපදීම අත්දැක නොමැති සියලුම පුද්ගලයන්ට දෙවියන්වහන්සේ මුලින්ම මිනිසා මවන විට තිබුණු පාපයෙන් තොර ස්වභාවය නැතිවී ඇති බැවින්, ඔවුහු "විනාශ වුවන්" ලෙස සළකනු ලැබේ. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඇදහීම තුළින් ඔවුන් තම පාප වලින් ගැළවීම ලබා නොමැති බැවින් අපට ඔවුන් "ගැළවීම නොලත් අය" හෝ "නොඇදහිලිවන්තයන්" ලෙසද හැඳින්විය හැකිය.

## විනාශ වුවන්ගේ ඉරණම :

ආදම්ගේ හා ඒවගේ පළමු පාපය නිසා, ලෝකයට මරණය ඇතුළු වූ අතර මේ හේතුවෙන් හැම කෙනෙක්ම අවසානයේදී ශාරීරිකව මරණයට පත් වේ. ශාරීරික මරණයෙන් අනතුරුව විනිශ්චය පැමිණේ

**තවද එක වරක් මණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක්මෙන්ම, (හෙබ්‍රෙව් 9:27)**

මරණයෙන් පසු අප විනිශ්චය පිණිස දෙවියන්වහන්සේ ඉදිරියේ සිටගනිමු. තම පව් උදෙසා පසුතැවිලි නොවූ මිනිසුන් දෙවන මරණයට මුහුණ දෙනු ඇත. දෙවියන්වහන්සේගෙන් සදාකාලිකව වෙන්වීම යන "ආත්මික මරණයට" ඔවුන් මුහුණ දෙනු ඇත. ඔවුන්ගේ ඉරණම නිරයයි :

**මක්නිසාද පාපයේ කුලී නම් මරණයය; නුමුත් දෙවියන්වහන්සේගේ දීමනාව නම්, අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළ සදාකාල ජීවනයය. (රෝම 6:23)**

**මළාවූ ලොකු අයද කුඩා අයද සිංහාසනය ඉදිරියෙහි සිටිනවා දුටිමි; පොත්ද දිගහරිනු ලැබුවේය. ජීවන-පොත වන තවත් පොතක් දිගහරිනු ලැබීය. මළාහූ තමුන්ගේ ක්‍රියා ලෙස පොත්වල ලියනලද දේවලින් විනිශ්චයකරනු ලැබුවෝය. යමෙකුගේ නම ජීවන-පොතෙහි ලියා නැති බව සම්බවිද, ඔහු ගිනිවලට හෙළනු ලැබුවේය. (එළිදරව් 20:12,15)**

ඔබ නැතිවූවන්ගේ ඉරණම සැබවින්ම තේරුම්ගත් විට, ධර්ම ප්‍රචාරණයේ හදිසි අවශ්‍යතාව ඔබ තේරුම්ගනු ඇත. මිනිසුන් වෙත ශුභාරංචිය ළඟා නොවුනහොත්, ඔවුන් පාපය සමඟ මරණයට පත්ව සදාකාලිකව නිරයට යාමේ ඉරණමට මුහුණ දෙනු ඇත.

# ධර්ම ප්‍රචාරණයේ ක්‍රියාවලිය

ධර්ම ප්‍රචාරය යනු ශුභාරංචියේ හැඩහුරුකම හා ප්‍රකාශකිරීම, කැමතිකරවාගැනීම, සිටුවීම, සම්පූර්ණ කිරීම හා සහභාගිවීම යන කරුණු ඇතුළත් ක්‍රියාවලියකි. අප මෙම ක්‍රියාවලිය පරීක්ෂා කර බලමු.

## හැඩහුරුකම :

ධර්ම ප්‍රචාරණයේ "හැඩහුරුකම" යනු ක්‍රිස්තියානි චරිතය හා සැලකිල්ල පෙන්නුම් කිරීම තුළින් යේසුස්වහන්සේගේ ගුණාංග ප්‍රචාරය කිරීමයි. සැබෑ කිතුනු හැඩහුරුකමකින් තොරව යේසුස්වහන්සේ උදෙසා ලෝකය වෙත ළඟා විය නොහැකිය. ඇදහිවන්තයන් නොඇදහිලිවන්තයන් සමඟ සබඳතා පැවැත්වීමට, ඔවුන් හඳුනාගැනීමට හා ඔවුන්ට සේවය කිරීමට ඉගෙන ගත යුතුය. ඔබට පව්කරුවන් සමඟ කිසිඳු සම්බන්ධතාවයක් නැතිනම් ඔබට ඔවුන් දිනාගත නොහැකිය.

## ප්‍රකාශකිරීම :

බොහෝ ඇදහිලිවන්තයන් "රහසිගත සේවය" නියුතු අය ලෙස සිටී. ලෝකය ධර්මප්‍රචාරයට ලක්කිරීම උදෙසා වූ මහත් ආඥාව සම්පූර්ණ කිරීමට ඔවුහු නොඇදහිලිවන්තයන් අතර සිටීම පමණක් ප්‍රමාණවත් බව ඔවුහු සිතති. නමුත් යේසුස්වහන්සේගේ ආඥාව අප දේශනාකිරීම, ඉගැන්වීම හා සාක්ෂිදැරීම තුළින් වාචිකව ශුභාරංචිය සන්නිවේදනය කිරීමයි. එසේම සුව කිරීම් හා මුදවාගැනීම් තුළින් අප ශුභාරංචියේ බලය ද පෙන්නුම් කළ යුතුය. මේවා ශුභාරංචිය ප්‍රකාශ කරන ආකාරයන්ය.

## කැමතිකරවා ගැනීම :

ශුභාරංචිය ප්‍රකාශ කිරීම තුළින් ධර්ම ප්‍රචාරණයේ ක්‍රියාවලිය අවසන් නොවේ. මිනිසුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ඇදහිලිවන්තයන් බවට පත්වීමට කැමති කරවා ගන්නා ආකාරයකින් ශුභාරංචිය ප්‍රකාශ කළ යුතුය.

## සිටුවීම :

යේසුස්වහන්සේ අනුගමනය කිරීමට කැමති කරවාගත් ඇදහිලිවන්තයා ප්‍රාදේශිය සභාවක් තුළ සිටුවීම හෝ නව ඇදහිලිවන්තයන් කණ්ඩායමක් අතර සභාවක් සිටුවීම කළ යුතුය.

## සම්පූර්ණකරවීම :

මෙම සිටුවීමේ ප්‍රතිඵලයක් ලෙස, ප්‍රදේශිය සභා පසුබිමක් තුළ ගෝලත්වය සිදු කෙරෙන විට ඇදහිලිවන්තයන් ආත්මිකව පරිණත බවට පත්වේ. (ආත්මිකව පරිණත වීම "සම්පූර්ණවීම" ලෙස බයිබලයේ දක්වා තිබේ.)

## සහභාගීවීම :

ධර්ම ප්‍රචාරණයේ ක්‍රියාවලිය සම්පූර්ණ වන්නේ නව ඇදහිලිවන්තයන් ධර්ම ප්‍රචාරණ කාර්යයෙහි ක්‍රියාකාරී වෙමින් ආත්මිකව ඵලදැරීමට පටන්ගත් විටය.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය" නිර්වචනය කරන්න.

3. "විනාශ වූවන් පිළිබඳ නිර්වචනය" යන්නෙහි අදහස කුමක්ද?

4. "විනාශ වූවන්ගේ ඉරණම" යන්නෙහි අදහස කුමක්ද?

5. ධර්ම ප්‍රචාරණ ක්‍රියාවලියේ පියවරයන් හය ලියා දක්වන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. මෙම ආරම්භක පරිච්ඡේදය තුළදී ඔබට "ධර්ම ප්‍රචාරණයේ" හැඳින්වීම ඉදිරිපත් කෙරුණි.

> **ධර්ම ප්‍රචාරණය :** මිනිසුන්ට හා කාන්තාවන්ට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු හා ස්වාමියා වශයෙන් පිළිගෙන උන්වහන්සේගේ සභාවේ වගකිවයුතු සාමාජිකයන් බවට පත් වීමේ වටිනා අවස්ථාව ලබා දිය හැකි වන අයුරින් ශුද්ධාත්මයාණන්ගේ බලය තුළින් ශුභාරංචිය ප්‍රකාශ කිරීමයි."

ඔබ විසින් දැනගත යුතු තවත් වචන කිහිපයක් පහත දැක්වේ :

**ධර්ම ප්‍රචාරණය හෝ ධර්ම ප්‍රචාරණයට ලක් කිරීම :**

මෙම පදය පාවිච්චි කරනුයේ ධර්ම ප්‍රචාරණ කාර්යය ඉටු කිරීමේ ක්‍රියාවලිය උදෙසාය.

**ධර්ම ප්‍රචාරණයට ලක් කරන ලද :**

තනි පුද්ගලයන්, පවුලක්, ගෝත්‍රයක් හෝ ජාතියක් ධර්ම ප්‍රචාරණයට ලක්ව ඇතැයි පැවසිය හැක්කේ ඇදහිල්ල තුළින් ශුභාරංචියට ප්‍රතිචාරයක් දැක්වීමට අවස්ථාවක් ලැබීමට ප්‍රමාණවත් තරම් ඊට සම්බන්ධ වී ඇති විටය. සම්පූර්ණ ධර්ම ප්‍රචාරණ ක්‍රියාවලියක් තුළ ඇදහිලිවන්තයෙකු ප්‍රාදේශීය සභා සහභාගිත්වයකට ඇතුළු කිරීම හෝ නව ඇදහිලිවන්තයන් කණ්ඩායමක් අතර ප්‍රාදේශීය සභාවක් පිහිටුවීම යන කරුණු ඇතුළත් වේ.

**ධර්මප්‍රචාරකයා :**

ධර්මප්‍රචාරකයෙකුට, දෙවියන්වහන්සේගෙන් විශේෂ නායකත්ව දීමනාවක් තිබේ. එනම් පුරුෂයන්ට හා ස්ත්‍රීන්ට ප්‍රතිචාර දක්වා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිවයුතු සාමාජිකයන් බවට පත්විය හැකි වන ආකාරයකට නොඇදහිලිවන්තයන් සමඟ ශුභාරංචිය බෙදා ගැනීමේ හැකියාවයි. "ධර්ම ප්‍රචාරකයා" යන වචනයේ තේරුම "ශුභාරංචිය ගෙන එන තැනැත්තා" යන්නයි. සෑම ඇදහිලිවන්තයෙකුටම ධර්මප්‍රචාරකයෙකු බවට පත් වීමට විශේෂ නායකත්ව දීමනාවක් නොමැති නමුත්, සෑම කෙනෙකුම ධර්මප්‍රචාරකයෙකුගේ කාර්යය කළ යුතුය.

**සාක්ෂිදැරීම :**

ඇදහිලිවන්තයෙකු ක්‍රිස්තුස්වහන්සේ සමඟ වූ තම පෞද්ගලික ජීවන අත්දැකීම නොඇදහිලිවන්තයෙකුට පැවසීම.

**පෞද්ගලික ධර්ම ප්‍රචාරණය :**

පෞද්ගලික ධර්ම ප්‍රචාරණය යනු, තනි ඇදහිලිවන්තයෙකු ගැළවීම නොලත් කෙනෙකුට ශුභාරංචිය පැවසීම.

**සමූහ ධර්ම ප්‍රචාරණය :**

සමූහ ධර්ම ප්‍රචාරණය "කණ්ඩායම්" ධර්ම ප්‍රචාරණය ලෙසද හඳුන්වයි. එනම් පුද්ගලයන් කණ්ඩායමකට ශුභාරංචිය සන්නිවේදනය කිරීමයි. ඒ තුළ සමූහ රැස්වීම්, ධර්ම ප්‍රචාරණ රැළි, හා ශුභාරංචි ප්‍රසංග වැනි දෑ අන්තර්ගත වේ.

**ගිහි ධර්ම ප්‍රචාරණය :**

මෙම පදයෙන් හැඳින්වෙන්නේ ගිහි පුද්ගලයන් විසින් කරනු ලබන ඕනෑම ධර්මදූත ක්‍රියාවකි. (සභාවේ සම්පූර්ණ කාලීන නායකත්ව තත්වයන් නොදරන පුද්ගලයන්).

**සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය :**

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය යන්නෙන් අදහස් වන්නේ සෑම පුද්ගලයෙකුටම ශුභාරංචිය ඇසිය හැකි වන පරිදි නිශ්චිත භූගෝලීය ප්‍රදේශයක් "සන්තෘප්ත" කිරීමයි.

**හැරෙනු ලැබූ තැනැත්තා :**

හැරෙනු ලැබූ තැනැත්තා යනු යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු වශයෙන් පිළිගත් තැනැත්තාය. ඔහු තම පැරණි පාපයේ ජීවිතයෙන් යේසුස්වහන්සේ තුළ නව ජීවිතයකට හැරෙනු ලැබී ඇත.

**ගෝලයා :**

ගෝලයෙකු යනු කිතුනු ඇදහිල්ලේ මූලිකාංග මත ගොඩනැඟනු ලැබූ සහ තවත් අලුත් ඇදහිලිවන්තයන් ඇති කිරීමේ හා ඔවුන් ගෝලයන් බවට පත්කිරීමේ හැකියාව ඇති ක්‍රිස්තුස්වහන්සේ වෙත හැරෙනු ලැබූ තැනැත්තන්ය. "ගෝලයා" යන වචනයේ අර්ථය ඉගෙන ගන්නා තැනැත්තා, සිසුවා, අනුගමනය කිරීමෙන් ඉගෙන ගන්නා තැනැත්තාය.

**නව ඇදහිලිවන්තයන් පිළිබඳ දිගටම ක්‍රියා කිරීම :**

දිගටම ක්‍රියා කිරීම යනු, ආත්මික ස්ථිරත්වය, වර්ධනය හා ඵලදැරීම සිදුවන පරිදි නව ඇදහිලිවන්තයන් පුහුණු කිරීමේ හා ඔවුන් ක්‍රිස්තුස්වහන්සේ තුළ පරිණතභාවයට ගෙන ඒමේ ක්‍රියාවලියයි. මෙම ක්‍රියාවලිය තුළ නව ඇදහිලිවන්තයන්ව ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ගෝලයන් බවට පත් කිරීමද අන්තර්ගත වන බැවින් මෙය "ගෝලත්වය" යනුවෙන්ද හඳුන්වයි.

2. පැරණි ගිවිසුමේදී, ආබ්‍රහම් තුළින් ලෝකයේ සියලු ජාතීන් ආශිර්වාද ලබනු ඇති බව දෙවියන්වහන්සේ ඔහුට පැවසූ සේක. නමුත් මෙම ආශිර්වාදය සමඟ විශාල වගකීමක් ද පැමිණුනි. දෙවියන්වහන්සේ තමාට පෙන්වූ දේශයට යාම සඳහා ආබ්‍රහම්ට තම රට, තම ජනතාව හා තම පියාගේ නිවස ද අත්හැරීමට සිදුවිය. (උත්පත්ති 12:1)

ආබ්‍රහම් පළමුව හාරාන් නම් ස්ථානයට ගොස් එහි නවාතැන් ගත්තේය (උත්පත්ති 11:31). හාරාන් හි දිගටම වාසය කරන ලෙස ඔහුට ඕනෑව තිබුනත් ආශිර්වාදය ලබා ගැනීම සඳහා ඔහුට දෙවියන්වහන්සේට කීකරු වී එම ස්ථානය හැරයාමට සිදුවිය. ආබ්‍රහම්ට ශ්‍රේෂ්ඨ ජාතියක පියා බවට පත්වීම හා තම ආත්මාර්ථකාමී අරමුණු ඉටු කර ගැනීම යන දෙකම එකවිට කළ නොහැකි විය. හාරාන් නගරයේ සීමාවන් ඉක්මවා යමින් දෙවියන්වහන්සේගේ සැළැස්ම සම්පූර්ණ කිරීමට ක්‍රියා කිරීම ආබ්‍රහම්ට මහත් තීරණයක් විය.

අද ඔබ ඇදහිලිවන්තයෙකුව සිටින්නේ ආබ්‍රහම්ගේ තීරණය නිසා බව ඔබ දන්නවාද? ආබ්‍රහම් හාරාන් හැර ගිය බැවින්, දෙවියන්වහන්සේ ඔහුට ආශිර්වාද කළ සේක. ආබ්‍රහම් තුළින් සෑම තැනකම සිටින සෑම ජාතියකම පුරුෂයන් හා ස්ත්‍රීන් ශුභාරංචියේ ආශිර්වාදය ලදහ. යේසුස්වහන්සේ තුළින් ලැබෙන ගැළවීම ආබ්‍රහම්ගේ කීකරු කම නිසා ඔහුගේ පවුල තුළින් පැමිණි බැවින් ඔවුන් ආශිර්වාද ලබා තිබේ.

ආබ්‍රහම් මෙන්ම, ඔබටද ආශිර්වාද ලැබෙන විට විශාල වගකීමක්ද හිමි වේ. ගැළවීම හා ශුද්ධාත්මයාණන් යන ආශිර්වාද ලත් හැම කෙනෙකුටම, ධර්ම ප්‍රචාරණය යනු විකල්පයක් නොවේ. එය අනිවාර්ය දෙයකි (ක්‍රියා 1:8).

ආත්මිකව කතාකළ විට, සෑම ඇදහිලිවන්තයෙක්ම තම ජීවිතයේදී "හාරාන්" නුවරකට මුහුණ දේ. මෙම ආත්මික "හාරාන් නගරය" යනු, "ශුභාරංචිය උදෙසා ඔබේ අරමුණු පසෙක දැමීමට ඔබ සූදානම්ද? මා විසින් පැවසුවහොත් ඔබේ මව්බිම, ඔබේ ජනතාව, ඔබේ පියාගේ නිවස අත්හැරීමට ඔබ සූදානම්ද?" යනුවෙන් දෙවියන්වහන්සේ ඔබගෙන් අසන ස්ථානයයි. ඔබට එකම අවස්ථාවකදී ඔබගේ ආත්මාර්ථකාමී අරමුණු ඉටුකර ගැනීම හා ලෝකයේ ජාතීන්ට ආශිර්වාද කිරීම යන දෙකම කළ නොහැකිය. ඔබ සීමාව පසු කර හාරාන් නගරය හැර යා යුතුය.

3. "මුහුන් ටිකකින් මුළු පිටි පිඩ පිපෙන්නේය" (ගලාති 5:9) යයි බයිබලය පවසයි. දේව රාජ්‍යයද මුහුන් මෙන් වැඩි වන බව මෙම පාඩමේදී ඔබ ඉගෙන ගත්තේය. නපුරද ඒ ආකාරයෙන්ම වර්ධනය වනු ඇත. පහත බයිබල් පද අධ්‍යයනය කරන්න: මතෙව් 16:6-12; මාර්ක් 8:15;

1 කොරින්ති 5:6-8. නව ගිවිසුමේදී, මුහුන් තුළින් ශුභාරංචියේ පැතිරයාමේ ගුණය හෝ සභාවේ භක්තිය හැර යාම (පසුබටවීමේ තත්වයන්) ගැන කතා කරයි. පැරණි ගිවිසුම තුළද, මුහුන් වලට තිබුණේ ඒ හා සමාන අදහසකි. එය නපුර සංකේතවත් කළ බැවින්, ඇතැම් පූජාවන් වලදී එය පිළිනොගන්නා ලදි. ස්තුති දීමේ පූජා වැනි වෙනත් පූජා වලදී මුහුන් භාවිත කිරීමට අවසර ලැබුණි.

4. ඔබ ප්‍රාදේශිය සභාවක සභාපාලකවරයෙකු හෝ නායකයෙකු නම්, ඔබේ සහභාගීත්වයේ ධර්ම ප්‍රචාරණයේ වත්මන් තත්වය මැන බැලීම සඳහා පහත ප්‍රශ්න පාවිච්චි කරන්න. වෙනම කඩදාසියක ඔබේ පිළිතුරු සටහන් කරන්න.

(1) ඔබේ සභාව තුළ ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් කිරීමේ වගකීම දරන්නේ කවුද?

(2) පසුගිය වසර පහ තුළදී කොපමණ පුද්ගලයන් ගණනක් දෙවියන්වහන්සේ වෙතට හැරෙනු ලැබ ඔබේ සභා සහභාගීත්වයේ කොටසක් බවට පත්වී තිබේද?

(3) ගැළවීම නොලත් අය වෙත ළඟාවීමට ඔබේ සභාව වර්තමානයේදී කරන්නේ මොනවාද? ඔබේ පිළිතුර නිශ්චිතව ලබා දෙන්න.

(4) ඔබේ සභාව තුළ දැනට පවතින ධර්ම ප්‍රචාරණයේදී හා නව ඇදහිලිවන්තයන් බිහිකිරීමේදී බලපෑමක් ඇති නොකරන වැඩසටහන් මොනවාද?

(5) සාමාජිකයන්ට තම ආත්මික දීමනා හඳුනා ගැනීමට හා ධර්ම ප්‍රචාරණයේදී ඒවා පාවිච්චි කිරීමට ඔබේ සභාව උදව් වන්නේ කෙසේද?

(6) ඔබගේ සමාජයට ශුභාරංචිය ගෙන යාමට ඔබේ සභාවට ඇති සැළැස්ම කුමක්ද?

(7) ඔබේ ජාතියට ශුභාරංචිය ගෙන යාමට ඔබේ සභාවට ඇති සැළැස්ම කුමක්ද?

(8) වෙනත් රට වලට ශුභාරංචිය ගෙන යාමට ඔබේ සභාවට ඇති සැළැස්ම කුමක්ද?

(9) ඔබගේ සාමාජිකයන්ට පසුගිය පස් වසර තුළ කී වතාවක් සභාව මඟින් පෞද්ගලික ධර්ම ප්‍රචාරණය පිළිබඳ පුහුණුකිරීම් ලබා දී තිබේද?

(10) ඔබගේ දේවමෙහෙයන් කොපමණ ප්‍රමාණයක් ධර්ම ප්‍රචාරණය කෙරෙහි අවධානය යොමු කරනවාද? එනම් ගැළවීම නොලත් අය වෙත ළඟා වීම ඉලක්ක කරගත් පණිවුඩ, ශුභාරංචියට ප්‍රතිචාර දැක්වීමට පුද්ගලයන්ට අවස්ථාව ලබා දීම වැනි දේවල්.

(11) රැස්වීමක්, රැළියක් හෝ ප්‍රසංගයක් වැනි සමූහ උත්සාහයකට ඔබේ සභාව අවසන් වරට සහභාගී වූයේ කවදාද?

**ඔබගේ පිළිතුරු ඇගයුම් කර පහත දේවල් සලකා බලන්න :**

(1) ඔබේ සභාව තුළ කටයුතු පිළිබඳ වගකීම දැරීමට නිශ්චිත පුද්ගලයෙකු නොමැති නම්, එවැනි කෙනෙක් පත් කිරීම කළ හැකිද?

(2) පසුගිය පස් වසර තුළ දෙවියන්වහන්සේ වෙතට හැරෙනු ලැබූ හා ඔබගේ සභා සහභාගීත්වයේ සාමාජිකයන් බවට පත් වූ ගණන අඩු නම්, ධර්ම ප්‍රචාරණය කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම තුළින් මෙය වෙනස් කළ හැක්කේ කෙසේද?

(3) ගැළවීම නොලත් අය වෙත ළඟා වීම සඳහා ඔබගේ සභාවට දැන්මම කළ හැක්කේ කුමක්ද?

(4) වඩා නව මය උත්සාහයන් වලට ඉඩ දීම සඳහා ඉවත් කළ හැකි දැනට පවතින එතරම් බලපෑමක් නොකරන වැඩසටහන් මොනවාද?

(5) සාමාජිකයන්ට ආත්මික දීමනා හඳුනාගෙන ධර්ම ප්‍රචාරණ කටයුතු සඳහා ඒවා යොදා ගැනීමට ඔබේ සභාවට උපකාර කළ හැක්කේ කෙසේද? (භාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "*සේවයේ යෙදවීමේ ක්‍රමවේද*" නම් පාඨමාලාවට මෙම කාර්යයේදී ඔබට උපකාර විය හැකිය)

(6) සමාජයට ශුභාරංචිය ගෙන යාමට ඔබගේ සභාවට ආරම්භ කළ හැක්කේ මොනවාද?

(7) ඔබේ රටට ශුභාරංචිය ගෙන යාමට ඔබේ සභාවට කළ හැක්කේ මොනවාද?

(8) වෙනත් රටවල් වලට ශුභාරංචිය ගෙනයාමට ඔබේ සභාවට කළ හැක්කේ මොනවාද?

(9) ඔබගේ සභාවට කෙතරම් ඉක්මනින් සාමාජිකයන් සඳහා විශේෂ පුහුණුවක් ලබා දිය හැකිද? (ඔබගේ සාමාජිකයන් පුහුණු කිරීමට ඔබට මෙම පාඨමාලාව පාවිච්චි කළ හැකිය. සුදුසු වේලාවක් හා මෙම සැසිය උගන්වන්නේ කවුද යන්න තිරණය කරන්න.)

(10) ඔබගේ සාමාන්‍ය සභා දේවමෙහෙයේදී ඔබට ගැළවීම නොලත් අය ඉලක්ක කළ හැක්කේ සහ ඔවුන්ට ශුභාරංචියට ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් දිය හැක්කේ කෙසේද?

(11) සමූහ ධර්ම ප්‍රචාරණය නමැති ක්ෂේත්‍රය තුළ ඔබගේ සභාවට කළ හැක්කේ මොනවාද? ඔබට ධර්ම ප්‍රචාරණ රැළියක් හෝ ප්‍රසංගයක් සැළසුම් කිරීමට හෝ රැස්වීමක් මෙහෙයවීමට වෙනත් සභාවක් සමඟ සම්බන්ධ වීමට හැකිද?

# දෙවන පරිච්ඡේදය

## ආඥාව

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- ධර්ම ප්‍රචාරණය පිළිබඳ ආඥාවට පදනම් වී ඇති ප්‍රතිපත්ති පහක් හඳුනාගැනීමට,
- ධර්ම ප්‍රචාරණයේ ආඥාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය දේවල් තුනක් හඳුනා ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **එම්බා දුෂ්ටය, නුඹ නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට කී කල්හි, තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ටයාට අවවාදකිරීමට නුඹ කථා නොකර සිටියොත්, දුෂ්ටවූ ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය කරන්නෙමි.**
> **(එසකියෙල්** 33:8)

## හැඳින්වීම

විවිධ හේතූන් උදෙසා මිනිස්සු ධර්ම ප්‍රචාරණයට සහභාගී වෙති. නව ඇදහිලිවන්තයන් බොහෝ විට තම වෙනස් වීමෙන් ඇතිවුනු උද්යෝගය හේතුවෙන් බොහෝ විට ධර්ම ප්‍රචාරණයට යොමුවෙයි. ඇතැම් පුද්ගලයන් ඔවුන්ගේ වැරදි හේතුවෙන් ධර්ම ප්‍රචාරණයට බලෙන් යොමු වී ඇත. තවත් සමහර අය තම පාසලට හෝ පුහුණු වැඩසටහනට එය අවශ්‍ය බැවින් ඊට යොමුවෙයි.

ධර්ම ප්‍රචාරණයට සහභාගී වීමේ දේව වචනයේ දැක්වෙන හේතුව එය ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ ආඥාවක් වීමයි. "ආඥාවක්" යනු කෙනෙකු විසින් තව කෙනෙකුට කරන නියෝගයකි. ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආඥාව මෙම පාඩමේ විෂය වේ.

## ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආඥාව

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම අනුගාමිකයන්ට ධර්ම ප්‍රචාරණය පිළිබඳව දුන් ආඥාව දේව වචනයේ උගන්වන ප්‍රතිපත්තීන් පහක් මත පදනම් වී තිබේ. මේවා නම් නියෝගය, තත්වය, සැලකිල්ල, තරඟය හා අවසානය පිළිබඳ ප්‍රතිපත්තීන්ය.

**නියෝගය :**

ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආඥාව පළමුවෙන්ම නියෝගය නැමති ප්‍රතිපත්තිය මත පදනම් වී ඇත. "මහ ආඥාව" ලෙසද හඳුන්වනු ලබන ධර්ම ප්‍රචාරණය යේසුස්වහන්සේ අවස්ථා කිහිපයකදී අණ කර ඇත. පහත සඳහන් කිරීම් ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආඥාව පිළිබඳව සලකා බලයි. සෑම බයිබල් කොටසක්ම කාර්යය පැහැදිලි කරන නමුත් ඒවා එකිනෙකට වෙනස් වේ. ඒවා එකිනෙකට පරස්පර විරෝධී නොවන නමුත්, ආඥාවේ විවිධ ස්වරූප විස්තර කරමින් එකිනෙකෙහි අඩුපාඩු සම්පූර්ණ කරයි.

මතෙව් හා යොහන් ධර්ම ප්‍රචාරණය කාර්යය උදෙසා වූ ආධිපත්‍ය පැහැදිලි කරයි. මතෙව්, මාර්ක් හා ලූක් මෙහෙවරේ ප්‍රමාණය පැහැදිලි කරයි. මතෙව්, ලූක්, යොහන් හා ක්‍රියා පොත් ශුද්ධාත්මයාණන් මෙම කාර්යය ඉටු කර ගැනීමේ බලවේගය ලෙස එළිදරව් කරයි. මාර්ක් පණිවුඩය සඳහන් කරන අතර ලූක් කරුණු එකතු කරයි. ධර්ම ප්‍රචාරණය පිණිස වූ ආඥාව තුළ ගෝලයන් සෑදීම, සෑම කෙනෙකුටම ශුභාරංචිය දේශනා කිරීම, ලෝකයේ සියලු දෙනාට පාපයෙන් පසුතැවිලි වීම හා කමාව ලැබීම ගැන දේශනා කිරීම, සමාවදීම, පාපය අතහැරීම හා යේසුස්වහන්සේ ගැන සාක්ෂි දැරීම යන කරුණු ඇතුළත්වන බව පහත බයිබල් පද එළිදරව් කරයි :

**එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්මකරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:19-20)**

**උන්වහන්සේ ඔවුන්ට කියනසේක්: නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරපල්ලා. අදහාගන්නාවූ බව්තීස්මය ලබන්නාවූ තැනැත්තේ ගළවනු ලබන්නේය; නුමුත් අදහා නොගන්නා තැනැත්තේ වරදට පත්කරනු ලබන්නේය. අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථාකරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය; ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:15-18)**

**මෙසේ ක්‍රිස්තුස්වහන්සේ වධවිඳින්ටත්, තුන්වෙනිදා මළවුන්ගෙන් නැගිටින්ටත්, යෙරුසලමේ පටන් සියලු ජාතීන්ට පසුතැවිල්ල සහ පව්කමාවද උන්වහන්සේගේ නාමයෙන් ප්‍රකාශකරනු ලබන්ටත් යුතුයයි ලියා තිබේ. නුඹලා මේ දේවලට සාක්ෂිකාරයෝය. (ලූක් 24:46-48)**

**යේසුස්වහන්සේ: නුඹලාට සමාදානය වේවයි නැවතත් ඔවුන්ට කියා-පියාණන්වහන්සේ මා එවූවාක්මෙන්ම මමත් නුඹලා යවමියි කීසේක. උන්වහන්සේ මෙසේ කියා, ඔවුන් දෙසට හුස්ම හෙළා: ශුද්ධාත්මයාණන් පිළිගනිල්ලා. යමෙකුගේ පව් නුඹලා කමාකරවුද ඒවා ඔවුන්ට කමාකරනු ලැබේ; යමෙකුගේ පව් නුඹලා කමා නොකරවුද ඒවා කමාකරනු නොලැබේයයි ඔවුන් කීසේක. (යොහන් 20:21-23)**

**නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

මෙම ආඥාවේ බරපතලකම පහත පද වලින් තහවුරු කරයි :

**එම්බා දුෂ්ටය, නුඹ නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට කී කල්හි, තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ටයාට අවවාදකිරීමට නුඹ කථා නොකර සිටියොත්, දුෂ්ටවූ ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය කරන්නෙමි.
(එසකියෙල් 33:8)**

**මක්නිසාද යමෙක් මා ගැනත් මාගේ වචන ගැනත් ලජ්ජාවන්නේද, මනුෂ්‍ය පුත්‍රයා තමන්ගේද පියාණන්ගේද ශුද්ධවූ දේවදූතයන්ගේද තේජසින් යුක්තව එන කල උන්වහන්සේ ඔහු ගැනත් ලජ්ජාවනසේක. (ලූක් 9:26)**

## තත්වය :

ධර්ම ප්‍රචාරණය පිළිබඳ ආඥාව දී ඇත්තේ ලෝකය නමැති ගොයමේ තත්වය ද සලකා බලා වේ. පාපයේ අතරමංව, බලාපොරොත්තු විරහිතව, දෙවියන්වහන්සේගෙන් තොර වූ සදාකාලික ජීවිතයක් වෙත යන මිනිසුන් සිය දහස් ගණනක් අපට දැකගත හැකිය. ගොයමේ පවතින හදිසි තත්වය අපව ක්‍රියාත්මක වීමට පෙළඹවිය යුතුය. ගොයම පැසී ඇති නමුත් සේවකයන් මද බව යේසුස්වහන්සේ පැවසූ සේක :

**උන්වහන්සේ ඔවුන්ට කථාකොට: ගොයම බොහෝය, මෙහෙකරුවෝ ස්වල්ප දෙනෙක්ය. ඒ නිසා තමන්ගේ ගොයම් කැපීමට මෙහෙකරුවන් එවන ලෙස ගොයමේ ස්වාමීන්වහන්සේට යාච්ඤා කරපල්ලා. (ලූක් 10:2)**

**තව සාරමසක් ගිය කල ගොයම් කපන කාලය පැමිණෙන්නේයයි නුඹලා කියනවා නොවේද? මම නුඹලාට කියමි-නුඹලාගේ ඇස් ඔසවා කුඹුරු දෙසට යොමා, ගොයම් දැනටම කැපීමට පැහී තිබෙන බව බලාපල්ලා. (යොහන් 4:35)**

## සැලකිල්ල :

ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආශාව සැලකිලිමත් බවේ ප්‍රතිපත්තිය මතද පදනම් වේ. ධර්ම ප්‍රචාරණය විනාශ වූවන් සඳහා අනුකම්පා සහගත හදවතකින් සිදු කළ යුතුය. පාවුල් විනාශ වූවන් උදෙසා වූ මෙම දිව්‍යමය අනුකම්පාවෙන් පිරී සිටියේය. ඔහුගේ යුදෙව් සහෝදරයන් ගැළවීම ලබන්නේ නම්, දෙවියන්වහන්සේගෙන් තමා පිටට ශාපය ලබා ගැනීමට පවා ඔහු සූදානමෙන් සිටියේය. ඔහු මරණ බවට ඔවුන් තර්ජනය කරද්දී සහ ඔවුන්ගේ අත් වලින් ඔහුට පීඩා කරනු ලබද්දීත් ඔහු ඔවුන් වෙතට ගියේය.

යේසුස්වහන්සේ තුළ වූ අනුකම්පාව උන්වහන්සේ කැමැත්තෙන් කල්වරි කුරුසියේදී මරණය ලැබීමට සූදානම් කළේය. යෙරුසලමේ ආගමික නායකයන්ගේ අන්ධකම ගැන යේසුස්වහන්සේ වැළපුන සේක. අපගේ දෑස් වල මිට වඩා අනුකම්පාවේ කඳුළු වූයේ නම්, නිරය තුළ නැතිවූවන් අතර වැළපීම තවත් අඩු වනු ඇත. තර්ක කිරීම ආත්ම ගළවන්නේ නැත. කෙනෙකු ළඟ සත්‍ය තිබිය හැකිය නමුත්, ප්‍රේමයෙන් හා අනුකම්පාවෙන් යුතුව එය පවසනු නොලැබුවහොත් එය ප්‍රාණවත් වනවාට වඩා මරා දමනු ඇත. ප්‍රේමය සියල්ල ඉවසමින්, සියල්ල දරාගෙන හා කිසිදා පහ නොවන බැවින් (1 කොරින්ති 13:4,7,8) අනුකම්පාව වෙහෙස නොබලා කරන ධර්ම ප්‍රචාරණ කාර්යයක් වෙත මෙහෙයවනු ඇත. එවැනි ප්‍රේමණීය අනුකම්පාවක් ලැබෙන්නේ දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ගෙනි. එය ශුද්ධාත්මයාණන් ඔබ තුළ පැවතීම නිසා වර්ධනය වන උන්වහන්සේගේ ඵලයකි.

## තරඟය :

ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආශාව තරඟකාරීත්වය පිළිබඳ ප්‍රතිපත්තිය මතද පදනම්ව තිබේ. වෙනසක් උදෙසා පිපාසිතව සිටින අපගේ විශ්වීය අසල්වැසියන් අප විසින් දිනාගනු නොලැබුවහොත්, අනෙකුත් තරඟකාරී දේශපාලනමය හා ආගමික බලවේග විසින් ඔවුන් දිනාගනු ඇත. ආත්මික පිපාසය මිනිසුන්ට හා ස්ත්‍රීන්ට සත්‍ය සොයා යෑමට පොළඹවයි :

> **බලව, හානියක්, එනම් කෑම හානියක්වත් වතුර පිපාසයක්වත් නොව ස්වාමීන්වහන්සේගේ වචන ඇසීමේ හානියක්, මා විසින් දේශයට එවන දවස් පැමිණෙන්නේය. එවිට මනුෂ්‍යයෝ ස්වාමීන්වහන්සේගේ වචනය සොයන පිණිස මුහුදෙන් මුහුදට ගමන්කරන්නෝය, උතුරේ සිට නැගෙනහිරටද ඔබ මොබ දුවනවා ඇත, නුමුත් ඔවුන්ට සම්බවෙන්නේ නැත.**
> **(ආමොස් 8:11-12)**

ආත්මික පිපාසය සත්‍ය සෙවීම වෙත යොමු කරනු ලැබූවන් එම හිස්බව සත්‍යයෙන් පුරවනු නොලැබුවහොත් නපුරු දේශපාලන පද්ධති, ඇදහිලි හා විරුද්ධවාදී ආගමික බලවේග පිළිගැනීම සිදුවිය හැකිය.

සතුරා කුඹුරේ බීජ වැපිරීම පිළිබඳ උපමාවේදී යේසුස්වහන්සේ තරඟකාරීත්වය පිළිබඳ ප්‍රතිපත්තිය ඉගැන්වූ සේක. අප දේව වචනය නමැති යහපත් බීජ වැපිරීම හා නෙලා ගැනීම සිදු නොකළහොත්, සතුරා නපුරේ බීජ වපුරනු ඇත. එවැනි නපුරේ තරඟය තුළින් ආත්මික කටු පඳුරු හා වල් පැලෑටි වලින් දේව වචනයට අවහිර කර ශුභාරංචියේ පැතිරීමට බාධා කරනු ඇත.

## අවසානය :

ධර්ම ප්‍රචාරණය උදෙසා වූ ආශාව සියලු දේවල් වල අවසානය නමැති ප්‍රතිපත්තිය මතද පදනම් වී තිබේ. අප දැන් දන්නා ආකාරය විශ්වීය ධර්ම ප්‍රචාරණය උන්වහන්සේගේ පැමිණීමට හා කාලයන්ගේ අවසානයට පෙර සිදුවන දෙයක් බව යේසුස්වහන්සේ පැවසූ සේක :

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශකරනු ලබන්නේය; එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

# ආශාව සම්පූර්ණ කරන ආකාරය

සභාව මේ ලෝකය තුළ දේව රාජ්‍යයේ නියෝජිතයා වන අතර පොළොවේ සියලු මිනිසුන් වෙතට ශුභාරංචි පණිවුඩය ගෙන යන ලෙසට එයට අණ කර තිබේ. කෙසේ වෙතත් අද දවසේ සාමාන්‍ය සභාවක ප්‍රමුඛත්වයන්, වැඩසටහන් හා ක්‍රියාකාරකම් දෙස බැලූ විට, ඇදහිලිවන්තයන් ලෙස අපගේ සේවය අපට අමතක වී ඇතිද හෝ ඒ පිළිබඳ අපහැදිලිතා මතු වී ඇතිදැයි සිතේ.

අප කාර්යය බහුලය, නමුත් කුමකින්ද? කොයිතරම් වැඩසටහන්, රැස්වීම් හා ක්‍රියාකාරකම් ප්‍රමාණයක් සැබවින්ම නව ඇදහිලිවන්තයන් ඇති කරනවාද? විචිත්‍රවත් දේශනා සහ විනෝදජනක කතාන්දර සමඟ නිසරු ධර්ම දේශකයන් අපට සිටී. බයිබලයේ දැක්වෙන කාලයේදී එක් ප්‍රසිද්ධ දේශනාවකින් තුන් දහසක් වෙනස් කරනු ලැබිය. අද බොහෝ විට දේශනා තුන් දහසකින් පමණ වුවද සිදු වන්නේ වෙනස්වීම් කිහිපයක් පමණි.

ගීතිකා කණ්ඩායම්, ගායකයන් හා සංගීතඥයින්ගේ හැකියාවන් පමණක් ප්‍රදර්ශනය කරන අලංකාර ආගමික සංගීතයන් බොහොමයක් තිබේ. නමුත් ආත්ම කීයක් දිනාගතහැකිද? ජීවිත කීයක් වෙනස් වේද? ආත්මික අස්වැන්න ගැන කිසිඳු සැකිල්ලක් නැති දහස් ගණනක් වූ සාම්ප්‍රදායික කිතුනුවන් මෙයට එක් කළ විට "ධර්ම ප්‍රචාරණයේ කාර්යය කිසි දිනක ළඟා කරගන්නේ කෙසේද?"යි අපට ප්‍රශ්න කළ හැකිය.

අපට ධර්ම ප්‍රචාරණයේ ආඥාව සම්පූර්ණ කිරීමට කරුණු 03 ක් අවශ්‍ය වේ :

## ඊට ප්‍රමුඛත්වය දිය යුතුය :

ධර්ම ප්‍රචාරණයට ප්‍රමුඛත්වය දිය යුතුය. ලෝකයේ සියලු පුද්ගලයන්ට ශුභාරංචිය ගෙන යාමේ කාර්යයට අප මුල්තැන දිය යුතුය. අපගේ දේශනාකිරීම්, යාච්ඤාකිරීම්, අධ්‍යයනයන්, සැළසුම්, වැඩසටහන්, ඉගැන්වීම්, පුහුණුකිරීම් යන සියලු දේ මෙම අරමුණ වටා පැවතිය යුතුය.

සභාව විවේකය හෝ විනෝදය උදෙසා පවතින තැනක් වෙනුවට සේවකයන් පිටත්කර හරින තැනක් විය යුතුය. සභාවේ සියලුම ක්‍රියාකාරකම් ආත්ම දිනන්නන් සන්නද්ධ කිරීමට සෘජුව දායක විය යුතුය. සභාවේ නායකයන් ධර්මදූත කාර්යය සඳහා ඇදහිලිවන්තයන් දිරිමත් කරන හා පුහුණු කරන, ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ක්‍රියාවේ යොදවන්නන් විය යුතුය.

## එය ශුද්ධාත්මයාණන් තුළින් බලගැන්විය යුතුය :

නව ගිවිසුමේ දැක්වෙන ධර්ම ප්‍රචාරණය මෘදු හෝ උදාසීන ක්‍රියාවක් නොවේ. එය ශුද්ධාත්මයාණන්වහන්සේගේ හා නපුරේ බලවේග වල බල ගැටුමකි. ශුද්ධාත්මයාණන්වහන්සේ සියලු පල, දීමනා බලයන් සමඟ උන්වහන්සේ අප ජීවිත තුළ යාථාර්ථයක් විය යුතුය. බලයේ ප්‍රකාශ වීමක් සමඟ වචනය දේශනා කිරීම හා ඉගැන්වීම සිදු විය යුතුය. ශුභාරංචිය සමාව අයදින, දියාරු කළ, වෙනස් කළ හෝ වෙස් වලා ගත් ස්වභාවයක් ලෙස නොපවසා, එය ප්‍රකාශ කළ යුතුය. ධර්ම ප්‍රචාරණ කාර්යය ඉටුකර ගැනීම සඳහා සම්පත් වශයෙන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සෑම සාමාජිකයෙකුම සතු ආත්මික දීමනා පාවිච්චි කළ යුතුය. ශුභාරංචියේ සත්‍ය උදෙසා සාක්ෂියක් වීමේ හැකියාව අපට ලැබෙන පරිදි අප අපගේ ලෞකික ස්වභාවය ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට සමාන හැසිරීමකට මාරු කරගත යුතුය.

## එය නව ගිවිසුම් රටාවන් අනුගමනය කළ යුතුය :

අප මෙම ආඥාව සම්පූර්ණ කිරීමට නම්, අප නව ගිවිසුමේ ධර්ම ප්‍රචාරණ රටාවන් යළි නිර්මාණය කළ යුතුය : එනම් හැම කෙනෙක්ම, හැම තැනකදීම, හැම වේලාවකදීම සාක්ෂි දැරීම හා ආත්ම දිනාගැනීමයි. නව ගිවිසුම් කාලයේදී මෙන්, ධර්ම ප්‍රචාරණය එදිනෙදා ජීවිතයේ ස්වාභාවික කොටසක් බවට පත්විය යුතුය. සෑම නිකායක්ම, සෑම ප්‍රාදේශීය සභාවක්ම, සෑම කිතුනු නායකයෙක්ම, සෑම නිවසක්ම හා සෑම පුද්ගලයෙක්ම මෙම කාර්යයට යොමුවිය යුතුය.

## ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ධර්ම ප්‍රචාරණය පිළිබඳ ආඥාව පදනම් වී ඇති ප්‍රතිපත්තීන් පහ ලියන්න.

3. ධර්ම ප්‍රචාරණයේ ආඥාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය දේවල් තුනක් හඳුනාගන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ධර්ම ප්‍රචාරණය සඳහා වූ කැඳවීම විකල්පයක් හෝ යෝජනාවක් හෝ නොවේ. එය ආඥාවකි. මහා ආඥාව පිළිබඳ විවිධ බයිබලීය වාර්තා සංසන්දනය කරන පහත වගුව අධ්‍යයනය කරන්න. සෑම බයිබල් පදයක්ම ඔබේ බයිබලයෙන් බලන්න. ආඥාව සම්පූර්ණ කිරීමට ඔබට ඇති ආධිපත්‍ය වටහා ගන්න. ඔබේ සේවයේ ප්‍රමාණය, එහි පණිවුඩය සහ වැඩි වීමේ ක්‍රියාවලියට සහභාගි වීමට ඔබ විසින් කළ යුතු ක්‍රියාකාරකම් ආදිය නිරීක්ෂණය කරන්න.

| බයිබල් පදය | ආධිපත්‍ය | ප්‍රමාණය | පණිවුඩය | ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|
| මතෙව් 28:18-20 | "සියලු ආධිපත්‍ය" | සියලු ජාතීන් | යේසුස්වහන්සේ අණකළ සියලු දේ | බව්තිස්මය හා ඉගැන්වීම තුළින් ගෝලයන් බිහි කිරීම |
| මාර්ක් 16:15 | යේසුස් වහන්සේගේ නාමය. | මුළු ලෝකයට, සෑම ජීවියෙකුටම | ශුභාරංචිය රෝගීන් සුවකිරීම | ගොස් දේශනා කරන්න. |
| ලූක් 24:46-49 | යේසුස් වහන්සේගේ නාමය. | යෙරුසලමෙන් පටන්ගෙන සියලු ජාතීන්ට. | පාපය උදෙසා පසුතැවීම හා පව්කමාව. | දේශනා කිරීම, ප්‍රකාශ කිරීම හා සාක්ෂිදැරීම. |
| යොහන් 20:21 | යේසුස්වහන්සේ පියාණන් එවූ ලෙසට උන්වහන්සේ විසින් යවනු ලැබීම. | (සේවයේ ප්‍රමාණය, පණිවුඩය හා ක්‍රියාකාරකම් "යේසුස්වහන්සේ" හා සමාන විය යුතුය.) | | |
| ක්‍රියා 1:8 | ශුද්ධාත්මයාණන්ගේ බලය. | යෙරුසලම යුදය, සමාරිය හා ලෝකයේ ඉතාම දුෂ්කර ප්‍රදේශ. | ක්‍රිස්තුස්වහන්සේ | සාක්ෂිදැරීම. |

2. දේව වචනය තුළ ධර්ම ප්‍රචාරණය සඳහා පැහැදිලි ආඥාවක් දී තිබියදීත්, බොහෝ කිතුනුවන් මෙම මහා ආඥාව සම්පූර්ණ කිරීමට කැමැත්තක් නොදක්වන්නේ ඇයි? ධර්ම ප්‍රචාරණයට ඇති සුලභ බාධාවන් කිහිපයක් පහත දැක්වේ :

### හැකියාව මඳ බව :

බොහෝ පුද්ගලයන්ට ධර්ම ප්‍රචාරණයට හැකියාවක් මඳ බව හැඟීම නිසා ඔවුන් ධර්ම ප්‍රචාරණයෙන් වැළකී සිටිති. ඔවුන්ට විධිමත් අධ්‍යාපනයක් හෝ බයිබලය හා ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳ දැනුම මඳ විය හැකිය. ඇතැම් පුද්ගලයන්ට ඇත්තෙන්ම හැකියාව මඳ නොවේ, නමුත් ඔවුන්ට දුර්වල ආත්ම ප්‍රතිබිම්බයක් හෝ බොරු යටහත් කමක් ඇත.

දෙවියන්වහන්සේ මහත් දේවල් කිරීමට දුර්වල පුද්ගලයන් කැඳවන බව හැමවිටම මතක තබාගන්න. විනිශ්වයකාරයන්ගේ පොතේ 6 සිට 8 පරිච්ඡේද වල සඳහන් ගිඩියොන්ගේ කතාව කියවන්න. දෙවියන්වහන්සේ උදෙසා ශ්‍රේෂ්ඨ මෙහෙයක් උදෙසා ගිඩියොන්ව කැඳවනු ලබන විට, ඔහු සතුරාට බිය හේතුවෙන් සැඟවී සිටියේය. ඔහුගේ ප්‍රතිචාරය වූයේ, "මා මෙය කරන්නේ කෙසේද? මාගේ පවුල දිළිඳුය, මමද පවුලේ බාලයා වෙමි"යි

ඉශ්‍රායෙල් ජාතියට නායකත්වය දීමට මෝසෙස් කැඳවනු ලැබූ විට ඒ හා සමානම පිළිතුරක් දුන්නේය. “මම කවුද? මීට ප්‍රථමවත් ඔබ තමන් මෙහෙකරුවාට කථා කළාට පසුවත් මම වාක්තයෙක් නොවෙමි. මක්නිසාද කථාවට අදක්ෂ වූ අදක්ෂ දිමක් ඇත්තාවූ කෙනෙක්මි” යි ඔහු පැවසුවේය (නික්මයාම 3-4). තමා තවමත් දරුවකු වන බවත් දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කරනු ලැබීමට කිසිසේත් නුසුදුසු බවත් යෙරමියා දිවැසිවරයා පැවසුවේය (යෙරමියා 1:4-9).

ධර්ම ප්‍රචාරණයට හැකියාව මදයැයි හැඟෙන මිනිසුන් දෙවියන්වහන්සේ පොරොන්දු වී ඇති ප්‍රඥාව උන්වහන්සේගෙන් ඉල්ලා සිටිය යුතුය (යාකොබ් 1:5). දෙවියන්වහන්සේට මහිමය ලැබිය හැකිවන ලෙස උන්වහන්සේ ස්වාභාවික හැකියාවක් නොමැති අය පාවිච්චි කරන බවද ඔවුන් දැනගත යුතුය (1 කොරින්ති 1:27-29).

## නොවැදගත් උත්සාහයක් :

නෙළා ගතයුතු අස්වැන්න ඉතා විශාල බැවින් තම උත්සාහය නොවැදගත් වනු ඇතැයි හැඟීම නිසා බොහෝ පුද්ගලයන් කිසිවක් නොකරයි. මිථ්‍යාදෘෂ්ටික අන්ධකාරයේ අතරමංව සිටින මිලියන ගණනක් මිනිසුන් වෙනුවෙන් එක් පුද්ගලයෙකුට යමක් කළ හැක්කේ කෙසේද? මිනිසාට නොව දෙවියන්වහන්සේට ගෞරවය ලැබෙන පිණිස ගිඩියොන්ගේ හමුදාවේ ප්‍රමාණය අඩු කරනු ලැබූ ආකාරය ඔබට මතක් වනු ඇත (විනිශ්චයකාරයා 7). නොවැදගත් උත්සාහයන් රැගෙන ඒවා තම අරමුණු ඉටු කර ගැනීම උදෙසා පාවිච්චි කිරීමට දෙවියන්වහන්සේ ඉතා කැමතිය. එක් පුද්ගලයෙකු, සෑම වසරකදීම එක් පුද්ගලයෙකු දිනාගෙන ඉගැන්වීම තුළින්, කෙටි කාලයක් තුළදී සැබවින්ම ඇදහිලිවන්තයන් දහස් ගණනක් නඟා සිටුවිය හැක්කේ කෙසේද යන්න මෙම අධ්‍යයනයේදී ඉදිරියට ඔබ ඉගෙන ගනු ඇත. එක් ආලෝකයකට තනිවම අන්ධකාරය දුරු කළ නොහැකි නමුත්, එකවර දල්වන ලද, කුඩා ගිනිදැල් බොහොමයක්, අවසානයේදී මහත් ආලෝකයක් නිර්මාණය කරයි.

## බිය :

තමන් සාක්ෂි දරන අය විසින් තමා ප්‍රතික්ෂේප කරනු ලැබේ යැයි මිනිසුන් බිය වේ. ඔවුන් ධර්මදූත ක්‍රමවේද ගැන හොඳින් නොදන්නේ නම්, ඔවුන් නොදන්නා දෙයට බිය වේ. ඔවුන්ට පාලනය කරගත නොහැකි තත්වයක් නිසා හෝ පිළිතුරු ලබාදිය නොහැකි ප්‍රශ්නයක් නිසා ඔවුන් ලැජ්ජාවට පත්වනු ඇතැයි ඔවුන් බිය වේ. ධර්ම ප්‍රචාරණය පිළිබඳ බිය සාමාන්‍යයෙන් ඇති වන්නේ පහත ප්‍රශ්න හේතුවෙනි :

- මා පවසන්නේ මොනවාද? මෙම පාඨමාලාවේ තුන්වන පරිච්ඡේදයේදී ඉදිරිපත් කළ යුතු පණිවුඩය ඔබ ඉගෙන ගනු ඇත.

- මා එය පැවසිය යුත්තේ කෙසේද? මෙම පාඨමාලාවේ පස්වන පරිච්ඡේදයේදී පණිවුඩය සන්නිවේදනය කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත.

- මම අපහසුතාවයන් සමඟ ගනුදෙනු කරන්නේ කෙසේද? මෙම අත්පොතේ දහවන පරිච්ඡේදය ඔබ ධර්ම ප්‍රචාරණය කරන විට පැන නඟින අපහසුතා සමඟ ගනුදෙනු කළ යුතු ආකාරය පැහැදිලි කරයි.

- මට යම් ප්‍රශ්නයකට පිළිතුරු දිය නොහැකි වුවහොත් කුමක් සිදුවේද? ඔබ යම් ප්‍රශ්නයකට පිළිතුරු දිය නොහැකි වුවහොත් එය භාර ගන්න. ඔබ ඒ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කර එයට පිළිතුරක් ලබා දෙන බව එම පුද්ගලයාට පවසන්න.

- මා කෙනෙකුව තරහ ගැස්සුවහොත් කුමක් සිදුවේද? සාමාන්‍යයෙන් මිනිසුන්ට තරහව ගෙන දෙන්නේ දෙවියන්වහන්සේ පිළිබඳ අවංක කතාවන් නොව, සියල්ලටම පිළිතුරු ඇති සේ පෙන්වීම, කෝපය හෝ භේදය නැමති දේ මඟිනි. ඔබේ ප්‍රවේශයේදී ඔබ ප්‍රේමණීය හා අවංක වන නමුත් මිනිසුන් තවමත් තරහ ගනී නම්, ඔබ පොළොවේ ලුණු බව මතක තබා ගන්න. ස්වභාවික ලෝකය තුළ, තුවාලයකට ලුණු දැමූ විට මුලින්ම ඇති වන්නේ අප්‍රසන්න ප්‍රතික්‍රියාවකි, නමුත් එහි ප්‍රතිඵලය සුවය ලැබීමයි. ආත්මික ලෝකය තුළද මෙය සැබෑවකි.

- මා අසමත් වුවහොත් කුමක් සිදුවේද? උත්සාහ නොකර සිටීමට වඩා උත්සාහ කර අසමත් වීම යහපත්ය. ධර්ම ප්‍රචාරණයේදී ප්‍රධාන ලෙස සලකනුයේ සාර්ථක වීම හෝ අසමත් වීම

නොවේ. ඔබ කැඳවා ඇත්තේ විශ්වාසවන්ත වීමටය. වපුරන්නාගේ උපමාව තුළ අසමත් වීමේ ආකාර තුනක් වාර්තා වේ (මාර්ක් 4:1-20). මෙම පරිච්ජේදයේම පසුව, ධාන්‍ය නිපදවන්නේ වපුරන්නා විසින් නොව, ශුද්ධාත්මයාණන් මඟින් සුදානම් කළ පස තුළින් බව මාර්ක් අපට පවසයි. කෙසේ වෙතත්, කැපවීම උදෙසා වූ කැඳවීමෙන් ගැළවීමට නිදහසට කරුණක් ලෙස මෙය පාවිච්චි නොකළ යුතුය. අපව කැඳවා ඇත්තේ මසුන් අල්ලන්නන් මෙන් මිනිසුන්ගේ ආත්ම අල්ලා ගැනීමට මිස ඒවාට බලපෑමක් කිරීමට පමණක් නොවේ.

## හුදකලාවීම :

අපට නොඇදහිලිවන්තයන් සමඟ සම්බන්ධතා නොමැති බැවින් බොහෝවිට ධර්ම ප්‍රචාරණයට බාධා ඇති වේ. ඔබගේ සියලුම මිතුරන් හා සම්බන්ධතා ඇති අය කිතුනුවන් නම්, ඔබට විනාශ වුවන් දිනා ගැනීමට නොහැකි වනු ඇත. ඔබට නොඇදහිලිවන්තයන් සමඟ සම්බන්ධකම් නොමැති නම් ඔබට ඔවුන්ව දිනා ගැනීමටද නොහැකිය.

## ප්‍රමාණවත් නොවීම :

ප්‍රමාණවත් තරම් කාලය හා අභිප්‍රාය නොමැති වීම ධර්ම ප්‍රචාරණයේ ආඥාව සම්පූර්ණ කිරීමේදී මිනිසුන්ට බාධා ඇති කරයි. නමුත් කෙසේ වෙතත්...ඔබට කිරීමට කැමති සහ එය කිරීම අත්‍යවශ්‍ය බව ඔබට හැඟෙන දේවල් උදෙසා ඔබ සැමවිටම කාලය සොයා ගන්නා බව සැමවිටම මතක තබා ගන්න. ඔබට ශුභාරංචිය බෙදාගැනීමට කාලය නොමැතිනම්, ඒ එසේ කිරීමට ඔබ අකමැති නිසා හෝ එහි අවශ්‍යතාවය ඔබට නොහැඟෙන නිසාය. ඔබ ඔබගේ ප්‍රමුඛතාවයන් නැවත සලකා බැලිය යුතුය.

අභිප්‍රාය මද බව සාමාන්‍යයෙන් ඇති වන්නේ අත්දැකීම් මදබව නිසාය. තම ඇදහිල්ල බෙදාගැනීම සම්බන්ධයෙන් නව අදහිලිවන්තයන් කෙතරම් උද්යෝගිමත් ද යන්න ඔබ සලකා බලා තිබෙනවාද? මෙසේ වන්නේ ඔවුන්ගේ අත්දැකීම නැවුම් හා උද්යෝගිමත් වන බැවිනි. ඔබ ප්‍රවේසම් නොවුණහොත්, ඔබ දෙවියන්වහන්සේ සමඟ නැවුම් හා ප්‍රාණවත් සම්බන්ධතාවයක් පවත්වා නොගතහොත් පසු කාලෙකදී ඔබට මෙය අහිමි වනු ඇත.

## ආත්මික නොමේරූ බව :

ඇදහිලිවන්තයන්ට අන් අය සමඟ ශුභාරංචිය බෙදාගත හැකි විය යුතු නමුත්, ආත්මික නොමේරූ බව නිසා ඔවුන්ට එය කළ නොහැකි බව පාවුල් පැවසුවේය (හෙබ්‍රෙව් 5:12). ආත්මික නොමේරූබව එළිදරව් වන්නේ ඇදහිලිවන්තයන් අතර ගැටුම් ඇතිවන විටය (1 කොරින්ති 3:1-3). ක්‍රිස්තුස්වහන්සේ තුළ ඔබගේ සහෝදර සහෝදරියන් සමඟ දබර කර ගැනීමෙන් ඔබ කාර්යබහුල වූ විට, ඔබට ධර්ම ප්‍රචාරණයට කාලය නැත.

3. දැන් ධර්ම ප්‍රචාරණයට බාධා කරන පොදු කරුණු ඔබ ඉගෙන ගෙන තිබේ. පහත ප්‍රකාශයන් කියවා ඔබේ හැඟීම් විස්තර කරන්නේ මොනවාදැයි පරීක්ෂා කර බලන්න :

## හැකියාව මද බව :

----- පැවසිය යුත්තේ මොනවාදැයි මම දන්නේ නැත.
----- මට බයිබලය ඉතා හොඳින් වැටහෙන්නේ නැත.
----- මම වෙනත් අයට කතා කිරීමට දක්ෂතාවයක් නැත.

## නොවැදගත් උත්සාහයක් :

----- මම තනි පුද්ගලයෙක් බැවින් මට වෙනසක් කළ නොහැකියයි මට හැඟේ.
----- ධර්ම ප්‍රචාරණ කාර්යය මාවද යටපත් කර දමන තරම් මහත්ය.

## බිය :

----- මා අනෙක් අයව තරහා ගන්වනු ඇතැයි මට බිය සිතේ.
----- මා අසමත් වනු ඇතැයි මට බියක් තිබේ.
----- මට ප්‍රශ්න වලට පිළිතුරු දිය නොහැකි වේයැයි බියක් තිබේ.

----- මම ලැජ්ජාවට පත්වනු ඇතැයි බියක් තිබේ.
----- පැවසිය යුත්තේ මොනවාදැයි මම දන්නේ නැත.

**හුදෙකලාව :**

----- මට නොඇදහිලිවන්තයන් සමඟ සම්බන්ධතා නොමැත.

**ප්‍රමාණවත් නොවීම :**

----- මට ධර්ම ප්‍රචාරණය සඳහා වැය කිරීමට කාලය නොමැත.
----- මට ධර්ම ප්‍රචාරණයට උනන්දුවක් නොමැත.

**ආත්මික නොමේරුබව :**

----- අන් අය සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට තරම් මා ආත්මිකව මෝරා ඇතැයි මට නොහැඟේ.
----- ස්වාමින්වහන්සේ තුළ අනෙකුත් සහෝදර සහෝදරියන් සමඟ මට නිතරම ප්‍රශ්න ඇති වේ.

4. ඔබ ඉහත සලකා බැලූ අවස්ථා නැවත සලකා බලන්න. ඔබ සළකුණු කළ සෑම අවස්ථාවක් අසලින්ම පුහුණුව, අධ්‍යයනය, අභ්‍යාසය, යාච්ඤාව හෝ ඔබගේ ප්‍රමුඛතා වෙනස් කිරීම මඟින් ඔබට බාධාව සමඟ ගනුදෙනු කළ හැකිදැයි ලියන්න.

5. ලැයිස්තුවේ ඇති අවස්ථා වලින් ඔබට බාධා කරන්නේ මොනවාද? ඔබට මේවායින් ජය ගත හැක්කේ කෙසේද?

# තුන් වන පරිච්ඡේදය

## පණිවුඩය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "රාජ්‍යයේ ශුභාරංචිය" නිර්වචනය කිරීමට
- ශුභාරංචියේ මූලිකාංග සාරාංශගත කිරීමට
- ශුභාරංචිය විශ්වීය වන ආකාර හතරක් ලියා දැක්වීමට
- ශුභාරංචිය බලවත් වන්නේ ඇයි දැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි, එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්,**
> **(1 කොරින්ති 15:3-4)**

## හැඳින්වීම

ලෝකයට ශුභාරංචිය ගෙන යාමට දෙවියන්වහන්සේට විශේෂ සැළැස්මක් තිබේ. යේසුස්වහන්සේ තම ගෝලයන්ට මෙලෙස පවසමින් මෙම සැළැස්ම එළිදරව් කළ සේක...

> **නුමුත් ශුද්ධාත්මයාණන්වහන්සේ නුඹලා කෙරෙහි පැමිණි කල නුඹලා බලය ලබන්නහුය. එවිට නුඹලා යෙරුසලමෙහිද මුළු යුදයෙහිද සමාරියෙහිද පොළොවේ සීමාව දක්වාද මාගේ සාක්ෂිකාරයෝ වන්නහුයයි කීසේක. (ක්‍රියා 1:8)**

මෙම පදය ධර්ම ප්‍රචාරණය පිළිබඳ දෙවියන්වහන්සේගේ සැළැස්ම පිළිබඳ කරුණු කිහිපයක් එළිදරව් කරයි :

- පණිවුඩයේ අන්තර්ගතය යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.
- ශුභාරංචියේ පණිවුඩකරුවන් වනුයේ ශුද්ධාත්මයාණන්වහන්සේ නමැති බලවත් බලවේගය. මඟින් හැකියාව ලබා දුන් ගෝලයන්ය.
- පණිවුඩය ලැබිය යුත්තන් වනුයේ මුළු මහත් ලෝකයම වේ.

මෙම පාඩමේදී ශුභාරංචි පණිවුඩයේ අන්තර්ගතය පිළිබඳව ඔබ ඉගෙන ගනු ඇත. හතරවන පරිච්ඡේදයේදී, ශුද්ධාත්මයාණන් මඟින් බලගන්වනු ලැබූ ඇදහිලිවන්තයන් වන ශුභාරංචියේ පණිවුඩකරුවන් ගැන ඔබ ඉගෙන ගනු ඇත. පස්වන පරිච්ඡේදය පණිවුඩකරුවන් පණිවුඩය සන්නිවේදනය කළ යුතු ආකාරය පැහැදිලි කරන අතර හයවන පරිච්ඡේදය පණිවුඩය ලබන පුද්ගලයන් ගැන සළකා බලයි.

## දේව රාජ්‍යයේ ශුභාරංචිය

**යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක :**

> **රාජ්‍යයේ මේ ශුභාරංචිය සියලු ජාතීන්ට සාක්ෂියක් පිණිස ලොව මුළුල්ලේ ප්‍රකාශකරනු ලබන්නේය; එවිට අන්තිමය පැමිණෙන්නේය. (මතෙව් 24:14)**

ධර්ම ප්‍රචාරණයේ පණිවුඩය රාජ්‍යයේ ශුභාරංචියයි. ශුභාරංචිය යන වචනයේ සැබෑ අර්ථය "යහපත් ආරංචිය" යන්නයි. බයිබලිය කෝණයකින් අප ශුභාරංචිය ගැන කතා කරන විට, ඉන් අදහස් වන්නේ දේව රාජ්‍යය පිළිබඳව සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් වූ ගැළවීම පිළිබඳව වේ.

රෝම 1:1 දී "දෙවියන්වහන්සේගේ ශුභාරංචිය" යනුවෙන් ශුභාරංචිය හඳුන්වා දී ඇත. රෝම 2:16 දී එය "පාවුල්ගේ ශුභාරංචිය" ලෙස හඳුන්වයි. රෝම 1:16 දී එය "ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචියයි". දෙවියන්වහන්සේ ශුභාරංචියේ කතුවරයාණෝ වන අතර, ක්‍රිස්තුස්වහන්සේ එහි තේමාවද, මිනිසා එය ලබාගන්නා කෙනා ද වන බැවින් මෙම පද අතර නොගැළපීමක් නැත.

## ශුභාරංචියේ මූලිකාංග

1 කොරින්ති 15:1-4 දක්වා පාවුල් විසින් ශුභාරංචියේ මූලිකාංග ඉදිරිපත් කර තිබේ.

> **තවද, සහෝදරයෙනි, මම නුඹලාට දේශනාකළාවූ, නුඹලා පිළිගත්තාවූ, නුඹලා පිහිටා සිටින්නාවූ, නුඹලා ගැළවීමට පැමිණෙවූවාවූ ශුභාරංචිය නුඹලාට දන්වමි. මා නුඹලාට ප්‍රකාශකළ කාරණා නුඹලා අල්ලාගෙන සිටින්නහු නම්, කුමන වචනවලින් එය නුඹලාට දේශනාකෙළෙම්දැයි දන්වමි. නැත්නම් නුඹලා නිෂ්ඵලලෙස ඇදහූවහුය. ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි, එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්, (1 කොරින්ති 15: 1-4)**

මූලික ශුභාරංචි පණිවුඩය නම් දේව වචනයට අනුව ක්‍රිස්තුස්වහන්සේ අපේ පව් උදෙසා මැරී, භූමිදාන කරනු ලැබූ බවත්, නැවත වරක් දේව වචනයටම අනුකූලව උත්ථාන වූ බවත්ය. ඉතා පටු ලෙස ගතහොත්, යොහාන් 3:16 හි ඇති පණිවුඩයෙන් ශුභාරංචිය සාරාංශ කළ හැකිය :

> **මක්නිසාද දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේමකළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහාගන්න සැමදෙනම විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. (යොහාන් 3:16)**

ඉතාම පුළුල් ලෙස ගතහොත්, ඒ තුළ යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉගැන්වූ සියලු දේ අන්තර්ගතය

> **යේසුස්වහන්සේ ඔවුන් ළඟට ඇවිත් කථාකොට: ස්වර්ගයෙහිද පොළොවෙහිද සියලු බලය මට දී තිබේ. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමඟ සිටිමියි කීසේක. (මතෙව් 28:18 හා 20)**

මිනිසුන්ට දේව රාජ්‍යය ගැන පවසා, ඊට ඇතුලු විමට අභියෝග කර, රාජ්‍යයේ පුරවැසියන් ලෙස ජීවත් වන ආකාරය පුහුණු කළ යුතුය.

අප දේශනා කරන ශුභාරංචිය සමාජය නැවත සකස් කිරීම උදෙසා වූ සාමාජිය ශුභාරංචියක් නොව, පව්කරුවන් ගැළවීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය වේ. දේව රාජ්‍යය පිළිබඳ පණිවුඩය තුළ පාපය ගැන පසුතැවීම උදෙසා වූ කැඳවීමක් අන්තර්ගත විය යුතුය :

> **යොහාන් පාවාදෙනු ලැබුවායින් පසු යේසුස්වහන්සේ ගලීලයට පැමිණ දෙවියන්වහන්සේගේ ශුභාරංචිය දේශනාකරමින්: කාලය සම්පූර්ණවිය, දෙවියන්වහන්සේගේ රාජ්‍යය සමීපය, පසුතැවිලිවී ශුභාරංචිය අදහාගනිල්ලායයි කීසේක. (මාර්ක් 1:14-15)**
>
> **එතැන් පටන් යේසුස්වහන්සේ: පසුතැවිලිවෙයල්ලා: මක්නිසාද ස්වර්ග රාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරන්ට පටන්ගත්සේක. (මතෙව් 4:17)**

(ඔබට දේවරාජ්‍යයේ මූලික ප්‍රතිපත්ති වැටහෙන්නේ නැතිනම්, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "*රාජ්‍යයේ ජීවත්වීම*" යන පාඨමාලාව සළකා බලන්න.)

## විශ්වීය පණිවුඩයක්

ශුභාරංචියේ ඇති ඉතාම වැදගත් වචනය "කවරෙකු නමුත්" යන්නයි. එය යේසුස්වහන්සේ විසින් (යොහාන් 3:16), පාවුල් විසින් (රෝම 10:13), හා යොහාන් විසින් (එළිදරව් 22:17) පාවිච්චි කර තිබේ. ශුභාරංචිය සෑම ජාතියකටම, සංස්කෘතියකටම, ගෝත්‍රයකටම හා රටකටම අයත් පුද්ගලයන් උදෙසාය. හේතු හතරක් නිසා එය විශ්වීය පණිවුඩයක් වේ :

1. පාපය විශ්වීය වන බැවින් : රෝම 3:23
2. ගැළවීම උදෙසා වූ අවස්ථාව විශ්වීය වන බැවින් : 1 තිමෝති 2:4
3. පසුතැවීම උදෙසා වූ ආඥාව විශ්වීය වන බැවින් : ක්‍රියා 17:30
4. අදහාගැනීම උදෙසා වූ ආරාධනය විශ්වීය වන බැවින් : රෝම 10:9-11

## ශුභාරංචියේ බලය

ශුභාරංචි පණිවුඩය තුළ මහත් බලයක් තිබේ. පාවුල් මෙසේ පැවසුවේය :

> **මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහාගන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය. කුමක්හෙයින්ද, ධර්මිෂ්ඨයා ඇදහිල්ලෙන් ජීවත්වේයයි ලියා තිබෙන ලෙස, ඇදහීමෙන් පැමිණෙන දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම ඇදහීම පිණිස එහි එළිදරව්වී තිබේ. මක්නිසාද සත්‍යය අධර්මිෂ්ඨකමින් වලක්වන්නාවූ මනුෂ්‍යයන්ගේ සියලු අභක්තියටද අධර්මිෂ්ඨකමටද විරුද්ධව දෙවියන්වහන්සේගේ උදහස ස්වර්ගයෙන් එළිදරව්වී තිබේ; මක්නිසාද දෙවියන්වහන්සේ ගැන දැනගන්ට පුළුවන් දේ ඔවුන් තුළ ප්‍රකාශව තිබේ; කුමක්හෙයින්ද දෙවියන්වහන්සේ එය ඔවුන්ට ප්‍රකාශකළසේක. (රෝම 1:16-19)**

ශුභාරංචිය බලවත් වන්නේ ඇයි දැයි මෙම පද එළිදරව් කරයි. එය බලවත් වන්නේ පහත හේතූන් නියාය :

- එය මිනිසාට දේව බලයේ එළිදරව්වකි.
- ජාතිය, වර්ණය හෝ ආගම නොසළකා එය සෑම පුද්ගලයෙකුටම ගැළවීම ළඟා කර දෙයි.
- එය දෙවියන්වහන්සේ පිළිබඳව මිනිසා නොදන්නා දේවල් එළිදරව් කරයි.
- එය පාපයට එරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චය හා උදහස එළිදරව් කරයි.
- එය දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම එළිදරව් කරයි.
- ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ කරනු ලබන අයුරු එය පෙන්වා දෙයි (සමාව දී, දෙවියන්වහන්සේ සමඟ සම්බන්ධතාවය නැවත ඇති කර ගැනීම).
- එය අප ජීවත් කරවන ඇදහිල්ලේ පදනමයි.

## බලයේ ප්‍රකාශවීම

ශුභාරංචිය දේශනා කිරීම හා ඉගැන්වීම සිදුවිය යුතු අතර, ඒ තුළ දේව රාජ්‍යයේ බලයේ ක්‍රියාත්මක වීමක්ද ප්‍රකාශ විය යුතුය. යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට මෙසේ පැවසූ සේක :

> **නුඹලා යමින්-ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරපල්ලා. රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)**

දේව රාජ්‍යයේ පණිවුඩය වචන වල පමණක් පවතින දෙයක් නොවේ. වාචික ඉදිරිපත් කිරීම සමඟ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීමක් ද සිදු විය යුතුය. මෙය යේසුස්වහන්සේගේ ආදර්ශය තුලින් පිළිඹිබු විය :

> **යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනාකරමින්ද සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද සියලු නුවරවලද ගම්වලද ඇවිද්දසේක. (මතෙව් 9:35)**

**එහෙත් සමූහයෝ එය දැනගෙන උන්වහන්සේ අනුව ගියෝය. උන්වහන්සේ ඔවුන් පිළිගෙන, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ගැන ඔවුන්ට කථාකොට, සුවය ඕනෑ අයට සුවකළසේක.**
**(ලූක් 9:11)**

බලයේ ප්‍රකාශ වීම් වන භාස්කම් හා සුවකිරීමේ දේව රාජ්‍යයේ ක්‍රියාකාරීකම් වේ. එය ධර්ම ප්‍රචාරණ පණිවුඩයේ කොටසක් විය යුතුය. පාවුල් මෙසේ පැවසුවේය :

**මක්නිසාද දෙවියන්වහන්සේගේ රාජ්‍යය (ප්‍රකාශවන්නේ) කථාවෙන් නොව බලයෙන්ය.**
**(1 කොරින්ති 4:20)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "දේව රාජ්‍යයේ ශුභාරංචිය" යන්න නිර්වචනය කරන්න.

3. ශුභාරංචියේ මූලිකාංග මොනවාද ?

4. ශුභාරංචිය විශ්වීය වන ආකාර හතරක් ලියා දක්වන්න.

5. ශුභාරංචිය බලවත් වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. දේව රාජ්‍යය පිළිබඳව වැඩිදුර අධ්‍යයනය කිරීම සඳහා, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *" රාජ්‍යයේ ජීවත්වීම"* යන පාඨමාලාව හදාරන්න.

2. 2 රාජාවලිය 4:29-37 කියවන්න. මෙය එලිෂා දරුවකු මරණයෙන් නැඟිටවූ ආකාරය පිළිබඳ කතාවයි. 2 රාජාවලිය 4:8-17 වූ මෙම කතාවේ පසුබිම කියවන්න. මෙම දරුවා, එලිෂාගේ යාච්ඤාවකට පිළිතුරක් වශයෙන් හා දිවැසිවරයාට කරුණාව දැක්වූ ෂූනම්ය ස්ත්‍රියගේ ඉල්ලීමකට පිළිතුරක් වශයෙන් දෙනු ලැබූ, භාස්කමේ දරුවෙකි. දරුවාගේ මරණය පිළිබඳව 18-20 පද වල වාර්තා වේ. මරණය සඳහා නිශ්චිතම හේතුව දී නොමැත. දරුවා තම හිස පිළිබඳව පැමිණිලි කළ බැවින් එය හදිසි ආබාධයක් නිසා යයි සිතිය හැකිය. මෙය ධර්ම ප්‍රචාරණයට අදාල කරගත හැකි ආත්මික සත්‍යයක් පෙන්වන ස්වාභාවික උදාහරණයකි. ධර්ම ප්‍රචාරණය තුළින් ආත්මික මරණය නමැති සදාකාලික ඉරණමින් මිනිසුන් ගලවා ගන්නා බැවින් එය මරණයෙන් උත්ථාන වීමක් හා සමානය. පව් කරන ආත්ම මැරෙණ බවත්, පාපයේ කුලිය මරණය බවත්, පව්කරුවන් අයුතුකම් හා පාපය තුළ මැරී සිටින බවත් බයිබලය පවසයි. 2 රාජාවලිය 4 හි සඳහන් කතාවෙන් පහත සඳහන් ආත්මික අදාලකර ගැනීම් උපුටා ගත හැකිය.

**1.** ඔබට අදහිල්ල තිබිය යුතුය :

**A.** (20-21 පද). මව දරුවාගේ මරණය නිකම්ම පිළිගත්තේ නැත. සාමාන්‍ය ආකාරයට කළ යුතුව තිබුණේ වැළපී, අවමංගල්‍ය වලට සහභාගි වන්නන් කැඳවා, මෘත ශරීරය අන් අයට දැක ගැනීමට තබා තිබීමයි.

**B.** නමුත් ඒ වෙනුවට, (21 පදය) ඇය ඔහු එලිෂාගේ ඇඳමත තබා, දොරවසා දිවැසිවරයා කැඳවාගෙන ඒමට ගියාය. මෙය තේරුම් ගැනීම සඳහා එලියා මළ දරුවකු මරණයෙන් නැඟුටුවීම පිළිබඳ වාර්තා වන 1 රාජාවලිය 17:17-24 කියවිය යුතුය. දරුවා දිවැසිවරයාගේ කුටිය වෙත ගෙනයාම එළියා විසින් කළ භාස්කම නැවත මතක් කර දුන් ඇදහිල්ලේ ක්‍රියාවකි. දිවැසිවරයා ඔහු ඇතුළට ගෙනයන තුරු ඇය සිටියේ නැත. සමාන භාස්කමක් බලාපොරොත්තුවෙන් ඇය ඔහු ඇතුළට ගෙන ගියාය.

**C.** ආරම්භයේ පටන්ම දෙවියන්වහන්සේ මිනිසුන් මළවුන්ගෙන් නැඟිටුවා තිබේ. ගැළවීම නොළත් පුද්ගලයන්, ඔවුන් සිටින ස්වභාවයෙන්ම, භාස්කමක් වන ස්ථානයකට ගෙන යන්න.

**D.** (22-23 පද). ඇගේ පුරුෂයාගේ ප්‍රශ්න වලට පිළිතුරු වශයෙන්, "එය සුව වනු ඇතැ'යි" පැවසූ විට ඈ තුළ වූ ඇදහිල්ල සළකන්න.

**E.** ඔබ ඇදහිල්ලෙන් ක්‍රියා කිරීමට පටන්ගත් විට, එය වර්ධනය වේ. ඇය දිවැසිවරයා වෙත ළං වන විට ඇගේ ඇදහිල්ල වර්ධනය වී තිබිණි (26 පදය). එලිෂා තම සේවකයා වූ ගෙහාසි යවා ප්‍රශ්න කළ විට, ඇය තවදුරට "එය සුවවනු ඇතැ'යි යනුවෙන් නොව "සුවසේ සිටී" යනුවෙන් පිළිතුරු දුන්නාය.

**11.** ඔබ ඉක්මන් විය යුතුය : 22 පදයේදී "හණික ගොස් එන පිණිස" යනුවෙන් කාන්තාව පැවසුවාය. ආත්ම, පාපය තුළ මියැදෙන බැවින් ඔබ මළවුන් නැඟිට වීමට ඉක්මන් විය යුතුය.

**111.** ඔබ සම්ප්‍රදායන් බිඳ දැමිය යුතුය :

**A.** (23 පදය). ඇගේ පුරුෂයා "නුඹ අද ඔහු ළඟට යන්නේ මොකටද?" යනුවෙන් ප්‍රශ්න කළේය. එය සම්ප්‍රදායානුකූලව දිවැසිවරයා වෙත යාමට කාලය නොවිය. එය අමාවක දිනයවත් සබත් දිනයවත් නොවිය.

**B.** බලයේ ප්‍රකාශ වීම තුළ ධර්ම ප්‍රචාරණය කිරීමට ඔබට සම්ප්‍රදායන් බිඳ දැමීමට සිදු විය හැකිය. "මේ දේවල් කළ යුත්තේ මෙලෙස නොවේ" යි මිනිසුන් ඔබට පැවසිය හැකිය.

**1V.** ඔබ තුළ අනුකම්පාව තිබිය යුතුය :

**A.** (25-27 පද). කිසිඳු අනුකම්පාවක් නොතිබුණු "ගෙහාසි" අතින් කිසිදාක මළ කෙනෙක් නැඟිටවනු නොලබනු ඇත. කාන්තාව ජීවනය සොයා පැමිණි විට, ඔහුට කිසිඳු අනුකම්පාවක් නොතිබුණු අතර ඔහු ඇය එළවා දමනු ඇත.

**B.** දිවැසිවරයා සැළකිල්ලක් දැක්වීය. "ඔබ සුවසේද? නුඹේ පුරුෂයා සුවසේද? ළමයා සුවසේද?"යි ඔහු ඇසුවේය.

**C.** අප වෙතට ඒමට කඳු අතර පොරබදන මිනිසුන් සිටී. ඔවුන් කරදරයෙන් පැමිණ අපගේ දෙපා ළඟ වැටෙන නුමුත්, අපි ඔවුන් තරහින් එළවා දමන්නෙමු. අපි ඔවුන් ලෝකයේ උපදේශකයන්, ඖෂධ හෝ පුනරුත්තාපන මධ්‍යස්ථාන වෙත යවන්නෙමු.

**V.** ඔබ ඔවුන් සිටින තැනට යා යුතුය :

**A.** (29-31 පද). පාපයේ මැරී සිටින අයට උපකාර කිරීමට, එලිෂා දරුවා ළඟට ගියාක් මෙන් ඔබද ඔවුන් සිටින තැනට යා යුතුය.

**B.** අපට බලයක් නොමැති පුද්ගලයින් (ගෙහාසි වැනි) හෝ අප වෙනුවට යවන වෙනත් දෙයක් (සැරයටිය මඟින් නිරූපනයවේ) යැවිය නොහැකිය. අප පාපයේ මරණයෙන් නැඟටුවීම සඳහා, යේසුස්වහන්සේ මෙලොවට පැමිණි සේක. උන්වහන්සේ අප සිටි තැනට පැමිණි සේක.

**C.** මව නියෝජිතයෙකුගෙන් සෑහිමට පත් නොවිය. මැරෙමින් සිටින පුරුෂයන් හා ස්ත්‍රීන්, මළ ආත්ම වලට ජීවනයේ හුස්ම ලබා දිය හැකි දෙවියන්වහන්සේගේ බලයෙන් මිස අන් කිසිඳු දෙයකින් සෑහීමට පත් නොවනු ඇත.

**D.** කාන්තාව තම අවශ්‍යතාවය පැවසූ විට, දරුවාට මෙහෙකිරීමට එළිෂා ගෙහාසිව යැව්වේය. "ගෙහාසි" දෙවියන්වහන්සේගේ සැරයටිය දරා සිටිය නමුත්, "ගෙහාසි" අතින් මළ අයෙකු නැඟිටවනු නොලබනු ඇත. ගෙහාසි එළිෂාට හා කාන්තාවට පෙරටුව ගොස් දරුවා පිට සැරයටිය තැබූ නමුත්, කිසිඳු ප්‍රතිචාරයක් නොවිය.

**E.** මළවුන් නැඟිටුවීමට නම්, ඔබ ගුරුවරයාගේ ආදර්ශය අනුගමනය කළ යුතුය. 1 රාජාවලිය 17:17-24 කියවන්න. එලිෂාගේ ගුරුවරයා වූ එළියා, මළ දරුවකු නැඟිටුවීම සම්බන්ධයෙන් ආදර්ශයක් සැපයීය. එලිෂා එම ආදර්ශය අනුගමනය කළේ නම්, කාර්යය කිරීමට උත්සහ කිරීමට ඔහු කිසිදාක සැරයටිය අතැතිව ගෙහාසිව නොයවනු ඇත.

**F.** තමාගේ සහභාගීත්වයෙන් හෝ උත්සහයකින් තොරව දෙවියන්වහන්සේගේ බලය ක්‍රියාත්මක වනු ඇතැයි එලිෂා සිතුවේය. අප මූලධර්ම පිළිබඳ හෝ ප්‍රායෝගික සත්‍යයන් ගෙන ආත්මිකව මළ අය මත තබන නමුත්, අප පෞද්ගලිකව ඔවුන් සමඟ එකතු නොවනු ඇත. අප පෞද්ගලික සහභාගීත්වයෙන් තොරව බොහෝ ක්‍රම උත්සහ කර බලන නමුත්, එළිෂාගේ සැරයටිය මෙන් අපද නැතිවුණු ආත්ම මත කිසිඳු බලපෑමක් ඇති නොකරනු ඇත.

**G.** ශුද්ධාත්මයාණන්ගෙන් තොර නීතියේ ලිපියකින් කිසිදාක මළවුන් නැඟිටවනු නොලබනු ඇත. නායකත්වය, මැරුණු පුරුෂයන් හා ස්ත්‍රීන් මත උදාසීන නෙසැලකිලිමත් ආකාරයේ අතක් හා සැරයටියක් තබන තුරාවට ජීවනය ගලා නොයනු ඇත.

**V1.** ඔබ තත්වයේ බරපතලකම හඳුනාගත යුතුය :

**A.** (31 පදය). දරුවා මැරී ඇති බව ගෙහාසි සැබවින්ම විශ්වාස කළේ නැත. ඔහු ආපසු එමින් "දරුවා පිබිදුණේ නැතැ"යි පැවසුවේය. නමුත් දරුවා නිදා සිටියේ නැත. ඔහු මැරී සිටියේය. ගෙහාසි සැබවින්ම විශ්වාස නොකළ අතර ඔහු නිදා සිටිනවා මෙන් සිතා කතා කළේය.

**B.** (32 පදය). දරුවා මැරී සිටි බව එලිෂා දැන සිටියේය.

**C.** පාපයේ අතරමංව සිටින නොඇදහිලිවන්තයන් නිදා සිටිනවා නොවේ. ඔවුන්ගේ තත්වය බරපතල වේ. එය ආත්මික මරණය වන අතර, අප මෙය තේරුම් ගන්නා තුරු ඔවුන් කිසිදාක උත්ථාන නොවනු ඇත.

**V11.** ඔබ අසමත්වීම් වලින් පරාජයට පත් නොවිය යුතුය :

(31 පදය..."ළමයා පිබිදුණේ නැත"). මළ තැනැත්තා නැඟිටුවීමට ගත් පළමු උත්සාහය අසාර්ථක විය. ඔබ එක් උත්සහයකින් අසමත් වූ විට අත්හැර දමන්න එපා. අසමත් වීම් නිසා ඔබට මෙම කාර්යයට කැඳවීමක් නැතැ'යි තිරණය නොකරන්න. අසමත්වීම් තුළින් ලැබෙන පාඩම මෙහෙය අතහැර දැමීම නොව, ක්‍රමය වෙනස් කිරීමයි. ඔබ ගුරුවරයාගේ ක්‍රමය අනුගමනය කළ යුතුය.

**V111.** ඔබගේ ඇතුළු ගෙයට ගොස් යළි ජිවනය ලබා දිය යුතුය :

(33 පදය). ඔබ යාච්ඤාවේ "ඇතුළු ගෙට" ගොස්, දොර වසාගෙන, මියැදෙමින් තිබෙන මනුෂ්‍යත්වය උදෙසා මැදහත්කම් කළ යුතුය.

**1X.** ඔබ බලය ලබා සිටිය යුතුය :

**A.** ඔහු කුටියට ඇතුළු වන විට, එලිෂා තම බලයේ උල්පත දැන සිටියාය. මෙම සිදුවීම සිදුවීමට ටික කලකට පෙර, එළියාගේ සළුව එලිෂා පිටම වැටී තිබුණි. ඔහු තමාගේ බලයේ උල්පත දැන සිටියේය. එය උත්සහ කර බලා එය සත්‍ය බව ඔප්පු වී තිබුණි.

**B.** ඔබේ ශක්තියෙන් ඔබට පුරුෂයන්ගේ හා ස්ත්‍රීන්ගේ මැරුණු හදවත් නැවත ජිවනය වෙතට ගෙන ආ නොහැකිය. ඔබගේ බලයේ උල්පත දෙවියන්වහන්සේය. උන්වහන්සේගේ ශුද්ධාත්මය නැමති සළුව නැමති බලයේ බව්තීස්මය ඔබ පිටට පැමිණ තිබේ.

**X.** ඔබ අරමුණ දැන සිටිය යුතුය :

ඔබේ අරමුණ මළ සිරුර පිරිසිඳු කර, නරක් නොවන පිණිස සුවඳ ද්‍රව්‍ය ගැල්වීම හෝ එය තුනි හන වලින් ආවරණය කිරීම නොවේ. මේ සියල්ල වැඩිදියුණු කිරීමක් පමණක් වන නමුත්, මළ සිරුර තවදුරටත් පවති. ඔබගේ අරමුණ සදාචාරය පිළිබඳ ඉගැන්වීම, ස්වයං-වර්ධනය, පාපය වැඩීම හෝ සමාජය වෙනස් කිරීම නොවේ. ඔබගේ අරමුණ නව ආත්මික ජිවිතයකි !

**X1.** ඔබ ජිවමානව සිටිය යුතුය :

**A.** (34-35 පද). යාච්ඤාවෙන් පසුව, එලිෂා මළ සිරුර මත දිගා වී තම කට මැරුණු දරුවාගේ කට මත තැබුවේය. ඔහු තම ඇස් දරුවාගේ ඇස් මතද තම දෑත් දරුවාගේ දෑත් මතද තැබුවේය. දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයාගේ උණුසුම් ශරීරය දරුවාගේ සීතල සිරුර වසා ගත්තේය. ඔබට මළවුන් නැඟටුවීමට නම්, ඔබ මළ අය සමඟ සම්බන්ධතා පැවැත්විය යුතුය. අප මරණයෙන් නැඟිටුවීමට, යේසුස්වහන්සේ ජීවිතය දුන් සේක. ඔබ මළවුන් නැඟිටුවීමට නම්, ඔබට මරණයේ සීතල හා භයානක බව දැනිය යුතුය.

**B.** වැඩුණු මිනිසා දරුවකු මත දිගා වීමට නම් තමා සංකෝජනය විය යුතු යැයි කෙනෙකු පැවසිය හැකි නමුත්, ඔහු දිගා වූ බව සඳහන් වේ. මියැදෙමින් සිටින පුරුෂයන් හා ස්ත්‍රීන් වෙත ළඟා වීම දිගාවීමේ අත්දැකීමකි. ඔබට ඔබේ පවුලේ සැනසිල්ල හා ඔබගේ කිතුණු මිතුරන්ගේ හා පරිසරයේ ආරක්ෂාව අත්හැරිය යුතුය. ඔබ ඔබේ මාර්ගයෙන් ඉවතට යා යුතුය.

**C.** ඔහු ජීවිතයෙන් මරණය ආවරණය කරත්ම, ඔහුගේ ශරීරයේ උණුසුම දරුවා තුළට ඇතුළු විය. ඔබත් මළ අයෙකුනම්, එය සිදු නොවනු ඇත. එක් මළ සිරුරක් මත තවත් මළ සිරුරක් තැබීම ඵලක් නැති දෙයකි. මියැදෙමින් සිටින මිනිසුන් තවත් මැරුණු ආත්මයක් වටා රැස්වීම නිෂ්ඵලය.

**X11.** ජීවනය හැර වෙනත් කිසිම දෙයකින් ඔබ සෑහීමට පත් නොවිය යුතුය :

**A.** දරුවාගේ මාංශය උණුසුම් වූ බව 34 පදය දක්වයි. නමුත් එළිෂා ජීවනයේ සළකුණක් දැක සෑහීමට පත් වූයේ නැත. අප හඹා යන්නේ ඇල් මැරුණු ස්වභාවය පසුපස නොව ජීවනය පසුපසය ! හුදු හැඟීම් පමනක් නොව, සැබෑ පිබිදීමයි.

**B.** එලිෂා බලා සිටිමින් හා කිසිඳු සැකයකින් තොරව දෙවියන්වහන්සේට හඬනඟමින්, එහා මෙහා ගියේය. ඉන්පසු ඔහු නැවත වරක් දරුවා පිට දිගාවිය. මේ අවස්ථාවේදී දරුවා සත් වරක් කිඹුහුම් හැරියේය. ("කිඹුහුම් " යන පදයෙන් සැබවින්ම අදහස් වූයේ "අමාරුවෙන් හුස්ම ගත්තේය" යන්නයි). ඔහු අපහසුවෙන් හුස්ම ගනිත්ම ඔහුගේ ශරීරයට නව ජීවනය ඇතුළු වූ අතර ඔහුගේ දෙනෙත් විවර විය. මළ පුරුෂයන් හා ස්ත්‍රීන් "ශුද්ධාත්මයාණන්ගේ බලවත් වේගවත් සුලඟ" නමැති විශ්වාසනීය හා අලුත් කිරීමේ බලය තමා තුළට ආශ්වාස කර ගනිත්ම, දෙවියන්වහන්සේගේ නැවත නැඟිටීමේ බලය තුළින් ගලා එන නව ජීවනය ඔවුන්ද අත්දකිනු ඇත.

# හතර වන පරිච්ඡේදය

## පණිවුඩකරුවන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- ධර්ම ප්‍රචාරණය තුළ දෙවියන්වහන්සේගේ වචනයේ භූමිකාව සාරාංශගත කිරීමට,
- ධර්ම ප්‍රචාරණය තුළ දෙවියන්වහන්සේගේ භූමිකාව පැහැදිලි කිරීමට,
- ධර්ම ප්‍රචාරණය තුළ යේසුස්වහන්සේගේ භූමිකාව හඳුනා ගැනීමට,
- ධර්ම ප්‍රචාරණය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ භූමිකාව සාරාංශගත කිරීමට,
- ධර්ම ප්‍රචාරණය තුළ යාච්ඤාවේ භූමිකාව පැහැදිලි කිරීමට,
- ධර්ම ප්‍රචාරණය තුළ ඔබගේ භූමිකාව හඳුනාගැනීමට,
- "සාක්ෂි දැරීම" යන වචනය නිර්වචනය කිරීමට,
- "ගිහි බව" යන පදය නිර්වචනය කිරීමට,
- "පූජ්‍ය බව" යන පදය නිර්වචනය කිරීමට,
- ගිහි භාවයේ කැඳවීම යන්නෙන් අදහස්වන්නේ කුමක්දැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මක්නිසාද, මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය (රෝම 1:16).**

### හැඳින්වීම

ඔබ අධ්‍යයනය කරනුයේ ක්‍රියා 1:8 හි දැක්වෙන ශුභාරංචිය උදෙසා ලෝකයා වෙත ළඟා වීම පිළිබඳව වූ දෙවියන්වහන්සේගේ ධර්ම ප්‍රචාරණ සැළැස්මයි :

- පණිවුඩයේ අන්තර්ගතය යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.
- ශුද්ධාත්මයාණනවහන්සේ මඟින් බලගැන්වූ ශුභාරංචියේ පණිවුඩකරුවන් වනුයේ ගෝලයන්ය.
- පණිවුඩය ලබන්නන් වනුයේ මුළු මහත් ලෝකයමය.

පසුගිය පාඩමේදී ඔබ ශුභාරංචි පණිවුඩයේ අන්තර්ගතය පිළිබඳව ඉගෙන ගත්තේය. මෙම පාඩමේදී ඔබ ශුභාරංචියේ පණිවුඩකරුවන් ගැන ඔබ ඉගෙන ගනු ඇත. ශුභාරංචියට බලවත් සාක්ෂිකරුවන් වීමේ හැකියාව පණිවුඩකරුවන්ට ලබා දීම සඳහා දේව වචනය, පිය වූ දෙවියන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ, ශුද්ධාත්මයාණන්වහන්සේ හා යාච්ඤාවේ යන සියල්ල තම ආත්මික බලවේග එකට එකතු කරනු ඇත.

### දේව වචනය සහ ධර්මප්‍රචාරණය

ශුභාරංචිය පිළිගන්නා ආත්මයක් තුළ ආත්මික උත්පාදනයක් සිදු කිරීමේ බලය ශුභාරංචිය තුළ තිබේ :

> **මක්නිසාද, මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය (රෝම 1:16).**

ශුභාරංචියේ පණිවුඩකරුවකු වීමට ඔබ දක්ෂ කථිකයෙකු විය යුතු නැත. අවශ්‍ය වන එකම දෙය මිනිසෙකු ගැළවීමේ හැකියාව ඇති ශුභාරංචිය බෙදා ගැනීම පමණි.

ඔබ දේව වචනය බෙදාගන්නා විට, අසන්නාගේ ඇදහිල්ල රඳා පවතින්නේ ඔබේ ප්‍රඥාව මත හෝ දක්ෂ ඉදිරිපත් කිරීම මත නොවේ (1 කොරින්ති 2:5). දේව වචනය හිස්ව ආපසු හැරී නොඑන බවද ඔබට සහතික විය හැකිය. එය දෙවියන්වහන්සේගේ අරමුණ ඉටු කරනු ඇත (යෙසායා 55:11). දේව වචනය මඟින් නොඇදහිලිවන්තයන්ට ශුභාරංචියේ සත්‍ය පිළිබඳ විශ්වාසයක් ඇති කරන ලකුණු හා ආශ්චර්යන්ගේ බලවත් ප්‍රකාශවීම් නිදහස් කරයි. (මාර්ක් 16:20).

## ධර්ම ප්‍රචාරණය තුළ දෙවියන්වහන්සේගේ භූමිකාව

නැවත ඉපදීමේ අත්දැකීම තුළින් කෙනෙකුගේ ජීවිතය වෙනස් කරන්නේ දෙවියන්වහන්සේය. ඔබට හැකි උපරිම අන්දමින් ශුභාරංචිය ගැන සාක්ෂි දැරීම, දේශනා කිරීම හා ඉගැන්වීම කළ හැකිය, නමුත් ආත්මයක් වෙනස් කළ හැක්කේ දෙවියන්වහන්සේට පමණි. ඔබ මෙය තේරුම්ගත් වහාම, ධර්ම ප්‍රචාරණය පිළිබඳ ඔබගේ කණස්සලුවීම් බොහොමයක් ඉවත් වනු ඇත.

ඔබ දිව්‍යමය කාර්මාන්තකරුවකුගේ කාර්යය ඉටු කරන මානුෂ්‍ය උපකරණයක් වන, පණිවුඩකරුවකු පමණි. කෙනෙක් වෙනස් කිරීම ඔබට කළ හැකි දෙයක් නොවේ. නැවත ඉපදීමේ අත්දැකීම පිළිසිඳවීමට හා එයට උත්පාදනය දීමට හැක්කේ දෙවියන්වහන්සේටය. පුද්ගලයෙකු නැවත ඉපදුනු විට, ඔහු "දෙවියන්වහන්සේගෙන් උපන්" අයෙක් වේ:

> **යේසුස්වහන්සේ ක්‍රිස්තුස්වහන්සේ බව විශ්වාසකරන සැමදෙනම දෙවියන්වහන්සේගෙන් ඉපද සිටිති. ඉපදෙවූ තැනන්වහන්සේට ප්‍රේමකරන සැමදෙනම උන්වහන්සේගෙන් උපන් තැනැත්තාටත් ප්‍රේමකරති (1 යොහන් 5:1).**

## ධර්ම ප්‍රචාරණය තුළ යේසුස්වහන්සේගේ භූමිකාව

ධර්ම ප්‍රචාරණය උදෙසා ආඥාව දුන්නේ සහ ඔබ එම කාර්යයේ යෙදවීම සඳහා ශුද්ධාත්මයාණන්වහන්සේ එවුයේ යේසුස්වහන්සේය. ලකුණු හා ආශ්චර්යයන් තහවුරු කරමින් ඔබ සමඟ ක්‍රියා කරන්නේ උන්වහන්සේය :

> **ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනා-කළෝය. ස්වාමීන්වහන්සේද ඔවුන් සමග ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළසේක. ආමෙන්. (මාර්ක් 16:20)**

## ධර්ම ප්‍රචාරණය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ භූමිකාව

නව ගිවිසුම් කාලයේදී, ශුභාරංචියේ පණිවුඩකරුවන් වෙතට ශුද්ධාත්මයාණන්වහන්සේ මිනිසුන් ඇද ගත් සේක. ඔවුන්ගේ සේවය පසුපස පැමිණි සමූහයා අපට වෙනත් කවර ආකාරයකට පැහැදිලි කළ හැකිද? ඒ කාලයේදී පුවත්පත්, ගුවන් විදුලි, රූපවාහිනි දැන්වීම් පැවතියේ නැත.

සමූහයා ආකර්ෂණය කර ගැනීමට ලෝකයේ ක්‍රමවේද පාවිච්චි කරනු වෙනුවට, අපටද ඉහළින් බලය ලැබෙන තුරු, අපද මුල්කාලීන සභාව මෙන් අපගේ උඩුමහල් මැදුරු වල යාච්ඤාවෙන් රැඳී සිටිය යුතුය. මිනිසුන්ට තම වැරදි පෙන්වා දෙන්නේ සහ ගැළවීමේ අවශ්‍යතාව ඒත්තු ගන්වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේය. ශුභාරංචිය බෙදාහැරීමේදී ඔජ්පු වූ ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද ප්‍රයෝජනවත් වන නමුත්, ඔබ ඒවා මත රැඳීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ. ඔබ ශුද්ධාත්මයාණන්වහන්සේගේ ඒත්තු ගැන්වීමේ බලය මත රඳ පැවතිය යුතුය.

> **එසේවී නුමුත් මම නුඹලාට සැබෑව කියමි: මාගේ අභක්ව යෑම නුඹලාට ප්‍රයෝජනවත්ය. මක්නිසාද මා අභක්ව නොගියොත්, සැනසිලිකාරයාණන්වහන්සේ නුඹලා ළඟට එන්නේ නැත: නුමුත් ගියොත්, උන්වහන්සේ නුඹලා වෙතට එවන්නෙමි. උන්වහන්සේ ආ කල, පාපය ගැනද ධර්මිෂ්ඨකම ගැනද විනිශ්චය ගැනද ලෝකයාට අභවාදෙනසේක. (යොහන් 16 :7-8)**

ධර්ම ප්‍රචාරණය බලගන්වන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලයයි. ගෝලයන් බලපෑමක් කළ හැකි ආකාරයේ ක්‍රියාකාරී සාක්ෂිකරුවන් බවට පත් වූයේ එම බලය අත්දැකීමෙන් අනතුරුවය. (ක්‍රියා 1:8 හා 2 වන පරිච්ඡේදය)

# යාච්ඤාව හා ධර්ම ප්‍රචාරණය

ආත්මික ලෝකයේ පවතින කිසිඳු දෙයකට යාච්ඤාවෙන් තොරව සාර්ථක විය නොහැකිය. ඇදහිලිවන්තයෙකු වශයෙන් ඔබ ශුභාරංචියේ යහපත් පණිවුඩය නැතිවුණු හා මියැදෙමින් සිටින ලෝකයක් වෙතට ගෙනයාමට යවනු ලැබූ ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටසකි. නමුත් ස්වාභාවික ශරීරය හිස මඟින් මෙහෙයවන්නාක් මෙන්ම මෙම ආත්මික ශරීරයද මඟපෙන්වනු ලබන්නේ පාලනය කරනුයේ හා බලගන්වනුයේ එහි හිස මඟිනි.

ක්‍රියාකාරී වීම උදෙසා ස්වාභාවික ශරීරය නියමිත ස්නායු, අස්ථි හා මාංශ පේෂී පිහිටීමකින් හිසට සම්බන්ධ විය යුතුවාක් මෙන්ම, ආත්මික ශරීරය ද ආත්මික හිස මත ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ සම්බන්ධ විය යුතුය. මෙම සම්බන්ධතාවය ඇති වන්නේ යාච්ඤාව තුළිනි.

තවත් පැහැදිලි කිරීමක් පාවිච්චි කරන්නේ නම්: යේසුස්වහන්සේ මිදි වැල වන අතර අපි එල දැරිය යුතු අතු වෙමු. යේසුස්වහන්සේ අතු වලට ජීවය ලබා දෙන නටුව හා මුල් වේ. මෙය අන්‍යෝන්‍ය වශයෙන් රඳා පැවැත්ම පිළිබඳ පිංතූරයකි. එල දැරීම උදෙසා උන්වහන්සේ අප මත රඳා පවතින අතර, ආත්මික ජීවය හා ශක්තිය උදෙසා අපි උන්වහන්සේ මත රැඳෙන්නෙමු (යොහන් 15). ඔබ හා ස්වාමීන්වහන්සේ අතර නිසි සම්බන්ධතාවයක් නොමැතිව මෙම බැඳීම පවතින්නේ නැත. මතෙව් 17:14-21 දක්වා මේ පිළිබඳ උදාහරණ වාර්තා වේ. යාච්ඤාව මඳ බව හේතුවෙන් ගෝලයන්ට කුඩා පිරිමි දරුවාට මෙහෙකිරීමට අසමත්විය. යාච්ඤාව යම් ක්‍රියාවට පෙර සිදුවිය යුතු දෙයක් නොවේ. එය ක්‍රියාවම වේ.

ධර්ම ප්‍රචාරණයට පෙර යාච්ඤාව පැවතිය යුතුය. ලූක් 10:1-24, යේසුස්වහන්සේ තම ගෝලයන්ට යාච්ඤා කරන ලෙස පවසන අතර (2 වන පදය), ඉන්පසු යන ලෙස පැවසූ සේක (3 වන පදය). යාමට පෙර යාච්ඤා කළ යුතු විය. ඇතැම් විට අප වඩා යාච්ඤා කළහොත් අප වඩාත් අය දිනාගනු ඇත. ක්‍රියා 2 වන පරිච්ඡේදයේදී ඔවුන් දින 10 ක් යාච්ඤා කර විනාඩි 10 ක් දේශනා කර, 3000 ක් ගැළවීම ලැබූහ. අද අපි විනාඩි 10 ක් යාච්ඤා කර දින 10 ක් දේශනා කරන අතර ගැළවීම ලබන්නේ සුළු පිරිසකි.

"ධර්ම ප්‍රචාරනුකූලව" යාච්ඤා කිරීම යනු පහත දේවල් උදෙසා යාච්ඤා කිරීමයි :

(1) අස්වැන්නේ සේවකයන් උදෙසා (ලූක් 10:2)

(2) ශුභාරංචිය "පතළ වීම" පිණිස (2 තෙසලෝනික 3:1-2). "පතළ වීම" යන්නෙහි අදහස "දිවීම හෝ වේගවත්ව ප්‍රචාරය කිරීම"යි.

(3) අවස්ථාවන් උදෙසා : කොලොස්සි 4:3 දී, ඔහුට ශුභාරංචිය බෙදාගැනීමට හැකිවන පරිදි දෙවියන්වහන්සේ "වචනයේ දොරක්" ඇර දෙන පිණිස තමා උදෙසා යාච්ඤා කරන්න යැයි පාවුල් පැවසුවේය.

(4) නිර්භීතකම : තමාට නිර්භීතව ශුභාරංචිය බෙදාගතහැකි වන ලෙස යාච්ඤා කරන්න යැයි පාවුල් එපීසයේ සභාවට පැවසුවේය. (එපීස 6:19).

(5) ගැළවීම : මිනිසුන් ගැළවීම ලබන ලෙස යාච්ඤා කිරීම බයිබලයට අනුකූලවේ. ඊශ්‍රායෙල් සෙනඟ ගැලවීම ලබන ලෙස පාවුල් ඔවුන් උදෙසා යාච්ඤා කළ බව රෝම 10:1 හි දැක්වේ.

(6) සමාදානය : 1 තිමෝති 2:1-4 දී, අපට සමාදානයෙන් ජීවත්විය හැකි වන පිණිස අධිපත්කම් කරන අය උදෙසා යාච්ඤා කරන ලෙස පාවුල් අපට පවසයි. "සෑම මිනිසෙකුම ගැළවීම ලැබීම" කෙරෙහි ආශාවන දෙවිඳුන්ගේ ඇස් හමුවේ එය යහපත් බැවින් මෙසේ කරන ලෙස ඔහු අපට පවසයි. පීඩාව, යුද කලාප, ගමනාගමන තහංචි ආදී දේවල් නොමැති සමාදානයේ වාතාවරණයක් යටතේ වඩා වේගයෙන් ශුභාරංචිය ප්‍රකාශ වේ.

අප යාච්ඤාවෙන් තොරව දේව රාජ්‍යයේ කටයුතු සිදු කිරීමේදී යම් සාර්ථකත්වයක් අත්දැකිය හැකිය. නමුත් අප යාච්ඤාවේ සැබෑ ක්‍රියාව හඳුනාගතහොත් අපේ උත්සහයෙන් අපට ළඟා කර ගත හැක්කේ ළඟා කරගත හැකි ප්‍රමාණයට වඩා අඩු ප්‍රමාණයක් බව හැඟෙනු ඇත.

# ධර්ම ප්‍රචාරණය තුළ ඔබගේ භූමිකාව

ශුභාරංචි පණිවුඩකරුවන් වන්නේ නැවත ඉපදීම ලද ගෝලයන්ය. දෙවියන්වහන්සේගේ ක්‍රමවේදය වනුයේ සෑම ගෝලයෙක්ම ශුභාරංචි පණිවුඩය පිළිබඳ “සාක්ෂි” දැරීමයි. “සාක්ෂි” දැරීම යනු ඔබ දැක ඇති, අසා ඇති හෝ අත්දැක ඇති දෙයක් පිළිබඳව පැවසීමයි.

නීතිය ඉදිරියේදී, සාක්ෂිකරුවකු යනු කෙනෙක් හෝ දෙයක් පිළිබඳව සහතික කරන කෙනෙකි. සාක්ෂිකරුවකු වශයෙන් ඔබ යේසුස්වහන්සේ පිළිබඳවත් සියලු මනුෂ්‍ය වර්ගයාගේ ගැළවීම පිළිබඳව වූ උන්වහන්සේගේ සැළැස්ම පිළිබඳවත් සහතික කළ යුතුය. උසාවියකදී සාක්ෂිකරුවන් දෙආකාරයක සාක්ෂි ඉදිරිපත් කරයි. එක් ආකාරයක් නම්, යම් කරුණක් පිළිබඳ වාචික සාක්ෂියකි. අනෙක් සාක්ෂි වර්ගය නම් දැකීමෙන් ඔප්පු වන සාක්ෂි වේ. වාචිකව මෙන්ම දෙවියන්වහන්සේගේ බලයේ දෘෂ්‍ය ප්‍රකාශවීම් තුළින් ද ශුභාරංචිය පිළිබඳ සාක්ෂි දැරීමට ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබට උපකාර කරන සේක.

## පූජක පක්ෂය හා ගිහි පක්ෂය අතර බෙදීම :

සෑම ගෝලයෙකු උදෙසාම දෙවියන්වහන්සේගේ සැළැස්ම ඔවුන් සාක්ෂි දැරීමයි. මුල් කාලීන සභාව මෙම සැළැස්ම අනුගමනය කිරීමත් සමඟ ඔවුන් වර්ධනය විය. සෑම ඇදහිලිවන්තයෙක්ම ශුභාරංචිය බෙදාගත් අතර ආත්මිකව ඵල දැරීය. සභාව වර්ධනය වීමත් සමඟම, ඇතැම් පුද්ගලයන්ට සභාපාලකවරු, ධර්ම ප්‍රචාරකයන්, ප්‍රොපේතවරු, ගුරුවරු හා ප්‍රේරිතයන් ලෙස සම්පූර්ණ කාලීනව සේවය කිරීමට දෙවියන්වහන්සේ කැඳවීමක් දුන් සේක. කාලයක් ගතවත්ම, ඇදහිලිවන්තයන් සභාවේ පවතින කොටස් දෙකකින් එකක සාමාජිකයන් බවට පත්විය. ඔවුහු පූජක පක්ෂයට හෝ ගිහි පක්ෂයට අයත් වූහ.

“ගිහියන්” යන වචනය පැමිණෙන්නේ “දෙවියන්වහන්සේගේ තෝරාගත් සෙනඟට අයිති” නම් අර්ථය ඇති ග්‍රීක වචනයකිනි. මෙම වචනයේ මූලික අදහස “දෙවියන්වහන්සේගේ සියලු සෙනඟ” යන්නයි. සභාවේ විශේෂිත සම්පූර්ණකාලීන සේවයන්හි නොයෙදෙන පුද්ගලයන් හැඳින්වීමට “ගිහියන්” හෝ ගිහි පක්ෂය යන පද භාවිත විය. “පූජකයන්” යන පදය සභාවේ වෘත්තිමය සේවකයන් හැඳින්වීමට යොදා ගැනුණි. පූජක පක්ෂය යනුවෙන් හැඳින්වෙන්නේ දේවසේවය තම වෘත්තිය කරගත් හෝ සභාව මඟින් සම්පූර්ණ කාලීනව සේවයේ යොදවනු ලැබූ පුද්ගලයන්ය.

සභා ඉතිහාසය තුළ කාලාන්තරයක් තිස්සේ, පූජක පක්ෂය හා ගිහි පක්ෂය අතර බෙදීමක් ක්‍රමයෙන් ඇතිවිය. බොහෝ ගිහි පුද්ගලයන් ආත්මිකව නැවත ඵල දැරීම නවතා දැමූහ. ඔවුහු ලෝකය දිනා ගැනීමේ අභියෝගය පූජක පක්ෂයට භාර දීමට පටන් ගත්හ. සම්පූර්ණ සභාවට කරන ලෙස අණ කර ඇති දේ කිසිඳු වෘත්තීය පූජක පක්ෂයේ අයෙකුට කිසිදාක ළඟා කරගත නොහැකිය. අප තවමත් ශුභාරංචියෙන් ලෝකය වෙත ළඟා නොහැකි වීමට මෙය එක් හේතුවකි. ඇදහිලිවන්තයන් තම වගකීම පූජක පක්ෂය වෙතට මාරු කර ඇත. සභාවේ කාර්යයන් බෙදා දීමක් පිළිබඳව බයිබලය කතා කරන නමුත්, සෑම පුද්ගලයෙක්ම ශුභාරංචිය ප්‍රචාරණය කිරීමට සහභාගි විය යුතුය. (ක්‍රියා 6:1-6)

යෙරුසලමේ සභාව වර්ධනය වීමත් සමඟම, සභාවේ අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා කාර්යයන් බෙදා වෙන් කළ යුතු විය. නායකයන් සම්පූර්ණ කාලීනව දේව වචනය අධ්‍යයනය කිරීමෙහිත් යාච්ඤාවෙහිත් නිරත විය. ගිහි පුද්ගලයන් වැන්දඹුවන්ට සේවය කිරීම හා වෙනත් සේවයන් හි නිරත විය. නමුත් ඇදහිලිවන්තයන් සභාවේ විවිධ කාර්යයන්හි නිරත වූ නමුත්, ඔවුන් සියලු දෙනාම ශුභාරංචිය ප්‍රචාරණය කිරීමෙහි නිරත විය :

- ස්තේපන් උපස්ථායකයෙකු ලෙස තෝරාගත් ගිහි පුද්ගලයෙක් වූ නමුත්, ඔහු බලවත් ලෙස ශුභාරංචිය ගැන සාක්ෂි දැරීය. (ක්‍රියා 6:8-11)

- පිලිප් ද උපස්ථායකයෙකු ලෙස තෝරාගත් ගිහියෙකු විය. ඔහු සමාරිතයන් සමඟ ශුභාරංචිය බෙදා ගත්තේය. (ක්‍රියා 8:5-12)

- යෙරුසලමට පීඩාව පැමිණ ඇදහිලිවන්තයන් වෙනත් නගර වලට විසුරුවා හරිනු ලැබූ විට, ඔවුහු දිගටම ශුභාරංචිය පිළිබඳ සාක්ෂි දැරූහ (ක්‍රියා 8:4). යේසුස්වහන්සේ සියල්ලේ ස්වාමියා වන බැවින්, සැබෑ ඇදහිලිවන්තයන්ට ශුද්ධ දේ හා ලෞකික දේ අතර වෙනසක් නොමැත.

## ගිහි භාවයේ කැඳවීම :

ගිහි භාවය උදෙසා වූ සැබෑ ආත්මික කැඳවීම හඳුනාගැනීමට නම් ඔබ නැවත පරණ ගිවිසුම වෙතට යා යුතුය. දෙවියන්වහන්සේගේ සැළැස්ම වූයේ මුළු ඊශ්‍රායෙල් ජාතියම පූජකයන් හෝ සේවකයන් වීමයි :

> **නුඹලා මට පූජක රාජ්‍යයක් සහ ශුද්ධ ජාතියක් වන්නහුය. නුඹ විසින් ඉශ්‍රායෙල් පුත්‍රයන්ට කිය යුතු වචන මේයයි කීසේක. (නික්මයාම 19:6)**

පූජකයන් වශයෙන්, ඊශ්‍රායෙලයේ සෑම පුද්ගලයෙකුම තමා අවට සිටි නොඇදහිලිවන්තයන්ට සැබෑ වූ එකම දෙවියන්වහන්සේ ගැන සාක්ෂි දැරිය යුතු විය. පූජකයන් ලෙස නිළයක් පත් කිරීම නිසා ඊශ්‍රායෙලය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැළැස්ම වෙනස් වූයේ නැත. පූජකයා නමැති තනතුර විශේෂ නායකත්ව භූමිකාවක් සහිත අද දවසේ පූජක පක්ෂයට සමාන විය. නමුත් මුළු මහත් ජාතියම තව දුරටත් අන්‍යජාතීන් වෙත දෙවියන්වහන්සේගේ පණිවුඩය ගෙන යන පණිවුඩකරුවන් ලෙස සේවය කළ යුතු විය.

නව ගිවිසුම තුළද, ඇදහිලිවන්තයන්ට ඒ හා සමාන කැඳවීමක් ලබා දී තිබේ. ඔවුහු ශුභාරංචියේ පූජකයන් හෝ සේවකයන් විය යුතුය.

> **නුමුත් අන්ධකාරයෙන් තමන්ගේ විස්මපත් ආලෝකයට නුඹලා කැඳවාගත් තැනන්වහන්සේගේ උත්කෘෂ්ටතාවන් දක්වන පිණිස නුඹලා වනාහි තෝරාගත් වංශයක්ද රාජකීය පූජකයෝද ශුද්ධවූ ජාතියක්ද දෙවියන්වහන්සේ සන්තක සෙනඟක්ද වන්නහුය. (1 පේත්‍රුස් 2:9)**

ඇදහිලිවන්තයන් උදෙසා වූ දෙවියන්වහන්සේගේ කැඳවීම නම් ඔවුන්ව ආත්මික අන්ධකාරයෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ආලෝකය තුළට ගෙන ආ දෙවියන්වහන්සේ ගැන සාක්ෂි දැරීමය (යොහන් 9:5). "නුඹලා කැඳවනු ලැබූ කැඳවීමට ඔබින ලෙස" හැසිරෙන ලෙස අදහිලිවන්තයන්ට පවසා තිබේ (එපීස 4:1). එක කැඳවීමක් ඇති අතර, එනම් ශුභාරංචියේ සාක්ෂිකරුවන් වීමයි. එය සියලු ඇදහිලිවන්තයන්ගේ කැඳවීමයි.

ශුභාරංචියේ පණිවුඩකරුවකු විමට ලබා දී ඇති කැඳවීම අධ්‍යාපනික හෝ ස්වාභාවික හැකියාවන් මත පදනම් වී නොමැත - දෙවියන්වහන්සේට පමණක් ගෞරවය ලැබෙන පිණිස උන්වහන්සේ සාමාන්‍ය ගිහි පුද්ගලයන් පාවිච්චි කරන සේක :

> **මක්නිසාද සහෝදරයෙනි, නුඹලාගේ කැඳවීම, එනම් මාංසය ලෙස ප්‍රඥාවන්ත බොහෝ දෙනෙක්වත් බලවන්ත බොහෝ දෙනෙක්වත් වංශවත් බොහෝ දෙනෙක්වත් කැඳවනු නොලැබූ බව බලාපල්ලා. නුමුත් දෙවියන්වහන්සේ ප්‍රඥාවන්තයන් ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ මෝඩ දේවල් තෝරාගත්සේකඃ දෙවියන්වහන්සේ ශක්තිමත් දේ ලජ්ජාවට පමුණුවන පිණිස ලෝකයේ දුර්වල දේවල් තෝරාගත්සේකඃ ඇත්තාවූ දේවල් නැතිකරන පිණිස නැති දේවල් වැනි ලෝකයේ පහත් දේවල්ද සුළුකොට සිතනු ලබන දේවල්ද දෙවියන්වහන්සේ තෝරාගත්සේක. එසේ කළේ කොයි මනුෂ්‍යයෙක්වත් දෙවියන්වහන්සේ ඉදිරියෙහි පාරට්ටුකර නොගන්නා පිණිසය. (1 කොරින්ති 1:26-29)**

## ධර්ම ප්‍රචාරණයේ දීමනාව :

ශුභාරංචියේ ඇතැම් පණිවුඩකරුවන්ට ශුභාරංචිය ප්‍රකාශ කරන්නකු විමට දෙවියන්වහන්සේගෙන් විශේෂ කැඳවීමක් ලැබී තිබේ. ශුභාරංචිය ප්‍රකාශකිරීමේ දීමනාව යනු, පුරුෂයන් හා ස්ත්‍රීන් ඊට ප්‍රතිචාර දක්වා ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිව යුතු සාමාජිකයන් බවට පත් වන ආකාරයකින් නොඇදහිලිවන්තයන් සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට ඇති හැකියාවයි. ශුභාරංචිය ප්‍රකාශ කරන්නා යන වචනය නව ගිවිසුමේ තුන් වතාවක් සඳහන්වේ. එපීස 4:11-12, දෙවියන්වහන්සේ ශුභාරංචි ප්‍රකාශකයන් වීමේ දීමනාව ඇති පුරුෂයන් හා කාන්තාවන් සභාවට ලබා දෙන බව පාවුල් පැවසුවේය.

කෙනෙකුට හොඳින් කතා කළහැකි බැවින්, හොඳ පෞරුෂත්වයක් ඇති බැවින් හෝ විවිධ වර්ග වල පුද්ගලයන් සමඟ හොඳ සම්බන්ධතා ඇති බැවින් කෙනෙකු ශුභාරංචි ප්‍රචාරකයකු විමට තීරණ කළ නොහැක. දෙවියන්වහන්සේ ශුභාරංචි ප්‍රකාශකයන් වීමට මිනිසුන් කැඳවා ඔවුන් සන්නද්ධ කරන සේක. සභාපාලකවරයෙකුගේ, ගුරුවරයෙකුගේ, හා ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ සේවය අතර කිසිඳු

තරඟයක් නොපැවතිය යුතුය. ශුභාරංචිය ප්‍රකාශ කරන්නා සභාවේ කොටසක් වන අතර ස්වීධිනව පැවත එන්නෙක් නොව.

ශුභාරංචි ප්‍රකාශ කරන්නෙකු වීමේ දීමනාව සභාවට දී ඇති නායකත්ව දීමනා පහෙන් එකකි. ඔවුන්ගේ ප්‍රධාන අරමුණ අන් අය සේවයෙහි යෙදවීමට සන්නද්ධ කිරීම වේ. මෙහි අදහස ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුට පව්කාරයන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ හැකියාව පමණක් නොව, ශුද්ධවන්තයන්ව ධර්ම ප්‍රචාරණයෙහි යෙදවීමේ හැකියාවද පැවතිය යුතු බවයි.

දෙවියන්වහන්සේ ඇතැම් අයට ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකු වීමේ විශේෂ දීමනාව ලබා දෙන නමුත්, සෑම ඇදහිලිවන්තයෙක්ම ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ කාර්යය ඉටු කරමින් අන් අය සමඟ ශුභාරංචිය බෙදා ගත යුතුය. 2 තිමෝති 4:5 දී ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකුගේ කාර්යය ඉටු කිරීමට තිමෝතිව උනන්දු කර තිබේ. ඔබට විශේෂ දීමනාව නොතිබිය හැකිය, නමුත් ශුභාරංචි ප්‍රකාශ කරන්නෙකුගේ කාර්යය ඉටු කිරීමේ වගකීම ඔබටද තිබේ.

## මැටි භාජන

> **නුමුත් ඒ බලයේ ඉතා උතුම්කම අපට නොව දෙවියන්වහන්සේට අයිතිවන පිණිස මේ වස්තුව අපි මැටි භාජනවල දරමුව, අපි හැම අතින්ම මඩිනු ලබමුව. (2 කොරින්ති 4:7)**

මෙම කොටසේදී පාවුල් කතා කරනු ලබන වස්තුව ශුභාරංචියයි. ඔබ, සාමාන්‍ය හැඩයක් ඇති සහ අපිරිසිඳු මැටි භාජනයක් වුවත්, ඔබේ මානුෂීය භාජනය දෙවියන්වහන්සේගේ මාලිගයයි. ඔබ මිනිසුන් හොඳින් හඳුනන්නේ නැති විය හැකිය. ඔබේ සමාජය, සභාව හෝ නිකාය තුළ ඔබ ප්‍රසිද්ධ කෙනෙක් නොවිය හැකිය. ඔබ සාමාන්‍ය කටයුතු සිදු කරන සාමාන්‍ය මනුෂ්‍යයෙකු විය හැකිය. නමුත් දෙවියන්වහන්සේට ඔබව ශුභාරංචි ප්‍රකාශකිරීමට පාවිච්චි කළ හැකිය.

ක්‍රියා 4 හි සඳහන් කොර මනුෂ්‍යයෙකු සුව කිරීමේ කතාන්දරය කියවන්න. පේත්‍රුස් හා යොහන් කවුන්සලය ඉදිරියේ පෙනී සිටි විට, ඔවුන් නූගත්, සාමාන්‍ය මිනිසුන් ලෙස පෙනීම අනිවාර්යය :

> **එවිට ඔව්හු පේත්‍රුස්ගේද යොහන්ගේද නිර්භීතකම දැක, ඔවුන් අපණ්ඩිතවූ නූගත් මනුෂ්‍යයන් බව දැන මවිතවූවෝය: ඔවුන් යේසුස්වහන්සේ සමග සිටි බව ඔව්හු ඇඳින්නෝය. සුවකරනු ලැබූ මනුෂ්‍යයා ඔවුන් සමග සිටිනවා දැක, ඊට විරුද්ධව කිසිවක් කියන්ට ඔවුන්ට නොහැකි විය. (ක්‍රියා 4:13-14)**

මෙම සාමාන්‍ය මිනිසුන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් වන පිවිතයක් ලබා තිබුණි. ඔවුන් තුළ වූ ජීවනයේ ප්‍රතිඵලය වූයේ බලවත්, ජීවිත වෙනස් කරවන ශුභාරංචියේ ප්‍රකාශනයයි.

යේසුස්වහන්සේ ගිහි පුද්ගලයන්ට ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ වගකීම භාර දුන් සේක. උන්වහන්සේ මසුන් අල්ලන්නන් ඔවුන්ගේ බෝට්ටු වලින් පිටතට ගෙන ඔවුන් මිනිසුන් අල්ලන්නන් බවට පත් කළ සේක. ශුද්ධාත්මයාණන් මගින් බලගැන්වූ විට සාමාන්‍ය මිනිසුන්ට අධි සාමාන්‍ය පුද්ගලයන් බවට පත්විය හැකි බව උන්වහන්සේ විශ්වාස කළ සේක.

ගිඩියොන් ගොවියෙකු විය. පාවුල් කූඩාරම් තනන්නෙකි. මෝසෙස් එඬේරෙකු විය. ලූක් වෛද්‍යවරයෙක් වූ අතර යෝසප් ශ්‍රේෂ්ඨ දේශපාලඥයෙක් විය. ඔබගේ අධ්‍යාපන මට්ටම හෝ රැකියාව කුමක් වුවත්, දෙවියන්වහන්සේට ඔබ උන්වහන්සේගේ සැළැස්ම තුළ පාවිච්චි කළ හැකිය.

ඔබ සිටින ස්ථානය හා ඔබ කවුරුන්ද යන්න වැදගත් වන්නේ නැත. වැදගත් වන්නේ දෙවියන්වහන්සේ ඔබ තබා තිබෙන ස්ථානය තුළ හිඳ ඔබ කරන දේය. බලපෑමක් කළ හැකි ආකාරයේ ධර්ම ප්‍රචාරණයක් සඳහා වැදගත් වනුයේ දෙවියන්වහන්සේගේ ස්ථානයන්හි, දෙවියන්වහන්සේගේ ක්‍රමයට, දෙවියන්වහන්සේගේ කාර්යයන් ඉටු කරන, දෙවියන්වහන්සේගේ පුරුෂයන් හා ස්ත්‍රීන් වීමයි.

# ස්වයං - පරීක්ෂණය

01. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

02. ධර්ම ප්‍රචාරණය තුළ දේව වචනයේ භූමිකාව සාරාංශගත කරන්න.

03. ධර්ම ප්‍රචාරණය තුළ දෙවියන්වහන්සේගේ භූමිකාව පැහැදිලි කරන්න.

04. ධර්ම ප්‍රචාරණය තුළ යේසුස්වහන්සේගේ භූමිකාව හඳුනාගන්න.

05. ධර්ම ප්‍රචාරණය තුළ ශුද්ධාත්මයාණන්වහන්සේගේ භූමිකාව සාරාංශගත කරන්න.

06. ධර්ම ප්‍රචාරණය තුළ යාච්ඤාවේ භූමිකාව පැහැදිලි කරන්න.

7. ධර්ම ප්‍රචාරණය තුළ ඔබගේ භූමිකාව හඳුනාගන්න.

8. “සාක්ෂිදැරීම” යන වචනය නිර්වචනය කරන්න.

9. “ගිහභාවය” යන පදය නිර්වචනය කරන්න.

10. “පූජකභාවය” යන පදය නිර්වචනය කරන්න.

11. ගිහිබවේ කැඳවීම යන්නෙන් අදහස්වන්නේ කුමක්දැයි පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. පිලිප්ට ශුභාරංචි ප්‍රකාශකරන්නෙකු වීමේ දීමනාව තිබුණි. ක්‍රියා 21:8 හි ඔහු ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකු ලෙස හඳුන්වා තිබේ. මෙම දීමනාව පිළිබඳ ඔහුගේ ක්‍රියාකාරීත්වය ක්‍රිස්තුස්වහන්සේ සමඟ ඔහුගේ මුල් කාලීන අත්දැකීම් වලින් ප්‍රකාශ වේ. ඔහුට යේසුස්වහන්සේ හමු වූ විට, ඔහු කළ පළමු දෙය වූයේ එම ආරංචිය නතානියෙල් සමඟ බෙදා ගැනීමය. (යොහන් 1:45-46). පසුව පිලිප් ආත්මික කුසගින්නේ සිටි ග්‍රීකයන් යේසුස්වහන්සේ වෙතට ගෙන ආවේය (යොහන් 12:21-22). මිනිසුන් විසින් පිලිප් උපස්ථායකයකු ලෙස පත් කරන ලද නමුත් (ක්‍රියා 6:1-6). දෙවියන්වහන්සේ විසින් සභාවේ ශුභාරංචිය ප්‍රකාශකරන්නෙකු ලෙස පත් කරන ලදි (එපීස 4:11-12). ශුභාරංචිය ප්‍රකාශ කරන්නෙකු වීමේ මෙම විශේෂ දීමනාව පිළිබඳ ඔබේ දැනුම වර්ධනය කරගැනීම සඳහා පිලිප්ගේ සේවය අධ්‍යනය කරන්න. පහත සඳහන් දේවල් පිළිබඳව අධ්‍යයනය කරන්න :

- ඔහුගේ පණිවුඩය : ක්‍රියා 8:12,35
- ඔහුගේ ජීවිතය තුළින් සිදු වූ බලයේ ප්‍රකාශ වීම : ක්‍රියා 8:5-8
- ඔහුගේ සේවය තුළ බව්තීස්මයේ භූමිකාව : ක්‍රියා 8:12,36-38
- ඔහුගේ පවුල් ජීවිතය : ක්‍රියා 21:8-9
- ඔහුගේ ගමන් : ක්‍රියා 8:4-5, 26,40
- කණ්ඩායම් හැසිරවීමට ඔහු තුළ වූ හැකියාව : ක්‍රියා 8:6
- තනි පුද්ගලයන්ට ඔහු කළ සේවය : ක්‍රියා 8:27-38
- දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම පිළිබඳ ඔහුගේ සංවේදීභාවය : ක්‍රියා 8:26,39
- දේව වචනය පිළිබඳ ඔහුගේ දැනීම : ක්‍රියා 8:3-35
- ඔහුගේ සේවයට මිනිසුන් දැක්වූ ප්‍රතිචාරය : ක්‍රියා 8:5,6,8,12,35-39

2. බලවත් ආත්ම දිනාගන්නෙකු වීම සඳහා පහත සඳහන් ගුණාංග මාලාව වැදගත් වේ.

(1) ඔබේ ගැළවීම පිළිබඳව ඔබට සැකයක් නැති විය යුතුය.
(2) ඔබ ශුද්ධාත්මයෙන් පූර්ණව සිටිය යුතුය.
(3) ඔබගේ ජීවන රටාව හා වාචික සාක්ෂිය පරස්පර නොවිය යුතුය.
(4) දෙවියන්වහන්සේගේ වචනය හා ක්‍රියා පිළිබඳව ඔබට ක්‍රියාකාරී දැනීමක් පැවතිය යුතුය.
(5) ඔබ යාච්ඤාවේ පුද්ගලයෙකු විය යුතුය.
(6) ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන්ව සිටින සියලුම පුද්ගලයන් නිරයට නියම වී ඇති බව තේරුම් ගැනීමෙන්, ඔබට නැති වූවන් පිළිබඳ සැළකිල්ලක් පැවතිය යුතුය.

3. ධර්ම ප්‍රචාරණයේදී දේව වචනය වැදගත් වන බැවින්, මිනිසුන් ගැළවීම වෙත ගෙන එන බයිබල් පද ඔබ ඉගෙන ගැනීම වැදගත් වේ. මෙම කාර්යය සඳහා ඔබට උපකාර වීමට සැළැස්මක් පහත දැක්වේ :

(1) කුඩා කාඩ් පතක හෝ කඩදාසියක එක් පසක කටපාඩම් කළ යුතු බයිබල් පදය ලියන්න.
(2) කාඩ් පතෙහි අනෙක් පස, එය සඳහන් ස්ථානය ලියන්න.
(3) ඔබ කාඩ් පතෙහි පදය සඳහන් ස්ථානය දැක්වෙන පැත්ත දෙස බලන විට පදය මතකයෙන් පැවසීමට උත්සාහ කරන්න.
(4) ඔබ කාඩ් පතෙහි පදය සඳහන් පැත්ත දෙස බලන විට එය සඳහන් ස්ථානය ඔබට මතක දැයි බලන්න.

# පස් වන පරිච්ඡේදය

# පණිවුඩය සන්නිවේදනය කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- ශුභාරංචිය සන්නිවේදනය කිරීම සඳහා වැදගත් ප්‍රතිපත්ති හයක් හඳුනාගැනීමට,
- වෙනත් සංස්කෘතීන් වල පුද්ගලයන්ට ශුභාරංචිය සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදය ඇතුළත් බයිබල් පදයක් හඳුනාගැනීමට, හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නුඹ තුළ පවතින සියලු යහපත් දේ ගැන දැනගැනීමෙන් නුඹේ ඇදහිල්ලේ හවුල්කාරකම ක්‍රිස්තුස්වහන්සේ උදෙසා බලවත්වන පිණිස, මාගේ යාච්ඤාවලදී නුඹ ගැන මතක්කරමින් නිතරම මාගේ දෙවියන්වහන්සේට ස්තුතිකරමි (පිලමොන් 5,6).**

## හැඳින්වීම

තුන් වන පරිච්ඡේදයේදී ශුභාරංචි පණිවුඩය තුළ අන්තර්ගත වන දේවල් ගැන ඔබ ඉගෙන ගත් අතර හතරවන පරිච්ඡේදයේදී ඔබ ශුභාරංචියේ පණිවුඩකරු වන බව ඉගෙන ගත්තේය. මෙම පරිච්ඡේදයේදී අවධානය යොමු කරනුයේ, ශුභාරංචි පණිවුඩය සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදය කෙරෙහිය.

බලපෑමක් කළ හැකි ආකාරයේ සන්නිවේදනයක් යනු, කෙනෙක් වරදවා වටහා නොගන්නා ආකාරයෙන් පණිවුඩයක් එක්කෙනෙකු විසින් තවත් කෙනෙකු වෙත මාරු කිරීමේ ක්‍රමයයි. ධර්ම ප්‍රචාරණයේදී වඩාත් වැදගත් ලෙස සළකනුයේ තේරුම්ගනු ලබන හා පිළිගනු ලබන ආකාරයකින් ශුභාරංචිය බෙදා ගැනීමයි.

## ධර්ම ප්‍රචාරණමය සන්නිවේදනය

ශුභාරංචිය ප්‍රකාශ කිරීමේදී වැදගත් ප්‍රතිපත්ති හයක් තිබේ. ධර්ම ප්‍රචාරණමය සන්නිවේදනය තුළ පහත දේවල් අන්තර්ගත විය යුතුය.

**මානුෂික හා දිව්‍යමය අංග ඇතුළත්වීම :**

ධර්ම ප්‍රචාරණමය සන්නිවේදනය වෙනත් ආකාර වල සන්නිවේදනයන්ගෙන් වෙනස් වනුයේ මෙහි ක්‍රියාවලිය තුළ දේව වචනය, පියාණන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ඇතුළත් වන බැවිනි. ශුභාරංචිය බෙදා ගැනීම යනු අන් අය සමඟ කතා කිරීම හෝ සතුටු සාමිච්චියේ යෙදීම නොවේ. පණිවුඩය ලබන්නන්ට එය ඒත්තු ගන්වන්නට සහ එය පිළිබඳ ස්ථිර විශ්වාසයක් ඇති කිරීමට හැකියාව ලබාදෙන්නේ බලවත් ආත්මික මූලාශ්‍ර තුළින් දෙනු ලබන දිව්‍යමය සන්නිවේදනයයි.

**සියලුම පංතිවල මිනිසුන් උදෙසා විය යුතුවේ :**

ධර්ම ප්‍රචාරණය දුප්පත් පොහොසත්, උගත් නූගත්, ශිෂ්ඨ අශිෂ්ඨ ආදී සියලුම පන්තිවල මිනිසුන් උදෙසා විය යුතුය. පාවුල් මෙසේ පවසමින් මේ බව අනුමත කළේය...

> **මම ග්‍රීක්වරුන් හා ම්ලේච්ජයන්ටත් ඥානවන්තයන් හා අඥානයන්ටත් ණයකාරයෙක්ව සිටිමි. එසේ රෝමයෙහි සිටින්නාවූ නුඹලාටත් මට පුළුවන් ප්‍රමාණයට ශුභාරංචිය දේශනාකරන්ට මම සැදී සිටිමි (රෝම 1:14).**

තමා ණයකාරයෙක්ව සිටින බව පැවසීමේදී ඔහු අදහස් කළේ ඔහු ශුභාරංචිය දැන සිටි බැවින් එය අන් අය සමඟ බෙදා ගැනීමට ඔහු ණයව සිටින බවය. සෑම තැනකම සිටි මිනිසුන් පිළිබඳව ඔහුට ඇති මෙම වගකීම හැඟුණි. පාවුල්ගේ මනස තුළ කිසිඳු පන්ති බෙදීමක් වූයේ නැත. සෑම කෙනෙකුටම ශුභාරංචිය අවශ්‍ය විය. දුප්පත්කමින් හෝ පොහොසත් බවින් වැඩි, ආගමානුකූල බවින් වැඩි හෝ මිත්‍යා දෘෂ්ටික බවින් වැඩි, වඩා සමීප හෝ දුරස්ථ වශයෙන් කිසිවෙක් සිටියේ නැත. ශුභාරංචිය බෙදා ගනීමේදී ඔබට පක්ෂපාති විය නොහැකිය. ඔබ පක්ෂපාති බවක් හඟවයි නම්, ඔබ කරන්නේ පාපයකි. (යාකොබ් 2:1-4)

## කණ්ඩායම් හා තනි පුද්ගලයන් අතර සමබරතාව රැක ගන්න :

බොහෝ ඇදහිලිවන්තයන් පුරුදු වී සිටින්නේ සමූහයන්ගෙන් සෑහීමකට පත් වීමටය. දේවගැතිවරු තම කාලයෙන් වැඩි කොටසක් වැය කරන්නේ කණ්ඩායමක් ඉදිරියේ තබා ඇති ධර්මාසනයක් අභියසය. තනි පුද්ගලයන් සමූහය තුළ අතරමංව සිටී. රූපවාහිනිය හා ගුවන් විදුලිය වැනි ජන සන්නිවේදන පහසුකම් ඇති බොහෝ සංස්කෘතීන් තුළ මෙය සැබවින්ම සිදු වේ.

පෞද්ගලික සම්බන්ධතා වෙනුවට වෙනත් ක්‍රමයක් නැත. පාවුල් විශාල සමූහයන්ට සේවය කළ නමුත් තෙසලෝනිකවරුන්ට සේවය කරන විට ඔහුගේ නිදර්ශනය වූයේ දරුවෙකුට සත්කාර කරන මවක් හෝ තමාගේම දරුවන් සමඟ සිටින පියෙකුට විය. (1 තෙසලෝනික 2:7,11) ඔහු තම සේවය කණ්ඩායම් හා තනි පුද්ගලයන් අතර සමබරව පවත්වාගෙන ගියේය.

යේසුස්වහන්සේ සමූහයන්ට ධර්ම ප්‍රචාරය කළ අතරම සමාරිය ස්ත්‍රිය, නිකදේමුස්, සාකෙවුස් හා තවත් එවැන්නන් සමඟ ද උන්වහන්සේ ශුභාරංචිය බෙදාගත් සේක.

## සංස්කෘතිමය පසුබිම හඳුනාගන්න :

විවිධ සංස්කෘතීන් තුළ දේවල් සිදු කිරීමට විවිධ ආකාර තිබේ. බයිබලීය යුගයේදී පවා මෙය සත්‍යයක් විය. උදාහරණයක් ලෙස, ලුස්ත්‍රාව දුෂ්කර සහ මිත්‍යා ඇදහිලි සහිත ස්ථානයක් විය. ඇතැන්ස් ඉතා දියුණු නගරයක් වූ අතර එහි ශුභාරංචිය පැවසීම ඉතා අසීරු විය. බෙරීය දේව වචනය සතුටින් භාර ගත්තේය. ඔවුන් සත්‍ය සොයමින් සිටියහ.

බොහෝ සංස්කෘතික, භාෂාමය, දේශපාලනික, අධ්‍යාපනික හා ජාතික වෙනස්කම් අභියෝග ගෙන දෙන අතර ඒවා ජය ගෙන පිළිගතහැකි ආකාරයකින් ශුභාරංචිය ඉදිරිපත් කළ හැකිය. වෙනත් සංස්කෘතීන් හඳුනාගැනීම සඳහා ඔබගේ සිතුවිලි හා හැසිරීම ඊට ඔබින පරිදි හැඩගසා ගැනීම අවශ්‍ය වේ. සැබවින්ම, දේව වචනයේ සඳහන් ආකාරයට වඩා වෙනස් ලෙස ඔබ ඔබේ සිතුවිලි හා හැසිරීම් වෙනස් කරගත යුතු නැත. නමුත් ශුභාරංචිය බෙදාගැනීමේදී වඩා ප්‍රයෝජනවත් වන ලෙස ඔබට වෙනත් ආකාර වලින් වෙනස් විය හැකිය.

අසන්නන්ට තේරුම්ගත හැකි ආකාරයකින් ශුභාරංචිය ප්‍රකාශ කළ යුතුය. වචන මාලාව, භාෂාව, හා ඉදිරිපත් කරන ශෛලිය ආදිය ශුභාරංචිය තේරුම් යන පරිදි හැඩගැසිය යුතුය. පාවුල් මෙය තේරුම් ගත් අතර ප්‍රායෝගිකව භාවිත කළේය (ක්‍රියා 21:37-40; 22:2).

වෙනත් සංස්කෘතීන් වල පුද්ගලයන්ට බලපෑමක් කළ හැකි අයුරින් ශුභාරංචිය සන්නිවේදනය කළ හැකි රටාවක් ක්‍රියා 26:18 හි දැක්වේ. දෙවියන්වහන්සේ අන්‍යජාතිකයන් වෙත පාවුල් යැවූ සේක...

> **ඔවුන් අන්ධකාරයෙන් ආලෝකයටද සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතටද හැරෙන ලෙස ඔවුන්ගේ ඇස් පහදවන්ට ඔවුන් වෙතට නුඹ යවමියි කීසේක (ක්‍රියා 26:18).**

**පහත කරුණු ඉටු වන ආකාරයට ශුභාරංචිය ඉදිරිපත් කළ යුතුය :**

1. එය මිනිසුන්ගේ දෑස් විවර කරන ලෙස.
2. ඔවුන් ආත්මික අන්ධකාරයෙන් ආලෝකයට හැරෙන ලෙස
3. ඔවුන් සාතන්ගේ බලයෙන් දෙවියන්වහන්සේ වෙතට හැරෙන ලෙස
4. ඔවුන් ගැළවීම තුළින් පව් සමාව ලබා ගන්නා ලෙස
5. ඇදහිල්ලෙන් පවිත්‍ර වීම තුළින් ඔවුන් ආත්මික උරුමයක් ලබන ලෙස

**මනුෂ්‍යයෙකු හැදෙනු වැඩෙනු ලැබූ සංස්කෘතිය මඟින් ක්ෂේත්‍ර පහක් තීරණය වේ :**

- **ඔහුගේ භාෂාව :** ඔහු සන්නිවේදනය කරන හා අදහස් හුවමාරු කරන ආකාරය

- **ලෝකය පිළිබඳ ඔහුගේ දෘෂ්ටිය :** ඔහු ලෝකය දෙස බලන හා එය තේරුම් ගන්නා ආකාරය.

- **ඔහුගේ විශ්වාසයන් :** ආගම, අධි ස්වාභාවික දේවල් පිළිබඳ විශ්වාසයන්, සිතුම් පැතුම්, සිතුවිලි මාලාවන්.

- **ඔහුගේ වටිනාකම් :** වටිනාකම, අවශ්‍යතාවය හා වැදගත් යැයි ඔහු සළකන දේවල්.

- **ඔහුගේ හැසිරීම :** ඔහු ක්‍රියා කරන හා හැසිරෙන අයුරුඃ සාමාජියව හා සංස්කෘතිකමය ලෙස පිළිගත හැකි හැසිරීම.

ක්‍රියා 26:18 තුළ පහත කරුණු ඉදිරිපත් කර ඇති ආකාරය පහත වගුව තුළින් ඔබට හඳුනාගත හැකිය.

| | |
|---|---|
| | භාෂාව : පණිවුඩය බලවත් ලෙස සන්නිවේදනය කළ අතර, එය තේරුම්ගත හැකි වු අතර එය පිළිගැන්විණි. |
| | ලෝක දෘෂ්ටිය : බයිබලිය ලෝකය පිළිබඳ දෘෂ්ටිය සන්නිවේදනය කරන ලදි. |
| ඔවුන්ගේ දෑස් විවර කරයි : | ඇදහිලි : ඇදහිල්ලේ පණිවුඩයඃ රාජ්‍යයේ ශුභාරංචිය ඔවුන්ගේ ඇදහිලි වෙනස් කළේය. |
| ඔවුන් හැරී එය භාරගනු ඇත : | වටිනාකම් වෙනස් වේ. |
| | හැසිරීම වෙනස් වේ. |

## වචන වල සීමාවෙන් එපිටට යන්න :

සන්නිවේදනයට වචන මුලික වේ. ලිඛිත වචනය තුළින්, දෙවියන්වහන්සේ උන්වහන්සේගේ කැමැත්ත මනුෂ්‍ය වර්ගයාට එළිදරව් කළ සේක. නමුත් නව ගිවිසුමේ නායකයන්ගේ ආදර්ශය අනුව යන්නන් ලෙස, විශේෂයෙන් අත්දැකීම් වලින් වැඩියෙන් සමන්විත වු සංස්කෘතින් වලදී, ඔබ වචන වල සීමාවන්ගෙන් එපිටට යා යුතුය. දෙවියන්වහන්සේගේ ආගාව මිනිසුන් ශුභාරංචියේ සත්‍යය ඇසීම පමණක් නොව එය අත්දැකීමය. "නුඹලා යන අතරතුර රෝගීන් සුව කරමින් යක්ෂයන් පලවා හරින්න"යැයි යේසුස්වහන්සේ පැවසුවේ මේ නිසාය. ශුභාරංචිය සන්නිවේදනය කිරීම වාචික ඉදිරිපත් කිරීමෙන් එහා ගිය දෙයකි. එය බලය පෙන්නුම් කිරීමයි.

## ඔබගේ ජීවන රටාව නිසි ලෙස හසුරුවා ගන්න :

මෙලෙස ජීවත් වන ලෙස පාවුල් පිලමොන්ට පැවසුවේය...

> **නුඹ තුළ පවතින සියලු යහපත් දේ ගැන දැනගැනීමෙන් නුඹේ ඇදහිල්ලේ හවුල්කාරකම ක්‍රිස්තුස්වහන්සේ උදෙසා බලවත්වන පිණිස, මාගේ යාච්ඤාවලදී නුඹ ගැන මතක්කරමින් නිතරම මාගේ දෙවියන්වහන්සේට ස්තුතිකරමි (පිලමොන් 5,6).**

කිතනු චරිතය හා අන් අයට යේසුස්වහන්සේ හඳුනාගත හැකි ආකාරයේ හැසිරීම තුළින් තම ඇදහිල්ල අන් අයට දන්වන ලෙස පාවුල් පිලමොන්ව ධෛර්යමත් කළේය. කෙතරම් වචන සංඛ්‍යාවකට හෝ රැවටිලිකාරයාගේ බලය අභිබවා යා නොහැකි අතර, යහපත් අදර්ශයක් තුළ ඇති බලයෙන් අත්පත් කරගත හැකි දේවල් වචන වලින් පමණක් ළඟා කරගත නොහැකිය. ශුභාරංචිය ප්‍රකාශ කිරීමේදී බලපෑමක් සිදු වීමට නම් එය ඔබගේ ජීවන රටාව සමඟ එකඟ විය යුතුය.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ශුභාරංචිය සන්නිවේදනය කිරීමේදී වැදගත් වන ප්‍රතිපත්තීන් හයක් ලියා දක්වන්න.

3. වෙනත් සංස්කෘතීන් වල පුද්ගලයන්ට ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ රටාව දක්වන බයිබල් පදය කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යහපත් සවන්දෙන්නෙකු වීම හොඳ සන්නිවේදකයෙකු වීමේ එක් කොටසකි. සවන්දීම සඳහා මූලික ප්‍රතිපත්ති කිහිපයක් පහත දැක්වේ :

   - අනෙක් පුද්ගලයා පවසන දෙයට සවන් දීමට ඔබේ මුළු අවධානය ලබා දෙන්න. සවන් දීම යනු බාධා කිරීම නොවේ. එහි අදහස කතා කිරීමට ඔබට ඇති ආශාව පාලනය කිරීමයි.

   - ඔහු පවසන දෙයට මූලිකත්වය දෙන්න. ඔබ ළඟ පිළිතුරක් තිබේ යැයි ඔබට හැඟිය හැකි නමුත්, ඔබ ප්‍රශ්නය කුමක්දැයි සැකහැර දැනගන්නා තුරු හිඳින්න.

   - කතාකරන තැනැත්තා පවසන දේ ඔබ නිවැරදිවම තේරුම්ගත්තේ දැයි සැකහැර දැන ගන්න. එසේ නොවේ නම් ප්‍රශ්න අසන්න.

   - සවන්දීමේ ක්‍රියාවලියට ප්‍රශ්න වැදගත් වේ. පවසනු ලබන දෙය පැහැදිලි කර ගැනීමට ඒවා උදව් වේ.

   - වචන වලින් තොරව සන්නිවේදනය කරන දේවල් හඳුනාගන්න. වචන පිළිබඳව පමණක් නොව, මුහුණේ ඉරියව් පිළිබඳව සහ ක්‍රියාවන් පිළිබඳව ද සංවේදී වන්න. කෙනෙකු යමක් පවසනවා විය හැකි නමුත්, ඔහුගේ ඉරියව් හා ක්‍රියාවන් වෙනත් දෙයක් එළිදරව් කළ හැකිය.

2. පාවුල්ගේ දේශනාකිරීම ජාතීන් හා රටවල් අනුව වෙනස් විය. ක්‍රියා 13 හි සඳහන් අන්තියෝකියේ සිනගෝගයේදී ඔහු කළ දේශනාව ක්‍රියා 17 හි සඳහන් ඇතැන්ස්හිදී ඔහු කළ දේශනාව සමඟ සසඳන්න.

3. යේසුස්වහන්සේ හොඳ සන්නිවේදකයෙකු විය :

   - උන්වහන්සේට ඓතිහාසික දැනුම මෙන්ම බයිබලිය දැනුමද තිබීය : මතෙව් 12:38-42.

   - මිනිසුන්ට හුරු වූ වස්තූන් හා පිංතූර උන්වහන්සේ භාවිත කළ සේක : ලූක් 21:29-32; මාර්ක් 4:21-34

   - උන්වහන්සේ සරල වූ අතර, ආලෝකය, ආහාර, යහපත් බැටළු එඬේරාණෝ හා මිදිවැල ගැන කතා කළ සේක : යොහන් 6:35; 8:12; 15:1

   - උන්වහන්සේ සැම විටම පිළිතුරු නුදුන් සේක, නමුත් උන්වහන්සේගේ ඉගැන්වීම් බොහොමයක් උපමා හා ප්‍රශ්න තුළින් ඉදිරිපත් කළ සේක.

   - උන්වහන්සේ හාස්‍ය ජනක දේ පාවිච්චි කළසේක. උදාහරණයක් ලෙස ඔබගේ සහෝදරයාගේ ඇසෙහි ඇති රොඩ්ඩ හා ඔබගේ ඇසෙහි ඇති පරාලය සැසඳීම දැක්විය හැකිය : මතෙව් 7:3-5.

   - උන්වහන්සේ හේතු පාවිච්චි කළ සේක : මතෙව් 12:1-32.

# හය වන පරිච්ඡේදය

## පණිවුඩය ලබාගන්නා අය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- ඇදහිලිවන්තයන් වැඩිකිරීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ ක්‍රියාවලිය පහැදිලි කිරීමට
- මෙම ක්‍රියාවලියට උදාහරණ ලෙස පාවිච්චි කරන ලද නව ගිවිසුමේ මිනිසුන් දෙදෙනෙක් නම් කිරීමට
- ධර්ම ප්‍රචාරණය සඳහා ප්‍රමුඛත්වයන් හඳුනාගැනීමට
- බයිබලයේ විස්තර කර ඇති සතර ආකාරයක පව්කාරයන් හඳුනාගැනීමට
- ධර්ම ප්‍රචාරණය කිරීමට පටන් ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න (2 තිමෝති 2:2).**

### හැඳින්වීම

ඔබ අධ්‍යයනය කරනුයේ සුභාරංචියෙන් ලෝකය වෙත ළඟා වීම උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැළැස්මයි :

- පණිවුඩය තුළ අන්තර්ගත දේ වනුයේ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.
- ශුද්ධාත්මයාණන්ගේ බලවත් බලය තුළින් හැකියාව ලබා දෙන ලද පණිවුඩකරුවන් වනුයේ ගෝලයන්ය.
- මුළු ලෝකයම පණිවුඩය ලබාගන්නන් විය යුතුය.

අද අප ජීවත් වනුයේ වර්ධනය වන ලෝකයකය. සෑම දිනකදීම දහස් ගණනක් නව මනුෂ්‍යයන් උපත ලබති. ලෝක ජනගහනය වේගයෙන් වර්ධනය වේ. ශුභාරංචිය අසා නැති මිනිසුන් මිලියන ගණනක් සිටිති.

යේසුස්වහන්සේ ඇදහිලිවන්තයන්ට ලබා දුන් අභියෝගය නම් මුළු ලෝකයටම ශුභාරංචිය ගෙන යාමය. කලින් පාඩම් දෙකේදී පණිවුඩය පිළිබඳවත්, පණිවුඩකරුවන් පිළිබඳවත් ඔබ ඉගෙන ගත්තේය. නමුත් පණිවුඩය ලබා ගැනීමට බලා සිටින මහත් ජන සමූහයක් අතරින්, පණිවුඩකරුවන් පටන්ගත යුත්තේ කොතැනින්ද? ප්‍රමුඛත්වය දිය යුත්තේ කුමකටද සහ ඔබ ආරම්භ කළ යුත්තේ කොතැනින්ද? පණිවුඩය ලබාගන්නන් විය යුත්තේ කවුද?

### ගුණනය කිරීමේ ක්‍රියාවලිය

ලෝකයට ශුභාරංචිය ගෙන යාමේ මෙහෙවර සම්පූර්ණ කිරීමේ හැකියාව ඇදහිලිවන්තයන්ට ලබා දෙන විශේෂ ක්‍රියාවලියක් දෙවියන්වහන්සේ බයිබලය තුළින් එළිදරව් කර තිබේ. එය ආත්මිකව ගුණනය වීමේ ප්‍රතිපත්තිය මත පදනම් වී තිබේ. ගුණනය වීම යනු ස්වාභාවික ලෝකයේ සෑම වර්ධනයකටම මූලික වන ප්‍රතිපත්තියයි. වර්ධනය ඇතිවන්නේ එක් ඒකකයක් තව එකකට එකතු කිරීමෙන් නොවේ. ජීවී සෛල ගුණනය වේ. මෙහි අදහස, නිපදවනු ලැබූ සෑම අලුත් සෛලයකටම නැවත නිපදවීමේ හැකියාව ඇති බවය.

ධර්ම ප්‍රචාරණයේ දෙවියන්වහන්සේගේ සැළැස්ම ස්වාභාවික ලෝකයේ ජීවී සෛල මෙන්ම ගුණනය මත පදනම් වී ඇත. පාවුල් තිමෝතිට මෙම වදන් ලියන විට ඔහු එය සාරාංශ කොට දැක්වූවේය.

**බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න (2 තිමෝති 2:2).**

විශ්වාසවන්ත මනුෂ්‍යයන් තෝරා තමා ඔහුට ඉගැන්වූ දේවල් ඔවුන්ට භාරදෙන්න යැයි පාවුල් තිමෝතිට පැවසුවේය. මෙම විශ්වාසවන්ත මනුෂ්‍යයන්ට අන් අයට ඉගැන්වීමේ හැකියාව තිබිය යුතු විය. මෙම සංවිධානාත්මක යලි ඵල දැරීමේ සැළැස්ම තුළින්, ලෝකය පුරා ශුභාරංචිය ව්‍යාප්ත වනු ඇත.

මෙම ක්‍රියාවලිය සිදුවන අයුරු දැන ගැනීමට, ඊළඟ පිටුවේ ඇති වගුව දෙස බලන්න. මෙම වගුව තුළදී කෙනෙකුව ශුභාරංචිය වෙතට හරවාගෙන නැවත ඵල දරන කිතුනුවෙකු ලෙස පුහුණු කිරීමට අවශ්‍ය සාමාන්‍ය කාලය ලෙස සළකා ඇත්තේ වසරකි. නමුත් සැබවින්ම, ඒ සඳහා දායකවන පුද්ගලයා මත පදනම්ව මෙම කාලය අඩු වැඩි විය හැකිය. එම නිසා ස්ථිර කාල සීමාවක් දැක්වීම කළහැකි දෙයක් නොවේ. නමුත් ඇදහිලිවන්තයෙකු සෑම වසරකදීම එක් පුද්ගලයෙකු දිනාගෙන ඔහුව ගෝලයෙක් කර සෑම වසරකදීම එක් කෙනෙක් දිනා ගැනීම වෙත ඔවුන් යොමු කළහොත්, ලෝකයට පහසුවෙන් ශුභාරංචි පණිවුඩය ගෙන යා හැකිවනු ඇත.

වගුව තුළ පළමු වසරේදී ඇදහිලිවන්තයා එක් අයකු ගෝලයකු කරන අයුරු නිරීක්ෂණය කරන්න. එම වසර අවසානයේදී, විශ්වාසවන්ත මනුෂ්‍යයන් දෙදෙනෙකු සිටී. එනම් ඇදහිලිවන්තයා සහ කිතුනු ඇදහිල්ලේ මූලික ප්‍රතිපත්තිය තුළ ඔහු විසින් ගෝලයකු ලෙස පුහුණු කරන ලද නව ඇදහිලිවන්තයාය.

ඊළඟ වසර තුළදී, ඔවුන් එක්එක්කෙනා තවත් පුද්ගලයා බැගින් දිනා ගෙන ඔවුන් ගෝලයෝ කරති. දෙවන වර්ෂය අවසාන වන විට, එකතුව හතර දෙනෙකු වන අතර ඔවුන් සෑම කෙනෙක්ම ඊළඟ වර්ෂයේදී තවත් කෙනෙකු ගෝලයකු කරනු ඇත.

| | **ගෝලයන් කරන්නා (කරන්නන්)** | **ගෝලයා (ගෝලයන්)** | **එකතුව** |
|---|---|---|---|
| 17 වන වර්ෂය | 65,536 | 65,536 | = 131,072 |
| 16 වන වර්ෂය | 32,768 | 32,768 | = 65,536 |
| 15 වන වර්ෂය | 16,834 | 16,834 | = 32,768 |
| 14 වන වර්ෂය | 8,192 | 8,192 | = 16,834 |
| 13 වන වර්ෂය | 4,096 | 4,096 | = 8,192 |
| 12 වන වර්ෂය | 2,048 | 2,048 | = 4,096 |
| 11 වන වර්ෂය | 1,024 | 1.024 | = 2,048 |
| 10 වන වර්ෂය | 512 | 512 | = 1,024 |
| 9 වන වර්ෂය | 256 | 256 | = 512 |
| 8 වන වර්ෂය | 128 | 128 | = 256 |
| 7 වන වර්ෂය | 64 | 64 | = 128 |
| 6 වන වර්ෂය | 32 | 32 | = 64 |
| 5 වන වර්ෂය | 16 | 16 | = 32 |

| | | | | |
|---|---|---|---|---|
| 4 වන වර්ෂය | 8 | 8 | = | 16 |
| 3 වන වර්ෂය | 4 | 4 | = | 8 |
| 2 වන වර්ෂය | 2 | 2 | = | 4 |
| 1 වන වර්ෂය | 1 | 1 | = | 2 |

ගුණනය කිරීම තුළින් ධර්ම ප්‍රචාරණය

දැන් සාමාන්‍යයෙන් සභාවක සිටින සාමාජිකයන් ගණන ආසන්න වශයෙන් 100 ලෙස සළකන්න. මෙම වගුව වසරකදී එක් අයකු දිනාගෙන ඔවුන්ව යළි එලදැරීමේ නිරත කරවන මිනිසුන් ගණන 100 දක්වා වැඩි කරන්න. අපට පහසුවෙන්ම ලෝකය දිනාගත හැක්කේ කෙසේදැයි ඔබට දැකගත හැකි වනු ඇත. කෙනෙකුව දිනාගෙන ඔහුට ඉගැන්වීමට ඔබ කෙනෙකුට පුහුණු කරන විට, ගෝලයන් වේගයෙන් වර්ධනය වන අතර, වැඩි වීම එකතු වීමට වඩා වේගවත් වනු ඇත.

## මුල්කාලීන සභාවේ ක්‍රියාවලිය

යේසුස්වහන්සේගේ මුල්ම ගෝලයන්ගෙන් කෙනෙක් වූ ඇන්ඩෘ තුළින්, ගුණනය වීම තුළින් ශුභාරංචිය කිරීම සිදු වූ අයුරු පහත සටහනින් දැක්වේ.

ඇන්ඩෘ → පේතෘස් → වෙනත් අය →

පේතෘස් | පෙන්තකොස්තය දිනය →

1. ඇන්ඩෘ ඔහුගේ සහෝදරයා වූ පේතෘස් සමඟ ශුභාරංචිය බෙදා ගත්තේය.

2. පේතෘස් පෙන්තකොස්ත දිනයේදී යෙරුසලමේදී ශුභාරංචිය බෙදා ගත්තේය.

3. යළි එල දැරීය හැකි අය බවට පත්වූ අයට පේතෘස් දිගින් දිගටම ශුභාරංචිය බෙදා ගත්තේය.

4. යෙරුසලමෙන් විසිර ගිය ඇදහිලිවන්තයන් දහස් ගණනක් දිගටම ශුභාරංචිය බෙදා ගත්හ.

5. ඔවුන් දිනා ගත් සෑම පුද්ගලයෙක්ම යළි එල දරන තත්වයට පත් වූ අතර ක්‍රියාවලිය දිගටම සිදුවිය.

අපෝස්තළුවරු පාවුල්ගේ ධර්ම ප්‍රචාරණයේ පළමු අදියර මෙම සටහනින් දැක්වේ.

අනනියස් → පාවුල් → වෙනත් අය

තිමෝති → වෙනත් අය

විශ්වාසවන්ත මනුෂ්‍යයන් → වෙනත් අය

වෙනත් අය → වෙනත් අය

1. පාවුල් නගා සිටුවීමට දෙවියන්වහන්සේ අනනියස් පාවිච්චි කළ සේක.
2. පාවුල් තිමෝතිව ගෝලයෙකු ලෙස ගොඩ නැගුවේය.
3. පාවුල් දිගින් දිගටම තවත් අය ගෝලයන් කළේය.
4. තිමෝති අන් අයට ඉගැන්විය හැකි විශ්වාසවන්ත මනුෂ්‍යයන්ව ගෝලයන් කළහ.
5. විශ්වාසවන්ත මනුෂ්‍යයෝ වෙනත් අය දිනාගත්හ.
6. මෙම “වෙනත් අය” ගුණනය වීමේ ක්‍රියාවලිය දිගින් දිගටම සිදු කළහ.
7. මෙම ජාලය තුළ සිටින සෑම පුද්ගලයෙක්ම දිගින් දිගටම ගුණනය විය.

## ධර්ම ප්‍රචාරණයේදී ප්‍රමුඛත්වය දිය යුතු කරුණු

ධර්ම ප්‍රචාරණයේදී මූලිකත්වය දිය යුතු කරුණු කිහිපයක් දේව වචනය තුළ හඳුනාගෙන තිබේ. එම ප්‍රමුඛත්වයන් මෙසේ දැක්විය හැකිය :


### පවතින සාමාජීය ජාල :

පවතින සමාජීය ජාල තුළින් ශුභාරංචිය ඉතා වේගයෙන් වර්ධනය වන බව නව ගිවිසුම එළිදරව් කරයි. මේ තුළින් අප අදහස් කරනුයේ ඔබට ඔබේ මිතුරන්ගෙන්, ඥාතීන්ගෙන් හා ඔබ සමඟ වැඩ කරන අයගෙන් සමන්විත සමාජ කණ්ඩායම් වලට ඉතා පහසුවෙන් ශුභාරංචිය බෙදා ගත හැකි බවයි.

උදාහරණයක් ලෙස යේසුස්වහන්සේ ඇන්ඩෲ නම් එක් මසුන් අල්ලන්නෙකු කැඳවූ සේක. ඇන්ඩෲ ඔහුගේ ඥාතියෙකු වූ පේතෘස් සමඟ ශුභාරංචිය බෙදා ගත්තේය. ඔවුන් සමඟ වැඩ කළ සෙසු මසුන් මරන්නන් සමඟ ශුභාරංචිය බෙදා ගත්හ. ඉක්මනින්ම මසුන් මරන්නන් කණ්ඩායමක්ම යේසුස්වහන්සේ අනුගමනය කළහ.

ඔබේ ඥාතීන්, මිතුරන් හා ඔබ සමඟ වැඩ කරන අය සිටින, රැකියා ස්ථානය, පවුල හා සමාජය ඔබ සේවය කළ යුතු ප්‍රදේශය වේ. ධර්ම ප්‍රචාරණය ආරම්භ කිරීමට ඔබට උපකාරී වීම පිණිස පහත ඇති රූප සටහන යොදාගන්න. රූප සටහනේ පහලින්ම ඇති රවුම තුළ ඔබේ නම ලියන්න. ඔබේ

අසල්වැසියන් හා පවුලේ සමාජිකයන් වැනි ඔබ ආශ්‍රය කරන අය ගැන සිතන්න. තවමත් ගැළවීම ලබා නොමැතිව ඔබේ සභාවට සහභාගි වන අය ගැන සිතන්න. ඔබ වටා ඇති රවුම් වල ඔබට සමීප සම්බන්ධතාවයක් ඇති නොඇදහිලිවන්තයන් වන ඥාතීන් හෝ මිතුරන් තිදෙනෙකුගේවත් නම් ලියන්න.




රූප සටහන දෙස බලන්න. ඔබේ මිතුරන් හා ඥාතින්ගෙන් ඔබ දෙසට යොමු වී ඇති ඊතල දෙස බලන්න. මෙම මිනිසුන් උදෙසා වූ දෙවියන්වහන්සේගේ තානාපතියා ඔබය. ඔවුන් කිසිදාක දේවස්ථානයකට ඇතුළු නොවිය හැකිය. ඔවුන් කිසිදාක ඔබේ සභාවේ සභා පාලක වරයා හමු වන්නේ නැති විය හැකිය. නමුත් ඔබ ඔවුන් හොඳින් හඳුනයි. ඔබට ධර්ම ප්‍රචාරණය ආරම්භ කළ හැක්කේ මෙම පවතින සමාජීය සම්බන්ධතා තුළිනි.

## නිවැසියන් :

පවුල යනු දිව්‍යමය නිර්මාණයක් වූ සාමාජීය ඒකකයක් වන අතර එය විශ්වීය සාමාජීය ආයතනයකි. බයිබලය තුළ වෙනත් කවර ආයතනයකටත් වඩා පවුල ගැන උපදෙස් දී තිබේ. මේ හේතුවෙන්, බයිබලිය ප්‍රමුඛත්වයක් වශයෙන් නිවැසියන්ට ධර්ම ප්‍රචාරණය කිරීමට සමීප අවධානයක් ලබා දිය යුතුය.

මෝසෙස් තම නිවැසියන් සම්බන්ධයෙන් විශ්වාසවන්ත වූ අතර, එහෙත් "අපි නම්-මමද මාගේ පවුලද-ස්වාමීන්වහන්සේට සේවයකරමු" යයි යෝෂුවා ප්‍රකාශ කළේය (යෝෂුවා 24:15). යෙරිකෝවේ සිටි වේශ්‍යාවක් වූ රාහබ්, දෙවියන්වහන්සේ වෙතට හැරීමෙන් තමාව සහ තමාගේ නිවැසියන්ව විනාශයෙන් ගලවා ගත්තාය (යෝෂුවා 2). යේසුස්වහන්සේ සාකෙවුස්ගේ නිවසට පැමිණි විට, යේසුස්වහන්සේ ඔහුට කියනසේක්: "ගැළවීම අද මේ ගෙදරට පැමිණියේය, කුමක්හෙයින්ද මොහුත් ආබ්‍රහම්ගේ පුත්‍රයෙක්ය" (ලූක් 19:9) යි ඔහු පැවසුවේය. යේසුස්වහන්සේ රාජ්‍ය සේවකයාගේ පුත්‍රයා සුව කළ විට, ඔහුත් සමඟ ඔහුගේ නිවැසියන් සියලු දෙනාම අදහා ගත්හ (යොහන් 4:46-54).

කොර්නේලියස්ගේ මුළු පවුලම දෙවියන්වහන්සේ වෙතට පැමිණියහ (ක්‍රියා 10), ලිඩියාගේ නිවැසියන් ද එසේම විය (ක්‍රියා 16). එසේම පිලිප්පියේ සිර ගෙදර භාරකරුගේ (ක්‍රියා 16), ක්‍රිස්පස්ගේ (ක්‍රියා 18:20) හා ස්තෙපනස්ගේ (1 කොරින්ති 1:16) පවුලේ අය ද දෙවියන්වහන්සේ වෙතට පැමිණියේය. තවද ඔනේසිපොරස් හා ඔහුගේ පවුලේ අය (2 තිමෝති 1:16) හා පිලමොන් ද (පිලමොන් 2) එසේම විය.

ශුභාරංචිය නිසා පවුල් වල බෙදීම් ඇතිවනු ඇතැයි යේසුස්වහන්සේ පැවසූ නමුත්, ඇතැම් විට එය සිදු වනුයේ ශුභාරංචිය නිසා නොව ධර්ම ප්‍රචාරණය කරන ක්‍රම වේද නිසා වේ. පවුල් ඒකකය තුළ ධර්ම ප්‍රචාරණය සිදු වූ විට, නිවස තුළ සුව වීම් හා ශුභාරංචියේ නැවත ගොඩනැගීමේ බලය ක්‍රියාත්මක වනු ඇත.

පවුලේ එක් එක් සමාජිකයන් නිවසින් පිට ශුභාරංචිය සමඟ සම්බන්ධ වූ විට, ඔවුන් පවුලේ සම්බන්ධතාවයන්ගෙන් ඉවත් වන අතර, ඔවුන් අයත්වන දිව්‍යමය ලෙස නිර්මාණය කරන ලද සාමාජීය ඒකකයෙන් වෙන් කරනු ලැබේ. පවුල තුළට අනවසරයෙන් ඇතුල් වන යමක් ගැන පවුල තුළ බියක් ඇතිවන අතර, එය ගැළවීම ලැබූ තැනැත්තාට සතුරු වී, ශුභාරංචියට බාධා කළ හැකිය. සම්පූර්ණ

පවුලක්ම ධර්ම ප්‍රචාරණයට ලක් කිරීම දෙවියන්වහන්සේ නිර්මාණය කළ සමාජ ඒකකයට ගෞරව කරයි. එවිට පවුල නව ඇදහිලිවන්තයාට විරෝධයක් වෙනවා වෙනුවට ශක්තියක් බවට පත් වේ.

## ළඟා නොවූ පුද්ගලයන් :

තවමත් ශුභාරංචි පණිවුඩය නොඇසූ පුද්ගලයන්ට ද ප්‍රමුඛත්වයක් ලබා දිය යුතුයි. කිසිදාක ශුභාරංචි පණිවුඩය නොඇසූ ගම්මාන මිලියන ගණනක් ලෝකයේ තිබේ. දේව වචනය ඔවුන්ගේ භාෂාවට පරිවර්තනය වී නොතිබීම නිසා දෙවියන්වහන්සේගේ වචනය කියවීමට කිසිදාක අවස්ථාව නොලද පුද්ගලයන් බොහොමයක් සිටී.

අප ජාතීන් වශයෙන් ලෝකය සළකා බැලුවහොත්, සෑම ජාතියක් තුළම කුමන හෝ ආකාරයක ශුභාරංචියේ සාක්ෂිකරුවකු සිටින බැවින් මුළු ලෝකයම දිනාගෙන ඇතැයි අපට පැවසිය හැකිය. මේ වන විට පෘථිවියේ සෑම රටක් තුළම ඇදහිලිවන්තයන් හා සංවිධානාත්මක සභාවන් තිබේ. නමුත් එළිදරව් 5:9 හි සඳහන් "සියලු ගෝත්‍රවලින් ද, භාෂාවන්ගෙන් ද, සෙනඟගෙන් ද, ජාතීන්ගෙන් ද මිනිසුන් " යන්න අදහස් නොවේ.

යේසුස්වහන්සේ ලෝකය වෙතට යන්න යැයි පැවසූ විට උන්වහන්සේ අදහස් කළේ ජාතීන් පිළිබඳව පමණක් නොවේ. ලෝකය පිළිබඳව කතා කිරීමේදී යේසුස්වහන්සේ පාවිච්චි කළ වචනය වූයේ "ethne" නමැති ග්‍රීක වචනයයි. මෙම වචනයේ අදහස "ජනවර්ග" හෝ "මිනිසුන් කණ්ඩායම්" යන්නයි. යේසුස්වහන්සේ ලෝකය දෙස බැලුවේ "සියලූ මිනිසුන්" හෝ "මනුෂ්‍ය කණ්ඩායම්" වශයෙනි.

ජන කණ්ඩායමක් මෙසේ නිර්වචනය කළ හැකිය :

> *"එකිනෙකාට පොදු බැඳීමක් ඇති සැළකිය යුතු තරම් විශාල තනි පුද්ගලයන් කණ්ඩායමකි. එවැනි බැඳීමක් තුළ භාෂාව, සංස්කෘතිය, චාරිත්‍ර හා භූගෝලීය පිහිටීම වැනි දේවල් අන්තර්ගත විය හැකිය."*

තේරුම් ගැනීම හා පිළිගැනීම පිළිබඳ ප්‍රශ්න වලට මුහුණ දීමෙන් තොරව ශුභාරංචිය ව්‍යාප්ත කළ හැකි විශාලතම කණ්ඩායම පුද්ගල කණ්ඩායමකි. එකට සිටින පුද්ගල කණ්ඩායමක් එකම භාෂාවක් කතා කරන නිසා සහ පොදු සංස්කෘතියක් ඇති නිසා, ශුභාරංචිය ඉදිරිපත් කිරීමේදී මතුවන භාෂාමය හා සංස්කෘතිමය ගැටලු එවිට ඉවත් වේ.

මේ වන විට ලෝකය පුරා හඳුනාගත් විවිධ පුද්ගල කණ්ඩායම් 19,000 ක් පමණ සිටී. ඇතැම් කණ්ඩායම් වල 3,000 පමණ සුළු සාමාජියන් පිරිසක් සිටින අතර ඇතැම් කණ්ඩායම් වල සාමාජිකයන් ගණන මිලියන 30 ක් පමණ වේ. ලෝකයේ සෑම මහද්වීපයක්ම විවිධ ජාතීන්ගෙන් පමණක් නොව විවිධ පුද්ගල කණ්ඩායම් වලින් සෑදී ඇත. උදාහරණ ලෙස අප්‍රිකා මහද්වීපය තුළ භාෂා 1,000 ක් සහ පුද්ගල කණ්ඩායම් සිය ගණනක් සිටී.

දිනාගනු ලැබූ පුද්ගල කණ්ඩායමක් යනු, බාහිර උපකාරයකින් තොරව තම ජනතාවට ධර්ම ප්‍රචාරණය කිරීමට ප්‍රමාණවත් තරම් සම්පත් සහිත හා ඇදහිලිවන්තයන් ප්‍රමාණයක් සිටින කණ්ඩායමකි.

දිනාගනු නොලැබූ පුද්ගල කණ්ඩායමක් යනු, බාහිර උපකාරයකින් තොරව තම ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට තරම් ප්‍රමාණවත් ස්වදේශික ඇදහිලිවන්තයන් ප්‍රමාණයක් හා සම්පත් නොමැති පුද්ගල කණ්ඩායමිය. ක්‍රියාකාරීව ශුභාරංචිය පිළිබඳව සාක්ෂි දරන සභාවක් නොමැති වාර්ගික කණ්ඩායම් හෝ පුද්ගල කණ්ඩායම් 17,000ක් පමණ තිබේ. මෙම වාර්ගික කණ්ඩායම් තුළ මිනිසුන් මිලියන ගණනක් ජීවත් වෙයි. මෙම දිනාගනු නොලැබූ පුද්ගල කණ්ඩායම් ගෝත්‍රික ජනයා, මුස්ලිම්වරු, චීන ජාතිකයන්, හින්දු ජනයා හා බෞද්ධයන් වශයෙන් ප්‍රධාන කණ්ඩායම් පහකට බෙදිය හැකිය.

දිනාගනු නොලැබූ පුද්ගලයන්ට ප්‍රමුඛත්වය දිය යුතු බව පාවුල් පැවසුවේය :

> **එසේය, වෙන කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩ නොනගන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ නාමය සඳහන්කරනු ලැබූ තැන්වල නොව : උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ අය දකින්නෝය, උන්වහන්සේ ගැන නෑසූ අය තේරුම්ගන්නෝයයි ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනාකරන්ට අභිප්‍රාය කෙළෙම් (රෝම 15:20-21).**

### යහපත් ප්‍රතිචාර දක්වන්නාවූ අංශ :

ශුභාරංචිය පිළිනොගන්නා මිනිසුන්ට සේවය නොකරන ලෙස යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූ සේක. ශුභාරංචිය ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ඉදිරියට ගොස් එය පිළිගන්නා අය සිටින ප්‍රදේශ වලට ගොස් තම ශක්තිය වැය කරන ලෙස ඔවුන්ට පවසා තිබුණි. පාවුල් තුමා ද මෙම උපක්‍රමය අනුගමනය කළේය.

### නගර :

ඉහළ ලෙස ශිෂ්ඨාචාරගතව තිබූ ප්‍රදේශ වල පාවුල් සභාවන් පිහිට වූයේ කෙසේ දැයි ඔබ පසුව ඉගෙන ගනු ඇත. වෙනස් වීම බොහෝ විට නගර වලින් ආරම්භ කොට ගම් ප්‍රදේශ වලට පැතිර යයි. නගර, වෙළඳ හා සංචාරක මධ්‍යස්ථාන වන බැවින් ඒවාට එන මිනිසුන් ශුභාරංචිය අසන අතර ඔවුන් නැවත තම නිවැස් කරා යන විට තමන් සමඟ එම පණිවුඩය රැගෙන යති.

## සිව් ආකාරයක පව්කරුවන්

සංස්කෘතියෙන් සංස්කෘතියට මිනිසුන් විශාල වශයෙන් වෙනස් වන නමුත්, බයිබලය හැම ස්ථානයකම සිටින මිනිසුන් තුළ ඇති චරිත ලක්ෂණ කිහිපයක් එළිදරව් කරයි. දෙවියන්වහන්සේගෙන් වෙන්ව සිටින සියලුම මිනිසුන් පව්කාරයෝය. බයිබලය තුළ විස්තර කෙරෙන පව්කරුවන් වර්ග හතරක් පහත දැක්වේ

### තාර්කාන්විත පව්කරුවන් :

රෝම 1:18-32 දක්වා තර්කාන්විත පව්කරුවන් ගැන විස්තර කර ඇත. තර්කාන්විත පව්කරුවා දෙවි කෙනෙකු සිටින බවට විශ්වාස කරනවා විය හැකිය. නමුත් මෙම කරුණ පමණක් ගැළවීම ළඟා කර නොදෙයි. තර්කාන්විත පව්කරුවා ඉතා බුද්ධිමත් වන අතර, ඔබ ශුභාරංචිය ඉදිරිපත් කිරීමට උත්සාහ කරන විට ඔහු ඉතා බුද්ධිමත් ප්‍රශ්න මතු කරනු ඇත. ඔබ දේව වචනය දැනගත යුත්තේ මේ හේතුවෙනි. බයිබලය මෙසේ පවසයි :

> **නමුත් නුඹලාගේ සිත්වලින් ස්වාමීන්වහන්සේ කොට ක්‍රිස්තුස්වහන්සේට ගෞරවකරපල්ලා. නුඹලා තුළ ඇත්තාවූ බලාපොරොත්තුව ගැන නුඹලාගෙන් අසන සියල්ලන්ට උත්තරදෙන්ට නිතර සැදී සිටපල්ලා, නුමුත් මෘදුකමින්ද යටහත්කමින්ද එසේ කළ යුතුය (1 පේත්‍රුස් 3:15).**

### ප්‍රතිසංස්කෘත පව්කරුවන් :

රෝම 2:1-16 දක්වා ප්‍රතිසංස්කෘත පව්කරුවන් ගැන විස්තර කරයි. ප්‍රතිසංස්කෘත පව්කරුවන් දෙවි කෙනෙකු සිටින බව විශ්වාස කරන නමුත් අප රෝම 2:3 හි ඉගෙන ගත් පරිදි රෝම 1:18-32 හි විස්තර කර ඇති පව්කරුවන් විනිශ්චය කිරීමේ හැකියාව ඔවුන්ට ඇති බව ඔවුහු සිතති. එසේම දෙවියන්වහන්සේගේ විනිශ්චයෙන් ඔවුන් බේරෙන්නේයයි විශ්වාස කරති. ප්‍රතිසංස්කෘත පව්කරුවන් සිතනුයේ තමන් අන් කවරෙකුටත් වඩා යහපත් බව සහ සභාව තුළ සිටින්නේ කෙරාටිකයන් පමණක් වන බවය. ඔහු තමා ප්‍රතිසංස්කරණය කිරීමටත්, නැවත ආරම්භ කිරීමටත් තමා වැඩි දියුණු කිරීමටත් තැත් කරගන්නා පුද්ගලයෙකි.

### ආගමික පව්කරුවා :

රෝම 2:17-23 ආගමික පව්කරුවා විස්තර කරයි. ආගමික පව්කරුවා යනු ගැළවීම උදෙසා තම ආගම හෝ නිකාය කෙරෙහි විශ්වාසය තබන පුද්ගලයාය. ඔහු උත්සව හා වත් පිළිවෙත් ගැන විශ්වාස කරන නමුත් සැබෑ දෙවිඳුන්ව දන්නේ නැත. නිකදෙමුස් ඵරිසියෙකු විය (යොහන් 3:1). ඔහු ආගමානුකූල වූ නමුත්, ඔහු ගැළවීමේ හා නැවත ඉපදීමේ සැබෑ අර්ථය වටහා ගෙන සිටියේ නැත.

### ප්‍රතික්ෂේප කරනු ලැබූ පව්කරුවා :

යොහන් 4 හි සඳහන් වන ළිඳ අසල සිටි කාන්තාව ප්‍රතික්ෂේප කරනු ලැබූ පව්කරුවාට උදාහරණයකි. ඇය සමාජයෙන් කොන් කරන ලද කෙනෙක් වූවාය. ඇය දික්කසාද වී සිටි අතර, සෙසු කාන්තාවන්

මඟින් කොන් කරනු ලැබූ කෙනෙක් වන්නට ඇත. ජලය ගෙන යාමට කාන්තාවන් කණ්ඩායම් වශයෙන් ළිඳට පැමිණයේ එය ඉතා සමාජශීලි කාලයක් වූ බැවිනි. එහෙත් මේ කාන්තාව පැමිණියේ තනිවය.

ප්‍රතික්ෂේප කරනු ලැබූ පව්කරුවා ආත්මික කරුණු වලට වඩා තම පෞද්ගලික ප්‍රශ්න ගැන සැළකිලිමත් වෙයි. ඔහු සමඟ කටයුතු කළ හැකි හොඳම ආකාරය යේසුස්වහන්සේ ළිඳ ළඟ සිටි කාන්තාව සමඟ කටයුතු කළ ආකාරයයි. ඔබ ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා වලින් ආරම්භ කළ යුතුය.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. ඇදහිලිවන්තයන් ගුණනය කිරීමේ දෙවියන්වහන්සේගේ ක්‍රියාවලිය කුමක්ද?

3. ආත්මික ගුණනය සඳහා උදාහරණ ලෙස දැක්විය හැකි නව ගිවිසුමේ සිටි මිනිසුන් දෙදෙනා කවුද?

4. ධර්ම ප්‍රචාරණයේදී මූලිකත්වය දිය යුතු කරුණු මොනවාද?

5. බයිබලයේ විස්තර කර ඇති පවිකරුවන් වර්ග හතර කවරේද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. පහත ප්‍රතිඥාව යාච්ඤාවෙන් යුතුව කියවා ඒ අනුව කටයුතු කිරීමෙට පටන් ගන්න.

   "ධර්ම ප්‍රචාරණය සෑම ඇදහිලිවන්තයෙකුම උදෙසා වූ වගකීම බව වටහා ගනිමින්, එක් අයකු උදෙසා යාච්ඤා කරමින්, ඔහුට/ඇයට ශුභාරංචිය පැවසීමට මට කළ හැකි හැම දෙයක්ම කිරීමටත්, ඔවුන්ව ක්‍රිස්තුස්වහන්සේ සමඟ හා සභාව සමඟ සහභාගිකමට ගෙන ඒමටත් මා මෙයින් ප්‍රතිඥා දෙමි."

   මා යාච්ඤා කරන හා ශුභාරංචිය පවසන පුද්ගලයා :

   අත්සන :

   දිනය :

2. ලූක් 16:19-31 හි සඳහන් නිරයට ගිය පොහොසත් මිනිසා පිළිබඳ කතාන්දරය කියවන්න. තම පවුලේ අය සමඟ ශුභාරංචිය බෙදා ගැනීම සඳහා නැවත පැමිණීමට මේ මිනිසාට අවශ්‍ය වූ නමුත් ඔහු ප්‍රමාද වැඩි විය. ඔබේම පවුලේ අය සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට ඔබ ප්‍රමාද වැඩි වන තුරු නොසිටින්න.

3. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ගුණනය කිරීමේ ක්‍රමවේද"* නමැති පාඨමාලාව අධ්‍යයනය කිරීම මඟින් ආත්මික ගුණනය වීම ගැන තවත් දේ ඉගෙන ගන්න.

4. අස්වැන්න සඳහා සේවකයන් නඟා සිටුවිය යුත්තේ මෙසේය :

   - සේවකයන් උදෙසා යාච්ඤා කරන්න : මතෙව් 9:38; යාකොබ් 4:2; ලූක් 11:9; යොහන් 14:14

   - සේවකයන් උදෙසා දේශනා කරන්න : යෙසායා 6:8

   - යේසුස්වහන්සේ කළ අන්දමට ඔවුන්ව පෞද්ගලිකව බඳවා ගෙන සුදානම් කරන්න : මතෙව් 20

# හත් වන පරිච්ඡේදය

## ක්‍රමවේද : නව ගිවිසුමේ ප්‍රතිපත්ති

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- නව ගිවිසුම තුළ ඇති ධර්ම ප්‍රචාරණය පිළිබඳ මූලික ප්‍රතිපත්ති සාරාංශගත කිරීමට,
- නව ගිවිසුමේ ධර්ම ප්‍රචාරණයේ ප්‍රතිඵල පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**...ලෝකය පෙරළුවාවූ මොව්හු මෙහිත් ඇවිත් සිටිති: (ක්‍රියා 17:6)**

## හැඳින්වීම

ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳව අවධානය යොමු කරන පාඩම් කිහිපයක් අතරින් පළමු පාඩම වශයෙන් මෙම පාඩම ආරම්භ වේ. ක්‍රමවේදයක් යනු යම් දෙයක් සිදු කිරීමේ සැළසුම් සහගත ක්‍රමයකි. ධර්ම ප්‍රචාරණ කාර්යයේදී ඔබ සාර්ථක වීමට නම්, ඔබ බයිබලීය ක්‍රමවේද පාවිච්චි කළ යුතුය. අත්දැකීම් තුළින් ඔප්පු වී ඇති ප්‍රායෝගික ක්‍රමවේද ද උපකාරී විය හැකිය.

මෙම පාඩමේදී අවධානය යොමුකරනු ලබන්නේ නව ගිවිසුමේ ඇති ධර්මප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳවය. නව ගිවිසුමේ වාර්තා වන උපමා වල ඇති ධර්ම ප්‍රචාරණය පිළිබඳ ප්‍රතිපත්ති හා සම්බන්ධ අතිරේක කරුණු පිළිබඳව අට වන පරිච්ඡේදය තුළ සළකා බැලේ. පෞද්ගලික ධර්ම ප්‍රචාරණය කළ යුතු ආකාරය නව වන පරිච්ඡේදයෙන් පැහැදිලි කරන අතර මෙම ක්‍රමවේදයේදී මුහුණ දීමට සිදු වන දුෂ්කරතා පිළිබඳව දහවන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරයි. සන්තෘප්ත වන ධර්ම ප්‍රචාරණය පිළිබඳව එකොළොස්වන පරිච්ඡේදයෙන් සාකච්ඡා කරන අතර දොළොස්වන පරිච්ඡේදයේදී සාමූහික ධර්ම ප්‍රචාරණය පිළිබඳව සාකච්ඡා කරයි.

ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද පිළිබඳ මෙම අධ්‍යයනය ආරම්භ කරන විට ධර්ම ප්‍රචාරණයේදී සාර්ථක ප්‍රවේශයන් බවට ඔප්පු වූ ඇතැම් ක්‍රමවේද ඇති නමුත් එක් එක් අවස්ථාවේදී ඔබට අනුගමනය කිරීම උදෙසා දෙවියන්වහන්සේට විශේෂ ක්‍රමවේදයක් පැවතිය හැකි බව මතක තබා ගැනීම වැදගත් වේ. ධර්ම ප්‍රචාරකයෙකුගේ කාර්යය ඉටුකිරීමේදී, සැම විටම ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආලේපලත් ස්පර්ශය ඔබ සමඟ තබන මෙන් ශුද්ධාත්මයාණන් ගෙන් ඉල්ලන්න. ඔබ කතා කරන පුද්ගලයාගේ හදවත උන්වහන්සේ දන්නා සේක. ඔබට මඟපෙන්වා ඔබව ආලේප කිරීම, ඔබට වටහාගැනීම හා අනුකම්පාව ලබා දීම හා ගැළවීම නොලත් අය පාපයෙන් හරවා ශුභාරංචියට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ව පෙළඹවීම ශුද්ධාත්මයාණන්ගේ භූමිකාවයි.

## නව ගිවිසුම් ධර්මප්‍රචාරණය

ලෝකයේ නොවැදගත් ප්‍රදේශයක වැසියන් දොළොස් දෙනෙකුගෙන් සමන්විත ව්‍යාපාරයක් අවුරුදු 300 ක් ඇතුළත ශිෂ්ඨාචාරගත ලෝකයේ නිල ආගම දක්වා වර්ධනය විය. එබැවින්, එය පරීක්ෂාකර බලා එහි ප්‍රවේශයන් තුළින් ඉගෙන ගැනීම නුවණට හුරු වේ.

මෙම ව්‍යාපාරය කිතු දහම වන අතර, එහි ක්‍රමවේදයන් දේව වචනය හෙවත් ශුද්ධ බයිබලය තුළ සඳහන් වේ. ශුභාරංචි පොත්, ක්‍රියා පොත හා යැවුම් පත්‍ර නැවත සළකා බැලීමෙන් ධර්ම ප්‍රචාරණයේ ඇතැම් මූලික ප්‍රතිපත්ති හඳුනාගත හැකිය. නව ගිවිසුම් කාලයේ ධර්ම ප්‍රචාරණය තුළ පහත ලක්ෂණ දැකගත හැකිය :

## යාච්ඤාවෙන් කළාවු දෙයකි :

යාච්ඤාව යන ධර්ම ප්‍රචාරණයේ ආත්මික ක්‍රමවේද අතරින් ඉතාම වැදගත් එකකි. පාපය තුළ අතරමංව සිටින ආත්මික අස්වැන්න පෙන්නුම් ස්වභාවික කුඹුරක් දෙස බලමින් යේසුස්වහන්සේ පළමුවෙන්ම ඉල්ලා සිටියේ යාච්ඤා කරන ලෙසය. යේසුස්වහන්සේ පහත දේවල් පැවසුවේ නැත :

- "කුඹුර අස්වැන්න උදෙසා සූදානම්ය, යන්න."
- "කුඹුර අස්වැන්න උදෙසා සූදානම්ය. සංවිධානය වන්න."
- "කුඹුර අස්වැන්න උදෙසා සූදානම්ය. සැළසුම් සකස් කරන්න."
- "කුඹුර අස්වැන්න උදෙසා සූදානම්ය. ධර්ම ප්‍රචාරණය වෙනුවෙන් අරමුදලක් රැස් කරන්න."
- "කුඹුර අස්වැන්න උදෙසා සූදානම්ය. එබැවින් මිනිසුන් දැනුවත් කරන්න."
- "කුඹුර අස්වැන්න උදෙසා සූදානම්ය. ඒ බව අධ්‍යනය කිරීමට කමිටුවක් පත් කරන්න."

උන්වහන්සේ පැවසුවේ : "ගොයම නම් බහුලය,... යාච්ඤා කරන්න" යනුවෙනි.

මුල් කාලීන සභාව නොනවත්වා යාච්ඤා කළ බව නව ගිවිසුමේදී අපි ඉගෙන ගත්තෙමු. (ක්‍රියා 1:14). පළමු ධර්මදූත ගමන වර්ධනය වූයේ යාච්ඤාව තුළිනි (ක්‍රියා 13:3). තමන් ධර්ම ප්‍රචාරණය කරන අතරතුර තමන් උදෙසා යාච්ඤා කරන මෙන් පාවුල් සභාවන්ගෙන් උදක්ම, ඉල්ලා සිටියේය. (2 තෙසලෝනික 3:1).

ධර්මදූතනය පිළිබඳව, ශුභාරංචිය නොදැන සිටි ජනයා පිළිබඳව හා ශුභාරංචිය සන්නිවේදනය කළ හැකි ක්‍රමවේද පිළිබඳව අප දන්නා දේවල් මත යැපීම අප නැවැත්විය යුතුය. මේවා වැදගත්ය, නමුත් "යාච්ඤා කරන්න" යන පළමු ආඥාව වෙත අප වඩා අවධානය යොමුකිරීම අවශ්‍ය වේ.

## එයට ප්‍රමුඛත්වය දිය යුතුය :

ධර්ම ප්‍රචාරණය මුල් කාලීන සභාවට තිබුණු ක්‍රියාකාරකම් බොහොමයක් අතරින් එකක් නොවීය. එය ප්‍රමුඛතම කරුණ විය. අද දවසේදී, බොහෝ පුද්ගලයන්ගේ හා සභාවන්ගේ ප්‍රමුඛතා ලේඛන වල පහළින්ම ඇත්තේ ධර්ම ප්‍රචාරණය හා මිෂනාරි සේවයයි.

නව ගිවිසුම් කාලයේදී, ධර්ම ප්‍රචාරණය යනු ස්වාභාවික, සිය කැමැත්තෙන්ම සිදු වුණු ශුභාරංචිය බෙදාගැනීමක් විය. එය සෑම ඇදහිලිවන්තයෙකුම නිරන්තරයෙන් සිදුකළ දෙයක් විය. ඔවුන්ගේ පුරුද්දක් වූයේ මිනිසුන් සිටින තැන් වලට ගොස් ඔවුන් ගෝලයන් කිරීමයි. අද අප මිනිසුන්ට සභාවට පැමිණෙන ලෙස ආරාධනා කර ඔවුන් එතැයි බලාපොරොත්තුවෙන් සිටින්නෙමු. මුල් කාලීන සභාව ආක්‍රමණය කළ අතර, නූතන සභාව ආරාධනා කරයි.

සෑම කෙනෙක්ම ධර්ම ප්‍රචාරණ සේවයේ යෙදී සිටියේය (ක්‍රියා 1:8). සෑම ඇදහිලිවන්තයෙක්ම මහා ආඥාව ධර්ම ප්‍රචාරණය උදෙසාවු පෞද්ගලික අණක් ලෙස සළකා කටයුතු කළෝය. සභාවේ ගොඩනැගිල්ල තුළදී පමණක් නොව, ඔවුන් සෑම තැනදීම එය ඉටු කළේය (මාර්ක් 16:20). ධර්ම ප්‍රචාරණ ව්‍යාපාරයක් පවත්වන කාල පරිච්ජේදයක් තුළදී පමණක් නොව, ඔවුන් හැමදාම එය ඉටු කළහ (කියා 5:42). සෑම සභාවක්ම ගෝලයන් බිහි කළේය. සෑම ඇදහිලිවන්තයෙක්ම ගෝලයන් බිහි කළහ. එසේම සෑම නිවසක්ම ධර්ම ප්‍රචාරණ මධ්‍යස්ථානයක් විය.

අවශ්‍ය අවස්ථාවලදී, ශුභාරංචිය ප්‍රචාරය කිරීමට තමන්ට උපකාර කිරීම පිණිස ඇදහිලිවන්තයෝ රැකියාවන් කළහ. අපෝස්තුළුවර පාවුල් මෙය සිදු කළේය. පාවුල් වැනි හැකියාවක් ඇති, උගත් හා ආත්මික දීමනා සහිත පුද්ගලයෙකු තමාට සපයා ගැනීම සඳහා බර වැඩ කිරීම මෝඩකමක් ලෙස පෙනිය හැකිය. සභාවන්ගෙන් යැපීම සම්පූර්ණ ලෙස ලබා ගැනීමේ අයිතිය පාවුල්ට තිබුණේය (1 කොරින්ති 9:7-15; 1 තිමෝති 5:17-18; ගලාති 6:6), නමුත් අවශ්‍යතාවයක් ඇති වුවහොත් ශුභාරංචිය ප්‍රචාරය කිරීම සඳහා තමාටම සපයා ගැනීමට ඔහු සූදානමින් සිටියේය. ඔහු කිහිප විටකදී මෙසේ සිදු කළේය. (1 කොරින්ති 4:12; 1 තෙසලෝනික 2:9; 2 තෙසලෝනික 3:8).

අද දවසේ බොහෝ සභාවන්ගේ සම්ප්‍රදාය සභාපාලකවරුන්ට හා ධර්මදූත සේවකයන්ට තම සේවය උදෙසා සම්පූර්ණ ගෙවීමක් සිදු කිරීමය. මෙය ශුභාරංචිය ප්‍රචාරය කිරීමට හා නව සභාවන් ඇති කිරීමට බාධාවක් වී ඇත. සම්පූර්ණ කාලීන සේවකයන්ට මෙම සේවය උදෙසා "ගෙවීමක් කරන" බැවින් ඇදහිලිවන්තයන් ද ධර්ම ප්‍රචාරණ කාර්යය ඔවුන් පිටම පැවරීමට උත්සාහ කරයි. අද තවත් බොහෝ සභාවන්ට සම්පූර්ණ කාලීන සේවකයෙකුට ගෙවීමට නොහැකි නිසා සහ සභාපාලකවරයා රැකියාවක්

කිරීමේ අවස්ථාව සැළකිල්ලට ගෙන නොමැති නිසා සභාපාලකවරයකු නොමැති තත්වයට එම සභාවන් පත්ව ඇත.

යේසුස්වහන්සේ පිළිබඳ ශුභාරංචියෙන් ජාතීන්ට බලපෑම් කිරීමට නම්, අප ධර්ම ප්‍රචාරණයට ප්‍රමුඛතාව ලබා දිය යුතුය. අප එය සැමතැනදීම, සෑමදාම කළ යුතු අතර අවශ්‍යතාවයක් ඇත්තේ නම් රැකියාවක් ලබා ගෙන පණිවුඩය අන් අය වෙත ගෙන යාමේ අරමුණින් එය කළ යුතුය.

## ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීම තුළින් කරන ලද්දකි :

ක්‍රියා පොතේ වාර්තා වන සෑම ධර්ම ප්‍රචාරණ ක්‍රියාවලියකදීම, ඔවුන් උනන්දු කරවන්නා සහ බලගන්වන්නා වූයේ ශුද්ධාත්මයාණෝය. වත්මන් සභාවේදී, විශේෂයෙන් බටහිර රටවල, ශුද්ධාත්මයාණන් මත රඳා පවතිනු වෙනුවට කළමණාකරණ හැකියාවන් හා කමිටු රැස්වීම් මත රඳා පවතිනු දැකිය හැකිය.

ධර්ම ප්‍රචාරණයේ මෙහෙයවන්නා ශුද්ධාත්මයාණන්ය. ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාකාරීත්වය විස්තර කරන බයිබල් පද බොහොමයක් ක්‍රියා පොත තුළ දැකිය හැකි අතර ධර්ම ප්‍රචාරණය සම්බන්ධයෙන් පහත කොටස් විශේෂ වේ.

- ක්‍රියා 1:8 : ශුද්ධාත්මයාණන්වහන්සේ ඇදහිලිවන්තයන්ගේ සාක්ෂි දැරීම බලගන්වන සේක.
- ක්‍රියා 2 : ශුද්ධාත්මයාණන් නමැති දීමනාව සියලු ඇදහිලිවන්තයන්ට දෙනු ලැබූ අතර ඉදිරියටද දෙන බවට පොරොන්දු වී තිබේ.
- ක්‍රියා 4 : ශුද්ධාත්මයෙන් පිරුණු පේත්‍රුස්, ක්‍රියා 3 දී කොර මිනිසා විසින් අත්දුටු හාස්කම ගැන සාක්ෂි දැරුවේය.
- ක්‍රියා 4:31 : ඔව්හු සියලු දෙනා ශුද්ධාත්මයෙන් පූර්ණව නිර්භීතව දේව වචනය ප්‍රකාශ කළහ.
- ක්‍රියා 5:52 : ශුද්ධාත්මයාණන්වහන්සේ සමඟ අපද සාක්ෂිකාරයන් වන බව පේත්‍රුස් පැවසුවේය.
- ක්‍රියා 7:51 : ශුද්ධාත්මයාණන්ට විරුද්ධකම් පාමින් ශුභාරංචිය පිළිනොගත් යුදෙව් නායකයන්ට ස්තේපන් චෝදනා කළේය.
- ක්‍රියා 9:17 : තම හැරීමෙන් අනතුරුව පාවුල් ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වුණේය.
- ක්‍රියා 10 : කොර්නේලියස්ගේ නිවසේ සිටි අය මත ශුද්ධාත්මයාණන්වහන්සේ පැමිණ ඔවුන්ගේ ජීවිත වෙනස් කළ සේක.
  කායිසාරියට ගියේ ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීම අනුව බව පේත්‍රුස් විස්තර කළේය.
- ක්‍රියා 13:2 : ශුද්ධාත්මයාණන්වහන්සේ පාවුල්ව හා බාර්ණබස්ව ධර්ම ප්‍රචාරණ කටයුතු සඳහා කැඳවූ සේක.
- ක්‍රියා 16:6 : ශුද්ධාත්මයාණන්වහන්සේ පාවුල්ට ආසියාවේ ධර්ම ප්‍රචාරණය කිරීම තහනම් කළ සේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ දේව වචනය තුළින්, අධි ස්වාභාවික මඟපෙන්වීම තුළින්, සේවකයන් කැඳවීම හා බලගැන්වීම තුළින්, හා දෙවියන්වහන්සේගේ අරමුණු වලට සරිලන අන්දමින් අපගේ සැළසුම් නිවැරදි කිරීම තුළින් ධර්ම ප්‍රචාරණයට මඟපෙන්වන සේක.

## නිශ්චිත සැළසුම තුළින් ඉටුකර ගන්නා ලදී :

යේසුස්වහන්සේ පළමුවෙන්ම තම සේවය ආරම්භ කළ විට, උන්වහන්සේ කරුණු හයකින් යුතු සැළැස්මක් ප්‍රකාශ කළ සේක :

**ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය: මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළසේක: වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඬනාලද්දවුන් නිදහස්කර හරින්ටද ස්වාමීන්වහන්සේ පිළිගත යුතු අවුරුද්ද ප්‍රකාශකරන්ටද උන්වහන්සේ මා එවුසේකැයි ලියා තිබෙන ස්ථානය සොයාගෙන,**
**(ලූක් 4:18-19)**

යේසුස්වහන්සේ පෘතුවියේ තම සේවය තුළදී මෙම සැළැස්ම අනුගමනය කළ අතර, මුල් සභාව ද මෙම රටාව අනුගමනය කළේය.

පසුව යේසුස්වහන්සේ ලෝකයේ ජාතීන්ට ශුභාරංචිය ගෙන යාමට සැළැස්මක් දුන් සේක (ක්‍රියා 1:8). ගෝලයන් පළමුව යෙරුසලමේද, යුදයේද, සමාරියේද ඉන් අනතුරුව ලෝකයේ සියලු ප්‍රදේශවලද ධර්ම ප්‍රචාරණය කළ යුතු විය. එය තවදුරටත් ධර්ම ප්‍රචාරණය උදෙසා ස්වාමීන්වහන්සේගේ සැළැස්ම විය. ඔබ සිටින තැනින් ආරම්භ කර ඔබ ලෝකයේ ජාතීන් වෙත ළඟා වන තුරු සැම විටම ව්‍යාප්ත වන ආකාරයකින් ඉදිරියට කරගෙන යා යුතුය.

ඔබේ "යෙරුසලම" ඔබ ජිවත් වන ජන සමාජයයි. සේවයන්ට ආධාර කරන හා යාච්ඤා කරන නමුත්, කිසිදාක පාරට බැස තම අසල්වැසියාට යේසුස්වහන්සේ ගැන නොපැවසූ කිතුනුවන් දහස් ගණනක් සිටී. පිටරට වල බලවත් ධර්ම ප්‍රචාරණ වැඩසටහන් තිබෙන නමුත්, තම සභාවට පැමිණෙන අයට හැර තම නගරයේ සෙසු අයට ශුභාරංචිය ප්‍රකාශ කිරීමට කිසිවක් නොකරන ඇතැම් සභාවන් තිබේ.

## සාතන් විසින් බාධා කරනු ලැබේ:

නව ගිවිසුමේදී දෙවියන්වහන්සේ සැමවිටම ධර්ම ප්‍රචාරණය තවත් ව්‍යාප්ත කිරීම සඳහා සාතන් විසින් ගෙන ආ බාධාවන් පාවිච්චි කරන ලදි. පහත සඳහන් පරිච්ජේද අධ්‍යයනය කරන්න :

- ක්‍රියා 12:1-24 : හෙරෝද් යාකොබ් මැරුවේය. පේත්‍රුස්ව සිර කළේය. මෙය දේශපාලනික විරෝධයක් විය.

- ක්‍රියා 16:16-40 හා 19:23-41: එපීසිය හා පිළිප්පිය යන නගර වල ව්‍යාපාර කටයුතු වලට තිබූ උනන්දුව හා ධර්ම ප්‍රචාරණය අතර පරස්පර විරෝධී බවක් ඇති වූ අතර පීඩාව පැමිණුනේ ආර්ථික ලෝකයෙන්ය.

- ක්‍රියා 4-7 : මෙම පරිච්ජේද තුළ එම කාලයේ සිටි ආගමික නායකයන්ගෙන් පැමිණි විරෝධතා පිළිබඳව වාර්තා කරයි.

- ක්‍රියා 11 : යුදෙව්වන්ගේ චාරිත්‍ර හේතුවෙන් සභාව තුළින්ම පැමිණි පීඩාවන් පිළිබඳව මෙම පරිච්ජේදය වාර්තා කරයි.

- ක්‍රියා 8, 13 හා 16 : සීමොන්, එලිමස් හා යක්ෂාවේශ වූ තරුණිය තුළින් ඇති වූ සාතන්ගේ සෘජු බාධාවන් පිළිබඳව මෙම පරිච්ජේද විස්තර කරයි.

ශුභාරංචිය සමඟ ඔබ සාතන්ගේ රාජ්‍ය ආක්‍රමණය කරන විට, ඔබ දේශපාලනික, ආර්ථික හා ආගමික යන ක්ෂේත්‍ර වලින් පැමිණෙන විරෝධතාවයන් බාර ගත යුතුය. එසේම සභාව අභ්‍යන්තරයෙන් පැමිණෙන ප්‍රහාරයන් සහ සාතන්ගේ සෘජුවම ඇති වන ප්‍රහාරයන් ද ඔබ භාරගත යුතුය. මෙම ප්‍රහාරයන්ට ඔබ නැවැත්වීම ඉඩ හරිනු වෙනුවට, නව ගිවිසුම් කාලයේදී කළාක් මෙන් ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ අවස්ථා වැඩි කර ගැනීමට ඒවා යොදා ගන්න.

## කණ්ඩායම් හා තනි පුද්ගලයන් යන දෙකොටසටම අවධානය යොමු කළේය :

නව ගිවිසුමේ සඳහන් සියලුම ධර්ම ප්‍රචාරණ ක්‍රමවේදයන් පෞද්ගලික හෝ කණ්ඩායම් ධර්ම ප්‍රචාරණය යටතේ සළකා බැලිය හැකිය. යේසුස්වහන්සේගේ, ගෝලයන්ගේ, අපෝස්තුළුවර පාවුල්ගේ හා අන් අයගේ සේවයන් විධිමත් හා අවිධිමත් යන මාර්ග දෙකෙහිම වැදගත්කම පෙන්නුම් කරයි.

යේසුස්වහන්සේ මෙලොව සිටියදී විශාල කණ්ඩායම් රැසකට සේවය කළ සේක. මෙම අවස්ථාවන් තුළ තිබූ උනන්දුව නිසා ඒවා අපගේ මතකයේ රැඳේ. නමුත් තම සේවයේ ආරම්භයේ පටන් අවසානය දක්වාම පෞද්ගලික ධර්ම ප්‍රචාරණය තුළින් මිනිසුන් හා ස්ත්‍රීන් එක් එක්කෙනා බැගින් දිනා ගැනීමට ද

යේසුස්වහන්සේ ක්‍රියා කළ සේක. ලූක් 15:3-7 හි සඳහන් නැති වූ බැටළුවා පිළිබඳ උපමාවේදී, උන්වහන්සේ ධර්ම ප්‍රචාරණය පිළිබඳ තම ක්‍රමවේදය පැහැදිලිව විස්තර කළ සේක.

පෙන්තකොස්ත දවසේදී පේත්‍රුස් යෙරුසලමේ සමූහයාට දේශනා කළේය (ක්‍රියා 2). මෙය කණ්ඩායමකට ධර්ම ප්‍රචාරණය කිරීමයි. එසේම ඔහු කොර්නේලියස් සමඟ ද පෞද්ගලිකව ශුභාරංචිය බෙදා ගත්තේය (ක්‍රියා 10). මෙය පෞද්ගලික ධර්ම ප්‍රචාරණයයි. පිලිප් සමාරියේදී මහ සමූහයන්ට දේශනා කළ අතර (ක්‍රියා 8:5-6), කාන්තාරයේදී එතියෝපිය මිනිසාට පෞද්ගලිකව දේශනා කළේය (ක්‍රියා 8:27-35). පාවුල්ගේ ඇතැම් රැස්වීම් වලදී ඒවා කෝලාහලයකින් අවසන් වන තරම් සමූහයක් සිටියෝය ! නමුත් ඔහු තනි පුද්ගලයන් සමඟ ගණුදෙනු කිරීම කිසිදාක නවතා දැමූයේ නැත.

කිසිදාක ඔබට තනි පුද්ගලයන් අමතක වන තරම් සමූහයන් සමඟ කටයුතු නොකරන්න. රාජ්‍යයේ ශුභාරංචිය පිළිබඳව පැවසීම සඳහා යේසුස්වහන්සේ නිරන්තරයෙන්ම තනි පුද්ගලයන්ව සමූහයාගෙන් පිටතට කැඳවූ සේක. තනි පුද්ගල හා කණ්ඩායම් යන ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද දෙකම බයිබලීය වශයෙන් බලවත් ක්‍රමවේදයන්ය.

## බලය ප්‍රකාශ වීමක් ද සිදු විය:

නව ගිවිසුම් ධර්ම ප්‍රචාරණය සමඟ දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීමක් ද සිදු විය. "ඔබ යන අතර...රෝගීන් සුව කරන්න. යක්ෂයන් දුරු කරන්න"යි යේසුස්වහන්සේ තම ගෝලයන්ට අණ කළ සේක.

දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීමේදී ඔබ කතා කරන වචන ගෙන ඒවා බලවත් ලෙස පාවිච්චි කරනු ලැබේ :

> **උන්වහන්සේගේ වචනය බලයෙන් යුක්තවූ බැවින් උන්වහන්සේගේ ඉගැන්වීමට ඔව්හු විස්මිතවූවෝය. සියල්ලෝ විස්මිතව: මේ වචනය කිමෙක්ද? මක්නිසාද? උන්වහන්සේගේ බලයෙන්ද ආනුභාවයෙන්ද අශුද්ධාත්මයාණන්ට අණදෙනසේක, ඔව්හු පිටවෙතියි ඔවුනොවුන් අතරෙහි කතාකරගත්තෝය. (ලූක් 4:32,36)**

බලය ප්‍රකාශ වීම දේව වචනයට අනතුරුව සිදුවන ලකුණු මගින් එය ස්ථිර කරයි :

> **ඔව්හු පිටත්ව ගොස්, සියලු තැන්වලම දේශනාකළෝය. ස්වාමින්වහන්සේද ඔවුන් සමඟ ක්‍රියාකරමින් ඔවුන් අතින් සිදුවූ ලකුණුවලින් වචනය ස්ථිරකළසේක. ආමෙන්. (මාර්ක් 16:20)**

ඔබ ධර්ම ප්‍රචාරණය කරන අතර තුර සුව කිරීම උදෙසා දෙවියන්වහන්සේගේ බලය පවතී :

> **සුවකරන පිණිස ස්වාමීන්වහන්සේගේ ආනුභාවය උන්වහන්සේ සමඟ වූයේය. (ලූක් 5:17)**

දෙවියන්වහන්සේගේ බලය මිදීම ගෙන දෙයි:

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරු කරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමට ද ඔවුන්ට බලය දුන්සේක. (මතෙව් 10:1)**

දෙවියන්වහන්සේගේ බලය ශුභාරංචිය ස්ථිර කරයි. "ස්ථිර කිරීම" යනු යමක් ඔප්පු කිරීමයි. ශුද්ධාත්මයාණන්වහන්සේගේ බලය දේව වචනයේ යථාර්ථය ඔප්පු කරයි :

> **මහත් සමූහයක් උන්වහන්සේ අනුව ගියෝය, මක්නිසාද රෝගීන් කෙරෙහි උන්වහන්සේ විසින් දැක්වූ ලකුණු ඔව්හු දුටුවෝය. (යොහන් 6:2)**

බලය ප්‍රකාශ වීම මිනිසුන් දෙවියන්වහන්සේ වෙතට ගෙන එයි :

> **මාගේ කථාවත් මාගේ දේශනාකිරීමත් ප්‍රඥාවේ සිත් පොලඹවන්නාවූ වචනවලින් නොව ආත්මයාණන්වහන්සේගේද බලයේද ප්‍රකාශකිරීමෙන් විය. එසේ වුණේ නුඹලාගේ ඇදහිල්ල දෙවියන්වහන්සේගේ බලයෙන් මිස මනුෂ්‍යයන්ගේ ප්‍රඥාවෙන් නොපිහිටන පිණිසය. (1 කොරින්ති 2:4-5)**

මෙම පාඨමාලාවේ "ඔබ යන විට" නමැති දෙවන කොටසේදී බලය ප්‍රකාශවීම හා ධර්ම ප්‍රචාරණය පිළිබඳ තවත් දෑ ඔබ ඉගෙන ගනු ඇත.

## උපක්‍රමිකව සංචාරය කරන ලදි :

මුල් සභාවේ ඇදහිලිවන්තයන් දේව වචනය ලබා ගැනීමට සූදානමින් සිටි ප්‍රදේශ විනිවිද යමින්, ශුභාරංචිය උදෙසා නිරන්තරයෙන් වැඩ කළහ. අප මෙය "උපක්‍රමිකව සංචාරය කිරීම" ලෙස හඳුන්වන අතර එහි අදහස නම් පණිවුඩය පිළිගන්නා ප්‍රදේශ වලට ඉක්මනින් යාමට හැකි වීම යන්නයි.

ක්‍රියා 8:1 දී, පීඩාව තුළින් සභාව උපක්‍රමික සංචාරය කිරීම උදෙසා යොමු කළ අයුරු අපට දැකගත හැකිය. පීඩාවන් නිසා ඇදහිලිවන්තයන් යෙරුසලමෙන් විසිරවනු ලැබූවිට, ඔව්හු "ගිය ගිය ස්ථාන වල වචනය ප්‍රකාශ කළහුය."

ක්‍රියා 8 හි උපක්‍රමිකව සංචාරය කිරීම පිළිබඳ කදිම උදාහරණයක් තිබේ. පිලිප් විශාල ආත්මික අස්වැන්නක් නෙළමින් සමාරියෙහි සිටි විට, ස්වාමින්වහන්සේ කාන්තාරයට යාමට ඔහු කැඳවූ සේක. අප්‍රිකාව තුළ අනර්ඝ ධර්ම දූත සේවයක් ඉටු කළ හැකි එතියෝපිය මිනිසෙකු උදෙසා සේවයක් කිරීමට දෙවියන්වහන්සේ ඔහු උදෙසා වෙන් කර තිබූ සේක. පිලිප් ඉක්මනින්ම සමාරිය අතහැර කාන්තාරයට ගියේය.

උපක්‍රමිකව සංචාරය කිරීම යන්න තේරුම් ගැනීමට නම්, අපට "අස්වැන්න" හා "සොල්දාදුවා" යන මානසිකත්වයන් දෙකම පැවතිය යුතුය. මතෙව් 9:36-38 දී, යේසුස්වහන්සේ ලෝක ධර්මදූත මෙහෙවර ස්වාභාවික අස්වැන්න සමඟ සැසඳූ සේක. අස්වැන්න සූදානම්ව ඇති විට එය නෙළා ගැනීමට නම්, අස්වැන්න පැසී ඇති විට එය තිබෙන තැනට අප යා යුතුය. අස්වැන්නට සරිලන පරිදි වෙනස් වීමට හෝ නැවති සිටීමට අප සූදානම්ව සිටිය යුතුය.

එසේම අපට සොල්දාදුවෙකුගේ මානසිකත්වයක් ද පැවතිය යුතුය. අප ඇදහිලිවන්තයන් බවට පත්වන විට, දේව රාජ්‍යයේ ආත්මික හමුදාව තුළට ද අපි ඇතුළු වන්නෙමු. "යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වන්න" අපව කැඳවා තිබේ (2 තිමෝති 2:3). දේවල් අසීරු වූ පමණින් සොල්දාදුවෙකුට පසුබැසීමට හෝ අතහැර යාමට නොහැකිය. යහපත් සොල්දාදුවෙකු දැයි පරීක්ෂා කරනුයේ ආචාර පෙළපාලියේදී ඔහුගේ ස්වරූපයෙන් නොව, සටන් බිමේදී ඔහුගේ ක්‍රියාවන් ගෙනි.

සොල්දාදුවෙකුට තමන්ගේ කාර්යය තෝරාගත නොහැකි අතර ඔහු අද දවසේදී මීට වසර 20 කට පෙර ලැබුණු ආඥාවන් මත පදනම්ව ක්‍රියා කරන්නේ නැත. ඒවා ඒ කාලයේදී හොඳ ආඥා වූ නමුත් කල් යාමත් සමඟ යල් පැන ගිය තත්වයට පත්ව තිබේ. නමුත්, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සොල්දාදුවෙක් ශුද්ධාත්මයාණන්වහන්සේගෙන් ලැබෙන නැවුම් අණ වලට හා එළිදරව් වීම් වලට විවෘතව සිටිය යුතු වේ.

පුරන් බිමේ නොවපුරන ලෙස තම අනුගාමිකයන්ට පැවසූ විට යේසුස්වහන්සේ කතා කළේ උපක්‍රමිකව සංචාරය කිරීම පිළිබඳවය :

> **කවරෙක් නුමුත් නුඹලා පිළිගන්නේවත් නුඹලාගේ වචන අසන්නේවත් නැත්නම්, ඒ ගෙදරින් හෝ නුවරින් හෝ පිටත්ව යන කල නුඹලාගේ පාදවල ධූලි ගසාදමාපල්ලා. (මතෙව් 10:14)**

පාවුල් මෙම "දූවිලි ගසා දැමීමේ" ආඥාව අනුගමනය කළ සේක. ක්‍රියා 13:51-52 දී පිසිදියේ අන්තියෝකියේදී ශුභාරංචි සේවය ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, පාවුල් එම නුවර අතහැර ඉකෝනියට ගියේය. යේසුස්වහන්සේ උපක්‍රමිකව සංචාරය කළ සේක. උන්වහන්සේ ශුභාරංචිය දේශනා කරමින් ගමින් ගමට ගිය සේක. ගෝලයන් උන්වහන්සේගේ සේවය එක් ස්ථානයකට සීමා කිරීමට උත්සාහ කළ විට, උන්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **නුමුත් උන්වහන්සේ : මා විසින් අනික් නුවරවලත් දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් ආරංචිය දේශනාකරන්ට ඕනැය. මක්නිසාද ඒ පිණිස එවනලද්දෙමියි ඔවුන්ට කීසේක. (ලූක් 4:43)**

### ජාලයක් ලෙස ක්‍රියා කිරීම තුළින් ඉටුකර ගන්නා ලදී :

ජාලයක් ලෙස ක්‍රියා කිරීම නව ගිවිසුම තුළ ධර්ම ප්‍රචාරණය කිරීමේ තවත් ක්‍රමවේදයකි. ජාලයක් ලෙස ක්‍රියා කිරීම යන්නෙහි සරල අදහස කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමයි. එනම්, ශුභාරංචිය ව්‍යාප්ත කිරීමේ පොදු අරමුණ උදෙසා මිනිසුන් එක්ව ක්‍රියා කිරීමයි. නව ගිවිසුම් කාලයේදී, ධර්ම ප්‍රචාරණය සිදු කරන ලද්දේ දේව රාජ්‍යයේ වර්ධනය උදෙසා ජාලයක් ලෙස එක්ව ක්‍රියා කළ ඇදහිලිවන්තයන් තුළිනි. නිකායක් ලෙස කිතුනුවන් බෙදී නොසිටි අතර එකිනෙකා තම තමන්ගේ සභාවන් හෝ සංවිධාන දියුණු කිරීමෙහි කාර්ය බහුලව නොසිටියහ. අවසාන කාලයේදී ලබාදෙන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ මහත් ආත්මික අස්වැන්න නොගැනීමේදී පවතින සම්පත් වලින් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා අප නැවත ජාලයක් ලෙස ක්‍රියා කිරීමට පටන්ගත යුතුය. මෙම පාඩමාලාවේ පහළොස්වන පරිච්ජේදයේදී ජාලයක් ලෙස ක්‍රියා කිරීම ගැන ඔබ තවත් දේවල් ඉගෙන ගනු ඇත.

### සභාවන් පිහිටුවීම මගින් මුදුන් පමුණුවාගන්නා ලදී :

නවගිවිසුම් ධර්ම ප්‍රචාරණයේ අවසන් ප්‍රතිඵලය වූයේ ඇදහිලිවන්තයන් ප්‍රාදේශීය වශයෙන් සහභාගිත්වයට යොමු කරවීමයි. මෙය සභාවන් පිහිටුවීම ලෙස හැඳින් වේ. නව ඇදහිලිවන්තයන් සභාවේ ක්‍රියාකාරී කොටසක් බවට පත්වන තුරු ධර්ම ප්‍රචාරණ කාර්යය සම්පූර්ණ නොවේ. මෙම පාඩමාලාවේ තුන් වන කොටසේදී පාවුල් තුමා විසින් යොදාගත් ක්‍රමවේද පිළිබඳව විස්තරාත්මක ඉගෙන ගැනීමේදී සභාවන් පිහිටුවීම ගැන තවත් දේවල් ඔබ ඉගෙන ගනු ඇත. නව ගිවිසුම් කාලයේදී නව ඇදහිලිවන්තයන් ගෝලයන් බවට පත් කරනු ලැබුවේ ප්‍රාදේශීය සභාවන් තුළ දී විය. “තීරණද? ගෝලයන්ද?” යන දහතුන් වන පරිච්ජේදයේදී මෙම ක්‍රියාවලිය පිළිබඳ බොහෝ දේ ඔබ ඉගෙන ගනු ඇත.

## සාක්ෂි දැරීමේ ප්‍රතිඵල

නව ගිවිසුමේ ධර්ම ප්‍රචාරණ ක්‍රමවේදයන්ගේ ප්‍රතිඵල ඉතා අනර්ඝ විය :

> **ස්වාමීන්වහන්සේගේ හස්තය ඔවුන් සමග වූයේය. විශ්වාස කළාවූ විශාල ගණනක් ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය. (ක්‍රියා 11:21)**

එපිසයේ ප්‍රාදේශීය සභාවක් අවුරුදු දෙකක් ඇතුළත ආසියාවේ සෑම පුද්ගලයෙක් වෙතටම වචනය ගෙන ගියේය (ක්‍රියා 19:10). තෙසලෝනියේ ඒ හා සමාන කණ්ඩායමක් ග්‍රීසියේ බොහෝ ප්‍රදේශ වල ධර්ම ප්‍රචාරණය කළහ (1 තෙසලෝනික 1:8). ගෝලයන් තෙසලෝනියට පැමිණි කළ, ආගමික නායකයන් පහත පරිදි ධර්ම ප්‍රචාරණයට ඔවුන් ගත් උත්සාහයන්ගේ ප්‍රතිඵල සාරාංශ කර දැක්වූහ :

> **නුමුත් ඔව්හු ඔවුන් සොයා නොදැක, යාසොන් සහ සමහර සහෝදරයන්ද නුවර මුලාදෑනීන් ළඟට ඇදගන ගොස්: ලෝකය පෙරළුවාවූ මොව්හු මෙහිත් ඇවිත් සිටිති: (ක්‍රියා 17:6)**

නපුරු හා අභක්තික සමාජයක් තුළ, මුද්‍රණාලයන්, සභා ගොඩනැගිලි, සම්මන්ත්‍රණ, නිකායන්, ජන සන්නිවේදන මාධ්‍ය හෝ ඉක්මන් ගමනාගමන ක්‍රම වලින් තොරව ඔව්හු ලෝකය පෙරළුවෝය.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. මෙම පාඩම තුළදී ඔබ ඉගෙන ගත් නව ගිවිසුම් ධර්ම ප්‍රචාරණයේ ප්‍රතිපත්ති සාරාංශගත කරන්න.

3. නව ගිවිසුම් ධර්ම ප්‍රචාරණයේ ප්‍රතිඵල මොනවාද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. නව ගිවිසුම් කාලයේදී සැම නිවසක්ම ධර්ම ප්‍රචාරණ මධ්‍යස්ථානයක් වූ බව මෙම පාඩමේදී ඔබ ඉගෙන ගත්තේය. නිවාස තුළදී සිදුවූ මෙම සිදුවීම් සියල්ල නැවත සළකා බලන්න :

   - ක්‍රියා 2 : ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා දෙනු ලැබුවේ නිවසක උඩුමහල් මැදුරේ පවත්වනු ලැබූ යාච්ඤා රැස්වීමක් අතරතුරදීය.

   - ක්‍රියා 5:42 : ඇදහිලිවන්තයන් දේව මාලිගාවේදී සහ නිවසේදී නමස්කාර කළ අතර සහභාගිකම් දරමින් සහ නමස්කාර කරමින් ගෙයින් ගෙට ගියෝය.

   - ක්‍රියා 8:3 : සාවුල් සභාව පරාජය කිරීමට උත්සාහ කරන විට, නමස්කාර කරන්නාවූ දේවමාලිගාවන් පිළිබඳ පමණක් ඔහු අවධානය යොමු කළේ නැත. ශුභාරංචිය ප්‍රචාරය කිරීමේ උත්සාහයන් වළක්වමින් ඔහු සැම නිවසකටම ගියේය. සැම නිවසක්ම ධර්ම ප්‍රචාරණ මධ්‍යස්ථානයක් විය.

   - ක්‍රියා 9:11,17: නිවසක් තුළදී අනනියස් පාවුල් ගෝලත්වයට ගෙනාවේය.

   - ක්‍රියා 10 : සැම සංස්කෘතියකටම ශුභාරංචිය ගෙන යාම පිළිබඳ පළමු දර්ශනය දෙනු ලැබුවේ පේත්‍රුස් නිවසක යාච්ඤා කරමින් සිටියදීය.

   - ක්‍රියා 10 : අන්‍යජාතීන්ට පළමු පණිවුඩය දේශනා කරන ලද්දේ නිවසක් තුළදීය.

   - ක්‍රියා 12 : නිවසක පැවැත්වූ යාච්ඤා රැස්වීමක ප්‍රතිඵලයක් ලෙස පේත්‍රුස් සිරගෙදරින් ගැළවුණේය.

   - ක්‍රියා 20:20 හා 28:30-31: තම සේවය තුළදී පාවුල් ප්‍රසිද්ධියේ මෙන්ම ගෙයින් ගෙට ගොස් ද ඉගැන්වුයේය.

   - ක්‍රියා 20:7-12: යුතිකස් කවුළුවෙන් බිමට වැටුණු අවස්ථාවේදී පාවුල් නිවසක් තුළ කතා කරමින් සිටියේය.

   - ක්‍රියා 21:8-14 : නිවස් තුළදී අනාගතවක්තෘමය එළිදරව් කිරීම් සිදු විය.

   - 1 කොරින්ති 16:19: රෝම 16:3-5: කොලොස්සි 4:15 හා පිලමොන් 1:2 තුළ නිවාස වල පැවැත්වූ සභාවන් ගැන වාර්තා වේ.

2. ධර්ම ප්‍රචාරණය උදෙසා වූ විවිධ ප්‍රවේශයන් ගැන සළකා බලන විට පහත ප්‍රශ්න ඔබට උපකාරී වනු ඇත. "මෙම ක්‍රමවේදය..." පිළිබඳ පහත ප්‍රශ්න අසන්න.

   - එය බයිබලිය ද : ක්‍රමවේදයන් බයිබලයේ දැක්වෙන ප්‍රතිපත්ති මත පදනම් විය යුතුය.

   - එයට බලපෑමක් කළ හැකිද : ක්‍රමවේදයන් සාර්ථක විය යුතුය. සාර්ථකත්වය නිර්වචනය කර ඇත්තේ ගැළවීම නොලත් පුද්ගලයෙකු ශුභාරංචියට දක්වන යහපත් ප්‍රතිචාරයක් ලෙසයි.

   - එය කාර්යක්ෂමද : ක්‍රමවේදයන් තුළින් මිනිසුන්, ද්‍රව්‍ය හා මුදල් ද ඇතුළුව ආත්මික සම්පත්වල උපරිම ප්‍රයෝජන ගෙන දිය යුතුය.

   - එය සංස්කෘතියට අදාළ වේද? එක් රටක් තුළට සරිලන දෙයක් තවත් රටකට උචිත නොවිය හැකිය. එක් මිනිසුන් කණ්ඩාමකට සරිලන දෙයක් තවත් මිනිසුන් කණ්ඩායමක් ප්‍රතික්ෂේප කළ හැකිය.

3. ශුභාරංචි පොත්, ක්‍රියා පොත හා යැවුම් පත්‍ර පිළිබඳව ඔබේම අධ්‍යයනයන් කරගෙන යන්න. නව ගිවිසුම් ධර්ම ප්‍රචාරණය පිළිබඳ තවත් ප්‍රතිපත්ති හා පාඩම තුළ ඉගෙනගත් ප්‍රතිපත්ති සඳහා තවත් උදාහරණ හඳුනා ගන්න.

# අට වන පරිච්ඡේදය

## ක්‍රමවේද : නව ගිවිසුමේ සඳහන් උපමා

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "උපමාව" යන පදය නිර්වචනය කිරීමට
- යේසුස්වහන්සේ උපමා යොදාගත්තේ මන්දැයි පැහැදිලි කිරීමට.
- යේසුස්වහන්සේ විසින් ඉගැන් වූ උපමා තුළ සඳහන් ප්‍රතිපත්ති හඳුනා ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට මෙබඳු බොහෝ උපමාවලින් උන්වහන්සේ වචනය ඔවුන්ට කීසේක. (මාර්ක් 4:33)**

## හැඳින්වීම

පෙර පාඩමේදී නව ගිවිසුමේ ඇති ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද ගැන ඔබ ඉගෙන ගත්තේය. ධර්ම ප්‍රචාරණ ක්‍රියාවලිය පිළිබඳ තවත් දේවල් උගන්වන නවගිවිසුම් උපමා බොහොමයක් තිබේ. උපමාවක් යනු ආත්මික සත්‍යයක් දැක්වීම සඳහා ස්වාභාවික ලෝකයෙන් උදාහරණයක් පාවිච්චි කරන කතාවකි. "උපමාව" යන පදයේ සැබෑ අර්ථය "සැසඳීම සඳහා එක ළඟ තැබීම" යන්නයි. උපමා තුළදී, යේසුස්වහන්සේ ස්වාභාවික උදාහරණයක් ආත්මික සත්‍යයන් සමඟ සංසන්දනය කළ සේක. උපමාවක් යනු ස්වර්ගික අර්ථයක් ඇති ලෞකික කතාන්දරයකි.

මෙම පාඩම තුළදී ධර්ම ප්‍රචාරණයේ ප්‍රතිපත්ති පිළිබඳ උගන්වන නව ගිවිසුම් උපමා ගැන ඔබ ඉගෙන ගනු ඇත.

## උපමාවන් අවශ්‍ය මන්ද?

ආත්මික සත්‍යයන් ඉගැන්වීම සඳහා උපමා පාවිච්චි කරන්නේ මන්දැයි ගෝලයන් යේසුස්වහන්සේගෙන් ඇසූ සේක :

> **එවිට ගෝලයෝ ඇවිත්: ඔබවහන්සේ ඔවුන්ට උපමාවලින් කථාකරන්නේ මක්නිසාදැයි ඇසුවෝය. (මතෙව් 13:10)**

යේසුස්වහන්සේ මෙසේ පිළිතුරු දුන් සේක :

> **උන්වහන්සේ ඔවුන්ට උත්තරදෙමින්: ස්වර්ගරාජ්‍යයේ රහස් දැනගැනීම නුඹලාට දී තිබේ, නුමුත් ඔවුන්ට දීලා නැත. (මතෙව් 13:11)**

උපමා තුළින් ඉගැන්වූ ආත්මික සත්‍යයන් ගෝලයන්ට තේරුම් ගත හැකි වූයේ ඔවුන්ට ආත්මික මනසක් තිබුණු බැවිනි. ආත්මික මනසක් නොතිබුණු අය උපමා ඇසූ නමුත් තේරුම් ගත නොහැකි විය. ආත්මික සත්‍යයන් තේරුම් ගත හැක්කේ ආත්මික මනසක් තුළින් පමණි :

> **නුමුත් ජම්මික මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ ආත්මයාණන්වහන්සේගේ කාරණා පිළි නොගනියි. ඒවා ඔහුට මෝඩකමය: ඒවා ආත්මික ලෙස විමසිය යුතු බැවින් ඒවා දැනගන්ට ඔහුට බැරිය.**
> **(1 කොරින්ති 2:14)**

ආත්මික මනසක් ඇති පුද්ගලයෙක් යනු ආත්මිකව නැවත ඉපදීම ලැබූ අයෙකි. ආත්මික මනසක් සහිත පුද්ගලයන් උපමාවන් තේරුම් ගන්නා අතර, ලෞකික, පාපී මනසක් ඇති අයට ඒවා තේරුම්ගත නොහැකිය.

## ධර්ම ප්‍රචාරණය පිළිබඳ උපමාවන්

ධර්ම ප්‍රචාරණය පිළිබඳ සහ දේව රාජ්‍යය ලෝකය පුරා ව්‍යප්ත වන්නේ කෙසේදැයි පැහැදිලි කරන උපමාවන් රැසක් යේසුස්වහන්සේ පැවසූ සේක. පහත උපමාවන් අධ්‍යයනය කරන්න.

**නැති වූ බැටළුවා : මතෙව් 18:12-14; ලූක් 15:4-7**
**නැති වූ කාසිය : ලූක් 15:8-10**
**අකීකරු පුත්‍රයා : ලූක් 15:11-32**

මෙම උපමාවන් තුළින් නැතිවූවන් පිළිබඳ දෙවියන්වහන්සේගේ සැළකිල්ල පිළිබඳව සහ ඔවුන් සොයා යාමට ඔබ තුළ පැවතිය යුතු උනන්දුව පිළිබඳව ප්‍රකාශ වේ. ඔවුන් නැති වූයේ මන්ද යන්න ගැටලුවක් නොවේ. බැටළුවා නොමග ගියේය. කාසිය නැති වූයේ නොසැලකිල්ල නිසාය. පුත්‍රයා නැති වූයේ ඔහුගේ කැරලිකාරකම නිසාය. මිනිසුන් නැති වී සිටින්නේ කෙසේද යන්න ගැන දෙවියන්වහන්සේ සැළකිලිමත් නොවන අතර උන්වහන්සේ සළකනුයේ ඔවුන් නැවත සොයා ගැනීම ගැන පමණි. පාපය තුළ අතරමං වූවන් සොයා ගැනීමට ඔබ හැකි සෑම උත්සහයක්ම දැරිය යුතුය. ඔවුන් ඔබ ළඟට පැමිණෙන තුරු නොසිට, ඔබ ඔවුන් සිටින තැනට යා යුතුය.

**මහත් රාත්‍රි කෑම : ලූක් 14:15-23**

ඇතැම් අය ශුභාරංචිය වෙත වූ ආරාධනාව පිළිනොගත් පමණින් ධර්ම ප්‍රචාරණය නවතා දැමිය යුතු නැත. ඔබ ආත්මිකව කුසගිනිව සිටින අය සොයා ස්වාමීන්වහන්සේ සූදානම් කර ඇති මංගල්‍ය භෝජනය වෙත ඔවුන් ගෙන ආ යුතුය.

**ඵල නැති අත්තික්කා ගස : ලූක් 13:6-9**

අත්තික්කා ගස ඉශ්‍රායෙල් ජාතිය පිළිබඳ ස්වාභාවික සළකුණකි. දෙවියන්වහන්සේ තම රාජ්‍යය ලෝකයට ප්‍රකාශ කළ හැකි ජාතියක් ලෙස ඉශ්‍රායෙලය නැඟිටවූ සේක. සැබෑ දෙවියන්වහන්සේ පිළිබඳ තම දැනුම බෙදාගැනීම තුළින් අන්‍යජාතීන් අතර ඵල දරන “ගසක්” ලෙස ඉශ්‍රායෙලය නඟා සිටුවීමට දෙවියන්වහන්සේ උත්සාහ කළ සේක. නුමුත් ඉශ්‍රායෙලය නිසරුව ඵල නොදැරුවේය. දැන් දෙවියන්වහන්සේ මේ අරමුණ උදෙසා සභාව නැඟිටුවා තිබේ. දෙවියන්වහන්සේ ඉශ්‍රයෙල් ජාතියට කළාක් මෙන් ඵල දැරීම සඳහා ඇදහිලිවන්තයන් පෝෂණය කරන සේක. උන්වහන්සේගේ අරමුණ එකමය : අප සැබෑ දෙවියන්වහන්සේ පිළිබඳ දැනුම බෙදා ගැනීම තුළින් අන්‍යජාතීන් අතින් ඵල දැරිය යුතුය. ඵල නොදරන ගස් පිළිබඳව දෙවියන්වහන්සේ ප්‍රසන්න නොවේ.

**තලෙන්ත උපමාව : මතෙව් 25:14-30; ලූක් 19:11-27**
**අන් රටක නැවතී සිටි මනුෂ්‍යයා : මාර්ක් 13:34-37**
**දාසයන් : මතෙව් 24:43-51; ලූක් 12:39-46**
**බලාසිටින සේවකයන් : ලූක් 12:36-38**
**විශ්වාස වූ දාසයා : මතෙව් 25:14-30**

“දාසයන්” පිළිබඳ උපමාවන්, ඇදහිලිවන්තයන්ට භාර දී ඇති ශුභාරංචිය පිළිබඳ නැණවත් භාරකාරයෙක්ව සිටීම අවධාරණය කරයි. ශුභාරංචිය ප්‍රචාරය කිරීමට පාවිච්චි කිරීම සඳහා සෑම ඇදහිලිවන්තයෙකුටම තලෙන්ත හෝ විශේෂ හැකියාවක් දී තිබේ. ඔබේ හැකියාවන් කුඩා වුවත් විශාල වුවත්, දෙවියන්වහන්සේ ඔබට දී ඇති දේවල් ඔබ පාවිච්චි කළ යුතුය. යේසුස්වහන්සේ නැවත පැමිණෙන විට, තම හැකියාවන් නිසි ලෙස පාවිච්චි කර ඇති අයට විපාක ලැබෙනු ඇත. (ලූක් 16:10-12).

**වපුරන්නාගේ උපමාව : මතෙව් 13:3-8; මාර්ක් 4:3-8; ලූක් 8:5-8**

ශුභාරංචිය ප්‍රකාශ කරනු ලබනුයේ දේව වචනය නමැති බීජය වැපිරීමෙනි. වචනයෙන් තොරව ගුණනය වීමක් පැවතිය නොහැකිය. ඵලදාව රඳා පවතින්නේ බීජය තුළ ඇති ජීවය (දේව වචනය) හා පසෙන්

ලැබෙන ප්‍රතිචාරය (දේව වචනය සඳහා මිනිසාගේ ප්‍රතිචාරය) මතය. දේව වචනය වැපිරීමේදී විවිධ ප්‍රතිචාර පැවතිය හැකිය.

ඔබගේ වගකීම වැපිරීමය. ඔබ දේව වචනය වපුරන කළ, ඇතැම් පස් අස්වැන්න ගෙන දීමට සූදානම්ය. අනෙකුත් පස් ප්‍රතිචාර නොදක්වන අතර ඵල දරන්නේ ඉතා කුඩා ප්‍රමාණයකි. යේසුස්වහන්සේට පවා තම පොළොවේ කළ සේවය තුළදී ප්‍රතිචාර නොදක්වන පස් හමුවිය :

> **එහිදී රෝගීන් ස්වල්පදෙනෙකු පිට අත් තබා සුවකළා මිස වෙන කිසි බලවත් ක්‍රියාවක් කරන්ට උන්වහන්සේට නොහැකිවූයේය. ඔවුන්ගේ විශ්වාසය නැතිකම ගැන උන්වහන්සේ මවිතවූසේක. උන්වහන්සේ උගන්වමින් අවට ගම්වල ඇවිද්දසේක. (මාර්ක් 6:5-6)**

**කිරිඳි සහ තිරිඟු : මතෙව් 13:24-30**

ඔබ ධර්ම ප්‍රචාරය කරන විට සහ සභාවට නව ඇදහිලිවන්තයන් එකතු කරනු ලබන විට තම ක්‍රියාවලිය පරාජය කිරීමට සාතන් උත්සාහ කරනු ඇත. ඔහු දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ යහපත් බීජ අතර "වල් පැළෑටි" නමැති මිනිසුන් වපුරනු ඇත. ඇදහිලිවන්තයන් ලෙස පෙනී සිටින හා ධර්ම ප්‍රචාරණය තුළින් සභාවට පැමිණෙන පුද්ගලයන් අවංක නොවේ. ඔව්හු සාතන් විසින් සිටවනු ලැබූ "වල් පැළෑටි"ය. තිරිගු වලින් වල් පැළෑටි වෙන් කිරීමට ඔබ ඔබගේ කාලය සහ ශක්තිය වැය කිරීම දෙවියන්වහන්සේට අවශ්‍ය නොවේ. බීජ වැපිරීම සහ ධර්ම ප්‍රචාරණය කිරීම දිගටම කරගෙන යන්න. යේසුස්වහන්සේ නැවත පැමිණි විට අස්වැන්න නෙලීමේදී වල් පැළෑටි වෙන් කරනු ලබනු ඇත.

**මාළු දැළ : මතෙව් 13:47-50**

යේසුස්වහන්සේ ධර්ම ප්‍රචාරණය මුහුදට හෙළනු ලැබූ මහත් දැළකට සමාන කළ සේක. සියලු ආකාරයේ මත්ස්‍යයන් ඇතුළු වන නමුත්, දැළ වෙරළට අදිනු ලැබූ කළ හොඳ මාළු නරක මාළුන්ගෙන් වෙන් කරනු ලබනු ඇත. දේව රාජ්‍යය සෑම ජාතියකින්ම මිනිසුන් සහ කාන්තාවන් එක්කර ගනු ලබනු ඇත. බොහෝ දෙනෙක් දේව රාජ්‍යයට ඇතුළු වනු ඇත. ඇතැම් අය අවංක වනු ඇති අතර, අනෙක් අය එසේ නොවේ. අවසාන විනිශ්චයේදී දෙවියන්වහන්සේ දැළ අදිනු ලබනු ඇති අතර, හොඳ හා නරක වෙන් කරනු ලැබේ. ඔබ කැඳවා ඇත්තේ වෙන් කිරීමට නොව මාළු ඇල්ලීමටය.

**අබ ඇටය : මතෙව් 13:31-32; මාර්ක් 4:31-32; ලූක් 13:19**

දේව රාජ්‍යය අබ ඇටයක් මෙන් වර්ධනය වනු ඇත. ආරම්භයේදී අබ ඇටය ඉතා කුඩා වනු නමුත් පරිණත වත්ම එය විශාල ලෙස වර්ධනය වේ. පෘතුවිය මත දේව රාජ්‍යයට ද තිබුණේ කුඩා ආරම්භයකි. පෘතුවිය මත තම සේවය අවසන් කර යේසුස්වහන්සේ ස්වර්ගයට යන විට, ශුභාරංචිය ව්‍යාප්ත කිරීම උදෙසා උන්වහන්සේ ඉතිරි කර ගියේ අනුගාමිකයන් කුඩා පිරිසක් පමණි. එම කුඩා ඇදහිලිවන්තයන් ප්‍රමාණය බොහෝ ජාතීන් තුළින් ඇදහිලිවන්තයන් දහස් ගණනකට ගුණනය වී තිබේ.

**මුහුන් : මතෙව් 13:33; ලූක් 13:21**

පිටි පිඩක් තුළ මුහුන් මෙන්, ලෝකය නමැති "පිටි පිඩ" තුළ ශුභාරංචිය ව්‍යාප්ත වනු ඇත. මුහුන් මෙන්ම දේව රාජ්‍යයේ බලය බාහිරින් පවතින දෙයක් නොව අභ්‍යන්තරයේ පවතින දෙයකි.

**මිදි වැල සහ අතු : යොහන් 15:1-16**

මෙම උපමාවෙන් විස්තර කරන්නේ යේසුස්වහන්සේ, අපත්, ධර්ම ප්‍රචාරණ ක්‍රියාවලියත් අතර ඇති සම්බන්ධතාවයයි. උන්වහන්සේ ආත්මික මිදි වැල වන අතර අප අතුය. අපට තනිවම ඵල දැරිය නොහැකිය. අපට නැවත ඵල දැරිය හැකි වන්නේ අප යේසුස්වහන්සේ නැමති ජීවනය ගෙන දෙන වැලට සම්බන්ධ වී සිටිනතුරු පමණි. පවතින ආත්මික ඵල දරණ පිණිස ඔබේ ජීවිතයේ ඇති ඵල නොදරන හැම දෙයක්ම ඉවත් කිරීමට යේසුස්වහන්සේට අවශ්‍යය :

**අස්වැන්න : මතෙව් 9:37-38; ලූක් 10:2**

මෙම උපමාව තුළදී, කුඹුර යනු ලෝකයයි. අස්වැන්න යනු ශුභාරංචිය පණිවුඩයට ප්‍රතිචාර දැක්වීමට සූදානම් ජන සමූහයයි. දෙවියන්වහන්සේගේ ආත්මික සේවකයන් විසින් නෙලා ගන්නා තුරු විශාල අස්වැන්නක් බලා සිටී.

# වෙනත් ධර්ම ප්‍රචාරණ ප්‍රතිපත්ති

කෙටි ප්‍රකාශයන් තුළින් යේසුස්වහන්සේ වෙනත් ධර්ම ප්‍රචාරණ ප්‍රතිපත්ති ඉගැන්වූ සේක :

**ලෝකයේ ආලෝකය : මතෙව් 5:14-16; ලූක් 8:16**

ඇදහිලිවන්තයන් සැතපුම් ගණනක් ඈත සිට වුවද දැකගත හැකි ලෙස කන්දක් මුදුණේ ඇති නුවරකින් නිකුත් වන ආලෝකයක් ලෙස පෙනෙන විට ශුභාරංචිය ව්‍යාප්ත වනු ඇත. ආත්මික අන්ධකාරයෙන් වැසුණු ලෝකයකට අප ලෝකයේ ආලෝකය (යේසුස්වහන්සේ) ගෙනා ආ යුතුය.

**පොළොවේ ලුණු : ලූක් 14:34**

බයිබලිය කාල වලදී මස් නරක් වීම වැළැක්වීමට ඒවාට ලුණු ආලේප කරනු ලැබිය. ඇදහිලිවන්තයන් යනු, ලෝකය පාපයෙන් නරක් වීම (ආත්මික මරණය) නවතනු පිණිස ආරක්ෂාවේ පණිවුඩය (ගැළවීම) සමඟ ලෝකයට ආලේප කරනු ලැබූ ලුණුය.

**ස්වර්ගීය වස්තුව : මතෙව් 6:19-21; ලූක් 12:16**

අදහිලිවන්තයන් ලෝකයේ වස්තුව ගැන කරදර විය යුතු නැත. අප ශුභාරංචිය බෙදා ගන්නා විට, අප ස්වර්ගයේ ආත්මික වස්තු රැස් කරනු ඇත.

**පුළුල් දොරටුව : මතෙව් 7:14**

සංඛ්‍යාව පමණක් සළකා ඔබට නිවැරදි මාර්ගය නිශ්චය කළ නොහැකි. නිරයට යන දොරටුවෙන් බොහෝ දෙනෙක් ඇතුළු වන අතර සදාකාල ජීවනයට යන මාර්ගය සොයා ගන්නේ ස්වල්ප දෙනෙකි.

**බොහෝ ක්‍රියාවන් : මතෙව් 7:22**

ඇතැම් මිනිසුන් විසින් මහත් ක්‍රියාවන් කරනු ඇත. නමුත් මහත් කාර්යයන් කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත කිරීමට හා උන්වහන්සේගේ අරමුණු ඉටු කිරීමට සමාන නොවේ. දෙවියන්වහන්සේගේ කාර්යයන් උන්වහන්සේගේ මිනිසුන් විසින් උන්වහන්සේගේ ආකාරයට ඉටු කළ යුතුය.

**කුඩා දේ විශාල වේ : මතෙව් 10:42; මතෙව් 14:15-21**

යේසුස්වහන්සේගේ නාමයෙන් කරනු ලබන හැම දෙයක්ම, කුඩා ලෙස පෙනුනත් ඵලදායි වේ. අපට පූජා කිරීමට ඇති කුඩා දේ දෙවියන්වහන්සේට කෙලෙස වර්ධනය කර පාවිච්චි කළ හැකිද යන්න රොටි සහ මාළු පිළිබඳ හාස්කමෙන් පෙන්නුම් කෙරේ. ධර්ම ප්‍රචාරණය සඳහා ගන්නා කුඩා උත්සාහයකදීත් මෙය සත්‍යයකි.

**වර්ධනය වීමට වෙනසක් අවශ්‍යය : මාර්ක් 2:21-22; 7:13**

නව වර්ධනයක් සඳහා වෙනසක් අවශ්‍යය. අප ඔබට සම්ප්‍රදායානුකූල හා පච්කාර ජීවන රටාවන්ගෙන් යුත් පැරණි භාජන තුළ නව දේවල් රැගෙන ගිය නොහැකිය. සම්ප්‍රදායන් හි ගැලී සිටින හා වෙනස් වීම් ප්‍රතික්ෂේප කරන මිනිසුන් නිසා ශුභාරංචියට ඇති බලවත් හැකියාවට බාධා ඇති වේ.

**නැති කර ගැනීම තුළින් ලබා ගැනීම : මාර්ක් 8:34-37; 10:29-30**
**දීම තුළින් ලැබීම : ලූක් 6:38**

ලෝකයේ ප්‍රතිපත්ති උගන්වන පරිදි ඔබට දෙයක් ලබා ගත හැක්කේ වඩ වඩා අත්පත් කර ගැනීමෙනි. යේසුස්වහන්සේ ඉගැන්වූයේ ඔබට හැම දෙයක්ම ලබා ගත හැක්කේ හැම දෙයක්ම නැති කර ගැනීම තුළින් වන බවයි. ස්වාභාවික ලෝකයේදී අහිමි වීමක් ලෙස පෙනෙන දේවල් ආත්මික ලෝකයේදී හිමි කර ගැනීමකි. ධර්ම ප්‍රචාරණ කාර්යය උදෙසා ඔබ වැය වන විට, ඔබ සදාකාලිකව විපාක ලබනු ඇත.

**මරණය ජීවනය ගෙන දේ : යොහන් 12:24**

යළි යළිත් ඵල දරන ඇදහිලිවන්තයෙකු වීමට නම් ඔබ ඔබගේ මාංශයේ ආශාවන්ට මළ කෙනෙක් විය යුතුය. ඔබ පාපය උදෙසා මැරී ලෝකයේ ආත්මික අස්වනු නෙළා ගැනීමට යේසුස්වහන්සේ අනුගමනය කිරීම සඳහා ඔබේ මාර්ග යටත් කළ යුතුය.

## සාරාංශය

ධර්ම ප්‍රචාරණය හා සම්බන්ධ යේසුස්වහන්සේගේ ඉගැන්වීම් වලදී, උන්වහන්සේ පහත දේවල් ගැන ප්‍රසන්න නොවන බව යේසුස්වහන්සේ ප්‍රකාශ කළ සේක :

මාළු අල්ලා ගැනීමෙන් තොර මාළු බෑම
හිස් වූ මංගල්‍යය භෝජනය
ඵල නෙලීමෙන් තොරව වැපිරීම
ඵල නොදරන ගස
රැළ වෙත ගෙනෙනු නොලැබූ නැති වූ බැටළුවා
සෙවූ නමුත් හමු නොවුණු නැති වූ කාසිය
ආපසු නොපැමිණි නැති වූ පුත්‍රයා
සඵලවත් නොවන සේවකයන්
ප්‍රතිචාර නොදක්වන ආත්මික පස
පැසුණු නමුත් නෙලා නොගත් අස්වැන්න

එක් පුද්ගලයෙකු වත් විනාශ වීම අපේක්ෂා නොකරන අපගේ පියාණන්වහන්සේ ධර්ම ප්‍රචාරණය තුළින් ලැබෙන ප්‍රතිඵල වලට කැමතිය :

> **ප්‍රමාදයයි සමහරුන් සලකන හැටියට ස්වාමින්වහන්සේ තමන්ගේ පොරොන්දුව ගැන ප්‍රමාද නොවනසේක: නුමුත් සියල්ලන්ම පසුතැවිලිවෙනවාට මිස කිසිවෙක් විනාශවෙනවාට උන්වහන්සේ නොකැමතිව, නුඹලා කෙරෙහි බොහෝ කල් ඉවසනසේක. (2 පේතෘස් 3:9)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "උපමාව" නමැති වචනය නිර්වචනය කරන්න.

3. තම අනුගාමිකයන්ට ඉගැන්වීමට යේසුස්වහන්සේ උපමාවන් යොදා ගත්තේ ඇයි?

4. පහත එක් එක් උපමාව තුළින් උගන්වනු ලබන ධර්ම ප්‍රචාරණ ප්‍රතිපත්ති කෙටියෙන් පැහැදිලි කරන්න.

   හිස් වූ මංගල්‍යය භෝජනය :

   ඵල නැති අත්තික්කා ගස :

   නැති වූ බැටළුවා, කාසිය හා පුත්‍රයා :

   දාසයන් පිළිබඳ උපමාවන් :

   වපුරන්නා :

   කිරිඳි සහ තිරිඟු :

   මාළු දැළ :

   අබ ඇටය :

   මුහුන් :

   මිදිවැල සහ අතු :

(ස්වයං පරික්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. නව ගිවිසුමේ උපමාවන් තුළින් එළිදරව් වන ධර්ම ප්‍රචාරණයේ ප්‍රතිපත්ති පිළිබඳ ඔබගේ අධ්‍යයනය දිගින් දිගටම කරගෙන යන්න. යේසුස්වහන්සේගේ සෑම උපමාවක්ම වඩා විස්තරාත්මකව අධ්‍යයනය කිරීම සඳහා මෙහි සඳහන් බයිබල් පද යොදාගන්න. ඔබට ධර්ම ප්‍රචාරණය පිළිබඳ තවත් ප්‍රතිපත්ති හඳුනාගත හැකිද?

2. මෙම උපමාවන් තුළින් ප්‍රකාශ වන ධර්ම ප්‍රචාරණය පිළිබඳ ඉගැන්වීම් ඔස්සේ ඔබේ ජීවිතය පරීක්ෂා කර බලන්න.

- ඔබට මාළු අල්ලා ගැනීමට නොහැකිව මාළු අල්ලමින් සිටිද?

____________________________________________________________

- ඔබ නෙලා ගැනීමෙන් තොරව වපුරනවාද?

____________________________________________________________

- ඔබ ඵල නොදරන ගසක් මෙන්ද?

____________________________________________________________

- ඔබ "නැති වූ බැටළුවන්" සොයා යන්නේද?

____________________________________________________________

- ඔබ කාර්යක්ෂම සේවකයෙක්ද?

____________________________________________________________

- ඔබ සේවය කරන පස ප්‍රතිචාර දක්වන්නේද?

____________________________________________________________

- ඔබේ සමාජය, ඔබේ රට හා ලෝකය තුළ ආත්මික අස්වැන්න නෙළා ගැනීම පිළිබඳ ඔබේ කොටස ඔබ ඉටු කරන්නේද?

____________________________________________________________

# නව වන පරිච්ජේදය

## ක්‍රමවේද : පෞද්ගලික ධර්ම ප්‍රචාරණය

**අරමුණු :**

මෙම පරිච්ජේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට,
- පෞද්ගලික ධර්ම ප්‍රචාරණය නිර්වචනය කිරීමට,
- පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කළ හැකි ආකාරයන් තුනක් ලියා දැක්වීමට.
- ක්‍රිස්තුස්වහන්සේ වෙතට ආත්මයක් ගෙන එන්නේ කෙසේදැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මා කළ සියල්ල උන්වහන්සේ මට කීසේකැයි සාක්ෂිදුන් ස්ත්‍රියගේ වචන නිසා ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. (යොහන් 4:39)**

### හැඳින්වීම

ශුභාරංචිය බෙදාගැනීම පිළිබඳ නව ගිවිසුමේ ක්‍රමවේද තුළ පෞද්ගලික හා කණ්ඩායම් ධර්ම ප්‍රචාරණය යන කොටස් දෙකම ඇතුළත් වන බව ඉගෙනගෙන තිබේ. මෙම පාඩමේදී පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කරන ආකාරය ඔබ ඉගෙනගනු ඇත. දහ වන පරිච්ජේදයේදී පෞද්ගලික ධර්ම ප්‍රචාරණයයේදී ඔබ මුහුණ දෙන අපහසුතාවයන් සමඟ ගනුදෙනු කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත.

### පෞද්ගලික ධර්ම ප්‍රචාරණය

පෞද්ගලික ධර්ම ප්‍රචාරණය යනු කුමක්දැයි එහි නමින්ම පැහැදිලි වේ. එනම් තනි පුද්ගලයන් සමඟ පෞද්ගලිකව ශුභාරංචිය බෙදා ගැනීමයි. එය පුද්ගලයෙක් තවත් පුද්ගලයෙක්ට, එක් කෙනෙක් තවත් කෙනෙකුට කරන ධර්ම ප්‍රචාරණයයි. පෞද්ගලික ධර්ම ප්‍රචාරණය පහත ආකාර තුනට අනුව සිදු කෙරේ.

**නිහඬ සාක්ෂි දැරීම :**

ඔබේ කිතුනු ජීවන රටාව තුළින් ඔබ ශුභාරංචිය පිළිබඳව නිහඬව සාක්ෂි දරයි. ඕනෑකමින්ම හෝ එසේ නොමැතිව ඔබේ ජීවිතය යම් දෙයකට සාක්ෂියක් විය හැකිය. ඔබේ ජීවිතය ශුභාරංචිය ගැන ඔබ කටින් ප්‍රකාශ කරන සාක්ෂිය හා එකඟ නොවේ නම්, මිනිසුන් ගැළවීමට ප්‍රතිචාර දැක්වීම කෙරෙහි එය බාධාවකි.

කිතුනු ජීවිතය බලවත්ම නිහඬ සාක්ෂි දැරීම වන නමුත්, ඇතැම් පුද්ගලයන් "ආගමික" ආභරණ පැළඳීම හෝ තම නිවසේ, ව්‍යාපාරික ස්ථානයේ හෝ මෝටර් රථයේ බයිබල් පද හෝ පින්තූර එල්ලා තැබීම ආදිය සිදු කරයි. ඇතැම් අවස්ථාවලදී ගැළවීම නොලත් පුද්ගලයෙක් ඒ පිළිබඳව විමසූ විට මේවා තුළින් වාචික සාක්ෂි දැරීමකට මඟ පාදයි.

**ශුභාරංචි පත්‍රිකා :**

ශුභාරංචි පත්‍රිකා යනු, කුඩා කොළ කැබලි වල මුද්‍රණය කරන ලද දේව වචනයේ කෙටි පණිවුඩයන්ය. ඒවා අඩු වියදමින් කරගත හැකි සහ බරින් අඩුය. එමනිසා එක වර විශාල ප්‍රමාණයක් රැගෙන යා හැකි අතර ඔබ සමඟ කතා බහ කරන අයට නොමිලේ බෙදා දිය හැකිය.

ශුභාරංචි පත්‍රිකාවක්, ඔබ සමඟ ගනුදෙනු කරන අය, මිතුරන්, ඥාතීන් හෝ මහ මඟ ඔබ පසු කර යන පුද්ගලයන් ආදී ඕනෑම කෙනෙකුට දිය හැකිය. ඔබ විසින් ලියන ලියුම් වල, පුස්තකාල වල, කඩ සාප්පු

වල, අවන්හල් වල කාර්යාල වල ඔබට ඒවා තැබිය හැකිය. ඔබට බස් රථය තුළ, දුම්රිය තුළ හෝ ගුවන් තොටුපළ වල ඒවා තබා යා හැකිය.

ඔබ කෙනෙකුට පෞද්ගලිකව ශුභාරංචි පත්‍රිකාවක් දෙන විට, "මෙන්න කියවීමට හොඳ යමක්" හෝ "මෙය මාගේ ජීවිතය වෙනස් කළ දෙයක් මම එය ඔබ සමඟ බෙදා ගැනීමට කැමති"යි පවසන්න. මෙවැනි ප්‍රකාශයන් බොහෝ විට වාචික සාක්ෂි දැරීමකට මඟ පාදයි.

ඔබ පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සඳහා පත්‍රිකා තෝරා ගැනීමේදී පහත ප්‍රශ්න සලකා බලන්න :

1. කෙනෙකු සැබවින්ම අසන ප්‍රශ්න වලට පිළිතුරු සපයයිද? එය එසේ නම්, මිනිසුන් එය කියවීමට උනන්දු වනු ඇත.

2. එය කෙටියෙන් සඳහන් වන දෙයක්ද? එය සංක්ෂිප්ත හා පැහැදිලිව කරුණු දක්වන්නක් විය යුතු අතර නොඑසේනම් පණිවුඩය සම්පූර්ණයෙන් කියවීමට පෙර මිනිසුන් එය අතහැර දමනු ඇත.

3. එය තවත් ඇදහිමක් විවේචනය නොකර ධනාත්මක ලෙස කතා කරයිද?

4. ගැළවීම නොලත් පුද්ගලයන්ට නොතේරන ආගමික භාෂාවක් ඒ සඳහා භාවිත කර තිබේද?

5. පහසුවෙන් කියවිය හැකි වන පරිදි මුද්‍රණය කර තිබේද?

6. පත්‍රිකාව තුළින් මූලික ශුභාරංචි පණිවුඩය බෙදා ගැනේද?

7. ප්‍රතිචාර දක්වා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමට ඒ තුළින් අවස්ථාවක් සලසා දෙයිද?

යමෙකුට තවත් ආත්මික උපකාරයක් අවශ්‍ය නම් ඔබට කතා කළ හැකි වන පරිදි ඔබේ නම, ලිපිනය හා දුරකථන අංකය පත්‍රිකාවේ යම් තැනක ලියා තබන්න. බොහෝ පත්‍රිකා වල මේ සඳහා හිස් ඉඩක් සපයා තිබේ. පත්‍රිකාවක් යනු වාචික සාක්ෂි දැරීම වෙනුවට සිදු කළ හැකි දෙයක් නොව, ඒ සඳහා අතිරේකව යොදාගත හැකි දෙයකි. පත්‍රිකාවක වටිනාකම නම් ඔබ එම ස්ථානය හැර ගිය පසුත් එයට දිගින් දිගටම සාක්ෂි දැරීමට හැකිවීමයි.

## වාචික සාක්ෂි දැරීම :

නිහඬ සාක්ෂි දැරීමට හා පත්‍රිකා මඟින් ශුභාරංචිය බෙදා ගැනීමට බලපෑමක් කළ හැකි නමුත්, මහා ආඥාව සඳහා අවශ්‍ය වන්නේ මේවා පමණක් නොවන බව මතක තබා ගන්න. ඒ සඳහා අවශ්‍ය වන්නේ ඔබ වාචිකව ශුභාරංචිය බෙදා ගැනීමයි.

පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී වාචික සාක්ෂි දැරීම සිදු කරනුයේ දේශනා කිරීම හා ඉගැන්වීම වැනි විධිමත් ක්‍රම වලට වඩා අවිධිමත් ක්‍රම වලටය. ගෙයින් ගෙට ගොස් ශුභාරංචිය ප්‍රකාශ කිරීම මඟින් එය සිදු කළ හැකිය. මහලු නිවාස වලදී, රෝහල් වලදී, සිරගෙවල් වලදී. පාසල් වලදී, ව්‍යාපාරික ස්ථාන වලදී හා විශේෂ ධර්ම ප්‍රචාරණ අවස්ථා වලදී එය සිදු කළ හැකිය. මිතුරන්, ඥාතීන්, අසල්වැසියන් හා පාසලේදී සහ ව්‍යාපාරික ස්ථානයේදී ඔබ සමඟ ඇසුරු කරන අයට ඔබට පෞද්ගලිකව ශුභාරංචිය බෙදා ගත හැකිය. ප්‍රසිද්ධ රැස්වීමකදී අනුශාසකයෙකු ලෙස ක්‍රියා කිරීමෙන් හා ඔබගේ සභාවේදී අල්තාරය ඉදිරියට එන අයට සේවය කරන්නෙකු වශයෙන් ද ඔබට පෞද්ගලිකව ධර්ම ප්‍රචාරණය කිරීම සිදු කළ හැකිය. පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී, ඔබ සමඟ කතා බහ කරන ඕනෑම කෙනෙකු සමඟ ඔබට ශුභාරංචිය බෙදාගත හැකිය.

යොහන් 4 හි සඳහන් පරිදි යේසුස්වහන්සේ ළිඳ ළඟ සිටි කාන්තාව සමඟ කළාක් මෙන් සම්මුඛ සාකච්ඡාවක ස්වරූපයෙන් පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කළ හැකිය. කෙනෙකු විසින් ඔබට පෙනෙන ලෙස කරන දෙයක් පිළිබඳව හෝ ඔබට පෙනෙන ලෙස ඔවුන්ට පවතින අවශ්‍යතාවයක් ගැන ඔබේ අවධානය යොමු කළ හැකිය. ශුභාරංචිය බෙදා ගැනීමකට මඟ පාදන ප්‍රශ්න ඔබට ඔවුන්ගෙන් ඇසිය හැකිය.

යේසුස්වහන්සේ ඔබේ ජීවිතයේ කර ඇති දෙය පිළිබඳ සාක්ෂිය අන් අය සමඟ බෙදාගැනීමෙන් ද පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කළ හැකිය. යොහන් 4 දී, සමාරිය ස්ත්‍රිය නැවත තම නගරයට ගොස් තමන්ගේ පෞද්ගලික අත්දැකීම බෙදාගත්තාය. එහි ප්‍රතිඵලයක් ලෙස, බොහෝ පුද්ගලයන් යේසුස්වහන්සේ මුණගැසීමට හා ශුභාරංචිය ඇසීමට පැමිණියහ. බයිබලය මෙසේ වාර්තා කරයි...

> **මා කළ සියල්ල උන්වහන්සේ මට කීසේකැයි සාක්ෂිදුන් ස්ත්‍රියගේ වචන නිසා ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. (යොහන් 4:39)**

කාන්තාව ඒ වන විට ස්වාමීන්වහන්සේ ගැන දැන සිටියේ සුළු ප්‍රමාණයක් නිසා ඇයගේ සාක්ෂිය කෙටි විය. "මා කළ සියල්ලම උන්වහන්සේ මට පැවසුවා"යි ඇය සරලව කීවාය. ඇය ස්වාමීන්වහන්සේ ගැන දැන සිටි දේ ඇයට යථාර්ථයක් විය. එය මූලික දැනීමක් වූ අතර දෙවියන්වහන්සේ ඇගේ වචන අපූර්ව ලෙස පාවිච්චි කළ සේක.

තමන්ගේම හදවත තුළ සත්‍යයක් නොවන නමුත් කෙනෙක් විසින් දේශනා කරනු ලබන තාක්ෂණිකව නිවැරදි පණිවුඩයක ඇතුළත් දේවල් වලට වඩා තමා කතා කරන දෙය පිළිබඳව පෞද්ගලිකව දන්නා නව ඇදහිලිවන්තයෙකු පැකිලෙමින් පවසන වචන වලට දෙවියන්වහන්සේ ආශිර්වාද කරනු ඇත.

ඔබ යේසුස්වහන්සේ දැනගත් ආකාරය හා උන්වහන්සේ ගැන ඔබ තේරුම් ගත් දේවල් පිළිබඳ කතාන්දරය බෙදා ගැනීම බලවත් ධර්ම ප්‍රචාරණ මාර්ගයකි. ඔබගේ සාක්ෂිය තුළින් යේසුස්වහන්සේ බයිබල් පිටු අතරින් ආගමෙන් හා සභාවෙන් පිටතට ගෙන, ජීවමාන හා අද දවසේදීත් ක්‍රියා කරන කෙනෙක් වශයෙන් පෙන්නුම් කරයි. මිනිසුන්ට බයිබලය හෝ ආගම ඉවත දැමිය හැකි නමුත් සැබෑ අත්දැකීමක ඇති යථාර්ථය ඔවුන්ට ප්‍රතික්ෂේප කළ නොහැකිය. අත්දැකීමක් සහිත පුද්ගලයෙක් කිසිදාක තර්කයක් ගෙන එන පුද්ගලයෙක් ඉදිරියේ අසරණ වන්නේ නැත !

ඔබගේ සාක්ෂිය පැවසීමේ අපහසුතාවයක් ඔබට තිබේ නම්, ඔබ අන් අය සමඟ එය බෙදා ගැනීමට පෙර එය ලියා අධ්‍යයනය කිරීම ඔබට උපකාරී වනු ඇත. ඔබගේ සාක්ෂිය සූදානම් කරන විට සිතා බැලිය යුතු ප්‍රශ්න කිහිපයක් පහත දැක්වේ :

-ඔබ දෙවියන්වහන්සේ ගැන සිතීමට පෙළඹවූයේ කුමක්ද?
-ඔබ යේසුස්වහන්සේ දැන ගත්තේ කෙසේද?
-උන්වහන්සේ දැන ගැනීමෙන් ඔබගේ ජීවිතයේ ඇති වූ වෙනස්කම් කවරේද?
-ඒ තුළින් ඔබගේ පවුලේ ඇති වූ වෙනස්කම් මොනවාද?
-ඔබේ ජීවිතය වෙනස් වී ඇත්තේ කෙසේද?
-සිදුවී ඇති ආශ්චර්යමත් දේවල් හා හාස්කම් මොනවාද?
(උදාහරණයක් ලෙස ඔබ සුවය ලබා හෝ මත්කුඩු හෝ මත්ද්‍රව්‍ය වලින් නිදහස් වී තිබේද?)

ඔබ ඔබේ සාක්ෂිය රචනා කිරීමෙන් පසුව, පළමුව එය කිතුනු මිතුරෙකු සමඟ බෙදා ගන්න. නොඇදහිලිවන්තයෙකු ස්වාමීන්වහන්සේ වෙත ගෙන ඒම සඳහා කළ හැකි වෙනස්කම් ගැන ඔවුන්ගෙන් විමසන්න. සටහන් පාවිච්චි නොකර ඔබට එය බෙදාගත හැකි වනතුරු ඔබේ සාක්ෂිය පුහුණු වන්න.

යම් කෙනෙකු සමඟ ගීතයක් බෙදා ගැනීම තුළින් ද පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කළ හැකිය. ගීතිකාකරු දාවිත් මෙසේ ලිවේය :

> **උන්වහන්සේ අලුත් ගීතිකාවක් එනම් අපේ දෙවියන්වහන්සේට ස්තුති ගීතිකාවක් මාගේ මුඛයෙහි තැබූසේක. බොහෝ දෙනෙක් ඒ දැක, භයව, ස්වාමීන් කෙරෙහි විශ්වාසකරන්නෝය.**
> **(ගීතාවලිය 40:3)**

මෙම පදයට අනුව දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන ගීතිකාවක් බොහෝ දෙනෙකුට ගැළවීම ගෙන දිය හැකි සාක්ෂියකි.

## කෙනෙකු ක්‍රිස්තුස්වහන්සේ වෙතට ගෙන එන ආකාරය

සෑම ආකාරයේම පෞද්ගලික ධර්ම ප්‍රචාරණයකම ඉලක්කය මිනිසුන් හා කාන්තාවන්, පිරිමි ළමුන් හා ගැහැණු ළමුන් තම පව්වලට සමාව ලබාගෙන යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු වශයෙන් පිළිගැනීමයි. අවුරුදු ගණනාවක් තිස්සේ කෙනෙකු යේසුස්වහන්සේ වෙතට ගෙන ආ හැකි ආකාරයන්

රැසක් සංවර්ධනය කර තිබේ. ඒවා තුළ විවිධ කරුණු සංඛ්‍යාවක් හා ශුභාරංචිය බෙදා ගැනීමේ විවිධ ක්‍රම පාවිච්චි කර තිබේ.

එවැනි සැළසුම් උපකාරී විය හැකි නමුත්, සෑම අවස්ථාවකටම සරිලන එක් පෞද්ගලික ධර්ම ප්‍රචාරණ ක්‍රමවේදයක් නොමැතිය. ඔබට මුණගැසෙන හැම පුද්ගලයෙකුටම විවිධ අවශ්‍යතා හා ගැටලු ඇති වෙනස් පුද්ගලයෝ වෙති. මෙම වෙනස්කම් නිසා කටපාඩම් කරන ලද කරුණු වලට වඩා විවිධාකාර ක්‍රම අවශ්‍ය වේ. මිනිසුන් ගැළවීමට ගෙන එන්නේ ශුද්ධාත්මයාණන්වහන්සේ වන බැවින්, ඔබ උන්වහන්සේගේ මඟපෙන්වීමට සංවේදී විය යුතුය. උන්වහන්සේ මනුෂ්‍යයන්ගේ හදවත් විමසන බැවින් ඔබ කතා කරන පුද්ගලයා කුමන ආකාරයේ කෙනෙක්දැයි උන්වහන්සේ දන්නා සේක.

කෙසේ වෙතත්, ගැළවීම නොලත් සෑම පුද්ගලයෙකුටම පොදුවේ ඇති එකම දෙය නම්, පාපය හා ගැළවුම්කරුවකු උදෙසා වූ අවශ්‍යතාවයයි. මේ හේතුවෙන් ශුද්ධාත්මයාණන්වහන්සේ කුමන ආකාරයකින් ශුභාරංචිය බෙදාගැනීමකට ඔබ ගෙන ගියත්, ඔබගේ සාක්ෂිය සෑම විටම එම පුද්ගලයා ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන ඒම කෙරෙහි කේන්ද්‍රගත විය යුතුය.

මෙය ඉටු කර ගැනීම සඳහා, ඔබගේ පෞද්ගලික සාක්ෂිය ඉදිරිපත් කිරීමේදී පහත දේවල් ඒ තුළ අඩංගු විය යුතුය :

## ඉදිරිපත් කිරීම : මූලික ශුභාරංචි පණිවුඩය :

ධර්ම ප්‍රචාරණයේ පණිවුඩය පිළිබඳව සාකච්ඡා කරන මෙම අත්පොතේ තුන් වන පරිච්ඡේදය නැවත සලකා බලන්න. පාවුල් විසින් 1 කොරින්ති 15:1-4 හි ශුභාරංචියේ මූලිකාංග දක්වා තිබේ. ඔබගේ බයිබලයෙන් මෙම කොටස නැවත කියවන්න. මූලික පණිවුඩය නම් සෑම මනුෂ්‍යයෙක්ම පව් කර ඇති බවත්, යේසුස්වහන්සේ පාපය උදෙසා මළ බවත්, උන්වහන්සේ භූමදාන කරනු ලැබ, දේව වචනයට අනුව නැවත නැඟිටුණු බවත්ය.

ශුභාරංචිය ඉදිරිපත් කිරීමේදී උපකාරී වන බයිබල් පද කිහිපයක් පහත දැක්වේ :

- දෙවියන්වහන්සේ ශුද්ධ දෙවි කෙනෙකි :
  1 පේත්‍රුස් 1:16; හබක්කුක් 1:13
- උන්වහන්සේ ශුද්ධ බැවින්, පාපය මිනිසාව දෙවියන්වහන්සේගෙන් වෙන් කරයි :
  යෙසායා 59:2
- පාපය විශ්වීය වේ; සියලු දෙනාම පව් කර තිබේ :
  රෝම 3:10-12,23
- පාපය සඳහා දඬුවම මරණයයි :
  එසකියෙල් 18:20; රෝම 6:23; ගීතාවලිය 9:17
- කිසිවෙකු විනාශ වීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවේ :
  1 පේත්‍රුස් 3:9; යොහන් 3:16; රෝම 5:8
- සියලු මනුෂ්‍යයන්ට ගැළවීම ලබාදීම සඳහා දෙවියන්වහන්සේ සියල්ලටම ප්‍රමාණවත් පූජාවක් කළ සේක :
  හෙබ්‍රෙව් 10:10; යොහන් 1:29; ගලාති 2:20
- යේසුස්වහන්සේ කුරුසිය මත මරණයට පත්වීමේදී සියලු මනුෂ්‍යයන්ගේ පාපය උදෙසා වූ දඬුවම දරාගත් සේක :
  1 පේත්‍රුස් 2:24; යෙසායා 53:6,10
- ගැළවීම විශ්වයේ සියලු දෙනා උදෙසාය :
  1 තිමෝති 2:4
- පසුතැවිලි වීම සඳහා වූ ආඥාව විශ්වීය වේ :
  ක්‍රියා 17:30
- අදහාගැනීම සඳහා වූ ආරාධනාව විශ්වීය වේ.
  රෝම 10:9-11
- පාපය උදෙසා වූ පූජාවේ ප්‍රතිලාභ ලබා ගැනීමට නම් පව්කාරයා පසුතැවිලි වී යේසුස්වහන්සේ පිළිගත යුතුය :
  යොහන් 1:12; 5:24

## අවසානය : ආරාධනාව හා ප්‍රතිචාරය :

ව්‍යාපාරික ලෝකයේදී “අවසානය” යන වචනය ඉතා වැදගත් වේ. “අවසානය” යන්නෙහි අර්ථය බලාපොරොත්තුවෙන් සිටින ගැණුම්කරුවෙකුගේ ධනාත්මක ප්‍රතිචාරයකින් ගණුදෙනුවක් අවසන් කිරීමයි. පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී ද අවසානය යන්න වැදගත් වචනයක් වේ. කෙනෙකු යේසුස්වහන්සේ පිළිගැනීම දක්වා ගෙන ඒම පමණක් ඔහුව නිරයෙන් ගලවා ගැනීමට ප්‍රමාණවත් නොවේ. ව්‍යාපාරික කටයුතු වලදී මෙන්ම, බොහෝ විට පසුව තීරණයක් ගන්නා තුරු අවසානය ප්‍රමාද කිරීම සෘණාත්මක ප්‍රතිඵල ගෙන දේ.

ව්‍යාපාරික ලෝකයේ නායකයන් උගන්වන ආකාරයට අවසානය ආරම්භ වන්නේ ඔවුන් තමා බලාපොරොත්තු වන ගැණුම්කරු සමඟ විකුණුම් ශිල්ප ක්‍රම පටන් ගන්නා මොහොතේදීමය. ඉදිරිපත් කිරීම අතරතුරදී ඔවුන් එම පුද්ගලයා තමා සමඟ සුළු එකඟවීම් වෙත ගෙන එයි. මෙය තම නිෂ්පාදනය පිළිගැනීම පිළිබඳ අවසන් එකඟතාව වෙත ගෙන යයි.

මෙම ප්‍රවේශය ධර්ම ප්‍රචාරණය සඳහා ආත්මිකව අදාළ කරගත හැකිය. ඔබ ශුභාරංචිය බෙදා ගන්නා විට, ගැළවීම නොලත් පුද්ගලයාව, සුළු එකඟවීම් වෙත ගෙන එන්න. පහත සඳහන් ආකාරයේ ප්‍රශ්න ඇසීම මඟින් මෙය සිදු කළ හැකිය :

- ඔබ සිතන්නේ කුමක්ද?
- ඔබ කවදා හෝ ---- ගැන සිතා තිබේද?
- මිනිසුන්ට ----- ලෙස හැගෙනවා යැයි ඔබ සිතනවාද?
- එය අසාමාන්‍ය බව ඔබ සිතනවාද?
- ඔබට කවදා හෝ එවැන්නක් සිදු වී තිබෙනවාද?
- ඔබට එම ප්‍රශ්නය තිබී තිබෙනවාද?

එම පුද්ගලයාව සාකච්ඡාවට සහභාගී කරවා ගන්න. තොරතුරු ස්වල්පයක් පවසා ප්‍රතිචාරයක් සඳහා කැඳවීමක් දෙන ප්‍රශ්නයක් අසන්න. යොහන් 4 දී ළිඳ ළඟ සිටි කාන්තාව සමඟ සහ යොහන් 3 දී නිකදෙමුස් සමඟ කළ කතා බහේදී යේසුස්වහන්සේ මෙම ක්‍රමවේදය පාවිච්චි කළ සේක.

ඔබ ඔබේ ඉදිරිපත් කිරීම අවසන් කරන විට, ශුභාරංචිය සඳහා අවසන් ධනාත්මක ප්‍රතිචාරයකින් අවසන් කිරීම සඳහා ඔවුන්ගේම ප්‍රතිචාර මත පදනම් වන්න. ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලබා නොදී ශුභාරංචිය බෙදාගැනීම සාක්ෂි දැරීමක් වන නමුත්, ධර්ම ප්‍රචාරණයක් නොවේ. අප කැඳවා ඇත්තේ සාක්ෂි දැරීමට පමණක් නොව දිනා ගැනීමටය.

කුමන හෝ ආකාරයකින් ප්‍රශ්න දෙකක් ඇසීමෙන් ශුභාරංචිය පිළිබඳ ඔබේ ඉදිරිපත් කිරීම අවසන් කරන්න :

1. “මා මෙතෙක් පැවසූ දේ ඔබට වැටහුනාද?” මේ මඟින් ඔබ අවසන් ප්‍රතිචාරයට කැඳවීමක් දීමට පෙර ප්‍රශ්න හා විරෝධතා ඇත්නම් ඒවා පැහැදිලි කරගැනීමට සහ ඔවුන්ට තේරුම් ගිය බව සැකහැර දැන ගැනීමට අවස්ථාව සැළසේ.

2. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබගේ ස්වාමියා හා ගැළවුම්කරු බවට පත්කර ගැනීමට ඔබ කැමතිද?” පාප වලට සමාව ඉල්ලීමට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීමට එම පුද්ගලයාට යාච්ඤාවෙන් මඟපෙන්වන්න.

පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී ඔබ නිෂ්පාදනයක් විකිණීම හෝ සභාවක් හෝ නිකායක් ප්‍රසිද්ධ කිරීමට වඩා වැඩි යමක් කරන බව සැමවිටම මතක තබා ගන්න. ඔබ ගණුදෙනු කරනුයේ ආත්මවල සදාකාලික ඉරණම සමඟය. මතෙව් 22:2-5 මංගල්‍ය භෝජනයක් පිළිබඳ තම උපමාවේදී යේසුස්වහන්සේ දැක්වූ පරිදි දේව රාජ්‍යයට ඇතුළු වීම විවාහ මංගල්‍යයකට ආරාධනයක් පිළිගැනීම හා සමාන වේ. ඇතුළු විය හැක්කේ ආරාධනාවට යහපත් ප්‍රතිචාර දක්වන අයට පමණි. “මම පැමිණීමට සැළසුම් කර තිබුණා”යි පැවසීම ප්‍රමාණවත් නොවේ.

“මා අනුව වරෙල්ලා, මම නුඹලා මසුන් අල්ලන්නන් නොව, මනුෂ්‍යයන් අල්ලන්නන් කරන්නෙමි”යි යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූ විට (මතෙව් 4:19), උන්වහන්සේ ආත්මික සත්‍යයක් පිළිබඳ ස්වාභාවික උදාහරණයක් දුන් සේක. කිසිඳු මසුන් මරන්නෙක් තම ඇම හෝ දැල විසිකර බලා සිටින්නේ නැත. මසුන් අල්ලා ගැනීම සඳහා ඔහු එය නැවත ඇදිය යුතුය.

## ගොඩනැගීම : ගෝලත්වය :

මතෙව් 28:19-20 හි සඳහන් මහ ආඥාවේදී, දෙයාකාරයක ඉගැන්වීම් වාර්තා කර තිබේ. පළමු වර්ගය නම් මිනිසුන් ගැළවීම වෙත ගෙන ඒම සඳහා ශුභාරංචිය බෙදා ගැනීමයි. දෙවන වර්ගය නම් ස්වාමින්වහන්සේ පිළිගැනීමෙන් අනතුරුව වන ඇදහිලිවන්තයන්ට ඉගැන්වීමයි. ගෝලත්වයෙන් (ගොඩනැඟීමේ ඉගැන්වීම) තොරව ධර්ම ප්‍රචාරණය (පළමු ආකාරයේ ඉගැන්වීම) සම්පූර්ණ නොවේ.

සෑම නව ඇදහිලිවන්තයෙක් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගැනීමෙන් අනතුරුව ඔවුන්ට ගොඩනැඟීමේ ඉගැන්වීමක් ලැබිය යුතුය. ගැළවීමෙන් අනතුරුව කරන ඉගැන්වීම් තුළ ගැළවීම පිළිබඳ සහතිකයක්, ප්‍රසිද්ධියේ ක්‍රිස්තුස්වහන්සේ ගැන කියා සිටීම, වතුර බව්තීස්මය ලැබීම, ශුද්ධාත්ම බව්තීස්මය ලැබීම, මෙනෙහි කිරීමේ කාලයේ වර්ධනය හා ප්‍රාදේශීය සභාවක කොටසක් බවට පත්වීම යන කරුණු අන්තර්ගත වේ. “තීරණද? ගෝලයන්ද?” යනුවෙන් නම් කර ඇති දහතුන්වන පරිච්ඡේදයේදී ගොඩනැඟීමේ ඉගැන්වීම් ගැන ඔබ තවත් දේ ඉගෙන ගනු ඇත.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. පෞද්ගලික ධර්ම ප්‍රචාරණය නිර්වචනය කරන්න.

3. පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කළ හැකි ආකාරයන් තුනක් ලියා දක්වන්න.

4. කෙනෙකුව ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන එන ආකාරය පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. බොහෝ ගැළවීම නොලත් පුද්ගලයන් ජීවත් වන්නේ සාම්ප්‍රදායික ධර්ම ප්‍රචාරණ ප්‍රවේශයන්ට වැසුණු දේශයක් තුළ වේ. විදේශ මිෂනාරිවරුන්ට වීසා බලපත්‍ර ලබා නොදෙන අතර ශුභාරංචිය පිළිබඳ විවෘත ප්‍රකාශ කිරීමක් සිදුවන රැස්වීම් හෝ ඒ හා සමාන වෙනත් අවස්ථා පැවැත්විය නොහැකිය.

   මෙවැනි රටවල් වලදී, පෞද්ගලික ධර්ම ප්‍රචාරණය ඉතාම වැදගත්වේ. "කූඩාරම් තැනීම" ලෙස හැඳින්වෙන්නේ මෙවැනි රටවල් තුළ ඇදහිලිවන්තයන් ධර්ම ප්‍රචාරණය කරන ආකාරයකි. අපෝස්තුළුවර පාවුල් තුමා තම වෘත්තිය වූ කූඩාරම් තැනීම තුළින් තම අවශ්‍යතා සම්පූර්ණ කරගැනීමට කටයුතු කළේ කෙසේදැයි ඔබ දැනටමත් ඉගෙන ගෙන ඇත.

   සාම්ප්‍රදායික ධර්ම ප්‍රචාරණය සඳහා වැසුණු දේශයන් තුළට ඇදහිලිවන්තයන් රැකියා සඳහා වීසා ලබාගෙන එම රට වලට ඇතුළු වී, තම අවශ්‍යතා සපුරා ගැනීමට රැකියාවන් කරමින්, තමා අවට සිටින අයට පෞද්ගලිකව ධර්ම ප්‍රචාරණය සිදු කරයි. මෙම ඇදහිලිවන්තයන් ලෞකික රැකියාවන් වල නිරත වන නමුත්, ඔවුන්ගේ ප්‍රධාන කාර්යය පෞද්ගලික ධර්ම ප්‍රචාරණයයි. ශුභාරංචිය බෙදා ගැනීමේ මෙම සංකල්පය "කූඩාරම් තැනීම" ලෙස හඳුන්වයි.

2. ඔබ පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කරන විට, ගැළවීම නොලත් පුද්ගලයෙකුට තේරුම් ගත නොහැකි විය හැකි ආකාරයේ ආගමික පද හෝ වාක්‍ය ගැන සැළකිලිමත් වන්න. "ගැළවීම ලැබීම, නැවත ඉපදීම, ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීම, ක්‍රිස්තියානි, හාලේලූයා" වැනි වචන ඒ තුළ අන්තර්ගත විය හැකිය. මෙම වචන බොහොමයක් ඔබට හුරු වුවත් ගැළවීම නොලත් කෙනෙකුට ඒවා නොවැටහේ.

3. පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී, දරුවන් සමඟ ශුභාරංචිය බෙදා ගැනීමට මැලි නොවන්න. ශුභාරංචියේ මූලික කොටස් සරලව ඉදිරිපත් කරන්න. ඔවුන්ට ඒවා තේරුම්ගත හැකි නම්, ප්‍රතිචාරයක් සඳහා කැඳවීමක් දී ඔවුන් යේසුස්වහන්සේ වෙතට ගෙන යන්න.

4. ඔබට සාමාන්‍ය කතාබහක් ශුභාරංචිය බෙදා ගැනීමේ අවස්ථාවකට හරවා ගත හැකිය. යෝජනා කිහිපයක් පහත දැක්වේ :

කෙනෙකු මෙසේ පැවසූ විට : "වේලාව කීයද කියන්න පුළුවන්ද?"

පිළිතුර : "මගේ ඔරලෝසුවට අනුවද? බයිබලයට අනුවද?"

කතාබහ ඉදිරියට ගෙනයාමට : ඔවුන්ට නියම වේලාව පවසන්න, නමුත් බයිබලය තුළද කාලය ගැන සඳහන් වන බව බෙදා ගන්න. ස්වාමින්වහන්සේ නොදන්නා සියලු දෙනාටම පසුතැවිලි වී උන්වහන්සේ වෙත පැමිණීමට කාලය මෙය බව එහි සඳහන් වේ.

⁂

කෙනෙකු මෙසේ ඇසූ විට : "මොනවද ආරංචි?"

පිළිතුර : "ඔබ ඇසීමට කැමති මොන ආකාරයේ ආරංචිද? ශුභාරංචිද? අසුභ ආරංචිද?"

කතා බහ ඉදිරියට ගෙන යාමට : බොහෝ විට ඔවුන් ප්‍රතිචාරය "යහපත් ආරංචි" යනුවෙන් විය යුතුය. එම නිසා ශුභාරංචිය බෙදා ගන්න.

⁂

කෙනෙකු වැරදීමකින් ඔබේ ඇඟේ හැපී මෙසේ පවසූ විට : "මට සමාවන්න."

පිළිතුර : "එයට කමක් නෑ. අත්වැරදීම් සිදුවෙනවා එසේ නැත්නම් එහෙම නොවෙන්නත් පුළුවන්."

කතාබහ ඉදිරියට ගෙනයාමට : "ඇතැම්විට මෙය සිදුවුණේ මට ඔබ සමඟ යම් විශේෂිත දෙයක් පැවසීමට අවස්ථාව සළසා දීමට විය හැකිය."

⁂

අයකැමියෙක් ඔබට වැඩිපුර මුදල් දුන් විටක එය ආපසු දෙමින් මෙස් පවසන්න. "ඔබ මට වැඩිපුර මුදල් දුන්නේය."

කතාබහ ඉදිරියට කරගෙන යාමට : "මගේ ජීවිතයේ එක්තරා කාලයකදී නම් මම එය ඔබට නොදී තබා ගන්නවා. නමුත් මම කිතුනුවෙකු වූ පසු දේවල් වෙනස් විය." ඉන් අනතුරුව ශුභාරංචිය ඔබේ ජීවිතයට බලපෑම් කර ඇති ආකාරය බෙදා ගන්න.

⁘

ගබඩා භාරකරුවෙකු මෙසේ ඇසූ විට : "මා ඔබට උදව් කරන්නද?"

පිළිතුර : "ඔව්, ඔබ අවසර දෙනවානම් මමත් ඔබට උදව් කරන්නම්."

කතාබහ ඉදිරියට කරගෙන යාමට : "ඔබ මට උදව් කරන්නේ කෙසේද?" යි ඇය අසනු ඇත. ඇයට පවසන්න. !

⁘

කෙනෙකු දුම්වැටියක් දල්වන්නට ගින්දර ඉල්ලූ විට, මෙසේ පවසන්න. "පිපිරීමෙන් පසුව මම ඒවා පාවිච්චි කරන්නේ නෑ."

කතාබහ ඉදිරියට කරගෙන යාමට : "මොන පිපිරීමද?"යි එම පුද්ගලයා විසින් අසනු ඇති බවට කිසිම සැකයක් නොමැත. "මම කිතුනුවෙකු වූ විට මගේ ජීවිතයේ ඇති වූ පිපිරීම"යි පිළිතුරු දෙන්න.

⁘

ඔබ දුරකථනයෙන් කතාකරන විට කෙනෙකු මෙසේ පැවසූ විට : "සමාවන්න. වැරදි අංකයක්"

පිළිතුර : "නෑ. ඔබ ඇත්තෙන්ම අමතා ඇත්තේ නිවැරදි අංකය."

කතාබහ ඉදිරියට කරගෙන යාමට : "ඔබ ඉන් අදහස් කළේ කුමක්ද?"යි ඔවුන් අසනු ඇත. ඇතැම් විට මෙය ඔවුන්ගේ ජීවිත හා ඉරණම වෙනස් කරන ආකාරයේ දෙයක් ඇසීමේ අවස්ථාව ඔවුන්ට සැළසීම සඳහා සිදු වූ දෙයක් විය හැකි බව පවසන්න.

⁘

දෛනික ජීවිතයේ සිදු වන ශුභාරංචි බෙදා ගැනීමේ අවස්ථාවන් බවට හරවා ගත හැකි වෙනත් අවස්ථා ගැන ඔබට සිතිය හැකිද? මේ ගැන සිතා බලා ඔබේම ප්‍රතිචාර කිහිපයක් සූදානම් කරගෙන, ඒවා පාවිච්චි කිරීමට සූදානමින් සිටින්න.

කිසිම එක් ප්‍රවේශයක් සෑම අවස්ථාවකටම සුදුසු නොවන බව මතක තබා ගන්න. ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීමට විවෘත වන්න. උන්වහන්සේගේ ප්‍රවේශය සැමවිටම නිවැරදිය.

6. පහත කරුණු සළකා බැලූ විට ඔබ පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේ වැදගත්කම වටහා ගනු ඇත.

- සාමූහික ධර්ම ප්‍රචාරණය වැදගත් වන නමුත්, බොහෝ මිනිසුන් එවැන්ජලිස්තවරයෙකුට සවන් දීමට නොපැමිණෙනු ඇත. ප්‍රමාණවත් තරම් එවැන්ජලිස්තවරු නොමැති අතර, රජයේ නිති රීති නිසා බොහෝ රටවල් වල මේ සඳහා අවස්ථාවද නොමැත.

- ගුවන් විදුලිය තුළින් ධර්ම ප්‍රචාරණය වැදගත්ය, නමුත් ලෝකයේ මිනිසුන්ගෙන් බහුතරයකට ගුවන් විදුලියක් නොමැත. කිතුනු විරෝධී ආණ්ඩු බලයේ සිටින විට ඔවුන් මෙයට බාධා කරයි.

- රූපවාහිනිය තුළින් ධර්ම ප්‍රචාරණය වැදගත්ය. නමුත් ලෝකයේ මිනිසුන්ගෙන් බහුතරයකට රූපවාහිනියක් නොමැත. කිතුනු විරෝධී ආණ්ඩු බලයේ සිටින විට ඔවුන් මෙයට ද බාධා කරයි.

- මුද්‍රිත මාධ්‍යයෙන් කරන ධර්ම ප්‍රචාරණයටද ස්ථානයක් තිබේ. නමුත් බොහෝ අයට කියවීමට නොහැකිය, ප්‍රමාණවත් තරම් පත්‍රිකා ද නොමැති අතර ඇතැම් රටවල් තුළට අපට කිතුනු ලියවිලි ගෙන යා නොහැකිය.

- සභා ගොඩනැඟිලි කේන්ද්‍ර කරගත් ධර්ම ප්‍රචාරණයටද ස්ථානයක් තිබේ, නමුත් බොහෝ අයට සභා ගොඩනැඟිල්ලක් නොමැත. මෙම ප්‍රවේශය තුළින් ලෝකයටම ශුභාරංචිය ගෙන යාමට ප්‍රමාණවත් තරම් කාලය හෝ මුදල් නොමැත. බොහෝ රටවල් තුළ සභා ගොඩනැඟිලි තහනම් වේ.

ධර්ම ප්‍රචාරණයට ඇති අනෙකුත් සියලුම ක්‍රමවේදයන් එකතු වුවද, පෞද්ගලික ධර්ම ප්‍රචාරණයෙන් තොරව ලෝකයටම ශුභාරංචිය ගෙන ගිය නොහැක.

7. යේසුස්වහන්සේ විසින් සිදු කළ පෞද්ගලික ධර්ම ප්‍රචාරණයන් අධ්‍යයනය කරන්න.

- ඇන්ඩෲ, යොහන් සහ පේත්‍රුස් : යොහන් 1:35-42
- පිලිප් සහ නතානියෙල් : යොහන් 1:43-51
- නිකදෙමුස් : යොහන් 3
- සමාරිය ස්ත්‍රිය : යොහන් 4
- රාජ්‍ය සේවකයා : යොහන් 4:46-54
- සීමොන්, ඇන්ඩෲ, යොහන් සහ යාකොබ් කැඳවීම : ලූක් 5:1-11
- කුෂ්ඨරෝගියා : මාර්ක් 1:40-45
- මිතුරන් විසින් ගෙනෙනු ලැබූ අංශභාග රෝගියා : මාර්ක් 2:1-12
- මතෙව් කැඳවීම : මාර්ක් 2:13-17
- බෙත්සයිදාවේ කොර මිනිසා : යොහන් 5
- වියළි අතක් ඇති මිනිසා : ලූක් 6:6-11
- ශතාධිපතියා : ලූක් 7:1-10
- නායින් නුවර වැන්දඹුව : ලූක් 7:11-17
- සීමොන්ගේ නිවසේ සිටි පව්කාර ස්ත්‍රිය : ලූක් 7:36-50
- ගදරීනයේ යක්ෂාවේශ වූ පුද්ගලයා : මාර්ක් 5:1-20
- යායිරස් හා ඔහුගේ පවුල : මාර්ක් 5:21-43
- මහලේ රෝගී කාන්තාව : මාර්ක් 5:25-34
- අන්ධ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-31
- යක්ෂාවේශ ගොළුවා මතෙව් 9:32-34
- අන්‍යජාතික කාන්තාව : මතෙව් 15:21-28
- ගොළු සහ බිහිරි මිනිසා : මාර්ක් 7:32-37
- බෙත්සයිදාව අසල සිටි අන්ධ මිනිසා : මාර්ක් 8:22-26
- යක්ෂාවේශ වූ තරුණයා : මාර්ක් 9:14-29
- අනාචාරයේ යෙදෙමින් සිටියදී හමු වූ කාන්තාව : යොහන් 8:1-11
- ගෝලයන් වීමට බලා සිටි තිදෙනා : ලූක් 9:51-62
- නීතිවේදියා : ලූක් 10:25-37
- උපතින්ම අන්ධ මිනිසා : යොහන් 9
- කුදු ස්ත්‍රිය : ලූක් 13:10-21
- පොහොසත් තරුණයා : මතෙව් 19:16-22
- යෙරිකෝව ළඟ සිටි අන්ධ මිනිසා : මාර්ක් 10:46-52
- සාකෙවුස් : ලූක් 10:1-10
- යූදස් ඉස්කාරියොත් : ලූක් 22; යොහන් 13; මතෙව් 27.
- පිලාත් : යොහන් 18-19; ලූක් 23
- හෙරෝද් : ලූක් 23; මාර්ක් 15
- සොරුන් දෙදෙනා : ලූක් 23:32-43

8. ක්‍රියා පොතෙහි සඳහන් පෞද්ගලික ධර්ම ප්‍රචාරණයන් අධ්‍යයනය කරන්න :

- පේත්‍රුස් හා යොහන් කොර මිනිසාට 3:1-11
- පිලිප් මායාකාර සීමොන්ට 8:9-24
- පිලිප් එතියෝපිය නපුංසකයාට 8:26-40
- අනනියස් හා තාර්සිස් හි සාවුල් 9:10-20
- පේත්‍රුස්, අයිනෙයස් හා දෝර්කස්ට : 9:32-42
- පේත්‍රුස් කොරනේලියස්ට : 10:1-11,18
- පාවුල් එලිමස්ට : 13:6-12
- බාර්ණබස් හා සාවුල් සර්ගියස් පාවුලස්ට : 13:7-12
- පාවුල් හා සීලස් ලිදියා සමඟ : 16:12-15

- පාවුල් හා සීලස් පිලිප්පියේ සිරගෙදර මුලාදෑනියාට : 16:23-40
- පාවුල් එපිසියේදී ගෙයින් ගෙට ගොස් ධර්ම ප්‍රචාරණය: 20:17-35
- පාවුල් ෆිලික්ස් හා දෘසිල්ලා සමඟ : 24:24-27
- පාවුල් අග්‍රිපා හි රජු සමඟ : 26 පරිච්ඡේදය
- පාවුල් පබ්ලියස් හා ඔහුගේ පියාට : 28:7-11
- පාවුල් රෝමයේ තම නිවසේදීම : 28:16-31

# දහ වන පරිච්ඡේදය

## ක්‍රමවේද : අපහසුතාවයන්ට මුහුණ දීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මිනිසුන් නිදහසට කරුණු ඉදිරිපත් කරන්නේ ඇයි දැයි පැහැදිලි කිරීමට
- පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී පැන නඟින පොදු අපහසුතාවයන් සමඟ ගණුදෙනු කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලිකවූ බලය හා දෙව්කම මවනලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනියන්නේය; එබැවින් ඔව්හු නිරුත්තරව සිටිති. (රෝම 1:20)**

### හැඳින්වීම

ධර්ම ප්‍රචාරණයේදී ඔබට මුහුණ දීමට සිදුවන අසිරු අවස්ථාවන්ට මුහුණ දීමට අවශ්‍ය උපදෙස් මෙම පරිච්ඡේදයේ සඳහන් වේ. ඔබට ඇතිවිය හැකි සෑම අපහසුතාවයක්ම ආවරණය කිරීම කළ හැක්කක් නොවේ, නමුත් අප ඉතාම පොදු ගැටලු වෙත අවධානය යොමු කර ඇත්තෙමු.

මේවා, මීට පෙර ධර්ම ප්‍රචාරණ කටයුතු වල නිරත වූ අයගේ අත්දැකීම් මත පදනම් වන අපහසුතා සමඟ ගණුදෙනු කිරීම පිළිබඳ යෝජනා පමණක් වන බව මතක තබා ගන්න. සෑම කෙනෙක්ම අද්විතිය බැවින්, අසිරු අවස්ථාවලදී ඔබ ශුද්ධාත්මයාණන්ගේ බලය මත රැඳී සිටීම වැදගත් වේ.

### මිනිසුන් නිදහසට කරුණු ඉදිරිපත් කරන්නේ ඇයි දැයි තේරුම් ගැනීම

ධර්ම ප්‍රචාරණය කරන විට මිනිසුන් නිදහසට කරුණු ඉදිරිපත් කරන්නේ ඇයිද යන්න සහ විරෝධතා මතු කරන්නේ ඇයි ද යන්න ඔබ විසින් තේරුම් ගැනීම වැදගත්ය. ඇතැම් විට සාතන් කෙනෙකුගේ මනසට ප්‍රශ්න හෝ විරෝධතා ඇතුළු කරයි. ඔබ මිනිසුන්ගේ හා කාන්තාවන්ගේ ආත්ම උදෙසා ආත්මික සටනක යෙදෙන බව සෑමවිටම මතක තබා ගන්න.

ඇතැම් අය ඉදිරිපත් කරන විරෝධතා ඔවුන් තුළ ඇති වූ ඒවා නොවේ. ඒවා වෙනත් අය ඉදිරිපත් කරනු ඔවුන් අසා ඇති අතර ඔබව බාධා කිරීමට හෝ ඔබව වෙනත් මාතෘකාවක් වෙත යොමු කිරීමට ඒවා ඉදිරිපත් කරයි. අනෙක් අය ඉදිරිපත් කරනුයේ ඔවුන්ට ක්‍රිස්තුස්වහන්සේ ගැන තීරණයක් ගැනීමට සැබවින්ම බාධා කරන විරෝධතාවයන්ය. ඔවුන් ශුභාරංචිය පිළිගැනීමට පෙර මේවාට සාර්ථක ලෙස පිළිතුරු ලබා දිය යුතුය.

සෑම නිදහසට කරුණකටම හෝ විරෝධතාවයකටම දේව වචනයෙන් පිළිතුරු දිය හැකිය. කිසිදාක විරෝධතාවයක් නිසා ඔබට කේන්ති යාමට හෝ ඔබ විවාදයකට යොමු කිරීමට ඉඩ නොදෙන්න. එසේ සිදු වුවහොත් ඔබට ධර්ම ප්‍රචාරණය කිරීමේ අවස්ථාව සීමා වන අතරම නිදහසට කරුණු ගෙන ආවාවූ අරමුණ සාර්ථකව ඉටු වේ.

ශුභාරංචිය බෙදා ගැනීමේදී ඔබට ලැබිය හැකි විවිධ ප්‍රතිචාරයන් විස්තර කරන මාතෘකාවන්ගෙන් මෙම පාඩමේ ඉතිරිය සමන්විත වේ. ඔබ මේවා අධ්‍යයනය කරන විට නිදහසට කරුණු ගෙන ඒම පිළිබඳව දෙවියන්වහන්සේ පවසන්නේ මොනවාදැයි මතක තබා ගන්න.

**මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලිකවූ බලය හා දෙව්කම මවනලද දේවලින් තේරුම් ගොස් පැහැදිලිලෙස පෙනියන්නේය; එබැවින් ඔව්හු නිරුත්තරව සිටිති. (රෝම 1:20)**

## "මම සුදුස්සෙක් නොවෙමි"

හෝ

## "මම ඉතා දරුණු පව්කාරයෙක්"

දෙවියන්වහන්සේ වෙතට පැමිණීමට තමන් සුදුසු නොවන බව ඇතැම් මිනිසුන් සිතන අතර ඔවුන් වඩා යහපත් වන තුරු සිටී.

දෙවියන්වහන්සේට අවශ්‍ය වන්නේ ඇදහිල්ල මිස සදාචාරාත්මක සුදුසුකම නොවන බව ඔවුන්ට පෙන්වා දෙන්න. යේසුස්වහන්සේ මේ ලෝකයට පැමිණියේ පව්කාරයන් මිස ධර්මිෂ්ඨයන් ගළවා ගැනීමට නොවේ (මතෙව් 9:12-13; ලූක් 18:19). හදවත වෙනස් වී නැත්නම් පිටත වෙනස පමණක් ප්‍රමාණවත් නොවේ. පහත සඳහන් බයිබල් පද පාවිච්චි කරන්න. යෙසායා 1:18-19; ක්‍රියා 2:38; 1 තිමෝති 1:15; 1 යොහන් 1:7; යොහන් 6:37; එළිදරව් 22:17; රෝම 5:8,16,20.

## "කිතුනු ජීවිතය ඉතා අසීරුයි."

"ද්‍රෝහීන්ගේ මාර්ගය රළුය" (හිතෝපදේශ 13:15) යන්න ඔහුට පෙන්වා දෙන්න. තමන්ගේ වියගහ පහසු බවත් තම බර සැහැල්ලු බවත් යේසුස්වහන්සේ ඉගැන්වූ සේක (මතෙව් 11:28). පාපයේ සතුට කෙටි කලකට පමණක් වන අතර සැබෑ සහ සදාකාලික සතුට ලැබෙනුයේ ගැළවීම තුළිනි. (1 පේත්‍රුස් 1:5 හා යුද් 24).

## "මට මාගේ නපුරු මාර්ග අත්හැරිය නොහැක"

ඔහු සමඟ එකඟ වී ඒ සමඟ එකඟ වන රෝම 7 සාරාංශ කර බෙදා ගන්න. ඉන් අනතුරුව ඔහුගේ ගැටලුව "ඔහුට නොහැකි" විමට "ඔහු අකමැති" වීමද යන්න තීරණය කරන්න. ඔහු ඇදහිලිවන්තයකු බවට පත්වූ විට, ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් ඔහුට සියල්ල කළ හැකි බව පැහැදිලි කර දෙන්න (පිලිප්පි 4:13). පාපය වහල්කමක් වන බවත් ඉන් ගැළවීමට ඇති එකම මාර්ගය යේසුස්වහන්සේගේ රුධිරය තුළින් පමණක් වන බවත් විශේෂ කොට පවසන්න. (යොහන් 8:34; රෝම 7-8)

## "මගේ හදවත ඉතා දැඩියි"

එය වෙනස් කළ හැකිනම් ඔහුට එසේ කිරීම අවශ්‍ය දැයි අසන්න. ඉන් පසුව එසකියෙල් 36:26-27 හා යොහන් 6:37 බෙදා ගන්න.

### "නිරයේ මට සගයන් රැසක් සිටී"

මෙය සත්‍යයකි, නමුත් එළිදරව් 22:15 යොදාගනිමින් ඒ කවර ආකාරයේ ආශ්‍රයක් දැයි ඔහුට පෙන්වා දෙන්න. මිතුරන් හෝ ඥාතීන් සමඟ ඇති සම්බන්ධතා නිසා එළිදරව් 20:10 හි විස්තර කරන පීඩාව අඩු නොවන බව ඔහු සමඟ බෙදා ගන්න.

## "මම බයිබලය පිළිගන්නේ නැහැ"

හෝ

## "මට බයිබලය වැටහෙන්නේ නැහැ"

කිසිම කෙනෙකුට සියල්ලම සම්පූර්ණයෙන් නොවැටහෙන නමුත්, ගැළවීම සම්බන්ධයෙන් දෙවියන්වහන්සේට අවශ්‍ය ප්‍රතිචාරය පහසුවෙන් වටහා ගත හැකි බව පහදා දෙන්න. ඇදහිලිවන්තයකු

බවට පත් වන තුරු ඇතැම් දේවල් තේරුම් ගත නොහැකි බව වටහා දෙන්න. (1 කොරින්ති 2:14 බලන්න)

යොහන් 3:16, ක්‍රියා 16:31; 2:38; 3:19; රෝම 10:9-10; ක්‍රියා 22:16, සහ 6:1-4 තේරුම් ගැනීමට අපහසුදැයි බලන්න. මෙම පදයන්ද යොදාගන්න. යොහන් 7:17; 1 යොහන් 5:9-12; මාර්ක් 16:16; 2 තිමෝති 3:16-17.

## "බයිබලයේ පරස්පර විරෝධි තැන් රැසක් තිබෙනවා"

ඇතැම් විට අන් අය මෙම කරුණ ඉදිරිපත් කරනු ඇසි ඇති අතර ඔවුහු එයම නැවත පවසති. එක් පරස්පර විරෝධි තැනක් පවසන ලෙස ඔහුට කියන්න. සාමාන්‍යයෙන් කෙනෙකුට මෙය කළ නොහැක. ඔවුන් පරස්පර විරෝධි යැයි සිතන තැනක් ඔබට පැවසුවහොත් එය පැහැදිලි කර දෙන්න. ඔබ පිළිතුර නොදන්නවා නම්, එය සොයා ගන්න !

## "මට හැකි උපරිමය මා කරනවා"

හෝ

## "මම තවම සුදුස්සෙක් නොවෙමි"

සදාචාරාත්මක ප්‍රමිතින් හා යහපත් ක්‍රියා සම්බන්ධයෙන් බැලූ කළ මෙය සත්‍යයක් විය හැකිය. නමුත් අප ගැළවීම ලබන්නේ මේවා මත පදනම්ව නොවේ. පහත බයිබල් පද පාවිච්චි කරන්න. යෙසායා 64:6; එපිස 2:8-9; තිතස් 3:5; 1 යොහන් 1:7; ක්‍රියා 17:30; 22:16; පිලිප්පි 3: 4-7; රෝම 2:1; 14:13.

## "අන් අය මට බාධා කරනවා"

තමා ඇදහිලිවන්තයෙක් වූ විට මිතුරෙකු හෝ ඥාතියෙකු තමාට සිනාසෙනු ඇතැයි යන්න කෙනෙකු නිදහසට කරුණක් ලෙස ඉදිරිපත් කරනු ඇත. ලූක් 9:26; රෝම 14:12 හා ක්‍රියා 5:29 හි සඳහන් අනතුරු ඇඟවීම් කියවන්න. පීඩාව බලාපොරොත්තු විය යුතු බව ඔහුට පවසන්න (2 තිමෝති 2:12; 3:12; 2 කොරින්ති 4:16,18). එසේම තම ස්වාමිපුරුෂයා හෝ භාර්යාව වැනි තව කෙනෙක් ගැළවීම ලබන තුරු ඔවුන් බලා සිටින බවද පැවසිය හැකිය. මතෙව් 10:37 පාවිච්චි කරන්න. තමා කිතුනුවෙක් වීමෙන් පව්කාර මිතුරන් නැතිවීම ගැන ඔවුන් බිය විය හැකිය. යාකොබ් 4:4, ගීතාවලිය 1:1-2 හා හිතෝපදේශ 18:24 බෙදා ගන්න.

## "සභාව තුළ කෛරාටික මිනිසුන් ද සිටිති"

ඔහු සමඟ එකඟ වන්න. එය එසේ වන බව යේසුස්වහන්සේ පැවසූ සේක (මතෙව් 13:25,47). නමුත් මෙම කෛරාටිකයන් නිසා තමන්ගේ ආත්මය සඳහා ක්‍රිස්තුස්වහන්සේ කරන ලද ප්‍රකාශයන් සඳහා බලපෑමක් ඇති නොවේ. කිසිඳු නපුරු අයකු ස්වර්ගයේ නොසිටිනු ඇති බව ඔහුට පවසන්න (එළිදරව් 21:8). ඇතැම් විට අනෙක් ඇදහිලිවන්තයන් නිසා ඔහුගේ සිත රිදී තිබෙනු ඇත. අපගේ ඇදහිල්ල මිනිසා මත නොව දෙවිඳුන් මත රඳා පවතින බව 1 කොරින්ති 2:5 හි සඳහන් බව ඔහුට පවසන්න. විනිශ්චයේදී ඔහු වෙනුවෙන් පිළිතුරු දෙන්නේ ඔහුම මිස අන් අය නොවන බව ඔහුට මතක් කර දෙන්න. රෝම 2:1-5 හා එළිදරව් 20:12 බෙදාගන්න.

## "කුමන නිකායකට එකතු විය යුතු දැයි මට තීරණය කළ නොහැක"

හෝ

## "මම වෙනත් විශ්වාසයකට අයත් කෙනෙක්"

බයිබලය අණ කරනුයේ නිකායකට එකතු වීමට නොව නැවත ඉපදීම අත්දැකීම තුළින් එකම සැබෑ සභාවේ කොටසක් වීමට බව පෙන්වා දෙන්න. යේසුස්වහන්සේට කීකරුව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටසක් වීමට මිස නිකායකට එකතු වීමට කිසිවෙකුටත් ආරාධනා නොකරන්න (ක්‍රියා 2:47). ගැළවීම

ඇත්තේ යේසුස්වහන්සේ තුළ මිස සභාවක සාමාජිකයකු වීම තුළ නොවන බව ඔවුන්ට මතක් කර දෙන්න (ක්‍රියා 4:12).

## "මම ප්‍රමාද වැඩියි"

මෙම කරුණු බොහෝ විට තමා විශාල පව් කාරයෙක් ලෙස සළකන සහ/හෝ තම මුළු ජීවිතයම පාපයේ ගත කර දැන් වයස්ගතව සිටින කෙනෙක් විසින් ගෙන ආ හැකිය. කිසිවකු විනාශවීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවන බව (2 පේත්‍රැස් 3:9) සහ කුරුසියේ සිටි සොරා පවා තම ජීවිතයේ අවසන් මොහොතේදී ගැළවීම ලද බව (ලූක් 23:43) ඔහුට මතක් කර දෙන්න.

## "මට දැන් ක්‍රිස්තුස්වහන්සේ පිළිගැනිමට නොහැක"

ඔහුට පහත බයිබල් පද පවසන්න : යෙසායා 55:6; මතෙව් 24:44; ක්‍රියා 17:30; 22:16; 2 කොරින්ති 6:2; යෝෂුවා 24:15; 1 රාජාවලිය 18:21; හෙබ්‍රෙව් 2:3 යාකොබ් 4:13-14.

## "මගේ ප්‍රශ්න ඉතා අසීරුයි"

අසිරු ප්‍රශ්න සඳහා පිළිතුරු දෙවියන්වහන්සේය. 2 කොරින්ති 12:9-10; මතෙව් 19:26; පිලිප්පි 4:13 බෙදාගන්න.

## "මම සොයමින් සිටින නමුත් මට හමු වූයේ නැත"

තමා ස්වාමින්වහන්සේ සමඟ අත්දැකිමක් සොයමින් සිටින නමුත් තමාට එය හමු නොවූ බව ඇතමුන් පවසයි. පහත බයිබල් පද බෙදාගන්න : යෙරමියා 29:13; ලූක් 19:10; යොහන් 1:12.

## "දෙවියන්වහන්සේ දඬුවම් දීමට තරම් අයහපත් නැත"

රෝම 2:4-5; 2 පේත්‍රැස් 3:9-11; යොහන් 5:40; එසකියෙල් 33:11 බෙදා ගන්න.

## "මට කෙනෙකුට සමාව දිය නොහැක"

තමාට වරදක් කළ කෙනෙකුට සමාව දීමට නොහැකිව සිටින නිසා තමාට ගැළවීම ලැබිය නොහැකි බව මිනිසුන් බොහෝ විට පවසයි. නැවත ප්‍රකෘතිමත් කරනු නොලැබූ මනසක් ඇති විට සමාව දීම කළ නොහැකිය. නමුත් කිතුනුවකු ලෙස එසේ කිරීමට දෙවියන්වහන්සේ උපකාර කරනු ඇත. මාර්ක් 11:25 හා යාකොබ් 4:6 බෙදා ගන්න.

## "මගේ ව්‍යාපාරය නිසා මට කළ නොහැකිය"

ඇදහිලිවන්තයෙකු වීම නිසා තම රැකියාව අතහැර පූර්ණ කාලීන සේවයට ඇතුළු විය යුතු යැයි සිතන නිසා බොහෝ මිනිසුන් මෙවැනි කරුණු ඉදිරිපත් කරයි. එය එසේ නොවන බව පැහැදිලි කර දෙන්න. ඔහුගේ ව්‍යාපාරය කුමක්දැයි අසන්න. ඔහුගේ රැකියාව කිතුනු ප්‍රතිපත්ති සමග එකඟ නොවේ නම්, එය අත්හැරීම අවශ්‍ය වේ. තම ආත්මය නැතිකර ගැනීමට වඩා එසේ කිරීම යහපත්ය. මාර්ක් 8:36 බෙදාගන්න.

## "මම වරක් උත්සාහ කර අසමත් වුණා"
හෝ
## "මම අසමත් වේ යැයි මට බයයි"

අසමත් විම ගැන සැළකීමට ඔහු තුළ වූ අවංක බව අගයන්න. නමුත් ඔහුට පාපයෙන් ජය ගැනීමට බලය දෙන බවට දෙවියන්වහන්සේ පොරොන්දු වූ බව පෙන්වා දෙන්න. රෝම 8:37; 1 කොරින්ති 10:13; 1 පේත්‍රැස් 1:5; 2 තිමෝති 1:12; සහ හෙබ්‍රෙව් 13:5 බෙදා ගන්න.

ඔවුන් අසමත් වීමට හේතුව සළකා බලන්න. දෙවියන්වහන්සේ විශ්වාස කරනු වෙනුවට ඔවුන් තමාගේ ශක්තියෙන් උත්සාහ කර බැලුවහුද? තම පාපය කියා දෙනවා වෙනුවට ඔවුන් ඒවා වසා ගත්තහුද? දේව වචනය අනුව යනවා වෙනුවට ලෝකයේ මාර්ග අනුව ගියහුද? ඔවුන් දිනපතා යාච්ඤා කර, බයිබලය කියවා සභාවට සහභාගි වුවාද?

බලාපොරොත්තුවක් ඇති කර ඔවුන් ධෛර්යමත් කරන්න. දෙවියන්වහන්සේගේ කරුණාවල් උදයෙන් උදය අලුත්ව තිබෙන බව හා නොනවතින බව ඔවුන්ට පවසන්න (විලාප ගී 3:21-24). 2 කොරින්ති 9:8; 12:9; 1 යොහන් 1:9; යුද් 24; 2 තිමෝති 1:12; 1 පේත්‍රුස් 1:5 බෙදාගන්න. ගැළවීම ගෙන එන්නේ උත්සාහ කිරීමෙන් නොව විශ්වාස කිරීමෙනි. යොහන් 1:12 සහ රෝම 4:3-5 බෙදා ගන්න.

## "මට සහතිකයක් නැහැ"

ඇතැම් විට ඔබ කෙනෙකුව ස්වාමීන්වහන්සේ වෙතට ගෙන ආ විට ඔවුන්ට ගැළවීම පිළිබඳ නිසැක බවක් නොපැවතිය හැක. දේව වචනය විශ්වාස කිරීම ප්‍රතික්ෂේප කිරීම පාපයක් බව ඔවුන්ට පවසන්න (රෝම 14:23). ගැළවීම පිළිබඳ සහතික කරන පහත බයිබල් පද බෙදා ගන්න : යොහන් 1:12; 3:16; 18,36; 5:24; ක්‍රියා 10:43; 13:39; එපීස 1:17-20; 2:8; යුද් 24; 2 තිමෝති 1:12; 1 පේත්‍රුස් 1:5,18-19; 1 යොහන් 1:7; 5:13; හෙබ්‍රෙව් 9:22-10:22; 2 කොරින්ති 5:17; රෝම 5:1,9; 3:25; 8:16.

## "සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කිරීම"

ලූක් 10:10-12 කියවන්න. ඔබ ධර්ම ප්‍රචාරය කරද්දි ශුභාරංචිය සම්පූර්ණයෙන්ම ප්‍රතික්ෂේප කරනු ලැබූ විට, එය පිළිගැනීමට සූදානම් වෙනත් පුද්ගලයෙක් හෝ ප්‍රදේශයක් වෙත ඔබ යා යුතුය.

# ස්වයං - පරීක්ෂණය

01. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

02. ධර්ම ප්‍රචාරණය හමුවේ මිනිසුන් නිදහසට කරුණු ඉදිරිපත් කරන්නේ ඇයි?

03. පෞද්ගලික ධර්ම ප්‍රචාරණයේදී ඇති වන මෙම පොදු අපහසුතා සමඟ ඔබ ගණුදෙනු කරන්නේ කෙසේද? ඔබගේ පිළිතුරු වෙනම කොලයක සටහන් කරන්න.

"මම සුදුස්සෙක් නොවෙමි"
"කිතුනු ජීවිතය ඉතා අසීරුයි"
"මට මාගේ නපුරු මාර්ග අත්හැරිය නොහැක"
"මගේ හදවත ඉතා දැඩියි"
"නිරයේ මට සගයන් රැසක් සිටී"
"මම බයිබලය පිළිගන්නේ නැහැ"
"බයිබලයේ පස්පර විරෝධි තැන් රැසක් තිබෙනවා"
"මට හැකි උපරිමය මා කරනවා"
"අන් අය මට බාධා කරනවා"
"සභාව තුළ කෛරාටික මිනිසුන්ද සිටිති"
"මම වෙනත් විශ්වාසයකට අයත් කෙනෙක්"
"මම ප්‍රමාද වැඩියි"
"මම දැන් ක්‍රිස්තුස්වහන්සේව පිළි ගැනිමට නොහැක"
"මගේ ප්‍රශ්න ඉතා අසීරුයි"
"මම සොයමින් සිටින නමුත් මට හමුවූයේ නැත"
"දෙවියන්වහන්සේ මට දඬුවම් දීමට තරම් අයහපත් නැත"
"මට කෙනෙකුට සමාව දිය නොහැක"
"මගේ ව්‍යාපාරය නිසා එය කළ නොහැක"
"මම වරක් උත්සාහ කර අසමත් වුණා"
"මට සහතිකයක් නැහැ"

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

ධර්ම ප්‍රචාරණයේදී මතුවන අපහසුතාවයන්ට මුහුණ දෙන විට ඔබ මතක තබා ගත යුතු කරුණු කිහිපයක් පහත දැක්වේ :

1. මිනිසුන්ගේ හා ස්ත්‍රීන්ගේ ආත්ම උදෙසා වූ ආත්මික සටනක ඔබ නියැළෙන බව මතක තබා ගන්න. විවාදය හා කෝපය නමැති ලෞකික අවියන්ගෙන් ආත්මික සටනේදී සටන් නොකරන්න.

2. විරෝධතාවයක් නොවැදගත් ලෙස සළකා පහ නොකරන්න. එය එම පුද්ගලයාට ඉතා වැදගත් විය හැකිය.

3. නිදහසට කරුණක් ඉදිරිපත් කළ විට ඒ සඳහා වැඩිපුර වේලාව ගත නොකරන්න. ඉක්මනින්, මෘදුව හා බලපෑමක් වන අයුරින් එය පහදා දී ක්‍රිස්තුස්වහන්සේ වෙත ඔවුන්ගේ කැපවීම පිළිබඳ ප්‍රධාන කරුණට නැවත යොමුවන්න.

4. විවාද නොකරන්න.

5. කේන්ති නොගන්න.

6. ආචාරශීලි හා උපායශීලි වන්න.

7. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් මත සහ දේව වචනය මත රඳා සිටින්න.

8. නැවත නැවත ප්‍රධාන කරුණ වෙතට එන්න.

9. විවේචනය නොකරන්න.

10. වරදටපත් නොකරන්න.

11. අධෛර්යයට පත්ව අත්නොහරින්න.

# එකළොස් වන පරිච්ඡේදය

## ක්‍රමවේද : සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය" නිර්වචනය කිරීමට
- සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ බයිබලීය පදනම සාරාංශ ගත කිරීමට
- සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ මූලික ප්‍රතිපත්ති සාකච්ඡා කිරීමට
- සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ රටාව පැහැදිලි කිරීමට
- ප්‍රාදේශීය සභාපාලකවරයකු සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයට තම සෙනඟ සූදානම් කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**ක්‍රිස්තුස්වහන්සේ විසින් මා කරණකොටගෙන කරවනලද කාරණා ගැන මිස, අන් කිසිවක් ගැන කථාකරන්ට සිතටවත් නොගනිමි. එසේම යෙරුසලම පටන් ඉල්ලූරිකය දක්වා අවට රටවල ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සම්පූර්ණ වශයෙන් දේශනාකළෙමි. (රෝම 15:19)**

### හැඳින්වීම

" සන්තෘප්ත " යන වචනයේ අර්ථය "පැතිර යන යමකින් සම්පූර්ණයෙන් පිරීම" යන්නයි. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය යනු පාන් පිටි පිඬක යෙදූ මුහුන් වල කාර්යයට සමාන අයුරින් ශුභාරංචිය ව්‍යාප්ත කිරීමයි. එහි අරමුණ සම්පූර්ණ ප්‍රදේශයම පිරී ගොස් බලපෑමක් ඇතිවන තුරු ශුභාරංචිය ප්‍රචාරය කිරීමයි. ප්‍රදේශයකින් ආරම්භ කර (ඔබේ යෙරුසලම) ඔබේ ප්‍රාන්තය හෝ පළාතත් ඉන් අනතුරුව ඔබේ දේශයත් වැසෙන පරිදි සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය ව්‍යාප්ත වේ.

### "සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ බයිබලීය පදනම"

"සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය" යන පදය බයිබලයේ හමු නොවේ. ධර්ම ප්‍රචාරණය, පෞද්ගලික ධර්ම ප්‍රචාරණය හෝ සාමූහික ධර්ම ප්‍රචාරණය යන පදත් බයිබලයේ හමු නොවේ. මෙම විශේෂිත පද පාවිච්චි කර නොමැති නමුත් නව ගිවිසුම ධර්ම ප්‍රචාරණ කාර්යය වැදගත්කොට දක්වයි.

කෙසේ නමුත්, සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය නව ගිවිසුම තුළ හොඳින් පැහැදිලි වේ. අපෝස්තළුවරු තම ධර්මයෙන් යෙරුසලම පුරවා ඇති බව නාගරික කවුන්සලය වාර්තා කළේය (ක්‍රියා 5:28). යුදයේ, ගලීලයේ සහ සමාරියෙහි සභාවන් ගොඩ නගනු ලැබූහ. ලද්දයෙහි හා ෂාරොනෙහි හි ජීවත් වූ සියලු දෙනා ස්වාමීන්වහන්සේ වෙතට හැරුණු අතර මුළු යොප්පාවට ශුභාරංචිය දැනුම් දෙනු ලැබිය (ක්‍රියා 9:31,35,42). දහස් ගණනක් යුදෙව්වන් ස්වාමීන්වහන්සේ වෙතට හැරුණහ (ක්‍රියා 21:20). පිසීදියේ, අන්තියෝකියේදී සහ එපිසියේදී "ස්වාමීන්වහන්සේගේ වචනය ඒ පළාත මුළුල්ලෙහි පතළව ගියේය" බව වාර්තා වේ. (ක්‍රියා 13:49).

ආසියාවේ ජීවත්වූ සියලු දෙනා දේව වචනය ඇසූහ (ක්‍රියා 19:10). එසේම ඇතැම් විට සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය පිළිබඳ විශාලතම වාර්තාව පාවුල්ගේ පෑනෙන් ලියැවී තිබේ :

**ක්‍රිස්තුස්වහන්සේ විසින් මා කරණකොටගෙන කරවනලද කාරණා ගැන මිස, අන් කිසිවක් ගැන කථාකරන්ට සිතටවත් නොගතිමි. එසේම යෙරුසලම පටන් ඉල්ලූරිකය දක්වා අවට රටවල ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචි සම්පූර්ණ වශයෙන් දේශනාකළෙමි. එසේය, වෙන කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩ නොනගන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ නාමය සඳහන්කරනු ලැබූ තැන්වල නොව: උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ අය දකින්නෝය, උන්වහන්සේ ගැන නෑසූ අය තේරුම්ගන්නෝයයි ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනාකරන්ට අභිප්‍රායකෙළෙමි.**
**(රෝම 15:19-21)**

## සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ මූලික ප්‍රතිපත්ති

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය පහත ප්‍රතිපත්ති මත රඳා පවතී :

### අධික අස්වනු නෙළීමකට අධික වැපිරීමක් අවශ්‍ය වේ :

අපෝසතුළුවර පාවුල් කොරින්තියේ සභාවට මෙසේ පැවසුවේය :

**නුමුත් මේක කියමි: මසුරුලෙස වපුරන්නා මසුරුලෙස කපාගන්නේය: නොමසුරුව වපුරන්නා නොමසුරුව කපාගන්නේය. (2 කොරින්ති 9:6)**

ධර්ම ප්‍රචාරණයට ඉහත සත්‍යය අදාළ කළ විට, අස්වැන්න පිළිබඳ මෙම නියමයෙන් පැවසෙනුයේ ආත්ම රැසක අස්වැන්නක් බලාපොරොත්තු විය හැක්කේ ධර්ම ප්‍රචාරණය උදෙසා වැඩ කරන සභාවන්ට පමණක් වන බවයි. බීජය කෙතරම් සරු වුවත්, පොළොව කෙතරම් සාරවත් වුවත්, ගොවියා කෙතරම් දක්ෂ වුවත් පළමුව වැපිරීමෙන් තොරව ඔහුට අස්වනු නෙළිය නොහැක. ධර්ම ප්‍රචාරණයට නොවපුරන සභාපාලකවරු හෝ සභාවන් ධර්ම ප්‍රචාරණයේ අස්වනු නෙළා ගන්නේ නැත. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයට ඔබ කාලය, මිනිසුන්, වෙහෙස, යාච්ඤාව, කඳුළු හා අරමුදල් යෙදවීම අවශ්‍යවේ.

### කැපවුණු සුලුතරයකට ජාතියකට බලපෑම් කළ හැකිය :

දෙවියන්වහන්සේ ආශා වන්නේ බොහෝ දෙනෙක් තුළින් නොව ස්වල්ප දෙනෙක් තුළින් වැඩ කිරීමට බව බයිබලීය වාර්තා සඳහන් කරයි. දෙවියන්වහන්සේ ගිඩියොන්ගේ හමුදාවේ සිටි වැඩි පුර සොල්දාදුවන් ආපසු යවා 300 දෙනෙකුගෙන් යුත් කුඩා හමුදාවක් පාවිච්චි කළ අයුරු ඔබට මතක ඇති. “ලෝකය පෙරලීමට” අවශ්‍ය වුයේ ආත්මයෙන් පිරුණු ගෝලයන් ස්වල්පයක් පමණක් (ක්‍රියා 17:6) වූ අතර, අද දවසෙ ද අවශ්‍ය වන්නේ එය පමණී.

සෑම ඇදහිලිවන්තයෙක්ම ධර්ම ප්‍රචාරණයේ යෙදුනත්, ඇතැම් නගර හා රටවල් වල ජනගහනය සමඟ සැසඳූ විට ඔවුන් සුළුතරයක් වේ. නමුත් මෙය සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයට බාධාවක් නොවේ. මිනිසුන් ස්වල්ප දෙනෙක් තුළින් දෙවියන්වහන්සේ මහත් දේ කරන විට, සියලු මහිමය මිනිසුන්ට හිමිවනු වෙනුවට උන්වහන්සේට හිමිවේ.

### සෑම ඇදහිලිවන්තයෙක්ම ඒ සඳහා යොමුවිය යුතුය :

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය සඳහා සෑම ඇදහිලිවන්තයෙක්ම ධර්ම ප්‍රචාරණයට උනන්දු වී ඒ සඳහා යොමුවීම අවශ්‍ය වේ. මෙම යෙදවීම තුළ, නැතිවුණු හා මියැදෙන ලෝකයක් කෙරෙහි වූ අනුකම්පාවකින් ඔබව උනන්දු කරවන, දෙවියන්වහන්සේ හා ඔබ අතර ඇති සිරස් සම්බන්ධතාවයක් අවශ්‍ය වේ. එසේම ඒ සඳහා එක් එක් පුද්ගලයන් අතර ඇති තිරස් සම්බන්ධතාවයක් ද වැදගත් වේ. දෙවියන්වහන්සේ ශුද්ධාත්මයාණන් තුළින් ඔබව ගෙන යන විට, ඔබේ උද්යෝගය බෝ වන රෝගයක් මෙන් අන් අය වෙතට ද පැතිරෙනු ඇත.

සාම්ප්‍රදායිකව ධර්ම ප්‍රචාරණය සභාපාලකවරුන්ට සීමා වී තිබේ. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ දී, අවධාරණය දේශනා කුඩුවේ සිට සභාවේ සෙනඟ වෙතට මාරුවේ. එහෙත් මෙම වෙනස්වීම සභාපාලකවරයා පැත්තකට නොදමයි. ඔහු නායකයෙකු ලෙස ඔහුගේ භූමිකාව ඉතාම වැදගත් වේ. දැන් ඔහු සෙනඟ ක්‍රියාවේ යෙදවීම පිණිස සිටින්නා වේ.

සභාව ධර්ම ප්‍රචාරණය සඳහා යෙදවීම ආත්මික දීමනා පිළිබඳ ආත්මික සංකල්පය මත පදනම් විය යුතුය. එහිදී සෑම ඇදහිලිවන්තයෙක්ම තමාට දීමනාවක් ඇති ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක වේ. (භාවස්ටයිම්

ජාත්‍යන්තර ආයතනයේ *"සංවිධානය කිරීම පිළිබඳ ක්‍රමවේද"* පාඨමාලාව තුළින් "දීමනා මත පදනම් සංවිධානය" විස්තර කෙරේ.)

## ක්‍රියාවේ යෙදවීම සභාවේ රාමුව තුළ සිදුවිය යුතුය :

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ දී සභාව පිළිබඳව කතා කරන විට අප අදහස් කරනුයේ, ප්‍රාදේශීය සභාවක්, නිකායක් හෝ සභාවන් කිහිපයක් සහ විශ්වය පුරා සිටින සැබෑ ඇදහිලිවන්තයන්ගේ එකතුවක් වශයෙන් සභාව පිළිබඳවයි.

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය ප්‍රාදේශීය සභාව ඇතුල් කරගත යුතුවූ අතර එසේම එය නිකායන් දක්වා ව්‍යාප්ත විය යුතුය. සෑම ප්‍රාදේශීය සභාවක්ම සහ සෑම නිකායක්ම ධර්ම ප්‍රචාරණයට නියම වැදගත්කම ලබා දුන්නහොත්, මෙහි ප්‍රතිඵලයක් ලෙස විශ්වය පුරා සිටින සෑම සැබෑ ඇදහිලිවන්තයෙක්ම ඒ සඳහා ක්‍රියාවේ යෙදෙනු ඇත. මෙම ක්‍රියාවේ යෙදවීම සඳහා පදනම ශුභාරංචියේ රහස ලොවට එළිදරව් කිරීම සඳහා දෙවියන්වහන්සේ තෝරාගත් මාධ්‍යය සභාව බව අවබෝධ කර ගැනීමයි (එපිස 3:9-10).

## අවධානය යොමු විය යුත්තේ "පැමිණීම"ට වඩා "යාම" කෙරෙහිය :

නූතනයේ දී බොහෝ සභාවන් ධර්ම ප්‍රචාරණය සඳහා "පැමිණීම" පිළිබඳ ප්‍රවේශයක් යොදා ගෙන තිබේ. ඔවුහු දේවමෙහෙයන් පැවැත්වෙන වේලාවන් වලදී සභාවේ දොරටු විවර කර ගැළවීම නොලත් අය පැමිණෙන තුරු බලා සිටිති. නමුත් නව ගිවිසුම තුළ උගන්වන්නේ "යාම" පිළිබඳ ක්‍රමවේදයකි. සභාව ශුභාරංචිය සමඟ ලෝකයා වෙතට යා යුතුය. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ දී මිනිසුන් සභාවේ ආසන වලින් නැඟිට ලෝකයට යා යුතුය. විශාලතම ධර්ම ප්‍රචාරණමය සභාව මඟින් සිදු කළ යුතු නමුත් එය සිදු විය යුත්තේ සභාව තුළදී නොවේය.

## ආත්මයෙන් එක්සත් වීම අවශ්‍ය වේ :

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය සඳහා සෙසු ඇදහිලිවන්තයන් හා සෙසු නිකායන් සමඟ එක්සත් සාක්ෂි දැරීමක් අවශ්‍ය වේ. එබඳු සාක්ෂි දැරීමක් සඳහා පෞද්ගලික විශ්වාසයන් ප්‍රකාශ කිරීමක් හෝ නිකායක් විශේෂ කොට දැක්වීමක් අවශ්‍ය නොවේ. එය දෙවියන්වහන්සේ ආත්මයාණන් මඟින් ලබා දෙන ආත්මයේ එක්සත් බවකි (1 කොරින්ති 12:13). ධර්ම ප්‍රචාරණය සඳහා අපගේ ආත්ම එක්සත් වී තිබේ.

දෙවියන්වහන්සේගේ ජනතාව ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වශයෙන් හඳුන්වනු ලැබේ (එපිස 4:12). එය සත්‍යයක් නම්, අප සම්බන්ධයක් නොමැති සහ සම්බන්ධීකරණයක් නොමැති සාමාජිකයන් ලෙස නොව එකම ශරීරයක් ලෙස කටයුතු කළ යුතුය. (පහළොස්වන පරිච්ඡේදයේදී "ධර්ම ප්‍රචාරණය උදෙසා ජාලයක් ලෙස කටයුතු කිරීම" ගැන ඉගෙන ගැනීමේදී මේ පිළිබඳ තවත් දේ ඔබ ඉගෙන ගනු ඇත.) සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ දී උත්සාහ කරනුයේ ධර්ම ප්‍රචාරණයේ දී සහයෝගයෙන් කටයුතු කිරීම සඳහා හැකිතරම් සභාවන්, සේවයන්, නිකායන් සහ සංවිධාන ප්‍රමාණයක් එකතු කිරීමටය.

## එය ස්වභාවයෙන්ම විශ්වීය වේ :

මහා ආඥාව ක්‍රිස්තුස්වහන්සේගේ සියලු අනුගාමිකයන් උදෙසා ලබා දුන්නක් වන අතර එය සියලුම ජීවීන් පිළිබඳ ආඥාවකි. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය යනුවෙන් අදහස් වනුයේ, සියලු මනුෂ්‍යයන්ට මුළු ශුභාරංචිය දේශනා කරමින්, සෑම පුද්ගලයෙකු වෙතම ළඟා වීම සඳහා හැකි සෑම ප්‍රවේශයක්ම යොදා ගැනීමයි.

බොහෝ අවස්ථාවලදී ධර්ම ප්‍රචාරණය පිළිබඳ අපගේ ඉලක්කයන් ඇත්තේ ඉතා පහළ මට්ටමකිනි. අප සිතා බලා ඇත්තේ කුඩා භූමි ප්‍රදේශයක් ගැන පමණි. සීමිත අරමුදල් ප්‍රමාණයකින් සීමිත දැක්මක් ඇතිව කටයුතු කිරීම නිසා, ඇතැම් විටක නගරයක හෝ රටක කුඩා ප්‍රදේශයක සේවය කිරීමෙන්ම අප අපගේ වගකීම සම්පූර්ණ කර ඇතැයි සිතන්නෙමු.

ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන ලෙස ක්‍රිස්තුස්වහන්සේ අපට අණ කළ විට උන්වහන්සේ අදහස් කළේ සියලු ජාතීන් වෙත ළඟා වීමයි. සියලුම ජාතීන් වෙතට ගිය විට එය ලෝකයම වෙතට යාම වන බැවින්, සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය ස්වාභාවයෙන්ම විශ්වීය වේ.

# සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ රටාව

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය ලෝකය පුරා අදාළ කර ගැනීමේදී එය වෙනස් ආකාර ගනී. ලෝකය තුළ විවිධ සංස්කෘතීන් පවතින බැවින් වෙනස් සංස්කෘතීන් තුළ ධර්ම ප්‍රචාරණය කිරීමේදී වෙනස් රටාවන් අනුගමනය කළ යුතු වීම ස්වභාවිකය. එක් සංස්කෘතියක් තුළදී සාර්ථක වන ක්‍රමවේදයක් තවත් සංස්කෘතියක් තුළදී සාර්ථක නොවිය හැකි බව අප හඳුනාගත යුතුය.

කෙසේ වෙතත්, සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ මූලික රටාව නම්, සෑම ජාතියකම සෑම ප්‍රදේශයකම සිටින මිනිසුන් හා අවසානයේ දී ලෝකයේ සෑම ජාතියක්ම වෙත ළඟා වීම සඳහා ක්‍රමයක් නිර්මාණය කිරීමයි. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ මූලික රටාව පහත දැක්වේ :

## සංවිධානය :

මුළු ජාතියකටම ධර්ම ප්‍රචාරණය කිරීම උදෙසා, ප්‍රාදේශීය වශයෙන්, පළාත් මට්ටමෙන් හා ජාතික මට්ටමෙන් සම්බන්ධීකරණය කරන ලද ධර්ම ප්‍රචාරණ වැඩසටහනක් පැවතිය යුතුය. මෙය ඉටුකර ගැනීම සඳහා, සෑම සභාවකටම ධර්ම ප්‍රචාරණය පිළිබඳ කමිටුවක් පිහිටුවිය යුතු යයි යෝජනා වී තිබේ. තමන්ට විශේෂිත භූගෝලීය ප්‍රදේශය තුළ හා එම ප්‍රදේශයේ සිටින පුද්ගල කණ්ඩායම් වෙත ධර්ම ප්‍රචාරණය පිළිබඳ මෙම කමිටුව මඟින් සළකා බලනු ඇත.

නගරය තුළ ධර්ම ප්‍රචාරණ කටයුතු සම්බන්ධීකරණය කිරීම සඳහා ප්‍රාදේශීය සභාවන් මඟින් නගර මට්ටමින් කමිටුවක් පිහිටුවිය යුතුය. මේ තුළින් එම ප්‍රදේශයේ ප්‍රාදේශීය සභාවන් අතර තරගයක් වෙනුවට සම්බන්ධීකරණයක් ඇතිවනු ඇත. පළාත් මට්ටමින් ඇති කරන කමිටුව අදාළ පළාත තුළ කටයුතු පිළිබඳව ද ජාතීන් මට්ටමෙන් ඇතිකරනු ලබන කමිටුවක් ජාතික මට්ටමේ කටයුතු පිළිබඳව ද සැළකිලිමත් විය යුතුය.

එක් එක් කමිටුවේ අන්තර්ගතය ප්‍රාදේශීය, පළාත් හා ජාතික මට්ටමේ තත්වයන් හා ඉලක්ක මත පදනම්ව වෙනස් වනු ඇත. නමුත් සෑම කමිටුවක් තුළම අවම වශයෙන් පහත සාමාජිකයන් වත් සිටිය යුතුය.

- සභාපති : කමිටුවට මග පෙන්වන හා එය සම්බන්ධීකරණය කරන තැනැත්තා
- උප සභාපති : සභාපතිට සහය දෙන හා ඔහු නොමැති අවස්ථාවලදී ඔහු වෙනුවෙන් වැඩ කරන තැනැත්තා
- ලේකම් : ලිපි, රැස්වීම් පිළිබඳ සටහන්, වාර්තා වැනි ලිඛිත කටයුතු පාලනය කිරීමට.
- මූල්‍ය සභාපති : අරමුදල්, අයවැය හා මූල්‍යවාර්තා පාලනය කරන්නා.
- යාච්ඤා සභාපති : ධර්ම ප්‍රචාරණය උදෙසා වූ සම්බන්ධීකරණය කරන ලද යාච්ඤාවන්ට මඟ පෙන්වන්නා.
- පුහුණු කිරීමේ සභාපති : ධර්ම ප්‍රචාරණය පිළිබඳ පුහුණු වීම් සංවිධානය කරන්නා.
- සැපයීමේ සභාපති : ධර්ම ප්‍රචාරණයට අවශ්‍ය පත්‍රිකා හා බයිබල් වැනි ලිපි ද්‍රව්‍ය මෙන්ම, සිතියම්, හඳුනාගැනීමේ කාඩ්පත්, ධර්ම ප්‍රචාරණමය පොත්, චිත්‍රපට, කැසට්පට ආදිය සපයන්නා.
- ප්‍රචාරක සභාපති : ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත්පත්, ශබ්දවිකාශන යන්ත්‍ර සහිත මෝටර් රථ, පෝස්ටර් සහ බැනර් මෙන්ම ලිපි මඟින් ද විශේෂ අවස්ථා පිළිබඳ දැන්වීම් පාලනය කරන්නා.

**සැළැස්ම :**

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය ක්‍රියාකාරකම් සඳහා සංවිධානාත්ම සැළැස්මක් තිබිය යුතුය. යෝජිත වාර්ෂික සැළැස්මක් පහත දැක්වේ :

ජනවාරි : ප්‍රාදේශිය, පළාත් හා ජාතික කමිටු සංවිධානය කරන්න.

පෙබරවාරි : නායකයන් පුහුණු කරන්න.

මාර්තු : සෑම කිතුනුවෙක්ම පුහුණු කරන්න.

අප්‍රේල් : }
මැයි : } ධර්ම ප්‍රචාරය කිරීමේ විවිධ ක්‍රමවේද යොදා ගනිමින් ප්‍රාදේශිය සීමාවන් තුළ ධර්ම ප්‍රචාරණය කරන්න.
ජූනි : }

ජූලි : ප්‍රාදේශිය ධර්ම ප්‍රචාරණ ව්‍යාපාර

අගෝස්තු : ප්‍රාදේශිය ධර්ම ප්‍රචාරණ වලට පසු සෙනග ගොඩනැඟීම

සැප්තැම්බර් : පළාත් ධර්ම ප්‍රචාරණ ව්‍යාපාර

ඔක්තෝබර් : පළාත් වල සෙනඟ ගොඩනැඟීම

නොවැම්බර් : ජාතික ධර්ම ප්‍රචාරණ ව්‍යාපාර

දෙසැම්බර් : සෙනඟ ගොඩනැඟීම සහ ඊළඟ වර්ෂය උදෙසා සැළසුම් කිරීම.

(දොළොස්වන පරිච්ඡේදයේ දී ධර්ම ප්‍රචාරණ රැළියක් සංවිධානය කරන අයුරු හා මෙහෙයවන අයුරු ඔබ ඉගෙන ගනු ඇත. දහතුන්වන පරිච්ඡේදයේ දී නව ඇදහිලිවන්තයන් ගොඩනඟන ආකාරය හා ගෝලත්වය සඳහා ඔවුන් පුහුණු කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත.)

**ක්‍රමවේද :**

පහත දැක්වෙන ඒවාද ඇතුළත්ව, ප්‍රාදේශිය, පලාත් හා ජාතික යන මට්ටම් වලදී යොදා ගතහැකි සෑම ක්‍රමයක්ම යොදාගැනේ.

- ධර්ම ප්‍රචාරණය ඉලක්ක කර ගත් යාච්ඤා රැස්වීම.
- ගුවන්විදුලිය හා රූපවාහිනිය මඟින් කෙරෙන ධර්ම ප්‍රචාරණය
- ධර්ම ප්‍රචාරණමය ශ්‍රවණ හා දෘෂ්‍ය කැසට් පට මගින්.
- ධර්ම ප්‍රචාරණමය චිත්‍රපට.
- නිවෙස්, සභාවන් හෝ ජනතාව රැස්වෙන ස්ථාන වලදී පවත්වන ධර්ම ප්‍රචාරණමය බයිබල් අධ්‍යයනයන්.
- තැපැල් මාර්ගික ධර්ම ප්‍රචාරණමය පාඨමාලාවන්.
- මිනිසුන් සභාවට හා ධර්ම ප්‍රචාරණමය කටයුතු වලට ළං කිරීම.
- ගෙයින් ගෙට ගොස් ධර්ම ප්‍රචාරණය.

- ආරක්ෂක අංශයේ අය අතර ධර්ම ප්‍රචාරණය.

- ව්‍යාපාරික හෝ උසස් නිළයන් දරන පුද්ගලයන් ඉලක්ක කර ගත් ධර්ම ප්‍රචාරණය.

- ධර්ම ප්‍රචාරණයට වැඩි වැදගත්කමක් ලබා දෙන සාක්ෂර වැඩසටහන්.

- ධර්ම ප්‍රචාරණයට වැඩි වැදගත්කමක් ලබා දෙන වෛද්‍ය වැඩසටහන්.

- දුරකථන මාර්ගික ධර්ම ප්‍රචාරණය.

- ශුභාරංචිය බෙදාගන්නා සහ ධර්ම ප්‍රචාරණමය වැඩ සටහන් වලට පුද්ගලයන්ට ආරාධනා කරන ශබ්ද විකාශන යන්ත්‍ර සහිත මෝටර් රථ.

- ශුභාරංචිය බෙදා ගන්නා පෞද්ගලික ලිපි.

- සිරගෙවල්, රෝහල්, වැඩිහිටි නිවාස තුළ සිදුකරන ආයතනික ධර්ම ප්‍රචාරණය.

- කිතුනු අධ්‍යාපනය තුළින් ධර්ම ප්‍රචාරණය : සබත් පාසල, නිවාඩු කාලීන බයිබල් පාසල් හා බයිබල් විද්‍යාල.

- උද්‍යාන, වෙළඳ සංකීර්ණ හා වෙනත් ජනතාව රැස්වන ස්ථාන වල සිදු කරන ධර්ම ප්‍රචාරණය.

- පොළ, සර්කස් සංදර්ශන හෝ දේශපාලනික රැස්වීම් වැනි සමාජයේ විශේෂ අවස්ථා වලදී ධර්ම ප්‍රචාරණය කිරීම.

- ධර්ම ප්‍රචාරණමය ප්‍රසංග සහ නාට්‍ය.

- ලිඛිත ධර්ම ප්‍රචාරණය : පත්‍රිකා, පොත් හා වෙනත් මුද්‍රිත මාධ්‍ය බෙදා ගැනීම.

- විශේෂ අවස්ථා සහිත පුද්ගලයන්ට ධර්ම ප්‍රචාරණය : මත් පැන් පානය කරන්නන්, මත් ද්‍රව්‍ය වලට ඇබ්බැහිවූවන්, කුසගිනි වූවන්, නිවාස නොමැති අය, කුඩා දරුවන්, මානසික හෝ ශාරීරික ආබාධ ඇත්තන්.

- දරුවන්, තරුණයන්, මහත්වරු හා කාන්තාවන් උදෙසා වූ විශේෂ ධර්ම ප්‍රචාරණමය වැඩසටහන්.

- දේශීය විද්‍යාලයක් හෝ විශ්ව විද්‍යාලයක් තුළදී ජාත්‍යන්තර ශිෂ්‍යයන්ට ධර්ම ප්‍රචාරණය කිරීම.

- රජයේ පාසල් තුළ ධර්ම ප්‍රචාරණය.

- ප්‍රාදේශීය, පළාත් ජාතික මට්ටමේ ප්‍රසිද්ධ රැස්වීම්.

රජයේ නීතිරීති නිසා ඉහත සඳහන් ඇතැම් ධර්ම ප්‍රචාරණ ක්‍රම ඇතැම් රාජ්‍යයන් තුළ කළ හැකි ඒවා නොවනු ඇත. නමුත් වැදගත් කරුණ නම් සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ දී මුළු රටම හැකි සෑම අයුරකින්ම ශුභාරංචියෙන් ආවරණය කිරීමට උත්සාහ කිරීමයි.

සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේදී යොදාගත හැකි වෙනස් ආකාරයේ ධර්ම ප්‍රචාරණ ක්‍රමවේදයන්ට සීමාවක් නොමැත. එහි අරමුණ සෑම කෙනෙකුටම ශුභාරංචිය ගෙන යාම බව මතක තබා ගන්න.

## ප්‍රාදේශීය සභාව සූදානම් කිරීම.

පළාත් මට්ටමින් හා ජාතික මට්ටමෙන් සිදුකරන වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් වල ප්‍රතිඵලයක් ලෙස සිදුවන නිසාත් සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය ප්‍රාදේශීය සභාවේ රාමුව තුළ සිදුවන බැවිනුත් සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය සඳහා තම සභාවන් යොමු කරන්නේ කෙසේදැයි සභා පාලක වරු දැන සිටීම වැදගත්ය. මෙම අරමුණ ඉටු කර ගැනීම සඳහා සභාපාලකවරුන්ට උපකාරීවන ක්‍රමවේද කිහිපයක් පහත දැක්වේ.

- ඔබ ආදර්ශයක් වන්න : ඔබ ධර්ම ප්‍රචාරණය පිළිබඳ උනන්දු වෙමින් ආත්ම දිනා ගන්නා අයුරු ඔබේ සභාවේ අය දුටු විට ඔබගේ උනන්දුව නිසා ඔවුනට බලපෑමක් ඇතිවනු ඇත.

- ඉරුදින උදෑසන පණිවුඩය ගැළවීම නොලත් අය වෙත යොමු කරන්න. ගැළවීම නොලත් අය සභාවකට පැමිණෙන්නේ නම් එය ඉරුදින උදෑසන විය හැකිය.

- නිතර නිතර ධර්ම ප්‍රචාරණය පිළිබඳ දේශනා කරන්න.

- ඔබගේ සභාවේ සෙනඟ සඳහා ධර්ම ප්‍රචාරණය පිළිබඳ සන්නිවේදන මාධ්‍යයන් ලබා දෙන්න: මේ තුළ ධර්ම ප්‍රචාරණයට අවධානය දෙන වීඩියෝ හා ශ්‍රවණ කැසට් පට, චිත්‍රපට හා ග්‍රන්ථ ඇතුළත් විය හැකිය.

- ආත්ම දිනාගැනීම සභාවේ නායකත්වය සඳහා අවශ්‍ය පූර්ව සුදුසුකමක් බවට පත් කරන්න. ආත්ම දිනා ගැනීම සෑම නායකයෙකුම සතු සුදුසුකමක් විය යුතුය. ඔබගේ වත්මන් නායකත්වය මිනිසුන් ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙන එන්නේ නැත්නම් ඔවුන්ව පුහුණු කිරීමෙන් ආරම්භ කරන්න.

- සබත් පාසල ආත්ම දිනාගැනීම වෙත යොමු කරන්න - ශිෂ්‍යයන්ට ශුභාරංචිය ඉදිරිපත් කරන ආකාරය පිළිබඳව හා ඊට ප්‍රතිචාර දැක්වීමට ශිෂ්‍යයන්ට ආරාධනා කරන ආකාරය පිළිබඳව ගුරුවරුන් පුහුණු කරන්න. සබත් පාසලේ සිටින දරුවන්ගේ ගැළවීම නොලත් දෙමාපියන් වෙතට ද ළඟා විය යුතුය.

- ඔබේ යාච්ඤා රැස්වීම් වලදී ධර්ම ප්‍රචාරණයට මූලිකත්වය දෙන්න. අද දවසේ බොහෝ යාච්ඤා රැස්වීම් ගීතිකා, යහපත් දේශනා ඇති නමුත් සැබෑ යාච්ඤාවට ස්වල්ප ලෙස යොමු වූ තවත් දේව මෙහෙයක් බවට පත්ව තිබේ. ඔබගේ ජනතාව නැති වූ අය හා අස්වැන්න උදෙසා සේවකයන් උදෙසා යාච්ඤා කිරීම ඉලක්ක කරගත්, සැබෑ ආත්මයාණන් මඟපෙන්වන, නව ගිවිසුම් යාච්ඤාව වෙත ගෙන යන්න.

- නොකඩවා සිදු කෙරෙන ධර්ම ප්‍රචාරණ පුහුණුවක් කරගෙන යන්න. එම අරමුණ උදෙසා *"මුහුන් මැනි වූ ධර්ම ප්‍රචාරණය"* නමැති මෙම පාඩමාලාව ඔබට යොදාගත හැකිය. වෙනත් සභාවන්ගෙන් පැමිණෙන අලුත් සාමාජිකයන් උදෙසා සහ ස්වාමින්වහන්සේ වෙතට එන නව ඇදහිලිවන්තයන් උදෙසා නව පංති පවත්වන්න.

- ඔබගේ ප්‍රදේශය උදෙසා සැළැස්මක් සකස් කරන්න : ඔබගේ ගමේ හෝ නගරයේ සිතියමක් ගන්න. එය කොටස් වලට බෙදා සෑම කොටසකටම නායකයෙක් පත් කරන්න. ඉන්පසු...

- සතියකට එක් හැන්දෑවක් හෝ පෞද්ගලික ධර්ම ප්‍රචාරණයට කැප කරන්න. අප විසින් කරනු ලබන්නේ එසේ කිරීමට කාලය වෙන් කරන දේවල් පමණක් වන අතර, මෙය ධර්ම ප්‍රචාරණය සම්බන්ධයෙන් ද සත්‍යයකි. ආත්ම දිනා ගැනීම උදෙසා ඔබ කාලය වෙන් කරන තුරු කිසිම දිනයක ඔබ ආත්ම දිනා නොගනු ඇත.

- නිශ්චිත දිනයක් හා වේලාවක් යොදාගෙන, යාච්ඤා කිරීමට සියලු සේවකයන් එකතු වී ඔවුන් දෙදෙනා බැගින් යවන්න. පවුල්, ව්‍යාපාරික ස්ථාන, සාප්පු, සංකීර්ණ උද්‍යාන, ඉන්ධන පිරවුම් හල්, තැබෑරුම්, අවන්හල් ආදී සියලු ස්ථාන වෙත යාමට ඔවුන්ට කාඩ්පතක් පිළියෙල කර දෙන්න - සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය යනුවෙන් හැඳින්වෙන්නේ එයයි.

- ගොඩනැඟීමේ වැඩසටහනක් ඇති කරන්න. අලුත් ඇදහිලිවන්තයන් ගොඩනැඟීමේ වගකීම පෞද්ගලිකව දැරීමට ඔබේ ජනතාවට පුහුණු කරන්න. නව ඇදහිලිවන්තයන්ට කිතුනු ඇදහිල්ලේ මූලික සිද්ධාන්ත ඉගැන්වීමටත්, ඔවුන්ව සභාවේ කටයුතු වලට සහභාගි කර ගැනීමටත් පංතියක් ආරම්භ කරන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය" නිර්වචනය කරන්න.

3. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ බයිබලීය පසුබිම සාරාංශගත කරන්න.

4. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ මූලික සිද්ධාන්ත සාකච්ඡා කරන්න.

5. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ රටාව සාකච්ඡා කරන්න.

6. ප්‍රාදේශීය සභාපාලකවරයෙකුට සන්තෘප්ත ධර්ම ප්‍රචාරය සඳහා තම සභාව සූදානම් කළ හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"පරිසර විශ්ලේෂණ"* කිරීම නමැති පාඨමාලාව මඟින් ශුභාරංචිය තුළින් ගමක්, නගරයක්, පළාතක් හෝ ජාතියක් වෙත ළඟා වීමේදී ඒවා විශ්ලේෂණය කරන ආකාරය පිළිබඳව විස්තර දැක්වේ. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේ දී අවශ්‍යතා හඳුනා ගැනීමේදී හා සැළසුම් නිර්මාණය කිරීමේ දී එය ඔබට උපකාරී වනු ඇත.

2. ඔබ ජීවත් වන නගරය හෝ ගම තුළ සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය උදෙසා සැළැස්මක් සකස් කරන්න. ඒ තුළ ඇතුළත් විය යුතු ධර්ම ප්‍රචාරණමය ක්‍රියාකාරකම් පිළිබඳව යාච්ඤා කර ඔබගේ සැළසුම් ක්‍රියාවට නැංවීමට කාලරාමුවක් සකස් කරන්න. ඔබගේ සමාජය වෙත ගමන් කිරීමේදී ඔබට උපකාරී විය හැකි සභාවන් හා කිතුනු සංවිධාන මොනවාද?

3. ඔබ මෙම පාඨමාලාව අධ්‍යයනය කරනුයේ සිරගෙයක් තුළ දී නම්, ඔබ සිටින ආයතනය උදෙසා සන්තෘප්ත ධර්ම ප්‍රචාරණ සැළැස්මක් පිළියෙල කරන්න. ඔබගේ ආයතනයේ දේවගැතිවරයෙකු සිටි නම්, ඔහුගේ සහය ලබා ගන්න.

# දොළොස් වන පරිච්ඡේදය

# සාමූහික ධර්ම ප්‍රචාරණ ක්‍රමවේද

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සාමූහික ධර්ම ප්‍රචාරණයේ වාසි පැහැදිලි කිරීමට
- පහත දේවල් පිළිබඳව පාඩම තුළ සාකච්ඡා කර ඇති තොරතුරු සාරාංශගත කිරීමට
- ආත්මික සූදානම
- රැස්වීම් පවත්වන ස්ථානය
- පහසුකම් පිළිබඳ ගිවිසුම්
- දින සහ වේලාවන්
- ප්‍රචාරණ කටයුතු
- මූල්‍ය පහසුකම්
- අවශ්‍ය පහසුකම් පිළිබඳ පෙර සූදානම
- සේවකයන් පුහුණු කිරීම
- රැස්වීම පැවැත්වීම
- රැස්වීමෙන් පසු සෙනඟ ගොඩනැංවීම
- සාමූහික රැස්වීමක් පැවැත්වීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**ජාතීන් අතරෙහි බලා, කල්පනාකර, ඉතා විස්මපත්වෙයල්ලා, මක්නිසාද නුඹලාට කිවත් නුඹලා විශ්වාස නොකරන ක්‍රියාවක් නුඹලාගේ දවස්වලදී කරමි. (හබක්කුක් 1:5)**

## හැඳින්වීම

සාමූහික ධර්ම ප්‍රචාරණයෙන් තොරව සමාජයක්, පළාතක් හෝ රටක් ධර්ම ප්‍රචාරණයෙන් සන්තෘප්ත කළ නොහැකිය. ශුභාරංචිය ගෙන යා යුතු මිනිසුන් සමූහයක් සිටින අතර, සාමූහික ධර්ම ප්‍රචාරණයයේ දී විශාල පුද්ගලයන් කණ්ඩායමක් වෙත එකවර ළඟා වීම කෙරෙහි අවධානය යොමු කරයි.

නව වන පරිච්ඡේදයේ දී පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදු කරන ආකාරය ඔබ ඉගෙන ගත්තේය. සාමූහික ධර්ම ප්‍රචාරණය සිදු කරන ආකාරය මෙම පාඩම විස්තර කෙරේ. මෙම ක්‍රම දෙකම නව ගිවිසුම් සමයේ දී යොදාගත් අතර මෙම ක්‍රම දෙකම අද දවසේදීත් ධර්ම ප්‍රචාරණයේ දී වැදගත් වේ.

## සාමූහික ධර්ම ප්‍රචාරණ රැස්වීම්

සාමූහික ධර්ම ප්‍රචාරණ රැස්වීම්, කණ්ඩායම් වලට ශුභාරංචිය ගෙන යාමේ ඉතා වැදගත් ක්‍රමවේදයකි. එය දේව රාජ්‍යයේ ශුභාරංචියෙන්, නගරයේ සිටින සෑම පුද්ගලයෙකුම වෙත ළඟා වීම උදෙසා වූ, ඇදහිලිවන්තයන්ගේ එක්සත් උත්සාහයකි.

එය ප්‍රාදේශීය දේවස්ථානයක බිත්ති හතර තුළ පවත්වනු ලබන රැස්වීම් මාලාවක් සේ නොවේ. පිබිදීමක් තුළින් අදහස් කරනුයේ කලින් ප්‍රාණවත්ව තිබී දැන් මිය යාමට ආසන්න දෙයක් නැවත පණ ගැන්වීමක් වන බැවින්, එය පිබිදීමක් නොවේ. පිබිදීම අවශ්‍ය වනුයේ තම ආත්මික අත්දැකීම් තුළින් ඇල්මැරී සිටින

ඇදහිලිවන්තයන්ටය. සාමූහික ධර්ම ප්‍රචාරණ රැස්වීමක් පවත්වනු ලබනුයේ සම්පූර්ණ ප්‍රදේශයක් තුළ සිටින ගැළවීම නොලත් ජනගහනය ඉලක්ක කර ගෙනය.

ධර්ම ප්‍රචාරණය උදෙසා සාමූහික රැස්වීම් පැවැත්වීම බයිබලයට අනුකූල වේ. නව ගිවිසුම් තුළ ආසන්න වශයෙන් 150 වතාවක් පමණ යේසුස්වහන්සේ සමූහයන්ට කතා කළ අවස්ථා පිළිබඳව අපට කියවිය හැකිය. අපෝස්තුළුවර පාවුල් සහ සෙසු ගෝලයන් ද බොහෝවිට සමූහයා රැස්වන වෙළඳ පොළවල් වල සේවය කළහ.

සාමූහික ධර්ම ප්‍රචාරණ රැස්වීම් තුළින් අවුරුදු ගණනාවක් තිස්සේ දෙවියන්වහන්සේ සොයමින් සිටි පුද්ගලයන්ට සේවය කරයි. කිසිදිනක දේවස්ථානයකට නොයන මිනිසුන් එමගින් ස්පර්ශ කරයි. ඒ තුළින් නොඇදහිලිවන්තයන්ට දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට අවස්ථාව සැළසේ. එය ඉක්මනින් විශාල පිරිසක් වෙත ශුභාරංචිය ගෙන යන අතර, ලෝකයේ වේගයෙන් වර්ධනය වන ජනගහනය වෙත ළඟා වීමට එය වැදගත් ක්‍රමවේදයකි.

සාමූහික ධර්ම ප්‍රචාරණය තුළින් අස්වැන්න ලබා දීමට සූදානම් ආත්මික භූමි හඳුනාගැනීමට උපකාර වන අතර එහි ප්‍රතිඵලය බොහෝ විට නව සභාවක් පිහිටුවීමයි. එම ප්‍රදේශය තුළ දැනටමත් සභාවන් පවතී නම්, සහභාගීත්වයට නව ඇදහිලිවන්තයන් එක් වීමෙන් වර්ධනය අත්දැකිය හැකිය.

## ආත්මික සූදානම

මෙම පාඩම තුළ ඇති යෝජනාවන් බොහෝවිට යොමු වී ඇත්තේ රැස්වීමක් පැවැත්වීමට අවශ්‍ය යාන්ත්‍රික හා භෞතික අංග කෙරෙහිය. නමුත් ආත්මික බලයෙන් තොරව ඔබට භෞතික හා යාන්ත්‍රික වශයෙන් සම්පූර්ණ සූදානමක් පැවතියත්, ඔබ "හඬ නඟන පිත්තලට හෝ ශබ්ද නඟන අත්ලකට" සමාන වන බව පැහැදිලිව තේරුම් ගැනීම වැදගත්වේ. ඕනෑම ධර්ම ප්‍රචාරණ උත්සාහයක වැදගත්ම කොටස ආත්මික සූදානමයි.

සියල්ලටම වඩා වැදගත් අංගය වන ආත්මික සූදානම අමතක වන තරම් රැස්වීමකට අවශ්‍ය යාන්ත්‍රික කරුණු පිළිබඳව කාර්ය බහුල වීමේ උගුලට ඔබ හසුවීමට කිසිදිනක ඉඩ නොහරින්න. සාමූහික ධර්ම ප්‍රචාරණ රැස්වීමක බලපෑම වඩා වැඩි වනුයේ ගැළවීම, සුවය හා යක්ෂ ආත්ම දුරු කිරීම යන ශුද්ධාත්මයාණන්ගේ බලයේ ආලේපය සමඟ දේව රාජ්‍යයේ ශුභාරංචිය ඉදිරිපත් කළහොත් පමණි. මේ සඳහා ආත්මික සූදානම අවශ්‍ය වේ.

## රැස්වීම පවත්වන ස්ථානය

සාමූහික රැස්වීමක අරමුණ කිසිදාක ශුභාරංචිය අසා නොමැති අයට ශුභාරංචිය ඉදිරිපත් කිරීමයි. ඔබ රැස්වීම් පවත්වන ස්ථානය පහත ආකාර දෙකෙන් එක් ආකාරයකට තීරණය කළ හැකිය.

> **පළමුව,** ඔබට දේවගැතිවරයෙකුගේ හෝ මිෂනාරි සේවා සංවිධානයකින් හෝ යම් ප්‍රදේශයක සිටින ඇදහිලිවන්තයන් ගෙන් රැස්වීමක් පැවැත්වීමට ආරාධනාවක් ලැබෙනු ඇත. සෑම ආරාධනයක් පිළිබඳව යාච්ඤා කර එය ඔබ උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත බව ඔබට හැඟේ නම්, එය පිළිගන්න.
>
> **දෙවනුව,** යම් ප්‍රදේශයක් වෙත යාමට ඔබට දෙවියන්වහන්සේගෙන් දිව්‍ය මඟපෙන්වීමක් ලැබිය හැකිය. මෙවැනි අවස්ථාවකදී, එම ප්‍රදේශයේ සිටින ඇදහිලිවන්තයන්ට කතා කොට ඔබේ හදවතේ ඇති පෙළඹවීම ගැන පවසා හැකියාවක් තිබේ නම් ඔවුන්ගේ උපකාරය ලබා ගන්න. එම ප්‍රදේශය තුළ ඇදහිලිවන්තයන් හෝ සභාවන් නොමැති නම්, හෝ ඔවුන්ගේ සහයෝගය පිළිබඳව ඔබට විශ්වාසයක් නොමැති නම්, එනමුත් දෙවියන්වහන්සේ ඔබ යවන්නේ නම් ඔබ යා යුතුය.

මුළු රටටම බලපෑමක් ඇති කරන රැස්වීමක් උදෙසා රටක අගනුවර හෝ ප්‍රධාන නගරයක් තෝරාගත යුතුය. නගරයක් තෝරාගත් විට, නගරයේ නිශ්චිත ස්ථානය තෝරා ගත යුතුය. ඔබ අනෙකුත් සෑම දෙයක්ම හොඳින් සිදු කළත්, මිනිසුන්ට එම ස්ථානය සොයා ගැනීමට හෝ ඊට පහසුවෙන් ළඟා වීමට නොහැකි නම්, ඔබේ උත්සාහයන්ගෙන් පලක් නැති බැවින් මෙය ඉතා වැදගත් වේ. ඕනෑම නගරයක හොඳම ස්ථානය එනම් ජනතාව වැඩියෙන්ම යොමුවන ස්ථානයට ආසන්න විය යුතුය.

සාමූහික රැස්වීම් සඳහා යොදාගත හැකි ස්ථාන කිහිපයක් පහත දැක්වේ.

### විශාල විවෘත ප්‍රදේශයක් :

මෙය ඉතාම හොඳම ස්ථානය ලෙස ඔප්පු වී තිබේ. ප්‍රදේශයේ හොඳම ස්ථානයේ වේදිකාවක් ගොඩනැඟිය හැකි අතර මිනිසුන් විශාල ගණනකට ඊට ඇතුළුවිය හැකිය. එය බොහෝ විට ගෙවීමකින් තොරව හෝ අවම ගෙවීමකින් පාවිච්චි කළ හැකිය.

### පොදු උද්‍යානයක්:

සාමාන්‍යයෙන් උද්‍යානයක් හෝ වෙළඳ සංකීර්ණයක් පාවිච්චි කිරීම සඳහා ප්‍රාදේශීය අධිකාරීන්ගෙන් අවසර ලබා ගත යුතුය. මෙවැනි ස්ථානයක වැදගත්කම නම් සමාජයේ බොහෝ දෙනෙක් එම ස්ථාන දැන සිටීම සහ වෙනත් ස්ථානයක පැවැත්වුයේ නම් නොපැමිණෙන අය ආකර්ෂණය කර ගැනීමට හැකි වීමයි. එයද බොහෝ විට නොමිළයේ හෝ සුළු මුදලකට ලබාගත හැකිය.

### ක්‍රීඩාංගනයක් :

ක්‍රීඩාංගනයක් සාමාන්‍යයෙන් නගරයේ මිනිසුන් හොඳින් දන්නා ස්ථානයකි. ක්‍රීඩාංගනය පාවිච්චි කිරීම හා ක්‍රීඩා පිටිය තුළ වේදිකාවක් ඉදි කිරීම සඳහා ලිඛිත අවසරයක් ලබා ගැනීමට වග බලා ගන්න. සංවෘත ක්‍රීඩාංගනයක් තුළ සෙනඟ විධිමත් ආකාරයට සංවිධානයට ඉඩකඩ තිබේ. ඇතුළු වීමට හා පිටවීමට නියමිත ස්ථාන ප්‍රමාණවත් තරම් තිබේදැයි පරීක්ෂා කර බලන්න.

(සටහන : සාමූහික රැස්වීම් සඳහා දේවස්ථාන ගොඩනැගිලි යොදා නොගත යුතුය. ඊට හේතුව වනුයේ සෙනඟට ළගා විය හැකි ප්‍රතිඵලය කෙරෙහි බලපෑම් ඇති කරන බැවිනි. බොහෝ ගැළවීම නොලත් පුද්ගලයන්ට දේවස්ථානයකට යාම අපහසුතාවයක් ඇති කරයි. ඇතැම් නිකායක් මඟින් තම සාමාජිකයන්ට වෙනත් නිකායන්ට අයත් දේවස්ථාන වලට යාම තහනම් කර ඇත.)

සෑම ස්ථානයකදීම, සළකා බැලිය යුතු තවත් කරුණු කිහිපයක් පහත දැක්වේ :

- ආසන
- වාහන නැවැත්වීමට ප්‍රමාණවත් පහසුකම්
- ඇතුළු වීමට හා පිටවීමට ප්‍රමාණවත් පහසුකම්
- පොදු ප්‍රවාහන මාර්ග ආසන්නයේ පිහිටා තිබීම
- ආලෝක කරණයට හා ශබ්ද විකාශනයට ප්‍රමාණවත් විදුලි බල පහසුකම්
- වැසිකිලි පහසුකම්

## භාවිතා කරන ස්ථානය පිළිබඳ ගිවිසුම්

රැස්වීම් පවත්වන ස්ථානය පිළිබඳ කිසිඳු ප්‍රචාරයක් කිරීමට පෙර ඔබ අවශ්‍ය පහසුකම් පිළිබඳව ගිවිසුමක් අත්සන් කර තිබිය යුතුය. ගිවිසුමකට ඇතුළත් විය යුතු ඇතැම් මූලික කරුණු පහත දැක්වේ.

1. ඔබගේ නම හා ඔබට අදාළ ස්ථානය ලබා දෙන පුද්ගලයාගේ, සමාගමේ හෝ ආයතනයේ නම

2. ඔබ එම ස්ථානය පාවිච්චි කරන නිශ්චිත දිනයන්

3. ඔබ එම ස්ථානය පාවිච්චි කරන නිශ්චිත වේලාවන්

4. අදාළ ස්ථානය පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු මුළු මුදල

5. ගෙවීම් සිදුකරන ආකාරය හා ඒවා සිදු කරන නිශ්චිත දිනයන්

6. පළමු රැස්වීමට පෙර ස්ථානය සූදානම් කිරීමට ඔබට එම ස්ථානය ලබා ගත හැකි වේලාව.

7. වෙනත් කරුණු: ගෙවීම් තුළ, වේදිකාව, ආසන, වැසිකිලි හා පිරිසිදු කිරීම් ආදිය පිළිබඳ ගෙවීම් ඇතුළත් වේද?

## රැස්වීම් පවත්වන දින

ඔබ තෝරාගන්නා ස්ථානය අනුව රැස්වීම් පවත්වන දින වෙනස් විය හැකිය. එය ඇතැම් විට ඇතැම් මාස වල හෝ විශේෂිත දිනයන් හිදී පමණක් ලබා ගත හැකි එකක් විය හැකිය. දින තෝරා ගැනීමේදී සළකා බැලිය යුතු වෙනත් කරුණු පහත දැක්වේ:

- **කාළගුණය :** රැස්වීම් පවත්වන්නේ එළිමහනේ නම්, ඔබ ඉතා දැඩි සීතල, වැස්ස හා රස්නය ඇති කාල ගැන සැළකිලිමත් වෙමින් ඒවා මඟහැරිය යුතුය. රැස්වීම් පැවැත්වීම සඳහා හොඳම කාලය දැන ගැනිමට රැස්වීම පවත්වන ප්‍රදේශයේ ජිවත් වන පුද්ගලයන් සමඟ සාකච්ජා කරන්න.

- **නිවාඩු දින :** නිවාඩු කාල වලදී මිනිසුන් තම පවුල් සමඟ කාලය ගත කිරීමටත්, උත්සව පැවැත්විමටත් උනන්දුවන බැවින් ඒවා මඟහැරීම ඉතා සුදුසුය.

- **බාධාවන් විය හැකි වෙනත් අවස්ථා :** උත්සව, සල්පිල්, පාසල් වල පවත්වන උත්සව හා දේශපාලන රැස්වීම් වැනි බාධාවන් විය හැකි සාමාජිය අවස්ථා බැහැර කරන්න.

## රැස්වීම් පවත්වන වේලාවන්

මිනිසුන් විශාල සංඛ්‍යාවක් පැමිනීම උදෙසා, ඔවුන්ට සහභාගි විය හැකි වේලාවන්හිදී රැස්වීම් පවත්වන්න. එම ප්‍රදේශයේ කාර්යාලිය වේලාවන්, ඇඳිරි නීතිය පැනවිය හැකි වේලාවන් හා පොදු ප්‍රවාහන සේවාවන්ගේ කාලසටහන් පිළිබඳ සැළකිලිමත් වන්න.

## රැස්වීම් පිළිබඳ ප්‍රචාරණ කටයුතු

රැස්වීමක් පවත්වන බව ජනතාවට පැවසීමට ඔබ අපොහොසත් වුවහොත්, සාමුහික රැස්වීමක් තුළ ඇති මහත් බලපෑම ඔබට මඟහැරෙනු ඇත. සීමිත අයවැයක් ඇතිව වුවද, ඔබට රැස්වීම පිළිබඳ ප්‍රවෘත්තිය විශාල ප්‍රදේශයක් වෙත ගෙන යා හැකිය. පළමුව, ඔබ කරුණු දෙකක් තීරණය කළ යුතුය.

1. ඔබේ ප්‍රචාරණය තුළ ඇතුළත් විය යුත්තේ මොනවාද?

2. ඔබට ඇති මුදල් භාවිතා කරන්නේ කොතැනටද?

අප මෙම එක් එක් කරුණු ගැන සළකා බලමු :

### ඔබ ඇතුළත් කළ යුත්තේ මොනවාද?

සියලු ප්‍රචාරණයන් තුළ දින, වේලාවන් හා රැස්වීම් පවත්වන ස්ථානය පිළිබඳ පැහැදිලි තොරතුරු ඇතුළත් විය යුතුය. යේසුස්වහන්සේ අද දවසේ දී පවා ගැළවීමේ, සුව කිරීමේ හා මිදීමේ භාස්කම් කරන බවද ඔබ පැවසිය යුතුය. තමාට හෝ තම හිතවතුන්ට සුවය හෝ මිදීම අවශ්‍ය පුද්ගලයන් තුළ මෙමඟින් උනන්දුවක් ඇති කරනු ඇත. එසේම බලාපෙරොත්තුවේ ආත්මයක් ඇතිව දෙවියන්වහන්සේගේ බලය සැබවින්ම සොයමින් පුද්ගලයන් ආකර්ෂණය වනු ඇත.

### ඔබේ මුදල් වියදම් කරන ආකාරය :

ඔබගේ ප්‍රචාරණය සඳහා වු මුදල් වියදම් කිරීමේදී සළකා බැලිය හැකි ප්‍රචාරණ ක්‍රමවේද කිහිපයක් පහත දැක්වේ.

**අත් පත්‍රිකා :** අත් පත්‍රිකා ඔබට සුදානම් කරගත හැකි ඉතාමත්ම වැදගත් ප්‍රචාරණ මාධ්‍යයන්ය. මෙය අගල් 5.5 X 8.5 වැනි ප්‍රමාණයේ මිළෙන් අඩු කඩදාසි වල මුද්‍රණය කරන ලද රැස්වීම් පිළිබඳ දැන්වීමය. මහ මඟ, වෙළඳ සල් වල, උද්‍යාන වල හා කඩ සාප්පු වල සිටින පුද්ගලයන්ට මේවා පෞද්ගලිකව බෙදා දිය හැකිය. බෙදන ලෙස පවසමින් ප්‍රදේශයේ ඇදහිලිවන්තයන්ට සහ සභාවන්ට ඒවා දිය හැකිය. එසේම ගෙයින් ගෙට යමින් ද ඔබට ඒවා බෙදා හැරිය හැකිය. අත් පත්‍රිකා හැකි තරම් ආකර්ෂණීය ලෙසත්, ඔබට ප්‍රමාණවත් තරම් මුද්‍රණය කළ හැකි වන පරිදි අඩු වියදමකින් ද

මුද්‍රණය කරන්න. ඔබට අත් පත්‍රිකා ලබා ගැනීමට අවශ්‍ය දිනට පෙර ප්‍රමාණවත් කාලයක් ඇතිව ඒවා මුද්‍රණය කිරීමට හා දීමට වගබලා ගන්න.

ඔබ ශුභාරංචියෙන් ළඟා වීමට බලාපොරොත්තු වන සියලුම ප්‍රදේශ වල, රැස්වීම් පවත්වන දිනයට සතියකට පෙර අත් පත්‍රිකා බෙදා හරින්න. (පීඩාවන් හා විරෝධතා ඇති විය හැකි ප්‍රදේශවල අත් පත්‍රිකා බෙදා හැරීම සඳහා රැස්වීමට දින තුනකට පමණ පෙර දිනයක් යොදා ගැනීම නුවණට හුරු වේ). අත් පත්‍රිකා බෙදා හැරීමට විවිධ ප්‍රදේශ වෙත යාමට මිනිසුන් කණ්ඩායම් සූදානම් කර ගන්න. මෙය සිදු කළ හැකි හොඳම ආකාරය නම්, ප්‍රදේශයේ සිතියමක් යොදා ගනිමින් එක් එක් ප්‍රදේශ වෙත පුද්ගලයන් පත් කිරීමයි.

**බැනර් :** බැනර් යනු නගරයේ ප්‍රධාන ස්ථාන වල ලණු ආධාරයෙන් රඳවා තැබිය හැකි රෙදි සළකුණුය. නගරයට ඇතුළු වන සෑම ප්‍රධාන පාරක්ම ආවරණය වී ඇති බව සැක හැර දැනගන්න. ඇතැම් ප්‍රදේශ වල මේ සඳහා නගරයේ ප්‍රධානීන්ගේ අවසරය ලබා ගැනීම අවශ්‍ය වනු ඇත. එසේම වෙළඳ සංකීර්ණ හා උද්‍යාන වැනි මිනිසුන් රැසක් එකතු වන ස්ථාන වලදී ඔබට බැනර් එල්ලා තැබිය හැකිය. සියලුම තොරතුරු ඇතුළත් කර තිබේදැයි බලන්න (දින, වේලාවන්, ස්ථානය).

**පෝස්ටර් :** පෝස්ටරයක් බොහෝ විට විශාල ප්‍රමාණයේ අත් පත්‍රිකාවක් වන අතර ඒ තුළ ද ඉහත තොරතුරුම ඇතුළත් විය යුතුය. එකම වෙනස නම් එය විශාල ප්‍රමාණයෙන් මුද්‍රණය කර තිබීම හා නගරයේ ඇති සෑම ඉඩකඩම එය නිරූපණය කළහැකි වීමයි.

නැවත වතාවක්, මිනිසුන් කණ්ඩායමක් තෝරාගෙන පෝස්ටර් ඇලවීමට සුදුසුම ස්ථාන ඔවුන්ට පැවසීම යෝග්‍යය. අරමුණ විය යුත්තේ මිනිසුන් හොඳින් දකින තැනක පෝස්ටර් ඇලවීමයි. පයින් යන්නන් බහුල තැනක එය ඇළවීම සුදුසුය. එක් ස්ථානයක එක් පෝස්ටරයක් පමණක් නොඅලවන්න. එකම පෝස්ටර දෙක තුනක් අලවා ඇති තැනකට මිනිසුන්ගේ ඇස් ආකර්ෂණය වනු ඇත.

**ශබ්ද විකාශන යන්ත්‍ර සහිත මෝටර් රථ :** අත් පත්‍රිකාවක්, බැනරයක් හෝ පෝස්ටරයක් කියැවිය නොහැකි මිනිසුන් සිටින අතර ශබ්ද විකාශනයක් තුළින් ඇසෙන නිවේදන ඔවුන්ට වැටහෙනු ඇත. මෙමඟින් අදහස් වනුයේ රැස්වීම් පිළිබඳව නිවේදනය කරමින් නගරය පුරා යන ශබ්ද විකාශන යන්ත්‍ර සහිත මෝටර් රථයකි. කියවීම සඳහා ලිඛිත නිවේදනයක් සකස් කරන්න. ඇතැම් ප්‍රදේශ මඟහැරීම හා ඇතැම් ප්‍රදේශ වලට දෙවරක් යාම වැළැක්වීම පිණිස වාහනයට ගමන් කිරීමට නිශ්චිත මාර්ගයක් ලකුණු කරන්න.

**පුවත්පත් :** පුවත්පත් දැන්වීමක් තුළ ඇතුළත් විය යුත්තේ අත් පත්‍රිකා හෝ පෝස්ටර් තුළ ඇති මූලිකම තොරතුරුය. ඔබ නගරය තුළ මහජන සේවයක් කරන බැවින්, ප්‍රචාරණ ගාස්තු අඩු කිරීම ගැන විමසීමට බිය නොවන්න. රැස්වීම් නිසා මිනිසුන් මත්ද්‍රව්‍ය හා මත් පැන් වලට ඇති ඇබ්බැහිකම් වලින් නිදහස් වනු ඇත. ආත්මිකව, මානසිකව හා ශාරීරිකව සුවය ලබනු ඇත. සමාජය තුළ දෙවියන්වහන්සේගේ ක්‍රියාකාරීත්වය නිසා එය වඩා යහපත් තැනක් වනු ඇත.

බොහෝ පුවත් පත්, රැස්වීම පිළිබඳව නොමිළයේ එක් ලිපියක් හෝ පළ කරනු ඇත. මෙම ලිපිය තුළ දින, වේලාවන් හා ස්ථානය පිළිබඳව මූලික තොරතුරු ප්‍රමාණයක් ඇතුළත් විය යුතු නමුත් දැන්වීම් තුළ ඇතුළත් වන තොරතුරු වලට වඩා වැඩි තොරතුරු ප්‍රමාණයක් ඇතුළත් විය යුතුයි. පිට රටකින් පැමිණි ධර්ම ප්‍රචාරකයෙකු ලෙස ඔබගේ සම්මුඛ සාකච්ඡාවක් ගැනීමට හෝ පළමු රැස්වීම් ආවරණය කිරීමට යෝජනා කරන්න.

**ගුවන් විදුලිය හා රූපවාහිනිය :** ගුවන් විදුලිය හෝ රූපවාහිනිය ප්‍රචලිතව ඇති ප්‍රදේශ වල ඒවා භාවිත කර දැන්වීම් කිරීම පිළිබඳව ඔබට සළකා බැලිය හැක. නැවත වතාවක් ඔබ සමාජ සේවයක් සිදු කරන බැවින්, ප්‍රචාරණ ගාස්තු අඩු කිරීම ගැන විමසීමට මැළි නොවන්න. දැන්වීම් ප්‍රචාරය වන දින හා වේලාවන් සහ ඒවායේ කාලයේ ප්‍රමාණය ගැන සඳහන් ලිඛිත ගිවිසුමක් ළඟ තබා ගන්න.

මුදල් වියදම් කිරීමෙන් තොරව ගුවන් විදුලි හෝ රූපවාහිනිය පාවිච්චි කිරීමට යෝජනා කිහිපයක් පහත දැක්වේ :

- ප්‍රාදේශීය වශයෙන් ගුවන් විදුලි හෝ රූපවාහිනී වැඩසටහනක් විකාශනය කරන කිතුනු පුද්ගලයන් හෝ ආයතන සමඟ සම්බන්ධතා ඇති කර ගන්න. ඔවුන්ගේ වැඩසටහන් තුළ රැස්වීම් ගැන නිවේදනය කරන මෙන් ඉල්ලන්න.

- ඔබත් සමාජ සේවයක් සිදු කරන බැවින්, පොදු කටයුතු ගැන දැනුම් දෙන විකාශන ආයතනයකට දැන්වීම් භාර දෙන්න.

- යම් ආයතනයකට පළමු රැස්වීමට පැමිණ එහි කොටසක් පටිගත කිරීමට හෝ එය සජීවීව විකාශනය කිරීමට යෝජනා කරන්න.

- ප්‍රාදේශීය වැඩසටහනක දී සංචාරක ධර්ම ප්‍රචාරකයකු ලෙස ඔබෙන් සම්මුඛ සාකච්ඡාවක් ලබා ගන්නා ලෙස යෝජනා කරන්න.

**විශේෂ ලිපි :** රජයේ හා ව්‍යාපාර වල නායකයන්ට හා සමාජයේ සෙසු අයට යැවිය හැකි විශේෂ ආරාධනා සහිත ලිපිය.

**දුරකථනය :** නගරයේ දුරකථන පහසුකම් තිබේ නම්, මුද්‍රිත දුරකථන නාමාවලියක පිටපතක් ලබා ගන්න. පොත කොටස් වලට කඩා විවිධ දේවස්ථාන අතර බෙදා දෙන්න. දේශීය ඇදහිලිවන්තයන්ට පෞද්ගලික දුරකථන ඇමතුම් මඟින් පුද්ගලයන්ට රැස්වීම් වලට ආරාධනා කරන්න යැයි පවසන්න.

**වාචික නිවේදන :** ප්‍රාදේශීය සමිති රැස්වීම්, පාසල්, සාමාජීය කටයුතු හා සභාවන් වලදී වාචික නිවේදන ඉදිරිපත් කළ හැකිය.

## රැස්වීමකට අවශ්‍ය මුදල්

සාමුහික රැස්වීම් වලදී දීමනා එකතු කිරීම පිළිගෙන තිබේ. නමුත් බොහෝ විට රැස්වීම් අවසන් වන තුරු ඒවා එකතු නොකළ යුතුය. විශේෂයෙන් පළමු රාත්‍රියේ දී එසේ නොකළ යුතුය. පළමුව මිනිසුන්ගේ හදවත් ඇද බැඳ තබා ගැනීම සඳහා දෙවියන්වහන්සේගේ බලය සමාජය පුරා පැතිරිය යුතුය. මිනිසුන් යේසුස්වහන්සේ නමැති යථාර්ථය අත් දුටු විට, දූෂ්‍යමාන ආරංචි, අපවාද හා මුදල් පිළිබඳ වැරදි ආරංචි වැනි දේවල් තුළින් සතුරාගේ බලයට රැස්වීම් විනාශ කළ නොහැක.

මුදල් විවෘත ලෙස ගනුදෙනු කළ යුතුය. මේ බව සහතික කිරීමට, මුදල් පරිපාලනයට ප්‍රාදේශීය කිතුනුවන්ගේ කමිටුවක් පත් කිරීම යෝග්‍යය. මුදල් ගණන් කිරීමට, වාර්තා කිරීමට හා රැස්කර තබා ගැනීමට කිසිදාක තනි පුද්ගලයෙකුට භාර නොදෙන්න. දීමනාවක් ගණන් කරන විට හා සෙසු ක්‍රියාවලියේ දී අවම වශයෙන් තිදෙනෙකුවත් සිටිය යුතුය. ප්‍රාදේශීය බැංකුවක් තිබේ නම්, රැස්වීම සඳහා ගිණුමක් විවෘත කිරීම නුවණට හුරුය.

රැස්වීම් සඳහා ලැබුණු හා වියදම් කරන ලද මුදල් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් තබා ගත යුතුය. ද්‍රව්‍ය සඳහා රිසිට්පත් පැවතිය යුතු අතර සහභාගිවන සියලු දේවගැතිවරුන්ට හා සභාවන්ට ඒ පිළිබඳ තොරතුරු ලබා ගත හැකි විය යුතුය. එකතු කරන ලද සම්මාදම් පහසුකම් සඳහා ගාස්තු, රැස්වීම් පිළිබඳ ප්‍රචාරණ කටයුතු, ශබ්ද විකාශන යන්ත්‍ර සඳහා ගෙවීම්, සහ ගමනාගමනය, නවාතැන් හා වෙනත් දෑ ආදිය උදෙසා යොදා ගත යුතුය.

## අවශ්‍ය පහසුකම් පිළිබඳ පෙර සූදානම

පළමු රැස්වීමට පෙර ඔබ විසින් සූදානම් කරගත යුතු දේවල් කිහිපයක් තිබේ. ඒ තුළ පහත දේවල් ඇතුළත් වේ.

### රැස්වීම් පවත්වන ස්ථානය :

රැස්වීම් පවත්වන ස්ථානයේ හා ඒ අවට ප්‍රදේශයේ බැනර්, පෝස්ටර් හෝ ලකුණු දැක්වීමෙන් එම ස්ථානය පැහැදිලිව දැක්විය යුතුය.

### වේදිකාව :

පහසුකම් ලබා දෙන ස්ථානයෙන් වේදිකාවක් ලබා නොදෙන්නේ නම් ඔබ එකක් ඉදිකළ යුතුය. කළ යුතු පළමු දෙය නම් එය ඉදිකරන ස්ථානය තීරණය කිරීමයි. සළකා බැලිය යුතු දේවල් කිහිපයක් පහත දැක්වේ :

1. ජනකාය කොපමණ විශාල වුවත් ඔවුන් ස්වභාවයෙන්ම වේදිකාව ඉදිරියේ රැස්වනු ඇතිද? වේදිකාව දෙපසට හා පිටුපසට යා නොහැකි පරිදි බාධා නොතැබුවහොත් මිනිසුන් ඔබ වටා හැම තැනම සිටිනු ඇති අතර එවිට ඔවුන් හැසිරවීම හා ඔවුන්ගේ අවධානය ලබාගැනීම අපහසු වනු ඇත.

2. රැස්වීම පවත්වන්නේ වැටකින් හෝ තාප්පයකින් වටවූ තැනක නම්, ප්‍රධාන දොරටුවට ප්‍රතිවිරුද්ධ දිශාවේ වේදිකාව ඉදි කිරීම වැදගත් වේ. එවිට රැස්වීම පවත්වන අතරතුර පැමිණෙන අය රැස්වීමට බාධාවක් නොවනු ඇත.

3. භූමිය සමතලා නොවේ නම් මිනිසුන්ට වේදිකාව හොඳින්ම දැකගත හැකි ස්ථානය ගැන ඔබ සැළකිලිමත් විය යුතුය. එම ස්ථානයේ ආසන නොමැති නම්, මිනිසුන්ට රැස්වීම් පවත්වන කාලය පුරා හිටගෙන සිටීමට සිදුවනු ඇති අතර බෑවුමක හෝ සමතලා නොවන තැනක සිටගෙන සිටීමට ඔවුන්ට අපහසු වනු ඇත.

4. ඔබ රැස්වීම් පවත්වන්නේ වෙළඳ සංකීර්ණයක හෝ උද්‍යානයක නම්, වාහන තද බදය නිසා ශබ්දය අඩුවෙන්ම ඇසෙන තැනක වේදිකාව ඉදිකිරීමට ඔබට අවශ්‍ය වනු ඇත. බොහෝ අවස්ථා වලදී, ලී දඬු සපයන්නන් වේදිකාව ඉදිකිරීමට නොමිළයේ ලී දඬු ලබා දෙනු ඇත. නොඑසේනම් ඔවුන් ඒවා කුලියට හෝ ණයට ලබා දෙනු ඇත. ඒවා රැස්වීමෙන් පසු ආපසු ලබා දෙන බැවින් මිළදී ගැනීමට වඩා මේ ක්‍රමය යොග්‍ය වේ. ලබා ගැනීමට හැකි නම් තෙල් සහ වෙනත් දියර වර්ග දමා තිබෙන බැරල් මත වේදිකාව ගොඩනැඟීම ගැන ඔබට සළකා බැලිය හැකිය. වේදිකාව මත සිටීමට බලාපොරොත්තු වන මිනිසුන් ගණන අනුව එහි ප්‍රමාණය තීරණය වේ. වේදිකාවේ දෙපසින්ම දේශනා කුඩුව වෙතට ඒමට පඩිපෙළවල් දෙකක් යෙදීමට මතක තබා ගන්න. රැස්වීමේ සිටින සෙනඟ අතරින් ගැළවීම, සුවය හා මිදීම ගැන සාක්ෂි දරන අයට මෙය ප්‍රයෝජනවත් වනු ඇත. මෙම පඩිපෙලෙහි ඉහළ පහළ යන පුද්ගලයන්ට උපකාර කිරීම සඳහා ශක්තිමත් අත්වැළක් පැවතීම අවශ්‍ය වනු ඇත. පටු ලී පටි එකට තබා ඇණ ගසා මෙම පඩි සාදාගත හැකිය.

## දේශනා කුඩුවට ආසන්න ප්‍රදේශය:

වේදිකාව ඉදිරියේ කෙලින්ම ඇති ප්‍රදේශය ලණුවකින් වෙන් කරන්න. මේ මඟින් මිනිසුන් වේදිකාවට වැඩිපුර සමීපවීම වලක්වන අතර පූජාසනය වෙත කරන කැඳවීම් වලට ප්‍රතිචාර දක්වන අයට ඉඩක් වෙන් කරනු ඇත. පූජාසනය වෙත කරන කැඳවීමක දී ඔබට සියලුම අය ඉදිරියට කැඳවීමට අවශ්‍ය නම් ඉවත් කළ හැකි වන පරිදි ලණුව නිර්මාණය කරන්න.

## විදුලි බලය :

ආලෝකය සඳහා හා විදුලි බලය සඳහා එකිනෙකට වෙනස් රැහැන් තබා ගන්න. එකම රැහැනකින් කටයුතු දෙකම සිදු නොකරන්න. බල ජනක යන්ත්‍ර සහ ස්විච් පෙට්ටිය කිසිවෙකුට ළඟා විය නොහැකි ස්ථානයක තබන්න.

## ශබ්ද විකාශන පද්ධතිය :

රැස්වීමට පැයකට හෝ පමණ පෙර ශබ්ද විකාශන පද්ධතිය හොඳින් පරීක්ෂා කර බලන්න. හදිසි අවස්ථාවක දී ප්‍රයෝජනයට ගැනීමට වැඩිපුර උපකරණ හෝ ඒවාට අවශ්‍ය කොටස් තබා ගත හැකි නම් වඩා යෝග්‍ය වේ.

## වෙන්කරන ලද ආසන :

වෙන් කරන ලද ආසන වෙනම ලකුණු කර තබන්න. උදාහරණයක් ලෙස, පාවිච්චි කරන භාෂාව නොතේරෙන අයට පරිවර්තනය උදෙසා ඔබට ආසන වෙන් කර තැබිය හැකිය. සංගීතඥයන්ට, ගායකයන්ට හෝ ගීතිකා කණ්ඩායමට කොටසක් අවශ්‍ය විය හැකිය. එසේම සේවකයන් උදෙසා ද ඔබට වෙන් කරන ලද ආසන පැවතිය හැකිය.

### වෙනත් සූදානම් වීම් :

සම්මාදම් එකතු කිරීමට අවශ්‍ය භාජන සහ උපකාරක සේවය සඳහා අවශ්‍ය බැජ්, තීරණ සටහන් කරන කාඩ්පත්, පත්‍රිකා ආදිය සූදානම් කර තබන්න.

## රැස්වීම් සඳහා සේවකයන් පුහුණු කිරීම

රැස්වීමට උපකාර කිරීමට ප්‍රාදේශීය ඇදහිලිවන්තයන් පුහුණු කිරීම තුළින්, ඔවුන් ප්‍රේක්ෂකයන් බවට පත් වීම වැළකේ. සිදු වන දේ බලා සිටිනු වෙනුවට ඔවුන් ආත්ම දිනා ගැනීමේ කොටසක් බවට පත්ව යාච්ඥා කර රැස්වීම් පැවැත්වීමට ඔබට ඇති වුවමනාව සමඟ එක් වනු ඇත.

### සේවකයන් බඳවාගැනීම :

රැස්වීමේ සේවකයන් රැස්වීම පවත්වන ප්‍රදේශයේ ඊට සහභාගි වන සභාවන්හි පරිණත ඇදහිලිවන්තයන් විය යුතුය. තම සභාවන්ගෙන් ඇදහිලිවන්තයන් බඳවා ගැනීම සඳහා සහ උපදේශකයන් ලෙස සේවය කිරීම සඳහා සභාපාලකවරු යොදාගත හැකිය. සභාවක් නොමැති ප්‍රදේශයක ඔබ රැස්වීමක් පවත්වන්නේ නම්, රැස්වීමේ සේවකයන් ලෙස පැමිණ උපකාර කිරීමට අසල්වැසි ප්‍රදේශයකින් ඇදහිලිවන්තයන් කණ්ඩායමක් බඳවා ගන්න.

### පුහුණු සැසි සැළසුම් කිරීම :

රැස්වීම් පටන් ගැනීමට දින දෙකකට පෙර පුහුණුව ලබා දීම සුදුසුය. එවිට එය එම පුද්ගලයාගේ මනසේ නැවුම්ව පවතිනු ඇත. පළමු රැස්වීම ප්‍රාදේශීය සභාවක හෝ රැස්වීම් ශාලාවක පැවැත්විය හැකි නමුත් සේවකයන් සිටිය යුතු ස්ථානයන් පිළිබඳ නියම අවබෝධයක් ලබා දීමට අවසන් සැසිය රැස්වීම් පවත්වන ස්ථානයේම පැවැත්විය යුතුය.

කෙනෙකු බොහෝ කාලයක් ඇදහිලිවන්තයෙක්ව සිටි පමණින් ඔහුට පුහුණුවක් අවශ්‍ය නොවේ යැයි අදහස් නොවේ. කිසිවෙකුට, “ඔබට කිරීමට අවශ්‍ය මොනවාදැයි මම දන්නවා, එම නිසා මම පුහුණු සැසි වලට පැමිණීම අවශ්‍ය නොවේ”යි පැවසීමට ඉඩ නොදෙන්න. ප්‍රාදේශීය සභාපාලකවරු හා රැස්වීමේ සේවකයන් වීමට කැමති සියලු දෙනා පුහුණුව ලැබිය යුතුය.

### සේවකයන් සූදානම් කිරීම :

බැජ් එකක් හෝ වර්ණ රිබන් පටියක් පැළඳීම මඟින් රැස්වීමේ සේවකයන් හඳුනාගත හැකි නම් එය පහසුවක් වනු ඇත. හැකි තරම් විනීත ලෙස ඇඳුම් ඇඳීමටත්, හැකි තරම් තමාගේම ලිංගයට අයත් අය සමඟ කටයුතු කරන ලෙසත් ඔවුන්ට උපදෙස් දෙන්න. රැස්වීම් ආරම්භ වන වේලාවට වඩා පැය එකයි භාගයකට පෙර ඔව්හු රැස්වීම් පැවැත්වෙන භූමියට පැමිණිය යුතුය.

මොවුන් සමඟ බයිබලයක් ද, නව ඇදහිලිවන්තයන්ගේ තොරතුරු ලබා ගැනීමට ඔබ කාඩ්පත් පාවිච්චි කරන්නේ නම් ඒවා සහ පෑන් හෝ පැන්සල් ද තිබිය යුතුය. ආර්ථික හැකියාවක් තිබේ නම් නව ඇදහිලිවන්තයන්ට ලබා දීමට යොහන් ශුභාරංචිය හා කිතුනු ජීවිතය පිළිබඳ උපදෙස් ආදිය අඩංගු පත්‍රිකා තිබේ නම් යෝග්‍ය වනු ඇත.

### උපදේශකයන් පුහුණු කිරීම :

සේවකයන්ට අනුශාසනය පිළිබඳ මූලික පුහුණුව ලබා දිය යුතුය. පුද්ගලයෙකු යේසුස්වහන්සේ වෙතට ගෙනෙන ආකාරය සහ මිදීම හා සුවය උදෙසා යාච්ඥා කරන ආකාරය ඔව්හු දැන සිටිය යුතුය. මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඔවුන් පුහුණු කිරීමට මෙම පාඨමාලාවේ කොටස් යොදා ගන්න. පාඩමේ “තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා” කොටසේ තවත් විස්තර සපයා තිබේ.

ගැළවීම උදෙසා වූ කැඳවීමට ප්‍රතිචාර දක්වන ගැළවීම නොලත් අයට මොවුන් සේවය කරනු ඇත. එසේම ඔවුන්ට යක්ෂ ආත්ම සහිත අයට ද සේවය කිරීමට සිදුවිය හැකිය. (සෙනඟ පාලනය කිරීම නමැති ඊළඟ කොටස බලන්න). ඔබ විශේෂ යාච්ඥාවන් තුළින් මෙහෙකරන අතරතුර උපදේශකයන්

තමා පත්කර ඇති අංශ වල අනෙක් සේවකයන් සමග සෙනඟගේ මිදීම හා සුවය උදෙසා යාච්ඤා කරනු ඇත.

## සෙනඟ පාලනය කිරීම :

මිනිසුන්ගේ හා කාන්තාවන්ගේ ආත්ම, සදාකාලික විනාශය නමැති ඉරණමින් මුදවා ගනිමින් ඔබ ආත්මික යුද්ධයක නියැලෙන බව මතක තබා ගන්න. ඔබ මහා පරිමාණයෙන් මෙය සිදු කරන විට යක්ෂ ආත්ම නිකරුණේ බලා නොසිටිනු ඇත.

ප්‍රථමයෙන්ම, ඔබට ශුද්ධාත්මයාණන්ගේ බලය තිබිය යුතු අතර, බාධාකාරී ආත්මයන් බැඳ දැමීමට ක්‍රිස්තුස්වහන්සේගේ නාමය පාවිච්චි කළ යුතුය. දෙවනුව ඔබ මෙම අවශ්‍යතාවය ඔබේ සේවකයන්ට පැවරිය යුතුය. අවධානය බිඳින හා බාධාකාරී දේවල් ගැන ඔවුන් නිරතුරුව අවධියෙන් සිටිය යුතු අතර එවැනි අවස්ථාවක දී කුමක් කළ යුතු දැයි දැන සිටිය යුතුය.

ප්‍රශ්නයක් ඇති වූ විට අවිනිශ්චිතව නොසිට ඉක්මනින් ක්‍රියා කිරීමට සේවකයන් පුහුණු කරන්න. ප්‍රශ්නය ඉබේම නවතිනතුරු බලා නොසිටින්න. මන්ද එය එසේ නොවේ. වෙනත් කෙනෙකු ප්‍රතිචාර දක්වන තුරු බලා නොසිටින්න. එය යක්ෂයාගේ ක්‍රියාවක් ලෙස ක්ෂණිකව හඳුනාගෙන ඒ සමඟ අවශ්‍යතාවය අනුව ගණුදෙනු කරන්න.

මෙහිදී වැදගත් වන්නේ දැනටමත් ඇති වී තිබෙන බාධාව තවත් වැඩි නොවන පරිදි ප්‍රශ්නය සමඟ ගණුදෙනු කිරීමයි. පවතින තත්වය වැඩි කරන කිසිවක් සිදු නොකරන්න. හැකි තරම් ඉක්මනින් වේදිකාව වෙත නැවත අවධානය ගෙනෙන ආකාරයකින් කටයුතු කරන්න.

බොහෝ විට තම ක්‍රියාවන් ආරම්භ කිරීමට සාතන් යක්ෂ ආත්මයක් සහිත පුද්ගලයෙකු යොදාගනු ඇත. බොහෝ අවස්ථා වලදී, සේවකයන් එම ස්ථානයේ ජනතාව මධ්‍යයේදීම ඔහු සමඟ ගණුදෙනු නොකර, ඔහු වෙනත් ස්ථානයකට ගෙන ගොස් යක්ෂ ආත්මය දුරු කළ යුතුවේ. වැදගත් දෙයනම් කුමක් සිදු කළත් එය හැකි තරම් ඉක්මනින් හා නිහඬව කිරීමයි. බාධාවන් එම ස්ථානයේ ඇති වන්නේ දෙවියන්වහන්සේ කරන දෙයට බාධා කිරීමට සාතන් ක්‍රියා කරන නිසා බව හඳුනා ගන්න.

සෙනඟ පාලනය කිරීමේ කොටසක් ලෙස, වේදිකාව හා එයට නගින පඩිපෙළ අසළ සිටීමට විශේෂ සේවකයන් පුහුණු කරන්න. එම සේවකයන් වේදිකාවට පැමිණීමට අවසර නැති පුද්ගලයන් නවත්වා, පැමිණීමට යුතු පුද්ගලයන්ට ළං වීමට උදව් කළ යුතුය. සේවකයන් සෙනඟ තුළින් ගෙන එන විවිධ හාස්කම් පිළිබඳ සාක්ෂි සහිත පුද්ගලයන් පිළිගෙන ඒවායේ සත්‍යතාවය තහවුරු කර ඔවුන්ව වේදිකාව වෙතට ගෙනයාම ඔවුන් විසින් සිදු කරනු ඇත.

වේදිකාව දෙපස ද සේවකයන් දෙදෙනෙකු තබා තිබිය යුතුය. ඔවුන් පුහුණු කළ යුතු වන්නේ පඩි පෙළ අසළ සිටින සේවකයන් විසින් ඉඩ හරින අය හැර සෙසු අය වේදිකාවට ඇතුළු වීම වැළැක්වීමටය. සාක්ෂි දෙන්නන්ගේ පෝලිම පිළිවෙළට තබා ගැනීම සඳහා තවත් සේවකයන් දෙදෙනෙකුවත් පත් කළ යුතුය.

සෙනඟ පාලනය කිරීමේ කොටසක් ලෙස, අසුන් ගැනීමට (ආසන තිබේනම්) මිනිසුන්ට උපකාර කිරීමට සහ දීමනා එකතු කිරීමටත් ඔබට සේවකයන් පුහුණු කිරීමට අවශ්‍ය වනු ඇත. බොහෝ පුද්ගලයන් වාහන වලින් පැමිණෙන්නේ නම්, ඒවා නැවැත්වීමේදී උපකාර කිරීමටත් සේවකයන් පුහුණු කිරීමට අවශ්‍ය වේ. වාහන නැවැත්වීමට ඇති ස්ථානය හා ඊට ඇති ප්‍රවේශ පිළිබඳව අධ්‍යයනය කර වාහන නැවැත්විය යුතු අයුරු පිළිබඳ සටහනක් සකස් කර ගන්න. සේවකයන්ට හා රැස්වීම් මෙහෙයවන කණ්ඩායමේ අයට වාහන නැවැත්වීමට ඔබ කොටසක් වෙන්කර තැබිය යුතුය. වාහන නැවැත්විය හැකි ස්ථාන සඳහා සලකුණු දමා හැකිනම් විදුලි ආලෝකය ද දමන්න. මිලේච්ච හැසිරීම් වලට එරෙහි ආරක්ෂාව සැපයීමට සූදානම් කරන්න. (මතක තබා ගන්න...ඔබ ආත්මික සටනක නිරත වේ.)

## ගැළවීම :

ඔබ යේසුස්වහන්සේ පිළිගැනීම උදෙසා කැඳවීමක් දෙන විට, තමන්ට භාරදී ඇති ප්‍රදේශය වෙත නැඟිට යාමට සේවකයන් පුහුණු කර තබන්න. යේසුස්වහන්සේ පිළිගැනීම උදෙසා වූ කැඳවීමෙන් අදහස් වන්නේ රැස්වීමේ සේවය උදෙසා වූ කාලය පැමිණි බවයි. මේ කාලයේ දී ඔබ පවසන දෙයට සම්පූර්ණ අවධානය ලබා දීමට සේවකයන් පුහුණු කරන්න. විවිධ අවස්ථා වලදී වෙනස් ලෙස සේවය කිරීමට

දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්විය හැකිය. එසේම ශුද්ධාත්මයාණන් ක්‍රියා කරන විට ඔබ සමඟ ක්‍රියා කිරීමට සේවකයන් සූදානම්ව සිටිය යුතුය.

සාමාන්‍යයෙන්, සාමූහික රැස්වීමක දී ප්‍රතිචාර දක්වන ප්‍රමාණය වැඩි බැවින්, සාමූහික යාච්ඤාවක් සිදු කර, ඔබ පැවසූ පසු සමාව ලබා ගැනීම උදෙසා පව්කාරයන්ගේ යාච්ඤාව පවසන ලෙස පැවසීම සුදුසුය. ගැළවීම ලැබූ පුද්ගලයෙකු ඉන් අනතුරුව ගොඩනඟනු ලැබීම යෝග්‍ය වේ. එම නිසා පහත කරුණු ඉටු වේදැයි විමසිලිමත් වන්න :

- උපදේශකයන් තීරණ සටහන් කිරීමේ කාඩ්පත් පිරවීම. ඒ තුළ නව ඇදහිලිවන්තයන්ගේ නම් සහ ලිපිනයන් සටහන් වන බැවින් ප්‍රාදේශීය සභාපාලකවරුන්ට ඔවුන් සමඟ සම්බන්ධ විය හැකිය.

නොඑසේනම්,

- ඊළඟ දිනයේ උදෑසන යේසුස්වහන්සේ පිළිගත් සියලු දෙනා උදෙසා රැස්වීමක් පවත්වන බව නිවේදනය කරන්න. එම රැස්වීම් වලදී, නව ඇදහිලිවන්තයන් ගොඩනැඟීම සිදු කළ හැකිය.

නොඑසේනම්,

- ගැළවීම සඳහා ප්‍රතිචාර දැක් වූ අය එම ස්ථානයේම ඇති අනුශාසනා ලබාදෙන කාමරයකට හෝ ප්‍රදේශයකට ගෙන යන්න. ඔවුන් සමඟ සේවකයන් ද එම ස්ථානයට ගොස් ඔවුන්ට තවත් උපදෙස් ලබා දී තීරණ සටහන් කිරීමේ කාඩ්පත් වල ඔවුන්ගේ නම් සහ ලිපිනයන් සටහන් කර ගනු ඇත.

ඔබ තීරණ සටහන් කිරීමේ කාඩ්පත් පාවිච්චි කරන්නේ නම්, ඒ තුළ පහත දේවල් සටහන් කිරීමට ඉඩ සැළසිය යුතුය.

- නම
- ලිපිනය
- දුරකථන අංකය

- ප්‍රතිචාරය : ඔවුන් පැමිණියේ ගැළවීම සඳහාද, ක්‍රිස්තුස්වහන්සේ තුළ වූ කැපවීම අලුත් කිරීමටද, මිදීම ලබන්නටද, සුවය ලබන්නටද ආදිය දැන ගැනීමට ඉඩක්

- යෝජනා : ගොඩනැංවීමේදී උපකාරී වියහැකි වැඩිපුර යෝජනා පිළිබඳව උපදේශකවරයාට සටහන් කිරීමට ඉඩක්

- අත්සන :උපදේශකවරයාට අත්සන් කිරීමට ඉඩක්

තීරණ සටහන් කිරීමට කාඩ්පත් පාවිච්චි කරන්නේ නම්, එය පුරවන අවස්ථාවේදීම එහි කාබන් පිටපතක් ලබාගත හැකිවන පරිදි හැකිනම් එය කොටස් දෙකකට සකස් කරන්න. මුල් පිටපත අදාළ පුද්ගලයා ගොඩනැංවීම උදෙසා ප්‍රාදේශීය සභාපාලකවරයෙකුට ලබා දිය හැකිය. සේවකයන්ට ද නව ඇදහිලිවන්තයන් ගොඩනැංවිය හැකිවන පිණිස පිටපත ඔවුන් ළඟ තබා ගත හැකිය. මෙම කාඩ්පත් පුරවන විට ඒවා පැහැදිලිව පිරවීමට ඔබේ සේවකයන් පුහුණු කරන්න. මෙම කාඩ්පත් එකතු කිරීමට හා ඒ සම්බන්ධ කටයුතු සඳහා වෙනම පුද්ගලයෙක් පත් කරන්න.

## සුවය හා මිදීම :

දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීම තුළින් ශුභාරංචිය පිළිබඳ දේශනාවන් සත්‍ය බවට සාක්ෂියක් වේ. මෙම පාඨමාලාවේ දෙවන කොටසේ දී ඔබ ඉගෙන ගන්නා ආකාරයට සුවය හා මිදීම ධර්ම ප්‍රචාරණයේ අනිවාර්යය කොටසක් වේ. ඇදහිලිවන්තයන්ගේ ඇදහිල්ල වර්ධනය කිරීම සඳහා, දේව වචනය ස්ථිර කිරීම සඳහා සහ නොඇදහිලිවන්තයන් ආකර්ෂණය කරගැනීම සඳහා රැස්වීම පවත්වන අවස්ථාවේදී දෙවියන්වහන්සේ කරන දේවල් ගැන සාක්ෂි බෙදා ගැනීම උපකාරී වේ. බොහෝ ගැළවීම නොලත් පුද්ගලයන් විශ්වාස කරමින් නොපැමිණෙන බව මතක තබා ගන්න. ඔවුන් උපහාසාත්මකව අවිස්වාසයෙන් බලන්නාවූ අය වේ. දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වීමක් දකින්නට නොලැබේ නම් ඔවුන් උපහාසාත්මකව අවිශ්වාසයෙන් හැරී යනු ඇත.

ඔබ සුවය හා මිදීම උදෙසා යාච්ඤා කරන විට, තම දෑස් විවර කරගෙන යාච්ඤා කිරීමට සේවකයන් පුහුණු කරන්න. ඔබ යාච්ඤා කරන විට, සුවය අවශ්‍ය ස්ථානයට තම අත තබන ලෙස මිනිසුන්ට පවසන්න. යාච්ඤාවෙන් අනතුරුව, තමාට පෙර කිරීමට නොහැකි වූ යමක් කිරීමට උත්සාහ කරන ලෙස ඔවුන්ට පවසන්න. මිනිසුන් තමාට සුවය අවශ්‍ය ස්ථානයට අත තබන විට සහ යාච්ඤාවෙන් අනතුරුව ඔව්හු ඇදහිල්ලෙන් ක්‍රියා කරන විට, ඔවුන් දෙස බලා සිටින ලෙස සේවකයන් පුහුණු කරන්න. ඉන් අනතුරුව සේවකයන්ට මෙම මිනිසුන් වෙත ළඟා වී ඔවුන්ගේ සාක්ෂි ලබාගත හැකිය.

(ඔබ සේවකයන් පුහුණු කරන විට, සුවය හා මිදීම උදෙසා සැබවින්ම යාච්ඤා කරන්න. බොහෝ අවස්ථාවලදී පුහුණු සැසි වලදී සුවවීම් සිදු වනු ඇත). පුහුණු සැසි වලදී, අන්ධ පුද්ගලයෙකුට ඇඟිලි පෙන්වා ගණන් කරන ලෙස පවසමින් ඔහු පරීක්ෂා කරන අයුරු පෙන්වන්න. බිහිරි පුද්ගලයෙකුට, තමාගේ පිටුපසින් ඇසෙන හඬක් අනුකරණය කළ හැකිය. උදාහරණයක් ලෙස නිශ්චිත වාර ගණනක් අත්පුඩි ගැසීම. ක්ෂණිකව ස්ථිර ලෙස දැනගත නොහැකි අභ්‍යන්තර සුවවීම් වලට වඩා බිහිරන්, අන්ධයන්, ශරීරයේ ගෙඩි හා කොරුන් වැනි අයගේ දෘෂ්‍යමාන සුව වීම් තුළින් ඇදහිල්ල වර්ධනය වේ.

සුවය හෝ මිදීම අත්දුටු කෙනෙකු හමු වූ විට, එම පුද්ගලයාව පඩි පෙළ අසලට ගෙන එන ලෙස (එවන ලෙස නොව) සේවකයන් පුහුණු කරන්න. පඩි පෙළ අසල සිටින සේවකයන්ට ඔවුන් වේදිකාවට එවිය හැකි අතර ඔබට ඔවුන් සමඟ කතා කර දෙවියන්වහන්සේ විසින් සිදුකරන දේවල් පිළිබඳ සාක්ෂි බෙදාගත හැකිය. ඉන් අනතුරුව සේවකයන් නැවතත් සේවය කිරීමට හා සාක්ෂි ලබා ගැනීමට තමන්ව පත් කර ඇති ස්ථාන වෙත යා යුතුය.

### සේවකයන් සිටින ස්ථාන :

පළමු පුහුණු සැසියේ දී රැස්වීම පවත්වන ස්ථානයේ තමන් සිටිය යුතු ස්ථානය සේවකයන්ට පෙන්වීමට සටහනක් පාවිච්චි කරන්න. රැස්වීම් පවත්වන ස්ථානයේදීම පවත්වන දෙවන පුහුණු සැසියේ දී, සෑම සේවකයෙකුම එක් එක් රැස්වීමේ දී සැබවින්ම සිටිය යුතු ස්ථානයේ ඔවුන් හිඳුවන්න.

දේශනා කරන ප්‍රදේශය තුළ අතින් අත අල්ලාගෙන එම ස්ථානය ආවරණය කිරීමට ප්‍රමාණවත් තරම් පිරිසක් රඳවා ගන්න. සෙනඟ පාලනය කිරීමට සහ ඉදිරියට පැමිණෙන අයට සේවය කිරීමට ඔවුන් වැදගත් වනු ඇත.

පඩි පෙළ අසල සිටීමට හා වේදිකාව මත සිටීමට විශේෂයෙන් පුහුණු කරන ලද සේවකයන් එම ස්ථාන වල රඳවා සෙසු අය රැස්වීම් පවත්වන ස්ථානය පුරා බෙදා හරින්න. ඇතුළුවන හා පිටවන ස්ථාන අසල සහ විදුලි බල පද්ධතිය ආරක්ෂා කිරීමට සේවකයන් යෙදවීමට මතක තබා ගන්න.

## රැස්වීම මෙහෙයවීම

රැස්වීම මෙහෙයවීම සඳහා යෝජනා කිහිපයක් පහත දැක්වේ :

### රැස්වීම් ආරම්භ කිරීම :

රැස්වීම් ආරම්භ කිරීමට විනාඩි 30 කට පෙර විශේෂ සංගීත වාදනය කිරීමට සැලසුම් කරන්න. සංගීතය මඟින් එම ස්ථානයට පුද්ගලයන් ආකර්ෂණය කරගනු ඇති අතර දේව වචනය ලබා ගැනීමට දැනටමත් රැස්ව සිටින අයගේ හදවත් සූදානම් කරනු ඇත. ගායනා කළ යුතු ගීතිකා පිළිබඳව සංගීතඥයන්ට හා ගීතිකා ගායනා කරන අයට උපදෙස් දෙන්න. ප්‍රාණවත්, උද්යෝගිමත් හා ධර්ම ප්‍රචාරණයට සුදුසු ගීතිකා තෝරා ගන්න. භාවාත්මක ගීතිකා හෝ තේරුම් ගැනීමට ඉතා අසීරු ගීතිකා තෝරා නොගන්න. ගැළවීම නොලත් අය ආකර්ෂණය කර ගන්නා ජීවනය හා ජ්වලිත බව ප්‍රකාශ කරන ගීතිකා තෝරා ගන්න.

පළමු රාත්‍රියෙන් පසුව, ගැළවීම ලත්, සුවය ලත් හා මිදීම ලත් මිනිසුන් ඔබ සමඟ සිටිනු ඇත. රැස්වීම ආරම්භ කිරීමට පෙර විනාඩි 30 තුළ ඔවුන්ට සාක්ෂි දැරීමට අවස්ථාව දෙන්න. ඔබ ඔවුන්ගෙන් පැහැදිලි ප්‍රශ්න අසන්න. එමගින් වෙන කෙනෙකු රැස්වීම පාලනයට ගැනීම වැළැක්වීය හැක. (සාතන්ගේ තවත් බාධාකාරී උපක්‍රමයකි)

## වචනය බෙදා ගැනීම :

රැස්වීම් නියමිත වේලාවට ආරම්භ කරන්න. මූලික වැඩ කටයුතු අවම වේලාවකින් අවසන් කරන්න. ධර්ම ප්‍රචාරණ රැස්වීමක අරමුණ යේසුස්වහන්සේ උදෙසා මනුෂ්‍යයන් දිනා ගැනීමය. එය සිදු කර ගැනීමට, දේව වචනය දේශනා කළ යුතු අතර දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ විය යුතුය. මිනිසුන් පැමිණ සිටින්නේ විශාල ආත්මික, ශාරීරික හා හැඟීම්වල අවශ්‍යතාවයන් සහිතව වේ. ඔවුන් පැමිණ සිටින්නේ නිවේදන, විහිලු, හැඳින්වීම් හා වෙනත් නොවැදගත් කථා වලින් යුතු වැල් වටාරම් ඇසීමට නොවේ.

ඔබ දේශනා කිරීමට පටන් ගැන්මට පෙර, දේශනාවෙන් පසුව ඔබ සුවය හා මිදීම උදෙසා යාච්ඤා කරන බව පවසන්න. බොහෝ විට බොහෝ අය පැමිණෙනුයේ සුවය ලබා ගැනීමට වන බැවින්, මෙසේ පැවසීමෙන් තොරව ඔබ දේශනා කිරීමට පටන් ගතහොත් ඔවුන්ට රැස්වීම් පිළිබඳ වැරදි වැටහීමක් ලැබී ඇතැයි සිතනු ඇත. දේශනාවෙන් පසුව ඔබ රෝගීන් උදෙසා යාච්ඤා කරන බව පැහැදිලිව පැවසුවහොත්, ඔබගේ දේශනාවට වඩා හොඳින් අවධානය ලැබෙනු ඇත.

## ගැළවීම උදෙසා වූ යාච්ඤාව :

දේශනාව අවසානයේදී, කතා කළ යුතු පළමු කරුණ ගැළවීමයි. ශරීරය සුව වීමට වඩා ආත්මය සුව වීම වැදගත් වන බව පවසන්න. ඔබ ඔවුන්ගේ ශරීර උදෙසා යාච්ඤා කරනු ඇති නමුත්, දෙවියන්වහන්සේ ඔවුන්ට ආත්මිකව සුවය දී යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේ තුළින් ඔවුන්ගේ පව් වලට සමාව දෙන මෙන් පළමුව ඔවුන්ගේ ආත්ම උදෙසා යාච්ඤා කිරීමට අවශ්‍ය බව පවසන්න.

සාමාන්‍යයෙන්, සාමූහික රැස්වීමක ප්‍රතිචාර දක්වන්නන්ගේ ප්‍රමාණය නිසා, සාමූහික යාච්ඤාවක් කර සමාව ලබාගැනීම උදෙසා පව්කරුවාගේ යාච්ඤාව පවසන ලෙස කීම යෝග්‍ය වේ. ඉන් පසුව මෙම පුද්ගලයන්ට ගොඩනැඟීමක් ලැබීම වැදගත් වේ. සේවකයන්ගේ පුහුණු සැසි යටතේ දී පැවසූ මෙන්, පහත දේවල් තුනෙන් එකක් සිදු වීම පිළිබඳව මතක තබා ගන්න :

- උපදේශකයන් තිරණ සටහන් කිරීමේ කාඩ්පත් පිරවීම. ඒ තුළ නව ඇදහිලිවන්තයන්ගේ නම් සහ ලිපිනයන් සටහන් වන බැවින් ප්‍රාදේශීය සභාපාලකවරුන්ට ඔවුන් සමඟ සම්බන්ධ විය හැකිය.

නොඑසේනම්,

- ඊළඟ දිනයේ උදෑසන යේසුස්වහන්සේ පිළිගත් සියලු දෙනා උදෙසා රැස්වීමක් පවත්වන බව නිවේදනය කරන්න. එම රැස්වීම් වලදී, නව ඇදහිලිවන්තයන් ගොඩනැඟීම සිදු කළ හැකිය.

නොඑසේනම්,

- ගැළවීම සඳහා ප්‍රතිචාර දැක් වූ අය එම ස්ථානයේම ඇති අනුශාසනා ලබාදෙන කාමරයකට හෝ ප්‍රදේශයකට ගෙන යන්න. ඔවුන් සමඟ සේවකයන් ද එම ස්ථානයට ගොස් ඔවුන්ට තවත් උපදෙස් ලබා දී තිරණ සටහන් කිරීමේ කාඩ්පත් වල ඔවුන්ගේ නම් සහ ලිපිනයන් සටහන් කර ගනු ඇත.

## සුවය හා මිදීම උදෙසා වූ යාච්ඤාවන් :

ගැළවීම උදෙසා වූ යාච්ඤාවෙන් අනතුරුව, සුවය සහ මිදීම උදෙසා යාච්ඤා කිරීම කළ යුතුය. සේවය කරන සෑම අවස්ථාවක්ම විශේෂිත විය හැකි නිසා ඇතැම් අවස්ථා වලදී සේවය කළ යුතු ආකාරය පිළිබඳව දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්වනු ඇත. සාමූහික රැස්වීමක් තුළදී සුවය උදෙසා යාච්ඤා කිරීම පිළිබඳ පොදු යෝජනා කිහිපයක් පහත දැක්වේ.

විශාල සෙනඟක් සිටින විට, එක් එක්කෙනාට යාච්ඤා කළ නොහැකිය. පළමුව විශේෂිත රෝග පිළිබඳ අවධානය යොමු කරමින් යාච්ඤාවන් කිහිපයක් කරන්න. සුවය ලැබූ අය අතරින් සාක්ෂි කිහිපයක් ඉදිරියට ගෙන එන ලෙස සේවකයන්ට පවසන්න. සාක්ෂි තුළින් රැස්ව සිටින අයගේ ඇදහිල්ල ධෛර්යවත් වනු ඇති අතර, ඉන් අනතුරුව සියලු ආකාර ආබාධ වලින් නිදහස් වීම උදෙසා ඔබට

අවසාන සාමූහික යාච්ඤාවක් කළ හැකිය. මෙම අවස්ථාවේදී ඔබ දෙවියන්වහන්සේගේ මඟපෙන්වීමට විවෘත වීම අවශ්‍ය බව මතක තබා ගන්න. ඒ සඳහා නිශ්චිත රටාවක් නැත.

### රැස්වීම අවසන් කිරීම :

රැස්වීම අවසන් කිරීමේදී, ඊළඟ රැස්වීම පවත්වන දිනය හා වේලාව සහ නව ඇදහිලිවන්තයන් උදෙසා වූ උදෑසන රැස්වීම පිළිබඳව නිවේදනය කිරීමට මතක තබා ගන්න. වේලාවන් හා ස්ථාන පිළිබඳ නිශ්චිත තොරතුරු ලබා දෙන්න.

## රැස්වීමෙන් පසු නව ඇදහිලිවන්තයන් ගොඩනැංවීමේ වැඩසටහන්

රැස්වීම් තුළින් හැරුණු හැම කෙනෙක්ම ගොඩනැංවිය යුතුය. මහා ආඥාව තුළ දක්වා ඇති "සියල්ල උගන්වමින්" යන කොටසට මෙය අයත් වේ.

ගැළවීම උදෙසා කළ කැඳවීමේදී පහත කරුණු දෙකෙන් එකක් සිදු විය:

1. නව ඇදහිලිවන්තයා තීරණ සටහන් කිරීමේ කාඩ්පතක් පිරවූයේය. මෙය සිදු කරනු ලැබුවේ දේශනා කුඩුව අසලදී හෝ විශේෂිත අනුශාසන කාමරයක් තුළදීය. ගොඩනැංවීමේ කාර්යයේ නියැලෙන ප්‍රාදේශිය සභාපාලකවරුන්ට මෙම කාඩ්පත් ලබා දිය යුතුය.

2. නව ඇදහිලිවන්තයන් උදෙසා උදෑසන පංතියක් පිළිබඳව නිවේදනය කරනු ලැබීම : උදෑසන පංති තුළදී නව ඇදහිලිවන්තයන් ගොඩනැංවීමේ කාර්යය ඉක්මනින් කළ යුතු අතර ප්‍රාදේශිය සභාපාලකවරු තුළින් තවදුරටත් ගොඩනැංවීම සඳහා ඔවුන්ගේ නම් සහ ලිපිනයන් සුරක්ෂිතව තබා ගත යුතුය.

ගොඩනැංවීමේ සේවයේ ආදර්ශ පාඨය විය යුත්තේ "කිසිදා අත්නොහරින්න" යන්නයි. නව ඇදහිලිවන්තයන් ප්‍රාදේශිය සභාවකට එකතු වන තුරු ඔවුන් අත් නොහරින්න.

මෙම පාඩමාලාවේ දහතුන්වන පරිච්ඡේදය තුළින් නව ඇදහිලිවන්තයන් ගොඩනැංවීමේ ඉගැන්වීම් පිළිබඳ තොරතුරු සපයයි.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සාමූහික රැස්වීමක ප්‍රතිලාභ විස්තර කරන්න.

3. වෙනම කඩදාසියක, පහත කරුණු පිළිබඳව පාඩම තුළ සාකච්ඡා කරනු ලැබූ තොරතුරු සාරාංශගත කරන්න.

- ආත්මික සූදානම
- රැස්වීම පවත්වන ස්ථානය
- පහසුකම් පිළිබඳ ගිවිසුම
- දින සහ වේලාවන්
- ප්‍රචාරණය
- මුදල්
- පහසුකම් පිළිබඳ පෙර සූදානම
- සේවකයන් පුහුණු කිරීම
- රැස්වීම් මෙහෙයවීම
- ගොඩනැංවීම

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. අල්තාරය වෙත කරන කැඳවීම් වලට ප්‍රතිචාර දක්වන අය සමඟ ගණුදෙනු කරන ආකාරය සම්බන්ධයෙන් සේවකයන් පුහුණු කිරීමට උපදෙස් කිහිපයක් පහත දැක්වේ.

   (1) කැඳවීමට ප්‍රතිචාර දක්වා ඇති පුද්ගලයාට (“ අනුශාසනා ලබන්නා”) ඔබව (අනුශාසනා කරන්නා) හඳුන්වා දෙන්න.

   (2) ඔබගේ කතා බහ අතරතුරදී ඔබට මතක තබා ගත හැකි වන පරිදි ඔහුගේ නම අසා සටහන් කර ගන්න. (තීරණ සටහන් කිරීමේ කාඩ්පතක් පාවිච්චි කරන්නේ නම්, කාඩ්පත මත එය සටහන් කර ගන්න. එසේ නොවේ නම් බලාගත හැකිවීම උදෙසා කඩදාසියක එය සටහන් කරන්න.)

   (3) “මේ රාත්‍රියේදී ඔබ අත එසවූයේ (හෝ ඉදිරියට පැමිණියේ) ඇයි?” දැයි ඔහුගෙන් අසන්න. මේ මඟින් අනුශාසනා ලබන්නට තම අවශ්‍යතාවය ඔබට පැවසීමට අවස්ථාව ලැබෙනු ඇත.

   (4) මෙම ප්‍රශ්නයට පිළිතුරු දීමෙන් පුද්ගලයෙකුට ඇති සියලුම ගැටලු ඉදිරිපත් කිරීමේ හැකියාවක් නොමැති නමුත්, දේව වචනය තුළ සෑම අවස්ථාවකට පිළිතුරක් තිබේ. ඔබට හැසිරවිය නොහැකි ප්‍රශ්නයකට හෝ අපහසුතාවයකට ඔබ මුහුණ දුන් විට ඔබට උපකාර කිරීමට දේව ගැතිවරයෙකුට හෝ වෙනත් සේවකයෙකුට හඬගසන්න.*

   (5) කිසිදිනක තීරණයක් ගැනීමට පුද්ගලයෙකුට බල නොකරන්න. දෙවියන්වහන්සේගේ ආත්මයාණන්ට ක්‍රියා කිරීමට ඉඩහරින්න.

   (6) කතා බහ තුළින් අනුශාසනා ලබන්නාගේ නිශ්චිත ආත්මික අවශ්‍යතාවයන් හඳුනා ගැනීමෙන් අනතුරුව, දේව වචනය තුළින් අනුශාසනා කර ඉන් අනතුරුව ඔහු සමඟ යාච්ඤා කරන්න. ඔහු ගැළවීම උදෙසාවූ කැඳවීමකට ප්‍රතිචාර දක්වා ඇත්තේ නම්, තම පව් වලට කමාව අයැද යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම උදෙසා පව්කරුවෙකුගේ යාච්ඤාව තුළින් ඔහුට මඟ පෙන්වන්න. ඔබගේ අනුශාසනා හැකිතාක් සරලව පවසන්න. (මිනිත්තු කීපයක් තුළදී කිතුනු ඇදහිල්ලේ සියලුම මූලධර්ම ඉගැන්වීමට උත්සාහ නොකරන්න !). ඔහුට සුවය හෝ මිදීම අවශ්‍ය නම් එය උදෙසා මෙහෙකරන්න.

   (7) අනුශාසනා ලබන අයට දීම සඳහා ඔබට ලබා දී ඇති මුද්‍රිත යමක්, එනම් යොහන් ශුභාරංචිය හෝ කිතුනු ජීවිතය ගත කිරීම පිළිබඳ තවදුරටත් විස්තර ඇතුළත් පත්‍රිකාවක් වැනි යමක් ඔහුට දෙන්න.

   (8) එම පුද්ගලයාට මෙහෙකර, අවසන්වූ විට, තීරණ සටහන් කිරීමේ කාඩ්පතෙහි සෙසු කොටස් පුරවන්න. ලිපිනය හා දුරකථන පිළිබඳ තොරතුරු පුරවන්න, ඉන් අනතුරුව සුදුසු තීරණය ඇතුළත් කොටුව තෝරන්න. (ගැළවීම, මිදීම, සුවය, වෙනත්.) අනුශාසනා ලද තැනැත්තා ගොඩනැංවීමේදී වැදගත් විය හැකි කරුණු සටහන් කරන්න.

   (9) තීරණ සටහන් කිරීමේ කාඩ්පත් එකතු කිරීමට පත් කර ඇති තැනැත්තාට එය භාර දෙන්න. එම කාඩ්පත පිටපත් දෙකකින් යුක්ත නම්, මුල් පිටපත භාරදී, ඔබ අනුශාසනා කළ පුද්ගලයා ඔබට තවදුරටත් ගොඩනැංවිය හැකිවන පිණිස එහි පිටපත ඔබ සමඟ තබා ගන්න.

   (10) පැය 48 ක් ඇතුළත ගොඩනැංවීම අරඹන්න. ඔහු පිළිබඳ සොයා බලන්න. ඔබ ප්‍රාදේශීය සභාවක සහභාගීත්වය දරණ තුරු “කිසිදා අත්නොහරින්න”

---

* සටහන - පුහුණු සැසි තුළදී, පොදු තත්වයන් සමඟ ගණුදෙනු කරන අයුරු ඔබට පුහුණු කළ හැකිය. උදාහරණයක් ලෙස, ගැළවීම, ගැළවීම පිළිබඳ සහතිකයක්, ඇබ්බැහි වීමකින් නිදහස ආදිය සොයා පැමිණෙන අය.

2. මෙම පරිච්ඡේදයේදී සළකා බලන ලද්දේ සාමූහික ධර්ම ප්‍රචාරණයේ පොදු ක්‍රමවේදයක් වන ධර්ම ප්‍රචාරණ රැස්වීම් පිළිබඳවය. ඔබ කණ්ඩායම් ධර්ම ප්‍රචාරණයේ යෙදෙන විට ඔබ කළ යුතු සියලුම දේවල් පිළිබඳව සාකච්ඡා කිරීමට අපට හැකියාවක් නැත. සම්මන්ත්‍රණ, සමුළු, පිබිදීම්, ප්‍රසංග ආදිය පැවැත්වීමට ඔබ තිරණය කළ හැකිය. ඕනෑම වර්ගයක රැස්වීමක් සංවිධානය කිරීම පිළිබඳ පොදු උපදෙස් කිහිපයක් පහත දැක්වේ.

(1) එම රැස්වීම සඳහා අරමුණක් ඇතිකර ගන්න: සම්මන්ත්‍රණය, සමුළුව, පිබිදීම, රැස්වීම ආදිය පැවැත්වීමේ අරමුණ කුමක්ද? සැළසුම සකස් කිරීමේදී එය ඔබට මඟ පෙන්වනු ඇත.

(2) ඒ සඳහා දින හා වේලාවන් නියම කරන්න.

(3) ස්ථානයක් තෝරා ගන්න. එහිදී සැළකිය යුතු කරුණු නම්:

- ප්‍රමාණය : ඔබ බලාපොරොත්තු වන මිනිසුන් සංඛ්‍යාවට එය ප්‍රමාණවත් විය යුතුය.

- පහසුකම් : ඔබගේ අවශ්‍යතාවයට ගැළපෙන පහසුකම් එහිදී තිබිය යුතුය. උදාහරණයක් ලෙස, ඔබ පළමුව විශාල කණ්ඩායමක් ලෙස රැස්වී පසුව කුඩා කණ්ඩායම් වලට බෙදී යාමට අපේක්ෂා කරන්නේ නම්, ඒ සඳහා එක් විශාල ශාලාවක් හා කුඩා කාමර කිහිපයක් පැවතිය යුතුය. ඔබ ආහාර පිස සංග්‍රහ කිරීමට බලාපොරොත්තු වන්නේ නම් ඒ සඳහා කුස්සියක් පැවතිය යුතුය.

- පිහිටීම : එය පොදු ප්‍රවාහන සේවයන්ගෙන් පහසුවෙන් ළඟා විය හැකි තැනක සහ ඔබ බලාපොරොත්තු වන පිරිසට ආසන්න ස්ථානයක පැවතිය යුතුය.

- වියදම : එය ඔබට දැරිය හැකි විය යුතුය.

(4) කමිටුවක් නිර්මාණය කර පහත දේවල් පිළිබඳ වගකීම පවරන්න:

- පොදු සම්බන්ධීකරණය : සම්බන්ධීකාරකවරයා අන් සියලු දෙනාගේ කටයුතු අධීක්ෂණය කරමින් ඊට සම්බන්ධ සියලු කොටස් සම්බන්ධීකරණය කරනු ඇත.

- කාර්ය සැළසුම් කිරීම :කාර්ය සැළසුම තුළ පහත දේවල් ඇතුළත් විය යුතුය:

  - අදාළ රැස්වීමට පෙර කළ යුතු සියලුම දේවල් : එය කළ යුත්තේ කවුරුන්ද කුමන අවස්ථාවේදීද?

  - අදාළ රැස්වීමේදී සිදු විය යුතු දේවල් : නියමිත දිනයේ දී අදාළ වේලාවන්වලදී සිදු විය යුතු දේවල් මොනවාද?

  - අදාළ රැස්වීමෙන් පසුව සිදු විය යුතු දේවල්.

- අයවැය : රැස්වීම සඳහා අයවැය සකස් කිරීම, මුදල් රැස්කිරීම, බිල්පත් ගෙවීම, රැස්වීමේදී සම්මාදම් රැස් කිරීම, හා ආරාධිත දේශකයන් සඳහා සම්මාදම් හෝ තුටු පඬුරු සූදානම් කිරීම.

- පහසුකම් සූදානම් කිරීම : එම ස්ථානය තුළ ඔබ විසින් සූදානම් කළ යුතු ඇතැම් දේවල් පැවතිය හැකිය : පුටු, වේදිකාවක්, මේස, සම්මාදම් රැස් කරන භාජන, මයික්‍රෆෝන, සංගීත භාණ්ඩ, දේශනා කුඩුව, ශ්‍රව්‍ය-දෘෂ්‍ය උපකරණ, අනුශාසනා හා ලියාපදිංචිය සඳහා අවශ්‍ය දේවල්.

- ලියාපදිංචි කිරීම : ඔබ පුද්ගලයන් ලියාපදිංචි කරන්නේද? එසේ නම් ලියාපදිංචි කිරීමේ අවස්ථාවේදී ලබා දිය යුතු දේවල් මොනවාද? ලියාපදිංචි කිරීම හසුරුවන්නේ කෙසේද? ලියාපදිංචියට ගාස්තුවක් අය කරනු ලැබේද? නම් සහිත බැජ් අවශ්‍ය වේද? ඔබට අවශ්‍ය වන පෝරම මොනවාද? කොපමණ පිරිසක් අවශ්‍ය වේද?

- ප්‍රචාරණය : ඔබගේ රැස්වීම ප්‍රචාරය කරන්නේ කෙසේද? විශේෂ ලිපි, දුරකථන දැනුම් දීම්, ගුවන් විදුලිය, රූපවාහිනිය, පුවත් පත්, පෝස්ටර්, ප්‍රාදේශීය සභාවන් තුළ කරන නිවේදන ආදිය හැසිරවීමට කෙනෙකු තෝරා ගන්න.

- උපදේශන : ආත්මික අවශ්‍යතා සහිත පුද්ගලයන්ට අනුශාසනා කරමින් උපකාර කිරීමට උපදේශකයන් පුහුණු කිරීමට කෙනෙකු පත් කරන්න. මෙම උපදේශකයන්, කෙනෙකු ක්‍රිස්තුස්වහන්සේ වෙත ගෙනෙන අයුරු, රෝගීන් උදෙසා යාච්ඤා කරන ආකාරය හා මිදීම ගෙන දෙන අයුරු දැන සිටිය යුතුය. ඔවුන් සමඟ බයිබල්, පත්‍රිකා හා ආත්මික උපකාරයන් සොයන අය පිළිබඳ තොරතුරු සටහන් කිරීමට නම් හා ලිපිනයන් සටහන් කරන කාඩ් පත් ආදිය තිබිය යුතුය. මෙම අවස්ථාවෙන් පසුව මෙම පුද්ගලයන් සමඟ සම්බන්ධ වීමට මෙම කාඩ්පත් උපකාරී වනු ඇත.

- ආරාධිත දේශකයන් : ඔබ ආරාධිත දේශකයන් ගෙන්වා ගන්නෙහිද? එය එසේනම් ඔවුන්ට ආරාධනා කිරීම, ඔවුන්ට කාලසටහනක් හා තොරතුරු සැපයීම, අවශ්‍ය නම් ප්‍රවාහන හා නවාතැන් පහසුකම් සැපයීම හා ඒ කාලය තුළදී ඔවුන්ගේ පෞද්ගලික අවශ්‍යතා ආදිය සොයා බැලීම සඳහා කෙනෙකු පත් කළ යුතුය.

- සංගීතය : අවශ්‍ය සංගීත භාණ්ඩ සහ සංගීතඥයින් ලබා ගැනීමට, ගීතිකා කණ්ඩායමට මඟ පෙන්වීමට, විශේෂ සංගීත සැළසුම් කිරීමට හා සෙනඟ ගායනා වලදී මෙහෙයවීමට කෙනෙකු පත් කරන්න.

- ළමයින් බලා ගැනීම : එම අවස්ථාව අතරතුරදී ළදරුවන් හා කුඩා දරුවන් බලා ගැනීමට ඔබ කටයුතු කරන්නේද? එසේ නම්, අවශ්‍ය පහසුකම් සැපයීමට හා දරුවන් බලා ගැනීමට පුද්ගලයන් තෝරා ගැනීමටත් කෙනෙකු අවශ්‍ය වනු ඇත.

- වෙළඳ කටයුතු : බයිබල්, කිතුනු පොත්පත් හෝ කැසට්පට, ආහාර ආදිය විකිණීමට බලාපොරොත්තු වන්නේ නම්, ඒ සම්බන්ධව කටයුතු කිරීමට කෙනෙකු අවශ්‍ය වනු ඇත.

- ආසන පෙන්වන්නන් : පුද්ගලයන් අසුන් ගැන්වීම, දේවල් බෙදාහැරීමට හා එකතු කිරීමට, සම්මාදම් එකතු කිරීමට හා රැස්වීම් අතරතුර ඇතිවන ගැටලු විසඳීමට හා බාධාකිරීම් වැළැක්වීමට කෙනෙකු පත් කරන්න.

- ශබ්ද විකාශන : ඔබ මහා පරිමාණ යමක් සංවිධානය කරන්නේ නම්, ඔබට හොඳ ශබ්ද විකාශන පද්ධතියක් අවශ්‍ය වනු ඇත. මේ කටයුතු පිළිබඳ දැනුමක් ඇති සහ උපකරණ ඇති කෙනෙකු ඔබට මේ සඳහා අවශ්‍ය වනු ඇත.

- ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය පටිගතකිරීම් : ඔබ එම අවස්ථාව ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය ලෙස පටිගත කිරීමට බලාපොරොත්තු වන්නේද? එසේ නම්, පටිගත කිරීමට පුද්ගලයන්, පිටපත් සකස් කිරීම, අවශ්‍ය උපකරණ ලබා ගැනීම ආදිය සැළසුම් කිරීමට කෙනෙකු අවශ්‍ය වනු ඇත.

- සහභාගි වෙන අය : සහභාගී වෙන අය සම්බන්ධීකරණය කිරීමට ඔබට කෙනෙකු අවශ්‍ය වනු ඇත. උදාහරණයක් ලෙස, ප්‍රවාහන කටයුතු සැළසුම් කිරීමට, ආහාර හා නවාතැන් අවශ්‍ය නම් ඒවා සැළසුම් කිරීමට හා එම අවස්ථාවේදී ඇතිවන ප්‍රායෝගික ගැටලු වලදී පුද්ගලයන්ට උපකාර කිරීම මින් සමහරක් වේ.

- පසු කටයුතු : ඔබගේ දේවල් රැස් කිරීම, ස්ථානය පිරිසිදු කිරීම, උපකරණ රැස් කිරීම, උපකාර කළ අයට ස්තුති කිරීම හා නව ඇදහිලිවන්තයන් ගොඩනැංවීම පිළිබඳ කටයුතු මෙහෙයවීමට කෙනෙකු පත් කරන්න.

# දහතුන් වන පරිච්ඡේදය

## තිරණද? ගෝලයන්ද?

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "හැරෙනු ලැබූ පුද්ගලයා" යන්න නිර්වචනය කිරීමට
- "ගෝලයා" යන්න නිර්වචනය කිරීමට
- නව ඇදහිලිවන්තයෙකු ගොඩනැංවිමේදී ආවරණය කළයුතු කරුණු හයක් දැක්වීමට
- යේසුස්වහන්සේ පාවිච්චි කළ ගෝලත්වය පිළිබඳ ප්‍රතිපත්ති නවයක් හඳුනාගැනිමට
- ගෝලත්වයේ සැබෑ පරීක්ෂාව පැහැදිලි කිරීමට
- නව ඇදහිලිවන්තයෙකු ගොඩනැංවීම සඳහා එකෙහිණෙහිම සැලසුම් කිරීම
- නව ඇදහිලිවන්තයෙකු තව දුරටත් ගොඩනැංවීම සඳහා සැලසුම් කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **ඔහු එහි කලක් පසුකොට පිටත්ව පිළිවෙළින් ගලාතියේ සහ පිරිගියේ පළාත මැදින් ගොස් සියලු ගෝලයන් ස්ථිරකෙළේය. (ක්‍රියා 18:23)**
>
> **අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:22)**

### හැඳින්වීම

ඔබ බොහෝ විට මහා ආඥාව ගැන අසා තිබෙන නමුත්, යේසුස්වහන්සේ සැබවින්ම තම අනුගාමිකයන්ට භාර දුන් මෙහෙය ඔබට වැටහෙනවාද?

- අණ කළේ නව ඇදහිලිවන්තයන් ලබා ගැනීමට පමණක්ද ?
- ධර්ම ප්‍රචාරණ රැස්වීම් පැවැත්වීමට පමණක්ද?
- එය කෙනෙකු ස්වාමින්වහන්සේ වෙත දිනාගෙන ඉන්පසු වෙනත් කාරණා උදෙසා අවධානය යොමු කරන්නද?

අපි නැවත වරක් උන්වහන්සේගේ උපදෙස් කියවා බලමු :

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගේත් පුත්‍රයාණන්ගේත් ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බව්තිස්මකරපල්ලා. මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:19-20)**

ප්‍රමුඛත්වය ලබා දි ඇත්තේ සියලු ජාතීන් වෙතට ගොස්, ඔවුන්ට ශුභාරංචිය උගන්වා, ඔවුන් බව්තිස්ම කර යේසුස්වහන්සේ අණ කළ සියල්ල පිළිබඳ වැඩිදුරටත් ඉගැන්වීම සඳහාය. හැරීමෙන් අනතුරුව කරනු ලබන ඉගැන්වීම් වලින් තොරව ධර්ම ප්‍රචාරණය උදෙසා වූ කැඳවීම සම්පූර්ණ නොවනු ඇත.

## තිරණද? ගෝලයන්ද?

මෙම ආඥාව තුළ දෙආකාරයක ඉගැන්වීම් අන්තර්ගත වේ:

**පළමුව :** මිනිසුන් හා ස්ත්‍රීන් ගැළවීමට ගෙන ඒම උදෙසා ශුභාරංචිය ඉගැන්වීම වේ. ශුභාරංචියට ප්‍රතිචාර දක්වා, පාපය ගැන පසුතැවී නැවත ඉපදීම ලැබීමට නම් මිනිසුන්ට ශුභාරංචිය ඇසිය යුතුය :

> **එබැවින් නුඹලා ගොස්, සියලු ජාතීන් ගෝලයන් කරපල්ලා, පියාණන්ගෙත් පුත්‍රයාණන්ගෙත් ශුද්ධාත්මයාණන්ගෙත් නාමයට ඔවුන් බව්තීස්මකරපල්ලා. (මතෙව් 28:19)**

නව ඇදහිලිවන්තයන් “හැරෙනු ලැබූ අය” ලෙස හඳුන්වනු ලැබේ. හැරෙනු ලැබූ කෙනෙකු යනු ඇදහිල්ල තුළින් නැවත උත්පාදනය ලැබූ හා දේව රාජ්‍යයේ කොටසක් බවට පත් වූ යේසුස්වහන්සේ කෙරෙහි අදහන පුද්ගලයෙක්ය.

**දෙවනුව :** හැරීමෙන් අනතුරුව ඉගැන්වීම. කෙනෙකුට ශුභාරංචිය උගන්වා යේසුස්වහන්සේ වෙතට පැමිණීමෙන් පසුව, උන්වහන්සේ අනුගමනය කරන ආකාරය ඔවුන් ඉගෙන ගත යුතුය :

> **මා විසින් නුඹලාට අණකළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වාපල්ලා. මමද ලෝකාන්තිමය දක්වා සැම කල්හිම නුඹලා සමග සිටිමියි කීසේක. (මතෙව් 28:20)**

නව ඇදහිලිවන්තයන්ට යේසුස්වහන්සේ ඉගැන්වූ සියලු දේවල් ගැන උපදෙස් දිය යුතු බව මහා ආඥාව එළිදරව් කරයි. මෙම ක්‍රියාවලිය ඇතැම් විට “ගොඩනැංවීම” හෝ “ගෝලත්වය” ලෙස හඳුන්වයි.

සභාවන්හි නව ඇදහිලිවන්තයන් ගොඩනැංවීමට පාවුල් වගබලා ගත්තේය. ඔහු ක්‍රියා කළ අයුරු බයිබලයේ මෙසේ වාර්තා වේ...

> **ඔහු එහි කලක් පසුකොට පිටත්ව පිළිවෙළින් ගලාතියේ සහ පිරිගියේ පළාත මැදින් ගොස් සියලු ගෝලයන් ස්ථිරකෙළේය. (ක්‍රියා 18:23)**

> **අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනැයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:22)**

## ගෝලත්වය පිළිබඳ නිර්වචනය

“ගෝලයෙක්” යනු, මූලික කිතුනු ඇදහිල්ල මත පිහිටවනු ලැබූ සහ නව ඇදහිලිවන්තයන් ඇති කර ඔවුන් ගෝලයන් කිරීමේ හැකියාව ඇති ඇදහිලිවන්තයෙකි. “ගෝලයා“ යන වචනයේ අර්ථය සිසුවා, ශිෂ්‍යයා, අනුගමනය කිරීම තුළින් ඉගෙන ගන්න තැනැත්තා යන්නයි. එය මනසේ ඇති දැනුමට වඩා වැඩි යමකි. එය කෙනෙකුගේ ජීවන රටාව වෙනස් කරන ඉගැන්වීමකි. ගෝලත්වය යනු තොරතුරු ලබා දීම පමණක් නොව පුද්ගලයෙක් වර්ධනය කිරීමයි.

## තිරණයක ගැනීම/ ගෝලයෙක් වීම පිළිබඳ චක්‍රය

තිරණයක් ගැනීම යනු සැබෑ ගෝලත්වයේ පළමු පියවර පමණි. වෙනත් ඇදහිලිවන්තයන් ඇති කිරීමට සමත් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිව යුතු සාමාජිකයන් බවට පත් වීමට හැරෙනු ලැබූ අය තීරණ වලින් ඔබ්බට වර්ධනය විය යුතුය. නව ඇදහිලිවන්තයන් දිනා ගැනීම වැදගත් වේ. නමුත් යේසුස්වහන්සේ අනුගමනය කිරීමට හා ආත්මිකව නැවත ඵල දැරීමට පුද්ගලයන්ට ඉගැන්වීම ද එලෙසින්ම වැදගත් වේ. ඔබ පුහුණු කරන හැම කෙනෙක්ම අන් අය වෙනස් කර, ඔවුන් ගෝලයන් බවට පත්කර, අන්‍යයන් වෙත යාමට ඔවුන් පුහුණු කරනු ඇත. යේසුස්වහන්සේ විසින් පෙන්වා දුන් ගෝලත්වය පිළිබඳ බයිබලීය සැළසුම මෙයයි. උන්වහන්සේ දොළොස් දෙනෙකු තෝරාගත් සේක. ඔවුන් ගෝලයන් බවට පත්කළ සේක. එසේම අන්‍යයන් වෙත යාමට ඔවුන් පුහුණු කළ සේක.

ධර්ම ප්‍රචාරයේ හා ගෝලත්වයේ නොනවතින චක්‍රය පහත රූප සටහනින් දැක්වේ :

**නොනවතින චක්‍රය**

ධර්ම ප්‍රචාරණය

ගෝලයන් → ධර්ම ප්‍රචාරණය → නව ඇදහිලිවන්තයන්

ගෝලත්වය

ධර්ම ප්‍රචාරණය තුළින් නව ඇදහිලිවන්තයන් බිහි වේ. ගෝලත්වය තුළින් ධර්ම ප්‍රචාරණය කිරීම තුළින් නව ඇදහිලිවන්තයන් බිහි කිරීමට හා ඔවුන් ගෝලයන් කිරීමට සමත් ගෝලයන් බිහිවේ. චක්‍රය ඒ අයුරින්ම නොනැවති ක්‍රියාත්මක වේ.

## මුල් ගොඩනැංවීම

ක්‍රිස්තුස්වහන්සේ වෙතට හැරීමෙන් අනතුරුව නව ඇදහිලිවන්තයෙකුට පහත කරුණු පිළිබඳව ඉක්මනින් උපදෙස් ලබා දිය යුතුය :

### සහතිකය :

තම ගැළවීම පිළිබඳව සහතික කර ගැනීමට සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ සමඟ තම සම්බන්ධතාවය පිළිබඳ විශ්වාසයක් ඇති කර ගැනීමට නව ඇදහිලිවන්තයාට උපකාර කරන්න.

### ප්‍රසිද්ධියේ ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳව කියා සිටින්න :

තවත් ඇදහිලිවන්තයෙකු, ඥාතියෙකු හෝ මිතුරෙකු සමඟ තම නව අත්දැකීම බෙදා ගන්නා ලෙස නව ඇදහිලිවන්තයා ධෛර්යවත් කරන්න. ප්‍රකාශ කිරීම ගැළවීමේ අත්දැකීමේ වැදගත් කොටසකි.

> **කුමක්හෙයින්ද යේසුස්වහන්සේ ස්වාමින්වහන්සේයයි නුඹේ මුඛයෙන් ප්‍රකාශකරන්නෙහිනම්, දෙවියන්වහන්සේ විසින් උන්වහන්සේව මළවුන්ගෙන් නැගිටවූ බව සිතින් අදහන්නෙහි නම්, නුඹ ගළවනු ලබන්නෙහිය. මක්නිසාද මනුෂ්‍යයා ධර්මිෂ්ඨකම පිණිස සිතින් අදහාගන්නේය; ගැළවීම පිණිස මුඛයෙන් කියාදෙන්නේය. (රෝම 10:9-10)**

### ජලයෙන් බව්තිස්ම වීම :

ක්‍රියා පොතේදී, හැරීමෙන් අනතුරුව හැකිතරම් ඉක්මනින් නව ඇදහිලිවන්තයන් ජලයෙන් බව්තීස්ම කරන ලදි. ක්‍රියා 8,9 හා 16 වන පරිච්ඡේදවල මේ බව පෙන්නුම් කරන වාර්තා සඳහන්ය. *"ඇදහිල්ලේ පදනම"* ලෙස නම් කරන ලද හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව තුළ වතුර බව්තිස්මය පිළිබඳව විස්තරාත්මකව කරුණු දැක්වේ.

### ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම වීම :

හැරීමෙන් අනතුරුව ක්ෂණිකවම ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම වීමේ අත්දැකීම වෙත ඇදහිලිවන්තයන්ට මඟපෙන්වූ ආකාරය පිළිබඳ උදාහරණ කිහිපයක් ක්‍රියා පොත තුළ වාර්තා වේ. ක්‍රියා 8:14-17; ක්‍රියා 19:1-6 බලන්න. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ශුද්ධාත්මයාණන්වහන්සේගේ මෙහෙය"* නමැති පාඨමාලාව තුළ ශුද්ධාත්මයාණන්ගෙන් බව්තිස්ම වීම පිළිබඳ විස්තරාත්මකව කරුණු දැක්වේ.

### නිහඬ කාලයක් ගත කිරීම වර්ධනය කිරීම :

දිනපතා බයිබලය කියවා යාච්ඤා කිරීමේ පුරුද්දක් ඇති කර ගැනීමට නව ඇදහිලිවන්තයාව ධෛර්යවත් කළ යුතුය. ස්වාමින්ගේ යාච්ඤාවේ රටාව (ලූක් 11:1-4) ඔහුට උගන්වා යොහන් පොත කියවීමට ධෛර්යවත් කරන්න.

### ප්‍රාදේශීය සභාවක කොටසක් බවට පත්වීම :

නව ඇදහිලිවන්තයා දේශීය සභාවක සාමාජිකත්වය ලබා ගැනීම ඉතා වැදගත් වේ (හෙබ්‍රෙව් 10:25). ඔබ නව ඇදහිලිවන්තයෙකු ගෝලත්වයට පුහුණු කරන විට, ඔබ සභාපාලකයාගේ තත්වයට පත් නොවේ. දෙවියන්වහන්සේ සභාවන් තුළ සභාපාලකවරු පත්කර ඇත්තේ ඇදහිලිවන්තයන්ට දිගු කාලීන ආත්මික රැකවරණයක් ලබා දීම උදෙසාය. සෑම ඇදහිලිවන්තයෙක්ම සභාපාලකවරයෙකුගේ රැකවරණය ලද යුතුය.

නව ඇදහිලිවන්තයන්ට සභාවකට යාමට උපකාර කරන්න. ඔවුන්ට ප්‍රවාහන පහසුකම් ලබා දීමට හෝ ඔවුන් සමඟ දේවස්ථානය වෙත ඇවිදගෙන යාමට ඉදිරිපත් වන්න. ඔවුන් සභාවේ සෙනඟට හඳුන්වා දී ඔවුන් බයිබල් අධ්‍යයනයන්ට හා යාච්ඤා කාලයන්ට සහභාගී වන්නේදැයි පරීක්ෂා කර බලන්න.

හැරීමෙන් පසුව සිදු කෙරෙන ගොඩනැංවීමේදී මතක තබා ගත යුතු වැදගත් දෙය නම්, නව ඇදහිලිවන්තයා සභාවක් තුළ පිහිටුවන තුරු කිසිදා අත්නොහරින්න යන්නයි. ප්‍රාදේශීය සභාවක් නොමැති නම් එවැන්නක් පිහිටුවාලීම අවශ්‍ය වේ. මෙම පාඨමාලාවේ තුන්වන කොටස මෙය සිදු කිරීමට ඔබට උපකාරී වනු ඇත.

## දිගුකාලීන ගොඩනැංවීම

යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයන් අතර සම්බන්ධතාව අධ්‍යයනය කිරීමේදී, ගෝලත්වය පිළිබඳ ප්‍රතිපත්ති කිහිපයක් එළිදරව් වේ. නව ඇදහිලිවන්තයෙකු උදෙසා නොනවත්වා දිගුකාලීනව කරන ගොඩනැංවීමක දී මේවා වැදගත් වේ :

### 1. තෝරාගැනීම :

සෑම නව ඇදහිලිවන්තයෙකුම කවරෙකු හෝ තුළින් දිගුකාලීනව ගොඩනැංවිය යුතු නමුත්, ඔබට හැම කෙනෙක්වම ගෝලයෙකු කිරීමට නොහැකි වනු ඇත. ඔබ තනි පුද්ගලයෙක් වන බැවින් වරකට ඔබට ගෝලත්වයෙහි පුහුණු කළ හැක්කේ සීමිත පිරිසක් පමණි. යේසුස්වහන්සේ දිගුකාලීනව ගොඩනැංවීමට ඇතැම් අය තෝරාගත් සේක. අන් අයට තම නිවාස, ගම් හෝ ආගමික නායකයන් වෙත හැරී යන ලෙස පැවසූ සේක.

හැම විටම මුල් ගොඩනැංවීමේ කාර්යයට ඔබ යොමුවිය යුතු නමුත්, ස්වාමීන්වහන්සේ වෙත ඔබ දිනා ගන්නා හැම කෙනෙක්වම දිගුකාලීනව ගොඩනැංවීමට ඔබට හැකි නොවනු ඇත. ප්‍රාදේශීය සභාවන් තුළ ගෝලත්වය සිදු කළ යුත්තේ මේ හේතුවෙනි. සෑම නව ඇදහිලිවන්තයෙක්වම පරිණත ඇදහිලිවන්තයෙකු මඟින් ගොඩනංවන බවට සභාපාලකවරයා වග බලාගත යුතුය.

ඔබ දිගුකාලීනව ගොඩනංවන අය පිළිබඳව යාච්ඤා කරන්න. තවදුරටත් ගෝලත්වය පිළිබඳව ඉගැන්වීම සඳහා සභාපාලකවරු වෙත හෝ සභාවේ අන් අය වෙත යොමු කරන ලද අය උදෙසා යාච්ඤා කරන්න. ඔබට ධර්ම ප්‍රචාරකයෙකු වීමේ නායකත්ව දීමනාව තිබේ නම්, නව ඇදහිලිවන්තයන් දිගුකාලීනව ගොඩනැංවීම සඳහා ප්‍රමාණවත් කාලයක් එක් තැනක රැඳීමට ඔබට නොහැකි වනු ඇත. මෙම සේවය සඳහා ඔබ පාලකවරු හෝ නායකයන් තෝරාගත යුතුය.

### 2. සම්බන්ධතාවය :

යේසුස්වහන්සේ තම ගෝලයන් කැඳවූ පසු, තමා සමඟ ජීවත් වීමට ඔවුන්ට ආරාධනා කළ සේක. උන්වහන්සේ තම ගෝලයන් සමඟ තම ජීවිතය සමීප ලෙස බෙදාගත් සේක. විධිමත් සේවාවන් හි නිරත වූ අවස්ථාවන්හිදී මෙන්ම අවිධිමත් තත්වයන්හිදී ද උන්වහන්සේ ඔවුන් සමඟ කාලය ගත කළ සේක.

කමිටු රැස්වීම් තුළින් හෝ ඉරුදින නමස්කාර මෙහෙයන් තුළින් පමණක් ගෝලත්වය සිදු නොවේ. ඔබ ගෝලයන් බවට පත් කරන පුද්ගලයන් සමඟ සමීප සම්බන්ධතාවයක් පැවතිය යුතුය. ඔබ ඔවුන් සමඟ ඔබේ ජීවිතය බෙදාගත යුතුය.

## 3. කැපවීම :

යේසුස්වහන්සේ සමඟ පැවැත්වූ සම්බන්ධතාවය තුළින්, කැපවීම වර්ධනය විය. යේසුස්වහන්සේ තම ගෝලයන් කැඳවූයේ පුද්ගලයෙකු උදෙසා කැපවීමට මිස, නිකායකට හෝ සංවිධානයකට කැපවීමට නොවේ. එවැනි කැපවීමක් යනු දෙවියන්වහන්සේගේ වචනයට සහ උන්වහන්සේගේ පරමාර්ථවලට සම්පූර්ණයෙන් කීකරු වීමයි. (යොහන් 4:34; 5:30; 15:10; 17:4 සහ ලූක් 22:42 බලන්න). ගෝලයන් ඔබ මත යැපීමට ඉඩ නොහරින්න. කැපවීමේ ක්‍රියාවලිය තුළින් ඔවුන් දෙවියන්වහන්සේ මත යැපීමට සළස්වන්න.

## 4. දර්ශනය :

ආත්මික දර්ශනයක් ලබා දීම තුළින් යේසුස්වහන්සේ තම ඇදහිලිවන්තයන් උනන්දු කළ සේක. දෛනික චර්යාවේ යෙදීමට වඩා වැඩි කාර්යයකට උන්වහන්සේ ඔවුන් කැඳවූ සේක. (මතෙව් 4:19). විශ්වීය ආත්මික අස්වැන්නක් පිළිබඳ දර්ශනයක් උන්වහන්සේ ඔවුන්ට දුන් සේක (යොහන් 4:35). දේව වචනය පිළිබඳ එළිදරව්ව තුළින් උන්වහන්සේ ඔවුන්ට අභියෝග කළ සේක. (මතෙව් 13).

දර්ශනයක් නැති කල සෙනඟ හිතුවක්කාරවෙති (හිතෝපදේශ 29:18). ඔවුන්ට කිසිඳු මහපෙන්වීමක් හෝ පෙළඹවීමක් නැත. මෙහෙවර උදෙසා උනන්දු කිරීම සඳහා ආත්මික දර්ශනයක් සන්නිවේදනය කිරීමද ගෝලත්වය තුළ ඇතුළත් වේ. *"ආත්මික අස්වැන්න උදෙසා උපක්‍රම"* හා *"බයිබලීය දැක්මක් වර්ධනය කිරීම"* යන හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාවන්, නව ඇදහිලිවන්තයන් තුළ ආත්මික දර්ශනයක් ගොඩනැඟීමට ඔබට උපකාරී වනු ඇත.

## 5. උපදෙස් :

නව ඇදහිලිවන්තයන් උදෙසා වූ දිගු කාලීන ගොඩනැංවීම තුළ යේසුස්වහන්සේ අණ කළ සියල්ල පිළිබඳ උපදෙස් දීම ඇතුළත් වේ. පළමුව, ඔවුන්ට කිතුනු ඇදහිල්ල පිළිබඳ මූලික මූලධර්ම ලබා දිය යුතුය. *"ඇදහිල්ලේ පදනම"* නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව මේ අරමුණ උදෙසා උපකාරී වේ. හෙබ්‍රෙව් 6:1-3 මත පදනම්ව පහත කරුණු පිළිබඳ පහත උපදෙස් එහි අඩංගු වේ :

- මළ ක්‍රියාවන් උදෙසා පසුතැවීම.
- දෙවියන්වහන්සේ පිළිබඳ ඇදහිල්ල.
- බව්තීස්මය පිළිබඳ මූලධර්මය.
- අත් තැබීම.
- මරණයෙන් නැවත නැඟිටීම.
- සදාකාල විනිශ්චය.

මෙම මූලික කරුණු පිළිබඳ පුහුණුවක දී ශිෂ්‍යයන්ට *"රාජ්‍යයේ ජීවත්වීම"*, *"ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය"*, *"දෙවියන්වහන්සේගේ හඬ දැනගැනීම"*, *"ආත්මික සටන"*, *"නිර්මාණාත්මක බයිබල් අධ්‍යයන ක්‍රම"*, හා *"මූලික බයිබල් සමීක්ෂණය"* යන දේවල් ඉගැන්විය යුතුය. මේවා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ දෙවන මොඩියුලය තුළ ඇතුළත් පාඨමාලාවන් වේ.

උපදෙස් දීමේ අරමුණ ගෝලයා සම්පූර්ණත්වයට ගෙන ඒමයි. සම්පූර්ණත්වය යනු "පූර්ණ, නිමකරන ලද හා පරිණත බව" ගෙන දෙන ආත්මික පරිණත බවයි. සම්පූර්ණ කිතුනුවෙකු යනු තම ශරීරය, ප්‍රාණය හා ආත්මය ශුද්ධාත්මයාණන්ගේ පාලනයට යටත් කිරීම නිසා ආත්මික පරිණත බව ලබාගත් අයෙකි. "සම්පූර්ණත්වය" යන වචනය බයිබලයේ පාවිච්චි කර ඇති "පූජා කිරීම" හෝ "කැපකිරීම" යන වචන වලට ද සමාන වේ. "පූජාවීම" යන්නෙහි අර්ථය ශුද්ධකම වන අතර "කැප කිරීම" යනු ධර්මිෂ්ඨකම උදෙසා වෙන් කර තබනු ලැබූ යන්නයි.

සම්පූර්ණත්වය ස්ථර දෙකකින් සමන්විත වේ :

- ආරම්භ සම්පූර්ණත්වය, එනම් ගැළවීමේ අත්දැකීම තුළින් පව් සමාව ලැබීමයි.

- වර්ධනය වන සම්පූර්ණත්වය, එනම් ක්‍රිස්තුස්වහන්සේගේ ස්වරූපයට වෙනස් කරනු ලැබීමේ නොනවතින ක්‍රියාවලියයි. රෝම 7-8 පරිච්ඡේද; පිලිප්පි 3:12; 1 යොහන් 1:8-9 තුළ මෙය විස්තර කර තිබේ.

## 6. ප්‍රදර්ශනය :

යේසුස්වහන්සේ ඉගැන්වූයේ වාචික උපදෙස් දීම තුළින් පමණක් නොවේ. උන්වහන්සේ ඉගැන්වූ දේ ආදර්ශයෙන් පෙන් වූ සේක. උන්වහන්සේ සුවය ගැන ඉගැන්වූ අතර රෝගීන් සුව කිරීම තුළින් එය ආදර්ශයෙන් පෙන්වූ සේක. සාතන්ට එරෙහිව ඇදහිලිවන්තයන් සතු ආධිපත්‍ය ගැන උන්වහන්සේ ඉගැන්වූ අතර යක්ෂයන් දුරු කිරීම තුළින් එය ආදර්ශයෙන් පෙන්වූ සේක. දිළිඳුන් ගැන සැළකීම පිළිබඳව උන්වහන්සේ ඉගැන්වූ අතර සමූහයන්ට කන්න දීම මඟින් එය ක්‍රියාවට නැංවූ සේක.

ගෝලයන් ශිෂ්‍යයන් පමණක් නොව, දෙවියන්වහන්සේගේ බලය ඇසින් දුටු සාක්ෂිකාරයෝ ද වූහ. පසුව ඔවුන්ගේ ඉගැන්වීම් වලදී ඔවුන් පැවසුයේ "සාක්ෂිකරුවන් ලෙස අප ඇසූ හා දුටු දේවල්" (1 යොහන් 1:1) යනුවෙනි. යේසුස්වහන්සේ ජීවත් වූ ආකාරයෙන් ද උන්වහන්සේ තම ඉගැන්වීම් පෙන්නුම් කළ සේක. උන්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **මක්නිසාද මා නුඹලාට කළ ලෙස නුඹලාත් කරන පිණිස නුඹලාට ආදර්ශයක් දුනිමි. (යොහන් 13:15)**

## 7. සහභාගීත්වය :

හුදු දැනුම පමණක් ප්‍රමාණවත් නොවේ. ඵලදායි වීම සඳහා දැනුම ප්‍රායෝගිකව යෙදිය යුතුය. ගෝලයන් යේසුස්වහන්සේගේ ඉගැන්වීම් වලට සවන් දෙමින් බලය ප්‍රදර්ශනය කළ ආකාරය දෙස බලමින් සිටියේ නැත, ඔවුන් ද සහභාගී විය. ඉගෙනීම සහතික කිරීම උදෙසා විෂයක් ඉගැන්වීම පමණක් ප්‍රමාණවත් නොවේ. ඉගැන්වීම පමණක් හරියට පොතක් කියවමින් මොළයේ සැත්කමක් කිරීමට ඉගෙනීම හා සමානය. නව ඇදහිලිවන්තයන්ට තමා ඉගෙන ගන්නා දේවල් පිළිබඳ සැබෑ අත්දැකීමක් ලැබිය යුතුය. ශුභාරංචිය බෙදා ගන්නා ආකාරය, රෝගීන්ට යාච්ඤා කරන ආකාරය, යක්ෂයන් දුරු කරන ආකාරය ආදිය පිළිබඳව ඔවුන්ට අත්දැකීම් ලැබිය යුතුය. යේසුස්වහන්සේ ගෝලයන්ට එවැනි අවස්ථාවන් ලබා දුන් සේක. මාර්ක් 6:7-13 හා ලූක් 9:1-6 කියවන්න. තමන් ඉගෙනගත් දේවල් අත්දැකීම උදෙසා යේසුස්වහන්සේ තම ගෝලයන් පිටත් කර යැවූ සේක. ඔබගේ ගෝලයන් වචනය අසන්නෝ පමණක් නොවී එය පිළිපදින්නෝ වීම පිළිබඳව වගබලා ගන්න.

## 8. අධීක්ෂණය :

යේසුස්වහන්සේගේ ගෝලයන් තම මිෂනාරී ගමන් වලින් නැවත පැමිණි විට, යේසුස්වහන්සේ ඔවුන්ගේ උත්සාහයන් පිළිබඳ සමීක්ෂණයක් කළ සේක (ලූක් 9:10). මුළු පුහුණු කාලය තුළදීම යේසුස්වහන්සේ තම ගෝලයන් අධීක්ෂණය කළ සේක. ඔවුන් තම ගැටලු තුළ තනි කරනු ලැබුවේ නැත. ඔවුන් නිවැරදි කර, ඔවුන්ට තරවටු කර, ඔවුන් ධෛර්යවත් කළ සේක. ගෝලයන් ප්‍රශ්න වලට හා බාධාවන්ට මුහුණ දෙන විට, මෙම අභියෝග වලට මුහුණ දෙන ආකාරය ඔබ ඔවුන්ට ඉගැන්විය යුතුය.

## 9. පවරාදීම :

ගෝලත්වයේ අවසාන අදියර යේසුස්වහන්සේ තම ගෝලයන්ට ගෝලයන් ඇති කරන්නන් වීම පවරා දීමයි. ලෝකයේ ජාතීන් තුළ ආත්මික ගුණනයේ කාර්යය උන්වහන්සේ ඔවුන්ට දුන් සේක. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ තුන්වන මොඩියුලයේ පාඨමාලාවන් තුළින් ලබන පුහුණුව, ආත්මික ගුණනය ගැන ගෝලයන්ට උගන්වන අයුරු පිළිබඳව ඔබට උපකාරී වනු ඇත. හතරවන හා පස්වන මොඩියුලයන් තුළින් ඔවුන් වර්ධනය කරගෙන ඇති ආත්මික සම්පත් ක්‍රියාවේ යොදවන ආකාරය පෙන්වා දෙනු ඇත. ධර්ම ප්‍රචාරණයේ දී ඔවුන් පුහුණු කිරීමට මෙම පාඨමාලාවන් යොදාගන්න.

## ගෝලත්වයේ සැබෑ පරීක්ෂාව

ගෝලත්වයේ සැබෑ පරීක්ෂාව සිදු වනුයේ ඔබ ගෝලත්වයට පත් කළ අය සමඟ ඔබ නොසිටින විටය. ඔබ ඔවුන්ට ඉගැන්වූ දෙයට ඔවුන් විශ්වාසවන්ත වන්නේද? ඔවුන් ධර්ම ප්‍රචාරණය කර නව ඇදහිලිවන්තයන් හා ගෝලයන් බිහි කරන්නේද? එය එසේ නම්, ඔබේ ගොඩනැඟීම සාධාරණය :

> **ගෝලයා ගුරුවරයාට වඩා උතුම් නැත. නුමුත් සම්පූර්ණත්වයට පැමිණි සැමදෙනම තමුන්ගේ ගුරුවරයා මෙන් වන්නෝය. (ලූක් 6:40)**

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "හැරෙනු ලැබූ පුද්ගලයා" යන වචනයේ අර්ථය කුමක්ද?

3. "ගෝලයා" යන පදය නිර්වචනය කරන්න.

4. නව ඇදහිලිවන්තයෙක් මුලිකව ගොඩනැංවීමේදී උපදෙස් ලබා දිය යුතු කරුණු හයක් දක්වන්න.

5. යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයන් පිළිබඳ අධ්‍යයනයේදී එළිදරව් වන ගෝලත්ව ප්‍රතිපත්ති නවයක් හඳුනා ගන්න.

6. ගෝලත්වයේ සැබෑ පරීක්ෂාව කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. හරිලෙස ගොඩනැංවීමේ වැදගත් අංගයන් 1 තෙසලෝනික 1:2-9 හි දැක්වේ. යේසුස්වහන්සේ පිළිගැනීමෙන් අනතුරුව ඔබ මිනිසුන් ගෙන යාමට අවශ්‍ය ඉලක්කය 1 තෙසලෝනික 1:9 හි හඳුනාගන්න.

2. නව ඇදහිලිවන්තයන් සභාවේ සාමාජිකයන් මගින් දිගු කාලීනව ගොඩනැංවීම සඳහා "ආත්මික හදා වඩා ගැනීම" පිළිබඳව වැඩසටහනක් ඔබේ සභාව තුළ ආරම්භ කරන්න.

3. අපෝස්තළුවර පාවුල් තම ගෝලයන්ව ගොඩනැංවූ විවිධ ආකාරයන් හඳුනාගන්න.

| | |
|---|---|
| - ලිපි මඟින් : | 1 තෙසලෝනික 1:1 |
| - යාච්ඤා මඟින් : | 1 තෙසලෝනික 1:2; 3:10 |
| - තමා වෙනුවට නියෝජිතයන් යැවීම මඟින් : | 1 තෙසලෝනික 3:1-5 |
| - පෞද්ගලික සම්බන්ධතා තුළින් : | 1 තෙසලෝනික 2:18 |

4. ඔබ දේව වචනයේ එළිදරව්ව දෙස බැලූ කල යේසුස්වහන්සේගේ සැබෑ ගෝලයෙකුගේ චරිත ලක්ෂණ බොහොමයක් දැකිය හැකිය. නමුත් යේසුස්වහන්සේ විශේෂ චරිත ලක්ෂණ නවයක් විශේෂ කොට දැක්වූ සේක. ගෝලයෙකු යනු පහත ලක්ෂණ ඇති අයෙකි :

| | |
|---|---|
| (1) සියල්ල අත්හැර දමයි : | ලූක් 14:33 |
| (2) තමකමට මැරෙයි : | මතෙව් 16:24; ලූක් 14:27 |
| (3) යේසුස්වහන්සේ අනුගමනය කරයි : | මතෙව් 16:24 |
| (4) දේව රාජ්‍යයට මූලිකත්වය ලබා දෙයි : | මතෙව් 6:31,33 |
| (5) දෙවියන්වහන්සේගේ ප්‍රේමය පෙන්නුම් කරයි : | යොහන් 13:34-35 |
| (6) වචනය තුළ ස්ථිරව රැඳී සිටී : | යොහන් 8:31 |
| (7) කීකරුය : | යොහන් 8:31 |
| (8) සේවකයෙකි : | මතෙව් 10:25, 20:26-28 |
| (9) ඵල දැරීම තුළින් දෙවියන්වහන්සේ මහිමයට පත් කරයි. | යොහන් 15:8 |

5. ඔබගේ බයිබලයේ ලූක් 9:57-62 කියවන්න. මෙම කොටසේ දී ගෝලත්වය ලබා ගැනීමට කැමති මිනිසුන් තිදෙනෙක් යේසුස්වහන්සේ වෙත පැමිණෙයි. එක් එක් පුද්ගලයාට ගෝලත්වය උදෙසා වූ කැඳවීම තුළ ඇතුළත් වෙනස් කරුණු තුනක් යේසුස්වහන්සේ එළිදරව් කළ සේක:

**මිළයක් ගෙවිය යුතුය : ලූක් 9:57-58**

පළමු මිනිසා කැඳවන තුරු නොසිට යේසුස්වහන්සේ අනුව ගියේය. ස්ව උත්සාහයෙන් ගෝලයෙකු වීමට ඔහු වෙර දැරුවේය. "මා අනුව එන විට ඔබ මේවාට මුහුණ දිය යුතුය"යි යේසුස්වහන්සේ පැවසූ සේක. සැබෑ ගෝලත්වයට මිළයක් ගෙවිය යුතු බව උන්වහන්සේ පැහැදිලි කළ සේක. එය ස්ව උත්සාහයෙන් ලබාගත නොහැක.

**නියම ප්‍රමුඛතාවය : ලූක් 9:59-60.**

දෙවැනි මනුෂ්‍යයාට අනුගමනය කරන ලෙස යේසුස්වහන්සේ පැවසූ සේක. "අනුගමනය" යනු ඉදිරියෙන් යන තැනැත්තා පසුපස යෑමයි. ආදර්ශයක් අනුකරණය කිරීමයි. ඒ සඳහා විශ්වාසය හා කීකරුකම යන දෙකම අවශ්‍ය වේ. කැඳවීම හේතුවෙන් ගෝලයා තම පැරණි ජීවිතය අත්හැරිය යුතුය. මේ සඳහා අවශ්‍ය වන තීරණ, වෙන්වීම් හා කැපකිරීම ඔහු නොදනී. ලෝකයා සිතන ආකාරයට යේසුස්වහන්සේ අනුගමනය කරන්නා අනාරක්ෂිත ජීවිතයක් වෙනුවෙන් ආරක්ෂිත ජීවිතයක් අතහරී. කැපවීම කරනුයේ වැඩසටහනක් උදෙසා නොව, පුද්ගලයෙකු උදෙසාය. එම පුද්ගලයා ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

ලූක් පොතෙහි සඳහන් මෙම පරිච්ඡේදය තුළ, කැඳවීම උදෙසා එම පුද්ගලයාගේ ප්‍රතිචාරය වූයේ "ස්වාමීනි, පළමුකොට ගොස්..." යනුවෙනි. ඔහුට යේසුස්වහන්සේ අනුගමනය කිරීමට අවශ්‍ය වූ නමුත්, ඔහු ප්‍රමුඛත්වය දුන්නේ එයට නොවීය. තම අනුගාමිකයා තම දෙමාපියන්ගේ අවශ්‍යතාවයන් නොසළකා හැරිය යුතුයැයි යේසුස්වහන්සේ කිසිදාක යෝජනා නොකරයි (යොහන් 19:25-27). කතාව තුළ

අවධාරණය කර ඇත්තේ ප්‍රමුඛත්වය පිළිබඳ ගැටලුවකි. පළමුකොට තම පියා භූමිදාන කිරීමට මෙම පුද්ගලයාට අවශ්‍ය විය. යේසුස්වහන්සේ තමන් අනුගමනය කරන ලෙස පුද්ගලයෙකු කැඳවන තීරණාත්මක මොහොතේදී, එම කැඳවීමට දක්වන ප්‍රතිචාරයට ඉදිරියෙන් කිසිවක් නොපැවතිය යුතුය.

යේසුස්වහන්සේ අනුගමනය කිරීම යනු සෑම ගෝලයෙක්ම තම රැකියාව හා පවුලේ අය අත්හැරිය යුතුය යන්න මින් අදහස් නොවේ. මින් අදහස් වන දේ නම්, ඒ සඳහා ජීවන රටාවේ වෙනසක් අවශ්‍ය වන බවය. ඇතැම් අවස්ථාවලදී ඒ තුළ ශුභාරංචිය උදෙසා පවුල, රැකියා හා තමා ප්‍රේම කරන අය අත්හැරීමද ඇතුළත් විය හැකිය. යේසුස්වහන්සේ මඟ පෙන්වන ඕනෑම තැනකට ඔබ යා යුතුය. ගෝලත්වයට ප්‍රමුඛතාව දිය යුතුය.

**සම්පූර්ණ අරමුණු : ලූක් 9:61-62**

ලූක් 9:57-62 හි සඳහන් තෙවන පුද්ගලයාට යේසුස්වහන්සේ අනුගමනය කිරීමට අවශ්‍ය විය. නමුත් ඔහුට තමාගේම දේවල් රැසක් කිරීමට අවශ්‍ය විය. තම පවුලට සමුදීම සාමාන්‍ය දෙයක් විය. නුමුත් අනුගමනය කරන ලෙස ඔහුට කැඳවීම දී තිබුණේ යේසුස්වහන්සේය. ඔහුගේ ජීවිතයේ සැබෑ අරමුණ වූයේ කුමක්ද? ගෝලත්වය ද? තමාගේම කාරණා ඉටු කිරීමද? මෙම පුද්ගලයාගේ ජීවිතයේ පරමාර්ථය නියම ලෙස නොපැවතුණි. ඔහු තමාගේ දේවල් නිදහස් නොකර, පැරණි ජීවිතය හා යේසුස්වහන්සේ කැඳවූ නව ජීවිතය අතර මැදව් සිටියේය.

6. නව ඇදහිලිවන්තයෙකු ගොඩනැංවීමේ පළමු සැසිවාර තුන සඳහා සැළැස්මක් පහත දැක්වේ:

**පළමු සැසිය : (හැරීමෙන් පැය 24 ක් අතරතුර)**

- නව ඇදහිලිවන්තයාට කතා කර හමුවීම සඳහා ස්ථානයක් හා වේලාවක් සූදානම් කර ගන්න.

- පළමු රැස්වීමේදී, විවෘතභාවයේ හා මිත්‍රත්වයේ සම්බන්ධයක් ගොඩනඟා ගැනීමට උත්සාහ කරන්න. සාමාන්‍යයෙන් සැළසුම් කරගත් රැස්වීම් අතර මැදදී යම් ප්‍රශ්නයක් හෝ ගැටලුවක් ඇති වුවහොත් ඔබ වෙතට පැමිණිය හැකි ආකාරය ඔහුට පවසන්න.

- ඔහුට කිසියම් ප්‍රශ්නයක් තිබේදැයි විමසා ඊට පිළිතුරු දීමට උත්සාහ කරන්න.

- ගොඩනැංවීමේ දී ඔබගේ භූමිකාව හා ගෝලත්වය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

- මෙම පාඩම තුළදී සාකච්ජා කරන ලද, පහත සඳහන් මූලික ගොඩනැංවීමට ඇතුළත් අංග කෙරෙහි ඔහුට මඟපෙන්වන්න.

| | |
|---|---|
| - ගැළවීම පිළිබඳ සහතිකය. | - ශුද්ධාත්ම බව්තීස්ම වීම. |
| - ක්‍රිස්තුස්වහන්සේ ප්‍රසිද්ධියේ ප්‍රකාශ කිරීම | - මෙනෙහිකිරීමේ ජීවිතයක් ගොඩනැඟීම (ඔහුට බයිබලයක් ඇත් දැයි සොයා - බලන්න) |
| - ජලයෙන් බව්තීස්ම වීම. | - ප්‍රාදේශීය සභාවක සාමාජිකයෙකු වීම. |

- භාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඩමාලාවක් වන *"ඇදහිල්ලේ පදනම"* යන්නෙහි පිටපතක් ඔහුට ලබා දී පළමු පාඩම කියැවීමට උනන්දු කරන්න.

- එක්ව යාච්ඤා කරන්න.

- ඊළඟ සැසිය සඳහා වේලාව හා ස්ථානය සූදානම් කරගන්න.

**දෙවන සැසිය : (හැරීමෙන් සතියක් ඇතුළත)**

- *"ඇදහිල්ලේ පදනම"* හි පළමු පාඩම එක්ව නැවත මතක් කර ගන්න.
- ප්‍රශ්න තිබේදැයි අසා ඒවාට පිළිතුරු දීමට උත්සාහ කරන්න.
- *"ඇදහිල්ලේ පදනම"* හි දෙවන පාඩම කරන්න.
- "මුල් ගොඩනැංවීම" යටතේ විස්තර කරන ලද වැදගත් පියවරයන් හය තුළ ඔහුට තවදුරටත් මඟපෙන්වන්න.

- ඔහුට තිබුණු ඕනෑම නොවැටහෙන තැනක් හෝ සැකයක් වේ නම් එය බෙදා ගන්නා ලෙස පවසන්න.
- ඔබගේ සාකච්ජාව තුළ මතු වූ ප්‍රධාන කරුණු ආවරණය කරමින්, එක්ව යාච්ඤා කරන්න.

(ඊළඟ සැසිය සතියක කාලයක් තුළ පැවැත්විය යුතුය.)

**තෙවන සැසිය :**

- *"ඇදහිල්ලේ පදනම"* හි දෙවන පාඩම නැවත එක්ව මතක් කරගන්න.
- ප්‍රශ්න තිබේ දැයි අසා ඒවාට පිළිතුරු දීමට උත්සාහ කරන්න.
- *"ඇදහිල්ලේ පදනම"* හි තෙවන පාඩම උගන්වන්න.
- *"මුල් ගොඩනැංවීම"* යටතේ විස්තර කළ පියවරයන් හය තුළ ඔහුට තවදුරටත් මඟපෙන්වන්න.
- ඔහුට යම් නොවැටහීමක් හෝ සැකයක් ඇත්නම් බෙදාගන්නා ලෙස පවසන්න.
- ඔබගේ සාකච්ජාව තුළ මතු වූ විශේෂිත කරුණු ආවරණය කරමින් එක්ව යාච්ඤා කරන්න.

(ඊළඟ සැසිවාර වලදී තෙවන සැසියේ රටාව අනුගමනය කළ හැකිය. මාස දෙකක් අවසානයේ, "මුල් ගොඩනැංවීම" තුළ ඇතුළත් පියවර 6 පිළිබඳව ඔහුගේ ප්‍රගතිය සළකා බලන්න.)

# දහ හතර වන පරිච්ඡේදය

# ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් කිරීම

**අරමුණු :**

- ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.
- සැළසුම් කිරීමේ ප්‍රතිලාභ විස්තර කරන්න.
- සැළසුම් කිරීම බයිබලයට අනුකුල වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.
- ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් සකස් කිරීමට මෙම පාඩමේ දී ඇති ආදර්ශය යොදා ගන්න.

**ප්‍රධාන පදය :**

> **ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය; මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළසේක; වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද (ලූක් 4:18)**

## හැඳින්වීම

මුල් කාලීන සභාව මඟින් ලෝකය පුරා ධර්ම ප්‍රචාරණය කිරීමට යොදාගත් ප්‍රධාන උපක්‍රම දෙකක් ක්‍රියා පොත තුළ සඳහන් වන අතර ඒවා අද දවසටත් සුදුසු වේ. පළමු උපක්‍රමය නිරායාසයෙන් කරන්නාවු ධර්ම ප්‍රචාරණයයි. එහිදී ඇදහිලිවන්තයන් තමාට ලැබෙන අවස්ථාවන්ට ක්ෂණිකව ප්‍රතිචාර දක්වා නිරායාසයෙන් ශුභාරංචිය බෙදා ගනී. දෙවැන්න ධර්ම ප්‍රචාරණය උදෙසා වූ සැළසුම්ගත උපක්‍රමයයි. පාවුල්ගේ මිෂනාරී ගමන් සහ සභාවන් පිහිටුවීම සැළසුම්ගත උපක්‍රමය සඳහා සාක්ෂිය.

සියලුම ඇදහිලිවන්තයන් නිරායාසයෙන් ධර්ම ප්‍රචාරණය කිරීම උදෙසා වූ අවස්ථාවන් ගැන විමසිල්ලෙන් සිටිය යුතුය. නමුත් ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් කිරීම ඔබ විසින් සිතාමතා ගත යුතු පියවරකි. මෙම පාඩමේදී ධර්ම ප්‍රචාරණය උදෙසා සැළසුම් කළ යුත්තේ කෙසේදැයි ඔබ ඉගෙන ගනු ඇත.

## ආත්මික අස්වැන්න උදෙසා සැළසුම් කිරීම

සැළසුම් කිරීම බොහෝ දුරට ගොවිතැන් කිරීමට සමාන වේ. අනිශ්චිතව ගොවිතැන් කිරීමක් නැත. ගොවියන් ඇමරිකාවේ මිඩ්වෙස්ට් හිදී තිරිඟුද, ඉශ්‍රායෙලයේ දී දොඩම් ද පිලිපීනයේ දී සහල් ද වවනු ඇත.

මෙම සෑම ස්ථානයකම සමානතා ඇත. පැළ සිටවනු ලබන අතර පස, පොහොර, බීජ, ජලය, ආලෝකය, ලෙඩ රෝග, කෘමි උවදුරු හා උපකරණ වැනි පොදු සාධක තිබේ. එසේ නමුත් වගා කරනු ලබන දේ, ස්ථානය හා පවතින තාක්ෂණය වැනි කරුණු මත ගොවිතැන ඉතා වෙනස් වේ.

ආත්මික අස්වැන්නේදී ද එය එසේමය. ගොවියෙකුට අනිශ්චිතව වගා කළ නොහැකි සේම අනිශ්චිතව ධර්ම ප්‍රචාරණය තුළ නිරත විය නොහැකිය. සාර්ථක වීමට නම්, ඔබ පැහැදිලි සැළසුම්, ප්‍රමුඛතා, උපක්‍රම හා ක්‍රියා පැවරුම් ඇති කරගත යුතුය. ඔබ ඔබේ අරමුණ හා එම අරමුණ ඉටු කර ගැනීමේ සැළසුම දැන සිටිය යුතුය.

## සැළසුම් කිරීමේ ප්‍රතිලාභ

ශුභාරංචියේ හා ගොඩනැඟිලි, දේපළ, උපකරණ, මුදල් හා ඇදහිලිවන්තයන්ගේ දීමනා වැනි ඔබගේ භාරයේ ඇති සේවය උදෙසා වූ සම්පත් පිළිබඳ යහපත් ගබඩාකාරයන් වීමට සැළසුම් කිරීම ඔබට උපකාරී වනු ඇත. සැළසුම් කිරීම තුළින් ඔබට මඟපෙන්වීම ලැබෙන අතර, යහපත් තීරණ ගැනීමට, සේවයේ දී ප්‍රමුඛතා ඇතිකරගැනීමට උපකාරී වීම සහ විශ්ලේෂණය කිරීම තුළින් ගණන් දීමක් ද ඇති

කරයි. අර්බුදකාරී අවස්ථා වලට ප්‍රතික්‍රියා දක්වනු වෙනුවට තිරණාත්මක ලෙස ක්‍රියා කිරීමට එමඟින් ඔබට හැකියාව ලැබෙනු ඇත.

## සැළසුම් කිරීම බයිබලයට අනුකූල වේ.

දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම යටතේ සැළසුම් සකස් කළ පුද්ගලයන්ගේ කතාන්දර වලින් බයිබලය පිරී ඇත. නෝවා නැවක් සෑදීමට සැළසුම් කළේය. ආබ්‍රහම් තම සේවක එලියේසර්ට අරමුණක් ලබා දුන්නේය (උත්පත්ති 24). යෝසෙප් සාගත කාලය උදෙසා සැළසුම් කළේය (උත්පත්ති 41). ඉශ්‍රායෙල් ජාතිකයන් වහල්බවින් මුදා ගැනීමට සහ පූජාසනය ගොඩනැඟීමට මෝසෙස්ට සැළැස්මක් දී තිබුණි. පොරොන්දු දේශය අත්පත් කරගැනීමට යෝෂුවා විස්තරාත්මක සැළැස්මක් සකස් කළේය.

දාවිත් දේවමාලිගාව ගොඩනැඟීමට සූදානම් විය. හෙසකියා රජුට ඉශ්‍රායෙලය එක්සත් කිරීමට සැළැස්මක් වූ අතර නෙහෙමියා පවුර නැවත ගොඩනැඟීමට සැළසුම් කළේය. පැරණි ගිවිසුමේ ප්‍රොපේතවරු ජාතීන් උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැළැස්ම විස්තර කළ අතර එළිදරව් පොත අනාගතය උදෙසා වූ දෙවියන්වහන්සේගේ සැළැස්ම විස්තර කරයි.

සැළසුම් කිරීම ශුද්ධාත්මයාණන්ගේ නිදහසට බාධාවක් බව ඇතැම් අය විශ්වාස කරන නමුත් එය සත්‍යයක් නොවේ. ක්‍රියා 2 හි සඳහන් ශුද්ධාත්මයාණන්ගේ මහත් වැගිරීමෙන් අනතුරුව, කෙටි කලකින් ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීම යටතේ සැළසුම් කිරීම ආරම්භ විය (ක්‍රියා 6). මුල් කාලීන සභාව තුළ සිදු වූ භාස්කම් තුළින්, සැළසුම් කිරීම ශුද්ධාත්මයාණන්ගේ ක්‍රියාවන්ට බාධා නොවන බව නිශ්චිතවම පැහැදිලි වේ !

සැළසුම් කිරීම නමස්කාරයක් ලෙස සිදුවිය හැකිය. එහිදී ඔබ දෙවියන්වහන්සේගේ අරමුණ හා සැළසුම් දෙස බලමින් උන්වහන්සේගේ මඟපෙන්වීමට ඔබේ ආත්මය විවර කරමින් කාලය ගත කරයි. ඔබ යාච්ඤා කර දේව වචනය අධ්‍යයනය කර ශුද්ධාත්මයාණන්ගේ ආනුභාවය යටතේ සැළසුම් කරන විට එය ආත්මික ක්‍රියාවකි.

සැළසුම දෙවියන්වහන්සේට බාධා නොකරන නමුත් උන්වහන්සේ සමඟ සහයෝගයෙන් කටයුතු කරයි. ආයි හිදී යෝෂුවා විසින් කරන ලද සැළැස්ම මෙවැන්නක් සඳහා උදාහරණයකි (යෝෂුවා 8). ඔහුට සැළසුමක් තිබූ නමුත් (4 වන පදය) දෙවියන්වහන්සේගේ ආශ්චර්යවත් ක්‍රියාවට එය බාධාවක් නොවිය (18 වන පදය). අරමුණ ඉටු කර ගැනීම උදෙසා ස්වාභාවික සැළසුම හා අධි ස්වාභාවික ක්‍රියාව යන දෙකම එක්ව ක්‍රියා කළේය.

යේසුස්වහන්සේට සේවය උදෙසා සැළැස්මක් තිබුණි. ශුභාරංචිය දේශනා කිරීමට, රෝගීන් සුව කිරීමට, යක්ෂයන් දුරු කිරීමට හා දේව වචනය තහවුරු කරමින් භාස්කම් කිරීමට උන්වහන්සේ සැළසුම් කළ සේක. මනුෂ්‍ය වර්ගයාගේ පව් උදෙසා මැරී, සතුරාගේ ක්‍රියා විනාශකර බලයෙන් හා මහිමයෙන් යුතුව නැවත නැඟිටීමෙන් උන්වහන්සේ දෙවියන්වහන්සේගේ අරමුණ ඉටු කළ සේක.

> **ස්වාමීන්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය: මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළසේක: වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද (ලූක් 4:18)**

පාවුල් සැළසුම් සකස් කළේය. නොඑසේනම් ක්‍රියා 16:6-10 හි සඳහන් සිදු වීම වැනි අවස්ථා මඟින් ඒවා වෙනස් කිරීමට ශුද්ධාත්මයාණන්ට හැකි නොවනු ඇත. ක්‍රියා 1:8 හිදී යේසුස්වහන්සේ ධර්ම ප්‍රචාරණය උදෙසා පොදු සැළැස්මක් ලබා දුන් සේක. අප ධර්ම ප්‍රචාරය උදෙසා සැළසුම් කරන විට ඒ සඳහා විස්තරාත්මක කරුණු එක්කරනවා පමණි.

## සැළැස්මක් යනු කුමක්ද?

අනාගතයේ සිදු විය හැකි යමක් පිළිබඳව කරන ඕනෑම ප්‍රකාශනයක් ඇදහිල්ලේ ප්‍රකාශයකි. සැලසුම් යනු ඇදහිල්ලේ ප්‍රකාශනයන්ය. අනාගතය ගැන කිසිඳු ප්‍රකාශනයක් නොකිරීම ඇදහිල්ල නොමැති බව ප්‍රදර්ශනය කිරීමකි.


සැළැස්මක් යනු ධර්ම ප්‍රචාරණය උදෙසා ඔබගේ ඉලක්කයට ළඟා වන ආකාරය විස්තර කරන මාර්ගයකි. දෙවියන්වහන්සේගේ මනස හා ශුද්ධාත්මයාණන්ගේ කැමැත්ත සෙවීමට සැළසුම ඔබට බල

කරයි. දෙවියන්වහන්සේ ආඥා කරන්නේ කුමකටද? ඔබගේ ජීවිතය හා සේවය දෙවියන්වහන්සේගේ කැමැත්ත වෙත හැරවිය හැක්කේ කෙසේද? සැළසුම් තුළ යම් දේවල් අඩංගු වන බැවින්, ඔබ නොකළ යුතු දේවල් තීරණ කිරීමට එය ඔබට උපකාරී වනු ඇත.

*"අරමුණු තුළින් කළමණාකරණය"* නමැති හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව සැළසුම් කිරීමේදී ඔබට උපකාරී වනු ඇත. සමීක්ෂණය හා සැළසුම් කරමින් එසේ කිරීමට හේතු වූ කරුණ කිසිදාක ඉටු කර නොගනිමින් ඔබට ජීවිත කාලයම ගත කළ හැකි බව සැමවිටම මතක තබා ගන්න. ධර්ම ප්‍රචාරණය උදෙසා සමීක්ෂණ කිරීම හා සැළසුම් කිරීම පමණක් ධර්ම ප්‍රචාරණය කිරීම නොවේ.

## සැළසුම් කිරීම සඳහා ආදර්ශය

ධර්ම ප්‍රචාරණය සඳහා සැළසුම් කිරීමේදී ඔබට දිගින් දිගටම යොදා ගත හැකි ආදර්ශයක් පහත දැක්වේ :




මෙම ආදර්ශය ආරම්භ වන්නේ නිශ්චිත කණ්ඩායමක් උදෙසා දෙවියන්වහන්සේගේ උපක්‍රමය අප නොදන්නේය යන උපකල්පනය ඇතුවය. අපගේ කලින් තිබුණු සැළසුම් හා අදහස් පසෙක තබා ශුද්ධාත්මයාණන්ගේ මඟපෙන්වීමට විවෘත වීමට එය අපට උපකාර කරයි. දැන් ආදර්ශය පිළිබඳ කරුණු අධ්‍යයනය කරන්න :

### මෙහෙවරය තීරණය කරන්න :

අප විසින් නෙළා ගත යුතු ආත්මික අස්වැන්න බොහෝ ජාතීන් නමැති කුඹුරු වලින් සමන්විත වේ. ඔබගේ මෙහෙවරය කුමක්දැයි ඔබ නිශ්චිතව තීරණය කළ යුතුය. ඔබ ධර්ම ප්‍රචාරණය කිරීමට තැත් කරන්නේ කාටද? ඔවුන් ජීවත් වන්නේ කොහේද? ඔවුන්ගේ ස්වභාවය කවරාකාරද? භූගෝලීය පිහිටීම, සංස්කෘතිය හා භාෂාව යන කරුණු ඔස්සේ ආත්මික අස්වැන්න තීරණය කළ යුතුය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"පරිසර විශ්ලේෂණය"* නැමති පාඨමාලාව මෙහිදී ඔබට උපකාරී වනු ඇත.

### ධර්ම ප්‍රචාරණයට යොදාගත හැකි හොඳම මාර්ගය තීරණය කරන්න :

ධර්ම ප්‍රචාරණයට යොදාගත හැකි ක්‍රමවේද බොහොමයක් මෙම පාඨමාලාව තුළ විස්තර කර තිබේ. ඔබ ඔබේ මෙහෙවරය තීරණය කළ පසු, ඔබ ඉගෙන ගත් දේවල් මත පදනම්ව යාච්ඤාවෙන් යුතුව ධර්ම ප්‍රචාරණයට යොදාගත හැකි හොඳම මාර්ගය තීරණය කරන්න. ඔබේ උත්සාහයන් නාස්ති නොවන පිණිස එය ඉතා වැදගත් වේ. උදාහරණයක් ලෙස, රූපවාහිනී යන්ත්‍ර නොමැති ජනතාව වාසය කරන ප්‍රදේශයක් තුළ රූපවාහිනිය තුළින් ධර්ම ප්‍රචාරණය සාර්ථක නොවනු ඇත. සාක්ෂරතාවයක් නොමැති ප්‍රතිශතය ඉතා ඉහළ මට්ටමක ඇති ප්‍රදේශයක ලිඛිත ධර්ම ප්‍රචාරණය සාර්ථක නොවේ. ක්‍රමවේද තෝරා ගැනීම නමැති අංගය තුළ ඔබ විසින් කළ යුතු දේවල් තීරණය කිරීම මෙන්ම නොකළ යුතු දේවල් තීරණය කිරීම ද ඇතුළත් බව මතක තබා ගන්න.

## ධර්ම ප්‍රචාරණයේ උපක්‍රම තිරණය කරන්න :

ධර්ම ප්‍රචාරණය සඳහා ඔබ යොදාගන්නා උපක්‍රම මොනවාද? නිශ්චිත පුද්ගල කණ්ඩායමක් හෝ ප්‍රදේශයක් තුළ ධර්ම ප්‍රචාරණය කිරීමට ඔබ යොදා ගන්නේ කාවද? ඔබට ඇති මුදල් කොපමණද? ඔබට අවශ්‍ය ද්‍රව්‍යමය සම්පත් (උපකරණ, මුද්‍රිත මාධ්‍ය, වෙනත් එවැනි ද්‍රව්‍ය වැනි...) මොනවාද?

## ධර්ම ප්‍රචාරණය උදෙසා සැළැස්ම සකස් කරන්න :

ඔබගේ අරමුණ විය යුත්තේ ධර්ම ප්‍රචාරණය මිස ශිෂ්ටාචාරයක් ඇති කිරීම නොවේ. එය නිකායක හෝ සංවිධානයක නිති රීති ප්‍රචාරණය උදෙසා නොව, දේව රාජ්‍යයේ ශුභාරංචිය ප්‍රචාරණය කිරීම උදෙසා අවධානය යොමු කළ යුතු දෙයකි. සැළැස්මක් තුළ ඔබ ඉටු කර ගැනිමට බලාපොරොත්තු වන ඉලක්ක පිළිබඳ ප්‍රකාශයන් ඇතුළත් විය යුතුය. මෙම ප්‍රකාශයන් :

- ලිඛිත විය යුතුය

- ධර්ම ප්‍රචාරණයට අදාළ විය යුතුය.

- පැහැදිලිවම දක්වා තිබිය යුතුය.

- ඇදහිල්ල හා යථාර්ථය තුළ සමබරව දක්වා තිබිය යුතුය : ඒවා යාථාර්ථවත් නොවේ නම්, ඒවා ළඟා කරගත නොහැකිය.

- නිශ්චිත විය යුතුය : ඉතා අවිනිශ්චිත සැළසුම් ඉටු කර ගැනිම අපහසුය. ඔබගේ සැළැස්ම තුළ කවුරුන් කවර අවස්ථාවේදි කුමක් කළ යුතුද? යන්න හා එය කළ යුත්තේ කෙසේද යන්න සඳහන් විය යුතුය.

- මැනිය හැකි විය යුතුය : ඔබ සැළසුම ඉටු කරගෙන තිබේ දැයි දැන ගත හැකි විය යුතුය.

- ප්‍රමුඛත්වයන් අනුව සංවිධානය කර තිබිය යුතුය : සැළැස්මේ ඇතැම් කොටස් ඉටු කර ගැනිම සඳහා ඊට පෙර තවත් සමහර කොටස් ඉටුකරගත යුතුය. ඇතැම් අරමුණු අනෙක් අරමුණු වලට වඩා වැදගත් වේ.

## ධර්ම ප්‍රචාරණය උදෙසා වූ සැළැස්ම ක්‍රියාවට නංවන්න :

සැළසුම් කිරීමෙන් පමණක් ධර්ම ප්‍රචාරණ කාර්යය ඉටු නොවේ. ඔබ සැළැස්ම ක්‍රියාවට නැංවිය යුතුය. සැළැස්ම ක්‍රියාවට නැංවීම යනු සැළසුමට අනුව කටයුතු කිරීමයි. සැළැස්මක් ක්‍රියාවට නැංවීම තුළ පහත කරුණු ඇතුළත් වේ :

- සැළසුම ක්‍රියාවට නැංවීමට ජනතාව තෝරා ගැනිම.
- ඔවුන්ට සැළසුම සන්නිවේදනය කිරීම.
- සැළැස්මේ විවිධ කොටස් පිළිබඳ වගකීම් පවරා දීම.
- කටයුතු කිරීම සඳහා පුද්ගලයන් පුහුණු කිරීම.
- පුද්ගලයන්, සම්පත්, කටයුතු හා වෙනත් දෑ සංවිධානය කිරීම.
- කටයුතු සඳහා කාල සටහනක් සකස් කිරීම.
- අයවැය සකස් කිරීම.
- තිරණ ගැනිම.
- ප්‍රගතිය සළකා බැලිම.
- ප්‍රතිඵල ගණන් බැලිම.

## ධර්ම ප්‍රචාරණය සඳහා වූ සැළැස්මේ සාර්ථකත්වය මැන බැලිම :

ඔබ යමක සාර්ථකත්වය මැන බලන විට එය ප්‍රවේසමෙන් පරීක්ෂා කර එහි වටිනාකම සළකා බලයි. සාර්ථකත්වය මැන බැලිම යනු ධර්ම ප්‍රචාරණය නමැති අරමුණ ඉටු කර ගැනිම උදෙසා සැළැස්මක වටිනාකම තිරණය කිරීම සඳහා සැළසුම් පරීක්ෂා කර බැලිමේ ක්‍රියාවලියයි. අරමුණු තුළින් ඔබ කිරීමට අදහස් කරන දේ ප්‍රකාශ වේ. සාර්ථකත්වය මැන බැලිම ඔබ එම අරමුණු අත්පත් කර ගත්තේ දැයි

තීරණය කරයි. උත්පත්ති 1 දී දෙවියන්වහන්සේ පවා තම ක්‍රියාවන්ගේ සාර්ථකත්වය මැන බැලූ සේක. උන්වහන්සේ තමන්වහන්සේ මැවූ සියල්ල පරීක්ෂා කර බලා "ඒ යහපත්" බව ප්‍රකාශ කළ සේක. ඔබ අරමුණු නැවත සළකා බැලිය යුතු බව, අරමුණ උදෙසා ක්‍රියා කරන පුද්ගලයන් වෙනස් කළ යුතු බව, එය සම්පූර්ණ කළ යුතු දිනය වෙනස් කළ යුතු බව, ක්‍රමවේද වෙනස් කළ යුතු බව හෝ අයවැය නැවත සකස් කළ යුතු බව සාර්ථකත්වය මැන බැලීම තුළින් එළිදරව් විය හැකිය. ඔබ සැළැස්මක් සම්පූර්ණ කර ඇති විට, එහි සාර්ථකත්වය මැන බැලීම සඳහා පහත ප්‍රශ්න අසන්න :

- ඔබ ඉලක්කය වෙත ළඟා වූයේද?
- ඔබ අසාර්ථක වූයේ කොතැනද? ඇයි හා කෙසේද?
- ඔබ සාර්ථක වූයේ කොතැනද? ඇයි හා කෙසේද?
- ඔබට මීට වඩා වෙනස් ලෙස කිරීමට තිබුණු දේවල් මොනවාද? වෙනස් ක්‍රමවේද? වෙනස් පුද්ගලයන් ? වෙනස් සැළැස්මක්?
- මිනිසුන්, ද්‍රව්‍ය හා මුදල් යන සම්පත් බුද්ධිමත් ලෙස පරිහරණය කරනු ලැබුවේද?
- ඔබට මෙම සැළැස්ම නැවත යොදාගත හැකිද?
- නව සැළැස්මක් සකස් කිරීමේදී ඔබට උපකාර වන පිණිස මෙයින් ඔබට ඉගෙන ගත හැක්කේ මොනවාද?

---එසේනම් ධර්ම ප්‍රචාරණ චක්‍රය නැවත ආරම්භ කිරීමට ඔබ ඉගෙන ගත් දේ යොදා ගන්න.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සැළසුම් කිරීමේ ප්‍රතිලාභ විස්තර කරන්න.

3. සැළසුම් කිරීම බයිබලීය වන්නේ ඇයි දැයි පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. සැළසුම් කිරීම ගැන තව දුරටත් අධ්‍යයනය කිරීම සඳහා, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"අරමුණු තුළින් කළමණාකරණය"* නමැති පාඨමාලාව හදාරන්න.

2. ඔබගේ සමාජය උදෙසා ධර්ම ප්‍රචාරණය පිළිබඳ සැළැස්මක් සකස් කිරීමට මෙම පරිච්ඡේදය තුළ දී ඇති ආදර්ශය යොදා ගන්න.

3. ධර්ම ප්‍රචාරණය උදෙසා වූ යහපත් සැළැස්මක් තුළ, සැළසුම් කිරීම, සංවිධානය කිරීම, ගැටලු විසඳීම හා සාර්ථකත්වය මැන බැලීම ආදිය පිළිබඳ විවිධ ආකාරයේ රැස්වීම් අන්තර්ගත වේ. ඔබ විසින් පවැත්විය යුතු සියලුම ආකාරයේ රැස්වීම් පිළිබඳව අපට සාකච්ඡා කිරීමට හැකියාවක් නැත. නමුත් ඕනෑම ආකාරයක සැළසුම් කිරීමේ හෝ වෙළඳ රැස්වීමක් සඳහා පොදු උපදෙස් කිහිපයක් පහත දැක්වේ :

(1) රැස්වීම උදෙසා නිශ්චිත අරමුණක් තබා ගන්න : රැස්වීම අවශ්‍ය වන්නේ ඇයි? ඔබගේ අරමුණ කුමක්ද? ඔබට ළඟා කර ගැනීමට අවශ්‍ය මොනවාද?

(2) රැස්වීම උදෙසා න්‍යාය පත්‍රයක් සකස් කරන්න : වැදගත්කම අනුව ඔබ සාකච්ජා කිරීමට බලාපොරොත්තු වන කරුණු ලැයිස්තුගත කරන්න. සැමවිටම දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම ඉල්ලා යාච්ඤා කිරීමට කාලයක් ඇතුළත් කරන්න.

(3) රැස්වීම අවස්ථාවේදී ඔබ ළඟ තිබිය යුතු සියලුම දේවල් පිළිබඳ ලැයිස්තුවක් සකස් කරන්න : මේ තුළ පැන්සල්, කඩදාසි, වාර්තා, පෙන්වීමට ඇති දේවල් හා සාම්පල ආදිය රැස්වීමට පෙර සියලු ද්‍රව්‍ය සූදානම් කර ගන්න.

(4) රැස්වීම සඳහා දිනයක්, වේලාවක් හා ස්ථානයක් නියම කර ගන්න.

(5) රැස්වීමේ සිටිය යුතු යැයි ඔබ සිතන පුද්ගලයන් හඳුනා ගන්න : රැස්වීම පවත්වන දිනය, වේලාව, ස්ථානය හා එහි අරමුණ ඔවුන්ට දන්වන්න. යමක් රැගෙන ඒමට ඇති හැම කෙනෙක්ටම ඒ බව දැනුම් දෙන්න. උදාහරණයක් ලෙස, ඉදිරිපත් කිරීමක්, වාර්ථාවක්, ප්‍රගති සාරාංශයක් ආදිය.

(6) රැස්වීම නියමිත වේලාවට පටන්ගෙන වේලාවට අවසන් කරන්න.

(7) රැස්වීම මෙහෙයවීමට සභාපතිවරයෙක් පත් කරන්න.

(8) කතා කිරීමේ ක්‍රමවේදයක් අනුගමනය කරන්න : මිනිසුන් අත් එසවූ විට නායකයා ඔවුන්ට කතා කිරීමට අවස්ථාව ලබා දෙන්නේද? නොඑසේනම් විවෘත සාකච්ජාවක් පවත්වන්නේද?

(9) තිරණ ගැනීමට රටාවක් අනුගමනය කරන්න : සියලුම දේවල් පිළිබඳ පැහැදිලි අදහසක් ලැබෙන තුරු ඔබ යාච්ඤා කරනවාද? සැළකිය යුතු සියලු දෙනාට ඇහුම්කන් දුන් පසු සභාපාලකවරයා හෝ ආත්මික නායකයා තිරණ ගන්නේද?

(10) න්‍යාය පත්‍රය අනුව වැඩ කරන්න : වෙනත් සාකච්ජා නිසා එය බාධා ඇතිකර නොගනින්න.

(11) රැස්වීමේදී ගනු ලබන තිරණ සටහන් කරගන්න. විශේෂයෙන් පවරා දුන් කාර්යයන් සිදු කරන අය හා ඒවා ඉටු කළ යුතු දිනයන් සටහන් කරගන්න. රැස්වීමෙන් පසුව මෙම සටහන් නිසි පරිදි සකස් කර රැස්වීම සඳහා පැමිණි හැම කෙනෙකුටම පිටපතක් ලබා දෙන්න. ඔවුන් විසින් ඉටු කළ යුතු කාර්යයන් මතක තබා ගැනීමට මෙය ඔවුන්ට උපකාරී වනු ඇත.

# පහළොස් වන පරිච්ඡේදය

# ධර්ම ප්‍රචාරණය උදෙසා ජාලයක් ලෙස කටයුතු කිරීම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.
- "ජාලයක් ලෙස ක්‍රියාකිරීම" නිර්වචනය කිරීමට
- සභාව ජාලයක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්නට
- ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ශක්තිමත් බව සාකච්ජා කිරීමට
- ආත්මික දීමනාවල සහ ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ වැදගත්කම සාකච්ජා කිරීමට
- ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රතිඵලය වූ එක්සත් බව පැහැදිලි කිරීමට
- ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රායෝගික අදාළත්වය පැහැදිලි කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නුඹලා එක ප්‍රේමය ඇතුව, එකහව සිට, එක කාරණයම අභිප්‍රායකරගෙන එක්සිත්ව සිටීමෙන්, මාගේ ප්‍රීතිය සම්පූර්ණකරපල්ලා. පක්ෂවාදීකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකාරකමෙන්වත් කිසි දෙයක් නොකොට, එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා. නුඹලා එක් එක්කෙනා තම තමාගේම කාරණා නොව අනුන්ගේ කාරණාත් බලාපල්ලා. (පිලිප්පි 2:2-4)**

## හැඳින්වීම

ඔබ දැනටමත් මෙම පාඨමාලාව තුළින් ධර්ම ප්‍රචාරණය පිළිබඳව බොහෝ දේ ඉගෙන ගෙන ඇති අතර, ඇතැම්විට එම කාර්යයේ බරපතල බව දැනටමත් අන්සියල්ල අභිබවමින් ඔබ තුළ නැඟී සිටිනු ඇත. සැබවින්ම එය "මහ" ආඥාවයි !

නමුත් මෙම අභියෝගයට මුහුණ දෙන්නේ තනිවම නොවේ. ඔබ දෙවියන්වහන්සේගේ අස්වැන්නේ සේවකයන් සමූහයෙන් එක් කොටසක් පමණි. මෙම පරිච්ඡේදයේදී ධර්ම ප්‍රචාරණය උදෙසා අන් අය සමඟ ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ වැදගත්කම ඔබ ඉගෙන ගනු ඇත.

## ජාලයක් ලෙස ක්‍රියා කිරීම

ජාලයක් යනු සම්පූර්ණ යමක් සෑදීම සඳහා කොටස් රැසක් එකට එක් කිරීමය. සරලව දැක් වූ විට පොදු ඉලක්කයක් ළඟා කරගැනීමට එකිනෙකාට කතා කරමින්, අදහස්, තොරතුරු හා සම්බන්ධතා බෙදාගන්නා මිනිසුන් කණ්ඩායමකින් ජාලයක් සමන්විත වේ. විවිධ ප්‍රමාණයේ සෛල සමූහයක් සෘජුව හෝ වක්‍රව එකිනෙකට සම්බන්ධ වූ ගැට ගැසුණාවූ මාළු දැළකට ජාලයක් සමාන වේ. මනුෂ්‍ය ශරීරය ස්නායු, පේෂි හා රුධිරයෙන් සමන්විත ජාලයකි. පියාණන්වහන්සේ, පුත්‍රයාණන්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ද තිදෙනෙකුගෙන් සමන්විත දිව්‍යමය ජාලයකි.


අප ධර්ම ප්‍රචාරණය උදෙසා ක්‍රියා කරන විට, ලෝකයට ශුභාරංචිය ගෙන යාම නමැති පොදු අරමුණ ළඟා කර ගැනීම සඳහා අදහස්, තොරතුරු හා සම්පත් බෙදා ගැනීමට අප සෙසු ඇදහිලිවන්තයන්, සභාවන් හා කිතුනු සංවිධාන සමඟ කතා බහ කරන්නෙමු. කිසිදු නිකායක්, සභාවක් හෝ සේවා ආයතනයක් ලෝකයට ශුභාරංචිය ගෙන යාමට ස්වාමීන්වහන්සේ තෝරා ගත් එකම උපකරණය තමන් බව නොසිතිය යුතුය. එකිනෙකා සමඟ තිරස් ලෙස සම්බන්ධතා පවත්වන ජාලයන් සභාවේ සැකැස්ම තුළින් හෙළිවන දෙවියන්වහන්සේගේ සැළැස්ම වේ.

# සභාව ජාලයකි

සභාව යනු ජාලයක් ලෙස ක්‍රියා කිරීමට උදාහරණයකි. 1 කොරින්ති 12:4-31 කියවන්න. මෙම කොටස තුළ, සේවයේ දී හා මෙහෙවරයේ දී එක්ව ක්‍රියා කරන දීමනාලත් ඇදහිලිවන්තයන් ගෙන් සමන්විත එක්සත් ශරීරයක් ලෙස සභාව විස්තර කරයි. ස්වාභාවික ශරීරයේ මෙන්ම ආත්මික ශරීරය තුළ ද සෑම සාමාජිකයෙකුටම අරමුණක් තිබේ. එය ශරීරයේ සෙසු කොටස් සමඟ සහයෝගයෙන් හා සම්බන්ධීකරණයෙන් යුතු ක්‍රියාවකි. සභාව නමැති ජාලය පාලනය කරන බලවේගය දේව වචනය සහ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ මෙහෙය වීමයි.


## ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ශක්තිමත් බව

අන් අය සමඟ ක්‍රියා කිරීමේදී ඇති සම්බන්ධතාවය විස්තර කිරීමට මිනිසුන් විවිධ උදාහරණ පාවිච්චි කර තිබේ. ඇතැම් පුද්ගලයන් එකිනෙකට සම්බන්ධ වූ දම්වැල උදාහරණයක් ලෙස යොදා ගෙන ඇත :





ඔබ දම්වැලක පුරුක් මෙන් එක්ව ක්‍රියා කරන්නේ නම්, දුර්වලම පුරුක ඔබේ දම්වැලට බලපෑම් කරනු ඇත. දුර්වල පුරුක නිසා දම්වැල කැඩී යා හැකි අතර එවිට අන්‍යයන් අතර සම්බන්ධතාවය බිඳ වැටේ.

ඇතැම් අය නායකයා ඉහළින් ද සේවකයන් පහළින් ද සිටින පිරමීඩයක් ආකාරයේ ආකෘතියකට අනුව ක්‍රියා කිරීමට සංවිධානය වී තිබේ :





මේ ආකාරයේ සංවිධාන තුළ දම්වැල තුළ ඇති ගැටලුවම තිබේ. ඉහළ හෝ මධ්‍යම මට්ටමේ දී නායකත්වය අසාර්ථක වුවහොත්, හෝ පහළ ජනයා අසාර්ථක වුවහොත්, ක්‍රියාකාරීත්වයට බාධා ඇති වේ:




අවුරුදු ගණනාවක් තිස්සේ, සේවයේ කාර්යයන් කිරීම සඳහා අප මිනිසුන් සංවිධානය කළේ මේ ආකාරයටය. නමුත් මේ ආකෘතිය තුළින් සහයෝගයට වඩා තරඟකාරීත්වයක් ඇති වේ. ඉහළට යාම සඳහා මිනිසුන් අනෙක් අය පාගා නැඟී සිටී. සේවයේ කාර්යයන් සඳහා ඇදහිලිවන්තයන් සංවිධානය කළ යුත්තේ ජාලයක් සේ විය යුතුය. දම්වැල් පුරුක් හෝ පිරමීඩ සංවිධානය තුළ ඇති ගැටලු ජාලයක් තුළ ඇති නොවේ :

ජාලයක ආකෘතියක පිළිබඳ රූප සටහනක් පහත දැක්වේ :



ජාලයේ කොටසක් අසාර්ථක වුවද, ඒ වටා ඇති ජාලය තව දුරටත් ක්‍රියාත්මක වනු ඇත. ජාලය ක්‍රියාත්මක වනුයේ සභාව සමාන කරන ලද ස්වාභාවික ශරීරය ලෙසටම වේ. ඔබගේ මාපට ඇඟිල්ල ක්‍රියා විරහිත වුවහොත්, ඔබගේ සෙසු ඇඟිලි හෝ අනෙක් අත ඉන් ඉටු කර ගැනීමට අවශ්‍ය කාර්යයන් කිරීමට උපකාරී වනු ඇත.

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තුළ ද එය සත්‍යයකි. ඔබ අන්‍යයන් සමඟ ධර්ම ප්‍රචාරණය උදෙසා ජාලයක් ලෙස ක්‍රියා කිරීමේදී, ඔබේ දුර්වලතාවයන්හිදී ඔවුන් ඔබ ශක්තිමත් කරනු ඇත. ඔවුන්ගේ දුර්වලතා වලදී ඔබ ඔවුන් ශක්තිමත් කරනු ඇත. ජාලයක් ලෙස ක්‍රියා කිරීමේදී "ඉහළ" යාමට තැනක් නොමැති බැවින්, මිනිසුන් එකිනෙකා සමඟ තරඟ නොකරයි.

ජාලයකදී, ධර්ම ප්‍රචාරණයේ අරමුණ උදෙසා අප සම්පත් ඒකාබද්ධ කරන්නෙමු. අප කිසිවෙකුටවත් සියලුම ආත්මික දීමනා නොමැත. තනිව අපට ඇත්තේ සීමිත හැකියාවන් ප්‍රමාණයක් පමණි. එසේම අපට ඇත්තේ සීමිත කාලයක්, උපකරණ ප්‍රමාණයක්, අමුද්‍රව්‍ය ප්‍රමාණයක් හා මුදල් ප්‍රමාණයක් පමණි. නමුත් එක්ව ගත් කල ආත්මික අස්වැන්න නෙළීමට අපට බලවත් සම්පත් ප්‍රමාණයක් තිබේ.

ජාලයක් තුළ ඇති තවත් වාසියක් නම්, ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයෙන් පිට සිටින අය වෙතට ගොස් ඔවුන් සමඟ සම්බන්ධතා ඇති කර ගනිමින් ඔවුන් ද ජාලය තුළට ගෙන එන විට සැමවිටම ජාලය විශාල වීමයි. එසේම, ජාලයක් සැමවිටම ප්‍රමාණයෙන් විශාල වේ.

## ආත්මික දීමනා සහ ජාලයක් ලෙස ක්‍රියාකිරීම

සෙසු සාමාජිකයන් සේවයේ යෙදවීම උදෙසා හෝ ඒ සඳහා සූදානම් කිරීම උදෙසා දෙවියන්වහන්සේ සභාව තුළ විශේෂ නායකත්ව සේවයන් පත් කර ඇති බව එපීස 4:11-16 එළිදරව් කරයි. මෙම විශේෂ නායකත්ව දීමනාවන් නම් ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරු, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, පාලකවරුන් හා ගුරුවරුය.

මෙම නායකයන්ගේ කාර්යභාරය තම ආත්මික දීමනා හඳුනා ගැනීමට පුද්ගලයන්ට උපකාර කිරීම මඟින් සේවයේ කාර්යයන් උදෙසා මිනිසුන් සූදානම් කිරීමයි. බයිබලයේ සඳහන් "සූදානම් කිරීම" නමැති වචනය පැමිණෙනුයේ බිඳුණු අස්ථියක් සවි කිරීම හෝ අවසන්ධි වූ සන්ධියක් යළි සන්ධි කිරීම යන අර්ථය ඇති ග්‍රීක් වචනයෙනි. එහි අදහස ශරීරයට සාමාන්‍ය ලෙස ක්‍රියා කළ හැකි පරිදි වෙන් වූ කොටස් එක් කිරීමයි. ජාලයක් ලෙස ක්‍රියා කිරීමෙන් දෙවියන්වහන්සේ පත් කළ නායකයන් ඉවත් නොවේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වෙන් කරනු වෙනුවට, සේවයේ කාර්යය වන පොදු අරමුණ ඉටු කර ගැනීම සඳහා විවිධ පුද්ගල කණ්ඩායම් එක් කිරීම කිතුනු නායකත්වයේ වගකීමයි.

## ජාලයක් ලෙස ක්‍රියා කිරීම යනු එක්සත් බවයි.

බයිබලයේ මුල් භාෂාවන්ගෙන් ගත් කළ ග්‍රීක් බසින් එක්සත් බව යනු "ඒකත්වය සහ සම්මතිය" වන අතර හෙබ්‍රෙව් බසින් එය "එකට සම්බන්ධකිරීම" වේ. එක්සත්බව ඉතා බලවත් බලවේගයකි. දෙවියන්වහන්සේ බාබෙල් හි ක්‍රියාව විනාශ කර දැමූයේ මිනිසුන් අරමුණ උදෙසා එක්සත් වී සිටි බැවින් ඔවුන්ට කළ නොහැකි කිසිවක් නැති බව උන්වහන්සේ දැන සිටි බැවිනි (උත්පත්ති 11).

එක්සත් බව පිළිබඳ අගනාම උදාහරණය දෙවියන්වහන්සේය. පියාණන්වහන්සේ තමන් තුළත් තමා පියාණන්වහන්සේ තුළත් පවතින්නාක් මෙන්, ඇදහිලිවන්තයන්ද එක් කෙනෙකු මෙන් වන පිණිස යේසුස්වහන්සේ යාච්ඤා කළ සේක.

> **ඔවුන් සියල්ලන් ඒකත්වයක් වන පිණිස, පියවූ ඔබ මා තුළෙහිද මා ඔබ තුළෙහිද සිටින්නාක් මෙන්ම ඔබ මා එවූ බව ලෝකයා විශ්වාසකරන පිණිසත්, අප තුළ ඔවුන් ඒකත්වයක් වන පිණිසත් යාච්ඤාකරමි. (යොහන් 17:21)**

"ලෝකයා දැන ගන්නා පිණිස" යන්නෙන් අදහස් වනුයේ එක්සත් බවේ ප්‍රතිඵලය ධර්ම ප්‍රචාරණයට බලපෑමක් කරන බවය. ඇදහිලිවන්තයන් ජාලයක් ලෙස එක්සත් වීම ධර්ම ප්‍රචාරණය උදෙසා ස්වාමින්වහන්සේගේ යාච්ඤාවට පිළිතුරකි.

දේව ධර්මය පිළිබඳ මූලධර්ම වලට විවිධ නිකායන් විවිධ අර්ථ නිරූපණයන් ලබා දෙන බැවින්, එක්සත් බව මූලධර්ම කෙරෙහි අවධානය යොමු නොකළ යුතුය. කිතුනු සංවිධාන රැසක් ඇති බැවින් එය සංවිධානයක් මෙන් නොවිය යුතුය. අවධානය යොමු විය යුත්තේ ශුද්ධාත්මයාණන් මඟින් ඇති කරන ආත්මික එක්සත්භාවය කෙරෙහිය.

ජාලයක් ලෙස කටයුතු කිරීමේ අරමුණ මානුෂීය ආධිපත්‍යයක් යටතේ ඇති එක් ලෝක සභාවක් බිහි කිරීම නොවේ. නමුත් එය දෙවියන්වහන්සේගේ අරමුණ ඉටු කිරීමට බලාපොරොත්තු වන විවිධත්වය තුළින් ලැබෙන ඒකත්වයකි :

**එසේ කළේ කාලවල සම්පූර්ණකමේ නියමය ලෙස ස්වර්ගයෙහි දේවල්ද පොළොවෙහි දේවල්ද යන සියල්ල ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්රාශිකරන්ට, තමන්වහන්සේ තුළ අදහස්කළ තමන්ගේ ප්‍රසන්නකමේ හැටියට තමන්ගේ කැමැත්තේ රහස අපට දන්වාදීමෙන්ය. (එපීස 1:9-10)**

සෑම සැබෑ ඇදහිලිවන්තයෙකුටම ක්‍රිස්තුස්වහන්සේ තුළ එක්සත් බව ඇති බැවින්, මූලධර්මානුකූල වෙනස්කම් නොසළකා හරින්න. අප සියලු දෙනා උන්වහන්සේගේ ශරීරයේ කොටස්කරුවෝය. මේ හේතුවෙන්, අප සේවය තුළ ක්‍රියාකාරීත්වයේ එක්සත් බව සෙවිය යුතුය :

**නුඹලා එක ප්‍රේමය ඇතුව, එකඟව සිට, එක කාරණයම අභිප්‍රායකරගෙන එක්සිත්ව සිටීමෙන්, මාගේ ප්‍රීතිය සම්පූර්ණකරපල්ලා. පක්ෂවාදීකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකාරකමෙන්වත් කිසි දෙයක් නොකොට, එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා. නුඹලා එක් එක්කෙනා තම තමාගේම කාරණා නොව අනුන්ගේ කාරණාත් බලාපල්ලා. (පිලිප්පි 2:2-4)**

ලෝකය අප කිතුනුවන් බව දැනගන්නේ අපගේ ප්‍රේමණීය එක්සත් බව තුළිනි :

**නුඹලා එකිනෙකාට ප්‍රේමකරනවා නම්, නුඹලා මාගේ ගෝලයෝ බව එයින් සියල්ලන් දැනගන්නවා ඇතැයි කීසේක. (යොහන් 13:35)**

## ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රායෝගික අදාළත්වය.

ධර්ම ප්‍රචාරණය උදෙසා ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රායෝගික අදාළත්වය යනු අප අපේ කටයුතු පසෙක තබා ශුභාරංචිය ප්‍රචාරය කිරීම උදෙසා අනෙකුත් ඇදහිලිවන්තයන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමයි. අප අපගේ අදහස් හා සම්ක්ෂණ අනෙක් අය සමඟ බෙදා ගන්නෙමු. එකම අරමුණක් උදෙසා අප එක්ව ක්‍රියා කරන්නෙමු. ධර්ම ප්‍රචාරණය නැමැති අරමුණ උදෙසා අප පුද්ගලයන්, ආත්මික දීමනා, උපකරණ හා මුදල් යන සියලුම සම්පත් බෙදා ගන්නෙමු.

## නව ජාලයක්

මහත් ආත්මික සත්‍යයක් ප්‍රකාශ කිරීම උදෙසා ස්වාභාවික ලෝකයේදී දැළක් උපයෝගී කරගන්නා අවස්ථා දෙකක් යොදා ගත් වෙනස් සිදුවීම් දෙකක් බයිබලයේ වාර්තා වේ. පළමු සිදුවීම ක්‍රිස්තුස්වහන්සේගේ මෙළොව සේවයේ ආරම්භ කළ අවස්ථාවේදී සිදුවූ අතර, එය ලූක් 5 හි වාර්තා වේ. ගෝලයන් මුළු රෑ පුරා මසුන් ඇල්ලූ නමුත් කිසිවක් අල්ලාගෙන තිබුණේ නැත. යේසුස්වහන්සේ ඔවුන්ට මෙසේ පවසූ සේක :

**උන්වහන්සේ කථාකොට නිමවූ කල : ගැඹුරට ගොස් මසුන් අල්ලන්ට දැල් හෙළාපල්ලායයි සීමොන්ට කීසේක. (ලූක් 5:4)**

පේත්‍රුස් මෙසේ පැවසූ සේක :

**සීමොන් උත්තරදෙමින් : ස්වාමිනි, අපි මුළු රාත්‍රියෙහිම වෙහෙසවීමුව, නුමුත් මොකවත් ඇල්ලුවේ නැත. එහෙත් ඔබගේ වචනය නිසා දැල් හෙළමියි කීවේය. (ලූක් 5:5)**

ඔවුන් දැල් හෙලූ විට දැළ ඉරෙන තරමට මසුන් හසුවූ අතර, තමන්ට උපකාර කිරීමට වෙනත් බෝට්ටුවක සිටි තම සහයකයන්ට කතා කිරීමට ද ඔවුන්ට සිදුවිය. අල්ලා ගත් මසුන් ප්‍රමාණය ඉතා විශාල වූ අතර, ඉන් බෝට්ටු දෙකම පිරී ඒවා ගිලෙන්නට විය. පේත්‍රුස් මේ පිළිබඳ පුදුමයට පත් වූ අතර යේසුස්වහන්සේ ඔවුන්ට මෙසේ පැවසූ සේක :

**එහෙත් උන්වහන්සේ ගැන ප්‍රවෘත්තිය වඩ වඩා පතළවිය. බොහෝ සමූහයෝ වචනය අසන්ටත් තමුන්ගේ රෝග සුවකරවා ගන්ටත් රැස්වූහ. (ලූක් 5:15)**

පේත්‍රුස් අත් දුටු මෙම මහත් මසුන් ප්‍රමාණය, ඔහු මනුෂ්‍යයන් අල්ලන්නෙකු වූ පසු නෙළාගත් ආත්මික අස්වැන්න සමඟ සන්සන්දනය කළ විට කිසිවක් නොවිය. ක්‍රිස්තුස්වහන්සේගේ සේවයේ අවසානයේ දී සිදුවූ ඒ හා සමාන සිදුවීමක් යොහන් 21 හි දැක්වේ. ගෝලයන් මුළු රාත්‍රියේම මසුන් අල්ලා කිසිවක් ලබා නොගත්හ. යේසුස්වහන්සේගේ අණ අනුව ඔවුන් දැල් හෙලූ අතර, නැවත වරක්, එය මසුන් ගෙන් පිරුණි. නමුත් මෙම අවස්ථාව පළමු අවස්ථාවට වඩා වෙනස් විය. දැළ ඉරුණේ නැත :

> **එබැවින් සීමොන් පේත්‍රුස් ඔරුවට නැගී, ලොකු මසුන් එකසිය පණස් තුන් දෙනෙකුගෙන් පිරුණු දැල ගොඩට ඇද්දේය. එපමණ නුමුත් දැල ඉරුණේ නැත. (යොහන් 21:11)**

මෙම සිද්ධීන් දෙකම සැබැවින්ම ස්වාභාවික ලෝකය තුළ සිදු වූ නමුත් ඒවා මහත් ආත්මික සත්‍යයකට සමාන්තර වේ. පළමු අවස්ථාවේදී දැළ ඉරුණු නමුත්, දෙවන අවස්ථාවේදී එසේ නොවිය. මෙම වෙනස ඇති වූයේ කුමකින්ද?

පළමු දැළ මිනිසුන්ගේ උත්සාහයන් පිළිබඳ උදාහරණයක් වේ. පේත්‍රුස් වෘත්තියෙන් මසුන් අල්ලන්නෙක් විය. මසුන් අල්ලන්නෙක්ගේ ස්වාභාවික ක්‍රමවේදයන් හා සම්ප්‍රදායන් ඔහු දැන සිටියේය. මිනිසුන්ගේ උත්සාහයෙන් පමණක් දෙවියන්වහන්සේගේ දර්ශනය හා දැක්ම සම්පූර්ණ කළ නොහැකි බව ඉරුණු දැළ තුළින් යේසුස්වහන්සේ ඔහුට පෙන්වා දුන්සේක. පේත්‍රුස්, දෙවියන්වහන්සේ තමාව කැඳවා ඇති මහත් කාර්යය තේරුම් ගත් විට ඔහු හඬා වැටුණේය :

> **සීමොන් පේත්‍රුස් ඒ දැක, යේසුස්වහන්සේගේ දණ ළඟ වැටී : ස්වාමීනි, මා වෙතින් ගිය මැනව, මම පව්කාර මනුෂ්‍යයෙකැයි කීවේය. (ලූක් 5:8)**

පේත්‍රුස් මිනිසුන් අල්ලන්නෙකු වනු ඇත. ඔහු අයත්ව සිටියාවූ පැරණි ජාලයට, ඔහුට නෙළීමට ඇති මහත් ආත්මික අස්වැන්න දරාගැනීමට නොහැකි වනවා ඇත. පේත්‍රුස්ට මිනිසුන්ගේ සම්ප්‍රදායන් අභිබවා යා යුතු විය. යුදෙව්වන් හා අන්‍ය ජාතීන් වෙන් කළ රේඛාව හරහා ඔහු යා යුතු විය. පැරණි ජාලය බිඳිය යුතු වූ අතර, ඔහු නව ජාලයක කොටසක් විය යුතුය.

පළමු සහ දෙවන මසුන් ඇල්ලීමේ ගමන් දෙක අතරතුර දී නව ජාලයක් නිර්මාණය විය. මෙම ස්වාභාවික මසුන් ඇල්ලීමේ සිදුවීම් ආත්මික ලොව තුළ සිදුවූ දෙයට සමාන්තර විය. දෙවියන්වහන්සේ නව ජාලයක් ඔසවමින් සිටි සේක. එය යුදෙව්වන් හා අන්‍යජාතීන්, පොහොසතුන්, හා දුප්පතුන්, වහලුන් හා නිවහලුන් අතර බෙදීම බිඳ දමනු ඇත. පාවුල්, බාර්ණබස්, සිලස්, තීතස් හා වෙනත් මිනිසුන් රැසක් එකතු කර ගැනීමට එය වර්ධනය වනු ඇති අතර, යෙරුසලමෙන් යුදයටත් සමාරියටත්, ලෝකයේ සියලූ සීමාවන් වෙත ළඟා වීම දක්වාත් එය ව්‍යාප්ත වනු ඇත.

ආත්මික ලෝකය තුළ නව "දැළකින්" මිස අන් කිසිවකින් මහත් ආඥාවේ අභියෝග ඉටුකර ගත නොහැකිය. අවසන් කාලයේ දී මාංසමය සියල්ලන් කෙරෙහි, තම ආත්මය වගුරුවන බව දෙවියන්වහන්සේ පැවසූ සේක. අවසාන කාලයේ දී හාන තැනැත්තා ගොයම් කපන්නා පරාජය කර දමන තරම් ආත්මික අස්වැන්න විශාල වන බව පැරණි ගිවිසුමේ ප්‍රොපේතවරු අනාවැකි පැවසූහ.

මෙම මහත් ආත්මික අස්වැන්න තනි පුද්ගලයෙකුට, තනි සංවිධානයකට හෝ තනි නිකායකට පමණක් සිදුකළ නොහැකිය. අවසාන කාලයේ දී මාංසමය සියල්ලන් කෙරෙහි තම ආත්මය වගුරුවන බව දෙවියන්වහන්සේ පැවසුයේ මේ හේතුවෙනි. අප නියමිත කාලයේ දී අස්වැන්න වෙත ළඟා වීමට නම්, අපගේ ධර්ම ප්‍රචාරණමය උත්සාහයන්ට වගකීමෙන් යුතු කණ්ඩායම් ක්‍රියා කාරිත්වය අදාළ විය යුතුය. නව ගිවිසුමේ අපෝස්තුළුවරුන්ගේ උදාහරණ තුළ ධර්ම ප්‍රචාරණය නමැති එකම අරමුණ උදෙසා බලවත් ලෙස සේවය කරන කැපවීමෙන් යුතු පුද්ගල කණ්ඩායමක් විය. ලෝකයේ ජාතීන් නැමැති කුඹුර වෙතට රාත්‍රියේ හෙවනැලි වැටීමට පටන් ගත් විට මෙය තවත් කොතරම් වැඩිපුර අවශ්‍ය වනු ඇතිද.

යේසුස්වහන්සේ කැඳවන විට යොහන් සහ ඔහුගේ සහෝදරයා දැළ සකස් කරමින් සිටි අයුරු මතකද? ඔව්හු අබලන් වූ යමක් ප්‍රතිසංස්කරණය කිරීමට උත්සාහ කරමින් සිටියහ. තම අබලන් වූ දැළ පසෙක දමා මනුෂ්‍යයන් අල්ලන්නන් වන පිණිස යේසුස්වහන්සේ ඔවුන්ව කැඳවූසේක. ඊට ප්‍රතිචාර දැක්වීමෙන් ඔව්හු ධර්ම ප්‍රචාරණය නමැති නව දැළෙහි කොටසක් බවට පත් වූහ. දැන් මතුවන ප්‍රශ්නය මෙයයි : නිකායන් හා දේවධර්මානුකූල වෙනස්කම් නමැති පැරණි දැළ සකස් කිරීමට උත්සාහ කිරීම ඔබ දිගටම සිදු කරනවාද, එසේ නොවේ නම් ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීමට සවන් දෙනවාද? ලෝකයට ශුභාරංචිය ගෙන යා හැකි වන පිණිස සහයෝගයේ නව දැළ උදෙසා තරඟය නමැති පැරණි දැළ පසෙක තබනවාද? යන්නයි.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "ජාලයක් ලෙස ක්‍රියා කිරීම" යන්න නිර්වචනය කරන්න.

3. සභාව ජාලයක් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

4. ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ශක්තිය සාකච්ඡා කරන්න.

5. ආත්මික දීමනා සහ ජාලයක් ලෙස කටයුතු කිරීමේ වැදගත්කම සාකච්ඡා කරන්න.

6. ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රතිඵලය වන එක්සත් බව පැහැදිලි කරන්න.

7. ජාලයක් ලෙස ක්‍රියා කිරීම ප්‍රායෝගිකව යොදාගන්නා අයුරු පැහැදිලි කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ධර්ම ප්‍රචාරණය සඳහා යේසුස්වහන්සේට ජාලයක් තිබිය. උන්වහන්සේ ගෝලයන් 12 දෙනෙකුගේ කණ්ඩායමක් පාවිච්චි කළ අතර පසුව තවත් 72 පත් කර ඔවුන් දෙදෙනා බැගින් උන්වහන්සේ යා යුතු වූ සෑම නගරයකටම හා ස්ථානයකටම ඔවුන් පිටත් කර හැරිය සේක (ලූක් 10:1). “තම කණ්ඩායමට” අයිති නොවූ කෙනෙක් සුව කිරීම හා යක්ෂයන් දුරු කරනු හමු වූ විට, ඔහුව නවතාලිය යුතු දැයි ඔවුන් යේසුස්වහන්සේගෙන් ඇසුවේය. යේසුස්වහන්සේ දුන් පිළිතුරෙන් උන්වහන්සේ “ජාලයක් ලෙස ක්‍රියාකිරීම” පැහැදිලි කළ සේක. මාර්ක් 9:38-40 හි එය කියවන්න.

2. පාවුල්ගේ සේවය ආරම්භ වුයේ ජාලයක් ලෙස ක්‍රියා කිරීමේ ප්‍රතිඵලයක් ලෙසය. ශුද්ධාත්මයාණන්වහන්සේ අන්තියෝකියේ සභාවට කතා කොට “මා විසින් බාර්ණබස්ද, සාවුල්ද කැඳවූ වැඩය පිණිස ඔවුන් මට වෙන් කරන්නැ”යි කීසේක. උන්වහන්සේ කැඳවූයේ තනි පුද්ගලයෙක්ව නොව කණ්ඩායමක්ය (ක්‍රියා 13:1-3). පාවුල් සහ බාර්ණබස් මෙම නව ජාලයේ මුලින්ම සිටි අය වුහ. ධර්ම ප්‍රචාරණය උදෙසා පාවුල්ගේ ජාලයේ කොටසක් බවට පත් වූ සෙසු අය තුළ පහත සඳහන් අයද ඇතුළත්ය.

| | |
|---|---|
| - යොහන් මාර්ක් | ක්‍රියා 13:5 |
| - සිලස් | ක්‍රියා 15:22 |
| - තිමෝති | ක්‍රියා 16:1 |
| - ලූක් | ක්‍රියා 16:10 |
| - ප්‍රිස්කිලා සහ අකිලා | ක්‍රියා 18:18 |
| - එරස්තස් | ක්‍රියා 19:22 |
| - සොපතර්ද | ක්‍රියා 20:4 |
| - අරිස්තාකිස් සහ සෙකුන්දස් | ක්‍රියා 20:4 |
| - ගායස් | ක්‍රියා 20:4 |
| - ත්‍රොපිමස් | ක්‍රියා 21:27-29 |
| - තුඛිකස් | එපීස 6:21 |
| - තිතස් | ගලාති 2:1 |
| - දෙමස් | 2 තිමෝති 4:10 |
| - එපප්‍රොදිතස් | පිලිප්පි 2:25 |
| - තර්තියස් | රෝම 16:22 |

3. ජාලයක් ලෙස ක්‍රියා කිරීම හෝ ශරීරයක් ලෙස සේවය කිරීම පැහැදිලි බයිබලිය සංකල්ප තිබියදීත්, මිනිසුන් එය ප්‍රතික්ෂේප කරන්නේ ඇයි? පහත දැක්වෙන්නේ අප සහයෝගයෙන් ක්‍රියා නොකිරීමට පොදු හේතූන්ය. අප අන් අය සමඟ සාර්ථකව ජාලයක් ලෙස ක්‍රියා කිරීමට නම් මේවා ජය ගත යුතුය :

- පාලනය අහිමිවීම ගැන අප බියවේ : අපගේ සංවිධානයේ හෝ සභාවේ පාලනය වෙනත් කෙනෙකුට යටත් කිරීමට සිදුවේයයි අපි සිතමු.

- පොදු අරමුණ හා ස්ථාවරය ගැන සිතනු වෙනුවට අප වෙනස්කම් දෙස අවධානය යොමු කරන්නෙමු : අප ක්‍රිස්තුස්වහන්සේ තුළ එක් අයෙකු වන බව හා ධර්ම ප්‍රචාරණය උදෙසා පොදු ඉලක්කයක් ඇති බව ගැන සිතනු වෙනුවට අප අන් අයගෙන් වෙනස් වන ආකාරය වැදගත් කොට දක්වන්නෙමු.

- අරමුදල් නැති වේ යයි අපි බිය වන්නෙමු : අප වෙනත් ආයතන සමඟ සහයෝගයෙන් ක්‍රියා කළහොත්, සේවය සඳහා අවශ්‍ය අරමුදල් අපට ලැබෙනු වෙනුවට එම ආයතන වලට ලැබෙනු ඇතැයි අපි බිය වන්නෙමු.

- පුද්ගලයන් අහිමි වේ යයි අපි බිය වන්නෙමු : තම සභාවේ හෝ සංවිධානයේ සාමාජිකයන් වෙනත් කණ්ඩායමකට එකතු වේයයි ඇතැම් විට නායකයෝ බිය වෙති.

- අපි මධ්‍යස්ථ ප්‍රතිපදාවක් ඇති කරගැනීමට බිය වන්නෙමු : අපට සුළු දේවධර්මානුකූල වෙනස්කම් ඇති බැවින් අන් අය සමඟ සහයෝගයෙන් ක්‍රියා කිරීමට මධ්‍යස්ථ වීමට සිදු වන්නේ යයි අපි බිය වන්නෙමු. සදාචාරාත්මක කරුණු, මිථ්‍යා ඇදහිලි හෝ වැරදි

මූලධර්ම සම්බන්ධයෙන් අප මධ්‍යස්ථ විය යුතු නැති නමුත් සුළු දේවධර්මානුකූල වෙනස්කම් නිසා ධර්ම ප්‍රචාරණයේ ජාලයට බාදා ඇති වීමට ඉඩ නොදිය යුතුය.

- අපගේ පව්කාර ස්වභාවය ස්වාධිනත්වය අගය කරයි : ඒව වෙත ගෙන ආ පරීක්ෂාව සාර්ථක වූයේ මේනිසාය. ඇයට දෙවියන්වහන්සේගෙන් ස්වාධීන වීමට අවශ්‍ය විය. ස්වාධිනත්වය යනු දෙවියන්වහන්සේගෙන් තොර ආත්මයක ලක්ෂණයකි.

# දෙවන කොටස සඳහා හැඳින්වීම

## “ඔබ යන විට ...”

නව ගිවිසුමේ ශුභාරංචි පොත්වලදී, සුව කිරීම් හා මුදාගැනීම් වලින් තොර ශුභාරංචිය දේශනා කිරීමට යේසුස්වහන්සේ අණ නොකළ සේක. උන්වහන්සේ ඔවුනට පැවසුවේ, “ඔබ යන විට ... රෝගීන් සුව කරන්න, යක්ෂයන් දුරු කරන්න” යනුවෙනි.

සුවය හා මිදීම සොයමින් සමූහයා පැමිණෙන විට, නව සේවකයන් අවශ්‍ය වන තරම් වේගයෙන් ආත්මික අස්වැන්න වර්ධනය විය. වැඩිකල් යාමට පෙර තවත් ගෝලයන් 70 දෙනෙක් අවශ්‍ය වූ අතර දේශනා කිරීමට, ඉගැන්වීම, සුව කිරීම හා මිදීමට ඔවුන් පිටත්කර හරිනු ලැබීය.

ඔවුන් යන අතර සිදුවූ මෙම බලය ප්‍රකාශ වීමේ ප්‍රතිඵලය වූයේ ලෝකය පුරා ශුභාරංචිය වේගයෙන් ව්‍යාප්ත වීමයි. මේ හේතුවෙන් “මුහුන් වලට සමාන වූ ධර්ම ප්‍රචාරණය” නමැති මෙම පාඨමාලාවේ මෙම කොටස, ශුභාරංචිය දේශනා කිරීම හා ඉගැන්වීම සමඟ සිදු විය යුතු සුව කිරීම් හා මුදවා ගැනීම් පිළිබඳව අවධානය යොමු කරයි.

දහසය වන පරිච්ඡේදය සුව කිරීම් හා මිදීමේ සේවය පිළිබඳ හැඳින්වීමක් සපයයි. දහහත් වන පරිච්ඡේදය සුවකිරීම් කෙරෙහි බාධා කරන විචල්‍යයන් ගැන සාකච්ඡා කරයි. දහ අටවන පරිච්ඡේදය සුව කිරීමේ සේවය පිළිබඳ අවධානය යොමු කරන අතර දහ නව වන පරිච්ඡේදය යක්ෂයන් දුරු කිරීමේ සේවය පිළිබඳව සළකා බලයි.

# දහසය වන පරිච්ඡේදය

## සුව කිරීම හා මිදීම පිළිබඳ හැඳින්වීමක්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සුව කිරීම පිළිබඳ ඇති වත්මන් ආකල්ප සමහරක් පැහැදිලි කිරීමට
- පස් ආකාරයක රෝග හඳුනා ගැනීමට
- "දිව්‍යමය සුව කිරීම" නිර්වචනය කිරීමට
- රෝගයක මූලාශ්‍රය හඳුනා ගැනීමට
- රෝගයක් උදෙසා හේතු හඳුනා ගැනීමට
- රෝග නිසා ඇති වන අවසන් ප්‍රතිඵල දෙකක් පැහැදිලි කිරීමට
- දිව්‍යමය සුවකිරීමේ අරමුණ සාකච්ඡා කිරීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. අන් භාෂාවලින් කථාකරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බිවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:17-18)**

### හැඳින්වීම

දේව රාජ්‍යයේ ශුභාරංචියේ කොටසක් වශයෙන් දේශනා කළ යුතු හා නිරූපණය කළ යුතු සුව කිරීමේ හා මිදීමේ සේවය මෙම පරිච්ඡේදයෙන් හඳුන්වා දෙයි. මෙම පාඩම් තුළදී "සුව කිරීම" හා "මිදීම " යන වචන එකිනෙක සමඟ හුවමාරු කර යොදා ඇත. දෙකෙන්ම අදහස් වනුයේ දේව වචනය තුළ උගන්වන ශරීරයේ, ප්‍රාණයේ හා ආත්මයේ සම්පූර්ණත්වය පිළිබඳ සංකල්පයයි.

මෙම පාඩමේදී සුව කිරීම් හා මිදීම පිළිබඳ වත්මන් කරුණු ගැන ඔබ අධ්‍යයනය කරනු ඇති අතර මෙම කරුණු පිළිබඳ නිවැරදි ඉගැන්වීමක් අවශ්‍ය වන්නේ ඇයි දැයි ඉගෙන ගනු ඇත. එසේම රෝග වල මූලාශ්‍ර හා ඒවා ඇති වීමට හේතු, සුව කිරීමේ දීමනා හා සුව කිරීමේ අරමුණු ගැනද ඔබ ඉගෙන ගනු ඇත.

### සුවකිරීම පිළිබඳ වත්මන් ආකල්ප

පළමුව, මෙම ක්ෂේත්‍රය තුළ සේවය කිරීමේදී ඔබට මුහුණ දීමට සිදුවන ඇතැම් වත්මන් ආකල්ප තේරුම් ගැනීම වැදගත් වේ. සුවකිරීම හා මිදීම පිළිබඳ සැළකීමේදී බොහෝ ඇදහිලිවන්තයන්....

**එය නොසළකා හැර තිබේ :**

ව්‍යාජ හාස්කම් වලට විරුද්ධව ඇති බයිබලීය අනතුරු ඇඟවීම් නිසා ඇතැම් අය එය නොසළකා හැර තිබේ (මාර්ක් 13:22-23). ඔවුන් මෙය සියලු හාස්කම් පිළිබඳ අනතුරු ඇඟවීමක් ලෙස සළකයි. ඇතැම් අය සිද්ධාන්තයක් ලෙස සුවකිරීම් ගැන විශ්වාස කරන නමුත්, ප්‍රායෝගිකව එය නොසළකා හරී. අනෙක් අය එය නොසළකා හරින්නේ රෝගබාධ හා දුක් විඳීම් හා සම්බන්ධ සියලුම ප්‍රශ්න වලට ඔවුන්ට පිළිතුරු දිය නොහැකි නිසාය.

අසමත් වීමට ඇති බිය නිසා ඇතැම් අය සුව කිරීම් නොසළකා හරී. අපට ද්විත්ව ප්‍රමිති ඇත්තාක් සේ පෙනේ. මුදල්, ප්‍රඥාව ආදී දේවල් උදෙසා අප විශ්වාසයෙන් යුතුව යාච්ඤා කරන නමුත්, සුවය උදෙසා යාච්ඤා කිරීමට අප බිය වන්නෙමු. සෙසු අය හේතු වාදය හා භෞතිකවාදය තමන්ට කෙතරම් බලපෑමක් කර ඇති දැයි වටහා නොගනී. බොහෝ අය "දැකීමෙන් විශ්වාස කරන" අතර අධිස්වාභාවික දේවල් වලට වඩා ස්වාභාවික හා භෞතික දේවල් වලට කැමති වෙති.

## ප්‍රතික්ෂේප කරති :

සුව කිරීම් හා මිදීම පිළිබඳ කිසිඳු දේව ධර්මයක්, ආදර්ශයක්, පුරුද්දක් හෝ අත් දැකීමක් නොමැති බැවින් අද දවසේ ඇතැම් අය එය ප්‍රතික්ෂේප කරති. නව ගිවිසුමේ ශුභාරංචි පොත් තුළ ශාරීරික සුවකිරීම් පිළිබඳ වාර්තාවන් 26 ක් ඇතුළත් වේ. ක්‍රියා පොත තුළ මෙවැනි වාර්තා පහක් සඳහන් වේ. 1 කොරින්ති 12:8-11 හා 28-30 හි ශාරීරික සුවකිරීමක් දක්වා තිබේ. රෝගීන් උදෙසා යාච්ඤා කළ යුතු ආකාරය පිළිබඳ උපදෙස් යාකොබ් 5:13-16 හි දැක්වේ.

ශුභාරංචි පොත්වල සඳහන් සුවකිරීම් පිළිබඳ ඉගැන්වීම් වෙනස් කරන කිසිවක් යැවුම් පත්‍ර තුළ සඳහන් නොවේ. යැවුම් පත්‍ර ලියන ලද කාලයේදී රෝගීන් උදෙසා යාච්ඤා කිරීමට උනන්දු කළ අතර දිව්‍යමය සුව කිරීම් සභාව තුළ විවාදයට හේතු වූ බවට කිසිඳු ඉගියක් නැත.

## පැටලිලි සහගත බවට පත් කර ගනිති :

බොහෝ පුද්ගලයන් සුව කිරීම් හා මිදීම දේව වචනයට පටහැනි මනුෂ්‍යයන්ගේ සම්ප්‍රදායන් සමඟ පටලවා ගනිති. ඊළඟ පාඩමේදී මෙම සම්ප්‍රදායන්ගෙන් ඇතැම් ඒවා ගැන ඔබ ඉගෙන ගනු ඇත.

අතීතයේදී සුවය උදෙසා යාච්ඤා කර ඇති නමුත් එය නොලැබීම නිසා තවත් අය අත්දැකීම් සමඟ පටලවා ගනිති. නමුත් අපගේ ඇදහිල්ල අත්දැකීම් මත නොව දේව වචනය මත පදනම් විය යුතුය (අත්දැකීම් දේව වචනයට එකඟ වන අවස්ථාවන් හිඳි හැර). ඇතැම් පුද්ගලයන්, පුද්ගලිකත්වය වටා යොමුව ඇදහිලි ක්‍රම, මුදල් බලාපොරොත්තුවෙන් සුව කරන පුද්ගලයන්, වංචාවන්, පූර්ණත්වය වෙනුවට ශාරීරික සුවය ගැන පමණක් අධික ලෙස අවධානය යොමු කිරීම වැනි සුව කිරීම පිළිබඳ වැරදි ආදර්ශයන් නිරීක්ෂණය කිරීම නිසා, ඇතැම් පුද්ගලයන්ට සුවය පිළිබඳ විශ්වාසයන් පැටලිලි සහගත බවට පත් කර ඇත.

සමබරතාවයකින් තොරව ක්‍රියාකිරීමෙන් සුව කිරීම් හා මිදීම අවුල් සහගත බවට පත්විය හැක. කෙතරම් වලංගු වුවත්, සෙසු සත්‍යයන් අවලංගු කරන ඕනෑම සත්‍යයක් ප්‍රයෝගිකව වැරදි වේ. උදාහරණයක් ලෙස, සුව කිරීමේදී ඇදහිල්ලේ අවශ්‍යතාවය අධික ලෙස හුවා දැක්වීම නිසා ක්ෂණිකව සුවය නොලැබුණු විට රෝගී පුද්ගලයන්ට පරාජිත හැඟීමක් ඇති වේ.

## කල් දමති :

ඇතැම් පුද්ගලයන්ට සෑම දෙයකටම පිළිතුරු නොමැති බැවින් සුව කිරීම හා මිදීමේ සේවය කල්දමති. ඇතැම් අයට සුවය ලැබෙන්නේ හා ඇතැම් අයට එසේ නොවන්නේ ඇයි දැයි ඔව්හු තේරුම් නොගනිති. (ඊළඟ පාඩමේදී ඔබ මේ පිළිබඳ ඉගෙන ගනු ඇත.)

සුව කිරීමේ සේවය උදෙසා හා සුවය ලබා ගැනීම සඳහා ඒ පිළිබඳ සියලුම දේවල් තේරුම් ගැනීම අවශ්‍ය නොවේ. එය, ඔබ ගැළවීම ලබා අන් අයට ඒ පිළිබඳ සාක්ෂි දරන විට ඔබ ගැළවීම පිළිබඳ හැම දෙයක්ම දැන නොසිටියා සේම වේ.

ඔබ දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලය තුළින් සේවය කිරීමට හා එය අත්දැකීමට පටන් ගත් විට ඇතැම් පිළිතුරු ලැබෙනු ඇත. තවත් ප්‍රශ්න වලට කිසිදා පිළිතුරු නොලැබෙනු ඇත. සෑම දෙයක්ම සිදුවන්නේ "ඇයි" හා "කෙසේද" යන්න ඔබ දැන සිටියහොත්, එවිට ඔබට දෙවියන්වහන්සේ අවශ්‍ය නොවනු ඇත. "අපේ දැන ගැන්ම මදය" යනුවෙන් බයිබලයේ සඳහන් වේ. සුව කිරීමේදී රෝග හා වේදනා ගැන අවධානය යොමු කරන අතර අයුතුකමේ අභිරහස ක්‍රියාත්මක වන බැවින් සෑම විටම අභිරහස් පවතිනු ඇත.

# නිවැරදි ඉගැන්වීමේ අවශ්‍යතාවය

සුව කිරීම් හා මිදීම පිළිබඳ වත්මන් ආකල්ප නැවත සළකා බැලූ විට මෙම කරුණ පිළිබඳ අපට නිසි ඉගැන්වීමක් අවශ්‍ය වන්නේ ඇයි දැයි නිරූපණය වේ. සුවය පිළිබඳව දේව වචනයේ උගන්වන දේවල් පිළිබඳ නිසි දැනුමක් නොමැති වීම නිසා බොහෝ අය ශාරීරිකව හා ආත්මිකව විනාශ වී තිබේ.

> **මාගේ සෙනඟ දැනගැන්ම නැතිකමෙන් නාස්තිවී සිටිති. (හොෂෙයා 4:6)**

සුවය (සම්පූර්ණත්වය) අපට ව්‍යාප්ත කිරීමට අණ කර ඇති රාජ්‍යයේ ශුභාරංචියේ කොටසකි (ලූක් 16:15-18). යේසුස්වහන්සේ අප කැඳවූයේ දේශනා කිරීමට, ඉගැන්වීමට, සුව කිරීමට හා මිදීම ගෙන ඒමටය. සුව කිරීම හා මිදීම නොසළකා හැරීම නොකළ යුතු අතර සෙසු කරුණු දෙක යටපත් වන තරමට එය විශේෂ කොට දැක්වීමද සිදු නොකළ යුතුය.

අපගේ සභාවන් සුවකිරීමේ මධ්‍යස්ථාන විය යුතු බව බයිබලය එළිදරව් කරයි (ලූක් 14:16-24). මිනිසුන් හැරී යනවා වෙනුවට සුව වන ආකාරය අප දැකිය යුතුය.

> **කොර කකුල් අභක්කරනු නොලැබ, සුවවෙන පිණිස, නුඹලාගේ පාදවලට සමතලා පාරවල් සාදාගනිල්ලා. (හෙබ්‍රෙව් 12:13)**

නැති වුණු හා මියැදෙමින් සිටින ලෝකයකට අප සුව කිරීමේ හා යක්ෂයන් දුරු කිරීමේ යහපත් පුවත බෙදා නොගන්නේ නම්, ඇදහිලිවන්තයන් ලෙස එය පාපයකි. බයිබලය මෙසේ සඳහන් කරයි :

> **එබැවින් යමෙක් යහපත කරන්ට දැන එය නොකරන්නේ නම්, ඔහුට ඒක පාපයය. (යාකොබ් 4:17)**

සුව කිරීම නොසලකා හරින නායකයන්ට දෙවියන්වහන්සේ ඇතැම් දැඩි අනතුරු ඇඟවීම් කළ සේක.

> **දුර්වල එවුන් නුඹලා විසින් ශක්තිමත්කළේවත්, ලෙඩවූ එකාට සුවකළේවත්, පොඩිවූ එකාගේ තුවාල බැන්දේවත්, පන්නාදමනු ලැබූ එකා නැවත ගෙනාවේවත්, නැතිවුණ එකා සෙව්වේවත් නැත: බලාත්කාරකමින්ද සැරකමින්ද නුඹලා උන් ආණ්ඩුකළහුය.**
>
> **මම නතිවූ එකා සොයන්නෙමි. පන්නාදමනු ලැබූ එකා දෙවනු ගෙනෙන්නෙමි, පොඩිවූ එකාගේ තුවාල බඳින්නෙමි, ලෙඩවූ එකා ශක්තිමත්කරන්නෙමි. නුමුත් මම තරවූ එවුන්ද ශක්තිමත් එවුන්ද නැතිකර, විනිශ්චයෙන් උන් පෝෂ්‍යකරන්නෙමි. (එසකියෙල් 34:4,16)**

# නිවැරදි ආකල්පයෙන් යුතුව ආරම්භ කිරීම

ඔබ සුවකිරීම් හා මිදීම යන විෂයට අවතීර්ණ වන විට නිවැරදි ආකල්පයෙන් යුතුව එසේ කළ යුතුවේ. අතීත අත්දැකීම් හා ඔබ ඉගෙන ගෙන ඇති සම්ප්‍රදායන් ඔබ නොසළකා හැරිය යුතුය. ඔබ ඉගෙනගන්නා කෙනෙක් විය යුතුය. හේතු කාරණා සඳහා විවෘත වීම ඉහළින් ලැබෙන ප්‍රඥාවේ එක් ලක්ෂණයකි (යාකොබ් 3:17). ඉගැන්වීම් ප්‍රතික්ෂේප කරන විට ඔබ ආත්මිකව අනතුරුදායක තත්වයක සිටී.

පූර්ව නිගමනය නමැති පාපය වන්නේ දෙවියන්වහන්සේ අපගේ සීමාවන් වලට කොටු කිරීමය. යෝබ්ගේ මිතුරන් මේ අයුරින් පව් කළෝය. තනි පුද්ගලයෙකුගේ අත් දැකීමක් විශ්ව්ය ලෙස අදාළ කර ගැනීම වැරදි වේ. මිනිසුන්ගේ සාම්ප්‍රදායික ඉගැන්වීම් පිළිබඳව ඔබ කිසිවක් නොදන්නා ලෙස මෙම අධ්‍යයනය ආරම්භ කරන්න. දේව වචනය පවසන දේ පිළිගන්න : ඔබ සුවය ලැබූ බව එයින් කියැවේ නම්, එය විශ්වාස කරන්න. රෝගීන් මත අත් තබන ලෙස එයින් කියැවේ නම්, එය කරන්න. එමඟින් පවසන දෙය දෙවියන්වහන්සේ විසින් කරනු ඇත. උන්වහන්සේ එය කරන බව බලාපොරොත්තු වන්න.

සුවය ලබා ගැනීමට හෝ සුව කිරීමේ සේවය උදෙසා නිතිරීතීන් හෝ ක්‍රමවේද නොසොයන්න. බයිබලය තුළ විවිධ ප්‍රතිපත්ති එළිදරව් කර ඇති අතර අප ඒවා සමඟ ගණුදෙනු කළ යුතු නමුත් එය නිශ්චිත රීතියක් ඉදිරිපත් නොකරයි. රීතීන් සෙවීම වෙනුවට, සුවය ලබා දෙන්නා ඔබ තුළ වන බව තේරුම්

ගන්න. සුව කරන තැනන්වහන්සේ සමඟ සමීප සම්බන්ධතාවයකින් උන්වහන්සේ පිළිබඳ දැනුම වැඩි කර ගැනීමට උත්සාහ කරන්න.

යේසුස්වහන්සේ හා ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබ තුළ වාසය කරන සේක. සුව කිරීම යනු ඔබ බාහිරින් සොයන යමක් නොව, නමුත් එය අභ්‍යන්තරයෙන් නිදහස් කිරීමට ඔබ ඉගෙන ගනී. ඔබ සෙවිය යුත්තේ ඔබ තුළ ඇති බලය නිදහස් කරන ප්‍රතිපත්ති තේරුම් ගැනීම පමණී.

ඔබ සැබවින්ම යේසුස්වහන්සේගේ සුව කිරීමේ සේවය අනුගමනය කළහොත් ඔබට පහත දේවල් කිරීමට හැකි වන බව හඳුනාගන්න :

1. "ස්වාමියා" වෙනුවට සේවකයකු වනු ඇත : මාර්ක් 10:44

2. පොහොසත් නොව වෙහෙසට පත් වනු ඇත : මාර්ක් 6:31; යොහන් 4:6; ක්‍රියා 3:6

3. සෙසු අයගේ අවිශ්වාසයට මුහුණ දෙනු ඇත : මාර්ක් 13:58

4. ආගමික නායකයන්ගේ පීඩාව අත්දකිනු ඇත : (ඔවුන්ගෙන් ඇතැමුන් පරිසිවරු වැනිය...ජීවිතය පිළිබඳ සළකනවාට වඩා නීති හා සම්ප්‍රදායන් ගැන සළකයි) ලූක් 6:6-9.

5. ඔබට සමීපතම අයගේ පීඩාවට මුහුණ දේ : මාර්ක් 6:4 හා මතෙව් 13:58

6. ප්‍රසිද්ධිය සෙවීමට වඩා එය ප්‍රතික්ෂේප කරයි : මාර්ක් 8:26; 17:36; මතෙව් 8:4

7. දේව බලය තුළින් පෞද්ගලික වාසි හෝ ද්‍රව්‍යමය ප්‍රතිලාභ ලබා ගැනීම ප්‍රතික්ෂේප කරයි : ක්‍රියා 8:18-24

8. පෞද්ගලික මහිමය ප්‍රතික්ෂේප කරයි : ක්‍රියා 14:8-18

## දිව්‍යමය සුවකිරීම

අද දවසේ ලෝකය තුළ විවිධාකාර සුවකිරීම් තිබේ :

- **මානසික සුව කිරීම :** මෙයින් අදහස් කරන්නේ පදාර්ථමය ද්‍රව්‍යයට ඉහළින් මානසික දේ තැබීමය. ආත්ම , යන්ත්‍ර මන්ත්‍ර, ගුරුකම් සහ ගුප්ත සුවකිරීම් ආදිය මෙයට අයත් වේ.

- **අධි ස්වාභාවික සුව කිරීම :** දෙවියන්වහන්සේගෙන් නොවන අධි ස්වාභාවික සුව කිරීම් සිදු කරන මූලාශ්‍ර ද ඇති බැවින් අපගේ අධ්‍යයනය තුළදී අප මෙම පදය යොදා නොගනිමු. සාතන්ට අධි ස්වාභාවික කාර්යයන් සිදු කළ හැකිය (නික්මයාම 7:8-13).

- **වෛද්‍ය විද්‍යාත්මක සුව කිරීම් :** මේ ආකාරයේ සුව කිරීම් වලට වෛද්‍යවරුන්ගේ, හෙදියන්ගේ, රෝහල්වල හා ඖෂධ වල උපකාරය ලැබේ. අප ඉගෙන ගන්නා ආකාරයට සම්මත වෛද්‍ය විද්‍යාත්මක සුව කිරීම් දේව වචනයට පටහැනි නොවන නමුත්, එය උන්වහන්සේගේ යහපත්කමේ ව්‍යාප්ත කිරීමකි.

- **ස්වාභාවික සුවකිරීම් :** ස්වාභාවික ශාරීරික ක්‍රියාකාරිත්වය තුළින් සිදු වන සුව කිරීම් වලදී සැබවින්ම දෙවියන්වහන්සේ ක්‍රියාත්මක වේ. ස්වාභාවික ශාරීරික ක්‍රියාකාරීත්වය තුළින් උන්වහන්සේගේ ස්වභාවය සහ මනුෂ්‍යය ශරීරය තුළ උන්වහන්සේගේ මහත් හස්ත කර්මාන්තය පිළිඹිබු වේ. ස්වාභාවික සුව කිරීම් තුළ නිසි ආහාර, විටමින් වර්ග, විවේකය වැනි ස්වාභාවික ක්‍රමවේදයන් ද ඇතුළත් වේ.

(සටහන : වෛද්‍ය විද්‍යාත්මක හා ස්වාභාවික සුවකිරීම් තුළ දේවත්වයේ යම් ස්වභාවයක් පවතී, මන්ද යථාර්ථය නම් සුවය ගෙන දෙන්නේ දෙවියන්වහන්සේය.)

- **ඇදහිල්ලෙන් සුවය ලැබීම :** මෙම පදය බොහෝ විට යොදා ගනුයේ දෙවියන්වහන්සේ විසින් සිදු කරන සුව කිරීම් අදහස් කිරීමටය. එමඟින් සුවය උදෙසා සේවය කරන්නා හෝ

සේවය ලබන්නා තුළ ඇති ඇදහිල්ල කෙරෙහි අවධානය යොමු කිරීමට අදහස් කරන බැවින් අපි එය පාවිච්චි නොකරමු.

- **දිව්‍යමය සුවකිරීම :** "දිව්‍යමය" යන වචනය මිනිසුන්ගේ ඇදහිල්ලේ ප්‍රතිචාර වෙත නොව දෙවියන්වහන්සේ වෙත අවධානය යොමු කරයි. එසේම එය අද්භූත බලවේගයන්ගේ ගුරුකම් වලින් හා අධිස්වභාවික සුව කිරීම් වලින් වෙනස් වේ.

මෙම අධ්‍යයනයේදී අප දිව්‍යමය සුවකිරීම් යන පදය භාවිත කරමු. "දිව්‍යමය බව" දේව වචනය වන ශුද්ධ බයිබලය තුළ විස්තර කර ඇති ආකාරයට එකම සැබෑ දෙවිඳුන් හා උන්වහන්සේගේ ස්වභාවය පිළිබඳව අදාළ වේ. "සුවකිරීම" යනු ප්‍රතිකාර කිරීම හෝ සම්පූර්ණත්වයට ගෙන ඒමය. සුව කිරීම තුළ ආත්මික, ශාරීරික, හැඟීම්වල, මානසික හා යක්ෂ ආත්ම පිළිබඳ තත්වයන්ගෙන් නිදහස් වීමද ඇතුළත් විය හැකිය. සුව කිරීම යනු රෝග නොවැළදී සිටීම නොවේ. අපගේ ජීවිත "දිරාපත් වීමේ ක්‍රියාවලිය" තුළ වන අතර අප මේ ලෝකය තුළ සිටින තුරු එය සාතන්ගේ ප්‍රහාරයන්ට විවෘතව තිබේ.

දිව්‍යමය සුවකිරීම යනු, පුද්ගලයෙකුව සුව කිරීම හා ශරීරය, ප්‍රාණය (මනස, කැමැත්ත හා හැඟීම) හා ආත්මය පූර්ණත්වයට පත් කිරීම තුළින් සත්‍ය වූ එකම දෙවියන්වහන්සේ තම ස්වභාවය එළිදරව් කිරීම, තම පොරොන්දු ඉටු කිරීම හා ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවීම තුළ වූ තම සැපයීම ක්‍රියාවට නැංවීමයි.

දිව්‍යමය සුවකිරීම ක්ෂණිකව (හාස්කමක් ලෙස) හෝ ක්‍රමිකව (ක්‍රියාවලියක් ලෙස) සිදු විය හැකිය. ක්ෂණිකව, හාස්කමක් ලෙස සිදු වන සුව කිරීමකදී වඩා සම්පූර්ණ ලෙස දිව්‍යමය වැඩ සිටීම හා දෙවියන්වහන්සේගේ බලය නිරූපණය වුවද, ක්‍රියාවලියක් ලෙස සිදු වන දිව්‍යමය සුව කිරීමක් ක්ෂණිකව සිදු වන සුව කිරීමකට වඩා පහත් නොවේ (මාර්ක් 8:22-25 බලන්න).

## අසනීප හා රෝගාබාධ

අප අසනීප හෝ රෝගාබාධ පිළිබඳව කතා කිරීමේදී කතා කරනුයේ දෙවියන්වහන්සේ මැවූ නියමිත රටාවෙන් පිට ඇති වන්නාවූ ඕනෑම තත්වයකි. රෝගාබාධ කොටස් 05 කින් යුක්ත වේ :

### ආත්මික රෝගාබාධ :

ආත්මික රෝගය පාපය වේ. ඒ සඳහා පියවර නොගතහොත් එය ආත්මිකව අවසානය ගෙන දේ. ආත්මික රෝගය සඳහා සුවය නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් ලැබෙන පව් කමාවයි. මෙම තත්වය සඳහා වෛද්‍ය විද්‍යාවට හා ස්වාභාවික සුව වීමේ ක්‍රියාවලියට කිසිවක් කළ නොහැකි බැවින්, එය සියල්ලට වඩා උතුම් සුවකිරීමයි.

### ශාරීරික රෝගාබාධ :

ඉන්ද්‍රියන්ගේ ආබාධ නිසා ශාරීරික රෝග ඇති විය හැකිය. ඒවා වෛද්‍යවරුන්ට හඳුනාගත හැකි සහ සොයා ගත හැකි ගැටලු වේ. ශරීරයේ සැබෑ ආකෘතියට හෝ පටක වලට කුමන හෝ ආකාරයකින් ආබාධයක් සිදු වී තිබේ. අනිසි ක්‍රියාවන් නිසාද ශාරීරික රෝගාබාධ ඇති විය හැකිය. මෙය ඉන්ද්‍රියක් හෝ ශරීරයේ කොටසක් අක්‍රමවත් ලෙස ක්‍රියා කිරීම නිසා ඇති වන රෝග වේ. මේ තුළ විවිධ ගැටලු ඇති අතර එක් කොටසක් තුළ ඇති ගැටලුවක් මුළු ඉන්ද්‍රියන් පද්ධතියටම බාධා ඇති කරයි. හෘදයාබාද, අධික රුධිර පීඩනය, දියවැඩියාව, උදරයේ තුවාල හා සමහර ආහාර ද්‍රව්‍යයන් සඳහා ඇති අසාමාන්‍ය සංවේදීතාවය ආදිය බහුලව පවතී. ක්‍රියාකාරීත්වය පිළිබඳ රෝගාබාධ දිගින් දිගටම පරීක්ෂා නොකිරීමෙන් ඉන්ද්‍රියන් ආශ්‍රිත රෝගාබාධ ඇතිවිය හැකිය. මනුෂ්‍යයාගේ කොටස් එකිනෙකට සම්බන්ධ වූ ස්වභාවය නිසා, එක් කොටසක ඇති රෝගාබාධයක් සියල්ලටම බලපෑම් කරයි.

### හැඟීම්වල රෝගාබාධ :

තරහව, වෛරය, තික්තකම වැනි හානිකර හැඟීම් නිසා හැඟීම්වල රෝගාබාධ ඇති වේ. මේවා සුවකිරීම සඳහා දෙවියන්වහන්සේ අභ්‍යන්තර හැඟීම් ස්පර්ෂ කළ යුතුය. ඇතැම් අය මෙය "අභ්‍යන්තර සුව කිරීම" ලෙස හඳුන්වයි. ඇතැම් අවස්ථාවලදී මෙම පදය වැරදි ලෙස යොදා ගෙන ඇති අතර බයිබලය තුළ උගන්වා නොමැති අත්දකීම් විස්තර කිරීමට එසේ කර ඇත.

**මානසික රෝගාබාධ :**

මානසික රෝගාබාධ යනු ආබාධිත තත්ත්ව, රෝග, ස්නායු රෝග, උපතින්ම ඇතිවූ ආබාධ, සහ යක්ෂ ආත්ම වල සෘජු බලපෑම නිසා නොව මනෝවිද්‍යාත්මක තත්වයන් නිසා ඇතිවන මානසික තත්වයන් වේ.

**යක්ෂ ආත්ම නිසා ඇති වන තත්වයන් :**

යක්ෂ ආත්ම ආවේශ වීම, පීඩා විදීම හා යක්ෂ ආත්ම මඟින් ඇති කරන මානසික හා ශාරීරික තත්වයන් යක්ෂ ආත්ම නිසා ඇතිවන තත්වයන් ලෙස සැළකේ. මෙම තත්වයන් සඳහා මිදීම නමැති විශේෂ ආකාරයේ සුව කිරීමක් අවශ්‍ය වේ. මිදීම හා සුව කිරීම් අතර සම්බන්ධයක් ඇති නමුත්, බයිබලයේ එහි වෙනසක් පෙන්වා තිබේ.

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා කැඳවා සියලු යක්ෂයන් කෙරෙහිද රෝග සුවකරන්ටද බලය සහ වරය ඔවුන්ට දී, දෙවියන්වහන්සේගේ රාජ්‍යය ප්‍රකාශකරන්ටත් රෝගීන් සුවකරන්ටත් ඔවුන් යැවූසේක. (ලූක් 9:1-2)**

## රෝගාබාධ ඇති වීමේ මූලාශ්‍ර

පුද්ගලයෙකු රෝගී වීම සඳහා විවිධ හේතු බලපෑ හැකි නමුත්, රෝගාබාධ සඳහා එක් ප්‍රධාන මූලාශ්‍රයක් වේ. "ඉන්නිසා නුඹලා අතරේ බොහෝ දෙනෙක් දුර්වලව ලෙඩව සිටිති" (1 කොරින්ති 11:30) යි පවසමින් පාවුල් මෙය ස්ථිර කොට පැවසීය. ලෝකයේ ඇති සියලු නපුරේ මූලාරම්භය සාතන්ය. රෝගාබාධ හා මරණය ලෝකයට ඇතුළු වූයේ මිනිසාගේ පාපය තුළිනි (උත්පත්ති 1-3 හා යාකොබ් 1:17 අධ්‍යයනය කරන්න). සාතන් මරණය ගෙන දේ. සොරකම් කරයි, විනාශ කරයි. යේසුස්වහන්සේ අධික ජීවනයේ උල්පතයි.

> **සොරා එන්නේ සොරකම්කරන්ටත් මරන්ටත් විනාශකරන්ටත් පමණක්ය. මා ආවේ ඔවුන්ට ජීවනය ලැබෙන පිණිසත් එය අධිකලෙස ලැබෙන පිණිසත්ය. (යොහන් 10:10)**

තමා පැමිණියේ මිනිසුන් ගළවා ගැනීමට මිස ඔවුන් විනාශ කිරීමට නොවන බව යේසුස්වහන්සේ පැවසූසේක. "ගළවා ගැනීම" යන්න තුළ ගැළවීම මෙන්ම සුව කිරීම ද අන්තර්ගත වේ.

අසනීප හා රෝගාබාධ සාපයේ කොටසක් වන නමුත්, "ගසක එල්ලෙන සියල්ලෝ ශාපලද්දෝයයි ලියා තිබෙන ලෙස, ක්‍රිස්තුස්වහන්සේ අප උදෙසා ශාපයක්වී, ව්‍යවස්ථාවේ ශාපයෙන් අප මුදාගත්සේක" යනුවෙන් ගලාති 3:13 ප්‍රකාශ කරයි. ශරීරය ස්වාමින්වහන්සේ උදෙසාය. එය අප උදෙසාවත්, අසනීප හෝ රෝගාබාධ උදෙසාවත් නොවේය. පාපය, ආත්මය විනාශ කරන්නා සේ රෝගාබාධ ශරීරය විනාශ කරයි. අසනීප මගින් සෞඛ්‍ය, සතුට, මුදල්, කාලය, ශක්තිය, සිතුවිලි හා ශක්තිය සොරා ගනී. එය මරණය හා විනාශය ගෙන දෙයි. හදිසි අනතුරුද විනාශය ගෙන දේ. මෙම සියලු කාරණා වලදී "සතුරෙක් මේක කරලා තිබේ" (මතෙව් 13:12) යයි පැහැදිලිය.

රෝගාබාධ වල මූලාශ්‍රය සාතන් වන බැවින්, ඔබ පරීක්ෂාවට හා පාපයට විරුද්ධව සිටින පරිදි රෝගාබාධ වලට ද විරුද්ධ විය යුතුය. ඔබ පරීක්ෂාවට හා පාපයට විරුද්ධ වන විට ආත්මික සටනක නිරත වේ. ඔබ රෝගාබාධ වලට විරුද්ධ වන විට ද ඔබ ආත්මික සටනක නිරත වේ.

විනාශකාරී රෝග මූලයන් ගෙන එන්නේ සාතන්ය. සෑම රෝගයක්ම අශුද්ධ ආත්මයක සෘජු ප්‍රහාරයක් නොවූවද, රෝගාබාධ ඇති වීමේ මූලයන් ලෝකයේ පවතින්නේ සාතන් නිසාය. උදාහරණයක් ලෙස, ශීත කාලගුණයක් ඇති විට පාවහන් නොමැතිව යාම නිසා ඔබට සෙම්ප්‍රතිශ්‍යාව වැළඳිය හැකිය. මෙය අශුද්ධ ආත්ම වල සෘජු ප්‍රහාරයක් නොවන නමුත්, ඔබට සෙම්ප්‍රතිශ්‍යාව වැළඳීමට හේතු වූ රෝග මූලයන් ලෝකය තුළ පවතින්නේ සාතන් නිසාය.

සෑම රෝගයක්ම ඇති වන්නේ ජීවී විෂ බීජයකිනි. ඔබගේ ආත්මය ශරීරයට ජීවය දෙන පරිදි, සාතන් විෂ බීජ වලට ජීවය දේ. ස්වාභාවික ලෝකය තුළ, දෙවියන්වහන්සේ ජීවී සෛලයක් ගෙන ජීවය ඇති කිරීම උදෙසා එය ගුණනය කරයි (නව දරුවකු උපදී).

සාතන් යහපත වෙනුවට නපුර ඇතිකරයි. ඔහු ජීවී සෛලයක් ගෙන (වයිරස්, පිළිකා ආදිය) මරණය ගෙන ඒම උදෙසා එය ගුණනය කරයි. (පිළිකාවක් සහිත ශරීරයක තත්වය සම්බන්ධයෙන් මෙය විශේෂයෙන් සත්‍ය වේ. එය මැවුම්කරුට විරුද්ධව සෛල කැරලිගැසීමකි. සාමාන්‍යයෙන් පිළිකාව ඉවත් කිරීම සඳහා මාංශය කපා දැමූ විට, කැරලිගැසීම ශරීරයේ වෙනත් කොටසකට ගමන් කරන්නේ මේ නිසාය.)

දුර්වලතාවයේ ආත්මය පළවා හැරිය විට, ඔබගේ ශරීරය තුළ ඇති රෝගාබාධ මියයයි. එම ජීවී විෂ බීජය ඔබගේ ශරීරය තුළ පවතින තාක් කල්, රෝගය ජීවත් වන අතර එහි විනාශකාරී කාර්යයන් දිගටම කරගෙන යයි. රෝගවල මූලාරම්භය සාතන් කරණකොටගෙන වන බැවින්, ඔහුගේ බලය බැඳ පළවා හැරිය යුතුය.

දෙවියන්වහන්සේ රෝගාබාධ දෙස බලන ආකාරය ඔබ තේරුම් ගතහොත් එහි මූලය ගැන ඔබට කිසිදා සැකයක් ඇති නොවනු ඇත :

- දෙවියන්වහන්සේ රෝගාබාධ වහල්කමක් ලෙස සළකයි (යෝබ් 42:10). යේසුස්වහන්සේ පැමිණියේ වහලුන් නිදහස් කිරීම පිණිස දේශනා කිරීමටය (ලූක් 4:18).

- යේසුස්වහන්සේ රෝගාබාධ බැඳීම් ලෙස හැඳින්වූ සේක (ලූක් 13:16). උන්වහන්සේ පැමිණියේ සත්‍යයෙන් මිනිසුන් නිදහස් කිරීමටය (යොහන් 8:32)

- යේසුස්වහන්සේ රෝගාබාධ පීඩාවන් ලෙස සැළකූ අතර පීඩාවෙන් සිටි අය සුව කළ සේක (ක්‍රියා 10:38).

- බයිබලය රෝගාබාධ හා මරණය සතුරන් ලෙස සළකයි (1 කොරින්ති 15:26).

- රෝගය ඉතා අප්‍රසන්න දෙයක් ලෙස දක්වා ඇත (ගීතාවලිය 38:7)

- රෝගාබාධ නපුරු ලෙස හැඳින්වේ (ගීතාවලිය 41:8)

## රෝගාබාධ සඳහා හේතු

ආත්මික හෝ ශාරීරික රෝගාබාධ සඳහා එක මූලාශ්‍රයක් ඇති අතර, එම මූලාශ්‍රය සාතන්ය. නමුත් රෝගාබාධ ඇති වීම සඳහා හේතු විවිධාකාර වේ :

### ආත්මික නීති රීති කඩ කිරීම :

මිනිසා පාපයට වැටුණු පසු, මරණය ශරීරය තුළ විනාශය ක්‍රියාත්මක කිරීමට පටන් ගනී.

> **මක්නිසාද ව්‍යවස්ථාව දෙන තෙක් පාපය ලෝකයෙහි තිබුණේය. නුමුත් ව්‍යවස්ථාවක් නැති කල්හි පාපය ගණන්ගනු නොලැබේ. (රෝම 5:13)**
>
> **මක්නිසාද පාපයේ කුලි නම් මරණයය. (රෝම 6:23)**

කෙසේ නමුත්, කෙනෙකුට ඇති වන රෝගාබාධයක් ඔහුගේම පාපය නිසා ඇති වූවක් නොවිය හැකිය. උපතින්ම අන්ධව සිටි මිනිසා පිළිබඳ උදාහරණයේ දී යේසුස්වහන්සේ මේ බව පැහැදිලිව දැක් වූ සේක (යොහන් 9:1-3). දෙවියන්වහන්සේ පාපය සඳහා රෝගයෙන් දඬුවම් කළ හොත් ලෝකයේ සෑම පව්කාරයෙක්ම සහ පව් කරන සෑම කිතුනුවෙක්ම රෝගී වනු ඇත. පාපය හා රෝගය අතර සම්බන්ධයක් ඇති බව සැබෑ වූ නමුත්, මෙය පෞද්ගලිකව අදාළ කිරීමේදී අප ප්‍රවේසම් විය යුතුය. රෝගීන්ව නොසලකා හැරීමට සහ අපට එම රෝගීන් පිළිබඳව කිසි දෙයක් කිරීමට බලය නොමැති බවට හේතු දැක්වීමට උචිත ක්‍රමවේදයක් ලෙස මෙය යොදාගත හැකිය.

රෝගාබාධ ඇතිවන්නේ කෙනෙකුගේ පාපය හා ඇදහිල්ල මඳ බව (පාපයකි) නිසා යි ප්‍රකාශ කිරීම දේව වචනය ඉතාම වැරදි ලෙස අදාළ කරගත හැකි එක් ආකාරයකි.

ඔබ දෙවියන්වහන්සේගේ ආඥා කඩ කළහොත්, ඔබ විඳවනු ඇත. මෙය ඔබේම පාපි ක්‍රියාවන් උදෙසා දුක්විඳීමකි. පව්කාරයා උදෙසා මෙය විනිශ්චය වේ. ඇදහිලිවන්තයා උදෙසා මෙය තරවටුවකි. උදාහරණයක් ලෙස, කාමමිථ්‍යාචාරයෙහි යෙදෙන ඇදහිලිවන්තයෙකුට නොඇදහිලිවන්තයෙකුට මෙන්ම දරුණු රෝග ඇතිවිය හැකිය (ඒඩ්ස් වැනි). ඔබ දෙවියන්වහන්සේගේ ආඥා රක්ෂා කළද ඔබට දුක්විඳීමට සිදු විය හැකිය. එයට හේතුව ඔබ පාපයෙන් පිරුණු ලෝකයක ජීවත් වීමය. ලෝකය තුළ පාපය පැවතීම නිසා ඇතැම් විට ධර්මිෂ්ඨයන්ට දුක්විඳීමට සිදු වේ. තමන්ගේ පව්කාර හැසිරීම් නිසා ඒඩ්ස් වැළදෙන පුද්ගලයෙකු තමන්ගේම පාපය නිසා විඳවන කෙනෙකු සඳහා උදාහරණයකි. රුධිර පාරවිලනයක් තුළින් ඒඩ්ස් වැළදෙන පුද්ගලයෙකු, ලෝකය තුළ පවතින පාපය නිසා දුක්විඳින කෙනෙකු සඳහා උදාහරණයකි.

රෝගාබාධ පෞද්ගලික පාපය සමඟ සම්බන්ධ විය හැකි බව ඇතැම් බයිබල් පද ස්ථිර කරයි (මාර්ක් 2:1-12; යොහන් 5:1-11:14; යාකොබ් 5:14-16; ගීතාවලිය 38:3,7 බලන්න). ආබාධ ඇතිවන්නේ අපවිත්‍රබව (පාපය) තුළින් බව රෝම 6:19 ස්ථිර කරයි. අප ආත්මික නීති කඩ කරන විට, ද්විතිය කතාව 28 හි සඳහන් සාපය යටතේ අප ගමන් කරන්නෙමු. රෝගාබාධ සාමූහික පාපයන් සමඟ ද සම්බන්ධ විය හැකිය (ක්‍රියා 5:1-11; 1 කොරින්ති 11:27-32 බලන්න.)

නැවත පව් කිරීම තුළින් සුවය නැතිවිය හැකිය :

> **ඉන්පසු යේසුස්වහන්සේ දේවමාළිගාවේදී ඔහු දැක: බලාපන්න, නුඹ සුවය ලැබුවෙහිය. නුඹට මීට වඩා නරකක් සිදු නොවන පිණිස, තවත් පව් නොකරන්නැයි ඔහුට කීසේක. (යොහන් 5:14)**

මේ ලෝකය තුළ සැමවිටම රෝගය පවතින්නාක්මෙන් සැමවිටම පාපය ද පවතිනු ඇත. නමුත් ආත්මික සටන තුළින් අප පාපයට විරුද්ධව සටන් කරන පරිදිම අපට රෝගයට විරුද්ධව ද සටන් කළ හැකිය.

## සාතන්ගේ ප්‍රහාරයන් :

පාපය තුළින් ඇතිවන රෝගාබාධ වල මූලාරම්භය සාතන් වන බව සැබෑය. නමුත් ඇතැම් අවස්ථාවලදී පෞද්ගලික හා සාමූහික පව් නිසා පමණක් නොව සාතන්ගේ සෘජු ප්‍රහාරයන් නිසාද ඒවා ඇති වේ. යෝබ් මේ සඳහා කදිම උදාහරණයකි. (යෝබ් 1 හා 2 බලන්න)

පාපය යනු ආත්මික මනුෂ්‍යයා වෙත වූ සාතන්ගේ ප්‍රහාරයයි. රෝගාබාධ යනු ස්වාභාවික මනුෂ්‍යයා වෙත ඔහුගේ ප්‍රහාරයයි. නූතනයේ දී මෙන්ම, නව ගිවිසුමේදීත්, ධර්මිෂ්ඨයන් සාතන්ගේ ප්‍රහාරයන්ගේ බහුතරයකට ගොදුරු වේ. එයට හේතුව අප සාතන් සමඟ සටනකට යොමු කර ඇති බැවිනි. ඕනෑම යුද්ධයක දී තුවාලකරුවෝ සිටී.

සාතන් ඔබේ මනසට මෙන්ම ශරීරයට ද පහර දේ. ඔබගේ මනස, ශරීරය හා මාංශයේ පැරණි මිනිසාට (ඇස්වල තෘෂ්ණාව, මාංශයේ තෘෂ්ණාව හා ජීවිතයේ උඩඟුකම) ඔහු පහර දේ. ඔහු ආත්මිකව මෙන්ම ශාරීරිකවද ඔබට පහර දුන්නද, ඔබගේ ප්‍රාණය හෝ ආත්මය තුළ මෙන්ම ශරීරය තුළද රැඳී සිටීමට ඔහුට අයිතියක් නැත.

ඇදහිලිවන්තයෙකුගේ ශරීරය තුළ සාතන්ගේ ක්‍රියාකාරීත්වය ගරිල්ලා සටනකට සමාන කළ හැකිය. ඔවුන්ට එම ප්‍රදේශය පිළිබඳ කිසිඳු නීතිමය අයිතියක් නැති නමුත් කෙසේ හෝ ඒ තුළ ක්‍රියාත්මක වීමට උත්සාහ කරයි.

## ආත්මය ගළවා ගැනීම උදෙසා මාංසය මරණයට පත් කිරීම :

විනයානුකූල හේතූන් මත මාංසය මරණයට පත් කිරීම උදෙසා ඇතැම් අය සාතන් වෙතට හැරීමට දෙවියන්වහන්සේ ඉඩහරී. දෙවියන්වහන්සේ ඔවුන්ට රෝගය ගෙන එන්නේ නැත, නමුත් රෝගය පැමිණීමට ඉඩහරින සේක. 1 කොරින්ති 5:1-7 හි ඔබට මෙම ක්‍රියාවලිය ගැන ඉගෙන ගත හැකිය.

"මාංසය මරණයට පත් කිරීම", ආත්මය ගළවා ගත හැකි වන පිණිස සභාව පව්කාර මනුෂ්‍යයෙක් සාතන්ට භාර දේ. බයිබලය මෙම කරුණු එළිදරව් කරයි :

**එය කළ යුතු වන්නේ කෙසේද :**

1. එක්සත්ව
2. ස්වාමින්වහන්සේගේ ආත්මයෙන් හා බලයෙන්
3. ස්වාමීන්වහන්සේගේ නාමයෙන්

**එය කළ යුත්තේ ඇයි :**

1. අනාචාරයේදී
2. ලෝකයටත් (අන්‍යජාතීන්ටත්) වඩා නරක හැසිරීමේ දී
3. උඩඟුකම
4. පසුතැවිලිවීම නොමැති විට
5. දෙවියන්වහන්සේගේ සෙනඟ අතර නපුර ඇති විට

**එහි අරමුණ :**

1. පෞද්ගලික : ආත්මය ගළවා ගත හැකි වන පිණිස මාංසය මරණයට පත් කිරීම.
2. සාමූහික : අන් අයට බලපෑමක් වීමට පෙර නපුර පළවා හැරීම

## දෙවියන්වහන්සේගේ ස්වාභාවික නීතීන් කඩ කිරීම :

ඇතැම් ලෙඩ රෝග අපට වැළදෙන්නේ අප දෙවියන්වහන්සේගේ ස්වාභාවික නීතීන් කඩ කරන බැවිනි. උදාහරණ ලෙස :

- නිසි ආහාර නොගැනීම (බර වැඩිකම, බර අඩු කම)

- වැඩිපුර වැඩ කිරීම, කලබලකාරී ක්‍රියාකාරකම්

- නිසි විවේකයක් නොමැතිකම

- ස්වයං පාලනයක් නොමැතිකම, මේ හේතුවෙන් කෝපය, තික්තකම වැනි හානිකර හැඟීම් ඇතිවේ.

- අන් අය සමඟ ඇති ධනාත්මක සම්බන්ධතාවය අඩුවීම (තික්තකම, සමාව නොදීම වැනි)

- ව්‍යායාම (වැඩි වීම හෝ මද බව)

- මත් කුඩු හෝ මත්පැන් වලට ඇබ්බැහිවීම : ඒ තුළින් විෂ රසායන ද්‍රව්‍ය ශරීරයට ඇතුළු වේ.

- ගුරුත්වාකර්ෂණ නියමය වැනි ස්වාභාවික නියමයන් කඩ කිරීම. (ඔබ උස් ගොඩනැඟිල්ලකින් බිමට පැන්න හොත්, ඔබට තුවාළ සිදු විය හැකිය !)

- අනතුරුදායක ක්‍රියාවන් තුළින් සහ ආරක්ෂක විධි විධාන පාවිච්චිය ප්‍රතික්ෂේප කිරීම තුළින් ඔබ විසින්ම ඔබව අනතුරුදායක තත්වයකට පත්කර ගැනීම. (මෝටර් රථයේ ආරක්ෂක පටි, සේවය කරන ස්ථාන වල පළඳින ඇස් ආවරණ, ඉදිකිරීම් භූමියකදී හිස් ආවරණ, ආදිය)

## ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසි පරිදි තේරුම් නොගැනීම :

ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නිසි පරිදි තේරුම් නොගැනීම නිසා සහ ශුද්ධ සහභාගිකම සුළුකොට තැකීම නිසා බොහෝ අය දුර්වලව හා ලෙඩව සිටි බව පාවුල් පැවසුවේය.

# රෝගාබාධ වල අවසන් ප්‍රතිඵලය

රෝගාබාධ වල අවසන් ප්‍රතිඵලය පහත ඒවායින් එකක් වනු ඇත...

## දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා :

මනුෂ්‍යයකු සුව වන අතර ඔහුගේ සාක්ෂිය, ජීවිතය හා සේවය තුළින් දෙවියන්වහන්සේට මහිමය ලැබේ. යේසුස්වහන්සේ අන්ධ මිනිසා ගැන මෙසේ පැවසූ සේක :

> **යේසුස්වහන්සේ උත්තරදෙමින්: දෙවියන්වහන්සේගේ ක්‍රියා මොහු කෙරෙහි ප්‍රකාශවන පිණිස මිස මොහුවත් මොහුගේ මවුපියන්වත් පව්කළ නිසා නොවේ. (යොහන් 9:3)**

සැබවින්ම දිව්‍යමය සුව කිරීම් තුළින් දෙවියන්වහන්සේට මහිමය ලැබේ. එසේම ශරීරයේ ක්‍රියාවලිය තුළින් ඇති වන ස්වාභාවික සුව වීමේහිදී ද දෙවියන්වහන්සේට මහිමය ලැබිය යුතුය. දෙවියන්වහන්සේ ශරීරය මැවූ අතර ස්වාභාවික ශරීරයේ ක්‍රියාකාරීත්වය තුළින් උන්වහන්සේගේ ස්වාභාවය සහ නිර්මාණාත්මක බලය පිළිඹිබු කරන සේක.

වෛද්‍ය විද්‍යානුකූල සුව කිරීම් වලදීද දෙවියන්වහන්සේට මහිමය හිමිවිය යුතුය. සියලු යහපත් දීමනා දෙවියන්වහන්සේගෙන් වන බව බයිබලය පවසන අතර ඒ තුළ ඖෂධ, විටමින් හා අපට ශරීරික ප්‍රතිලාභ ගෙන දෙන අනෙකුත් ද්‍රව්‍ය ඇතුළත් වේ. බොහෝ ඖෂධ ඇති වන්නේ ශාක තුළ ඇති ස්වාභාවික ද්‍රව්‍ය වලින් හා දෙවියන්වහන්සේ විසින් මුලින්ම නිර්මාණය කළ ද්‍රව්‍ය වලින් වේ. ගැටලුව ඇති වන්නේ දෙවියන්වහන්සේ සුවයේ උල්පත බව තේරුම් ගනු වෙනුවට මිනිසුන් ඖෂධ වලට හා වෛද්‍යවරුන්ට ප්‍රශංසා කරන විටය.

> **... එහෙත් ඔවුන්ට සුවකළේ මා බව ඔව්හු නොදැන සිටියෝය. (හොෂෙයා 11:3)**

ඇතැම් විට සුවය ප්‍රමාද වන අතර පුද්ගලයෙකු පසුව හෝ ක්‍රමයෙන් සුව වනු ඇත. මෙම උදාහරණ සළකා බලන්න.

- යොහන් ඉපදෙන තුරු සෙකරියස් සුව වූයේ නැත : ලූක් 1:20

- දෙවියන්වහන්සේගේ කාලය එනතුරු හන්නාට දරුවකු ලැබුණේ නැත : 1 සාමුවෙල් 1:5-19

- ආබ්‍රහම්ට කොතරම් ඇදහිල්ලක් තිබුණත්, දෙවියන්වහන්සේගේ කාලය එනතුරු සාරාට හා ආබ්‍රහම්ට දරුවකු ලැබුණේ නැත : හෙබ්‍රෙව් 11:11

## මරණය ගෙන දෙන ලෙඩ රෝග :

යොහන් 11:4 දී ලාසරස්ගේ රෝගය මරණය ගෙන දෙන්නක් නොවන බව යේසුස්වහන්සේ පැවසූ සේක. එහි අදහස මරණය ගෙන දෙන ලෙඩ රෝග ද පවතින බවයි. බයිබලය තුළ මරණය ආකාර දෙකකින් දක්වා තිබේ. මාංශය මරණයට පත් විම පිණිස පාවා දෙනු ලැබූ අය ආත්මය ගළවා ගනු ඇති වන පිණිස නොමේරූ මරණයකට පත් වෙති.

සෑම මනුෂ්‍යයෙකුගේම මරණය සඳහා නියම කළ කාලයක් තිබේ (දේශනාකාරයා 3:2; හෙබ්‍රෙව් 9:2). බොහෝ සුව කිරීමේ හාස්කම් කළ ශ්‍රේෂ්ඨ එලිෂා අනාගතවක්තෘවරයා පවා "මරණීය ලෙඩක්" (2 රාජාවලිය 13:14) වැළඳුණේය. රෝගී තත්වයට පත්නොවී යමෙකුට ස්වසනය නතර කිරීමට (මරණය) හැකිය.

> **ඔබගේ මුහුණ සඟවන කල උන් කැලඹෙති: ඔබ උන්ගේ හුස්ම පැහැරගන්න කල උන් නැසී දූවිල්ලට හැරීයෙති. (ගීතාවලිය 104:29)**

ඇදහිලිවන්තයකු උදෙසා, මහලු කාලයේදී ඇතිවන බලපෑම මේ ආකාර විය හැකිය. මහලු මිනිසකු ලෙස මෝසෙස්ට වයස නිසා කිසිඳු බලපෑමක් ඇති නොවිය. යෝෂුවා "මහලුව හා වයෝවෘද්ධව" සිටියේය. දෙවියන්වහන්සේ එක් කෙනෙකු අධිස්වාභාවික ලෙස ආරක්ෂා කළ අතර අනෙක් තැනැත්තා ස්වාභාවිකව මහලු වීමේ ප්‍රතිඵල අත්දුටු වේය. ඔවුන්ගේ ආත්මික තත්වය ඒ උදෙසා කිසි බලපෑමක් නොවිය. අපගේ ශරීර ස්වාභාවිකව මහලු වීමේ ක්‍රමවේද අනුගමනය කරමින් රෝග මඟින් මරණය ළඟා කර ගන්නේද නැතිනම් අධිස්වාභාවික ලෙස ආරක්ෂා වනවාද යන්න කාරණා දෙකෙහිදීම දෙවියන්වහන්සේ දරා සිටිනවා ඇත. සුව කිරීමේ ඉලක්කය අමරණීයත්වය නොවේ. ඖෂධ වලින් සිදුවන ප්‍රමාණයට වඩා වැඩිපුර දිව්‍යමය සුවකිරීමෙන් මෙය ළඟා කරගන්නේ නැත. යේසුස්වහන්සේ මරණින් නැඟිටවූ අය පවා පසු කළෙක මිය ගියහ.

ඇදහිලිවන්තයෙකු මිය ගිය විට, සදාකාලික මිනුම් දණ්ඩ අනුව එය උසස්ම සුව කිරීමයි. සදාකාලයට වඩා කාලයෙන් බැඳීව ජීවත් වීමේ අත්වැරැද්ද අපි කරන්නෙමු. ඇදහිලිවන්තයෙකු ලෙස, අප මෙහි ජීවත් වුවද මරණයෙන් එහා ජීවත් වුවද අපි දැනටමත් සදාකාලික ජීවිතය ගත කරන්නෙමු.

## සුව කිරීමේ දීමනා

ශුද්ධාත්මයාණන්ගේ දීමනා ශරීරයට දී තිබෙන්නේ ශරීරයේ ගොඩනැංවීම උදෙසාය. එසේම සුව කිරීමේ දීමනා සියල්ලන්ට ලබාගත හැකි අතර සුවය සියල්ලන් උදෙසාය. තනි පුද්ගලයකු තමා විසින්ම සුව කිරීමේ දීමනා ක්‍රියාවට නංවන්නේ නැත. ඒවා ඔහු තුළින් ශුද්ධාත්මයාණන් විසින් ක්‍රියාවට නංවයි. අප අනර්ඝම දීමනාව සොයාගත යුතු බව බයිබලය පවසයි :

> **නුමුත් වඩා උතුම් දීමනාවලට ආශාවෙයල්ලා. තවද ඊටත් වඩා උතුම් මාර්ගයක් මම නුඹලාට පෙන්වමි. (1 කොරින්ති 12:31)**

ඔබ සුවකිරීමේ දීමනා උදෙසා යාච්ඤා කරන විට, ඔබ දෙවියන්වහන්සේගෙන් ඉල්ලනුයේ දැනටමත් ඔබ තුළ ඇති දේ තවදුරටත් වර්ධනය කිරීමටය. එයට හේතුව සියලු ඇදහිලිවන්තයන්ට රෝගීන් මත අත් තැබීමේ හැකියාව හා ආධිපත්‍ය පැවතීමයි. යේසුස්වහන්සේට දී තිබූ සම්පත් උන්වහන්සේ වර්ධනය කර ගත් අතර (ලූක් 5:22) තමා තුළ වූ දීමනා ඉස්මතු කරගන්නා ලෙස තිමෝතිට පවසනු ලැබීය (2 තිමෝති 1:3).

“දීමනා” යන වචනය බහු වචනයක් වන බැවින් සුව කිරීමේ දීමනා විවිධාකාර වේ. විවිධ රෝගාබාධ පවතින අතර ඒවා සුව කිරීමට විවිධ දීමනා (හෝ ආකාර) තිබේ. දෙවියන්වහන්සේට එක් ආකාරයකින් පමණක් සුව කිරීමට අවශ්‍ය වූයේ නම් උන්වහන්සේ බයිබලය තුළ විවිධ ක්‍රමවේද පාවිච්චි නොකරනු ඇත.

පුද්ගලයෙකු ගැළවීමට ගෙන ඒම සඳහා දෙවියන්වහන්සේ පාවිච්චි කරන විවිධ ක්‍රමවේද ගැන සිතන්න. සුවය ගෙන ඒම සඳහා උන්වහන්සේ විවිධ ආකාර පාවිච්චි නොකරනු ඇතිද? ඔවුන් තුළ වූ ක්‍රමවේද හෝ දීමනා ඔවුන්ට ගැළවීම ගෙන ආ නොහැකි ලෙසම සුවයද ගෙන නොදේ. ඒවා දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ වන මාර්ගයන් පමණකි. බයිබලය තුළ පහත ආකාර වලින් සුවය ගෙන දෙනු අපට දැකගත හැකිය :

1. අත් තැබීමෙන් : සේවකයා රෝගියා ස්පර්ශ කිරීමෙන්

2. පුද්ගලයන් සේවය කරන්නාව ස්පර්ශ කිරීමෙන්

3. යම් දුරක සිට වචනය ප්‍රකාශ කිරීමෙන්

4. රෝගියා ඉදිරියේ සිට වචනය ප්‍රකාශ කිරීමෙන්

5. පුද්ගලයා සමඟ සෘජුව ගණුදෙනු කිරීමෙන්

6. තවත් කෙනෙකුගේ මැදහත්කම නිසා සුවය ලැබීම

7. යාච්ඤා කිරීම

8. ඇදහිල්ලේ ක්‍රියා : රෝගියා විසින් කරනු ලබන ඇදහිල්ලේ ක්‍රියාවක් නිසා සිදුවන සුව කිරීම.

9. විවිධාකාරයෙන් ඇදහිල්ල ක්‍රියාත්මකවීම :

    a. සේවය කරන්නාගේ ඇදහිල්ල
    b. සුවය සොයන්නාගේ ඇදහිල්ල
    c. මිතුරන්ගේ ඇදහිල්ල
    d. ඥාතීන්ගේ ඇදහිල්ල

10. විවිධ "මාධ්‍යයන්" පාවිච්චියෙන්. ඒවායේ ශුද්ධ බවක් නිසා නොව ඒවා සම්බන්ධකම ඇතිකර ගැනීමේ මාධ්‍යයක් පමණි :

a. කෙළ
b. මඩ
c. යාච්ඤා කළ රෙදි කඩක්
d. අත්තික්කා පල වලින් සැදූ විලේපනයක්
e. සේවකයාගේ ඇඳුමේ වාටිය
f. සේවකයාගේ සෙවනැල්ල
g. තෙල්
h. කන් මත ඇඟිලි තැබීම
i. ජලය
j. ස්පර්ශය

11. විශේෂ හාස්කම් :

විශේෂ සුවකිරීම් සඳහා සමහර පුද්ගලයන් දෙවියන්වහන්සේ විසින් ඇදහිල්ලෙන් ආලේප කරනු ලැබේ (අපෝස්තළුවර පාවුල් වැනි). උදාහරණයක් ලෙස, පිළිකා රෝගීන් සඳහා විශේෂයෙන් සේවය කිරීමට දෙවියන්වහන්සේ ඇතැම් අය පාවිච්චි කරන සේක. අප සියලු ආකාරයේ සුවකිරීම් නොකළ යුතු බව මෙයින් අදහස් නොවන අතර අපගේ නියෝගය පොදුවේ සුව කිරීම උදෙසා වේ.

සියලු ඇදහිලිවන්තයන්ට සුවකරන ලෙස අණකර ඇති අතර, දෙවියන්වහන්සේ ඇතැම් අය තුළින් විශේෂ සුවකිරීමේ දීමනා මඟින් ක්‍රියාත්මක වුවත් සියලු දෙනාම සුව කිරීමේ සේවයට සහභාගී විය යුතුය. සුව කිරීමට සම්බන්ධ විය යුතු යැයි බයිබලය පවසන පුද්ගලයින් පහත දැක්වේ.

- සභාපාලකවරු සහ එඬේරන් (ආත්මික නායකයන්) : එසකියෙල් 34
- වැඩිමහල්ලන්/උපස්ථායකයන් : යාකොබ් 5:14
- සාමාන්‍ය ඇදහිලිවන්තයන් : යාකොබ් 5:16; ලූක් 16:15-18
- විශේෂ සුව කිරීමේ දීමනා ඇති අය : 1 කොරින්ති 12:9
- මුළු සභාවම සුව කිරීමේ මධ්‍යස්ථානයකි : ලූක් 14:16-24

## සුව කිරීමේ අරමුණු

සුව කිරීමේ ඉතාම අනිවාර්යය අරමුණ රෝගියෙකු සුවකිරීමයි. නමුත් සුව කිරීම් හා මිදීම පුද්ගලයෙකු පූර්ණත්වයට පැමිණවීමට වඩා වෙනත් අරමුණු ද තිබේ. සුව කිරීම් හා මිදීම තුළින් පහත දේවල් ද සිදු වේ.

### දෙවියන්වහන්සේගේ චරිතය පෙන්නුම් කරයි :

**ස්වාමීන්වහන්සේ දයාවන්තය, අනුකම්පාවෙන් පූර්ණය; උදහස්වීමට ප්‍රමාදය, මහත් කරුණාවෙන් යුක්තය. ස්වාමීන්වහන්සේ සියල්ලන්ට යහපත්ය; උන්වහන්සේගේ දයාබරකම් උන්වහන්සේගේ සියලු කර්මාන්ත කෙරෙහිය. (ගීතාවලිය 145:8-9)**

**උන්වහන්සේ අනුකම්පාවෙන් යුක්තව අත දිඟුකොට ඔහු පිට තබා: කමැත්තෙමි, පවිත්‍රවෙයන්නැයි ඔහුට කීසේක. (මාර්ක් 1:41)**

### දෙවියන්වහන්සේ මහිමයට පත් කරයි :

**බොහෝ සමූහයෝ කොරුන්, අන්ධයන්, ගොළුවන්, අබ්බගාතයන් හා වෙනත් බොහෝ දෙනා රැගෙන යේසුස්වහන්සේ ළඟට ඇවිත්, උන්වහන්සේගේ පාමුල ඔවුන් තැබුවෝය; උන්වහන්සේ ඔවුන්ට සුවකළ සේක. ඒ නිසා ගොළුවන් කථාකරන බවත් අබ්බගාතයන් සුවවී ඉන්න බවත් කොරුන් ඇවිදින බවත් අන්ධයන්ට ඇස් පෙනෙන බවත් සමූහයෝ දැක, පුදුමව, ඉශ්‍රායෙල්ගේ දෙවියන්වහන්සේට ප්‍රශංසාකළෝය. (මතෙව් 15:30-31)**

**සිද්ධවුණු දේ ගැන සියල්ලන් දෙවියන්වහන්සේට ප්‍රශංසාකළ බැවින්, සෙනඟ නිසා ඔවුන්ට දඬුවම්කරන්ට අන්දමක් නොදැක, ඔව්හු ඔවුන්ට තවදුරටත් තර්ජනයකොට යන්ට හැරියෝය. (ක්‍රියා 4:21)**

දෙවියන්වහන්සේට නිසි ලෙස බිය වීමද දෙවියන්වහන්සේ මහිමයට පත් කිරීමේ කොටසකි. සුව කිරීම තුළින් මෙයද සිදුවේ :

**එවිට සියලුදෙනා කෙරෙහි භය පැමුණුණේය. බොහෝ පුදුමද හාස්කම්ද ප්‍රේරිතයන් කරණකොටගෙන කරන ලද්දේය. (ක්‍රියා 2:43)**

## යේසුස්වහන්සේ ගැළවුම්කරු හා මෙසියස්වහන්සේ බව තහවුරු කරයි :

ඔබගේ බයිබලයෙන් මතෙව් 8:14-17 කියවන්න. මෙහි සඳහන් සුව කිරීම අනාගතවක්තෘවරයාගේ වචන ස්ථිර කළේය :

**මෙසේ වුයේ: උන්වහන්සේම අපේ දුර්වලකම් ගත්සේක, අපේ රෝග උසුලාගත්සේකැයි අනාගතවක්තෘවූ යෙසායා කරණකොටගෙන කියනලද කාරණාව සම්පූර්ණවන පිණිසය. (මතෙව් 8:17)**

ලූක් 5:18-26 හිදී කොර මිනිසා සුව කිරීම හා ඔහුගේ පාපයන්ට සමාව දීම යේසුස්වහන්සේ ගැළවුම්කරු මෙන්ම සුවය දෙන්නා ද වන බව ස්ථිර කරයි. සුව කිරීම් හා යක්ෂයන් දුරු කිරීම් යේසුස්වහන්සේ ගැළවුම්කරු බව ස්ථිර කළ තවත් අවස්ථා සඳහා උදාහරණ කිහිපයක් පහත දැක්වේ :

**මම මාගේ පියාණන්වහන්සේගේ ක්‍රියා නොකරම් නම්, මා විශ්වාස නොකරල්ලා. නුමුත් ඒවා කරම් නම්, නුඹලා මා විශ්වාස නොකරතත් පියාණන්වහන්සේ මා තුළෙහිද මා පියාණන්වහන්සේ තුළෙහිද සිටින බව දැන තේරුම්ගන්නා පිණිස ක්‍රියා විශ්වාසකරපල්ලායයි කීසේක. (යොහන් 10:37-38)**

**මේ පොතෙහි ලියා නැති වෙනත් බොහෝ හාස්කම් යේසුස්වහන්සේ ගෝලයන් ඉදිරියෙහි කළසේක. නුමුත් මේවා ලියනලද්දේ යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ පුත්‍රවූ ක්‍රිස්තුස්වහන්සේ බව නුඹලා විශ්වාසකරන පිණිසත් විශ්වාසකොට උන්වහන්සේගේ නාමයෙන් ජීවනය ලබන පිණිසත්ය. (යොහන් 20:30-31)**

## පණිවුඩය ගෙනයන්නා හා පණිවුඩය වෙනස් කර දක්වයි :

**ස්ත්‍රීද: ඔබ දෙවියන්වහන්සේගේ මනුෂ්‍යයෙකු බවත් ඔබගේ මුඛයෙහි තිබෙන ස්වාමීන්වහන්සේගේ වචනය සැබෑ බවත් දැන් දනිමියි එලියාට කීවාය. (1 රාජාවලිය 17:24)**

**එහෙයින් ඔව්හු ස්වාමීන්වහන්සේ තුළ නිර්භීතලෙස කථාකරමින් බොහෝ කලක් නැවතී සිටියෝය. උන්වහන්සේ ඔවුන්ගේ අත්වලින් හාස්කම්ද පුදුමද කරවමින්, ස්වකීය අනුග්‍රහයේ වචනයට සාක්ෂි දැරූසේක. (ක්‍රියා 14:3)**

**එවිට ඔව්හු පේත්‍රුස්ගේද යොහන්ගේද නිර්භීතකම දැක, ඔවුන් අපණ්ඩිතවූ නූගත් මනුෂ්‍යයන් බව දැන මවිතවූවෝය; ඔවුන් යේසුස්වහන්සේ සමඟ සිටි බව ඔව්හු ඇඳින්නෝය. (ක්‍රියා 4:13)**

## ශුභාරංචිය පිළිගැනීමට ධෛර්යය දේ :

**ඒ පුත්‍රයාණන්වහන්සේ මාංසාකාරයෙන් දාවිත්ගේ වංශයෙන් ඉපිද, ශුද්ධකමේ ආත්මයේ ප්‍රකාරයට දේව පුත්‍රයාණන් හැටියට මළවුන්ගෙන් නැඟිටීම කරණකොටගෙන බලයෙන් යුක්තව ප්‍රකාශකරනු ලැබූසේක. (රෝම 1:5)**

පුද්ගලයෙකු සුවය ලැබූ පසු ඔහුට ශුභාරංචිය පැවසීම පහසුය. ක්‍රියා පොත තුළ මේ සඳහා උදාහරණ කිහිපයක් තිබේ. සුව කිරීම තුළින් ගැළවීම උදෙසා ශුභාරංචිය බෙදා ගැනීමට, ශුද්ධාත්මයෙන් පූර්ණ වීමට හා සභාව වර්ධනය වීමට දොරටු විවර විය. උදාහරණ සඳහා ක්‍රියා 2:42-47 හා 5:14 බලන්න.

සුවකිරීම් තුළින් ශුභාරංචිය පිළිගැනීමට ධෛර්යය දුන්නද, එය ගැළවීම උදෙසා ශුභාරංචිය දේශනා කිරීම වෙනුවට යොදාගත නොහැකි බව මතක තබා ගන්න. මිනිසුන් දෙවියන්වහන්සේ සමඟ නිසි සම්බන්ධතාවය වෙත ගෙන ඒම සඳහා සුව කිරීම හා යක්ෂයන් දුරු කිරීම තුළින් දෙවියන්වහන්සේගේ බලය ප්‍රකාශ කිරීමත් සමඟ වචනයද උගන්වනු ලැබිය යුතුය. ගැළවීම, සුවය හා යක්ෂයන්ගෙන් නිදහස්වීම සඳහා අවශ්‍ය ඇදහිල්ල නිර්මාණය කරන්නේ වචනය බව සැමවිටම මතක තබා ගන්න.

සුව කිරීම ධර්ම ප්‍රචාරණය උදෙසා ඇති බලවත් ආයුධයකි. බයිබලයේ වාර්තාගත සුව කිරීම් තුළ :

- උදාහරණ 17 කදී, සුව කිරීම් සිදු වූයේ ධර්ම ප්‍රචාරණ වාතාවරණයකදීය :

    මතෙව් 4:24; 8:16; 9:2-8; 9:32-33
    මාර්ක් 1:23-28; 9:14-27; 1:46-52
    ලූක් 8:42-48; 13:10-13,16; 14:1-4; 17:11-19
    යොහන් 4:28-30; 5:1-9, 14; 9:1-7
    ක්‍රියා 3:1-10; 8:5-8; 14:8-10

- උදාහරණ 16 කදී. සුව කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ධර්ම ප්‍රචාරණය සිදු විය :

    මතෙව් 9:2-8; 9:32-33; 12:9-13
    මාර්ක් 1:23-28; 5:1-13; 18-20; 7:32-37; 9:14-27
    ලූක් 5:12-14; 13:10-13,16; 17:11-19
    යොහන් 4:28-30; 9:1-7
    ක්‍රියා 3:1-8; 8:5-8; 9:32-35; 14:8-10

- සුව කිරීම් 26 න් 21 ක්ම ධර්ම ප්‍රචාරණ පසුබිමක් තුළ සිදු වූවක් හෝ එහි ප්‍රතිඵලය ලෙස ධර්ම ප්‍රචාරණය සිදු වූවක් විය.

## දේව රාජ්‍යය පිහිටුවයි :

> **එහි ඉන්න රෝගීන් සුවකරපල්ලා, දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා ළඟට පැමුණුණේයයි ඔවුන්ට කියාපල්ලා. (ලූක් 10:9)**
>
> **තවද යේසුස්වහන්සේ ඔවුන්ගේ සිනගෝගවල උගන්වමින්ද රාජ්‍යයේ ශුභාරංචිය දේශනාකරමින්ද සෙනඟ අතරෙහි සියලු ආකාර ලෙඩ හා සියලු ආකාර රෝග සුවකරමින්ද ගලීලය මුළුල්ලෙහි ඇවිද්දසේක. (මතෙව් 4:23)**
>
> **නුමුත් මම දෙවියන්වහන්සේගේ ආත්මයාණන් කරණකොටගෙන යක්ෂයන් දුරුකරම් නම්, සැබවින්ම දෙවියන්වහන්සේගේ රාජ්‍යය නුඹලා කරා පැමිණ තිබේ. (මතෙව් 12:28)**

ඔබ සුව කිරීමේ සේවයේ යෙදෙන විට, දේව රාජ්‍යය තවමත් සම්පූර්ණ වී නොමැති බව මතක තබා ගන්න. දේව රාජ්‍යය සම්පූර්ණ වූ විට එහිදී ලෙඩ රෝග හා මරණය කිසි සේත් නොපවතිනු ඇත. ප්‍රාණය මෙන්ම ශරීරයද, රාජ්‍යයේදී සම්පූර්ණත්වයට පැමිණෙනු ඇති අතර දැන් නිදහස් වී නොමැත.

අප අතීතයේදී පාපය උදෙසා වූ දඬුවමින් ගැළවීම ලබා ඇති අතර වර්තමානයේදී එහි බලයෙන් ගැළවිය හැකිය. අනාගතයේදී අප පාපයේ පැවැත්මෙන් ගැළවීම ලබනු ඇත. රෝගාබාධ සම්බන්ධයෙන්ද එය සත්‍ය වේ. රෝගාබාධ අපගේ අතීත පව් සඳහා දඬුවමක් නොවේ. වර්තමානයේදී අපට එහි බලයෙන් ගැළවීම ලද හැකි අතර, අනාගතය වන තුරු එහි පැවැත්මෙන් ගැළවිය නොහැක.

## සතුරා කෙරෙහි වූ විනිශ්චය පිළිඹිබු කරයි :

> **විනිශ්චය ගැනයයි කීවේ මේ ලෝකයේ අධිපතියා විනිශ්චයකරනු ලැබ සිටින නිසාය. (යොහන් 16:11)**

ඔබ රෝගීන් මත අත තබන විට, ලෝකයේ කුමාරයා විනිශ්චයට ලක් වී ඇති බව සහ රෝගාබාධ හා අසනීප වල බලය විනාශ වී ඇති බව ඔබ ප්‍රකාශ කරයි. විනාශ වී තිබෙන්නේ රෝගාබාධ වල බලය මිස එහි පැවැත්ම නොවන බව මතකයේ තබා ගන්න. අප එහි පැවැත්මෙන් නිදහස් කරනු ලබන්නේ දේව රාජ්‍යය සම්පූර්ණයෙන් පැමිණි කළ පමණි.

### ආත්මික නායකයන් නඟා සිටුවයි :

ශ්‍රේෂ්ඨ ආත්මික නායකයන් නඟා සිටුවීමට සුවකිරීම් යොදාගෙන තිබේ. පාවුල්ගේ සුවකිරීමේ කාලයේ පටන් පාවුල් ශුභාරංචියේ අපෝස්තුළුවරයා ලෙස හැඳින්විය (ක්‍රියා 9).

### මහත් ප්‍රීතියක් ගෙන දේ :

ක්‍රියා 8:5-25 කියවන්න. සුවය හා මිදීම සිදු වු විට පුද්ගලයන්ට හා සමාජයන්ට ඇති වන මහත් ප්‍රීතිය මෙම පරිච්ඡේදයෙන් විස්තර කෙරේ.

## ඔබ ආරම්භ කරන විට...

බ්‍රිතාන්‍ය අත්පත් කරගැනීමට අවශ්‍ය වු, ජුලියස් සීසර් නම් ප්‍රසිද්ධ පාලකයා තම සේනාව සමඟ ප්‍රංශයේ සිට එංගලන්තයට මුහුදෙන් ගමන් කළේය. ඉන්පසු ඔහු බ්‍රිතාන්‍ය ඇළ හරහා යාමට යොදාගත් සෑම නැවක්ම පිළිස්සුවේය. එය ජයග්‍රාහිකව ඉදිරියට යාමක් හෝ මරණයට මුහුණදීමක් විය. ඒ සඳහා කිසිඳු පසුබැසීමක් නොවීය.

සුව කිරීමේ හා මිදීමේ සේවය තමා පසුපස ඇති නොඇදහිල්ලේ හෝ බියගුළු බවේ පාලම් ගිනි තබන අය උදෙසාය. සුවය හා මිදීම උදෙසා ඔබ මතයන් දෙකකින් එකක් ගනු ඇත. ඔබ පැත්තකින් හා ප්‍රවේශමෙන් බලා සිටින, නව ගිවිසුමේ නායකයෙකු වූ ගමාලියෙල් මෙන් වනු ඇත. පැත්තකින් හිඳ බලා සිටින ලෙස ඔහු ආගමික නායකයන්ට යෝජනා කළේය. නොඑසේනම් ඔබ, තම ක්‍රියාවේ අවධානම භාරගත් පේත්‍රුස්ට සමාන වනු ඇත. ඔහු ආත්මික නායකයන්ගේ කෝපයට මුහුණ දෙමින් හා යේසුස්වහන්සේගේ නාමයෙන් දේශනා කරන ලෙස හෝ සුව කිරීම් නොකරන ලෙස ඔහුට අණ කළ අධිපතීන්ට විරුද්ධව සිටිමින් ඔහු කොර මිනිසා සුව කළේය.

ඔබ සුව කිරීම සඳහා සුවය සපයන්නෙක් මිස, සුවකරන්නා නොවන බව මතක තබා ගන්න. ඔබ මාධ්‍යයක් පමණක් වන අතර ඔබ තුළ සිටින සුව කරන්නා ඔබ තුළින් පහත සඳහන් අය වෙත ගලා යනු ඇත.

- අසාධ්‍ය ලෙස දුක්විඳින හෝ පීඩාකාරී වේදනාවන්ට මුහුණ දෙන මිනිසුන් වෙත

- ජීවිතය තමාට සිදු කර ඇති දේවල් නිසා කරදර වන හෝ ජීවිතය තුළ තමා කර ඇති දේවල් ගැන වරදකාරී හැඟීමෙන් පසුවන මිනිසුන් වෙත.

- වෙහෙසට පත්ව, බලාපොරොත්තු රහිතව ජීවිතය අත්හැරීමට සූදානම් මිනිසුන් වෙත.

- තමන් ආදරය කරන අය අහිමි වු පුද්ගලයන් හෝ වේදනාවට පත්ව දරාගත නොහැකි තරම් වේදනාකාරී නමුත් පැවසිය නොහැකි තරම් පෞද්ගලික හැඟීම් වලින් හදවත පුරවාගත් මිනිසුන් වෙත.

- පාපය හා යක්ෂයාගේ පීඩාව නමැති දම්වැල් වලින් බඳිනු ලැබූ මිනිසුන් වෙත.

- මරණයට මුහුණ දෙමින් සිටින මිනිසුන් වෙත.

යේසුස්වහන්සේ ඇසූ මෙම ප්‍රශ්නය ගැන සිතා බලන්න : “වඩා පහසු, “ඔබගේ පව් කමා කරන ලදි” යයි පැවසීමට “නැඟිට ඇවිදින්න” යයි පැවසීමද?

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සුව කිරීම පිළිබඳ වත්මන් ආකල්ප සමහරක් පැහැදිලි කරන්න.

3. පස් ආකාරයක රෝගාබාධ හඳුනාගන්න.

4. "දිව්‍යමය සුව කිරීම" නිර්වචනය කරන්න.

5. රෝගාබාධ ඇති වීමේ මූලාරම්භය කවුද?

6. රෝගාබාධ ඇති වීම සඳහා හේතු සමහරක් ලියා දක්වන්න.

7. රෝගාබාධ ඇතිවීමේ අවසන් ප්‍රතිඵල දෙක මොනවාද?

8. දිව්‍යමය සුවකිරීමේ අරමුණු සමහරක් ලියා දක්වන්න.

(ස්වයං පරික්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. සුව කිරීම් හා මිදීම් පිළිබඳ ඔබගේ අධ්‍යයනය තවදුරටත් කරගෙන යාම සඳහා බයිබල් පද සමහරක් පහත දැක්වේ. ඒ තුළ සුව කිරීමේ හා මිදීම් පිළිබඳ පොරොන්දු මෙන්ම උදාහරණද ඇතුළත් වේ.

### පැරණි ගිවිසුමේ බයිබල් පද

උත්පත්ති 17:18-19 : සාරාගේ වඳ බව සුව කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වූසේක.

උත්පත්ති 20:17 : දෙවියන්වහන්සේ අබිමෙලෙක්ව සුව කළ සේක.

නික්මයාම 4:6-7 : මෝසෙස්ගේ කුෂ්ඨයක් සහිත අත.

නික්මයාම 15:25-26 : තම නම "ජෙහොවා රාෆා" ලෙස දෙවියන්වහන්සේ එළිදරව් කළ සේක. එහි අදහස "ස්වාමීන්වහන්සේ සුව කරන සේක" යන්නයි. ඊජිප්තුවේ කිසිඳු ලෙඩ රෝගයක් ඉශ්‍රායෙලය පිට නොපැමිණෙන බවට උන්වහන්සේ පොරොන්දු වූ සේක.

නික්මයාම 23:25 : තම සෙනඟ අතරින් රෝගාබාධ ඉවත් කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු වූ සේක.

ලෙවි කතාව 13:1-46 : කුෂ්ඨ රෝගය පිළිබඳ නීති රීති.

ලෙවි කතාව 14:1-32 : කුෂ්ඨ රෝගය පිළිබඳ නීති රීති.

ලෙවි කතාව 15:1-33 : සෞඛ්‍ය පිළිබඳ නීති රීති.

ලෙවි කතාව 16:29-30 : පාපයෙන් සුවය ලැබීම.

ගණන් කතාව 12:1-15 : මිරියම් හා ආරෝන්ගේ කුෂ්ඨ රෝගය.

ගණන් කතාව 16:41-50: ඉශ්‍රායෙලයේ වසංගතයක් ඇතිවේ.

ගණන් කතාව 21:5-9 : පිත්තල සර්පයා නැමති සළකුණ තුළින් සුවය.

ද්වතිය කතාව 7:15 : දෙවියන්වහන්සේට කීකරු වීමේ ප්‍රතිඵලයක් ලෙස සුවය ලැබීම.

ද්වතිය කතාව 28 : අප දෙවියන්වහන්සේගේ නීති නොපවැත්වීමේ ප්‍රතිඵලයක් ලෙස රෝගාබාධ ඇති වේ.

ද්වතිය කතාව 29:22 : ස්වාමීන්වහන්සේ දේශය මත රෝගා බාධ තබන සේක.

ද්වතිය කතාව 30:20 : දෙවියන්වහන්සේ ජීවනය හා දීර්ඝායුෂ වන සේක.

ද්වතිය කතාව 32:39 : දෙවියන්වහන්සේ තුවාළ කරන සේක. සුව කරන සේක.

ද්විතිය කතාව 7:15; 28:60 : ඊජිප්තුවේ වසංගත.

යෝෂුවා 5:8 : චර්මච්ඡේද්‍ය තුවාළ ස්වාභාවිකව සුව වීම.

1 සාමුවෙල් 6:3 : අපරාධ පූජාවකින් සුවය ලැබේ.

1 සාමුවෙල් 16:14-23 : යක්ෂ ආත්මයක් සාවුල්ට කරදර කළේය.

1 රාජාවලිය 5:23: 2 ලේකම් 16:12 : පාද වල ආබාධ.

1 රාජාවලිය 8:37-40 : දේශයේ වසංගතයක් ඇති වීම.

1 රාජාවලිය 13:4-6 : වියළි අතක් සහිත මිනිසා.

1 රාජාවලිය 17:17-24 : එළියා දරුවකු මරණයෙන් නැඟිටුවයි. (සුව කිරීම තුළින් පණිවුඩය හා පණිවුඩය ගෙන යන්නා ස්ථිර කරන ලදී.)

2 රාජාවලිය 1:2: 8:8-9: මට මෙම රෝගයෙන් සුවය ලැබෙනු ඇතිද?

2 රාජාවලිය 2:19-22 : එළිෂා විසින් ජලයෙන් සුව කරනු ලැබීම.

2 රාජාවලිය 4:8-37 : ෂුනමීය ස්ත්‍රියගේ පුත්‍රයා මරණින් නැඟිටුවීම.

2 රාජාවලිය 5:1-14 : නාමන් සුව කරනු ලැබීම.

2 රාජාවලිය 13:14,21 : එළිෂාට මරණීය රෝගයක් වැළඳීම.

2 රාජාවලිය 20:1-11 : හෙසකියාගේ රෝගය.

2 ලේකම් 6:26-31 : පසුතැවිලි වීමේ යාච්ඤාව සහ සුවය.

2 ලේකම් 7:14 : "මම ඔවුන්ගේ දේශය සුව කරන්නම්."

2 ලේකම් 16:12 : දරුණු රෝගයක් සහිත පුද්ගලයෙක් දෙවියන්වහන්සේ නොසොයයි.

2 ලේකම් 20:9 : අප විපත්තියෙහි සිට මොර ගසන විට දෙවියන්වහන්සේ සවන් දෙන සේක.

2 ලේකම් 21:12-30 : බඩවැල් වල හටගත් සුව කළ නොහැකි රෝගයක්.

2 ලේකම් 24:25 : රෝගය දරුණු ලෙස හැඳින්විනි.

2 ලේකම් 26:19 : උස්සියාගේ කුෂ්ඨ රෝගය

2 ලේකම් 30:20 : හෙසකියාගේ යාච්ඤාවන් තුළින් මිනිසුන් සුව වීම.

2 ලේකම් 32:24-26 : හෙසකියාගේ රෝගය.

යෝබ් 1-2 : යෝබ්ගේ රෝගය ද ඇතුළුව යෝබ්ගේ ගැටලු වල මූලාරම්භය මෙම පරිච්ඡේද වලින් එළිදරව් වේ.

යෝබ් 5:18: 30:18 : යෝබ් තම රෝගය පිළිබඳව කතා කරයි.

ගීතාවලිය 6:2-3 : "ස්වාමීනි, මා සුව කළ මැනව"

ගීතාවලිය 27:1 : "ස්වාමීන්වහන්සේ මාගේ ජීවිතයේ ශක්තිය යි."

ගීතාවලිය 30:2 : "මම මොරගැසුවෙමි, ඔබ මා සුව කළ සේක."

ගීතාවලිය 32:3-5 : පාපය හඳුනාගැනීමෙන් සුවය ලැබේ.

ගීතාවලිය 34:19-20 : "ධර්මිෂ්ඨයාගේ පීඩා බොහෝය. නමුත් ස්වාමීන්වහන්සේ ඒ සියල්ලෙන් ඔහු ගළවන සේක.

ගීතාවලිය 38:3,7 : කෝපය හා පාපය ඔබගේ සෞඛ්‍යයට බලපෑම් ඇති කරයිඃ රෝගය "අප්‍රසන්න" ලෙස හඳුන්වනු ලැබේ.

ගීතාවලිය 41:1-8 : "මම ඔබවහන්සේට විරුද්ධව පව් කර ඇති බැවින් මාගේ ආත්මය සුව කළමැනව." ලෙඩ රෝග නපුර ලෙස හඳුන්වා තිබේ.

ගීතාවලිය 42:11ඃ 43:5 : අපගේ මුහුණේ මළානික භාවයට සුවය ගෙනෙන්නේ දෙවියන්වහන්සේය.

ගීතාවලිය 42:1-5 : අධෛර්යයට පත් ආත්මයට සුවය.

ගීතාවලිය 55:1-2 : නොනැවතී කරන යාච්ඤාව හා සුවය.

ගීතාවලිය 60:2 : "දේශයේ බිඳුම් සුවකළ මැනව"

ගීතාවලිය 67:2 : "පොළොවෙහි ඔබගේ මාර්ග ද සියලු ජාතීන් අතරේ ඔබගේ ගැළවීමද ප්‍රකාශ කරන පිණිස."

ගීතාවලිය 72:13 : අප දුප්පතුන් හා දිළිඳුන් කෙරෙහි අනුකම්පා කළ යුතුය.

ගීතාවලිය 91:9,10 : "නුඹේ කූඩාරමට කිසි වසංගතයක් ළං නොවන්නේය"

ගීතාවලිය 103:1-5 : "...උන්වහන්සේගේ උපකාර සියල්ල සිහිනැති නොකරව...උන්වහන්සේ තාගේ සියලු රෝග සුව කරන සේක."

ගීතාවලිය 105:37 : ඉශ්‍රායෙලය කිසිඳු දුර්වලයෙක් නොමැතිව පිටතට පැමිණුනේය. මිලියන තුනක ජනතාව නිරෝගි සහ ශක්තිමත් අය වූහ.

ගීතාවලිය 107:17-20 : "උන්වහන්සේ ස්වකීය වචන එවා ඔවුන් සුවකොට..."

ගීතාවලිය 119:25-28 : වචනය තුළින් අප ශක්තිමත් වේ.

ගීතාවලිය 119:67 : "මට විපත්ති පැමිණෙන්නට පළමුවෙන් මුළාව ගියෙමි."

ගීතාවලිය 147:3 : "උන්වහන්සේ බිඳුණු සිත් ඇත්තන් සුව කරන සේක. ඔවුන්ගේ තුවාල බඳින සේක"

ගීතාවලිය 105:37 : "උන්වහන්සේ...ඔවුන් පිටතට ගෙනා සේක...කිසි දුර්වලයෙක් ද නොසිටියේය."

හිතෝපදේශය 3:7-8 : නිරෝගි වන ආකාරය.

හිතෝපදේශය 4:20-23: හදවතේ ආකල්පයන්ගෙන් ජීවිතයේ ප්‍රශ්න වලට බලපෑම් ඇතිවේ. දෙවියන්වහන්සේගේ පොරොන්දු ඒවා සොයා ගන්නා අයට ජීවනයක් ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ.

හිතෝපදේශ 12:18 : නුවණැත්තන්ගේ දිව සුවය ගෙන දේ.

හිතෝපදේශ 13:17 : විශ්වාස තානාපතියා සුවයට සමාන කර තිබේ.

හිතෝපදේශ 15:4,30 : ශාන්තිදායක දිව ජීවනයයිඃ යහපත් ආරංචි සුවයට බලපෑම් කරයි.

හිතෝපදේශ 16:24 : දෙවියන්වහන්සේගේ වචනය ඇට වලට සුවය ගෙන දේ.

හිතෝපදේශ 17:22 : බිඳුණු ආත්මය ඇට වලට බලපෑම් ඇති කරයි.

දේශනාකාරයා 3:3 : සුවය ලැබීමට කාලයක් තිබේ.

දේශනාකාරයා 5:17 : ශෝකය හා වැළපීම රෝගයට සම්බන්ධ වේ.

යෙසායා 6:10 : තේරුම් ගැනීම, හැරීම, සුවය ලැබීම.

යෙසායා 19:22 : දෙවියන්වහන්සේට කන්නලව් කළ විට, උන්වහන්සේ සුව කරන සේක. (කන්නලව් කිරීම යනු අවනතව හා මහත් ඕනෑකමින් ඉල්ලා සිටීමය.)

යෙසායා 32:3-4 : සුවය පිළිබඳ දිවැස්වැකි දේවාජයයේ කොටසකි.

යෙසායා 33:24 : "තමා ලෙඩින් යයි කිසි වැසියෙක් නොකියන්නේය."

යෙසායා 35:5-6 : ශතවර්ෂයේ දී ලැබෙන සුවය.

යෙසායා 38:1-12,16 : හෙසකියාගේ රෝගය හා ඔහු සුවය ලැබීම.

යෙසායා 53:5 : උන්වහන්සේගේ පූජාව තුළින් අපට සුවය හා මිදීම පොරොන්දු වී තිබේ.

යෙසායා 57:18-19 : සුවය ලැබීමට ළං වන්න.

යෙසායා 58:8 : සුවය උල්පතකින් මෙන් හටගනු ඇත.

යෙසායා 61:1 : යේසුස්වහන්සේ එවනු ලැබුවේ බිඳුණු සිත් ඇත්තන් සුව කිරීමටය. (හැඟීම්වල සුවකිරීම).

යෙසායා 58:8 : සුවය ඉක්මනින් හටගනු ඇත.

යෙරමියා 3:22 : අප උන්වහන්සේ වෙතට හැරෙන විට දෙවියන්වහන්සේ අපගේ පසුබට වීම් සුවකරනු ඇත.

යෙරමියා 8:14-15; 20-22 : සුවය ලැබීමේ කාලයක් ඇත. පාපයේ තික්තකම ශාරීරික සුවයට බැඳී තිබේ.

යෙරමියා 15:18 : සුව කළ නොහැකි තුවාළයක් සමඟ ගණුදෙනු කරන ආකාරය.

යෙරමියා 14:19 : අපට සුවය ලැබෙන්නේ නැද්ද?

යෙරමියා 17:14 : "මට සුව වන පිණිස, මා සුව කළ මැනව."

යෙරමියා 30:12-17 : දෙවියන්වහන්සේ සුවය ලබා දෙනු ඇත.

යෙරමියා 33:6 : "මම ඔවුන් සුව කරන්නෙමි"

යෙරමියා 46:11 : "නුඹට සුව වීමක් නැත."

යෙරමියා 51:8-9 : බබිලෝනිය සුව කිරීම

විලාප ගී 2:13 : "නුඹ සුව කරන්ට කාට පුළුවන්ද?"

විලාප ගී 3:33 : "දෙවියන්වහන්සේ කැමැත්තෙන් පීඩා නොකරන සේක."

එසකියෙල් 14:19 : "අපට සුවවීමක් නැතිද?"

එසකියෙල් 17:14 : "මා සුවය ලබන පිණිස, මා සුව කළ මැනව."

එසකියෙල් 30:17 : "මම සුව කරන්නෙමි."

| | |
|---|---|
| එසකියෙල් 30:12-13 | : ඖෂධ වලට සුව කළ නොහැකි තුවාළ. |
| එසකියෙල් 30:21 | : දෙවියන්වහන්සේ බිඳින දේ සුව කළ නොහැක. |
| එසකියෙල් 33:6 | : “මම ඔවුන් සුවකරන්නෙමි” |
| එසකියෙල් 34:4,16,21 | : සුව නොකරන එඬේරුන්ට අනතුරු ඇඟවීමක්. |
| එසකියෙල් 46:11 | : “තට සුවය නොළැබෙනු ඇත.” |
| එසකියෙල් 47:8-12 | : ජලය සුව කිරිම. |
| දානියෙල් 4:34,36 | : නෙබුකද්නෙශර්ගේ සුවය. |
| හොෂියා 5:13 | : සුවය උදෙසා සැම තැනම යාම. දෙවියන්වහන්සේ විසින් ඇති කළ තුවාලයක් මනුෂ්‍යයෙකුට සුව කළ නොහැක. |
| හොෂෙයා 6:1 | : “ඉරා දැමුවේ උන්වහන්සේය, උන්වහන්සේ අප සුව කරනවා ඇත.” |
| හොෂෙයා 7:1 | : ඉශ්‍රායෙලය උදෙසා සුවය. |
| හොෂෙයා 11:3 | : “ඔවුන්ව සුව කළේ මා බව ඔවුන් නොදැන සිටියෝය.” |
| හොෂෙයා 14:4 | : “මම ඔවුන්ගේ පසුබට වීම් සුව කරන්නෙමි.” |
| නාහුම් 3:19 | : අවසානය ළඟා වූ තත්වයක්. |
| සෙකරියා 11:16 | : සුව නොකරන එඬේරුන්ට අනතුරු ඇඟවීමක්. |
| මලාකි 4:2 | : උන්වහන්සේගේ පියාපත් වලින් සුවය ලැබීම. |

## නව ගිවිසුමේ බයිබල් පද

| | |
|---|---|
| මතෙව් 8:13 | : සම්බන්ධයක් ඇති වීමේදී කාලය තීරණය වේ. |
| මතෙව් 8:17 | : යේසුස්වහන්සේ අපේ රෝග උසුලාගත් සේක. |
| මතෙව් 10:1 | : රෝග වලට හා යක්ෂ ආත්ම වලට ඉහළින් බලයක් ගෝලයන්ට දුන් සේක. |
| මතෙව් 18:19-21 | : එකඟ වන ඕනෑම දෙදෙනෙක් ඉල්ලන දේ ලැබෙනු ඇත. |
| මාර්ක් 2:17 | : යේසුස්වහන්සේ පැමිණියේ පව්කාරයන් සුව කරන පිණිසය. |
| මාර්ක් 3:15-17 | : රෝග සුව කිරීමට ක්‍රිස්තුස්වහන්සේ බලය දෙන සේක. |
| මාර්ක් 4:18-19 | : සුව කිරීම ආලේපයේ කොටසකි : යේසුස්වහන්සේ පිටත් කර හැරියේ සුව කිරීමටය. |
| මාර්ක් 11:24 | : අප යාච්ඤා කරන විට අප අදහන්නේ නම් (ලැබුණු පසු නොව), ඔබට ලැබෙනු ඇත. |

| | |
|---|---|
| මාර්ක් 16:18 | : යේසුස්වහන්සේගේ නාමයෙන් ඇදහිලිවන්තයන් රෝග සුව කිරීම හා යක්ෂයන් දුරු කිරීම කරනු ඇත. |
| ලූක් 5:31 | : රෝගීන්ට වෙදෙක් අවශ්‍යය. |
| ලූක් 7:6 | : නොවටිනාකම යේසුස්වහන්සේ ඇදහිල්ල ලෙස දුටු සේක. |
| ලූක් 7:22-23 | : වඩා විශ්වාසය ඇති කරවන තර්කය අත්දැකීමයි. |
| ලූක් 17:6 | : කුඩා ඇදහිල්ලකට මහත් ප්‍රතිඵල ගෙන දිය හැකිය. |
| ලූක් 18:7-6 | : ඔබගේ පිළිතුර ලැබීමට පෙර අත්හැර නොදමන්න. |

(පරණ ගිවිසුමේ දානියෙල් ගේ කතාන්දරය ද යාච්ඤාවෙන් රැඳී සිටීමේ වැදගත්කම පෙන්නුම් කරයි. මුලදීම දෙවියන්වහන්සේට දානියෙල්ගේ හඬ ඇසුණු සේක, නමුත් සාතන් දින 21 ක් එයට බාධා කළේය.)

| | |
|---|---|
| යොහන් 6:53-58 | : යේසුස්වහන්සේගේ ශරීරය හා රුධිරය ජීවනය ගෙන දේ. |
| යොහන් 10:10 | : යේසුස්වහන්සේ පැමිණියේ අපට ජීවනය ලැබෙන පිණිසය. සාතන් පැමිණියේ මරා දැමීමට, සොරකම් කිරීමට හා විනාශ කර දැමීමටය. |
| යොහන් 11:1-45 | : මොහොතින් සුව නොවන රෝගයක් මහත් භාස්කමකට මඟ පාදයි. |
| යොහන් 14:12-13 | : යේසුස්වහන්සේ කළ කාර්යයන් අප ද කළ යුතුය. |
| යොහන් 15:7 | : ඉල්ලීමේදී හා ලබා ගැනීමේදී යේසුස්වහන්සේ මත පැවතීමේ වැදගත්කම |
| යොහන් 16:24 | : උන්වහන්සේගේ නාමයෙන් ඉල්ලන්න එවිට ඔබට දෙනු ලැබේ. |
| රෝම 2:4 | : දෙවියන්වහන්සේගේ යහපත්කම පසුතැවිල්ල වෙත ගෙන යයි. (පසුතැවිල්ල වෙත ගෙන යන්නේ රෝගය නොව, දෙවියන්වහන්සේගේ යහපත් කමයි.) |
| රෝම 8:19-23 | : මුළු ලෝකයම විනාශ වෙමින් පවතී. |
| 2 කොරින්ති 4:16 | : අපගේ බාහිර මනුෂ්‍යයා විනාශ වේ. නමුත් අභ්‍යන්තර මනුෂ්‍යයාට අලුත්විය හැකිය. |
| එපීස 3:20-21 | : අප අසනවාට නොහොත් සිතනවාටත් වඩා අප තුළ ක්‍රියා කිරීමේ බලය දෙවියන්වහන්සේ සතුය. |
| පිලිප්පි 2:25-27 | : එපප්‍රොදිතස් ගේ රෝගය. |
| කොලොස්සි 4:14 | : වෛද්‍යවරයෙකු වූ ලූක් පාවුල්ගේ ධර්ම ප්‍රචාරණ කණ්ඩායමේ සාමාජිකයෙක් විය. |
| 2 තිමෝති 4:20 | : ත්‍රොපිමස් පිළිබඳ සිදුවීම ඉතා කෙටිය. ඉන් දැන ගත හැක්කේ ස්වල්පයකි. ඔහු රෝගීව සිටින්නට පාවුල් ඉඩ හැරියේය නමුත්, පසුව ඔහු ක්ෂණිකව හෝ ක්‍රමිකව සුවය ලැබුවේද යන්න හෝ ඔහුගේ සුවවීම වළක්වනු ලැබුවේ කුමකින්ද යන්න අපට පවසා නැත. |
| හෙබ්‍රෙව් 4:15 | : උන්වහන්සේ අපගේ දුර්වලකම් දන්නාසේක. |
| හෙබ්‍රෙව් 11:1 | : ඇදහිල්ල ප්‍රකාශ වන්නේ නොපෙනෙන දේවල් (සුවය) වලිනි. |

යාකොබ් 1:6 : අප අනුමාන නොකර ඇදහිල්ලෙන් ඉල්ලිය යුතුය.

යාකොබ් 1:17 : සෑම යහපත් දීමනාවක්ම (සුවය) දෙවියන්වහන්සේගෙනි.

යාකොබ් 5:14-15 : තෙලින් ආලේප කර ඇදහිල්ලෙන් යාච්ඤා කර සුවය හා පව්කමාව ලබා දීමට වැඩිමහල්ලන් කැඳවීම.

1 පේත්‍රුස් 2:24 : උන්වහන්සේගේ තුවාළ වලින් අපට සුවය ලැබී තිබේ.

1 යොහන් 3:22 : අප කීකරු වන්නේ නම් අප ඉල්ලන ඕනෑම දෙයක් අපට ලැබෙනු ඇත.

3 යොහන් 1:2 : සුවය ඔබගේ ප්‍රාණයේ තත්වයට සම්බන්ධ කර තිබේ.

මාර්ක් 7:36; 8:26; මතෙව් 8:4 : සුවය ලැබීම මහත් කලබලයක් බවට පත්කර නොගනින්න.

එළිදරව් 20:2-3 : සාතන් බැද දැමූ විට රෝග හා මරණය තවත් නොවන්නේය.

එළිදරව් 21:4 : අවසන් සුව කිරීම තවත් රොග හා මරණය නොවේ.

2. දෙවියන්වහන්සේ සුවය හා මිදීම ලබා දෙන බවට පොරොන්දු වී ඇත.
දෙවියන්වහන්සේගේ පොරොන්දු සම්බන්ධ කිහිපයක් පහත දැක්වේ :

**මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය. (රෝම 1:16)**

**තමන්වහන්සේ පොරොන්දුවූ සියල්ලේ හැටියට තමන්ගේ සෙනඟවූ ඉශ්‍රායෙල්ට නිශ්චලතාව දුන් ස්වාමීන්වහන්සේට ප්‍රශංසාවේවා. උන්වහන්සේ තමන්ගේ මෙහෙකරුවූ මෝසෙස් ලවා ගිවිස්සාවූ සියලූ යහපත් වචනවලින් එක වචනයක්වත් හිස්නොවීය. (1 රාජාවලිය 8:56)**

**මක්නිසාද ඒවා සම්බවන්නන්ට ඒවා ජීවනයත් ඔවුන්ගේ සකල ශරීරයට සුවයත් වේ. (හිතෝපදේශ 4:22)**

**මක්නිසාද දෙවියන්වහන්සේගේ පොරොන්දු කොපමණ වුණත් උන්වහන්සේ තුළ එසේය කියා වේ. එහෙයින් අප කරණකොටගෙන දෙවියන්වහන්සේට ගෞරවය පැමිණෙන පිණිස, උන්වහන්සේ කරණකොටගෙන ආමෙන්ය කියාත් වේ. (2 කොරින්ති 1:20)**

3. වෙනත් ආත්මික දීමනා සුව කිරීමේ දීමනාව සමඟ සම්බන්ධ කර පාවිච්චි කරන ආකාරය පහත දැක්වේ :

- ඉගැන්වීම හා අනුශාසනා කිරීම : දේව වචනය මත පදනම් වේ, ඒවා සුවය ලැබීම උදෙසා ඇදහිල්ල වර්ධනය කරයි.
- දිවස්වැකි කීම, අන්‍යභාෂා කතා කිරීම, තේරුම්කර දීම : රෝගය යන /හෝ සුවය පිළිබඳ දෙවියන්වහන්සේගෙන් සෘජු වචනයක් ගෙන ආ හැකිය.
- ආත්ම විමසීම : ක්‍රියාකාරීව සිටින ආත්ම විමසා බලා සුවය හෝ මිදීම අවශ්‍යදැයි එළිදරව් කරයි.
- ඇදහිල්ලේ දීමනාව : විමසීමෙන් ලද දැනුම අනුව ක්‍රියා කිරීමට හා ඇදහිල්ලෙන් යුතු යාච්ඤාවක් කිරීමට විශේෂ විශ්වාසයක් ඇති කරයි.

- දැනගැන්මේ වචනය : රෝගයේ මූලය වූ හේතූන් පිළිබඳව දැනුමක් ලබා දේ. අභ්‍යන්තර සුව කිරීම් වලදී ශාරීරික රෝගයක් යක්ෂ ආත්මයක් සම්බන්ධ ගැටලුවක් සමඟ සම්බන්ධ වන විට මෙය ඉතා වැදගත්වේ. එමඟින් සමාව ලබා ගත යුතු පාපයන්, එයට සම්බන්ධ යක්ෂ ආත්ම හා සුවය ඇති වීමට බාධා කරන මානසික ආකල්ප ආදිය පිළිබඳව පෙන්වා දේ.

- ප්‍රඥාවේ වචනය : දෙවියන්වහන්සේ අපට හැකියාව ලබා දී ඇති ප්‍රඥාවේ වචනයක් (උපදෙසක්) රෝගී පුද්ගලයෙකුට ලබා දිය හැකිය.

  භාස්කම් කිරීමේ දීමනාව : ක්ෂණික හා නිර්මාණාත්මක සුව කිරීම. එනම්, අවයවයක් වර්ධනය වීම ආදිය. ඒවා ස්වාභාවික විස්තර කළ නොහැකි. ස්වාභාවික තත්වයක් යටතේ කිසිසේත් සිදු විය නොහැකි අවස්ථාවන්ය.

ආත්මික දීමනා පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම සඳහා, හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"ශුද්ධාත්මයාණන්ගේ සේවය"* නැමති පාඨමාලාව අධ්‍යයනය කරන්න.

4. භාස්කම් පිළිබඳ වචනයක් : භාස්කම් පිළිගැනීමට, ඔබ පළමුවෙන්ම ස්වාභාවික තත්වයට ඉහළින් සිටින එය පාලනය කළ හැකි ස්වාධීන දිව්‍යමය බලවේගය පිළිගත යුතුය. එම බලවේගය දෙවියන්වහන්සේය. භාස්කම් ඇතිවන්නේ දිව්‍යමය එළිදරව් කිරීමකිනි. දෙවියන්වහන්සේ ස්වාභාවික පිළිවෙළක් නිර්මාණය කළ නමුත් උන්වහන්සේ ඉන් බැඳී නැත.

සැබවින්ම භාස්කමකින් සුව වීම යනු නැවත සාමාන්‍ය තත්වයට පත්වීමකි. අස්වාභාවික වන්නේ මරණය මිස නැවත නැගිටීම නොවේ. දෙවියන්වහන්සේගේ ස්වභාව ධර්මයේ රීතීන් බිඳ දමන්නේ රෝග සහ යක්ෂ ආත්මයන්ය. එම නිසා සැබවින්ම, භාස්කමකින් සිදු වන සුව කිරීම, මිදීම ආදිය නැවත සාමාන්‍ය තත්වයකට පැමිණීමකි. යථාර්ථය තුළ අසාමාන්‍ය වන්නේ භාස්කම් නොව, අපගේ සේවයන් තුළ ඒවා සිදු නොවීමකි.

# දහ හත් වන පරිච්ඡේදය

# සුව කිරීමට බලපෑම් ඇතිකරන විචල්‍යයන්

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- “විචල්‍යය” නිර්වචනය කිරීමට
- සුව කිරීමට බලපෑම් කරන මිනිසුන්ගේ ඇතැම් සම්ප්‍රදායන් සාකච්ජා කිරීමට
- සුව කිරීමට බලපෑම් කරන ඇතැම් විචල්‍යයන් සාකච්ජා කිරීමට ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **පොළොවෙහි ඔබගේ මාර්ගයද, සියලු ජාතීන් අතරේ ඔබගේ ගැළවීමද ප්‍රකාශවෙන පිණිස දෙවියන්වහන්සේ අපට කරුණා කරනසේක්වා, ආශිර්වාදකරනසේක්වා, ස්වකීය මුහුණ අප කෙරෙහි බබළවනසේක්වා. (ගීතාවලිය 67:1,2)**

## හැඳින්වීම

බොහෝ මිනිසුන් සුවය නොලබන්නේ ඇයි? ඇතැම් අයට සුවය ලැබෙන විට තවත් අයට සුවය නොලැබෙන්නේ ඇයි? ඇතැම් අවංක හා කැපවුණු කිතුනුවන්ට සුවය නොලැබී තිබිය දීත් ඉතා සෙළවෙන හා ලෝකාකාර කිතුනුවන් සුවය ලබන්නේ ඇයි? ඔබ සුව කිරීමේ හා මිදීමේ සේවය පටන්ගත් විට ඔබට මුහුණ දීමට සිදුවන ප්‍රශ්න සමහරකි. සුව කිරීම් වලට බලපෑම් කරන විචල්‍යයන් මෙම පාඩමින් සළකා බැලේ. “විචල්‍යයක්” යනු විවිධත්වයක් හෝ විවිධ ප්‍රතිඵල ගෙන දෙන හේතුවකි.

දෙවියන්වහන්සේ තම වචනය තුළ සුවය ලබා දෙන බවට පොරොන්දු විය. කෙසේ වෙතත් දෙවියන්වහන්සේගේ සෑම පොරොන්දුවක්ම මනුෂ්‍යයාගේ ප්‍රතිචාරය නමැති සීමාවට යටත් වන බව අප මතක තබා ගත යුතුය. සුව කිරීමට බලපෑම් ඇති කරන විචල්‍යයන් තේරුම් ගැනිම වැදගත් වන්නේ මේ නිසාය.

## විචල්‍යයන් තේරුම් ගැනිම හා ඒවාට ප්‍රතිචාර දැක්වීම

සුව කිරීමේ සේවය තුළ විචල්‍යයන් යනු ඇතැම් පුද්ගලයන් සුව වීමටත් ඇතැම් අය සුව නොවීමටත් හේතුය. ඔබ මෙම අධ්‍යයනය ආරම්භ කිරීමට පෙර, සුව කිරීමේ හා මිදීමේ සේවයේදී ඔබට මුහුණ දීමට සිදුවන සියලු ප්‍රශ්න වලට ඒ තුළින් පිළිතුරු නොලැබිය හැකි බව මතක තබා ගැනිම වැදගත්ය.

සෑම දෙයක්ම තේරුම් ගැනීමට අවශ්‍ය වීම මනුෂ්‍ය ස්වභාවය වේ. පළමු පරීක්ෂාව ද ඇති වුයේ මෙම කරුණම හේතු කොට ගෙනය. හැම දෙයක්ම දැන ගැනීමේ ආශාව හටගන්නේ පිළිතුරු නොලැබුණු ප්‍රශ්න පැවතීමට විරුද්ධ වීමේ ස්වාභාවයට කැරලිගැසීම නිසාය. බලවත් ලෙස සුව කිරීමේ හා මිදීමේ සේවයේ නියැළීම සඳහා මෙම මනුෂ්‍ය ස්වභාවය ඔබ විසින් ජය ගත යුතු දෙයකි.

සුව කිරීම් හා මිදීමේ සේවයේදී බලපෑම් ඇති කරන ඇතැම් විචල්‍යයන් බයිබලය එළිදරව් කරයි. නමුත් ඔබට සෑම ප්‍රශ්නයකටම පිළිතුරු නොලැබෙනු ඇත. එසේ වුවහොත් ඔබට දෙවියන්වහන්සේ හෝ ඇදහිල්ල අවශ්‍ය නොවනු ඇත. ඇතැම් දේවල් අපට එළිදරව් කර ඇති අතර ඇතැම් ඒවා එසේ නොවන බව බයිබලයේ පැහැදිලිය

> **රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්වතිය කතාව 29:29)**

සුව කිරීමේ දී හා මිදීමේ සේවයේදී පිළිතුරු නොලත් ප්‍රශ්න පසෙක තබා රහස් වූ දේවල් දෙවියන්වහන්සේ වෙත රැඳවීමට ඔබ ඉගෙන ගත යුතුය.

ගැළවීම මෙන්ම සුවය හා මිදීම ද ශුභාරංචියේ කොටස්ය. සුවය හෝ මිදීම උදෙසා යාච්ඤා කර ඇතැම් විට එය නොලැබූ විට අත්හැර දැමීමට යමෙකු පෙළඹේ. නමුත් මෙම ප්‍රශ්නය සළකා බලන්න. ඔබගේ පණිවුඩය අසා සියල්ලෝම ගැළවීම නොලබන නිසා ඔබ ගැළවීම ගැන දේශනා කිරීම අතහැර දමනවාද? එසේනම් සැම කෙනෙකුටම පිළිතුරු නොලැබීම නිසා සුවය හා මිදීම උදෙසා සේවය කිරීම අප විසින් අතහැර දමන්නේ ඇයි? බොහෝ විට එයට හේතුව සුව කිරීමේ හා මිදීමේ සේවයේදී උඩඟුකම ඇති වීමයි. අප රෝගී පුද්ගලයෙකුට යාච්ඤා කර ඔහුට සුවය නොලැබුණු විට අපි ලැජ්ජාවට පත් වන්නෙමු. එය බාහිරින් සිදු වන දෙයක් බැවින් එය අන්‍යයන්ට පෙනේ. කෙනෙකු ගැළවීමට ප්‍රතිචාර දැක් වූ නමුත් සැබවින්ම ගැළවීම නොලැබුවත්. එය අභ්‍යන්තරයේ වන දෙයක් බැවින් මිනිසුන්ට නොපෙනේ. මිනිසුන්ට බාහිරින් දැකිය හැකි දේවල් අපගේ උඩඟුකමට බලපෑම් කරයි.

ගැළවීමට ප්‍රතිචාර දැක්වීම කෙරෙහි බලපෑම් කරන කරුණු සියල්ලටම පිළිතුරු ලද නොහැකි සේම සුවය කෙරෙහි බලපාන සියලු විචල්‍යයන් වලට ද ඔබට පිළිතුරු ලද නොහැකිය. ඇතැම් අය ගැළවීම ලබන අතර ඇතැම් අය නොලබයි. ඇතැම් අය සුව වන අතර ඇතැමුන් සුව නොවේ.

කෙසේ වෙතත්, සුවය හා මිදීම කෙරෙහි බලපෑම් කරන ඇතැම් කරුණු බයිබලය එළිදරව් කරයි. අන් අයට මේවා තුළින් කටයුතු කර සුවය ලබා ගැනීමට උපකාරී වන පිණිස ඔබ ඒවා තේරුම් ගැනීම වැදගත් වේ. මෙම විචල්‍යයන් ගෙන් සමහරක් පහත දැක්වේ:

## ඉගැන්වීම් මද වීම

සුවය පිළිබඳව, එහි ප්‍රතිපත්ති, මූලාරම්භය, ඇදහිල්ල ක්‍රියාවට නංවන ආකාරය හා එය ලබා ගන්නා ආකාරය පිළිබඳ දැනුම මද වීම සුවය කෙරෙහි බලපෑම් කළ හැකිය. දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක :

**මාගේ සෙනඟ දැනගැන්ම නැති කමෙන් නාස්තිවී සිටිති... (හොෂෙයා 4:6)**

දෙවියන්වහන්සේගේ වචනය හා උන්වහන්සේගේ බලය තේරුම් නොගත් විට අප වරදට පත්වන බව යේසුස්වහන්සේ පැවසූ සේක :

**යේසුස්වහන්සේ උත්තරදෙමින් : නුඹලා ශුද්ධලියවිලිවත් දෙවියන්වහන්සේගේ බලයවත් නොදැන, වරද්දාගනිහුය. (මතෙව් 22:29)**

ඇතැම් පුද්ගලයන්ට දෙවියන්වහන්සේගේ වචනය හා උන්වහන්සේගේ බලය නොවැටහීම නිසා ඔවුන්ට සුවය නොලැබේ. සුවය ලැබීම උදෙසා ඇදහිල්ල පැමිණෙන්නේ සුවය ලැබීම පිළිබඳ දේව වචනය ඇසීමෙනි (රෝම 10:17). බයිබලය දේව වචනය බීජය ලෙස හඳුන්වයි. ඇතැම් පුද්ගලයන් දේව වචනය තම හදවත තුළ පැළ කර ගැනීමෙන් තොරව සුවය නමැති අස්වැන්න නෙළීමට උත්සාහ කරයි. බීජය අප තුළ නොවනතාක් කල් එයට ක්‍රියාත්මක විය නොහැක. "ඔබ සුව කරන ස්වාමින්වහන්සේ මමය"යි පැවසීමට පෙර දෙවියන්වහන්සේ "ඔබ මාගේ වචනයට ඕනෑකමින් සවන් දෙන්නේ නම්" යි පැවසූ සේක. සුවය පැමිණියේ වචනයට පසුවය.

කිසිදිනක ගැළවීමේ පණිවුඩය නොඇසුවහොත් මිනිසුන් කී දෙනෙකු ගැළවීම ලබනු ඇති ද? නොඑසේනම්, ගැළවීමේ පණිවුඩයේ ප්‍රධාන කරුණු පහත පරිදි වූයේ නම් මිනිසුන් කී දෙනෙකු ගැළවීම ලබනු ඇතිද?

- ඔබ ගළවා ගැනීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවිය හැක.
- ඔබේ පාපය දෙවියන්වහන්සේගේ මහිමය උදෙසාය.
- ගැළවීම උදෙසා වූ දිනය පසු වී ඇත.

නමුත් ක්‍රිස්තුස්වහන්සේ අප වෙනුවෙන් තම ජීවිතය පූජා කිරීමේ කොටසක් වන සුව කිරීම සම්බන්ධයෙන් අපට මෙබඳු ප්‍රකාශ ඇසේ :

- ඔබව සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවිය හැක.
- ඔබගේ රෝගය දෙවියන්වහන්සේගේ මහිමය උදෙසාය.

- ඔබගේ සුවය උදෙසා වූ දිනය පසු වී ඇත.

ගැළවීම පිළිබඳව පුද්ගලයන්ට උගන්වන ආකාරයටම සුවය පිළිබඳ දේව වචනයෙන් පුද්ගලයන්ට ඉගැන්විය යුතුය. සුවය නමැති අස්වැන්න ගෙන දෙන්නේ වචනය නමැති බීජයයි.

## මිනිසුන්ගේ සම්ප්‍රදායන්

සම්ප්‍රදායන් යනු මිනිසුන්ගේ ඇදහිලි, රීතින් හා ප්‍රතිපත්තීන් ය. අපගේ සම්ප්‍රදායන් සහ ඇදහිලි නිසා දේව වචනයේ ක්‍රියාකාරීත්වයට බාධා ඇති වේ.

**මෙසේ නුඹලා නුඹලාගේ පරම්පරාගත නියෝග නිසා දෙවියන්වහන්සේගේ වචනය අවලංගුකළහුය. (මතෙව් 15:6)**

ඇදහිල්ල පැමිණෙන්නේ දේව වචනයෙන් නම්, ඇදහිල්ල විනාශ කරන මිනිසුන්ගේ සම්ප්‍රදායන් හා දේව ධර්ම ඇසීම හා පිළිගැනීම තුළින් එය නැතිවිය හැකිය. සුව කිරීමට බලපෑම් කරන මිනිසුන්ගේ පොදු සම්ප්‍රදායන් සමහරක් පහත දැක්වේ :

### සම්ප්‍රදාය මෙසේ පවසයි :

"සුව කිරීම හා මිදීම අද දවස උදෙසා නොවේ."

සුව කිරීම බයිබලීය කාලයන් හෝ යේසුස්වහන්සේ නැවත පැමිණි විට පමණක් බව ඇතැම් පුද්ගලයෝ ප්‍රකාශ කරති.

### අපගේ ප්‍රතිචාරය :

දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක :

**...මක්නිසාද මම වනාහි නුඹ සුවකරන්නාවූ ස්වාමීන්වහන්සේයයි කීසේක. (නික්මයාම 15:26)**

"කරන්නාවූ" යන පදය වර්තමාන කාලය අඟවයි. අප විසින් එය "කළ" යනුවෙන් අතීත කාලයට හෝ "කිරීමට බලාපොරොත්තු වන්නා වූ" යනුවෙන් අනාගතයට වෙනස් කරන්නේ කෙසේද? දෙවියන්වහන්සේ වෙනස් නොවන බව බයිබලයේ සඳහන්ය :

**සෑම යහපත් දීමද සෑම සම්පූර්ණ දීමනාව ද කිසි වෙනස්වීමක්වත් හැරීමේ ඡායාවක්වත් නැත්තාවූ ආලෝකවල පියාණන්වහන්සේ කෙරෙන් ඉහළින් බැස එන්නේය. (යාකොබ් 1:17)**

**මක්නිසාද ස්වාමීන්වහන්සේ වන මම වෙනස් නොවෙමි. . . . (මලාකි 3:6)**

කාලයන්ගේ පටන්ගැන්මේ සිට දෙවියන්වහන්සේ වෙනස් වී නොමැත :

**යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඊයෙත් අදත් සදාකාලයටත් එකාකාරමය. (හෙබ්‍රෙව් 13:8)**

ගැළවීමට වඩා මහත් හාස්කමක් තවත් නොමැති බැවින්, හාස්කම් කිරීමේ දින පසු වී ඇතිනම් ගැළවීමේ දිනය ද පසු වී තිබේ. සුව කිරීම් යේසුස්වහන්සේ නැවත පැමිණෙන අනාගතය උදෙසා බව ඇතැමුන් පවසති. මෙය සත්‍යයක් නම්, සුව කිරීමේ දීමනාවද සෙසු දීමනා මෙන්ම ආත්මික දීමනාවක් වන බැවින් ගුරුවරු, සභාපාලකවරු හා අනෙකුත් නායකයන්ගේ ද සේවය අනාගතය උදෙසා විය යුතුය.

හාස්කම් අද දවස උදෙසා නොවේය යන ප්‍රකාශයන්ට එරෙහි ඉතාම ස්ථිර තර්කය නම්, ලිඛිත අත්දැකීම් පිළිබඳ වාර්තාවන්ය. යේසුස්වහන්සේ හාස්කම් හා සුව කිරීම් කළ සේක.

**උන්වහන්සේ උත්තරදෙමින්: නුඹලා ඇසූ දුටු දේ ගොස් යොහන්ට දන්වාපල්ලා: බිහිරන්ට ඇසෙයි, මළාහු නැගිටුවනු ලබති, අන්ධයෝ පෙනීම ලබති, කොර ඇවිදිති, කුෂ්ඨ රෝගීහු පවිත්‍රකරනු ලබති. දිළිඳුන්ට ශුභාරංචිය ප්‍රකාශකරනු ලැබේ (ලූක් 7:22). ක්‍රියා 4:14-16 ද බලන්න.**

මුල් කාලීන සභාව තුළ සිදු වූ හාස්කම් සහ සුවකිරීම් ක්‍රියා පොතෙහි සඳහන් වේ. නූතන සභාවේ ඉතිහාසය පිළිබඳ ලිඛිත වාර්තා වලද බොහෝ හාස්කම් හා සුවකිරීම් පැවති බව සහතික කරයි. "සුව කිරීම අද දවස උදෙසා නම්, සෑම තැනම සිටින රෝගීන් හා මළ මිනිසුන් ඇදහිලිවන්තයන් විසින් නැඟිටුවන්නේ නැත්තේ ඇයි?" යනුවෙන් ඇතැම් පුද්ගලයෝ ප්‍රශ්න කරති. මළවුන් නැඟිටුවීම සභාවට ලබා දුන් මහ ආඥාවේ කොටසක් නොවේ. ගෝලයන් දේව රාජ්‍ය ප්‍රකාශ කිරීමේ පළමු දේශනා කිරීමේ ගමන අරඹන විට ඔවුන්ට එසේ අණ කරන ලදි. මළවුන් නැඟිටුවීම සිදුවන්නට තිබූ යේසුස්වහන්සේගේ නැවත නැඟිටීමේ ප්‍රථම ඵල විය.

විශේෂ හාස්කම් හා ගිවිසුම් හාස්කම් අතර වෙනසක් තිබේ. වතුර මිදි යුෂ බවට හැරවීම, මුහුද මත ඇවිදීම, මසුන් රාශියක් ඇල්ලීම, රතු මුහුද දෙබෑ කිරීම හා මළවුන් නැඟිටුවීම වැනි විශේෂ හාස්කම් සිදු කරන ලද්දේ විශේෂ අවස්ථා වලදී ලකුණක් ලෙසය. සුව කිරීම පැරණි ගිවිසුමේ ගිවිසුම් හාස්කමක් වන අතර විශේෂ හාස්කමක් නොවේ. දෙවියන්වහන්සේ තවමත් මළවුන් නැඟිටවනු නමුත්, එය උන්වහන්සේගේ පාලනය මත තීරණය වන අතර සුව කිරීම උදෙසා අප වෙත දී ඇත්තාවූ පොදු ආඥාවේ කොටසක් නොවේ.

අප මරණය පිළිබඳව කරුණු දැක්වීමේදී, දිව්‍යමය සුව කිරීම් සැමවිටම පවතී නම්, කිසිඳු කිතුනුවෙකු නොමැරෙනු ඇතැයි මෙම කරුණු පිළිබද සැකයෙන් බලන්නෝ පවසති. බයිබලයේ එවැන්නක් සඳහන් නොවේ. බයිබලය තුළින් ලබා දෙනුයේ සාමාන්‍ය ජීවිත කාලයක් තුළ දිව්‍යමය ජීවිත කාලයක් පමණි.

ක්‍රිස්තුස්වහන්සේගේ පූජාව තුළින් සදාකාලික මරණයෙන් ගැළවීම අපට අයත් වූ නමුත්, යේසුස්වහන්සේගේ නැවත පැමිණීම හෝ ඔසවා ගැනීම සිදු නොවුනහොත් මෙම මනුෂ්‍ය ශරීරය කල්යාමේදී මරණයට පත් වනු ඇත. සුව කිරීම් පිළිබඳ උගන්වන බයිබලය තුළම මනුෂ්‍යයාගේ ජීවිතයට සීමාවක් සඳහන් කර තිබේ :

> **අපේ ජීවිතයේ දවස් අවුරුදු හැත්තෑවක්ය, ශක්තිය ඇත්නම් අවුරුදු අසූවක්ය; එසේ වුවත් ඒවායේ යහපත් භාගය පවා වෙහෙස හා දුකමය; (ගීතාවලිය 90:10)**

> **තවද එක වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මනුෂ්‍යයන්ට නියමව තිබෙන්නාක්මෙන්ම, (හෙබ්‍රෙව් 9:27)**

## සම්ප්‍රදාය මෙසේ පවසයි :

"යේසුස්වහන්සේගේ කාලයේ දී ප්‍රමාණවත් වෛද්‍ය පහසුකම් තිබුණේ නැත. දැන් එම උපකාරය ඇති බැවින්, අප සුවය උදෙසා යාච්ඤා කරනු වෙනුවට වෛද්‍ය පහසුකම් පාවිච්චි කරනු ඇතැයි අපේක්ෂා කෙරේ."

## අපගේ ප්‍රතිචාරය :

ක්‍රි.පූ 400 තරම් අතීතයේ පවා වෛද්‍ය විද්‍යාව තිබුණි. ක්‍රි.පූ 460-370 කාලයේදී වෛද්‍ය විද්‍යාවේ පියා වන හිපොක්‍රෙටීස් වෛද්‍ය විද්‍යාව ඉතා ඉහළ තලයකට දියුණු කළේය. ඔහුගේ ඇතැම් ක්‍රමවේද අද දවසේ පවා යොදා ගනී. යේසුස්වහන්සේගේ කාලයේදී ග්‍රීසිය, ඊජිප්තුව හා රෝමය තුළ දක්ෂ වෛද්‍යවරු රැසක් විය.

වෛද්‍ය විද්‍යාවේ හැකියාව හෝ නොහැකියාව සමඟ දිව්‍ය සුව කිරීමේ කිසිඳු සම්බන්ධයක් නොමැත. එය ක්‍රිස්තුස්වහන්සේගේ පූජාවීම තුළින් ලද ආශිර්වාදයකි. සෑම යහපත් දීමනාවක්ම දෙවියන්වහන්සේගෙන් පැමිණෙන බැවින් සුදුසු වෛද්‍ය පහසුකම් පාවිච්චි කිරීම පිළිගත හැකිය. කෙසේ නමුත් ඖෂධ වලින් සුවය ගිවිසුම්ගත පොරොන්දුව වෙනුවට යොදාගත හැකි දෙයක් නොවන බව මතක තබා ගන්න.

ඖෂධ වල ඇති වාසි මෙන්ම සුව කළ නොහැකි රෝග ද ඇති බැවින්, දිව්‍යමය සුව කිරීම තවමත් අවශ්‍ය වේ. එසේම බොහෝ පුද්ගලයන්ට වෛද්‍ය පහසුකම් ලබා ගැනීමට ද නොහැකිය. උදාහරණයක් ලෙස අප්‍රිකාවේ 80% ක් පමණ ජනතාවකට මූලික වෛද්‍ය පහසුකම් පවා ලබා ගත නොහැකි බව ඇස්තමේන්තු කර තිබේ.

**සම්ප්‍රදාය මෙසේ පවසයි :**

"දිව්‍යමය සුව කිරීම් උගන්වනු ලබන්නේ මිත්‍යා මතවාද තුළ පමණි."

**අපගේ ප්‍රතිචාරය :**

මෙතෝදිස්ත, ලූතර් හා මොරේවියන් සභාවන් හි නායකයෝ වන වෙස්ලි, ලූතර් හා සින් සෙන්ඩෝර්ෆ්, යන අය සියලු දෙනා දිව්‍යමය සුවකිරීම් පිළිබඳව ඉගැන්වීය. යේසුස්වහන්සේගේ රුධිරයේ ඇත්තාවූ ගැළවීමේ බලය හා ක්‍රිස්තුස්වහන්සේගේ දේවත්වය සමඟ අද දවසේ දී සුවය පිළිබඳ ඉගැන්වීම් වල නිරත වන අය, මෙම නායකයන්ට වඩා වෙනස් මතයක් දරන අය නොවේය. ඇතැම් මිත්‍යා මතවාද තුළද සුව කිරීම් ගැන ඉගැන්වෙන නමුත් එය බයිබලයේ උගන්වන සැබෑ සුව කිරීම් නොවේ. එය දෙවියන්වහන්සේගෙන් නොවන වෙනත් මූලාශ්‍රයකින් වූ "අධ්‍යාත්මික" හෝ "භෞතික දෙයට ඉහළින් මනස ක්‍රියාත්මක වීම" වේ.

සාතන් රැවටිලිකාර අනුකරණය කරන්නෙකි. ඔහු රැවටිලිකාර ලෙස යක්ෂ බලවේග වලින් සුව කිරීම් කළ පමණින්ම අප දිව්‍යමය සුව කිරීම් ඉවත නොදමන්නෙමු. ඉන්දියාවේ ගංගානම් ගඟේ ජලය නෑමෙන් තම පව් වලින් පවිත්‍ර විය හැකි බව විශ්වාස කිරීමට සැළැස්වීමෙන් සාතන් බොහෝ අය රවටා තිබේ. සාතන් ගැළවීම අනුකරණය කළ පමණින්ම අප ගැළවීම පිළිබඳව දේශනා කිරීම නවතා දමන්නේද? සාතන් දිව්‍යමය සුව කිරීම් අනුකරණය කිරීම යන කරුණ සැබෑ සුවය ඇති බව පෙන්වන්නකි.

**සම්ප්‍රදාය මෙසේ පවසයි :**

"දිව්‍යමය සුව කිරීමේදී ප්‍රාණයට වඩා ශරීරය පිළිබඳව අවධානය යොමු කරයි."

**අපගේ ප්‍රතිචාරය :**

ඇතැම් අය දිව්‍යමය සුවකිරීම් වලදී මෙම රටාවට හුරු වී ඇති අතර මෙය සුව කිරීම පිළිබඳව බයිබලයේ දැක්වෙන රටාව නොවේය. බයිබලීය රටාව ශරීරය, ප්‍රාණය හා ආත්මය යන කොටස් තුනෙන් සමන්විත සම්පූර්ණ මිනිසා පිළිබඳව අවධානය යොමු කරයි. සුව කිරීම ශුභාරංචිය නොවන අතර එය ක්‍රිස්තුස්වහන්සේ පිළිබඳ ශුභාරංචියේ එක් අංශයක් පමණි. පාපිෂ්ඨ පුරුෂයන්ගේ හා කාන්තාවන්ගේ ආත්ම වලට ගැළවීම ලබා දීම උදෙසා වූ පූජාව ගැන සඳහන් නොකර සුවය කිසිදාක දේශනා නොකළ යුතුය. සභාව ආත්මය කෙරෙහි සැළකිල්ලක් දැක්වීම හා වෛද්‍ය විද්‍යව ශරීරය ගැන සැළකිල්ලක් දැක්වීම යන කරුණු දෙකම හේතුවෙන් බයිබලය තුළ ඉදිරිපත් කර ඇති සම්පූර්ණ මිනිසා පිළිබඳ සංකල්පය මඟහැරී තිබේ.

**සම්ප්‍රදාය මෙසේ පවසයි :**

"ඔබ රෝගී වී ඇත්තේ ඔබ පව් කර ඇති නිසාය."

**අපගේ ප්‍රතිචාරය :**

දහසය වන පරිච්ඡේදයේදී රෝගාබාධ වල මූලාරම්භය හා ඒවා ඇති වීමට හේතු යන කරුණු මත කරන ලද සාකච්ඡාවේදී ඔබ දැනටමත් මෙම විෂය ආවධාරණය කර තිබේ. ලෝකයට සියලු ලෙඩරෝග ඇති වී තිබෙන්නේ පාපය නිසා වුවද, පුද්ගලයෙකු රෝගී වන්නේ තමාගේම පෞද්ගලික පාපය නිසා නොවේ.

**සම්ප්‍රදාය මෙසේ පවසයි :**

"ඔබ රෝගීව සිටීම දෙවියන්වහන්සේගේ කැමැත්තය. එය උන්වහන්සේගේ මහිමය උදෙසාය"

## අපගේ ප්‍රතිචාරය :

බොහෝ අය දෙවියන්වහන්සේට සුව කළ හැකිද, නොහැකිද යන්න ප්‍රශ්න නොකරන නමුත් උන්වහන්සේ ඊට කැමති ද යන්න ප්‍රශ්න කරයි. දෙවියන්වහන්සේගේ කැමැත්ත තේරුම් නොගතහොත් අප අඥාණයන් වන බව බයිබලයේ සඳහන්ය.

> **මේ නිසා, නුඹලා අනුවණයෝ නොවී, ස්වාමීන්වහන්සේගේ කැමැත්ත කිමෙක්ද කියා තේරුම්ගනිල්ලා. (එපිස 5:17)**

සුවය පිළිබඳ දෙවියන්වහන්සේගේ කැමැත්ත දැන සිටීමෙන් ඇදහිල්ල වර්ධනය විය හැකි සාරවත් භූමියක් සකස් කරයි. සුවය ලබා ගැනීමේදී බලපෑමක් කළ හැකි එකම යාච්ඤාව ඇදහිල්ලේ යාච්ඤාවයි. සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බවට අප නිශ්චිතව නොදැන එම යාච්ඤාව කළ නොහැකිය.

පළමුව, ඔබ රෝගීව සිටීම දෙවියන්වහන්සේගේ කැමැත්ත බව ඔබ සැබවින්ම විශ්වාස කරන්නේ නම්, ඔබේ සුවය උදෙසා යාච්ඤා කරන ලෙස වෙන අයෙකුට පැවසීම වැරදිය. රෝගය දෙවියන්වහන්සේගෙන් වන දෙයක් නම්, වෛද්‍යවරු රෝග දුරු කිරීමට උත්සාහ කරන බැවින් ඔවුන් නපුරාගෙන් වන අය විය යුතුය. රෝහල් දෙවියන්වහන්සේට විරුද්ධ වෙමින් රෝගාබාධ දුරු කිරීමට උත්සාහ කරන බැවින් ඒවා වැරදි විය යුතුය. සෑම හෙදියක්ම වේදනාව නැති කිරීමට ගන්නා සෑම පියවරකදීම දෙවියන්වහන්සේට විරුද්ධව සිටිනවා විය යුතුය.

ලෙඩරෝග ආශිර්වාදයක් ලෙස සළකන සියලුදෙනා තම "ආශිර්වාදයෙන්" බැහැර වීමට ඖෂධ ලබා නොගත යුතු අතර, තම පවුලේ අය සහ සභාවේ සෙසු සාමාජිකයන් හට ද එම "ආශිර්වාදය" ම ලැබිය යුතු යැයි යාච්ඤා කළ යුතුය. එය දෙවියන්වහන්සේගෙන් වන බව විශ්වාස කරන අය ශල්‍යකර්මයක් මඟින් තම "ආශිර්වාදය" ඉවත් කිරීමට වෛද්‍යවරුන්ට ඉඩ නොහැරිය යුතුය. ලෙඩරෝග යනු ඇදහිලිවන්තයෙකු ලෙස ඔබ උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත බව ඔබ සැබවින්ම විශ්වාස කරන්නේ නම්, ඖෂධ ගැනීමේදී හා වෛද්‍යවරු හමුවීමේ දී ඔබ දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධව සටන් කරන බැවින් ඔබ එය නවතා දැමිය යුතුය.

නමුත් වෛද්‍යවරු, ඖෂධ, රෝහල් හා වෛද්‍ය විද්‍යාව දෙවියන්වහන්සේගේ යහපත්කම තවදුරටත් ව්‍යාප්ත වීමක් බව අපි දනිමු. ලෙඩරෝග සාතන්ගෙන් වන බැවින්, වේදනාව ඉවත් කිරීමේ සෑම සම්මත ක්‍රමයක්ම අපගේ ස්වර්ගීය පියාණන් වෙතින් වේ (සම්මත ක්‍රම යන්නෙන් අප අදහස් කරනුයේ සාතන්ගේ ක්‍රමවේද ඇතුළත් නොවන දේව වචනයට විරුද්ධ නොවන ක්‍රමයන්ය.)

අපගේ ශරීර මිළයක් ගෙවා ලබා ගෙන ඇති බැවින්, අප රෝගීව සිටියත් නිරෝගී වුවත් දෙවියන්වහන්සේ මහිමයට පත්කළ යුතු බව සැබෑවකි. නමුත්, මිනිසුන් සුවය ලැබූ විට දෙවියන්වහන්සේ මහිමයට පත් වූ බව බයිබලය වාර්තා කරයි. ලෙඩරෝග දෙවියන්වහන්සේ මහිමයට පත් කරයි නම්, රෝගීන් සුව කිරීමේදී යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ මහිමය සොරාගත් සේක. ලෙඩරෝග දෙවියන්වහන්සේ මහිමයට පත් කරයි නම්, අප සියලු දෙනා රෝගී වන පිණිස යාච්ඤා කළ යුතුය. ආත්මික රෝගය වන පාපය තුළින් මෙන්ම ශාරීරික ලෙඩරෝග වලින් ද දෙවියන්වහන්සේ මහිමයට පත් නොවේ.

ඇතැම් විට ඇදහිලිවන්තයන්ට ලෙඩරෝග පැමිණීමට දෙවියන්වහන්සේ ඉඩ හරින නමුත්, එහි මූලාරම්භය සාතන් බව සෑම විටම මතක තබා ගන්න. (යෝබ් මේ සඳහා උදාහරණයකි). ඇදහිලිවන්තයෙකු රෝගී වීම දෙවියන්වහන්සේ අපේක්ෂා නොකරයි. සාතන්ගේ ප්‍රහාරයන් පිළිබඳව උන්වහන්සේ දන්නා අතර සියලු දේම (නපුර පවා) ඔබගේ යහපත පිණිස එකට ක්‍රියා කිරීමට උන්වහන්සේ පාවිච්චි කරන සේක. රෝගීව සිටින විට වුවද ඔබට දෙවියන්වහන්සේට සමීප විය හැක්කේ මේ නිසාය. දෙවියන්වහන්සේ හැමවිටම උත්සාහ කරනුයේ නපුර තුළින් යහපත ගෙන දීමටය. දෙවියන්වහන්සේ පාපයෙන් ඇතිවූ බලපෑම් වලට ප්‍රතිකාරයක් ලෙස යේසුස්වහන්සේගේ මරණය පාවිච්චි කළ සේක.

පාවුල් පළමුවරට ගලාතියේ දී දේශනා කළේ රෝගයක් නිසා සැළැස්ම වෙනස් වූ නිසාය (ගලාති 4:13-15). ත්‍රොපිමස්ගේ රෝගය නිසා ඔහුට පාවුල් සමඟ රෝමයට යාමට නොහැකි වූ අතර ඉන් ඔහුට පාවුල්ගේ අවසානයට සමාන අවසානයකට මුහුණ දීමට සිදු වීමද වැළකුණි (2 තිමෝති 4:20). උත්පත්ති 12 හා 20 දී පාපයෙන් වැළකීම සඳහා රෝගය යොදාගන්නා ලදි. මෙම උදාහරණ තුළින් දෙවියන්වහන්සේ රෝගය පාවිච්චි කරන ආකාරය පෙන්වා දුන්න ද,

**මක්නිසාද උන්වහන්සේ මනුෂ්‍ය පුත්‍රයන්ට කැමැත්තෙන් පීඩා නොකරනසේක, ඔවුන් ශෝකයට නොපමුණුවනසේක. (විලාප ගී 3:33)** බවද මතක තබා ගන්න.

ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයට ලෙඩරෝග ඇති වීමේ මූලාරම්භය දෙවියන්වහන්සේ නොවන නමුත්, සාතන් නපුර උදෙසා ගෙන එන දේවල් ගෙන, ඔබ සාතන්ගේ ප්‍රහාරය තුළින් ගමන් කරන කල, ඔබට ආත්මික ජයග්‍රහණයන් ලබා දීමට උන්වහන්සේ ඒවා පාවිච්චි කරන සේක.

ලෙඩරෝග වලට පමණක් ශුද්ධවන්තයන් ඇති කළ නොහැක. එමගින් තික්ත, කොඳුරන, ඇදහිල්ලක් නොමැති මිනිසුන් ඇති කළ හැක. පවිත්‍ර කරමින් වර්ධනය ලබා දෙන්නේ දේව වචනයයි (යොහන් 17:17). ලෙඩරෝග ඇති විට ඔබ වැඩිපුර වචනයට ළං වන බව සැබෑ වුවද, ආත්මිකව වර්ධනය වීම සඳහා රෝගයක් පැවතීම අවශ්‍ය නොවේ. මෙය මතක තබා ගැනීම වැදගත් වේ: ඇදහිලිවන්තයන් උදෙසා දෙවියන්වහන්සේගේ කැමැත්ත වන්නේ චරිතයෙන් ක්‍රිස්තුස්වහන්සේට සමාන වීමයි. ලෙඩරෝග හා සෞඛ්‍යය ද ඇතුළත්ව අන් සෑම දෙයක්ම මෙම දිව්‍ය අරමුණ සම්බන්ධව හටගත් දේවල් වේ (රෝම 8:28-29).

නොඇදහිලිවන්තයන් සම්බන්ධයෙන්, ලෙඩරෝග ඇති වන්නේ පාපයේ හා පාපයේ ප්‍රතිඵලයක් ලෙස දෙවියන්වහන්සේගෙන් උරුම වූ විනිශ්චයේ ප්‍රතිඵලයක් ලෙසය. සුවය හා මිදීම ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස ගැළවීම ලැබීම සිදු විය හැකි බැවින්, මෙයද දෙවියන්වහන්සේට යහපත උදෙසා පාවිච්චි කළ හැකිය.

සුවය හා මිදීම සම්බන්ධයෙන් දෙවියන්වහන්සේගේ වචනය තුළ පොරොන්දු රැසක් ලබා දී තිබේ. ඔබ රෝගීව සිටීම උන්වහන්සේගේ කැමැත්ත නම් උන්වහන්සේ එසේ කර ඇත්තේ ඇයි? “මා සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත දැයි මා දන්නේ නෑ” යනුවෙන් ඇදහිලිවන්තයකු පැවසූ විට, “තම පොරොන්දු ඉටු කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත?” දැයි ඔහුගෙන් අසන්න.

“ඔබ මා දුටුවේ නම්, පියාණන්වහන්සේව ද දුටුවෙහිය” යි යේසුස්වහන්සේ පැවසූ සේක. උන්වහන්සේ මෙසේ පැවසුවේ උන්වහන්සේ පියාණන්වහන්සේගේ ක්‍රියාවන් හා කැමැත්ත කළ බැවිනි (යොහන් 14:9). දෙවියන්වහන්සේට සුව කිරීමට අවශ්‍යද නැද්ද යන්න ඔබට සැකයක් නම්, ඔබ කළ යුත්තේ සවාමින්වහන්සේගේ ක්‍රියාවන් දෙස බැලීමය.

ඔබ සුවය උදෙසා යාච්ඤා කරන විට , “ඔබවහන්සේගේ කැමැත්ත ඉටු වේවා” යනුවෙන් හෝ “ඔබවහන්සේගේ කැමැත්ත අනුව” යනුවෙන් යාච්ඤා කරන්න. ඔබ සුවය හා මිදීම සම්බන්ධයෙන් යාච්ඤා කරන විට “ස්වාමීනි, ඔබවහන්සේ කැමත්ත නම්” යනුවෙන් යාච්ඤා නොකරන්න. “ස්වාමීනි, ඔබවහන්සේ කැමති නම් මා ගළවා ගත මැනව” යනුවෙන් පව්කාරයෙකු යාච්ඤා කරන්නේ නැත. ගැළවීම මෙන්ම සුවය ද කුරුස පූජාවේ කොටසකි. අප පූර්ණත්වයට පත් කිරීමට දෙවියන්වහන්සේට අවශ්‍ය ද යන්න පිළිබඳව සැකයක් පවතී නම්, “ඔබගේ කැමැත්ත අනුව” යන්න ස්ථිර ඇදහිල්ලක් ඇති කරන අතර, ක්‍රමය, ප්‍රමාණය හා කාලය තීරණය කිරීම උන්වහන්සේට භාර දෙයි.

මරණීය රෝගයක දී පවා “ඔබවහන්සේ කැමති නම්” යනුවෙන් නොව, “ඔබවහන්සේගේ කැමැත්ත අනුව” යනුවෙන් යාච්ඤා කරන්න. “ඔබවහන්සේගේ කැමැත්ත අනුව” යනුවෙන් පැවසීමේ දී කාලය හා කොන්දේසි දෙවියන්වහන්සේට භාර වේ. ඇදහිලිවන්තයාව සදාකාලිකවම රෝගයෙන් ඉවත් කිරීම සඳහා මරණය තුළින් අවසාන සුවය ලබා දීම දෙවියන්වහන්සේගේ තෝරා ගැනීම විය හැකිය.

යේසුස්වහන්සේ අපට ඉගැන්වූයේ “ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද ඔබගේ කැමැත්ත ඉටු වේවා !” යනුවෙන් යාච්ඤා කිරීමටය. ස්වර්ගයේ රෝග නොමැත. එබැවින් පොළොවෙහිද ඒවා නොපැවතීම උන්වහන්සේගේ කැමැත්ත බව දැන අපට විශ්වාසයෙන් යුතුව ඊට විරුද්ධව යාච්ඤා කළ හැකිය. “දෙවියන්වහන්සේ, ඔබවහන්සේගේ කැමැත්ත නම්, සුව කළ මැනව” යනුවෙන් යේසුස්වහන්සේ යාච්ඤා කළේ නැත. “ඔබවහන්සේගේ කැමැත්ත නම්” යනුවෙන් උන්වහන්සේ යාච්ඤා කළ එකම අවස්ථාව වූයේ උන්වහන්සේගේ ජීවිතයේ දෙවියන්වහන්සේගේ සැළැස්මට උන්වහන්සේ යටත් වීම සම්බන්ධයෙන් මිස සුවය සම්බන්ධයෙන් නොවීය.

“එය ඔබවහන්සේගේ කැමැත්ත නම්” යන්න ඇදහිල්ල විනාශ කරයි. සමාජයෙන් කොන් කරනු ලැබූ කුෂ්ඨ රෝගියෙකු විසින් එය පාවිච්චි කළ විට, “මම එසේ කරමි” යනුවෙන් ඔහුට සහතිකයක් ලබා දෙමින් යේසුස්වහන්සේ ඔහුගේ අවිනිශ්චිත බව නිවැරදි කළ සේක. කිසිදිනක දෙවියන්වහන්සේගේ

සත්‍යවූ කරුණු බලාපොරොත්තු හෝ ප්‍රශ්න බවට නොහරවන්න. ඒවා යථාර්ථවත් ලෙස සළකා ක්‍රියා කරන්න. එවිට ඒවා බලවත් බව ඔබට වැටහෙනු ඇත.

කෙනෙකු ක්ෂණිකව සුව නොවූ පමණින් හෝ කෙනෙකු මරණීය රෝගයකින් මරණයට පත් වූ පමණින් ඔහුව සුව කිරීම දෙවියන්වහන්සේගේ කැමැත්ත නොවූ බව අපට පැවසිය නොහැක. අප දේවල් දෙස බලනුයේ කාලය තුළ වන අතර දෙවියන්වහන්සේ දේවල් දෙස බලනුයේ සදාකාලික ලෙස වේ. පහත ආකාරයේ කරුණු දෙකක් පවතින බව ඔබ මතක තබා ගත යුතුය.

ප්‍රමාද වී සිදුවන සුව කිරීම් : සාරා තම වඳ භාවයෙන් ක්ෂණිකව සුව වුයේ නැත. යෝබ් ක්ෂණිකව සුව වුයේ නැත. නියමිත කාලයක් ගත වන තුරු යොහන් බව්තීස්තගේ පියා තම ගොළු භාවයෙන් සුවය ලැබුවේ නැත. පළමු අවස්ථාවේදී තරමක් දුරට පමණක් පෙනීම ලැබූ අන්ධ මිනිසෙකු උදෙසා යේසුස්වහන්සේ දෙවරක් යාච්ඤා කළ සේක. දෙවියන්වහන්සේට වඩා මහිමය ගෙන දීම උදෙසා ඇතැම් විට සුව කිරීම් ප්‍රමාද වේ. මේ සඳහා හොඳම උදාහරණය ලාසරස්ගේ නැවත නැඟිටීම පිළිබඳ කතාන්දරය වේ.

මරණය ගෙන එන රෝග: මරණය යනු ඇදහිලිවන්තයෙකුගේ සදාකාලික ජීවිතයේ එක් අවස්ථාවක් පමණි. ඇදහිලිවන්තයෙකුට මරණය යනු පරම සුවය වන බැවින් මරණීය ලෙඩරෝග ජයග්‍රහණයක් බවට පත් වේ. අප රජිඳුන්ගේ අභිමුඛයට ඇතුළු වූ විට අප පූර්ණත්වයට පත් වන අතර තව දුරටත් පාපය හෝ ලෙඩරෝග නිසා විඳවිය යුතු නොවේ. මරණය පිළිබඳව කතාකිරීමේදී, අප නිර්මාණය කර ඇති අරමුණ පාවුල් මෙසේ විස්තර කරයි. "ශරීරයෙන් ඈත්ව ස්වාමීන්වහන්සේ සමග සිටින්ට වඩා කැමතිවෙමුව." (2 කොරින්ති 5:6-9)

සුව කිරීම් සියල්ලන්ම උදෙසා බව ඔබ විශ්වාස නොකරන්නේ නම්, එක් එක් අවස්ථාවේදී සුවය ලබා දීම දෙවියන්වහන්සේගේ කැමැත්ත ද නැද්ද යන්න පිළිබඳ දිව්‍යමය එළිදරව්වකින් පාලනය වන බව ඔබ විශ්වාස කළ යුතුය. එසේ නම් ඔබ දේව වචනය මත රඳා පවතිනු වෙනුවට මනුෂ්‍යයාට ලැබෙන සෘජු එළිදරව්ව මත රඳා පවතී. රෝගීව සිටින තැනැත්තා සුවය ලැබිය යුත්තෙක්ද යන්න පිළිබඳ ඔබට විශේෂ එළිදරව්වක් ලැබෙන තුරු ඔබගේ ඇදහිල්ලට කිසිඳු පදනමක් නොවනු ඇත.

## සම්ප්‍රදාය මෙසේ පවසයි :

"ධර්මිෂ්ඨයන්ට පීඩා බොහෝය. ඔබගේ රෝගය ධර්මිෂ්ඨකම නිසා ඔබ විසින් දරා ගත යුතු පීඩාවකි."

## අපගේ ප්‍රතිචාරය :

මෙම සම්ප්‍රදාය ගොඩනැගීමට භාවිතා කරන ගීතාවලිය 34:19 හි සඳහන් "පීඩා" යන වචනයේ අර්ථය ලෙඩරෝග යන්න නොවේ. හිරිහැර, අසිරුතා, විරෝධතා හෝ පරීක්ෂාවන්ය. ඉන් ලෙඩරෝග යන්න අදහස් වුවද, මෙම පදයේ ඉතිරි කොටසේ සඳහන් වන්නේ දෙවියන්වහන්සේට අපව ගළවා ගැනීමට අවශ්‍ය බවයි.

යාකොබ් 5:13-16 හි ලෙඩරෝග හා පීඩා අතර වෙනසක් සඳහන් වේ. හිරිහැර, අසිරුතා, විරෝධතා, හෝ පරීක්ෂාවන් වලින් ඔබට පීඩා ඇතිවේ නම්, ඔබ ඔබ උදෙසා යාච්ඤා කළ යුතුය (යාකොබ් 5:13). අන් අයට ඔබ සමග යාච්ඤා කරන ලෙස ඉල්ලීමට ඔබට හැකි වුවද, ඔබගේ සියලු ප්‍රශ්න පහවන ලෙස යාච්ඤා කිරීමට ඔවුන් කැඳවා නැත.

පීඩා ඇති වන විට හිරිහැර හා පරීක්ෂාවන් තුළින් යන විට යාච්ඤාවෙන් ජයග්‍රාහයකයකු වන ආකාරය ඔබ ඉගෙන ගත යුතු බැවින් ඔබම ඔබට යාච්ඤා කළ යුතු බව දේව වචනය උගන්වයි. කෙසේ වෙතත්, ලෙඩරෝග වලදී යාච්ඤා කිරීමට වැඩිමහල්ලන් කැඳවිය යුතුය (යාකොබ් 5:14). රෝගියා ගළවා ගනු ලැබිය යුතුය (ශාරීරික රෝගයෙන්), නඟා සිටුවිය යුතුය (නැවත ශක්තිය ලබා දීම) එසේම පව් වලට සමාව ලබා ගත යුතුය (ආත්මික සුව කිරීම).

## සම්ප්‍රදාය මෙසේ පවසයි :

"ඔබගේ රෝගය පාවුල්ගේ මෙන් "මාංසයේ කටුවකි". නොඑසේ නම් එය ඔබේ කුරුසියය. එය සමඟ ජීවත් වන ආකාරය ඔබ ඉගෙන ගත යුතුය."

## අපගේ ප්‍රතිචාරය :

ලෙඩරෝග ඔබගේ කුරුසිය යැයි පැවසීම සමඟ ගනුදෙනු කිරීම පහසුය. කුරුසිය යනු අපගේ කිසිඳු තේරාගැනීමකින් තොරව අප වෙතට පැමිණෙන ප්‍රශ්න, ලෙඩරෝග හෝ පීඩාවන් නොවේ. "කුරුසිය දැරීම" යනු කැමැත්තෙන් කළ යුතු ක්‍රියාවක් වන අතර, තෝරාගැනීමකින් තොරව පිළිගත යුතු යමක් නොවන බව යේසුස්වහන්සේ පැහැදිලි කළ සේක. ලෙඩරෝග හා මරණය දෙවියන්වහන්සේ විසින් එවනු ලැබූ කුරුසියක් ලෙස යේසුස්වහන්සේ නොසැළකූ සේක. උන්වහන්සේ ඒවා සැළකුයේ සතුරන් ලෙසය.

"මාංසයේ කටුව" පිළිබඳ ප්‍රකාශය පදනම් වී ඇත්තේ 2 කොරින්ති 12 හි සඳහන් පාවුල්ගේ මාංසයේ පැවති කටුව මත වේ. පාවුල්ගේ කටුව රෝගයක් බව විශ්වාස කරන මිනිසුන් සුවය පිළිබඳ සාකච්ජා කිරීමේදී එය ප්‍රසිද්ධ කරුණක් ලෙස යොදා ගනී. කටුව රෝගයක් ලෙස සැළකීම නිසා බොහෝ ඇදහිලිවන්තයන් රැවටී ඇති අතර සුවය නොලබා සිටී.

මෙම කටුව පිළිබඳව බයිබලයේ සඳහන් වන්නේ මොනවාදැයි අප දැන් පරීක්ෂා කර බලමු :

## එය කුමක් වීද :

එය "පණිවුඩකරුවකු" වූ බව බයිබලය පවසයි. "පණිවුඩකරු" යන ග්‍රීක් වචනය නව ගිවිසුමේ හත්වරක් සඳහන් වේ. 181 වතාවක් එය "දේවදූතයා" ලෙස පරිවර්තනය කර තිබේ. 188 වතාවේදීම ඉන් අදහස් වනුයේ පුද්ගලයෙකි. රෝගයක් හෝ ආබාධයක් නොවේ. "පණිවුඩකරුවකු" යනු පුද්ගලයෙකි.

පරණ ගිවිසුම තුළද "කටුව" යන වචනයේ භාවිතය මීට සමාන අදහසක් දරයි. ගණන් කතාව 33:55 හා යොෂුවා 23:13 හි කානාන් දේශයේ මුල් පදිංචිකරුවන් ගැන විග්‍රහ කිරීමට කටුව යන වචනය යොදාගෙන තිබේ. මෙම අවස්ථා දෙකේදීම මෙය ශාරීරික පීඩාවක් නොව, සතුරාගේ පහර දීමක් විය.

## එය ඇති කළේ කවුරුන්ද :

එය සාතන්ගේ පණිවුඩකරුවකු බව බයිබලය පවසයි.

## එයට අවසර ලැබුණේ ඇයි :

මෙම මාංසයේ කටුවට අවසර ලැබුණේ ඔහුට ලැබුණු මහත් එළිදරව් නිසා බවත් එමගින් පාවුල්ට උඩඟු කම ඇති වීමට හැකියාව ඇති නිසා බවත් පාවුල් පවසයි. තමන්ගේ මාංශයේ කටුවක් වැනි යමක් ඇති බව ප්‍රකාශ කිරීමට පෙර ඕනෑම කෙනෙක් තමාට ලැබී තිබෙන එළිදරව් හා දර්ශන ප්‍රමාණය සළකා බැලිය යුතුය. කටුවක් සඳහා ඔහුට සුදුසුකම් තිබේද? තමාගේ මාංසයේ කටුවක් වැනි යමක් ඇති බව පවසන බොහෝ දෙනෙකුට කිසිඳු ආකාරයක එළිදරව්වක් හෝ දර්ශනයක් ලැබී නැත.

කටුව අනාගත වාක්‍ය සම්පූර්ණ වීමක් ද විය. පාවුල් හැරුණු අවස්ථාවේදී, දෙවියන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **ඔහු මාගේ නාමය නිසා කොපමණ දේ විඳින්ට ඕනෑද කියා ඔහුට දක්වන්නෙමියි කීසේක. (ක්‍රියා 9:16)**

## ඉන් සිදු වූයේ කුමක්ද?

කටුව පාවුල්ට පහර දුන්නේය. "පහර දීම" යනු "නැවත නැවත ප්‍රති ප්‍රහාර එල්ල කිරීමයි". "පහර දීම" යන්නෙන් ස්ථිර රෝගී තත්වයක් ගැන අදහස් නොවන අතර ඉන් අදහස් වනුයේ ප්‍රතිප්‍රහාරයක් පිළිබඳවය. පණිවුඩකරු එවනු ලැබූයේ දේව වචනය දේශනා කිරීම නැවැත්වීම සඳහා පාවුල්ට ප්‍රතිප්‍රහාර එල්ල කිරීමටය.

ඇදහිලිවන්තයන්ගේ අභ්‍යන්තරයේ සිදුවන ප්‍රහාරයන් ඔවුන්ගෙන් ඉවත් කිරීමට දෙවියන්වහන්සේ පොරොන්දු නොවූ නමුත් ලෙඩරෝග ඔවුන්ගෙන් ඉවත් කිරීමට උන්වහන්සේ පොරොන්දු වූ සේක. අප ශුද්ධ ජීවිත ගත කළ හොත් අපට ලෙඩරෝග වලට නොව පීඩාවන්ට මුහුණ දීමට සිදු වනු ඇති බව බයිබලයේ නැවත නැවත අනතුරු අඟවයි.

## එය ප්‍රකාශ වූයේ කෙසේද?

පාවුල්ට ප්‍රතිප්‍රහාර එල්ල කිරීම සඳහා මෙම කටුව ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳ උදාහරණ කිහිපයක් පහත දැක්වේ :

- පාවුල්ගේ හැරීමෙන් අනතුරුව ඔහුව මරා දැමීමට යුදෙව්වන් තීරණය කළහ : ක්‍රියා 9:23
- ඇදහිලිවන්තයන්ට එකතු වීමේදී පාවුල්ට බාධා ඇති විය : ක්‍රියා 9:26-29
- ඔහුට සාතන්ගෙන් විරෝධතා ඇති විය : ක්‍රියා 13:6-12
- ඔහු සමූහයන් අතර සිටිය දී යුදෙව්වන්ගෙන් විරෝධතා ඇති විය : ක්‍රියා 13:44-49
- පිසිදියේ අන්තියෝකියේ දී ඔහුව නෙරපා හරිනු ලැබීය : ක්‍රියා 13:50
- ඉකෝනියේදී පාවුල්ට විරුද්ධව සෙනඟ වටවී පාවුල්ව එළවා දමනු ලැබීය : ක්‍රියා 14:1-5
- ඔහු ලුස්ත්‍රාවට හා දර්බයට පළා ගිය අතර එහිදී ඔහුට ගල් ගසා මැරෙන්නට හැර තිබුණි : ක්‍රියා 14:6-19
- වැරදි අදහස් දැරූ සහෝදරයන් සමඟ ඔහුට නිරන්තරයෙන් වාද කිරීමට සිදුවිය : ක්‍රියා 19:8
- පිලිප්පියේදී ඔහුව සිරගත කර පහර දෙනු ලැබීය : ක්‍රියා 16:12-40
- තෙසලෝනිකයේදී පාවුල්ට විරුද්ධව සෙනඟ වටවී ඔහුව පළවා හරිනු ලැබීය : ක්‍රියා 17:1-10
- බෙරියේදී පාවුල්ට විරුද්ධව සෙනඟ වටවී ඔහුව පලවා හරිනු ලැබීය : ක්‍රියා 17:10-14
- කොරින්තියේදී පාවුල්ට විරුද්ධව සෙනඟ වටවිය : ක්‍රියා 18:1-23
- එපිසයේදී පාවුල්ට විරුද්ධව සෙනඟ වටවිය : ක්‍රියා 19:23-31
- යුදෙව්වන් ඔහුගේ ජීවිතයට විරුද්ධව කුමන්ත්‍රණය කළහ : ක්‍රියා 20:3
- ඔහුව යුදෙව්වන් විසින් අල්ලා ගනු ලැබ, පස් වතාවක් අධිකරණයට ඉදිරිපත් කර වෙනත් අසිරුතාවයන්ට මුහුණ දීමට සිදුවිය : 2 කොරින්ති 11:23-33

එක්වරක් වත්, තමාගේ සියලු ලියවිලි වලදී පාවුල් ප්‍රතිප්‍රහාර එල්ල කිරීම ලෙඩරෝගයක් ලෙස නොදක්වයි. 1 කොරින්ති 4:11 දී, ප්‍රතිප්‍රහාර පිළිබඳ තම අදහස අනුව එය ස්ථිර රෝගයක් නොවන බව ඔහු පැවසිය. "මේ පැය දක්වාම ක්ෂුධාවද පිපාසයද විඳ, වස්ත්‍ර නැතුව, පහර ලැබ, නියම වාසස්ථානයක් නැතුව සිටිමුව" (1 කොරින්ති 4:11). ගලාති 4:13-16 හි සඳහන් පරිදි පාවුල් ලෙඩරෝග අත්දුටුවේය. නමුත් එය ස්ථිර තත්වයක් නොවන බැවින් එය ඔහුගේ කටුවේ කොටසක් නොවිය. ඔහුට එය තිබුණු බව ඔහු පැවසුවේ මුලදී පමණි.

පාවුල්ගේ කටුව යනු ඇස් නොපෙනීම යැයි ඇතැමුන් විශ්වාස කරති. නමුත් ඔහුගේ අන්ධවූ ඇස් සුව කරනු ලැබීය (ක්‍රියා 9:18). ඔහුට දිගටම ඇස් පිළිබඳ ප්‍රශ්නයක් පැවති බව විශ්වාස කිරීම දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලයට අපහාස කිරීමකි. එසේම, දෙවියන්වහන්සේගේ මහිමය දැකීම නිසා ඇස්වල ඇති වූ ආබාධයන් සාතන්ගේ පණිවුඩකරුවෙකු ලෙස හැඳින්වීම නිවැරදිද? ක්‍රි. ව. 60 දී මෙම යැවුම් පත්‍රය රචනා කිරීමේදී පාවුල් පවසන්නේ මීට අවුරුදු 14 කට පෙර තමා ලැබූවාවූ මහත් එළිදරව්වීම් නිසා ඔහුට මාංශයේ කටුව හිමි වූ බවය. එය ඔහුගේ හැරීමේදී දෙවියන්වහන්සේගේ මහිමය දුටු අත්දැකීමෙන් අවුරුදු 12 කට පසුව වේ.

ගලාති 4:15 දී "පුළුවන් නම් නුඹලාගේ ඇස් උගුලා මට දෙන්ට පවා නුඹලා කැමතිව සිටිය බවට නුඹලා ගැන සාක්ෂි දෙමි" යයි පැවසූ අතර එය හෙබ්‍රෙව් ව්‍යවහාරයේ එන ප්‍රකාශයකි. අධික ආශාව නිරූපණය කිරීම සඳහා අද දවසේදී භාවිත කරන ඇතැම් ප්‍රකාශන වලට එය සමාන වේ. උදාහරණයක් ලෙස "මම මගේ දකුණු අත දෙමි". ඇතැම් අය පවසන ආකාරයට, තම ඇස් වලින් සැරව ගලන ආකාරයේ අක්ෂි රෝගයක් පාවුල්ට වූයේනම්, එය මිනිසුන්ව විශේෂ භාසකම් උදෙසා වූ ඇදහිල්ලකට උනන්දු කරවීම පුදුම සහගතය. දුර්වලව ලෙඩව සිටීමට හේතුව, නුසුදුසු ලෙස ස්වාමීන්ගේ ශරීරයට සහභාගී වීම බව පාවුල් කොරින්තියේ සභාවට ලියා සිටි විට, "එසේ නම් ඔබ ලෙඩ වීමට හේතුව කුමක්දැ"යි ඔවුන් ඇසීමට ඉඩ තිබුණි.

## එහි ප්‍රතිඵල :

පාවුල් තම "දුර්වලකම" ගැන කතා කරයි. "දුර්වලකම" යනු "ශක්තියේ අවශ්‍යතාව, දුබල බව, තමන්ගේම ස්වාභාවික හැකියාවන් තුළින් ප්‍රතිඵල ගෙන දීමට ඇති නොහැකියාව" යන්නකි.

පාවුල්ගේ මාංශයේ වූ කටුව පිළිබඳව අවසාන වශයෙන් පැවසිය හැකි දෙය නම්, එම කටුව කුමක්දැයි අපට නිශ්චිතව දැන ගත නොහැකි අතර, එය ලෙඩරෝගයක් බව ඔබට උගන්වා තිබේනම්, පහත සඳහන් දේවල් මතකයේ තබා ගන්න :

පාවුල්ගේ කටුවේ ප්‍රතිඵලය වුයේ ඔහුගේ ජීවිතය තුළ දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය වීමකි. ඇතැම් පුද්ගලයන් ලෙඩරෝග වලින් දුර්වලව සිටිමට හේතුව වශයෙන් "මාංශයේ කටුව" ඉදිරිපත් කරයි. එවැනි කටුවක් පිළිබඳව බයිබලයේ සඳහන් උදාහරණයේදී එය සහිතව වුවද ඔහු තම සේවයේ හවුල් කරුවන් සමඟ ලිපි ලිවීම, දේශනා කිරීම, ගමන් කිරීම ආදී සියල්ල කළ බව ඔවුන් මතක තබා ගත යුතුය. දේව රාජ්‍ය තුළ ඔහුගේ බලවත් සේවයට හෝ ඔහු තුළින් සිදු වූ දෙවියන්වහන්සේගේ බලයේ ප්‍රකාශ වීමට මෙම කටුව නිසා බාධාවක් ඇති නොවිය.

## අවිශ්වාසය

සුව කිරීම කෙරෙහි බලපෑම් ඇති කරන තවත් විචල්‍යයක් වන්නේ අවිශ්වාසයයි. පහත සඳහන් හේතු නිසා අවිශ්වාසය ඇති විය හැකිය...

- දෙවියන්වහන්සේට සුව කළ නොහැකි යයි සිතිම

- දෙවියන්වහන්සේට සුව කළ හැකියඃ නමුත් උන්වහන්සේ මා සුව කිරීමට තෝරා නොගනිනු ඇතැයි සිතිම.

- දෙවියන්වහන්සේට සුව කළ හැකිය, එසේම මාවත් සුවකරන නමුත් එම අවස්ථාව දැන් නොවේ යැයි සිතිම.

- සුවයට බාධා කරන අවිශ්වාසයේ වටපිටාවක්.

අවිශ්වාසය දෙවියන්වහන්සේගේ ක්‍රියාවන්ට බාධා කළ ආකාරය පිළිබඳ බයිබලිය උදාහරණ කිහිපයක් දැක ගත හැකිය. නාසරෙත් නුවරදී යේසුස්වහන්සේ ...

> **ඔවුන්ගේ ඇදහිලි නැතිකම නිසා උන්වහන්සේ එහිදී බොහෝ ආශ්චර්යයන් නොකළසේක. (මතෙව් 13:58)**

මිනිසුන් විශ්වාස නොකිරීම නිසා යේසුස්වහන්සේ මවිතයටත්, පුදුමයටත් පත්විය :

> **. . . ඔවුන්ගේ විශ්වාසය නැතිකම ගැන උන්වහන්සේ මවිතවුසේක. (මාර්ක් 6:5-6)**

බයිබලය මෙසේ පවසයි :

> **නුමුත් අනුමාන නොකරම ඇදහිල්ලෙන් ඉල්ලාවා. මක්නිසාද අනුමාන කරන්නා සුළඟින් ගෙනයන්නාවූ, සෙලවෙන්නාවූ මුහුදේ රැළට සමානය. එබැවින් එබඳු මනුෂ්‍යයා තමාට ස්වාමීන්වහන්සේගෙන් යමක් ලැබේයයි නොසිතාවා. ඔහු දෙසිත් ඇති මනුෂ්‍යයෙක්ව, තමාගේ සියලු මාර්ගවලදී අස්ථිරව සිටින්නේය. (යාකොබ් 1:6-8)**

මාර්ක් 5:35-40 හි සඳහන් යායිරස්ගේ දියණිය සුවකිරීම, පිළිබඳ කතාව කියවන්න. යේසුස්වහන්සේ සුව කිරීම කළ අතරතුරදී ඇදහිල්ලේ වටපිටාවකට බාධාවූ අය කාමරයෙන් පිටතට යවනු ලැබූ අයුරු ඔබට දැකගත හැකි වනු ඇත. අද දවසේදී දෙවියන්වහන්සේට අවශ්‍ය ලෙස අපගේ සභාවන් තුළ සුවය හා මිදීම ගලා නොයාමට එක් ප්‍රධාන හේතුවක් වන්නේ ප්‍රජාවේ ඇති අවිශ්වාසයයි. අප එකිනෙකාගේ සාමාජිකයන්ය. ශරීරයේ එක් කොටසක් සුවය පිළිබඳ විශ්වාස නොකරයි නම්, මෙම අවිශ්වාසය අප මධ්‍යයේ සුවය වැගිරීමට බාධා කළ හැකිය.

"අදහන අය තුළ මෙම ලකුණු තිබේ" යයි බයිබලය පවසයි. මෙම පදයෙන් කතා කරනුයේ ඇදහිලිවන්තයන් (සභාව) පිළිබඳව වේ. "අදහන තැනැත්තාට" යනුවෙන් මෙම පදයේ තනි පුද්ගලයෙකු ගැන සඳහන් නොවේ. ක්‍රියා පොතෙහි වාර්තාවන සුවකිරීම් සිදු වූයේ ධර්ම ප්‍රචාරකයන් දෙතුන් දෙනෙකුගේ ක්‍රියාවන් නිසා නොවේය. එය සමස්ථයක් ලෙස ආත්මයෙන් පිරුණු සභාවක ඇදහිල්ල නිසාවේ.

නාසරෙත් නුවරදී ඔවුන්ගේ (ප්‍රජාවේ) අවිශ්වාසය නිසා යේසුස්වහන්සේට කිසිඳු බලවත් දෙයක් කළ නොහැකි වුයේ නම්, අපගේ ප්‍රජාවේ අවිශ්වාසය නිසා සුවකිරීම් වලට බාධා පැමිණෙන බව සත්‍යයක් නොවේද? මුල්කාලීන සභාව නොකඩවා යාච්ඤා කළ දෙයට අද දවසේ සභාවෙන් විශාල කොටසක් විරුද්ධ වේ. ඔවුන් ලෙඩ රෝග පිළිබඳ බයිබලිය ආකල්පය පිළිගෙන නැත. සුවය පිළිබඳ දේව වචනය

ප්‍රකාශ කරන දේ ඔවුන්ට උගන්වා නැත. එසේම, සුවය උදෙසා සේවය කරන අය වරදට පත් කිරීම උදෙසා ඔවුන් සුවය නොලබන අය දෙසට ඇඟිල්ල දිගු කරති. නමුත් එය ප්‍රජාවක් ලෙස ඔවුන්ට විශාල වගකීමක් ඇති අසමත් වීමකි.

සුවය හා මිදීම ඇතිව සම්පූර්ණ ගැළවීමේ ශුභාරංචිය දේශනා කරන අයට බොහෝ විට අවිශ්වාසයේ "නාසරෙත්" හි සේවය කිරීමට සිදුවේ.

මූලධර්මවාදි සභාවන් තුළ ගැළවීම පිළිබඳ විශ්වීය පිළිගැනීමක් ඇති බැවින් අපට බොහෝ අය ගැළවෙනු දැකගත හැකිය. නමුත් අපට බොහෝ නිකායන්ගේ සම්ප්‍රදායට, ප්‍රතික්ෂේප කිරීමට හා අවිශ්වාසයට මුහුණ දීමට සිදු වන බැවින් අපට බොහෝ සුව කිරීම් දැකගත නොහැකිය.

ප්‍රජාවේ අවිශ්වාසය සුව කිරීමේ සේවයට බාධාවක් නොවේ නම්, යේසුස්වහන්සේ නාසරෙත් නුවරදී තම සම්පූර්ණ සේවය නොකළේ ඇයි? (අද දවසේදී තුන්වන රටවල් තුළ බටහිර රටවල් වලට වඩා සුව කිරීම් දකින්නෙමු. ඒ තුන්වන රටවල් තුළ සුවය පිළිබඳව ආකල්පයක් ප්‍රජා විශ්වාසයේ ඇති බැවිනි. දෙවියන්වහන්සේ පවසා ඇති දෙය, ඔවුහු විශ්වාස කරති. අධිස්වාභාවික දේවල් ඔවුන්ගේ දෛනික ජීවිතයේ කොටසක් ලෙස ඔවුහු බලාපොරොත්තු වෙති. ද්‍රව්‍යමය අවධාරණය නිසා හා මානුෂීය හේතු විමසීම නිසා බටහිර ලෝකයේ සිටින බොහෝ මිනිසුන් ඒ තරමටම එය පිළිගැනීමට ඉදිරිපත් නොවෙති.)

## ඇදහිල්ල මද බව

අවිශ්වාසය යන ආකල්පය ඇති විට දෙවියන්වහන්සේට යමක් කළ නොහැකිය හෝ උන්වහන්සේ එසේ නොකරනු ඇත. අවිශ්වාසය නැති වූ පමණින්ම ඔබට ඇදහිල්ල ඇති බව අදහස් නොවේ. උදාහරණයක් ලෙස, අදේවවාදියා දෙවි කෙනෙකු ගැන විශ්වාස නොකරයි. භෞතික දේ ගැන පමණක් විශ්වාස කරන පුද්ගලයා උදාසීන වේ. ඇදහිලිවන්තයෙකුට ඇදහිල්ල ඇත. භෞතික දේ ගැන පමණක් විශ්වාස කරන පුද්ගලයෙකුගේ අවිශ්වාසය නැති වූ පමණින් ඔහුට ඇදහිල්ල ඇති බව අදහස් නොවේ.

රෝගීන් නඟා සිටුවන්නේ ඇදහිල්ලේ යාච්ඤාව තුළින් වන බැවින් ඔබ අවිශ්වාසය වෙනුවට දෙවියන්වහන්සේ කෙරෙහි ඇදහිල්ල ඇති කර ගත යුතුය (යාකොබ් 5:15). ඔබ ඇදහිල්ලෙන් ආයාචනා කරමින්, ඇදහිල්ලේ වචන කතා කරමින්, ඇදහිල්ලෙන් ක්‍රියා කළ යුතුය. ඔබ ඇදහිල්ලෙන් මිස දැකීමෙන් ගමන් නොකළ යුතුය (ශරීරයේ රෝග ලක්ෂණ හා වටා පිටාව දෙස බැලිය යුතු නොවේ).

ඇදහිල්ලෙන් නොමැතිව දැකීමෙන් ගමන් කිරීමට සලස්වා සාතන් සුවය සොරා ගැනීමට තැත් කරයි. සුවය ලැබුනේයයි ප්‍රකාශ කරන එහෙත් සුවය නොලැබූ අය කෙරෙහි බැලීමට සාතන් ඔබ උනන්දු කරයි. එය ඔබගේ ඇදහිල්ල කෙරෙහි ඇති ඇදහිල්ල හෝ වෙන අයෙකුගේ ඇදහිල්ල කෙරෙහි ඇති ඇදහිල්ල නොවේය. ඇදහිල්ලෙන් පමණක් සුවය නොලැබේ. සුවය ලබා දෙන්නේ දෙවියන්වහන්සේය. දෙවියන්වහන්සේගෙන් සුවය ලැබීම කෙරෙහි ඇදහිල්ල කොරාට තිබුණ බව පාවුල් තේරුම් ගත්තේය. (ක්‍රියා 14:8-10).

සුවය ලැබීම සඳහා විශාල ඇදහිල්ලක් අවශ්‍ය නොවේ. අබ ඇටයක තරම් ඇදහිල්ලක් ඉතා බලවත් බව යේසුස්වහන්සේ පැවසූ සේක. යේසුස්වහන්සේ මිනිසුන්ට සම්මුඛ වන්නේ ඔවුන්ගේ ඇදහිල්ලේ මට්ටම් වලදීය. උන්වහන්සේගේ ශාරීරිකව පැමිණීම අවශ්‍ය බව ඔවුන් සිතන අවස්ථා වලදී යේසුස්වහන්සේ එහි ගිය සේක. එය අවශ්‍ය නොවන බවට ඔවුන්ට ඇදහිල්ලක් තිබුණු විට උන්වහන්සේ දුර සිට වචනයක් වදාළ අතර සුවය ලැබීම සිදු විය.

රෝගීන් සුව නොවූ විට, මිනිසුන් සාමාන්‍යයෙන් ඇදහිල්ල මඳ බව හේතුව ලෙස දක්වයි. නමුත් ඔබ මෙම පාඩම තුළ ඉගෙන ගන්නා ආකාරයට, සළකා බැලිය යුතු වෙනත් විචල්‍යයන් රැසක් ද තිබේ. සුවය සොයා ආ මිනිසුන්ගේ ඇදහිල්ල මද බවට යේසුස්වහන්සේ කිසිදාක වරද තැබුවේ නැත.

## සමාව නොලැබූ පෞද්ගලික පාප

ඇතැම් අවස්ථාවලදී පෞද්ගලික පාප හා ලෙඩ රෝග අතර සෘජු සම්බන්ධතාවයක් බයිබලය ස්ථිර කරයි:

> **එබැවින් නුඹලාගේ වරද එකිනෙකාට කියාදී, සුව ලබන පිණිස එකිනෙකා උදෙසා යාච්ඤාකරපල්ලා. ධර්මිෂ්ඨ මනුෂ්‍යයෙක් ඔප්පුකරන කන්නලව්ව කරණකොටගෙන මහත් දේ ඉෂ්ටවෙයි. (යාකොබ් 5:16)**

"අයුතුකම් කිරීමේ අභිප්‍රායක් මාගේ සිතෙහි ඇත්නම්, ස්වාමීන්වහන්සේ මාගේ බස් නාසන සේක." යනුවෙන් දාවිත් පැවසුවේය.

අපගේ ආත්මයෙන් අප යක්ෂයාගේ ක්‍රියාවන්ට ඇලී ගැලී සිටියදී අපගේ ශරීරයෙන් යක්ෂයාගේ ක්‍රියාවන් විනාශ කර දැමීමට දෙවියන්වහන්සේ පොරොන්දු නොවූ සේක. රෝගීව සිටින තැනැත්තාගේ හදවතෙහි අයුතුකමක් තිබේනම්, දෙවියන්වහන්සේ ඔහුට සවන් නොදෙන බැවින් සුවය ලැබීම සිදු නොවනු ඇත. සේවය කරන තැනැත්තාගේ හදවතෙහි අයුතුකමක් තිබේනම්, දෙවියන්වහන්සේ ඔහුට සවන් නොදෙන බැවින් සුවය ලැබීම සිදු නොවනු ඇත.

සමාව නොදෙන ආත්මයක් හෝ අමනාපකම් සිතේ රඳවාගෙන තිබීම සුවය ලැබීමට බාධා ඇති කරයි. "ඔබ මනුෂ්‍යයන්ගේ වරද ඔවුන්ට කමා නොකරන්නේ නම්, ඔබගේ ස්වර්ගීය පියාණන් ද ඔබගේ වරද ඔබට කමා නොකරනු ඇතැ" යි යේසුස්වහන්සේ පැවසූ සේක. අප අන් අයට සමාව දෙන තුරු දෙවියන්වහන්සේ අපට සමාව නොදෙන්නේ නම්, සුවය ලැබිම ද සිදුවිය නොහැක. මන්ද සුවය ලැබීම යනු ප්‍රාණය, ආත්මය හා ශරීරය යන අංග තුනම පූර්ණත්වයට පත් වීමයි.

## පූර්ණත්වයට පත් වීම ප්‍රතික්ෂේප කිරීම

බෙතෙස්දාවේ පොකුණ අසල සිටි අන්ධ මිනිසාගෙන් යේසුස්වහන්සේ මෙසේ ඇසූ සේක :

> **. . . නුඹ සුවය ලබන්ට කැමැත්තෙහිදැයි ඔහුගෙන් ඇසූසේක. (යොහන් 5:6)**

බොහෝ විට අප සොයනුයේ සුවය හෝ මිදීම පමණි. දෙවියන්වහන්සේට අවශ්‍ය, සම්පූර්ණ මනුෂ්‍යයා සමඟ ගනුදෙනු කර ශරීරය, ප්‍රාණය හා ආත්මය සුවපත් කිරීමය. මිනිසා යනු ශරීරය, ප්‍රාණය හා ආත්මය වන බැවින් පූර්ණත්වය නමැති සංකල්පය තුළ මේ සියල්ලම සමඟ ගනුදෙනු කිරීම අදහස් වේ. අපට ශාරීරික සුවය ප්‍රාණයෙන් හා ආත්මයෙන් වෙන් කර විශේෂ කොට දැක්විය නොහැකි අතර, සුවය ගැළවීමෙන් වෙන්කර දැක්වීමට ද නොහැකිය.

දෙවියන්වහන්සේ ආත්මයක්ය. උන්වහන්සේ ඔබට සම්බන්ධ වන්නේ ඔබේ ආත්මය තුළිනි. ඔබගේ ආත්මය ශාරීරික, මානසික, ආත්මික හා හැඟීම් ජීවිතය පාලනය කරයි. ඔබගේ මුළු ජීවිතයම ආත්මිකත්වය මත පදනම්ව ඇත. ඔබ ආත්මිකත්වය මත පදනම් වූ ජීවියෙක් වන බැවින්, ශරීරය සුව වීම ආත්මයෙන් ආරම්භ වේ.

දෙවියන්වහන්සේ මිනිසා මැවූ විට, ඔහුගේ මෙලොව ජීවිතය පාලනය කිරීමේ බලයව පැවතීමට තිබුණේ උන්වහන්සේගේ ආත්මයයි. එමගින් මනුෂ්‍යයාගේ මනස හා ශරීරයේ සම්පූර්ණ පාලනය යටතේ දෙකොටසම එක් කර දෙවියන්වහන්සේට ජීවත් විය හැකි එක්සත් සම්පූර්ණ මිනිසෙකු බවට පත් කිරීම සැලැස්ම විය. ආරම්භයේ ඒදන් උයනේදී, මිනිසා දෙවියන්වහන්සේ සමඟ සමීප ආත්මික සම්බන්ධතාවයක් පවත්විය.

උද්‍යානයේදී දැනගැන්මේ ගසින් කෑම තහනම් කිරීමේදී, දෙවියන්වහන්සේ "ශාරීරික හා බුද්ධිමය දනුමේ" මට්ටමින් ජීවත් වීම තහනම් කරන ලදි. මිනිසා පව් කළ විට, ඔහුගේ ආත්මය යටපත් වූ අතර ඔහු තමාගේ බුද්ධියෙන් ජීවත් වීමට තෝරා ගත්තේය. මනස ආත්මය යටපත් කරමින් ඉස්මතු වූ විට, මනුෂ්‍යයාගේ ආත්මික කොටස මරණයට පත් විය (නොඑසේනම්, දෙවියන්වහන්සේට හා ජීවනයට ඔහුගේ ප්‍රතිචාරය දැක්වීමේ මූලාශ්‍රය ලෙස කටයුතු කිරීම ඇන හිටියේය.) ඒ කාලයේ පටන්ම, ආත්මය, මනස හා ශරීරය අතර වෙන් වීමක් සිදු විය. එහි ප්‍රතිඵලය වූයේ, මනුෂ්‍යයාත්, ඔහුගේ පරිසරයත් හා ඔහුගේ මැවුම්කරුවාණෝ අතර එකමුතුකම අඩු වීමයි.

සුවය ලැබීම යනු ලෙඩ රෝග නැතිවීමට වඩා ව්‍යාප්ත දෙයකි. එය ශරීරයේ යහපත් සෞඛ්‍ය තත්වයට එහා ගිය දෙයකි. එහි අදහස සෑම කොටසක්ම (මනස, හැඟීම් ආදිය ද ඇතුළත්ව ශරීරය, ප්‍රාණය හා ආත්මය) සෙසු කොටස් එනම්, පරිසරය හා මැවුම්කරුවාණෝ සමඟ නිසි ක්‍රියාකාරීත්වයට නැවත පත්වීමය.

## තිරණ හා ආශාව මදවීම

බෙතෙස්දාවේ කොර මිනිසාගෙන් යේසුස්වහන්සේ මෙසේ ඇසූ සේක :

**. . . නුඹ සුවය ලබන්ට කැමැත්තෙහිදැයි ඔහුගෙන් ඇසූසේක. (යොහන් 5:6)**

මේ අවස්ථාවේදී, කොර මිනිසාට තිරණයක් ගැනිමට සිදු විය. ඇතැම් පුද්ගලයන්ට සුවය ලැබීමට අවශ්‍ය නැත. රෝගී වීම නිසා ඔවුන්ට ලැබෙන අනුකම්පාව හා අවධානයට ඔවුහු කැමතිය. ඇතැම් අයට විශ්‍රාම වැටුප් තුළින් හෝ නිතිමය පියවර තුළින් වෛද්‍ය පහසුකම් ලැබෙන අතර ඔවුහු ඒවා අහිමි කර ගැනීමට අකමැති වෙති. තවත් අයට දෙවියන්වහන්සේ වෙතට ගොස් උන්වහන්සේ සමඟ සිටීමට විශාල ආශාවක් ඇති අතර සුවය ලැබීමට අවශ්‍ය නැත.

## අපගේ ඉල්ලීම් පිළිබඳ ගැටලු

සුවය ඉල්ලීමේදී එය ඉටුවීමට බාධා කරන අපගේ ඉල්ලීම පිළිබඳ ඇතැම් ගැටලු තිබේ.

### නොඉල්ලීම :

පළමුව හා ඉතා මූලිකව, ඇතැම් අවස්ථාවලදී අප සුවය ඉල්ලන්නේ නැත. අප උදව් සොයමින් ඖෂධ වෙතට හෝ සැනසිම සොයමින් මිතුරන් වෙතට හැරෙන්නෙමු.

**. . . නුඹලා නොඉල්ලන බැවින් නොලැබෙන්නේය (යාකොබ් 4:2)**

### නිශ්චිත වශයෙන් නොඉල්ලීම :

ඇතැම් අවස්ථා වලදී යාච්ඤාවන් නිශ්චිත නොවන බැවින් ඒවාට බාධා ඇති වේ :

**. . . වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත (යාකොබ් 4:3)**

ඔබ වැරදි ලෙස ඉල්ලන විට, ඔබගේ යාච්ඤාවන් තුළ ඔබ නිශ්චිත වන්නේ නැත. ඔබ ඉලක්කයට පහර නොදෙයි.

### වැරදි අභිප්‍රායන් සහිතව ඉල්ලීම :

ඇතැම් අවස්ථා වලදී, අප වැරදි අභිප්‍රායන් සහිතව යාච්ඤා කරන්නෙමු :

**නුඹලා ඉල්ලන නුමුත් නුඹලාගේ තෘෂ්ණා ගැන වියදම්කරන පිණිස වැරදි ලෙස ඉල්ලන බැවින් ලැබෙන්නේ නැත. (යාකොබ් 4:3)**

ඇතැම් අයට සුවය ලැබීමට අවශ්‍ය නමුත් තම පව්කාර, ලෞකික, කැපනොවූ ජීවන රටාව අත්හැර දැමීමට ඔවුහු අසමත් වෙති. ඔවුන්ට සුවය ලැබීමට අවශ්‍ය ඔවුන්ගේම කාර්යයන් වෙත ඔවුන්ට නැවත හැරී යාමට අවශ්‍ය බැවිනි. මිනිසුන් මෙම ප්‍රශ්න සළකා බැලිය යුතුය : “සුවය ලැබීමට අවශ්‍ය වීමේ ඔබේ අභිප්‍රාය කුමක්ද? එය ඔබගේ මමත්වය මුල් කරගත් ජීවිතයට හැරියාමට හැකිවනු පිණිස ද? එනම් ඔබ උදෙසා වූ දෙවියන්වහන්සේගේ විශේෂිත අරමුණ ඉටු කරනු වෙනුවට යහපත් ක්‍රියා කරමින් සිටිය හැකිවනු පිණිසද?”

## නොපසුබට වීමේ ස්වභාවය මද වීම

ඇතැම් අවස්ථාවලදී අප ප්‍රමාණවත් තරම් නොකඩවා (නොනවත්වා) යාච්ඤා නොකරන්නෙමු. පාවුල් පවා “මුලදී” රෝගීව සිටිමින් දේශනා කළ අතර (ගලාති 4:13-14) පසුව සුවය ලැබීය. මරණය අත්දුටු එපප්‍රොදිතස් කෙරෙහි (පිලිප්පි 2:27) සහ රෝගීව දමාගිය ත්‍රොපිමස් (2 තිමෝති 4:20) කෙරෙහි යාච්ඤාවෙන් ක්ෂණික බලපෑමක් වූ බව දක්නට නොතිබුණි. නමුත් ඔවුන් දෙදෙනාම කල්යාමේදී සාමාන්‍ය

තත්වයට පත් විය. (මෙම අවස්ථා දෙකේ දී ක්ෂණික සුවකිරීමක් සිදු නොවූ බව නොසලකා හරිමින් පාවුල් දිගින් දිගටම රෝගීන් උදෙසා යාච්ඤා කළ බව සැළකිල්ලට ගන්න.)

ඔබ එක් වරකට වඩා සුවය ඉල්ලන්නේ නම් එය ඇදහිල්ල මඳ බවක් බව ඇතැම් පුද්ගලයෝ පවසති. නොකඩවා යාච්ඤා කිරීම මඟින් අවිශ්වාසය හෝ ඇදහිල්ල මද බව පෙන්නුම් කරන බව යේසුස්වහන්සේ නොපැවසූ සේක. උන්වහන්සේ එයට ධෛර්යය දුන් සේක. ලූක් 11:1-13 දක්වා රාත්‍රියේ පැමිණි මිත්‍රයා (5-8 පද) හා වැන්දඹුව හා විනිශ්චයකාරයා (1-8 පද) යන උපමා වලින් යාච්ඤාවෙන් නොනවත්වා රැඳී සිටීමේ වැදගත් කම උගන්වයි. දානියෙල්ගේ උදාහරණය ද නොකඩවා රැඳී සිටීම ධෛර්යමත් කරයි. දානියෙල් යාච්ඤා කළ පළමු අවස්ථාවේදී දෙවියන්වහන්සේ ඔහුගේ යාච්ඤාව ඇසූ නමුත්, පිළිතුරු ගෙන ආ දේව දූතයාට සාතන් බාධා කළේය.

ඔබ යාච්ඤා කළ පළමු අවස්ථාවේ දී සුවය ලැබීම සිදු නොවුයේ නම්, එය අතහැර නොදමන්න. යාච්ඤාවේ "ඉල්ලීම, සෙවීම හා තට්ටු කිරීම" යන මට්ටම් ඇති බව මතක තබා ගන්න. ඇතැම් අවස්ථාවලදී ඔබ ඉල්ලන අතර ක්ෂණිකව පිළිතුරු ලැබේ. ඇතැම් අවස්ථා වලදී යාච්ඤාවකට පිළිතුරු ලැබීමට පෙර ඔබට සෙවීමට සහ නොනවත්වා තට්ටු කිරීමට සිදුවනු ඇත. අනාගතවක්තෘ එලිෂා අහසින් ගිනි වැටෙන ලෙස වරක් යාච්ඤා කළේය. වැසි ලැබෙන ලෙස ඔහුට සත්වරක් යාච්ඤා කිරීමට සිදු විය.

ඔබගේ ආයාචනය අසනු ලැබූ බව ඔබ දැන ගන්නා තුරු නොනවත්වා යාච්ඤා කරන්න. ඔබගේ ආත්මයට එම ස්ථිරත්වය ලැබුණු විට, ඔබට දෘෂ්‍ය ප්‍රතිඵලය දැකගත නොහැකි වුවත් දෙවියන්වහන්සේට ප්‍රශංසා කිරීමට පටන් ගන්න.

- යෙහෝෂාපාට් හා ඉශ්රායෙල් ජනතාව තම යාච්ඤාව සඳහා පිළිතුර සැබවින්ම දැක ගැනීමටත් පෙර ශබ්ද නගා ප්‍රශංසා කිරීමට පටන් ගත්හ.

- ලාසරස් ව නැඟිටුවීමට පෙර යේසුස්වහන්සේ දෙවියන්වහන්සේට ස්තුති කළ සේක.

- පුත්‍රයෙකු ලබා දීමේ පොරොන්දුව පිළිබඳව ආබ්‍රහම්ට සහතිකයක් ලැබුණු විට, ඔහු දිගින් දිගටම යාච්ඤා කළේ නැත. ඔහු විශ්වාස කරමින් දෙවියන්වහන්සේ මහිමයට පත් කළේය.

## සුව කිරීමේ ක්‍රියාවලිය තුළදී අකීකරු වීම

ඇතැම් අවස්ථාවලදී සුවකිරීමේ ක්‍රියාවලියේදී දෙවියන්වහන්සේ විශේෂ උපදෙස් ලබා දෙන සේක. උදාහරණයක් ලෙස, එලිෂා දිවැසිවරයා තුළින්, සුවය ලබා ගැනීමට නම් මඩ සහිත ගංගාවෙන් සෝදා ගන්නා ලෙස දෙවියන්වහන්සේ නාමන්ට පැවසූ සේක (2 රාජාවලිය 5:1-14). ඇතැම් අවස්ථාවලදී ඔබත් හාස්කමත් අතර ඇත්තේ කීකරුකමේ ඉතා සරල ක්‍රියාවකි.

## ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය ගැන හරිලෙස තේරුම් නොගැනීම

1 කොරින්ති 11:27-30 කියවන්න. එහි පසුබිම ගැන තවදුරටත් දැනගැනීම සඳහා ලූක් 22:2-20, මතෙව් 26:27-29 හා මාර්ක් 14:22-25 කියවන්න. දුර්වලතා හා ලෙඩ වීම අප ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයට තේරුමක් ඇතිව සහභාගි නොවීමේ ප්‍රතිඵලයයි. "සුදුසු ලෙස" යන්නෙහි අර්ථය "යමක් පරීක්ෂාකිරීම, ගවේෂණය හා වෙන්කොට හඳුනාගැනීම තුළින් ඉගෙන ගැනීම හා තේරුම් ගැනීමයි"

අපට ආකාර තුනකින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය තේරුම් ගැනීමට අසමත් විය හැක.

### රුධිරයේ හා මාංශයේ අර්ථය :

මිදි යුෂ වලින් හා රොටි වලින් සංකේතවත් කරණ උන්වහන්සේගේ රුධිරයේ හා මාංශයේ අර්ථය වටහා නොගැනීම නිසා අප තේරුමක් ඇතිව සිටීමට අසමත් විය හැකිය. යොහන් 6:66 දී යේසුස්වහන්සේ ප්‍රථම වරට මේ පිළිබඳ ඉගැන්වූ විට බොහෝ අය උන්වහන්සේ අනුගමනය කිරීමෙන් හැරී ගියේය. උන්වහන්සේ උගන්වමින් සිටි දෙයෙහි ආත්මික අර්ථය ඔවුන්ට වැටහුණේ නැත. බොහෝ අය රුධිරය, පාපය උදෙසා වූ සමාව ලෙස තේරුම් ගත්තද, ඔවුන්ට බොහෝවිට ශරීරයේ නියම අර්ථය වැටහෙන්නේ නැත. ශරීරය සුවය ලැබීම උදෙසා වූ අතර, අප ඉන් ආහාරයට ගත් විට අපට සුවය ලැබේ (යොහන් 6:48-58 හා ලූක් 6:48-51 බලන්න.)

**ශරීරයේ ඇති වන්නා වූ බෙදීම් :**

ඇතැම් අවස්ථාවලදී ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටස් වන අපගේ සහෝදර සහෝදරියන්ව තේරුම් ගැනීමට අප අසමත් වන අතර සභාව තුළ බෙදීම් ඇතිවේ. ස්වාමීන්වහන්සේ තුළ අපගේ සහෝදර සහෝදරියන් සමඟ අපට ඇති එක්සත් බව අප නිසි ලෙස තේරුම් නොගන්නේ නම් අප නුසුදුසු ලෙස කන්නේය, බොන්නේය. බෙදීම් වලට ඇතුල්ව සිටින ලෞකික කිතුණුවන්ගේ ලෞකිකත්වය නිසා ඔවුන්ට වචනයේ මස් (මාංශය, ශරීරය) අනුභව කළ නොහැකි බව 1 කොරින්ති 3:1-13 දී පාවුල් පැහැදිලි කළේය.

**නුසුදුසු ලෙස ආහාරයට ගැනීම :**

ජීවිතය ගැන නොවිමසා ශුද්ධ වූ සහභාගිකමට පංගුකාර වන විට අප නුසුදුසු ලෙස ආහාරයට ගන්නෙමු. එහි ප්‍රතිඵල දුර්වල වීම හා රෝගී වීමයි. ශුද්ධ වූ සහභාගිකමට සහභාගී වීමට පෙර තමාවම පරීක්ෂා කර බලා පසුතැවිලි වන්න යැයි පාවුල් කීවේ ඒ නිසාය.

## යක්ෂ ආත්මය පළවා හැර නැත

ඇතැම් අයට සුවය නොලැබෙන්නේ ඔවුන්ගේ ලෙඩරෝග ඇති වී තිබෙන්නේ යක්ෂ ආත්මයක් නිසා වේ. මෙම ආත්මය එලවා දමා නොමැති බැවින් ඔවුන්ට සුවය නොලැබේ. ඔවුන්ට යාච්ඤාවට වඩා යමක් අවශ්‍යය. යක්ෂ ආත්මයක් මඟින් ලෙඩරෝග ඇති කරන තත්වයන් වලදී, සුවය ලබා ගැනීම සඳහා යක්ෂ ආත්මය පළවා හරිනු ලැබූ බව බයිබලය සඳහන් කරයි.

## ස්වාභාවික නීතීන් කඩ කිරීම

"ඔබ සුවකරන ස්වාමීන්වහන්සේ මමය"යි පැවසූ දෙවියන්වහන්සේම, තම ජනයාට සෞඛ්‍ය හා පිරිසිඳුකම පිළිබඳ ස්වාභාවික නීතීන් ලබාදුන් සේක. ඇතැම් මිනිසුන් මෙම ස්වාභාවික නීතීන් කඩ කරන බැවින් ඔවුන්ට සුවය නොලැබේ. උදාහරණයක් ලෙස, දිගින් දිගටම මත්පැන් පානය කරන පුද්ගලයෙකු තම අක්මාවේ පවතින රෝගය සුව නොවීම ගැන පුදුම විය හැක. ඔවුන් දිගින් දිගටම දුම්වැටි පානය කරන අතර දෙවියන්වහන්සේ තමන්ගේ පෙනහලු වල පිළිකාව සුව නොකරන්නේ ඇයි දැයි පුදුම වේ.

## මරණය සඳහා නියම කරන ලද කාලය

මරණය සඳහා නියම කරන ලද කාලයක් ඇති බව බයිබලයේ උගන්වයි. (දේශනාකාරයා 3:2 සහ හෙබ්‍රෙව් 9:27). සුවකිරීම් හා මුදවාගැනීම් පිළිබඳ මහත් භාස්කම් කළ ශ්‍රේෂ්ඨ අනාගතවක්තෘ එලීෂාට පවා "මරණීය ලෙඩක් වැළඳුනි" (2 රාජාවලිය 13:14). දහ අට වන පරිච්ඡේදයේදී සුවය සඳහා සේවය කිරීමට උපදෙස් පිළිබඳව ඉගෙන ගැනීමේදී එහි කොටසක් ලෙස අසාධ්‍ය රෝග පිළිබඳ අධ්‍යයනයේ දී මෙම විචල්‍ය සමඟ ගනුදෙනු කරන ආකාරය ඔබ විසින් ඉගෙන ගනු ඇත.

## අවසාන මතක් කිරීම

මෙම පරිච්ඡේදය ආරම්භ කළේ ප්‍රශ්න කිහිපයක් සමඟය :

සුවය සඳහා බලපෑම් ඇති කරන විචල්‍යයන් මොනවාද? බොහෝ මිනිසුන් සුවය
නොලැබෙන්නේ ඇයි? ඇතැම් අයට සුව වන අතර ඇතැම් අය සුව නොවන්නේ ඇයි?
ඇතැම් අවංක හා කැපවුණු අයට සුවය නොලැබී තිබියදීත් ඉතා සෙළවෙන හා ලෝකාකාර
කිතුනුවන් සුවය ලබන්නේ ඇයි?

මෙම පාඩමේදී ඔබ ඉගෙන ගත් විචල්‍යයන් සුවය හා මිදීම කෙරෙහි බලපෑම් ඇතිකරන්නාවූ සමහර තත්වයන් පමණි. කෙසේ වෙතත් හැමවිටම මතක තබා ගන්න :

> **රහස්වූ දේ අපේ දෙවිවූ ස්වාමීන්වහන්සේට අයිතිය. එහෙත් මේ ව්‍යවස්ථාවේ සියලු වචන අප විසින් පවත්වන පිණිස එළිදරව්කර තිබෙන දේ අපටත් අපේ දරුවන්ටත් සදාකාලයටම අයිතිය. (ද්විතීය කතාව 29:29)**

ඇදහිල්ලට අවශ්‍ය වන්නේ ඉහත ආකාරයේ ඇදහිල්ලකි. ඔබට සියලුම පිළිතුරු තිබේ නම් ඇදහිල්ල අවශ්‍ය නැත. දෙවියන්වහන්සේට අවශ්‍ය ඔබ උන්වහන්සේගේ වචනය මත ඇදහිල්ලෙන් ක්‍රියා කිරීම මිස, පිළිතුරු සැපයීම නොවේය.

අවයවයන් වශයෙන්, සුවය සඳහා බලපාන විචල්‍යයන් පිළිබඳ වැදගත් ප්‍රකාශයක් පහත දැක්වේ. එම ප්‍රකාශය සිදු කර ඇත්තේ අවුරුදු ගණනාවක් සුවය හා මිදීම උදෙසා සේවය කළ ප්‍රසිද්ධ සේවකයෙකු විසිනි :

> *"මම, මාගේ ජීවිත කාලය තුළම වෙනත් මනුෂ්‍යයෙක් ගැළවීම ලබනු නොදුටුවත් සියලු ශුභාරංචිය දේශනා කරමි. මම තීරණය කර ඇත්තේ මා උගන්වන දේවධර්ම දෙවියන්වහන්සේගේ වෙනස් නොවන වචනය මත පදනම් කිරීමට මිස, අත්දැකීම් මත පදනම් කිරීමට නොවේය."*
>
> *- එන්. එෆ්. බොස්වර්ත්.*

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. “විවලය්‍යය” නිර්වචනය කරන්න.

3. සුවය සඳහා බලපෑම් කරන මිනිසුන්ගේ ඇතැම් සම්ප්‍රදායන් සාකච්ඡා කරන්න.

4. සුවය සඳහා බලපෑම් කරන ඇතැම් විචල්‍යයන් සාකච්ඡා කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. යේසුස්වහන්සේ විසින් ඉගැන්වූ ආදර්ශ යාච්ඤාව ඔබ විසින් කරන විට (එය ස්වාමීන්වහන්සේගේ යාච්ඤාව ලෙස ද හැඳින්වේ), ඒ තුළ සුවය උදෙසා කරනු ලබන ඉල්ලීම් ද අන්තර්ගත වේ :

**"ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි" :** ඔබ අපගේ පියාණන්ගෙන් ඉල්ලන විට, ඔබ ඉල්ලනුයේ උන්වහන්සේගේ නාමයෙන් අදහස් වන දේ මත පදනම්ව වන අතර, ඊට "ස්වාමීන්වහන්සේ නුඹ සුවකරන තැනන්වහන්සේය" යන්න ද ඇතුළත් වේ.

**"ඔබගේ රාජ්‍ය පැමිණේවා, ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද ඔබගේ කැමැත්ත ඉටුවේවා" :**
ස්වර්ගයෙහි කිසිඳු රෝගයක් හෝ පාපයක් නැත. ස්වර්ගයෙහි මෙන් අප විසින් පොළොවෙහිද උන්වහන්සේගේ කැමැත්ත ඉටු කළ යුතු බැවින්, අප පාපයට එරෙහිව මෙන්ම රෝගයට ද එරෙහිව යටත් කළ යුතුය.

**"අපගේ දවස්පතා භෝජනය අද අපට දුන මැනව" :** රොටී අයිති දරුවන්ට (ඇදහිලිවන්තයන්ට.) බව යේසුස්වහන්සේ පැවසූ සේක. ශාරීරික සුවයද දරුවන්ගේ ආහාර වලින් කොටසකි. (මතෙව් 15:21-28).

**"අප අන්‍යයන්ට කමා කරන්නාක්මෙන් අපේ වැරැද්දට අපට කමා කළ මැනව" :** මෙම කොටස ආත්මික සුවය පිළිබඳව කතා කරයි.

**"අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරාගෙන් අප ගළවා ගත මැනව" :** ඔබ පරීක්ෂාව විරුද්ධව සිටින්නාක් මෙන් රෝගයට ද විරුද්ධ විය යුතුය.

2. දෙවියන්වහන්සේ වේදනාමේ මුලාරම්භය නොවන නමුත් තම අරමුණ ඉටුකර ගැනිම සඳහා උන්වහන්සේට එය යොදාගත හැකි බව ඔබ ඉගෙන ගත්තේය. ඒ බව පෙන්නුම් කරන පහත සඳහන් උදාහරණ අධ්‍යයනය කරන්න :

| | |
|---|---|
| - ඊජිප්තුවට පැමිණි වසංගත : | නික්මයාම 7-11 |
| - මිරියම්ගේ කුෂ්ඨ රෝගය : | ගණන් කතාව 12:10 |
| - යෙහෝරම් රජුගේ රෝගය : | 2 ලේකම් 21:18 |
| - ගෙහාසි ගේ කුෂ්ඨ රෝගය : | 2 රාජාවලිය 5:27 |
| - දාවිත්ගේ දරුවාගේ මරණය : | 2 සාමුවෙල් 12:18 |
| - ඒලිගේ පුත්‍රයන්ගේ මරණ : | 1 සාමුවෙල් 2:34 |
| - යෝබ්ගේ වද විඳීම : | යෝබ් පොත |
| - යෝසෙප්ට මුහුණ දීමට සිදු වූ අවසානාවන්ත සිදුවීම් : | උත්පත්ති 45:5-7 |
| - යේසුස්වහන්සේගේ කුරුස පත්වීම : | මාර්ක් 14:35.36 සහ රෝම 5:6-12 |
| - පාවුල් සිරගත කිරීම : | පිලිප්පි 1:12,19 |
| - පාවුල්ගේ මාංශයේ කටුව : | 2 කොරින්ති 12:7 |

3. පූර්ණත්වය පිළිබඳ බයිබලයේ සඳහන් දේවල් ගැන තවත් ඉගෙන ගන්න.

- මිනිසුන්ට සුවය පමණක් අවශ්‍ය වුවත්, යේසුස්වහන්සේට සම්පූර්ණ මිනිසා සමඟ ගනුදෙනු කිරීමට අවශ්‍ය විය. "නුඹ සුවය ලබන්න කැමතිද?"යි (යොහන් 5:6) යේසුස්වහන්සේ බෙතෙස්දාවේ කොර මිනිසාගෙන් ඇසූ සේක.

- යේසුස්වහන්සේ පැමිණියේ සම්පූර්ණ නොවූ - බිඳුණු, රෝගීවූ, පීඩාවට පත් අය උදෙසා සේවය කිරීමටය. නිරෝගීන්ට වෙදෙකු අවශ්‍ය නැත : මතෙව් 9:12; මාර්ක් 2:17; ලූක් 5:31

- යේසුස්වහන්සේ පූර්ණත්වයේ උල්පත විය : ක්‍රියා 9:34; යොහන් 5:15

- යේසුස්වහන්සේ ස්පර්ශ කර සියලු දෙනා සම්පූර්ණ සුවය ලැබූහ : මතෙව් 9:21-22; 14:36; මාර්ක් 5:28-34.

- මරණාසන්නව සිටි සේවකයෙකු යේසුස්වහන්සේ සුවකළ සේක : ලූක් 7:10.

- උන්වහන්සේ කොරුන් සුව කළ සේක : යොහන් 5:9.

- දෙවියන්වහන්සේගේ බලය තුළින්, ගෝලයෝ කොරෙකු සුව කළහ : ක්‍රියා 9:34

- යේසුස්වහන්සේ කොරෙකු සුව කළ සේක : මතෙව් 5:31

- උන්වහන්සේ දෑත් සුව කළ සේක : මතෙව් 12:13; මාර්ක් 3:5; ලූක් 6:10

- මිනිසුන්ට පැවති ඕනෑම ආකාරයක රෝගයකින් උන්වහන්සේ ඔවුහු සුව කළ සේක : යොහන් 5:6

- ඔවුන්ව සම්පූර්ණයෙන්ම සුව කරනු ලැබීය : යොහන් 7:23

- මිනිසුන්ගේ ඇදහිල්ල ඔවුන් සුව කිරීමේදී ක්‍රියාකාරී කොටසක් ලෙස යේසුස්වහන්සේ සැළකූ සේක. නුඹේ ඇදහිල්ල නුඹ සුව කළේහිය" : මතෙව් 9:22; මාර්ක් 5:34; 10:52; ලූක් 8:48-50; 17:19.

# දහ අට වන පරිච්ඡේදය

## "ඔබ යන විට, සුව කරන්න"

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සුව කිරීමේ සේවය සඳහා මූලික සූදානම් වීම පිළිබඳ සාකච්ඡා කිරීමට
- සුවය උදෙසා සේවය කිරීමේ උපදෙස් සාරාංශගත කිරීමට
- සුවය ලැබූ අය ගොඩනංවන අයුරු සාකච්ඡා කිරීමට
- සුවය නොලැබූ අය ගොඩනංවන අයුරු සාකච්ඡා කිරීමට ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **නුඹලා යමින් - ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරපල්ලා. රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)**

## හැඳින්වීම

සුවය හා මුදවා ගැනීම දේව රාජ්‍යයේ ක්‍රියාකාරීත්වයේ කොටසක් බව ඔබ ඉගෙන ගෙන තිබේ. මෙම පාඩමේදී සුව කිරීමේ සේවය කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත. ඊළඟ පාඩමේදී මිදීමේ සේවය කරන ආකාරය ඔබ ඉගෙන ගනු ඇත.

## මූලික සූදානම් වීම්

ඔබ සුව කිරීමේ සේවය ආරම්භ කිරීමට පෙර මූලිකව කළ යුතු වැදගත් සූදානම් වීම් කිහිපයක් තිබේ. මේ තුළ, දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලය ඔබ සේවය කරන පුද්ගලයා වෙත ඔබ තුළින් ගලා යා හැකිවන මාර්ගයක් ලෙස ඔබව සූදානම් කර ගැනීමත් ඔබ සේවය කරන පුද්ගලයා සූදානම් කර ගැනීමත් ඇතුළත් වේ.

**ඔබව සූදානම් කර ගැනීම :**

ඇදහිල්ල පැමිණෙනුයේ සුවය පිළිබඳ දෙවියන්වහන්සේගේ වචනය ඇසීමෙනි. ඔබේ ඇදහිල්ල වර්ධනය කර ගැනීමට, බයිබලයේ සුවය පිළිබඳ ඇති සියලු දේ අධ්‍යයනය කරන්න. නව ආකල්පයකින් නව ගිවිසුම කියවන්න. යේසුස්වහන්සේ තමා අනුව පැමිණි අයට කිරීමට පැවසූ හැම දෙයක්ම ඔබත් කිරීමට පටන් ගන්න. උන්වහන්සේ විසින් කරනු ඇතයි පැවසූ හැම දෙයක්ම, උන්වහන්සේ කරන බවට බලාපොරොත්තුවෙන් සිටින්න.

උන්වහන්සේගේ බලය තුළින් ඔබට රෝගීන් සුව කළ හැකි බව උන්වහන්සේ පැවසුවේ නම්, ඔවුන් සුව වනු දැකීමට බලාපොරොත්තු වන්න. උන්වහන්සේ ඔබට යක්ෂයන් දුරු කරන ලෙස පැවසුවේ නම්, උන්වහන්සේගේ නාමයෙන් එසේ කරමින් ඔවුන් ඔබට අවනත වේ යැයි බලාපොරොත්තු වන්න. මිනිසුන්ගේ සියලු ඉගැන්වීම් හා ඔබට ලැබී ඇති පෞද්ගලික අත්දැකීම් නොසළකාහරින්න. නව ගිවිසුම තුළින් පවසන දේම ඉන් අදහස් කරන බව පිළිගන්න. එය සත්‍ය ලෙස පිළිගෙන ඒ අනුව ක්‍රියා කරන්න. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතියෙකි (2 කොරින්ති 5:20). තමා නියෝජනය කරන රට විසින් දෙන ලද වචන වෙනස් කරනු ඇතැයි තනාපතියෙකු කිසිදා සැක ඇති කර නොගනී.

ඔබ සේවය කිරීමට පෙර නිරාහාරව යාච්ඤා කරන්න. ක්‍රියා 28:8 හි සඳහන් පාවුල්ගේ උදාහරණය බලන්න. සුව කිරීම සඳහා බලය හා ආධිපත්‍ය පැමිණෙන්නේ දෙවියන්වහන්සේගෙන් වන බැවින්, උන්වහන්සේට සමීපව සිටිය යුතුය ! ඇතැම් යක්ෂ පීඩාවන් සුව කළ හැක්කේ නිරාහාර යාච්ඤාවෙන්

පමණි. අන් අයගේ අවශ්‍යතා වලට සේවය කිරීම අරමුණු කරගත් උපවාසයට දෙවියන්වහන්සේ ගරු කරන බව යෙසායා 58 උගන්වයි.

ඔබ ගැළවීම ලැබූ විගස කිතුනු ජීවිතය ගැන ඔබ විසින් දැනගත යුතු බොහෝ දේවල් ඇති නමුත් ඔබ සාක්ෂි දැරීමට පටන්ගත් ලෙසම, දිව්‍යමය සුවය ගැන ඔබට හැම දෙයක්ම නොවැටහුණත් රෝගීන්ට සේවය කිරීමට පටන් ගන්න. සුව කිරීම ගැන ඔබ දන්නා දේවල් මත පදනම්ව සේවය කිරීමට පටන් ගන්න. ඔබට දී තිබෙන ආලෝකය තුළ ඔබ ගමන් කරන විට, ඔබට තවත් ආලෝකය ලැබෙනු ඇත. බලාපොරොත්තුවක් ඇතිකර ගත නොහැකි අවස්ථා නොමැතිය යන ආකල්පය සිතට ගන්න. සිටිනුයේ තමන් පිළිබඳ බලාපොරොත්තු රහිත මිනිසුන් පමණි.

### අන් අයගේ මූලික සූදානම :

නිසි උපදෙස් ලබා දීමකින් තොරව රෝගීන්ට යාච්ඤා කරන ලෙස ඔබ උපදෙස් දුන්නොත් එය, යේසුස්වහන්සේ කවුදැයි නොදැන, තම පාපය හඳුනා නොගෙන, හා ගැළවීම උදෙසා ඔවුන්ට ඇති අවශ්‍යතාවය තේරුම් නොගෙන යේසුස්වහන්සේ පිළිගන්නා ලෙස ගැළවීම නොලත් පුද්ගලයෙකු දිරිමත් කිරීමක් වැනිය.

ඇතැම් අවස්ථාවලදී, එවැනි උපදෙස් ලබා දීමකින් තොරව දෙවියන්වහන්සේ සුව කරන සේක. නමුත් මතක තබා ගන්න. සුව කිරීමේ සේවයේදී, දේව වචනයේ සඳහන් කර ඇති සෑම උපායක්ම ඔබ නිසි පරිදි යොදාගත යුතුය. ඇදහිල්ල යනු දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලය ගලා එන එක් මාර්ගයක් වන අතර එය පැමිණෙනුයේ, දෙවියන්වහන්සේගේ වචනය ඇසීමෙනි. එම නිසා උපදෙස් ලබා දීම වැදගත් වේ. යේසුස්වහන්සේ සුවකිරීම තුළින් දේශනා කිරීම හා ඉගැන්වීම සම්බන්ධ කළ අතර තම අනුගාමිකයන්ට ද එසේ කිරීමට උපදෙස් දුන් සේක.

ඇදහිල්ල පැමිණෙනුයේ සුවය පිළිබඳ දෙවියන්වහන්සේගේ වචනය ඇසීමෙනි. සම්ප්‍රදායන් හෝ අත්දැකීම මත පදනම්ව නොකොට, දෙවියන්වහන්සේ පවසන දේ මත පදනම්ව එය දේශනා කරන්න. සාක්ෂි දැරීමෙන් පමණක් ඇදහිල්ල ගොඩනැඟීම සිදු නොවේ. සාක්ෂි මඟින් දේව වචනය ස්ථිර කරන අතර ඇදහිල්ල ධෛර්යවත් කරයි. නමුත්, සහතික වශයෙන්ම ඇදහිල්ල පැමිණෙනුයේ දේව වචනය ඇසීමෙන් බව බයිබලය පවසයි. (ස්වාභාවිකව, බිහිරි මිනිසෙකුට දේශනාවක් ඇසිය නොහැකි නමුත් බිහිරි ආත්මයකට එය ඇසිය හැකිය). සුවය ලබා දෙන තැනැත්තා, ලෙඩරෝග වල ආරම්භය හා ඒවාට හේතු, සුවය පිළිබඳ පොරොන්දු, හා යහපත් සෞඛ්‍ය තත්වයක් ලබා ගැනීම හා පවත්වාගෙන යාම සඳහා දෙවියන්වහන්සේගේ උපදෙස් පිළිබඳව බයිබලයේ ඇති දේවල් මිනිසුන් දැනගත යුතුය.

ඇදහිලිවන්තයන් උදෙසා වූ සුවකිරීමේ රැස්වීමක දී, රෝගීන් නිරාහාරව සිටීම හා යාච්ඤා කිරීම උපකාරී විය හැකිය. සුවය ලබා ගැනීම සඳහා මෙය අවශ්‍ය නොවන නමුත් බයිබලයේ සඳහන් අපට යොදා ගත හැකි සෑම උපක්‍රමයක්ම අප යොදාගත යුතු බව මතක තබා ගන්න. දෙවියන්වහන්සේ අපගේ ඉල්ලීම් අවධාරණය කරන අතර සෞඛ්‍ය සම්බන්ධයෙන් නිරාහාරව සිටීමේ හා යාච්ඤා කිරීමේ වැදගත්කම යෙසායා 58:6-8 හි අවධාරණය කරයි.

## සේවය කරන කාලය

සුවය උදෙසා සේවය කරන කාලය පිළිබඳ උපදෙස් කිහිපයක් පහත දැක්වේ. මේවා පොදු උපදෙස් පමණක් වන බව මතක තබා ගන්න. ඔබ හැම විටම ශුද්ධාත්මයාණන්ගේ වෙනස් මඟපෙන්වීම් වලට විවෘත විය යුතුය. මෙම උපදෙස් වලින් සමහරක් සමූහයක් උදෙසා යොදා ගත හැකි අතර ඇතැම් ඒවා තනි පුද්ගලයෙක් උදෙසා කරන සේවයන් හිදී පමණක් අදාළ කර ගත හැකිය.

### ඇදහිල්ලේ වටපිටාවක් ගොඩනඟා ගන්න :

ඇදහිල්ලේ වටපිටාවක් ගොඩනඟා ගන්න. සුවය පිළිබඳ වචනය බෙදා ගැනීමේදී ඔබ මෙය සිදු කිරීම ආරම්භ කර ඇති නමුත්, ඇදහිල්ලේ වටපිටාවක් ගොඩනැඟීමට ඔබට අතිරේක පියවරයන් ද ගැනීමට සිදුවනු ඇත. ඇදහිල්ල හා විශ්වාසය ඇති පුද්ගලයන්ගෙන් රෝගියා වට කරන්න. සුවය ලබා ඇති අයගේ සාක්ෂි ඇසීමට ඔවුන්ට ඉඩ සළසාදෙන්න. අවිශ්වාසය නාසරෙත් නුවරදී යේසුස්වහන්සේගේ සේවයට පවා බාධා කළ බව මතක තබා ගන්න.

ඇදහිල්ලේ වටපිටාවක් යනු නමස්කාරයේ හා ප්‍රශංසාවේ වටපිටාවකි. අප දෙවියන්වහන්සේගේ අභිමුඛයට (එහි සුවය ඇත) ළංවන්නේ නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙනි. දෙවියන්වහන්සේ උන්වහන්සේගේ ජනතාවගේ ප්‍රශංසා මධ්‍යයේ වැඩසිටින බැවින්, සුවය උදෙසා වූ යාච්ඤාවකින් තොරව වුවද, නමස්කාරය හා ප්‍රශංසාව තුළින් සුවය ලැබිය හැකිය. අප ප්‍රශංසා කරන විට, සුව කිරීම උදෙසා උන්වහන්සේ වැඩ සිටී. ගැළවීම සම්බන්ධයෙන් ඔබ සිදු කරන ආකාරයටම, මිනිසුන්ව සුවය සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීම වෙත ගෙන එන්න. “නුඹ සුවය ලබන්න කැමැත්තෙහිද?” (යොහන් 5:6) යනුවෙන් යේසුස්වහන්සේ කොර මිනිසාගෙන් ඇසූ ආකාරය මතක තබා ගන්න.

සුවය උදෙසා තමාගේ ආශාව කුමක්දැයි තීරණය කරන ලෙස පුද්ගලයාට පවසන්න. සමූහයක් සිටින තැනකදී, ඔවුන්ට නැගී සිටින ලෙස, ඉදිරියට පැමිණෙන ලෙස, අත ඔසවන ලෙස, හෝ තම ශරීරයේ අදාළ ස්ථානය වෙත අත තබන ලෙස ඔවුන්ට පවසන්න. මෙය සුවය ලැබීමට ඔවුන් තුළ ඇති ආශාව පෙන්නුම් කිරීමට උපකාරී වේ. එය සුවය අවශ්‍ය අය හඳුනා ගැනීමට ඔබට උපකාරී වෙනවා සේම, ඔවුන් උදෙසා එය ඇදහිල්ලේ ක්‍රියාවකි.

## වටහාගැනීමේ හැකියාව උදෙසා යාච්ඤා කරන්න :

සුවය උදෙසා සේවය කිරීමට පෙර ප්‍රඥාව හා වටහා ගැනීම උදෙසා යාච්ඤා කරන්න. උන්වහන්සේ ඔබට දෙන ඕනෑම දිව්‍යමය ප්‍රඥාවක් තේරුම් ගන්න. දෙවියන්වහන්සේ පහත දේවල් ඔබට එළිදරව් කරනු ඇත :

**දැනගැන්මේ වචනයක් :** දැනගැන්මේ වචනයක් තුළින් යම් පුද්ගලයෙකු හෝ තත්වයක් පිළිබඳ විශේෂ කරුණු ඔබට ඉදිරිපත් කරන අතර එවිට ඔබට යාච්ඤා කළ යුතු ආකාරය දැනගත හැකි වනු ඇත. දැනගැන්මේ වචනයක් තුළ ඔබේ ආත්මයට, සිතුවිලි වලට, වචන වලට, දැනෙන ගැඹුරු දැනීමක් හෝ හැඟීමක් ඇතුළත් විය හැකිය. දැනගැන්මේ වචනයකින් රෝගය කුමක්ද යන්න හා එම පුද්ගලයාට එම තත්වය ඇති වී ඇත්තේ ඇයි ද යන්න එළිදරව් කළ හැකිය.

**බයිබල් පදයක් :** තත්වය, රෝගය, පුද්ගලයා හෝ කණ්ඩායම පිළිබඳ “රීමා” (විශේෂිත) වචනයක් දෙවියන්වහන්සේ ඔබට ලබා දිය හැකිය.

**දර්ශනයක් :** මේවා ඔබ සේවය කරන පුද්ගලයාට අදාළව ඔබේ මනසේ ඇතිවන පිංතූර වේ.

**ඇදහිල්ලේ වචන :** මේවා එම පුද්ගලයාටම විශේෂිත වූ ධෛර්යවත් කිරීමේ හා ඇදහිල්ලේ වචන වේ.

**විශේෂ ආලේපයක් :** දැඩි උණුසුමක් හෝ අධිස්වාභාවික විශ්වාසයක් ලෙස හැඟිය හැකි බලයේ දැනීමකි. ඇතැම් අවස්ථා වලදී විශේෂ ආලේපයක් ලැබෙන අතර, එසේ සිදු වුවහොත් ඒ සමඟ ක්‍රියා කරන්න. නමුත් රෝගියෙකුට යාච්ඤා කිරීමට විශේෂ ආලේපයක් ලැබෙන තුරු බලා නොසිටින්න. ඔබට එය හැඟුණත් නොහැඟුණාත් ඔබ යේසුස්වහන්සේගේ උපදෙස් අනුව ගමන් කළ යුතුය.

**විශේෂ ඇදහිල්ලේ ක්‍රියාවක් :** ඇතැම් අවස්ථාවලදී සුවය ලැබීම සඳහා යම් විශේෂ ඇදහිල්ලේ ක්‍රියාවක් කරන ලෙස යම් පුද්ගලයෙකුට පවසන්න යැයි දෙවියන්වහන්සේ ඔබට පැවසිය හැකිය.

## සම්මුඛ සාකච්ඡාවක් පවත්වන්න : (අතිරේක)

ඔබ පුද්ගලයෙකු සමඟ තනිව කටයුතු කරන්නේ නම්, ඔබට කෙටි සාකච්ඡාවක් පැවැත්වීමට අවශ්‍ය වනු ඇත. දෙවියන්වහන්සේ ඔබට රෝගය පිළිබඳව විශේෂ ප්‍රඥාවේ වචනයක් දුන්න හොත් ඔබට සාකච්ඡා කිරීම අවශ්‍ය නොවේ. නමුත් දෙවියන්වහන්සේ අධිස්වාභාවික ලෙස ඔබට රෝගය එළිදරව් නොකරන්නේ නම්, සාකච්ඡාව පාවිච්චි කිරීමට පසුබට නොවන්න.

සුවය උදෙසා සේවය කිරීමට සම්මුඛ සාකච්ඡාවක් අවශ්‍ය නොවන නමුත්, ඔබට විශේෂිතව යාච්ඤා කළ හැකි වන පරිදි තොරතුරු රැස්කර ගැනීමට එය ඔබට උපකාරී වේ. ඔබ යාච්ඤා කිරීමට පෙර යම්

පුද්ගලයෙකුට තවදුරටත් උපදෙස් අවශ්‍ය වේද යන්න දැනගැනීමට ද එය ඔබට උපකාරී වේ. යේසුස්වහන්සේ සම්මුඛ සාකච්ඡාව පාවිච්චි කළ සේක. උන්වහන්සේ මිනිසුන්ට අවශ්‍ය දේ කුමක් දැයි ඇසූ සේක. ඔවුන්ගේ ඇදහිල්ල සළකා බැලූ සේක, එසේම ඔවුන්ට සේවය කිරීමට පෙර සෘණාත්මක බලවේග සමඟ හා අවිශ්වාසය සමඟ ගනුදෙනු කළ සේක.

“ඔබගේ ප්‍රශ්නය කුමක්ද?”යි එම පුද්ගලයාගෙන් අසන්න. සුවය උදෙසා පැමිණි බොහෝ දෙනෙකුගෙන් යේසුස්වහන්සේ එම ප්‍රශ්නයම ඇසූ සේක. රෝගියා යාච්ඤා ඉල්ලීම ඔහුගේම වචනයෙන් පැවසීම වැදගත් වේ. සුවය උදෙසා සේවය කිරීමට රෝගියා විසින් වැඩිමහල්ලන් කැඳවිය යුතුය. බයිබලය යම් මඟපෙන්වීමක් ලබා දෙන විට, එය යම් හේතුවක් උදෙසා වේ. ඉල්ලීම යනු සුව කිරීමේ ක්‍රියාවලිය තුළ ඇති ඇදහිල්ලේ ක්‍රියාවකි (යාකොබ් 5:14-15).

(මීට වෙනස් තත්වයක් වන්නේ, පුද්ගලයෙකුට ඉල්ලීමක් කළ නොහැකි අවස්ථාවකි. උදාහරණයක් ලෙස, යේසුස්වහන්සේ නැඟිටෙවූ මැරුණු දරුවා දැක්විය හැකිය. නමුත් ඒ අවස්ථාවේදී පවා ඇගේ දෙමව්පියන් ඇයට සුවය ලබා දෙන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලුවෝය.)

විශේෂ ප්‍රකාශනයක් කරන ලෙස ඉල්ලන්න. ඉල්ලීම සාමාන්‍යයෙන් පොදු එකක් නම්, යාච්ඤා කළ යුත්තේ කුමක් උදෙසාද යන්න ඔබ නොදන්නා අතර ඉන් පිළිතුර ලැබූ පුද්ගලයා තමාට සුවය ලැබුණු බවද නොදකිනු ඇත. ඔබට අවශ්‍ය කෙටි තොරතුරු පමණි. උදාහරණයක් ලෙස “මගේ උදරයේ පිළිකාවක් තිබේ”. ඔබට සම්පූර්ණ වෛද්‍ය ඉතිහාසයක් අවශ්‍ය නොවේ. ඔබට කියන්නාවූ තොරතුරු විශ්ලේෂණය කිරීමට උත්සාහ නොකරන්න. ඔබගේ කාර්යය යාච්ඤා කිරීම මිස, උපදෙස් දීම නොවේ. ඇතැම් විශේෂ සිද්ධි සඳහා පුද්ගලිකව පුහුණු උපදේශකවරයෙකු සමඟ වැඩි කාලයක් ගත කිරීම අවශ්‍ය වනු ඇත. මේ සඳහා උපදේශකවරු තබාගන්න.

යාච්ඤා කිරීමට යන පුද්ගලයාගෙන්, “යේසුස්වහන්සේට සුව කළ හැකි බව ඔබ විශ්වාස කරනවාද?” යනුවෙන් අසන්න. ඔවුන් යහපත් පිළිතුරක් ලබා දුන්නහොත්, “යේසුස්වහන්සේ එය මේ මොහොතේ කරනු ඇති බව ඔබ විශ්වාස කරනවාද?” යනුවෙන් අසන්න. මෙම ප්‍රශ්න දෙකෙන් ඕනෑම එකකට “නැත” යන පිළිතුර ලැබුනහොත් දේව වචනයෙන් තවදුරටත් උපදෙස් ලබා දීම අවශ්‍ය වේ.

ඔබ විශාල පිරිසකට සේවය කරන විට, එක් එක් පුද්ගලයාට කතා කිරීම ඔබට හැකි නොවනු ඇත. ඔබ ඉදිරියේ සිටින ජනතාව අතර ඇති විශේෂ ලෙඩ රෝග දෙවියන්වහන්සේ ඔබට එළිදරව් කරනු ඇති අතර නොඑසේනම් බිහිරි බව, අන්ධ බව වැනි විශේෂ ලෙඩ රෝග උදෙසා සාමූහික යාච්ඤාවක් කරන ලෙස ඔබව මෙහෙයවිය හැකිය. ඇතැම් අවස්ථා වලදී සුවය උදෙසා පොදු යාච්ඤාවක් කිරීමට හෝ රෝගීව සිටින අය උදෙසා පෞද්ගලිකව යාච්ඤා කරන මෙන් ඔබ ඉදිරියේ සිටින ඇදහිලිවන්තයන්ගෙන් ඉල්ලීමට ඔබට හැඟෙනු ඇත.

සෑම සේවයක්ම ඔබ විසින් කරනු වෙනුවට සේවය කරන ආකාරය සෙසු ඇදහිලිවන්තයන්ට ද ඉගැන්වීම ඉතා යෝග්‍යය. යේසුස්වහන්සේගේ ආඥාව වූයේ අදහන අය තුළින් මෙම කරුණු පිළිඹිබු වීම මිස “ඔබ” තුළින් ඒවා පිළිඹිබු වීම නොවේය. සේවයේ කාර්යයන් සම්පූර්ණ ශරීරය විසින්ම මිස, ඇදහිලිවන්තයන් දෙතුන් දෙනෙකු විසින් තනිව කළ යුත්තක් නොවිය.

## ගැටලුව හඳුනාගන්න :

සාකච්ඡාවෙන් ලබා ගත් තොරතුරු හා දෙවියන්වහන්සේ ඔබට ලබා දෙන ප්‍රඥාව පාවිච්චි කරමින් ගැටලුව ඇත්තේ පහත කුමන තත්වයන හි ද යන්න තීරණය කරන්න :

**ආත්මික තත්වයන් :** මේවා පාපයට සම්බන්ධ තත්වයන් වන අතර ඒ සඳහා ආත්මික සුවය ලබා දීමේ සේවයක් අවශ්‍ය වේ. (ගැළවීම, පසුතැවිලිවීම හා පව් සමාව)

පාපය හා රෝගය අතර සම්බන්ධතාවයක් පවතින්නේ නම් (එවැන්නක් ඇති බව අප දැක තිබේ). එසේනම් සමාව දීම හා සුවය අතර ද සම්බන්ධතාවයක් පවතී. බොහෝ අය පව් සමාව ඉල්ලූ විට ඔවුන්ට ශාරීරික සුවය ලැබේ.

රෝගය පාපය නිසා හටගත් බව තීරණය කිරීමට ඉතා ඉක්මන් නොවන්න. සෑම පාපයක්ම පෞද්ගලික පාපයක ප්‍රතිඵලයක් නොවේ යන්න ඔබ ඉගෙන ගත් බව මතක තබා ගන්න. වරද පෙන්වා දී නිවැරදි කිරීම ශුද්ධාත්මයාණන්ගේ කාර්යයන්ගෙන් එකක් වන බැවින් පාපයක් වේ නම්, එය පෙන්වා දීම උන්වහන්සේගේ වගකීම වේ.

**ශාරීරික තත්වයක් :** මෙය ශරීරයට ඇතිවන ලෙඩක්, රෝගයක් හෝ ආබාධයකි. ශාරීරික සුවය උදෙසා යාච්ඤා කරන්න.

**හැඟීම් පිළිබඳ තත්වයක් :** මේ තුළ කණගාටුව, බිය, තරහව, තිත්තකම, අමනාපය, වරදකාරී හැඟීම, සැකය, අසමර්ථ වීම, ඊර්ෂ්‍යයාව, ආත්මාර්ථකාමීත්වය, අවුල් සහගත බව, නිෂ්ඵල හැඟීම, සමාව නොදීමේ ස්වභාවය හා අතීත සිදුවීම් වලින් හැඟීම් වලට සිදු වූ බලපෑම් ආදිය ඇතුළත් විය හැකිය. මෙම පුද්ගලයන්ට හැඟීම් පිළිබඳ තත්වයන් යටතේ සුවය අවශ්‍ය වේ. මෙය "අභ්‍යන්තර සුවය ලැබීම" ලෙස සාමාන්‍යයෙන් හඳුන්වන නමුත්, ඇතැම් පුද්ගලයන් එය වැරදි අර්ථයෙන් පාවිච්චි කරයි. සෑම අතීත කරුණක් හා අත්දැකීමක් වෙත නැවත යෑම අවශ්‍ය නොවේ. එවැනි කම්පනයකින් මිදීමට සති, මාස හෝ අවුරුදු ගණන් ගත කිරීම අවශ්‍ය නැත. ඔබ එසේ කරන්නේ නම් ඔබ උත්සාහ කරනුයේ පැරණි මිනිසා සුව කිරීමට උත්සාහයක් කිරීමක් මිස ක්‍රිස්තුස්වහන්සේ තුළ නව මැවිල්ලක් වීමට ඔහුට උපකාර කිරීමක් නොවේ.

හැඟීම් පිළිබඳව ඇතිවන ගැටලු බොහෝ දුරට කෙනෙකුගේ ජීවිතයේ සාමාජීය තත්වයන්ට සම්බන්ධ වේ. ඒවා බොහෝ විට පවුලේ හා සමාජයේ අය සමඟ ඇති සම්බන්ධතාවල ප්‍රතිඵලයක් ලෙස වේ. ඒවාගේ බලපෑමක් ලෙස මෙම තත්වයන් ඇති වේ. සුවය පැමිණෙනුයේ ගැටලුව හඳුනාගැනීම, සමාව ඉල්ලීම, හා එයට සම්බන්ධ අන් අයට සමාව දීම තුළිනි.

හැඟීම් පිළිබඳ තත්වයන් සුව වීමට ඇති විශාලතම බාධාව සමාව නොදීමයි, එම නිසා හැඟීම් පිළිබඳ තත්වයන් සුව කිරීම තුළ සාමාජීය සම්බන්ධතා යහපත් අතට හරවා ගැනීම ද ඇතුළත් වේ. අපව කැඳවා ඇත්තේ නැවත සමඟි කිරීමේ සේවය උදෙසාය (2 කොරින්ති 5:18-21). මිනිසුන් දෙවියන්වහන්සේ සමඟ මෙන්ම මිනිසුන් සමඟ ද නැවත සමඟි කරනු ලැබිය යුතු අතර, හැඟීම් පිළිබඳ, මානසික හෝ අභ්‍යන්තර සුවය පැමිණෙන්නේ මේ තුළින් වේ. මේ සියල්ල එකම ආකාරයේ සුව කිරීමකට සමාන විවිධ නම් වේ.

ඔබට යම් පුද්ගලයෙකුට සමාවදීම ගැන ඉගැන්වීමට සිදුවිය හැකිය. සමාව දීම යනු පහත තත්වයන් ගෙන් එකක් නොවේ :

- කෙනෙකු විසින් ඔබට කර ඇති වැරදි දෙයක් සාධාරණීකරණය කිරීම. (උදාහරණයක් ලෙස "ඔවුන් විශාල පීඩනයක සිටියා" යැයි පැවසීම.)

- ඔබගේ හිත් රිදීම සිදු නොවුනා සේ සැළකීම.

- ඔබට සිදු කර ඇති දේ ඉවසීමෙන් දරා සිටීම.

- ඔබට සිදු වූ වේදනාව සුව කිරීමට කාලයට ඉඩදීම (එසේ සිදු නොවේ)

සැබෑ සමාව දීම පැමිණෙනුයේ පහත දේවල් තුළිනි :

(1) ඔබට සිදු වී ඇති වැරැද්ද, පව්කාර ලෝකයක ජීවත් වන පව්කාර මිනිසෙකු නිසා සිදුවූවක් බව හඳුනා ගැනීම. මනසින් නැවත එම සිදුවීම තුළ ජීවත් වීම අවශ්‍ය නොවන අතර, එය නොසළකා හැරීම ද ඔබට කළ නොහැකිය. සිදුවූයේ කුමක් ද යන්න පිළිගෙන ඉන් ඔබට වූ බලපෑම තේරුම් ගන්න.

(2) වේදනාව දෙවියන්වහන්සේට පවසා ඔබගේ කරදරකාරී හැඟීම් වලින් ඔබව සුව කරන ලෙස උන්වහන්සේට පවසන්න. එම සිදුවීමට සම්බන්ධ කරුණු ඔබට කිසිදාක අමතක නොවනු ඇති නමුත් ඔබට අවශ්‍ය වන්නේ ඊට සම්බන්ධ වැරදි හැඟීම් වලට සුවය වේ.

(3) ඊට සම්බන්ධ අයට සමාව දීමට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේ ඔබට සමාව දුන් ලෙසම ඔවුන්ට සමාව දෙන්න. දෙවියන්වහන්සේ ඔබට සමාව දෙන්නේ ඔබ අන් අයට සමාව දෙන ප්‍රමාණයට බව තේරුම් ගන්න : "අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන ලෙස අපගේ වරද අපට කමා කළ මැනව". අදාළ පුද්ගලයා තමාටම සමාව දීම අවශ්‍ය විය හැකි අතර (තමා විසින් කළ වැරදි පිළිබඳ ඇති වරදකාරී හැඟීම නිසා) අනිවාර්යයෙන්ම හැඟීම් පිළිබඳ තත්වය සුව අතට හැරීමට යාච්ඤා කළ යුතුය. ඔබ ඔබට සමාව දෙන ආකාරය පහත දැක්වේ :

- වරදකාරී හැඟීම හා පාපී හැඟීම් ඇති කරන පාපය හඳුනාගන්න. එය දෙවියන්වහන්සේට පවසා පසුතැවිලි වන්න. ඔබේ පාපයට සමාව දී ඔබගේ හැඟීම් සුව කරන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලන්න.

- දෙවියන්වහන්සේ සමාව දුන් විට, උන්වහන්සේ එය අමතක කර දමන බව දැනගන්න. (නැගෙනහිර බටහිරින් දුරව තිබෙන්නාක් මෙන් උන්වහන්සේ අපගේ පාපය පහකර දමන සේක.)

- 1 යොහන් 1:8-9 හා රෝම 8:1 ප්‍රකාශ කරන්න.

- ඔබගේම කැමැත්ත අනුව කරන ක්‍රියාවකින්, ඔබවම වරදට පත්කර ගැනීමෙන් නිදහස් වන්න. නිෂ්ඵල සිතුවිලි සිතින් ඉවත්කර දමා අතීතයේ සිදු වූ දේවල් අමතක කර දැමීමෙන් අනාගතයේ ඇතිවිය හැකි සිතුවිලි රටාවන් පාලනය කරන්න.

**මානසික තත්වයන් :** මේවා සෘණාත්මක සිතුවිලි, සාතන් විසින් මනසට කරනු ලබන පහරදීම්, මානසික ආබාධ ආදිය නිසා ඇති වන තත්වයන් වේ. සුවය උදෙසා යාච්ඤා කරන්න.

**යක්ෂ ආත්ම සම්බන්ධ තත්වයන් :** මේවා යක්ෂ ආත්ම ආවේශ වීම වැනි සෘජු යක්ෂයාගේ ක්‍රියාකාරකම් නිසා ඇතිවන තත්වයන් වේ. යක්ෂ ආත්ම දුරු කිරීමේ සේවය පිළිබඳ ඊළඟ පාඩමේදී ඔබ මේ පිළිබඳව ඉගෙන ගනු ඇත.

එක් තත්වයක් තුළ ඇති වන ගැටලුවක් සම්පූර්ණ මනුෂ්‍යයාට බලපාන බව සැම විටම මතක තබා ගන්න. ඔබ සේවය කරන විට, රෝගය පිළිබඳව පමණක් නොව, යේසුස්වහන්සේ කළාක් මෙන් සම්පූර්ණ මනුෂ්‍යයා පිළිබඳව සැළකිලිමත් වන්න. මිනිසා යනු ශරීරය, ප්‍රාණය හා ආත්මයයි. සම්පූර්ණත්වය ඇති වන්නේ මේ සියල්ලම සමඟ ගනුදෙනු කිරීමෙනි.

## සුවය උදෙසා යාච්ඤා කරන්න :

තත්වය තීරණය කිරීමෙන් අනතුරුව ඔබ සාමාන්‍යයෙන් සුවය උදෙසා යාච්ඤා කරනු ඇත. නමුත් ඇතැම් අවස්ථාවලදී යාච්ඤා නොකිරීමට හෝ ප්‍රමාද වී යාච්ඤා කිරීමට දෙවියන්වහන්සේ ඔබව පොළොඹවයි නම් පුදුමයට පත් නොවන්න. උදාහරණයක් ලෙස, සාකච්ඡා කරන අතරතුරදී අදාළ පුද්ගලයාට ආබාධිතාවය නිසා ලැබෙන මුදල් හා පහසුකම් නොලැබේ යන හේතුවෙන් සුවය අවශ්‍ය නොවන බව ඔබට වැටහෙනු ඇත (මෙය එක්තරා සුව කිරීමේ රැස්වීමකදී සැබවින්ම සිදු විය !).

අදාළ පුද්ගලයාට පාපය සම්බන්ධ ගැටලුව හා තවදුරටත් උපදෙස් ලබා දෙන තුරු ශාරීරික සුවය උදෙසා යාච්ඤා කිරීම ප්‍රමාද කිරීමට දෙවියන්වහන්සේ ඔබට මඟපෙන්විය හැකිය. ඔබ යාච්ඤා කරන විට, විශේෂිත ප්‍රශ්නයට අවධානය යොමු කරමින් ඇදහිල්ලේ යාච්ඤාවක් කරන්න. ඔබේ යාච්ඤාවේ ප්‍රමාණය හා ශබ්දය නිසා සුවය ලබා ගැනීමට පොළඹවා ගත හැකි දෙවි කෙනෙක් ඔබට නොමැති බව මතක තබා ගන්න. ගැළවීම දැනටමත් ලබා ගත හැක්කේ යම් සේද සුවය ද එසේමය. ගැළවීම රඳා පවත්නේ ඇදහිල්ල මත සේම සුවය ද එසේමය. දෙවියන්වහන්සේට ගළවා ගැනීමට අවශ්‍ය සේම සුව කිරීමට ද අවශ්‍යය.

ඇතැම් අවස්ථාවලදී සුව කිරීම් උදෙසා දෙවියන්වහන්සේගේ බලය විශේෂ ආකාරයින් පැවතුනද (ලූක් 5:17), ශුභාරංචිය ව්‍යාප්ත කිරීමට ඔබට අණ කළ ලෙසම යේසුස්වහන්සේ සුව කිරීම සඳහා ද ඔබට අණ කර ඇති බැවින් විශේෂ ආලේපයකින් තොරව වුවද ඔබට සුවය උදෙසා යාච්ඤා කළ හැකිය.

පිළිතුරු ලබන යාච්ඤාවන්ගේ රහස නම් දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව යාච්ඤා කිරීමයි. "එය දෙවියන්වහන්සේගේ කැමැත්ත නම්" යනුවෙන් යාච්ඤා නොකරන්න. යේසුස්වහන්සේගේ "ඔබවහන්සේගේ කැමැත්ත නම් පමණක් සුව කරන්න" යනුවෙන් යාච්ඤා කළේ නැත. දෙවියන්වහන්සේගේ "කැමැත්ත ස්වර්ගයෙහි මෙන් කරනු ලැබේවා" යනුවෙන් හෝ "ඔබගේ කැමැත්ත අනුව" යනුවෙන් ධනාත්මක යාච්ඤාවක් කරන්න. එමගින් දෙවියන්වහන්සේගේ සර්වබලධාරී පාලනය ඒත්තු ගනු ලැබේ.

හැකියාවක් ඇති විට, අනෙක් ඇදහිලිවන්තයන් ද ඔබ සමඟ සේවය කිරීමට පාවිච්චි කරන්න. බොහෝ දෙනෙකු යාච්ඤා කරන විට ආත්මික බලයේ වැඩි වීමක් සිදුවේ (මතෙව් 18:19). ශරීරය එක්ව සේවය කිරීමේදී සාර්ථක සුව කිරීමේ සේවයක් ඇති අයත් සුවය ලබා ගන්නා අයත් මිනිසාට මහිමය දීම

අධෛර්යයට පත් කරයි. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ සෑම සාමාජිකයෙකුටම අවම වශයෙන් එක් ආත්මික දීමනාවක් හෝ තිබේ. සේවය වඩා බලවත් වනුයේ ...

> **දෙවියන්වහන්සේගේ අනේකාකාර කරුණාවේ යහපත් ගබඩාකාරයන් මෙන් එකිනෙකාට ලැබුණු දීමනාවේ හැටියට එයින් එකිනෙකාට සේවයකරපල්ලා. (1 පේත්‍රුස් 4:10)**

ඔබගේ සුවය උදෙසා වූ යාච්ඤාව පහත ආකාර වලින් එකක් විය හැකිය :

| | |
|---|---|
| ඉල්ලීමක් : | මාර්ක් 7:32-35 |
| අණකිරීමක් : | ලූක් 4:38-39; මාර්ක් 7:32-35; යොහන් 5:8; ක්‍රියා 3:6; 9:40 |
| මැදිහත්කමක් : | නික්මයාම 32 |
| තරවටු කර දුරු කිරීමක් : | මාර්ක් 9:25 |

දෙවියන්වහන්සේ මඟපෙන්වන ආකාරයට ඔබගේ යාච්ඤාව තුළ යම් විශේෂ ක්‍රියාවක් කිරීමට උපදෙසක් ද ඇතුළත් විය හැකිය (යොහන් 9:1-7 බලන්න.) (සටහන : කිසිදාක ඖෂධ ගැනීමෙන් වළකින ලෙස පුද්ගලයන්ට නොපවසන්න. ඒ සඳහා දෙවියන්වහන්සේට ඔවුන්ට මඟපෙන්වීමට ඉඩහරින්න). සෑමවිටම යේසුස්වහන්සේගේ නාමයෙන් යාච්ඤා කරන්න. එසේම, එක් වරකට වඩා යාච්ඤා කිරීම ඇදහිල්ල මද බවක් නොවන බවද මතක තබා ගන්න. (යේසුස්වහන්සේ නොකඩවා යාච්ඤා කිරීම ගැන ඉගැන්වූ බව නැවත මතක් කර ගන්න.)

## පිළිතුර උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න :

යාච්ඤාවෙන් අනතුරුව සුවය උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. යේසුස්වහන්සේ සුව කළ කුෂ්ඨ රෝගීන් දස දෙනා පිළිබඳ සිදුවීමේදී, සියලු දෙනාම සුව කරනු ලැබුවද සම්පූර්ණත්වයට පත්වූයේ ප්‍රශංසා කිරීම උදෙසා නැවත හැරී ආ තැනැත්තා පමණක් බව මතක තබා ගන්න. දකින දේ නිසා නොව ඇදහිල්ලෙන් දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබ කර ඇත්තේ දේව වචනය කරන ලෙස පවසා ඇති දෙයකි.

උන්වහන්සේ විසින් කරනු ඇති බවට පැවසූ දේ උන්වහන්සේ කර ඇති බව විශ්වාස කරන්න. ඒ උදෙසා උන්වහන්සේට ස්තුති කරන්න. ලාසරස් සොහොනින් පිටතට පැමිණීමටත් පෙර තම යාච්ඤාව ඇසීම ගැන යේසුස්වහන්සේ දෙවියන්වහන්සේට ස්තුති කළ සේක.

# ගොඩනැංවීමේ සේවය

සුවය ලැබූ අයට ගොඩනැංවීමේ සේවයක් ලැබීම වැදගත්ය. සුවය හා මිදීම අත්දුටු අයට යේසුස්වහන්සේ තවදුරටත් උපදෙස් දුන් සේක.

කුෂ්ඨ රෝගයකින් සුව වූ මිනිසාට උන්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **කාටවත් එය නොකියන්ට උන්වහන්සේ ඔහුට අණකොට: නුඹ ගොස් පූජකයාට පෙනී, මෝසෙස් විසින් අණකළ දේවල් ඔවුන්ට සාක්ෂි පිණිස නුඹේ පවිත්‍රවීම සඳහා ඔප්පුකරපන්නැයි කීසේක. (ලූක් 5:14)**

සුවය ලැබූ පව්කාර ස්ත්‍රියට උන්වහන්සේ මෙසේ පැවසූ සේක.

> **නුඹේ ගෙදරට හැරී ගොස්, දෙවියන්වහන්සේ නුඹට කොපමණ මහත් දේවල් කළසේක්ද කියා ප්‍රකාශකරපන්නැයි කීසේක. ඔහු ගොස්, යේසුස්වහන්සේ තමාට කොපමණ මහත් දේවල් කළසේක්ද කියා නුවර මුළුල්ලේ ප්‍රසිද්ධකෙළේය. (ලූක් 8:39)**

බෙතෙස්දාවේ පොකුණ අසල සිටි මිනිසාට උන්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **ඉන්පසු යේසුස්වහන්සේ දේවමාළිගාවේදී ඔහු දැක: බලාපන්න, නුඹ සුවය ලැබුවෙහිය. නුඹට මීට වඩා නරකක් සිදු නොවන පිණිස, තවත් පව් නොකරන්නැයි ඔහුට කීසේක. (යොහන් 5:14)**

අනාචාරයේදී හසුවූ ස්ත්‍රියට උන්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **එවිට යේසුස්වහන්සේ: මමත් නුඹ වරදට පත් නොකරමි. පලයන්න, මෙතැන් පටන් තවත් පව් නොකරන්නැයි ඇට කීසේක. (යොහන් 8:11)**

ඔබ තනිව පුද්ගලයකුට සේවය කරන්නේ නම්, ඔබටම ගොඩනැංවීම උදෙසා උපදෙස් දිය හැකිය. ඔබ සාමූහික රැස්වීමක සේවය කරන්නේ නම්, රැස්වීමෙන් පසුව හෝ පසුදින උදෑසන අනුශාසනා දීමේ කාලයක් පවත්වන්න. ඔබ ප්‍රාදේශීය සභාවක සේවය කරන්නේ නම්, සුවය ලද අයට ගොඩනැංවීමේ සේවය සපයන ලෙස සභාපාලක තුමාගෙන් ඉල්ලන්න.

ගොඩනැංවීමේ සේවයේදී පහත කරුණු සැළකිය යුතුය :

- ලද සුවය එසේම පවත්වා ගැනීමට කුමක් කළ යුතුද
- සුවය නොලැබුවේ නම් කුමක් කළ යුතුද

## ලද සුවය එසේම පවත්වා ගැනීමට කුමක් කළ යුතුද :

සුවය ලැබූ අයට පහත දේවල් උගන්වන්න...

## සාතන්ගේ ප්‍රහාරයක් හඳුනා ගන්න :

සාතන් ගැළවීම ලැබූ සෑම කෙනෙකුවම පරීක්ෂාවට පොළොඹවන්නා සේම, සුවය ලැබූ හැම පුද්ගලයෙක්වම ද ඔහු පරීක්ෂාවට ලක් කරනු ඇත. ඔබගේ ආත්මික ජයග්‍රහණය ඔබට අහිමිවිය හැකිවා සේම, ඔබේ ශාරීරික ජයග්‍රහණය ද ඔබට අහිමි විය හැකිය. ඔබගේ ආත්මික ජීවිතයේ ඔබ දෙවියන්වහන්සේ විශ්වාස කරන්නේ කුමන කරුණක් සම්බන්ධයෙන්ද, එම කරුණ සම්බන්ධයෙන් ඔබව පරීක්ෂාවට ලක් කෙරෙනු ඇත. පහත ආකාර වලින් සාතන් ඔබ පරීක්ෂාවට ලක් කරනු ඇත :

- රෝග ලක්ෂණ : සුව කිරීම ඇතැම් විට ක්‍රමක්‍රමයෙන් සිදුවේ. ඔබගේ සියලුම රෝග ලක්ෂණ ඉක්මනින්ම ඉවත්ව යා නොහැකිය. ඔබගේ රෝග ලක්ෂණ වඩා දරුණු අතට ද හැරිය හැකිය. ඔබට උණ ගතියක් පැවතිය හැකි නමුත්, එය ඔබගේ සුව කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස ඔබේ රෝගයට විරුද්ධව යටත් කිරීමේදී ඔබේ ශරීරයේ සිදුවන ක්‍රියාවලියක් විය හැකිය. ඔබගේ ශරීරයට දැනෙන දේ අනුව නොව ආත්මයට දැනෙන දේ අනුව ගමන් කරන්න. ඔබගේ රෝග ලක්ෂණ නැවත ඇතිවෙමින් පවතිද යන්න සොයමින් තොරතුරු දැන ගැනීමට උත්සාහ නොකරන්න. අනෙක් අතට, ඒවා පිළිබඳ බොරු නොකියන්න. යමෙකු විමසුවහොත් “ඔව්, මට _____________ රෝග ලක්ෂණය තිබේ. නමුත් උන්වහන්සේගේ කස පහර වලින් මට සුවය ලැබී තිබේ.” ඔබගේ අවධානය රෝග ලක්ෂණ කෙරෙහි නොව නොපෙනෙන දේවල් කෙරෙහි යොමු කරන්න. ඔබ දේව වචනයෙන්, උන්වහන්සේගේ අභිමුඛයෙන්, පොරොන්දු වලින් හා බලයෙන් ඈත් කිරීමට රෝග ලක්ෂණ වලට හැකිය. ඔබේ ශරීරයට පහර දීමට සාතන්ට ඇති හැකියාව මහිමයට පත් කරන සෘණාත්මක වචන නොපවසන්න. ඔබව වඩාත් ධෛර්යවත් කරන්නේ රෝග ලක්ෂණ අඩු වීමද ෴ දෙවියන්වහන්සේ ඔබට සුවය දෙන බව පවසන උන්වහන්සේගේ වචනයද? ඔබේ අවධානය යොමුවන්නේ කුමක් වෙතටද?

- ඔබට අන්‍යයන් දෙස බැලීමට සැළැස්වීම : තමා සුව වූ බව සිතූ නමුත්, දැන් නැවත රෝගීව සිටින අය දෙස බැලීමට සැළස්වීම. තමා ගැළවීම ලද බව ප්‍රකාශ කර නමුත් දැන් නැවත පාපයේ ජීවත් වන අය ගැළවීමෙහි යාථාර්ථය ප්‍රතික්ෂේප කිරීමට උදාහරණයක් ලෙස ඔබ යොදාගන්නෙහිද?

- බිය : ඔබගේ රෝගය නැවත පැමිණෙනු ඇතැයි යන බිය.

- ඔබ අවට සිටින සෘණාත්මක පුද්ගලයන් : ඔබගේ මනස තුළ සැකය ඇති කරන අවිශ්වාසයෙන් පිරුණු අය.

## සාතන්ගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටින්න :

සුවය පිළිබඳ දේව වචනය දිගටම අධ්‍යයනය කිරීම තුළින් ඇදහිල්ලේ පරිසරයක් පවත්වාගෙන යන්න. සුවය උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. ඔබ සුවකළ තැනන්වහන්සේ සමඟ යාච්ඤාවෙන්

සම්බන්ධතාවය පවත්වාගන්න. දෙවියන්වහන්සේට මහිමය දෙමින් ඔබගේ සුව වීම ගැන අන් අයට සාක්ෂි දරන්න. ඔබගේ සාක්ෂි දැරීමේ වචන වලින් සාතන්ට විරුද්ධව සිටිය හැකි එක් ආකාරයකි. සුවය පිළිබඳ විශේෂිත වචන උපුටා දක්වමින් දෙවියන්වහන්සේගේ “රීමා” වචනයෙන් සාතන්ට විරුද්ධව සිටින්න. සැක සිතන මිනිසෙකුට දෙවියන්වහන්සේගේ දේවල් ලබා ගත නොහැකි බැවින්, ඔබගේ ඇදහිල්ල සෙළවීමට ඉඩ නොදෙන්න (යාකොබ් 1:6-8). ඔබගේ සුවය උදෙසා අවංකව ඇදහිල්ලෙන් සටන් කරන්න (පොර බදින්න) (රෝම 10:9).

ඔබගේ සුවය උදෙසා ඔබ සමඟ දෙවියන්වහන්සේට දිගින් දිගට ප්‍රශංසා කරන හා සතුරාගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටීමට ඔබට උපකාර කරන පුද්ගලයන්ගෙන් සමන්විත ඇදහිල්ලේ ධනාත්මක පරිසරයක් ඔබ වටා ගොඩනඟා ගන්න. සභාවක සාමාජිකත්වය ලබා ගන්න.

පහත දේවල් ද ඇතුළත්ව ආත්මික ආධිපත්‍ය ඔබ විසින් පාවිච්චි කරන විට ඔබ සාතන්ගේ ප්‍රහාරයන්ට විරුද්ධව සිටී :

- දේව වචනය
- යේසුස්වහන්සේගේ රුධිරය
- ඔබගේම සාක්ෂිය පිළිබඳ වචන
- බැඳීමට හා නිදහස් කිරීමට ඇති ආධිපත්‍ය
- යාච්ඤාව හා ප්‍රශංසාව
- එපීස 6:10-18 හි සඳහන් යුද්ධායුද
- ශුද්ධාත්මයාණන්වහන්සේගේ ආධිපත්‍ය හා බලය

(ඔබ ශුද්ධාත්මයාණන්ගේ බව්තිස්මය අත්දැක නොමැති නම් එය සෙවිය යුතුය. ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ සුවය පවත්වාගෙන යාමට අවශ්‍ය බලය සපයන සේක. ඊළඟ පාඩමේදී ඔබ ඉගෙන ගන්නා ආකාරයට යක්ෂයන්ගේ ක්‍රියාකාරකම් සම්බන්ධ තත්වයන්ගෙන් නිදහස් වීමේදී එය වැදගත් වේ.)

## ඔබේ ජීවන රටාව වෙනස්කර ගන්න :

නැවතත් පව්කාර ජීවන රටාවන්ට හැරී යාම නිසා ලෙඩරෝග නැවත පැමිණිය හැකිය (යොහන් 8:11). දේව වචනය තුළ දෙවියන්වහන්සේට කීකරුව ජීවත් වන්න. කැමැත්තෙන් පව් කිරීම නිසා සුවය අහිමි විය හැකිය (යොහන් 5:14). සෞඛ්‍යයට අහිතකර පුරුදු වලට නැවත හැරී යාම නිසාද ලෙඩරෝග නැවත ඇතිවිය හැකිය. අහිතකර පුරුදු වලින් ඔබ දෙවියන්වහන්සේගේ මාලිගාව කෙලසන බැවින් ඒවා සැබවින්ම පාපයන්ය.

## සෞඛ්‍යය හා සුවය උදෙසා වූ බයිබලීය උපදෙස් අනුගමනය කරන්න :

සෞඛ්‍ය සම්පන්න ජීවිතයක් සඳහා බයිබලය බොහෝ උපදෙස් සපයයි. මේවා විස්තරාත්මකව අධ්‍යයනය කිරීම සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *“ශරීරය උදෙසා වූ සටන්”* නමැති පාඩමාලාව අධ්‍යයනය කරන්න.

## වෛද්‍ය විද්‍යාවට අනුව ස්ථිරත්වයක් ලබා ගන්න :

ඔබ වෛද්‍ය ප්‍රතිකාර ලබමින් සිටියේ නම්, ඔබගේ සුවය සහතික කර ගැනීම සඳහා ඔබේ වෛද්‍යවරයා හමුවන්න. පැරණි ගිවිසුම් නීතිය යටතේ, පූජකවරු වෛද්‍යවරුන්ට සමාන විය. ඔවුන් රෝග විනිශ්චය කර සුවය ප්‍රකාශ කළහ. සුවය ලද කුෂ්ට රෝගියාට යේසුස්වහන්සේ මෙසේ පැවසූ සේක :

> **කාටවත් එය නොකියන්ට උන්වහන්සේ ඔහුට අණකොට: නුඹ ගොස් පූජකයාට පෙනී, මෝසෙස් විසින් අණකළ දේවල් ඔවුන්ට සාක්ෂි පිණිස නුඹේ පවිත්‍රවීම සඳහා ඔප්පුකරපන්නැයි කීසේක. (ලූක් 5:14)**

## ඔවුන් සුවය නොලැබුවේ නම් කළ යුත්තේ කුමක්ද?

සුවය නොලැබූ නිසා මිනිසුන් අධෛර්යයට පත් වීමට හෝ වරදකාරී හැඟීමෙන් යාමට ඉඩ නොහරින්න. සුවය නොලැබීම පිළිබඳ හේතුවක් සෙවීමේ පරීක්ෂාව මඟහරින්න (දෙවියන්වහන්සේ විශේෂයෙන් එළිදරව් කළොත් පමණක් පවසන්න). ඔවුන් රැස්වීමෙන් පිට වීමට පෙර, ඔවුන්ට ප්‍රතිඵල පෙනෙන්නට

නොතිබුනත් ඉන් අදහස් වනුයේ ඔවුන් සුවය නොලැබූ බව නොවන වග ඔවුන්ට තේරුම් කර දෙන්න. සුව කිරීම ආරම්භ වන්නේ ආත්මයෙනි. ප්‍රමාද වී සිදුවන සුව වීම් තිබේ. එනම්, ආබ්‍රහම්ගේ හා සාරාගේ වඳ බව සුව වුනේ වචනයක් ලැබ වසර ගණනාවකට පසුව වේ.

සැළසුම් කර ඇති කාලය ද මේ සඳහා බලපායි. ක්‍රියා 5 හි සඳහන් දේව මාලිගාව අසල සිටි කොර මිනිසා සළකා බලන්න. යේසුස්වහන්සේ බොහෝ වාරයක් දේව මාලිගාවේ දොරටු තුළින් ගමන් කළ සේක. නමුත් කොර මිනිසා වසර ගණනාවක් ඒ ස්ථානයේ සිටි බව සඳහන් වේ. පසුව ඔහු සුව කරනු ලැබුවේ යොහන් සහ පේත්‍රුස් විසිනි (ක්‍රියා 5:15-16). යෝබ් හා ලාසරස් සම්බන්ධ සිදුවීම් වලදී ද නිශ්චිත කාලයක් විය.

මෙම ගොඩනැංවීමේ පියවරයන් හිදී රෝගී පුද්ගලයා සමඟ කටයුතු කිරීමට ඔබ යමෙකු පත් කළ යුතු වේ :

1. සුවය උදෙසා නොකඩවා යාච්ඤා කරන්න : නොකඩවා යාච්ඤා කරන්න යේසුස්වහන්සේ ඉගැන්වූ සේක. උන්වහන්සේ එසේ නොකරන පිනිස මිනිසුන් අධෛර්යයට පත් කළේ නැත. ඔබ උදෙසා යාච්ඤා කරන මෙන් සභාවේ වැඩිහිටියන්ගෙන් ඉල්ලන්න.

2. ඔබගේ ඇදහිල්ල දිගටම ගොඩනඟා ගන්න : සුවය පිළිබඳ දෙවියන්වහන්සේගේ "රීමා" වචනය දිගටම අධ්‍යයනය කිරීම තුළින් ඔබට මෙය සිදු කළ හැකිය.

3. දිගින් දිගටම ඔබේ පව් කියා දෙන්න : ඔබේ පාපයන් ඔබේ ශාරීරික තත්වයට බාධා ඇති නොකරන පිණිස දිනපතා පාපොච්චාරණය කරන්න. දේව වචනය තුළ ඊට කීකරුව ජීවත් වන්න.

4. ඔබගේ ආත්මික ශක්තිය පාවිච්චි කරන්න : සෑම ඇදහිලිවන්තයෙකුටම සුව කිරීම හා යක්ෂයන් දුරු කිරීම සඳහා මූලිකව අවශ්‍ය වන දේවල් ඇත. ඒවා පාවිච්චි කිරීමට පටන් ගන්න. ඒවා නම් :

   - දේව වචනය
   - යේසුස්වහන්සේගේ රුධිරය
   - ඔබේම සාක්ෂියේ වචන
   - බැඳීමට හා නිදහස් කිරීමට ඇති ආධිපත්‍ය
   - යාච්ඤාව හා ප්‍රශංසාව
   - එපීස 6:10-18 හි සඳහන් යුද්ධායුධ
   - ශුද්ධාත්මයාණන්ගේ ආධිපත්‍ය හා බලය

5. හැකි අවස්ථාවන්හිදී, ඔබගේ ජීවන රටාව වෙනස් කරගන්න : පව්කාර හා සෞඛ්‍යයට අහිතකර පුරුදු ඉවත් කරන්න. බොහෝවිට සුවය පැමිණෙනුයේ ඔබගේ ජීවන රටාව දේව වචනයට එකඟ හා කීකරු ලෙස හැඩගසාගත් විටය.

6. ජීවිතය හා සෞඛ්‍ය පිළිබඳ ආත්මික උපදෙස් පිළිපදින්න.

7. ඇදහිල්ලේ පරිසරයක් ගොඩනඟන්න : ඇදහිලිවන්තයන්ගේ සහභාගිත්වයක කොටසක් බවට පත්වීම තුළින් ඔබ ඇදහිල්ලේ පරිසරයකින් වටකර ගැනීමට සළස්වන්න.

8. දෙවියන්වහන්සේ සම්පූර්ණයෙන්ම විශ්වාස කිරීමට ඔබව කැප කරන්න : සම්පූර්ණ විශ්වාසය යනු ජීවත් වුවත් මැරුණත්, රෝගී වුවත් නිරෝගී වුවත් ඔබ උන්වහන්සේගේ දෑතේ සිටින බව දැන ගැනීමයි. යෝබ් 10:29; යෝබ් 13:15; 19:26.

9. වේදනාවන් සඳහා ධනාත්මක ලෙස ප්‍රතිචාර දක්වන්න : ඔබ සම්පූර්ණ සුවය උදෙසා බලා සිටින අතර තුර, අන් අයට ද ධනාත්මක බලපෑමක් සිදු කළ හැකි වන අයුරින් ඔබේ වේදනාවන්ට ප්‍රතික්‍රියා දක්වන්න. පහත දේවල් තුළින් ඔබට එසේ කළ හැකිය.

   - ස්තුති දීම : 1 තෙසලෝනික 5:16-18
   - දුර්වලතාවයන් හිදී දෙවියන්වහන්සේගේ ශක්තිය සම්පූර්ණත්වයට පත් කිරීමට උන්වහන්සේට ඉඩහැරීම : 2 කොරින්ති 12:9-10

- ඔබ බලා සිටින අතරතුර ඉවසීම පෙන්නුම් කිරීම. වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලබා ගැනීම සඳහා මිනිසුන් වෛද්‍යවරුන්ගේ කාර්යාල වල රැඳී සිටිති. ඖෂධ ක්‍රියාකාරී වන තුරු අප බලා සිටින්නෙමු. අපට දෙවියන්වහන්සේ දෙස බලා සිටිය නොහැක්කේ ඇයි? ඉවසීම ඇති අය පොරොන්දු උරුම කර ගනිති : හෙබ්‍රෙව් 6:12; 12:2-3; යාකොබ් 1:2-4; 5:10-11; ගීතාවලිය 27:14; 37:34; යෙසායා 40:31; රෝම 5:3-5.

- අරමුණක් නැතිව කිසිඳු වේදනාවක් ඇති නොවන බව හඳුනාගැනීම. මේ බව පෙන්නුම් කරන දුක් විඳි අය පිළිබඳ බයිබලීය වාර්තාවන් අධ්‍යයනය කරන්න.

10. දෙවියන්වහන්සේගේ පොරොන්දු ප්‍රකාශ කරන්න : දෙවියන්වහන්සේ ඔබව අතහැර ඇති බව ඔබට හැඟුනද, මෙම පොරොන්දු ප්‍රකාශ කරමින් මෙම යාච්ඤාවන් කරන්න : ගීතාවලිය 5:1-3; 6:2-9; 13:1-6; 22:19; 27:7; 31:21-22; 42:9-11; 54:1-2; 55:1-2; 70:1; 71:9-21; 86:6-7; 94:19; 102:1-7; 2 කොරින්ති 4:17-18.

11. දෙන්න එවිට ඔබට ලැබෙනු ඇත : අප දෙන විට අපට ලැබෙන බව දේව රාජ්‍යයේ ප්‍රධාන ප්‍රතිපත්තියක් ලෙස බයිබලය උගන්වයි. ඔබ ඇදහිලිවන්තයෙක් නම්, දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලයෙන් අන්‍යයන්ට සේවය කිරීමට පටන් ගන්න. ඔබ දෙන විට ඔබට ද ලැබෙනු ඇත.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සුව කිරීමේ සේවයේ සුදානම්වීම සාකච්ඡා කරන්න.

3. සුවය උදෙසා සේවය කිරීමේ උපදෙස් සාරාංශගත කරන්න.

4. සුවය ලැබූ අය උදෙසා වූ ගොඩනැංවීමේ සේවය සාකච්ඡා කරන්න.

5. සුවය නොලැබූ අය උදෙසා වූ ගොඩනැංවීමේ සේවය සාකච්ඡා කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. සුවය උදෙසා සේවය කිරීමට පෙර යේසුස්වහන්සේ රෝගීන් සමඟ සාකච්ජා කළ ආකාරය පිළිබඳ මෙම උදාහරණ අධ්‍යයනය කරන්න :

   - මාර්ක් 5:1-20 : යක්ෂාවේශ වූ මනුෂ්‍යයාගෙන් යේසුස්වහන්සේ ප්‍රශ්න ඇසූ සේක.
   - මාර්ක් 8:22-26 : අන්ධ මිනිසාගෙන් ප්‍රශ්න ඇසීම.
   - මාර්ක් 9:14-27 : යක්ෂ ආත්මයක් සහිත පිරිමි දරුවා සමඟ සාකච්ජා කිරීම.
   - මාර්ක් 10:46-52 : අන්ධ බර්තිමේයුස්ගෙන් ප්‍රශ්න ඇසීම.

2. සුව කිරීමේ සේවයේ ගොඩනැංවීම සඳහා කරුණු කිහිපයක් පහත දැක්වේ :

   ප්‍රතිඵල ලබා දීම දෙවියන්වහන්සේට භාරදෙන්න. අසාර්ථකවීම් ලෙස පෙනෙන දේවල් පිළිබඳව කණගාටු නොවන්න. දෙවියන්වහන්සේ සුවය දෙන්නා වන විට ඔබ පරාජිතයෙකු වන්නේ කෙසේද? දිව්‍යමය සුව කිරීම් වල දෘෂ්‍ය ප්‍රතිඵල වල කීර්තිය ඔබ ලබා ගන්නේ නැහැ නොවේද? එසේනම් දෘෂ්‍ය ප්‍රතිඵල නොමැති විට වරද භාරගන්නේ ඇයි?

   අප සියලු දෙනාම දෙවියන්වහන්සේගේ සුව කිරීමේ බලය ගැන ඉගෙන ගන්නෙමු. ඔබ වටා අසමත්වීම් පෙනෙන්නට තිබෙන නිසා ඔබ ක්‍රිස්තියානි ජීවිතය ගත කිරීම නතර කරන්නේ නැතිවා සේම ඔබ වටා අසමත්වීම් ලෙස පෙනෙන්නට තිබෙන දේවල් නිසා සුවය උදෙසා සේවය කිරීම නතර නොකරන්න. අසමත් වීමට තිබෙන බිය සඳහා ඇති පිළිතුර බලාපොරොත්තු අඩු කර ගැනීම නොව, සේවය වැඩි කිරීමයි.

   ප්‍රතිඵල දැක ගැනීමට නොහැකි වීමට හේතුව දෙවියන්වහන්සේ එළිදරව් කරන තුරු, පිළිතුරු නොලත් ප්‍රශ්න දෙවියන්වහන්සේට භාර දෙන්න (ද්විතීය කතාව 29:29). අසම්පූර්ණ මනුෂ්‍ය දැනීම හා හේතු දැක්වීම මත පදනම්ව හේතු සොයා ගැනීමට හෝ විනිශ්චයන් ඇති කර ගැනීමට උත්සාහ නොකරන්න. මනුෂ්‍යයාගේ පළමු පාපය වූයේ දෙවියන්වහන්සේ මෙන් වීමට අවශ්‍ය වීම හා සියල්ල දැන ගැනීමට අවශ්‍ය වීම බව මතක තබා ගන්න. දෙවියන්වහන්සේගේ රහස් වූ දේවල් ජීවිතයේ කොටසක් ලෙස පිළිගන්න.

   වෛද්‍යවරු ක්‍රියාකරනුයේ තම අතැති හොඳම සම්පත් වලිනි. ඇතැම් අවස්ථාවලදී රෝගීන් සුව නොවන නමුත්, රෝගියා මිය ගියද වෛද්‍යවරයා තම ප්‍රතිකාර කිරීම නොනවත්වයි. ස්වාමින්වහන්සේ විසින් සපයා ඇති ආත්මික සම්පත් සමඟ අපට ද එවැනිම විශ්වාසයකින් කටයුතු කළ නොහැකි ද? අසමත්වීම් නොසලකමින් සුව කිරීමේ සේවය තුළ ඒවා පාවිච්චි කිරීම හා වර්ධනය කිරීම කළ නොහැකිද?

   පෙනෙන්නාවූ ප්‍රතිඵල ඉතා අලංකාරය. නමුත් සදාකාලික දේවල් යනු නොපෙනෙන දේවල්ය යන්න මතක තබා ගන්න. යේසුස්වහන්සේගේ ගෝලයෝ තම දේශනා කිරීමේ හා සුව කිරීමේ ප්‍රතිඵල දෙස අවධානය යොමු කරන විට යේසුස්වහන්සේ මෙලෙස පැවසුයේ එබැවිනි :

   **එසේවුවත් ආත්මයන් නුඹලාට යටත්වන නිසා නොව නුඹලාගේ නාම ස්වර්ගයෙහි ලියා තිබෙන නිසා ප්‍රීතිවෙයල්ලායයි කීසේක. (ලූක් 10:20)**

3. ඔබ සමඟ සුව කිරීමේ සේවයේ යෙදීම සඳහා සේවකයන් කණ්ඩායමක් ගොඩනඟා ගත යුතු ආකාරය පහත දැක්වේ :

   - ඇදහිල්ල ගොඩනැඟීමටත් උපදෙස් දීමටත් මෙම කොටසේ ඇති පාඩම් හා දේව වචනය පාවිච්චි කරන්න.
   - ඔබ විසින් උගන්වා ඇති සේවකයන් කණ්ඩායමක් තෝරාගන්න.
   - නිරාහාරව හා යාච්ඤාවෙන් එක්ව කාලය ගත කරන්න.
   - කණ්ඩායමේ සාමාජිකයන්ට එකිනෙකා සමඟ සහයෝගයෙන් කටයුතු කළ හැකි වන පරිදි සුව කිරීමේ මෙහෙයේදී එක් එක්කෙනා කරන්නාවූ කාර්යයන් තීරණය කරන්න. අවුල් සහගත තත්වයන් ඇතිවීම වළක්වාලීම සඳහා එක් අයෙකු රැස්වීමේ කටයුතු සම්බන්ධීකරණය කළ යුතුය.

- අන් අයව සුව කිරීමේ සේවයට සූදානම් කිරීම සඳහා කණ්ඩායම් සාමාජිකයන් පාවිච්චි කරන්න. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය උදෙසා දෙවියන්වහන්සේගේ බලය කොයිතරම් දුරට ලබාගත හැකිද යන බව වටහා දෙන සූදානම් කිරීමේ මෙහෙයන් තරම් සුවකිරීමේ රැස්වීම් නොපවත්වන්න.

4. අසාධ්‍ය ලෙස රෝගී වී ඇති අයට සේවය කිරීමේදී ඔබට උපකාරී වීම සඳහා මෙම උපදෙස් යොදාගන්න :

1. මරණීය රෝග තිබේ : යොහන් 11:4 දී ලාසරස්ගේ රෝගය මරණීය රෝගයක් නොවන බව යේසුස්වහන්සේ පැවසූ සේක. මෙහි අදහස මරණීය රෝගද පවතින බවය.

11. ස්වාභාවික මරණයන් ආකාර දෙකකි :

A. නොමේරූ මරණය : ආත්මය ගැළවෙනු පිණිස මාංශය නාස්තිවීමට හැරීම.

B. නියමකරන ලද මරණය : ජීවිතයේ ස්වාභාවික ක්‍රියාවලිය නිසා (හෙබ්‍රෙව් 9:27; දේශනාකාරයා 3:2; 2 රාජාවලිය 13:14; යෙසායා 38; 2 රාජාවලිය 20).

111. සුව කිරීමේ ඉලක්කය අමරණීයත්වය නොවේ :

A. යේසුස්වහන්සේ මරණින් නැඟිටවූ අය පවා කල් යාමේදී මරණයට පත්වූහ.

B. මෝසෙස් මෙන් ඇතැම් පුද්ගලයන් අධිස්වාභාවිකව මහලු වීමෙන් ඇතිවන ප්‍රතිඵල වලින් ඈත්කර තිබේ. සෙසු අය යොෂුවාට වූවාක් මෙන් ස්වාභාවිකව වයසට යාමේ ක්‍රමය අනුව යයි.

C. සුවය උදෙසා වූ ගිවිසුමේ කොටසක් ලෙස මොලොවදී අමරණීයත්වය ලැබෙන බවට බයිබලය පොරොන්දු නොවේ. දිව්‍යමය සුව කිරීම විශ්වාස කර ඒ උදෙසා සේවය කළ නමුත් රෝග නිසා මරණයට පත් වූ කිතුනුවන් බාධාවක් කර නොගන්න. මරණයෙන් අවුරුදු ගණනාවකට තම ඇට වලට පවා මිනිසෙකු මරණින් නැඟිටුවීමේ බලය තිබූ එළිෂාට පවා මෙය සිදු විය. එම නිසා ඔහුගේ මරණය සිදු වූයේ ඇදහිල්ල මද බව නිසා නොවන බව මෙමඟින් තහවුරු කරයි !

1V. අසාධ්‍ය රෝගී අයට සේවය කරන විට දෙවියන්වහන්සේගේ ප්‍රඥාව සොයන්න : එය එම පුද්ගලයාගේ මරණය සඳහා නියම කර ඇති කාලයද?

A. එය එම පුද්ගලයාගේ නියමිත කාලය බව දෙවියන්වහන්සේ එළිදරව් කරන්නේ නම්, කුරුසියේ සිටි සොරාට යේසුස්වහන්සේ උපකාර කළාක් මෙන් ඒ සඳහා සූදානම් වීමට ඔහුට උපකාර කරන්න :

1. යේසුස්වහන්සේ තම ගැළවුම්කරු බව ඔවුන් දන්නේ දැයි නිශ්චිතව දැනගන්න.

2. ඔවුන් ඇදහිලිවන්තයෙක් නම්, සමාව නොගත් පාප නැති බව සැකහැර දැනගන්න.

3. ඔවුන්ගේ ව්‍යාපාරික සම්බන්ධතා නිසි ලෙස පිළිවෙළ කිරීමට ඔවුන්ව උනන්දු කරන්න.

4. ඔවුන් වෙනත් පුද්ගලයෙකු සමඟ ප්‍රශ්නයක් ඇතිනම් එය විසඳා ගැනීමට ඔවුන් උනන්දු කරන්න.

5. සියල්ලන්ටම මරණය පැමිණෙන බව තේරුම් ගැනීමට ඔවුන්ට උදව් කරන්න. ඇදහිලිවන්තයන් ලෙස, සදාකාලික මිනුම් දඬු අනුව අප දැනටමත් මරණය අත්දැක තිබේ. අප ඒ පිළිබඳ අපගේ ආකල්පය වෙනස් කළ යුතුය. අප මරණය සොයා යා යුතු නැති නමුත්, පැමිණෙන්නට තිබෙන ජීවිතයට වඩා වැඩි කැමැත්තක් ඇතිවන පිණිසම වර්තමාන ජීවිතය කෙරෙහි අප එතරම්

වැදගත්කමක් දැක්විය යුතු නැත. ශරීරයෙන් සමුගැනීම යනු දෙවියන්වහන්සේ ඉදිරියේ සිටීමය (2 කොරින්ති 5:8). මරණය සතුරකු වන අතර එය පරාජය කිරීමට ඇති අවසාන සතුරා වේ (1 කොරින්ති 15:26). යේසුස්වහන්සේගේ නැවත නැඟිටීම මරණය පරාජය වී ඇති බව පෙන්වන “ප්‍රථම ඵලය” වන නමුත් එය තවම විනාශ කර නැත. ඇදහිලිවන්තයාට සතුරා පිළිබඳ බිය නැති කර ඇත. (1 කොරින්ති 15:55).

6. දෙවියන්වහන්සේ සියල්ල පාලනය කරන බව තේරුම් ගැනීමට ඔවුන්ට උදව් කරන්න. ඔවුන්ට තව කල් ජීවත් වීමට අවසරය දීම සඳහා උන්වහන්සේට ඕනෑම මොහොතක මැදිහත් විය හැකිය.

7. මරණය යනු අවසාන සුවය බව ඔවුන්ට මතක් කර දෙන්න. ඉන්පසු තවදුරටත් වේදනාව හෝ රෝගාබාධ ඇති නොවනු ඇත. අපි සම්පූර්ණව දෙවියන්වහන්සේගේ අභිමුඛයට ඇතුළු වන්නෙමු. ලෙඩරෝග පාපය හා සමාන වේ : යේසුස්වහන්සේ අපගේ ගැළවුම්කරු හා සුවය දෙන තැනන්වහන්සේ ලෙස පිළිගත් විට අප පාපය උදෙසා වූ දඬුවමින් (ලෙඩ රෝග) ගැළවීම ලබන්නෙමු. ඇදහිලිවන්තයන් ලෙස අපිට දිගින් දිගටම එහි බලයන්ගෙන් නිදහස්විය හැකි නමුත්, එහි පැවතීමෙන් අපට නිදහස් විය හැක්කේ ස්වාමින්වහන්සේ ඉදිරියට ගිය විට පමණි. නපුර කිරීමට සාතන් අදහස් කරන දේවල් පාවිච්චි කර ඒවා යහපතට හැරවීමේ ක්‍රමයක් දෙවියන්වහන්සේට තිබේ. මරණය පාපය උදෙසා වූ දඬුවම වූ අතර, ක්‍රිස්තුස්වහන්සේගේ මරණය ජීවනය ගෙන දුන්නේය. මරණය තුළ ජයග්‍රහණයක් ඇති ලෙස සළකනුයේ මේ නිසා වේ. මරණය තුළ, දෙවියන්වහන්සේ පරම සුවය ලබා දෙන සේක.

8. සදාකාලික ජීවිතය හා නැවත නැඟිටීම කෙරෙහි ඔවුන්ගේ අවධානය යොමු කරන්න. පහත බයිබල් පද පාවිච්චි කරන්න : යොහන් 11:5-6; යෝබ් 19:25-27; රෝම 8:10-11, 17-18,22-23; 10:11; 1 කොරින්ති 15:42-44, 54-58; 2 කොරින්ති 4:16-18; 5:1; 1 තෙසලෝනික 4:13-18.

B. මෙය මරණය සඳහා නියම කරන ලද කාලය ද යන්න පිළිබඳව ඔබට දෙවියන්වහන්සේගෙන් රීමා වචනයක් නොලැබුණේ නම්,

1. දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුව සුවය උදෙසා දිගටම යාච්ඤා කරන්න. මෙය අපගේ කැමැත්ත අනුව ඉල්ලා සිටීමක් නොව, ඔවුන්ව සුව කිරීමට හෝ උන්වහන්සේ වෙත ගැනීමට දෙවියන්වහන්සේගේ කැමැත්ත අනුව ක්‍රියා කිරීමට නිදහස් කිරීමක්ය. ශුද්ධාත්මයාණන්වහන්සේ දෙවියන්වහන්සේගේ කැමැත්ත දන්නා බැවින් හා උන්වහන්සේ නිසි ලෙස මැදිහත්කම් කරනු ඇති බැවින්, ආත්මයෙන් යාච්ඤා කිරීම ද සුදුසුය. (රෝම 8:26)

2. තමන් ජීවත් වන්නේද නැත්ද යන්න පිළිබඳව දෙවියන්වහන්සේ විශ්වාස කරමින්, තමා දෙවියන්වහන්සේට භාර දෙන ලෙස රෝගී අය ධෛර්යවත් කරන්න : යොහන් 10:29; යෝබ් 13:15

# තුන් වන කොටස සඳහා හැඳින්වීම

# "ඔබ එහි සිටින විට"

"මුහුන් වැනි වූ ධර්ම ප්‍රචාරණය" පාඨමාලාවේ මෙම කොටස, ඔබ එහි සිටින විට කුමක් කළ යුතුද යන්න පිළිබඳව නව ගිවිසුම ඉදිරිපත් කරන රටාව කෙරෙහි අවධානය යොමු කරයි. නව ඇදහිලිවන්තයන් කණ්ඩායමක් අතර සභාවක් පිහිටුවනු ලබන තුරු ධර්ම ප්‍රචාරණය සම්පූර්ණ නොවන බව එය යෝජනා කරයි.

නව ගිවිසුමේ ධර්ම ප්‍රචාරණය සිදු වූ හැම තැනකදීම එහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රාදේශිය සභාවක් ඇති විය. ධර්ම ප්‍රචාරණය සඳහා ඊළඟ ප්‍රජාව වෙත යාමට පෙර අපෝස්තුළුවරුන් තමන් එහි සිටින විට නව සභාවක් ආරම්භ කළහ. "සභා පිහිටුවීම" යනු නව සභාවක් ආරම්භ කිරීමේ ක්‍රියාවලිය විස්තර කරන වචනයකි. මෙම පදය පාවිච්චි කර ඇත්තේ, ස්වාභාවික ලෝකය තුළ ගොවියෙකු පැළයක් සිටුවන ආකාරයටම නව සභාවක් ආරම්භ කිරීමද සිදු කළ යුතු වූ බැවිනි. පොහොර සහිත පොළොවක දී, බීජය ලබා දුන් "මව්" පැළය හා සමාන පැළයක් බීජය තුළින් හටගනු ඇත.

"පිහිටුවීම" යන වචනය වඩා යෝග්‍ය වන්නේ, ප්‍රාදේශිය සංස්කෘතියට නොගැළපෙන සභාවක් සංවිධානය කිරීම ප්‍රමාණවත් නොවන බැවිනි, සභාවක් ආරම්භ කර එය අර්බුදකාරී තත්වයන්ට මුහුණ දීමට ඉඩ හැරීම ප්‍රමාණවත් නොවේ. එය පැළකරනු ලැබිය යුතුය. එහි අර්ථය නම් එය මුල් ඇද, වර්ධනය වෙමින් ආත්මික ජීවන චක්‍රය තුළ දිගටම පැවතිය යුතු බවයි.

ප්‍රාදේශිය සභාවක් ගොඩනැගීමකින් තොරව ධර්ම ප්‍රචාරණය කිරීම, මෙලොවට දරුවකු ගෙනැවිත් ඔහුගේ වගකීම් භාර නොගෙන සිටීමක් වැනිය. පුද්ගලයෙකු ප්‍රාදේශිය සභාවක සාමාජිකයෙකු වන තුරු ඔහුට ශුභාරංචිය ප්‍රකාශ කර ඇති සේ නොසැළකිය යුතුය. මෙය සිදුකර ගැනීමට, ප්‍රාදේශිය සභාවක් පැවතිය යුතුය. ප්‍රාදේශිය සභාවක් ආරම්භ කරන තුරු ප්‍රදේශයකට සම්පූර්ණයෙන් ධර්ම ප්‍රචාරණය කළ සේ නොසැළකිය යුතුය.

මෙම කොටස තුළදී සභාව උදෙසා වූ නව ගිවිසුමේ ආදර්ශයද, සභාවක් පිහිටුවීම, වර්ධනය හා සංවර්ධනය පිළිබඳ සිද්ධාන්ත ඔබ විසින් ඉගෙන ගනු ඇත. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පහත සඳහන් පාඨමාලාවන් සභා පිහිටුවීම කෙරෙහි අවධානය යොමු කරයි. මෙම විෂය පිළිබඳ සම්පූර්ණ අධ්‍යයනයක් සඳහා ඔබ මෙම පාඨමාලා හැදෑරීම කළ යුතුය.

**ගුණනය වීමේ ක්‍රමවේද :** ආත්මික සම්පත් ගුණනය කරන ආකාරය සහ නව සභාව අභ්‍යන්තරයෙන්, සංඛ්‍යාත්මකව, තම සංස්කෘතියේ තුළ, වෙනස් සංස්කෘතියක් තුළ වර්ධනය කරන අයුරු පැහැදිලි කරයි.

**බයිබලීය කළමණාකරණ ප්‍රතිපත්ති :** සභාව සඳහා නායකයන් තෝරාගැනීම හා වර්ධනය කිරීමේදී ඔබට මඟපෙන්වනු ඇත.

**පරිසර විශ්ලේෂණය කිරීම් :** ශුභාරංචියට ප්‍රතිචාර දැක්වීම හා ධර්ම ප්‍රචාරණය හා සභා පිහිටුවීම සඳහා සූදානම් ප්‍රදේශ හඳුනා ගැනීමට ඔබට උපකාරී වනු ඇත.

**අරමුණු මඟින් කළමනාකරණය :** ප්‍රාදේශිය සහභාගිත්වයෙන් අරමුණු හඳුනාගැනීමට, සැළසුම් සකස් කිරීමට හා සභාව සංවිධානය කිරීමට මෙමඟින් ඔබට උගන්වනු ඇත.

**ක්‍රියාවෙහි යෙදවීමේ ක්‍රමවේද :** සාමාජිකයන් ක්‍රියාවෙහි යෙදවීමට, ඔවුන්ගේ ආත්මික දීමනාව සහිත ක්ෂේත්‍රයේ සේවය කිරීමට ඔවුන්ට අභියෝග කිරීමට මෙමඟින් ඔබට උපකාර කරනු ඇත.

**මුහුන් වැනි වූ ධර්ම ප්‍රචාරණය :** ධර්ම ප්‍රචාරණයේ අවසන් ඉලක්කය ලෙස සභාවක් පිහිටුවීම දක්වා තිබේ.

# දහ නව වන පරිච්ඡේදය

## "ඔබ යන කල, නිදහස් කරන්න"

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- මිනිසාගේ ආත්මය, ප්‍රාණය සහ ශරීරයට පහර දෙන ප්‍රධාන යක්ෂයන් වර්ග තුනක් හඳුනාගැනීමට
- යක්ෂ බල සමඟ ගණුදෙනු කිරීමේ දී ආත්ම විමසීමේ දීමනාවේ ඇති වටිනාකම විස්තර කිරීමට
- යක්ෂයන් පිළිබඳව දැඩි ලෙස සිතෙහි රඳවා ගැනීම කුමක්ද යන්න විස්තර කිරීමට
- යක්ෂයන් පිළිබඳව දැඩි ලෙස සිතෙහි රඳවා ගත් පුද්ගලයෙකුගේ ගුණාංග හඳුනා ගැනීමට
- යක්ෂයා පිටස්තරයෙන් පීඩාවට පත්කිරීම යනු කුමක්ද යන්න විස්තර කිරීමට
- යක්ෂයන් පිටස්තරයෙන් පීඩාවට පත් කළාවූ පුද්ගලයෙකුගේ චරිත ගුණාංග හඳුනා ගැනීමට
- යක්ෂාවේශවීම යනු කුමක්ද යන්න විස්තර කිරීමට
- යක්ෂාවේශ වූ පුද්ගලයෙකුගේ චරිත ගුණාංග හඳුනා ගැනීමට
- යක්ෂ බල කෙරෙහි යේසුස්වහන්සේගේ සේවය සාරාංශගත කිරීමට
- යක්ෂ බල පරාජය කිරීමට බයිබලිය මඟපෙන්වීම භාවිත කිරීමට ඔබට හැකි වන්නේය.

**ප්‍රධාන පදය :**

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

## හැඳින්වීම

බොහෝ කාලයක සිට අන්‍යජාති සංස්කෘති වල කුතුහලය දක්වන ක්‍රියාවක් ලෙස බොහෝ දෙනෙකු යක්ෂයන්ගේ ක්‍රියා ඉවත දමා ඇත. ජීවිත, නිවෙස්, සභාවන් හා දේශයන් ආක්‍රමණය කරන ප්‍රශ්නයක් ලෙස එය සැළකිල්ලට ලක්කර නැත. එහෙත් යක්ෂයන් ලෙස හඳුනාගෙන ඇති අන්ධකාරයේ බලධාරීන් විසින් පීඩාවට හා කරදරයට පත්කරන ලද මිනිසුන් ඔබ වටා සිටින්නේය. යක්ෂ බලවල බලපෑමට යටත්වුවන්ට යේසුස්වහන්සේ සේවය කළ අතර (ක්‍රියා 10:38) උන්වහන්සේ අනුගාමනය කරන්නන්ද රාජ්‍යයේ ශුභාරංචිය පතල කරන අතරම ඉහත ආකාරයේම සේවයක් කරන ලෙස උන්වහන්සේ අණ කළ සේක (මතෙව් 10:1).

යක්ෂ බලයෙන් පීඩාවන්ට පත්වුවන්ට සේවය කිරීම සඳහා මෙම පරිච්ඡේදය මඟපෙන්වීම් සපයන්නේය. ශුභාරංචිය පිළිගන්න පිණිස මෙම වහලුන් ප්‍රථමයෙන්ම බැඳුම්වලින් නිදහස් කළ යුතුය. සාතන් සහ ඔහුගේ යක්ෂ බලධාරීන්ගේ ක්‍රියාවන් සමඟ ගණුදෙනු කරන්නාවූ *"ආත්මික උපක්‍රම: ආත්මික සටන සඳහා අත්පොතක්"* නමින් පාඨමාලාවක් **හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය** මගින් ඉදිරිපත් කරයි. ආත්මික සටන ඔබට නුහුරු දෙයක් නම් නිදහස් කිරීමේ සේවය ආරම්භ කිරීමට පෙර ඔබ මෙම පාඨමාලාව හැදෑරිය යුතුය.

## යේසුස්වහන්සේ සහ යක්ෂයෝ

යක්ෂාත්ම සැබෑ දුෂ්ට බලවේගයන් බව යේසුස්වහන්සේගේ ඉගැන්වීම සහ සේවය නිරූපණය කරන ලදී. යේසුස්වහන්සේ යක්ෂයන් ගැන ඉගැන්වූ දේ සහ උන්වහන්සේ ඔවුන් සමඟ ගණුදෙනු කළ ආකාරය සාතන්ගේ උපායයන් පිළිබඳව වටිනා තොරතුරු ලබා දෙන්නේය.

සාතන් යක්ෂ සේනාවක පාලකයා යන සත්‍යය යේසුස්වහන්සේ ද පිළිගත් සේක. යේසුස්වහන්සේ යක්ෂයන්ගේ යථාර්ථය සහ බලය පිළිබඳව ඉගැන්වූ සේක. යක්ෂයන් දුරු කිරීම දෙවියන්වහන්සේගේ රාජ්‍යය පැමිණ ඇති බවට සළකුණක් බැවි උන්වහන්සේ වදාළ සේක. (යේසුස්වහන්සේ යක්ෂයන් පිළිබඳව ඉගැන්වූ දේ පිළිබඳ සාරාංශයක් සඳහා මතෙව් 12:22-30, මාර්ක් 3:22-27 සහ ලූක් 11:14-23 කියවන්න.)

යේසුස්වහන්සේගේ සේවයේ විශාල කොටසක් යක්ෂයන් සමඟ ක්‍රියා කිරීමට අයත් විය. යේසුස්වහන්සේගේ ආදර්ශය හා උන්වහන්සේගේ නාමයේ ආධිපත්‍යය යක්ෂයන් සමඟ ක්‍රියාකිරීමට බයිබලිය පදනමක් සපයා දෙන්නේය. යක්ෂයා සම්බන්ධ ප්‍රශ්න සමඟ පැමිණි සියලු දෙනාටම යේසුස්වහන්සේ සේවය කළ සේක.

> **දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරිය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

මෙම පාඩමේ "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසින් යේසුස්වහන්සේ යක්ෂ බලධාරීන් සමඟ ක්‍රියා කළ ආකාරය පිළිබඳ විශේෂ සිද්ධීන් වැඩිදුරටත් ඉගෙන ගත හැකිය.

## යක්ෂයන් ක්‍රියා කරන ආකාරය

දෙවියන්වහන්සේටත්, උන්වහන්සේගේ සැළැස්ම හා අරමුණු වලටත් උන්වහන්සේගේ සෙනඟටත් එරෙහිවීම සඳහා සාතන් විසින් යක්ෂයන් ප්‍රයෝජනයට ගනු ලැබෙති. ඔව්හු නොඇදහිලිවතුන් ශුභාරංචියේ සත්‍යයෙන් ඈත් කර තබනු පිණිස ඔවුන්ට එරෙහිව යුද්ධ කරන්නෝය. දානියෙල් 10:12-13 හි සඳහන් ලෙස පර්සියාවේ අධිපතියා වශයෙන් යක්ෂයන් විශේෂ ප්‍රදේශ පාලනය කරන්නේය. ලෝකය තුළ සාතන්ගේ අරමුණු ඉටුකර ගැනීම පිණිස යක්ෂයන් ස්ත්‍රීන් වේවා පුරුෂයන් වේවා පුද්ගලයන් තුළින් ක්‍රියා කරන්නේය.

සාතන්ගේ මූලික අරමුණ වන්නේ දෙවියන්වහන්සේගේ කැමැත්තට විරුද්ධකම් පෑමයි. "සාතන්" යන වචනයේ අර්ථය "එදිරිකාරයා" යන්නයි. සාතන් මූලිකවම දෙවියන්වහන්සේගේ එදිරිකාරයාය. (යෝබ් 1:6, මතෙව් 13:39). දෙවනුව සාතන් මිනිසාගේ එදිරිකාරයාය (සෙකරියා 3:1; 1 පේත්‍රුස් 5:8).

යක්ෂයන්ට වෙනස් ස්වභාවයන් ඇත්තේය. 1 රාජාවලිය 22:23 හි එක් යක්ෂයෙක් බොරුකීමේ ආත්මයක් ලෙස තමාම හඳුන්වා ගත්තේය. මාර්ක් 9:25 හි ගොළු බිහිරි ආත්මයක් පිළිබඳව සඳහන් කර ඇත. දුර්වලකමේ ආත්ම, මුළාකිරීමේ ආත්ම, සහ අපිරිසිදු ආත්ම ලෙස යක්ෂයාගේ විවිධ ස්වාභාවයන් ක්‍රියාත්මක වන්නේය. සාතන් මෙවැනි ආත්ම මිනිසාගේ ආත්මයට ප්‍රාණයට සහ ශරීරයට එරෙහිව සටන් කිරීමට යොදවයි.

### දුර්වලකමේ ආත්ම

ඇදහිලිවතුන්ගේ මෙන්ම නොඇදහිලිවතුන්ගේ ශරීරවලට හිංසා පීඩා කිරීමට හැකි ආත්ම සිටී. ලූක් 13:10-17 කියවන්න. මේ ස්ත්‍රිය දුර්වලකමේ ආත්මයකින් පීඩාවට පත්කරනු ලැබ සිටියාය. ඇය සබත් දින දේව මෙහෙයට පැමිණ සිටි අතර යේසුස්වහන්සේ විසින් "ආබ්‍රහම්ගේ දියණිය" ලෙස අමතනු ලැබුවාය. මේ කරුණු දෙකෙන්ම ප්‍රකාශ වූයේ සැබවින්ම ඇය දෙවියන්වහන්සේ අනුගමනය කරන්නියක බවත්, එහෙත්, ඇගේ ශරීරය අවුරුදු 18 ක් තිස්සේ සාතන් විසින් පීඩාවට පත්කර තිබෙන බවත්ය. (යක්ෂ බලවේගයන් විසින් පීඩාවට පත්කරන ලද අනෙක් ශරීර පිළිබඳ උදාහරණ සඳහා මතෙව් 12:22; 17:15-18; ක්‍රියා 10:38; 2 කොරින්ති 12:7 බලන්න.)

### මුළාකිරීමේ ආත්ම

මේ ආත්ම මිනිසාගේ ආත්මය පීඩාවට පත්කරන අතර බොරු දේවධර්ම විශ්වාස කර සදාකාලික දඬුවමට යොමුවන ලෙස මුළා කරවයි. ඔව්හු බොරු දේවධර්ම, ව්‍යාජ ධර්ම, බොරු ක්‍රිස්තුස්වරු හා බොරු ගුරුවරුන්ගේ ආත්මයන්ය.

**එහෙත් පසු කාලවලදී සමහරු මුළාකරවන ආත්මයන්ද යක්ෂයන්ගේ ගුරුකම්ද සලකා ඇදහිල්ලෙන් අහක්ව යනවා ඇතැයි ආත්මයාණන්වහන්සේ පැහැදිලි ලෙස කියනසේක. (1 තිමෝති 4:1)**

**මක්නිසාද ඔව්හු සර්වපරාක්‍රමවූ දෙවියන්වහන්සේගේ මහත් දවසේ යුද්ධයට මුළු ලෝකයේ රජුන් රැස්කරන පිණිස, ඔවුන් ළඟට යන්නාවූ, හාස්කම් කරන්නාවූ යක්ෂයින්ගේ ආත්මයෝය. (එළිදරව් 16:14)**

**ඔහුගේ ඊම සාතන්ගේ ක්‍රියාකිරීමේ හැටියට බොරුවූ සියලු ආකාර ආශ්චර්යවලින්ද ලකුණුවලින්ද පුදුමවලින්ද, විනාශවෙන්නවුන්ට අධර්මිෂ්ඨකමේ සියලු රැවටිලිවලින්ද යුක්තවේ: මක්නිසාද ගැළවෙන පිණිස ඔව්හු සැබෑකමට ප්‍රේමවීම පිළි නොගත්තෝය. (2 තෙසලෝනික 2:9-10)**

ක්‍රියා පොතෙහි සඳහන් කර ඇති ජේන කීමේ ආත්මය ද මුළා කිරීමේ ආත්මවලට අයත්ය.

**අප යාච්ඤාකරන තැනට යද්දී, ශාස්ත්‍ර කියන ආත්මයක් ඇත්තාවූ, ජේනකීමෙන් ස්වකීය ස්වාමිවරුන්ට බොහෝ ලාභ ඉපදෙව්වාවූ එක්තරා තරුණියක් අපට සම්බවූවාය. (ක්‍රියා 16:16)**

ශාස්ත්‍ර කියන්නන්, යකුන්ගෙන් වැඩ ගන්නා ස්ත්‍රීන් සහ අත්ල, පළිගු බෝලයෙන් හා, අඳුන ආදී දේ බලා ශාස්ත්‍ර කියන්නන් තුළ ජේන කීමේ ආත්ම හෝ "ආත්ම බන්ධන" ක්‍රියාත්මක වේ. ශුද්ධ ලියවිල්ලට අනුකූල නොවන ක්‍රම භාවිතයෙන් ජේන කීමේ ආත්ම අනාගතය පිළිබඳ අනාවැකිද ස්වාභාවිකව නොදන්නා දේ පිළිබඳව කරුණු ද හෙළිදරව් කරයි. ලෙවී කථාව 19:31: 20:6: ද්විතීය කථාව 5:9: 18:18: ලෙවී කථාව 20:27 සහ 1 සාමුවෙල් 28:3 ආත්ම බන්ධන වලට එරෙහිව අනතුරු අඟවා ඇත.

මුළා කිරීමේ ආත්ම හෘද සාක්ෂිය දැඩි කරයි, මුළා කරයි, පොළොඹවයි, පරීක්ෂාවට යොමු කරවයි, ආශා උපදවයි, ඇල්ම ඇති කරයි, වශී කරවයි, පුදුම කරවයි, ඇදගනියි රැවටීමට ලක් කරයි. "ඉහළ ස්ථාන වල ආත්මික දුෂ්ටකම" ඇති කිරීමේදී මුළා කිරීමේ ආත්ම ක්‍රියාකාරී වේ. මුළා කිරීමේ ආත්ම දේවධර්ම වැරදිව පවතින සෑම ව්‍යාජ ධර්මයකම ක්‍රියා කරමින් සිටී. සාතන් නමස්කාරයට මහත්සේ ආශා කරන අතර ලබාගත හැකි ඕනෑම ආකාරයට ඔහු එය ලබා ගන්නා බව මතක තබා ගන්න. මුළාකිරීමේ ආත්ම රූප හෝ සාතන්ට වුවද නමස්කාර කරන පිණිස ස්ත්‍රීන් හා පුරුෂයන් පොළොඹවන්නේය.

## අපිරිසිදු ආත්ම

මේ යක්ෂ බලවේගයන් මිනිසාගේ ආත්මික ස්වභාවයට පීඩා කරන්නේය. ඔවුන් දුරාචාරී ක්‍රියාවන්ට, අශුද්ධ සිතිවිලිවලට, පරීක්ෂාවන්ට හා මනුෂ්‍යයන් හා ස්ත්‍රීන් බැඳ තැබීමට සාතන්, භාවිත කරන අනේක් උපායයන්ට වගකිව යුත්තෝය. අපිරිසිදු ආත්ම තුළින් තනි පුද්ගලයන් පාලනය කිරීමට සාතන්ට හැකිය. තනි පුද්ගලයන්ගෙන් සමන්විත වන නිවෙස්, සභාවන් සහ මුළු දේශය තුළ ක්‍රියාත්මක වීමට ද ඔවුන්ට හැකිය. සමාජයේ විවිධ මට්ටම්වල සාතන් ක්‍රියාකරන්නේ මෙසේය. අපිරිසිදු ආත්මයක් පිළිබඳ උදාහරණයක් සඳහා මතෙව් 10:1: 12:43 සහ මාර්ක් 1:23-26 බලන්න.

# යක්ෂයා පිටස්තරයෙන් පීඩාවට පත්කිරීම, යක්ෂයා දැඩි ලෙස සිතෙහි රඳවා ගැනීම, යක්ෂාවේශවීම

සෙනඟ පිටස්තරයෙන් පීඩාවට පත්කිරීමට දුෂ්ටාත්ම වලට හැකිය. පිටස්තරයෙන් පීඩාවට පත්කිරීම යනු, යටපත් කිරීම, විරුද්ධව පැමිණීම හෝ පිටස්තරයෙන් බැඳ දැමීමය. මේ පීඩාවට පත් කරන්නේ දුෂ්ටාත්ම විසින් විවිධ මාර්ග වලිනි. ඔවුන් දොම්නස ඇති කරන අතර අසුබවාදී වටපිටාවක් නිර්මාණය කරයි. සිය දිවි හානි කර ගැනීම, දුරාචාරය, අවිශ්වාසය, භය ආදී වැරදි සිතුවිලි මනසට ඇතුල් කරයි. යක්ෂයන් මිනිසුන් පව් කිරීමට පොළොඹවන්නාවූ සාතනික වටපිටාවක් සහ තත්වයන් නිර්මාණය කරන්නේය.

**දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරීය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය. (ක්‍රියා 10:38)**

මනුෂ්‍යයන් කෙරෙහි ආවේශවීමටද යක්ෂයන්ට හැකියාව ඇත. යක්ෂාවේශ වීම එක් යක්ෂයෙකු හෝ කිපදෙනෙකු ශරීරයට ඇතුල් වී ඔවුන්ගේ ගොදුර සම්පූර්ණයෙන් ඔවුන්ගේ පාලනයට යටත් කරගන්නාවූ තත්වයකි. යක්ෂාවේශ වීම, වෙනුවට ඇතමුන් "යකෙක් මෙන්" යන වචනය භාවිත කිරීමට ප්‍රිය කරයි. කුමක් භාවිත කරත් යක්ෂාවේශ වූ මිනිසා නවාතැන් ගන්නා යක්ෂයන්ගේ, සත්කාරකරුවෙකු බවට පත්වේ. "යක්ෂාවේශ වීම" යනු යම් පුද්ගලයෙකු ඔහුගේ පාපය පිළිබඳ වගකීමක් නැති බව අඟවන්නක් නොවේ. ඔහු මේ තත්වයට පත්කල හේතු සඳහා ඔහු වගකිව යුතු වේ.

යක්ෂාවේශ වීම තම කැමැත්තෙන්ම සිදුවිය හැකිය. යම් විශේෂ බලයක් ලැබීමට, ශාස්ත්‍ර කීමට, හූනියම් කිරීමට, ශාප කිරීමට, මළවුන් සමඟ සබඳකම් පවත්වා ගැනීමට යම් පුද්ගලයෙකු ආත්ම බලවේග වලට යටත්වීමට ආශා විය හැකිය. යක්ෂාවේශ වීම අකමැත්තෙන් වුවද සිදුවිය හැකිය. යමෙකු යක්ෂාවේශ වීමට ඉල්ලා සිටිනවා නොවිය හැකිය. එහෙත් පාපී සිතුවිලි, ක්‍රියා හෝ ව්‍යාජ ධර්මවලට යටත්වීම තුළින් එය සිදුවිය හැකිය.

දෙමාපියන් තුළ ක්‍රියාකරන යක්ෂ බලවේග සහ දෙමාපියන්ගේ පාප ඵලඟ පරම්පරාවට බලපෑ හැකිය. (නික්මයාම 20:5; 34:7 සහ ද්විතිය කථාව 5:9 බලන්න.) දරුවන්ගේ යක්ෂාවේශ වීමට හෝ යක්ෂ බලපෑම් වලට යටත්වීම පිළිබඳ මාර්ක් 7:24-30 සහ 9:17-21 වාර්තා කර ඇත. .

යක්ෂයා දැඩි ලෙස සිතෙහි රඳවා ගැනීම වැනි දේවල් ද තිබේ. මෙය කෙනෙකු යක්ෂයා ගැන දැඩි උනන්දුවක් හා සෑම විටම සිත තුළ තබා ගැනීම පිළිබඳ තත්වයකි. මෙය ගුප්ත දේවල්, යක්ෂ ආත්ම හා සාතන් කෙරෙහි ඇති අසාමාන්‍ය උනන්දුවකි. එම උනන්දුව ආසාවන් හා කෙනෙකුගේ උද්යෝගයන්, අණ කරන්නාවූ ස්වරූපයෙන් පාලනය කරනු ලැබේ. එලෙස සාතන් පිළිබඳව දැඩි ලෙස සිතෙහි රඳවා තබා ගැනීම නිසා කෙනෙකුට යක්ෂාවේශ වීමද සිදුවිය හැකිය.

## යක්ෂ ආත්ම වලට ඇදහිලිවන්තයන්ට බලපෑම් කළ හැකිද?

යක්ෂ ආත්මයක් වාසය කරන මාළිගයකම ශුද්ධාත්මයාණන්ට ද වාසය කළ නොහැකි බැවින් ඇදහිලිවන්තයෙකුට යක්ෂාවේශ වීම සිදු විය නොහැක :

> **නොහොත් නුඹලාගේ ශරීරය දෙවියන්වහන්සේගෙන් ලැබූ, නුඹලා තුළ ඇත්තාවූ ශුද්ධාත්මයාණන්වහන්සේගේ මාළිගාව බව නොදනිවුද? නුඹලා නුඹලාටම අයිති නැත; මක්නිසාද නුඹලා මිලේටගනු ලැබුවහුය. එබැවින් නුඹලාගේ ශරීරයෙන් දෙවියන්වහන්සේට ගෞරවකරපල්ලා (1 කොරින්ති 6:19-20)**

ඔබ දෙවියන්වහන්සේට අයත්ව, ශුද්ධාත්මයෙන් පිරී සිටින විට, ඔබට සාතන්ට අයත් වී ඔහුගේ ආත්මයන්ගෙන් පිරී සිටිය නොහැකිය. ශුද්ධාත්මයාණන්වහන්සේ සාතන් සමඟ එකම මාලිගයේ වාසය නොකරනු ඇත.

නමුත් ඇදහිලිවන්තයන්ට යක්ෂ ආත්ම වලින් බලපෑම් සිදුවිය නොහැකි බව මින් අදහස් නොවේ. අප පොරබදිනුයේ මෙම බලවේග වලට එරෙහිව වේ. සාතන් යක්ෂ ආත්ම යොදා ගෙන ඇදහිලිවන්තයන්ට පිටස්තරයෙන් සිට පහර දීමට ක්‍රියා කරයි. එවිට දකින්නට ලැබෙන ලක්ෂණ මීට පෙර සාකච්ඡා කරන ලදී. නමුත් සැබෑ ඇදහිලිවන්තයෙකුට ආවේශ වීමට ඔහුට නොහැකිය. "ආවේශ වීම" යන්න අභ්‍යන්තරය තුළ වාසය කිරීමක් පෙන්නුම් කරයි. "පිටත සිට පීඩා කිරීම" හෝ යමෙකුව බැඳ තැබීම යනු බාහිරින් වන බලපෑමකි. තමන්ට පිටස්තරයෙන් පීඩා කිරීමට යක්ෂ ආත්ම වලට ඇදහිලිවන්තයන් ඉඩ හැරියහොත් ඔවුන්ගේ ක්‍රියාවන් සාතන් මඟින් මෙහෙයවන ඒවා බවට පත්විය හැකිය. එවැනි බාහිරින් ක්‍රියා කිරීමට ඉඩ හැරීමක් හෝ යක්ෂ ආත්ම මගින් පුද්ගලයෙකු බැඳ තැබීමක් මඟින් වැරදි අරමුණු උදෙසා ඔවුන්ව පාවිච්චි කිරීමට සාතන්ට අවස්ථාව සැළසේ.

යේසුස්වහන්සේගේ ගෝලයෙක් වූ පේත්‍රුස්ව යොදා ගෙන, සියලු මනුෂ්‍ය වර්ගයාගේ පාපය උදෙසා දිවි පිදීමේ අරමුණින් යේසුස්වහන්සේ වෙනතකට හැරවීමට සාතන් උත්සාහ කිරීමේදී සිදු වූයේ මෙයයි. තමන් මුහුණ දිය යුතු වේදනාව යේසුස්වහන්සේ විස්තර කළ විට, පේත්‍රුස් මෙසේ පැවසුවේය :

> **එවිට පේත්‍රුස් උන්වහන්සේ කැඳවා තරවටුකරන්ට පටන්ගෙන: ස්වාමීනි, එය ඔබ කෙරෙන් දුරුවේවා. ඔබට කිසිකලකත් එසේ සිද්ධ නොවන්නේයයි කීවේය. (මතෙව් 16:22)**

යේසුස්වහන්සේ පේත්‍රුස්ට මෙසේ පැවසූ සේක :

**නුමුත් උන්වහන්සේ හැරී පේත්‍රුස්ට කථාකොට: සාතන් මා පස්සට යව, නුඹ මට බාධාවක්ය. මක්නිසාද නුඹ මනුෂ්‍යයන්ගේ කාරණා මිස දෙවියන්වහන්සේගේ කාරණා කල්පනාකරන්නේ නැතැයි කීසේක. (මතෙව් 16:23)**

පේත්‍රුස් සැබවින්ම සාතන් බව යේසුස්වහන්සේ අදහස් නොකළ සේක. ඒ මොහොතේදී තමන් තුළින් ක්‍රියා කිරීමට පේත්‍රුස් සාතන්ට ඉඩදුන් බව උන්වහන්සේ හඳුනාගත් සේක. පේත්‍රුස් යක්ෂාවේශ වී තිබුණේ නැති නමුත්, ඔහුට බලපෑම් කිරීමට ඔහු යක්ෂ ආත්ම වලට ඉඩහැරියේය. තමන්ගේම ක්‍රියා තුළින්, ඇදහිලිවන්තයන් තමන් පාවිච්චි කිරීමට සාතන්ට ඉඩ හරී (අවස්ථාව සළසා දෙයි) (එපීස 4:27).

කෙනෙකු නැවත ඉපදීම ලැබූ විට, ස්වර්ගයේ ඇති ජීවනයේ පොත නමැති විශේෂ පොතක ඔහුගේ නම සටහන් වේ. ස්වර්ගයේ සදාකාලිකව ජීවත් විය හැක්කේ මෙම පොතෙහි තම නම ඇති අයට පමණි :

**යමෙකුගේ නම ජීවන-පොතෙහි ලියා නැති බව සම්බවීද, ඔහු ගිනිවිලට හෙළනු ලැබුවේය. (එළිදරව් 20:15)**

ජීවනයේ පොතෙහි ඔබේ නම සටහන් කරගෙන නමුත්, පසු කළෙක ඔබ නැවත පව්කාර ජීවිතයට හැරී යාම නිසා ඔබගේ නම මකා ගැනීමට ද හැකිය :

**ජයගන්නා නම් මෙසේ සුදු වස්ත්‍රයෙන් පළඳවනු ලැබේ: ඔහුගේ නම ජීවන - පොතෙන් කිසිසේත් මකා නොහැර, මාගේ පියාණන්වහන්සේද උන්වහන්සේගේ දූතයන්ද ඉදිරියෙහි ඔහුගේ නාමය පිළිගන්නෙමි. (එළිදරව් 3:5)**

ඇදහිලිවන්තයන් දැන දැනම, සමාව නොගෙන පාපයේ ජීවත් වුවහොත්, ඔහු කිතුනුවෙකු වීම ඇනහිටින අවස්ථාවක් තිබේ. අන් අයට දේශනා කිරීමෙන් පසුව, ඔහුවම එපා නොකරන පිණිස පාවුල් සැළකිලිමත් වූහ :

**නුමුත් මාගේ ශරීරය දමනයකර වාල්කමට පමුණුවමි. එසේ කරන්නේ අනුන්ට දේශනාකළාට පසු කොයි ලෙසකින්වත් මාම එපාකරනු නොලබන පිණිසය. (1 කොරින්ති 9:27)**

තමා අන් අයට දේශනා කළත්, පාපය, විශේෂයෙන් සමාව නොගෙන දිගින් දිගටම කරගෙන යන මාංගයේ පාපයන් නිසා, තමාට තමාගේම ආත්මය අහිමි විය හැකි බව පාවුල් තේරුම් ගත්තේය.

දිගින් දිගටම පාපයේ ජීවත්වීම නිසා ඔබ අවසානයේදී පසුබට වීමේ තත්වයකට ලක් විය හැකිය. එහි අදහස ඔබ තවදුරටත් යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනුගාමිකයෙක් නොවනු ඇති බවය. ඔබ දිගින් දිගටම දැන දැනම සමාව නොලැබූ පාපයන් තුළ ජීවත් වේ නම්, කවර මොහොතේදී ඔබට නැවත කිතුනුවෙකු වීමට ඇති අවස්ථාව අහිමි වී ඔබ සාතන්ගේ රාජ්‍යයේ කොටසක් බවට පත්වනු ඇතිදැයි කිසිවෙකුටත් පැවසිය නොහැකිය. එම අවස්ථාව තීරණය කරනුයේ දෙවියන්වහන්සේය. නමුත් එම අවස්ථාව පැමිණි විට, ඔබ සාතන්ගේ මහත් ප්‍රහාරයන්ට ඔබ විවෘත කරන අතර, එවිට යක්ෂ ආත්මවලට ආවේශ වීමේ හැකියාවක් ද තිබේ. ඔබ පාපයක් කළ විට ඉක්මනින්ම පව් සමාව ලබාගෙන ඔබගේ අධර්මිෂ්ඨ බවින් හැරීම වැදගත් වන්නේ මේ හේතුවෙනි :

**අපේ පාපවල් කියාදෙමු නම්, අපේ පව් අපට කමාකරන්ටත් සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍රකරන්ටත් උන්වහන්සේ විශ්වාසව ධර්මිෂ්ඨව සිටිනසේක. අපි පව්කළේ නැතැයි කියමු නම්, අපි උන්වහන්සේ බොරුකාරයෙක් කරමුව. උන්වහන්සේගේ වචනද අප තුළ නැත. (1 යොහන් 1:9-10)**

බයිබලයේ බොහෝ අවස්ථාවල යේසුස්වහන්සේ දෙවියන්වහන්සේගේ වාක්‍යාණෝ ලෙස හඳුන්වා දී තිබේ. දේව වචනය ඔබ තුළ නොපවතී නම්, යේසුස්වහන්සේද ඔබ තුළ වාසය නොකරන සේක.

# යක්ෂ ආත්ම වලට පාලනය ලැබෙන ආකාරය

ආකාර කිහිපයකින් යක්ෂ ආත්ම වලට පාලනය ලැබේ :

1. **පාරම්පරාව තුළින් :** තම දෙමාපියන්ට පැවති තත්ව හේතුවෙන් කෙනෙකුට යක්ෂයා විසින් බාහිරින් පීඩා කිරීමක් හෝ යක්ෂාවේශ වීමක් ඇතිවිය හැකිය. දරුවන් කෙරෙහි ඇති යක්ෂ බලපෑම් වලදී මෙය දැකිය හැකිය (නික්මයාම 20:5; 34:7; ද්විතිය කතාව 5:9).

2. **මනස තුළින් :** මනස යනු සාතන්ගේ ප්‍රධාන යුද පිටියකි. සාතන්ට ඔබගේ සිතුවිලි පාලනය කළ හැකිනම්, ක්‍රමානුකූලව ඔහු විසින් ඔබගේ ක්‍රියාවන් පාලනය කරනු ඇත. මනස පාලනය කර නොගැනීම නිසා ක්‍රමානුකූලව ඔබේ කැමැත්ත පිළිබඳ ඔබට ඇති බලය අහිමි විය හැකි අතර එමඟින් පව්කාර ක්‍රියාවන් කිරීම සිදුවිය හැකිය. පව්කාර සිතුවිලි හා ක්‍රියාවන් තුළ දිගින් දිගටම නියැලීම නිසා යක්ෂයා විසින් බාහිරින් බලපෑම් කිරීම හා යක්ෂාවේශ වීම සිදුවිය හැකි අතර එමඟින් අවසානයේදී රෝම 1 හි විස්තර කරන ආකාරයේ දුෂ්ට මනසක් ඇතිවිය හැකිය. මෙය සම්පූර්ණයෙන්ම නපුරු සිතුවිලි මඟින් පාලනය කරනු ලබන මනසකි.

   මනස විකෘති කරන බෙහෙත් වර්ග තුළින් ද යක්ෂයන් ක්‍රියා කිරීමට පටන් ගන්නා අතර එමඟින් යක්ෂ ආත්ම වලට විරුද්ධ වීමට ඇති හැකියාව අඩු කරන බැවින් එමඟින් යක්ෂ ආත්ම වලට ක්‍රියාකාරී වීමට වැඩි ඉඩක් ලබා දේ. මනස යම් අදහස් වලින් පුරවීම සහ මනස පාලනය කරන ආකාරය පිළිබඳ ඉගැන්වීම් මඟින් ද යක්ෂයන්ට ඇතුළු වීමට අවස්ථාව ලබා දේ.

3. **පව්කාර ක්‍රියාවන් තුළින් :** පව්කාර සිතුවිලි, පව්කාර ක්‍රියාවන් තුළින් ඉක්මනින් ඉටු වේ. උදාහරණයක් ලෙස කාමම්ථ්‍යාචාරය පිළිබඳ සිතුවිලි කාමම්ථ්‍යාචාරයේ යෙදීමේ ක්‍රියාවන් තුළින් ඉක්මනින් ඉටුවේ. පාපය කැරලි ගැසීමක් වන අතර කැරලි ගැසීමේ සිතුවිලි හා ක්‍රියාවන් තුළින් යක්ෂයාගේ ක්‍රියාකාරීත්වයන්ට ඇතුළු වීමට ඉඩ සළසා දෙයි.

   ඇදහිලිවන්තයෙකු පව්කාර සිතුවිලි හෝ ක්‍රියාවන් තුළ දිගින් දිගටම සිටියහොත් ඔවුන් යක්ෂයාට "ඉඩ හරී" (එපීස 4:27). සතුරාගේ ක්‍රියාකාරීත්වයට වැඩි ආත්මික ඉඩකඩක් ලබා දේ. ගුප්ත වස්තු, ලියවිලි, මළවුන් සමඟ සම්බන්ධතා පැවැත්වීම, ආදී දේවල් ඇතුළත් පව් යනු විශේෂයෙන් භයානක හා යක්ෂ බලවේග ඇද බැඳ තබාගන්නා ක්‍රියාවන්ය.

   පාපය තුළ ජීවත්වන නොඇදහිලිවන්තයන් යක්ෂයාගෙන් සිදුවන පිටස්තර බලපෑම් වලට පමණක් නොව යක්ෂාවේශ වීම් වලට ද විවෘත වේ. ආත්මික සටන සිදුවනුයේ ස්වාභාවික භූමියක නොවේ. ඔබ යහපත හෝ නපුර යන පක්ෂ දෙකෙන් එකක වේ. ඔබ දෙවියන්වහන්සේට හෝ සාතන්ට අයිති වේ. ඔබ සාතන්ට අයත්ව ක්‍රිස්තුස්වහන්සේ තුළ නැවත උත්පාදනය ලැබ නැතිනම්, ඔහුගේ කැමැත්තට අනුව පිටින් සිට ඔබට පීඩා කිරීමට හෝ ආවේශ වීමට ඔබ ඔහුගේ පාලනය යටතේ වේ.

4. **ආශාව තුළින් :** ඇතැම් පුද්ගලයන් යක්ෂයාගේ පාලනය යටතේ සිටීමට ආශා කරන අතර එසේ කරන ලෙස ඉල්ලා සිටී. ඔවුන් මෙසේ කරනුයේ අධිස්වාභාවික බලයක් ලබා ගැනීමේ හෝ අධිස්වාභාවික ක්‍රියාවන් කිරීමේ අරමුණ ඇති වේ.

5. **හිස් වූ නිවසක් තුළින් :** තමන් වාසය කරන පුද්ගලයාගේ ශරීරය තම නිවස ලෙස යක්ෂ ආත්ම විසින් සළකයි (මතෙව් 12:44). පුද්ගලයෙකු යක්ෂ ආත්ම වලින් නිදහස් කරනු ලැබූ නමුත් නැවත ඉපදීම ලබා ශුද්ධාත්මයාණන්වහන්සේ ලබා ගැනීම තුළින් තම ආත්මික නිවස පුරවා නොගන්නේ නම්, නැවත ඇතුළුවීමක් සිදු විය හැකිය.

6. **අවසර දීම තුළින් :** ඇතැම් අවස්ථා වලදී විශේෂ අරමුණු ඉටුකර ගැනීම සඳහා දෙවියන්වහන්සේ යක්ෂ ආත්ම වලට අවසර ලබා දේ. ඇදහිලිවන්තයන් උදෙසා පරීක්ෂාවක් ලෙස පැමිණීමට ඉඩ දිය හැකිය. යෝබ්ගේ අවස්ථාව සේ. එසේම සාවුල්ගේ වැනි තත්වයකදී එය පව් උදෙසා වූ විනිශ්චයක් ද විය හැකිය.

# යක්ෂ ආත්ම සමඟ කටයුතු කළ යුත්තේ කවුරුන්ද?

යක්ෂ ආත්ම සමඟ ගනුදෙනු කිරීම සම්පූර්ණ කාලීන දේව සේවකයන්ට පමණක් සීමා වූ දෙයක් නොවේය. සෑම ඇදහිලිවන්තයෙකුටම යක්ෂ බලවේග වලින් ජය ගැනීමට බලය ඇති බව යේසුස්වහන්සේ පැවසූ සේක :

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථාකරන්නෝය; (මාර්ක් 16:17)**

යේසුස්වහන්සේ තම අනුගාමිකයන්ට යක්ෂ ආත්ම සමඟ ගනුදෙනු කිරීමේ හැකියාව ලබාදුන් සේක. උන්වහන්සේ පළමුව තම ගෝලයන්ට එවැනි බලයක් පවරා දුන් සේක :

> **තවද උන්වහන්සේ තමන් ගෝලයන් දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, අශුද්ධාත්මයන් දුරුකරන්ට ඔවුන් කෙරෙහිද සියලු ආකාර ලෙඩ සහ සියලු ආකාර රෝග සුවකිරීමටද, ඔවුන්ට බලය දුන්සේක. (මතෙව් 10:1)**

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලයදී, (මාර්ක් 6:7)**

උන්වහන්සේ එම බලයම සියලු ඇදහිලිවන්තයන්ට පවරා දුන් සේක :

> **අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය; අන් භාෂාවලින් කථාකරන්නෝය; (මාර්ක් 16:17)**

> **රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:8)**

මෙම වැදගත් සේවය නිශ්චිත මිනිසුන් කණ්ඩායමකට පවරා දීමට දෙවියන්වහන්සේ අදහස් කළ බව විශ්වාස කිරීමට කිසිඳු බයිබලීය පදනමක් නොමැත. සමාරියේ යක්ෂ ආත්ම පළවා හැරීමට පිලිප් නැමැති ගිහි මනුෂ්‍යයෙක් දෙවියන්වහන්සේ විසින් යොදාගනු ලැබීය (ක්‍රියා 8). ස්කෙවාගේ පුත්‍රයන් කළාක් මෙන්, නිසි සූදානමකින් තොරව යක්ෂ ආත්ම වලට මුහුණ දීමට ඇදහිලිවන්තයන් ඉක්මන් විය යුතු බව මින් අදහස් නොවේ (ක්‍රියා 19).

අදහිලිවන්තයන් ප්‍රමාණය ඉක්මවා යක්ෂ ආත්ම ගැන සැළකිලිමත් නොවී සිටීම ද වැදගත්ය. අපව කැඳවා ඇත්තේ අනවශ්‍ය ලෙස යක්ෂයන්ට අවධානය දීමට නොවේ. "යක්ෂයන් දුරු කිරීම" යනුවෙන් ආත්මික දීමනාවක් නොමැත. නමුත් ඔබ යක්ෂ බලවේග වලට බිය විය යුතු නොවේ. යක්ෂ ආත්ම වලින් බලපෑම් කරනු ලැබූ අයකු මුණගැසුණු විට ඔවුන්ට දෙවියන්වහන්සේගෙන් මිදීම ගෙන ඒමට ඔබට බලය තිබේ.

# යක්ෂ ආත්ම ඇති තැන් හඳුනාගැනීම

යක්ෂ ආත්ම වලින් ජය ගැනීමට නම්, ඔවුන් පවතින ස්ථාන හා ඔවුන්ගේ උපක්‍රම හඳුනා ගැනීම වැදගත් වේ. මෙම අරමුණ ඉටුකර ගැනීමට "ආත්ම විමසීම" නම් විශේෂ ආත්මික දීමනාවක් ශුද්ධාත්මයාණන් විසින් ලබා දී තිබේ (1 කොරින්ති 12:10).

විමසීම යනු, "සොයා ගැනීම, ඇගයීම, හා වෙන්කොට හඳුනා ගැනීම" වේ. ආත්ම විමසීමේ ආත්මික දීමනාව, අන් අය තුළ ක්‍රියාත්මක වන ආත්ම හඳුනා ගැනීමට උපකාරී වේ. යක්ෂ ආත්ම සොයා ගැනීමට, ඇගයීමට හා වෙන්කොට හඳුනා ගැනීමට එය උපකාරී වේ.

යක්ෂ බලවේග සමඟ ගනුදෙනු කිරීමේදී ආත්ම විමසීමේ දීමනාව ඉතා වැදගත් වේ. පුද්ගලයෙකු තුළ හෝ ඔහුට විරුද්ධව යක්ෂ ආත්මයක් ක්‍රියාත්මක වේද නොවේද යන්න හඳුනාගැනීමට එය ඔබට උපකාරී වේ. මුළා කරවන හෝ බොරුකාර ආත්ම වලින් රවටනු ලැබීම එමඟින් වළකාලයි. මෙම ආත්මික දීමනාව සහිත පුද්ගලයාට නපුරාගේ උපක්‍රම හා යක්ෂ බලවේග වල උත්සාහයන් හඳුනාගත හැකිය.

උදාහරණයක් ලෙස, ඇතැම් ගොළුභාවයන් හා බිහිරිභාවයන් (බයිබලීය වාර්තා අනුව) ඇතිවන්නේ ආත්මයක් නිසාය. අනෙක් අවස්ථා වලදී ඒවා අනතුරක් හෝ රෝගයක් නිසා ඇතිවන්නක් විය හැකිය. විමසා බැලීම තුළින් විශේෂිත සේවයට අවස්ථාව සැළසෙන පරිදි ඇතිවී තිබෙන තත්වය පිටුපස ඇති හේතුව හඳුනා ගැනීමට ඔබට හැකියාව ලබා දෙයි.

සියලුම ඇදහිලිවන්තයන්ට මෙම ආත්ම විමසීමේ විශේෂ ආත්මික දීමනාව නැත. ඇදහිලිවන්තයෙකුට මෙම දීමනාව නොමැතිනම්, යක්ෂ ආත්ම පවතින බව නිරීක්ෂණය කළ හැකි ලකුණු තිබේ. තම දියණිය තුළ ඇති අපවිත්‍ර ආත්මය පළවා හරින ලෙස ඉල්ලමින් කානානිය ස්ත්‍රිය යේසුස්වහන්සේ වෙතට පැමිණි විට, "මගේ දුව බලවත් ලෙස යක්ෂාවේශව සිටින්නීය"යි ඇය පැවසුවාය (මතෙව් 15:22). ඇය මේ බව දැන ගත්තේ කෙසේද? ඇය එය දැන ගත්තේ ලකුණු වලිනි. යක්ෂ ආත්ම විසින් කෙනෙකුට කරන දේවල් නිරීක්ෂණය කිරීමෙන් මෙසේ හඳුනාගත හැකිය.

යක්ෂ ආත්ම වල ක්‍රියාකාරකම් පිළිබඳ ලකුණු කිහිපයක් පහත දැක්වේ :

**යක්ෂයා දැඩි ලෙස සිතෙහි රඳවා තබා ගැනීම :** යක්ෂ ආත්ම, සාතන් හෝ ගුප්ත දේවල් සමඟ පවත්වන, පාලනය කළ නොහැකි හා අසාමාන්‍ය සම්බන්ධකම් තුළින් මෙය හඳුනාගත හැකිය. එවැනි පුද්ගලයෙකු ගුප්ත සිරිත් විරිත් පිළිපැදීම, නිරන්තරයෙන් සෑම දෙයකම ගෞරවය සාතන්ට හෝ යක්ෂ ආත්ම වෙත දීම හෝ යක්ෂ ආත්ම හා සාතන් ගැන අධ්‍යයනයට දැඩිව සිත යොමු කිරීම ආදිය සිදු කළ හැකිය.

**යක්ෂයා පිටස්තරයෙන් සිට පීඩා ගෙන දීම** පහත සඳහන් ලකුණු වලින් හඳුනාගත හැකිය:

1. ශාරීරික බැඳීමක් : දුර්වලකමේ ආත්මයක් බව යේසුස්වහන්සේ එළිදරව් කළ "ආබ්‍රහම්ගේ දියණිය" ශාරීරික බැඳීමකට ලක්ව තිබුණි. ලූක් 13:10-17 බලන්න. නිදන්ගත රෝග, යක්ෂයා පිටතින් සිට කරන බලපෑමක් විය හැකිය. සියලුම ලෙඩරෝග යක්ෂ ආත්ම නිසා ඇති වන ඒවා නොවේ. ඇතැම් රෝග නිසි ලෙස ආහාර නොගැනීම් හා අපිරිසිදු ජලය පානය කිරීම වැනි ස්වාභාවික නීති කඩ කිරීම නිසා ඇතිවන ඒවා වේ. ඇතැම් රෝගාබාධ දඬුවම් සඳහා පැමිණෙයි. බයිබලයේ සඳහන් ආකාරයට දෙවියන්වහන්සේට ගෞරවය නොදීම නිසා එක් රජ කෙනෙකුගේ බඩවැල් වල පණුවන් ඇති වී ඔහු මිය ගියේය !

2. මානසිකව ඇතිවන පීඩාවන් : මනසේ ඇති වන බාධාකාරී තත්වයන් හෝ මානසික පීඩාව, අවුල් සහගත බව, සැකය, මතකය අහිමි වීම වැනි සිතුවිලි සම්බන්ධ තත්වයන්ය. අවිවේකී බව, කරුණු පැහැදිලි කිරීමට ඇති නොහැකියාව හෝ අන්‍යයන්ට සවන් දීමට ඇති නොහැකියාව, අසාමාන්‍ය ලෙස කතා කිරීම හෝ නිදහස්ව කතා නොකිරීම වැනි දේවල් පෙන්නුම් කළ හැකිය. සියලුම මානසික ප්‍රශ්න සාතන් මඟින් ඇති කරන ඒවා නොවේ. ඇතැම් ආහාර වලට අසාමාන්‍ය ලෙස සංවේදී වීම නිසා හෝ මනස තුළ ඇති රසායන ද්‍රව්‍යයන්වල අසමතුලිත බව නිසා අධෛර්යයට පත් වීම, දොම්නස හා අන්ද මන්ද ස්වභාවය ඇතිවිය හැකිය. යක්ෂයා නිසා ඇති වන මානසික ගැටලු හා රෝග වලට මිදීම ගෙන දීමට ද අනෙකුත් මානසික ගැටලු හා රෝග වලට සුවය ගෙන දීමට ද දෙවියන්වහන්සේට හැකියාව තිබේ. නමුත් සියලුම මානසික ගැටලු හා රෝග යක්ෂ ආත්ම නිසා ඇතිවන ඒවා ලෙස සැළකීම යුතු නොවේ. ඇතැම් විට ශාරීරික හේතූන් නිසා ඇතිවන ගැටලු හා රෝග ආහාර රටාවේ හෝ ජීවන රටාවේ සුළු වෙනසකින් පවා ඉවත් කිරීමට හැකිය.

3. හැඟීම් පිළිබඳ ගැටලු :හැඟීම් කෙරෙහි නොනැවතී පවතින හෝ වරින් වර සිතට නැගෙන බාධාවන්. ඒවා සමහරක් අමනාපය, වෛරය, තරහව, බිය, ප්‍රතික්ෂේපවීම, තමා ගැන දුක්වීම, අනුකම්පාව, ඊර්ෂ්‍යාව, අධික පීඩනය, කනස්සල්ල, අනාරක්ෂිත බව, පහත් බව, විය හැකිය.

4. ආත්මික ගැටලු : පව්කාරී ක්‍රියාවන් ද ඇතුළුව, පාපය ජය ගැනීමට ඇති තදබල අපහසුතාවය. ගැටලු වලට දෙන්නාවූ ආත්මික පිළිතුරු ප්‍රතික්ෂේප කිරීම, ගුප්ත වස්තූන් හා ලියවිලි කෙරෙහි ඇති බැඳීම් ද ඇතුළත්ව, ඕනෑම ආකාරයක මූලධර්මානුකූල වැරදීමක් හෝ රැවටීමක්.

5. බාහිර තත්වයන් : බාහිර පීඩාවන් ඇති කරන අසිරු තත්වයන් නිර්මාණය කිරීමට යක්ෂ ආත්ම වලට හැකිය. එවැනි තත්වයන් තුළ සාමාන්‍යයෙන් වියවුල් බව පවතින අතර දෙවියන්වහන්සේ වියවුල් බවේ දෙවිඳුන් නොවන බැවින් ඒවා යක්ෂ ආත්ම නිසා ඇතිවන දේවල් ලෙස හඳුනාගත හැකිය (1 කොරින්ති 14:33; යාකොබ් 3:16).

**යක්ෂාවේශ වීම** පහත ලකුණු වලින් හඳුනාගත හැකිය :

1. අපවිත්‍ර ආත්මයක් වාසය කිරීම : සාදාචාරාත්මක අපවිත්‍ර බව හා අශික්ෂිත භාවය තුළින් මෙය පෙන්නුම් කෙරේ. නිරුවතින් ඇවිදීමට ඇති ආශාව ඊට ඇතුළත් විය හැකිය. උදාහරණ සඳහා මාර්ක් 5:2 හා ලූක් 8:27 බලන්න.

2. අසාමාන්‍ය ශාරීරික ශක්තිය : සාමාන්‍ය හැකියාවන්ගෙන් ඔබ්බට ශක්තිය පෙන්නුම් කරන පුද්ගලයෙක්. උදාහරණ සඳහා මාර්ක් 5:3 හා ලූක් 8:29 බලන්න.

3. මීමැස්මොරය වැනි රෝග තත්ව : මෙහිදී වෙව්ලීමත් සමඟ මුඛයෙන් සෙම පිටවීමද සිදුවේ. මාර්ක් 9:14-29 හා ලූක් 8:26-29 බලන්න.

4. ආත්මික දේවල් ප්‍රතික්ෂේප කිරීම : මාර්ක් 6:7 හා 1:21-28 හි සඳහන් වාර්තාවල, යක්ෂයන් ක්ෂණිකව යේසුස්වහන්සේ කවුද යැයි දැනගත් අතර තමන් අතහැර යන ලෙස උන්වහන්සේගෙන් ඉල්ලුවෝය. යේසුස්වහන්සේගේ නාමය, යාච්ඤාව හා දේව වචනය කෙරෙහි ඇති බිය සහ ආත්මික දේවල් වලට ශාප කිරීම යක්ෂාවේෂ වීම් වල ලකුණු වේ. අධික ලෙස ශාප කිරීම, ආත්මික දේවල් ගැන සඳහන් කළ විට ශාරීරිකව ඇතිවන වෙනස්කම් හා හදිස්සියේ හැසිරීමේ ඇතිවන වෙනස්කම් තුළින් හඳුනාගැනීමට හැකිය.

5. පෞරුෂත්වයේ හා/හෝ කටහඬෙහි ඇතිවන වෙනස්වීම් : සාමාන්‍යයෙන් ලැජ්ජාශීලි පුද්ගලයෙක් කලහකාරී හෝ විප්ලවකාරී තත්වයට පත්විය හැකිය. ක්‍රියාවන් මෙන්ම ස්වරූපය ද වෙනස් විය හැකිය. සදාචාරාත්මක චරිතය හා බුද්ධිමත්භාවය වෙනස් විය හැකිය. කටහඬ වෙනස් විය හැකිය. මාර්ක් 5:9 බලන්න.

6. ශාරීරික ආබාධ ඇති වීම : යක්ෂාවේශ වීම් වලදී, බොහෝ අවස්ථාවලදී මනසට හෝ ස්නායු පද්ධතියට ඇතිවන ආබාධ වලින් මෙය පෙන්නුම් කෙරේ. (මතෙව් 9:33; 12:22; මාර්ක් 5:4-5 බලන්න). මේ තුළ සාමාන්‍යයෙන් "හිර කිරීම" හෝ ශාරීරිකව නාස්ති වීම ඇතුළත් විය හැකිය. (මාර්ක් 9:14-29 බලන්න)

7. තමන් විසින්ම ඇතිකර ගන්නා ශාරීරික ආබාධ : තමන්ටම ගිනි තබාගත් පුතෙකු සිටි මිනිසෙකුගේ කතාවක් මතෙව් 17:14-21 හි සඳහන් වේ. ලූක් 8:26-39 දී යක්ෂාවේෂ වූ මිනිසෙකු තමාටම ආබාධ ඇති කර ගැනීමට ගල් වලින් තමාවම කපා ගත්තේය.

8. තදබල සිත් තැවුල : යක්ෂා වේශ වීම නිසා ඇතිවූ තදබල අධ්‍යාත්මික පීඩාව නිසා මිනිසෙකු හඬමින් එහේ මෙහේ ගිය බව ලූක් 8:28 හි සඳහන් වේ.

9. සාමාන්‍ය ලෙස ජීවත්වීමට ඇති නොහැකියාව : මේ මිනිසාට සමාජයේ ජීවත්විය නොහැකි වූ අතර සුසාන භූමි වල ඇති සොහොන් ගෙවල් වල ජීවත් විය. ලූක් 8:27 බලන්න.

10. බයිබලයට අනුකූල නොවන ක්‍රම වලින්, අනාගතයේ සිදුවන දේවල් පැවසීමට හෝ නොදන්නා දේවල් සොයාගැනීමට ඇති හැකියාව. ක්‍රියා 16:16 හි සඳහන් කාන්තාවට පේන කීමේ ආත්මයක් ආවේශව තිබූ බව පැවසේ.

පහත දේවල් මඟින්ද යක්ෂයා තදබල ලෙස සිතෙහි රඳවා තබාගැනීම, යක්ෂාවේශ වීම හා යක්ෂයා පිටතින් පීඩා කිරීම පෙන්නුම් කළ හැකිය :

1. අසභ්‍ය දේවල් නැරඹීම, අනාචාරය, අවිවාහක ස්ත්‍රීන් හා පුරුෂයන් ලිංගික සේවනයේ යෙදීම, ස්වයං වින්දනය, සමලිංගික සම්බන්ධතා හා වෙනත් ලිංගික පව් වැනි පීඩාකාරී සදාචාර විරෝධී හැසිරීම්, පිළිවෙලක් නැති ලෙස ආහාර ගැනීම, සියදිවි නසා ගැනීම,

තම අතපය කපා ගැනීම, තමාට හානි පමුණුවා ගැනීම හා මිනීමැරීම කෙරෙහි ඇති දැඩි පෙළඹවීම.

2. මත්කුඩු හෝ මත්පැන් වලට ඇබ්බැහිවීම.

3. සැබෑවූ එකම දෙවියන්වහන්සේ වෙත කේන්ද්‍රගත නොවූ සහ උන්වහන්සේ වෙතින් නොවූ භාවනා, දර්ශන හා මෙනෙහිකිරීම්.

4. බිය, කණස්සල්ල, මානසික පීඩාව, වෛරය, කෝපය, ඊර්ෂ්‍යයාව, ඕපාදූප කීම, අන් අයගේ දේට ආසා කිරීම ,උඩගුකම, තික්තකම, සෘණාත්මක ආකල්ප හා විවේචනය වැනි හැඟීම් වලට ඇති බැඳීම.

## මිදීම උදෙසා සේවය කිරීම

යක්ෂයාගේ බලපෑමට යටත්ව සිටින අයට සේවය කිරීම උදෙසා උපදෙස් කිහිපයක් පහත දැක්වේ :

### ඔබ තුළ මූලික සූදානම :

ඇදහිල්ල පැමිණෙනුයේ දෙවියන්වහන්සේගේ විශේෂිත හෝ "රීමා" වචනය ඇසීමෙනි. නව ආකල්පයකින් නව ගිවිසුම කියවීමට පටන් ගැනීමෙන් ඔබේ හදවත තුළ ඇදහිල්ල ගොඩනඟා ගැනීමට පටන් ගන්න.

- යේසුස්වහන්සේ තම අනුගාමිකයින්ට කරන ලෙස පැවසූ දේවල් කිරීමට පටන් ගන්න.

- තමා විසින් කරනු ඇතැයි යේසුස්වහන්සේ පැවසූ දේවල් කරනු ඇති ලෙස උන්වහන්සේ කෙරෙහි බලාපොරොත්තු වන්න.

- සාතන්ගේ බලපෑමට යටත්වූ අය නිදහස් කිරීමට ඔබට හැකි බව උන්වහන්සේ පැවසුවේ නම්, නිදහස් වනු දැකීමට බලාපොරොත්තු වන්න.

- යක්ෂයන් පළවා හරින ලෙස උන්වහන්සේ පැවසුයේ නම්, උන්වහන්සේගේ නාමයෙන් එසේ කර ඔවුන් ඔබට අවනත වනු ඇතැයි බලාපොරොත්තු වන්න.

මනුෂ්‍යයන්ගේ සියලුම ඉගැන්වීම් හා ඔබගේ පෞද්ගලික අත්දැකීම් නොසළකා හරින්න. නවගිවිසුම තුළින් කියැවෙන දේම ඉන් අදහස් වන බව පිළිගන්න. එය සත්‍ය ලෙස පිළිගෙන ඒ අනුව ක්‍රියා කරන්න. ඔබ ක්‍රිස්තුස්වහන්සේගේ තානාපතියෙකි (2 කොරින්ති 5:20). තමා නියෝජනය කරන රට එහි වචනය වෙනස් කරනු ඇති බවට තානාපතියෙකු කිසිදාක සැක නොසිතයි.

ඔබ මිදීම උදෙසා සේවය කිරීමට පෙර නිරාහාරව සිට යාච්ඤා කරන්න. මිදීම උදෙසා බලය හා ආධිපත්‍ය දෙවියන්වහන්සේගෙන් පැමිණෙන බැවින්, උන්වහන්සේ සමඟ සම්බන්ධව සිටීම යෝග්‍යය ! ඇතැම් යක්ෂ ආත්ම පිටතට පැමිණෙනුයේ යාච්ඤාව හා නිරාහාරය තුළින් පමණි. අන් අයගේ අවශ්‍යතා උදෙසා සේවය කිරීම උදෙසා වූ උපවාසයට දෙවියන්වහන්සේ ගරු කරන බව යෙසායා 58 හි උගන්වයි.

### අන් අය තුළ මූලික සූදානම ඇති කිරීම :

හැකි සෑම අවස්ථාවකදීම, යක්ෂ ආත්ම බැඳ දැමීමේදී හා පළවා හැරීමේදී ඇදහිලිවන්තයන් කණ්ඩායමක් පාවිච්චි කළ යුතුය. යේසුස්වහන්සේ තම ගෝලයන් සේවය සඳහා පිටත් කර හැරියේ දෙදෙනා බැගිනි :

> **එකල උන්වහන්සේ දොළොස්දෙනා තමන් ළඟට කැඳවා, ඔවුන් දෙදෙන දෙදෙනා බැගින් යවන්ට පටන්ගෙන, අශුද්ධාත්මයන් කෙරෙහි ඔවුන්ට බලයදී, (මාර්ක් 6:7)**

ඔබට යක්ෂ ආත්ම වලින් බලපෑමක් වූ පුද්ගලයන් හමු වූ විට ඔවුන්ට තනිව සේවය කළ නොහැකි බව මින් අදහස් නොවේ. නමුත් තවත් ඇදහිලිවන්තයෙකු සමඟ එක්සත්ව කරන යාච්ඤාවේ බලයක් තිබේ. ශක්තිය පැමිණෙන්නේ එක්සත් බව තුළින් වන බැවින්, මිදීමේ සේවය උදෙසා ඔබ සමඟ එකතු වන සියලුදෙනා යාච්ඤාවෙන් හා නිරාහාරයෙන් සමාන ලෙස සූදානම් විය යුතුය.

යක්ෂයා තද බල ලෙස සිතෙහි රඳවා ගැනීම හෝ පිටතින් සිට පීඩා කිරීම වැනි තත්වයකදී (දොම්නස, යක්ෂයා විසින් ඇති කරනු ලැබූ රෝගාබාධ වැනි) සේවය ලැබීමට සිටින පුද්ගලයාව සූදානම් කරන්න. නිදහස් කිරීම පිළිබඳව දෙවියන්වහන්සේගේ “රීමා” වචනය තුළින් ඔවුන්ගේ ඇදහිල්ල ගොඩනඟනු ලැබිය යුතුය. (යක්ෂාවේශව සිටියදී මෙය කළ හැකි දෙයක් නොවිය හැකිය.)

යක්ෂ ආත්ම මඟින් බලපෑමට ලක්වූ පුද්ගලයාට නිසි උපදෙස් ලබා නොදී යාච්ඥා කරන්නේ නම්, එය යේසුස්වහන්සේ කවුද යන්න සහ තම පාපය හා ගැළවීම උදෙසා වූ අවශ්‍යතාවය දැනගැනීමෙන් තොරව ගැළවීම නොලත් පුද්ගලයෙකුට යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තම ගැළවුම්කරු ලෙස පිළිගන්නා මෙන් පැවසීම වැනිය. ශුභාරංචිය බෙදා ගැනීමේදී, ඥාණවත් ආත්ම දිනාගන්නෙක් ඉක්මන් තීරණ ගැනීමට මිනිසුන් පොළඹවන්නේ නැත. මූලිකව කළ යුතු සේවයක් තිබේ. නිසි උපදෙස් ලබා දිය යුතුය.

මිදීම සම්බන්ධයෙන්ද මේ හා සමාන වේ. ඇතැම් අවස්ථාවල, එවැනි උපදෙස් වලින් තොරව දෙවියන්වහන්සේ මිදීම ලබා දෙයි. නමුත් මිදීම උදෙසා සේවය කිරීමේදී අදාළ කාර්යය සිදුවනු දැකීම සඳහා දේව වචනයේ සඳහන් හැකි සෑම මාර්ගයක්ම ඔබ විසින් පාවිච්චි කළ යුතුය. ඇදහිල්ල යනු දෙවියන්වහන්සේගේ මිදීමේ බලය ගලායන එක් මාර්ගයක් වන අතර එය පැමිණෙනුයේ දේව වචනයට සවන්දීම තුළින් වන බැවින්, උපදෙස් දීම වැදගත්ය. යේසුස්වහන්සේගේ දේශනා කිරීම හා ඉගැන්වීම, සුවකිරීම හා නිදහස් කිරීම සමඟ සම්බන්ධ කළ අතර තම අනුගාමිකයන්ට ද එසේ කරන ලෙස පැවසූ සේක.

## සේවය සඳහා සුදුසු ස්ථානය :

යක්ෂ ආත්ම වලින් බලපෑම් ඇති අය නිදහස් කිරීමේ සේවය සාමාන්‍ය සභා රැස්වීමක කොටසක් ලෙස සිදු කළ හැකිය. එවැනි සේවයන් පෞද්ගලික සැසිවාර සඳහා පමණක් සීමා කළ යුතු නැත. එය සභාවේ වටිනා සේවයකි.

සාමාන්‍ය සභා රැස්වීමක කොටසක් ලෙස යේසුස්වහන්සේ යක්ෂාවේශ වූවෙකුට සේවය කළ සේක (මාර්ක් 1:21-25). කෙසේ වෙතත්, යක්ෂ බලවේග සමඟ කටයුතු කිරීමට සාමාන්‍ය රැස්වීමක් පැමිණෙන තුරු බලා සිටිය යුතු නැත. නිදහස අවශ්‍ය අය හමුවූ විට හා හමුවූ ඒ සෑම තැනකදී උන්වහන්සේ ඔවුන්ට සේවය කළ සේක.

## සේවය සිදු කරන කාලය :

ඔබ මිදීම උදෙසා සේවය කිරීමට සූදානම් වූ විට . . .

### 1. ප්‍රශංසා හා නමස්කාරයෙන් ආරම්භ කරන්න :

අප උන්වහන්සේගේ අභිමුඛයට (එහි සුවය හා මිදීම ඇත) ඇතුළු වන්නේ නමස්කාරයෙන් හා ප්‍රශංසාවෙනි. දෙවියන්වහන්සේ තම ජනයාගේ ප්‍රශංසා මධ්‍යයේ වැඩ වසන බැවින් යාච්ඥාවකින් තොරව වුවද, නමස්කාරය හා ප්‍රශංසාව තුළින් මිදීම සිදුවිය හැකිය. අප ප්‍රශංසා කරන විට, සුවය දීමට හා නිදහස් කිරීමට උන්වහන්සේ වැඩ සිටින සේක.

### 2. ඇදහිල්ලේ පරිසරයක් නිර්මාණය කරන්න :

මිදීම පිළිබඳ දේව වචනය බෙදා ගැනීමේදී ඔබ මෙය කිරීමට පටන්ගත් නමුත්, ඇදහිල්ලේ පරිසරයක් ගොඩනැඟීමට ඔබට තවත් පියවරයන් ගැනීමට සිදුවනු ඇත. අවිශ්වාසය නාසරෙත් නුවරදී යේසුස්වහන්සේගේ සේවයට පවා බාධාවක් විය. ඇතැම් අවස්ථාවලදී යේසුස්වහන්සේ සේවය කරන විට උන්වහන්සේ අවිශ්වාසය ඇති අය පිටතට දැමූ සේක (මාර්ක් 5:35-40). තවත් අවස්ථාවලදී මිනිසුන්ට සේවය කිරීමට උන්වහන්සේ ඔවුන්ව තම ගම් වලින් (අවිශ්වාසයේ පරිසරයෙන්) පිටතට ගෙනා සේක (මාර්ක් 8:23). දෙවියන්වහන්සේ මඟපෙන්වන පරිදි ඇතැම් අවස්ථාවලදී, අවිශ්වාසය, බිය ආදිය සමඟ පොරබදන අයට පිටතට යන ලෙස ඉල්ලීමට ඔබට සිදුවිය හැකිය.

### 3. පළමුව යාච්ඥා කරන්න :

මිදීම උදෙසා සේවය කිරීමට පෙර ප්‍රඥාව හා දැනගැන්ම ඉල්ලන්න. යාච්ඥාව තුළදී දෙවියන්වහන්සේ ඔබට පහත දේවල් එළිදරව් කළ හැකිය . . .

දැනගැන්මේ වචනයක් : යාච්ඤා කළයුතු ආකාරය ඔබට දැනගත හැකි වන පිණිස පුද්ගලයකු හෝ තත්වයක් පිළිබඳ විශේෂිත කරුණු හෝ තොරතුරු ලබා දිය හැකිය. “දැනගැන්මේ වචනයක්” යනු ගැඹුරින් දැනෙන දෙයක් හෝ ඔබගේ ආත්මය, සිතුවිලි, වචන හෝ හැඟීම් කෙරෙහි ඇතිවන බලපෑමක් යනුවෙන් විය හැකිය. රෝගය කුමක්ද යන්න සහ එම පුද්ගලයාට මේ තත්වය ඇති වී තිබෙන්නේ ඇයිද යන්න දැනගැන්මේ වචනයකින් එළිදරව් විය හැකිය.

බයිබල් පදයක් : එම අවස්ථාව, තත්වය, පුද්ගලයා හෝ කණ්ඩායම පිළිබඳ රීමා වචනයක්.

දර්ශනයක් : ඔබ සේවය කරන පුද්ගලයා විනිවිද දකින මනසේ ඇතිවන පිංතූරයක්

ඇදහිල්ලේ වචන : එම පුද්ගලයා කෙරෙහි විශේෂිත ධෛර්යවත් කිරීමේ හා ඇදහිල්ලේ වචන.

විශේෂ ආකල්පයක් : ඇතැම් විට දැඩි රස්නයක් හෝ අධිස්වාභාවික විශ්වාසයක් ලෙස නැඟෙන, හදිසියේ එන බලයෙන් පූර්ණවීමක්.

එම පුද්ගලයා විසින් යම් විශේෂ ඇදහිල්ලේ ක්‍රියාවක් කරනු ලැබුවහොත්, මිදීම ලැබෙනු ඇතැයි විශ්වාසය.

4. **කෙටි සාකච්ඡාවක් මෙහෙය වන්න :**

මෙය අවශ්‍යතාවයක් නොවේ. එය අතිරේක දෙයක් වන අතර දෙවියන්වහන්සේගේ මඟපෙන්වීම අනුව කළ යුතුය. පුද්ගලයාගේ තත්වය පිළිබඳව දෙවියන්වහන්සේ ඔබට විශේෂිත ප්‍රඥාවේ වචනයක් දිය හැකි අතර එවිට සාකච්ඡා කිරීමක් අවශ්‍ය නොවනු ඇත.

නමුත් දෙවියන්වහන්සේ අධිස්වාභාවික ලෙස ඔබට යමක් එළිදරව් නොකරන්නේ නම්, සාකච්ඡා කිරීමට මැලි නොවන්න. යේසුස්වහන්සේ ස්වාභාවික හා අධිස්වාභාවික යන ක්‍රමවේදයන් දෙකම පාවිච්චි කළ සේක. ඇතැම් අවස්ථා වලදී ශුද්ධාත්මයාණන් මඟින් උන්වහන්සේ පුද්ගලයන්ගේ තත්වය විමසා දැනගත් සේක. තවත් අවස්ථාවලදී ඔවුන්ට අවශ්‍ය කුමක්ද යන්නත්, කොපමණ කාලයක් තිස්සේ ඔවුන් පීඩා විඳිනවාද යන්නත් උන්වහන්සේ ඔවුන්ගෙන් ඇසූ සේක.

සාකච්ඡාවක් තොරතුරු ලබාගැනීම සඳහා ඔබට උපකාරී වන අතර එවිට ඔබට වඩා විශේෂිත ලෙස යාච්ඤා කළ හැකිය. යාච්ඤා කිරීමට පෙර එම පුද්ගලයාට තවදුරටත් උපදෙස් අවශ්‍ය ද යන්න තීරණය කිරීමට ද එය ඔබට උපකාරී වේ. යේසුස්වහන්සේ බොහෝ විට මෙසේ කළ සේක. උන්වහන්සේ මිනිසුන්ගේ ඇදහිල්ල පිළිබඳව ප්‍රශ්න ඇසූ අතර ඉන්පසු සේවය කිරීමට පෙර අවිශ්වාසයේ සෘණාත්මක බලවේග සමඟ ගනුදෙනු කළ සේක. පහත උදාහරණ අධ්‍යයනය කරන්න :

- මාර්ක් 5:1-20 : යේසුස්වහන්සේ යක්ෂාවේශ වූ මිනිසාගෙන් ප්‍රශ්න ඇසූ සේක.
- මාර්ක් 8:22-26 : අන්ධ මිනිසාගෙන් ප්‍රශ්න ඇසීම
- මාර්ක් 9:14-27 : යක්ෂ ආත්මයක් සහිත පිරිමි ළමයා.
- මාර්ක් 10:46-52 : අන්ධ බර්තිමේයුස්ගෙන් ප්‍රශ්න ඇසීම

“ප්‍රශ්නය කුමක්දැ?”යි මිනිසුන්ගෙන් අසන්න. යාච්ඤාව සඳහා ඉල්ලීමක් පැවසීම වැදගත්ය. තම අවශ්‍යතාව පවසමින් උන්වහන්සේ වෙත පැමිණි බොහෝ අය යේසුස්වහන්සේ නිදහස් කළ සේක. ඉල්ලීමම සුව කිරීමේ ක්‍රියාවලිය තුළ ගත හැකි අදහිල්ලේ පියවරකි (යාකොබ් 5:14-15). නිශ්චිත ප්‍රකාශයක් පවසන ලෙස ඉල්ලන්න. ඔබට අවශ්‍ය කෙටි තොරතුරු පමණි. සම්පූර්ණ ඉතිහාසයක් හෝ ජීවිත කතාවක් ඔබට අවශ්‍ය නොවේ.

ඔබට පවසා ඇති තොරතුරු මානසික විග්‍රහ කිරීමකට යොමු නොකරන්න. ඔබගේ කාර්යය මිදීම උදෙසා සේවය කිරීමය. ඇතැම් විශේෂිත අවස්ථා වලදී පෞද්ගලිකව පුහුණුව ලත් උපදේශකයකු සමඟ ඔවුන්ට වැඩි කාලයක් ගත කිරීම අවශ්‍ය විය හැකිය. මේ සඳහා උපදේශකයන් තබා ගන්න.

ඔබ යාච්ඤා කරන පුද්ගලයාගෙන් මෙසේ අසන්න. “යේසුස්වහන්සේට ඔබව නිදහස් කළ හැකි බව ඔබ විශ්වාස කරන්නේද?” පිළිතුර යහපත් නම්, “යේසුස්වහන්සේ එය දැන් කරනු ඇතැයි ඔබ විශ්වාස

කරන්නේද?" යනුවෙන් අසන්න. මෙම ප්‍රශ්න දෙකෙන් එකකට හෝ පිළිතුර "නැත" යන්න නම්, දේව වචනයෙන් තවදුරටත් උපදෙස් දීම අවශ්‍ය වේ.

ඔබ විශාල ජනකායකට සේවය කරන විට, ඔබට එක් එක් පුද්ගලයාගෙන් ප්‍රශ්න කිරීමට හැකියාවක් නොවනු ඇත. දෙවියන්වහන්සේ විසින්, ඔබ ඉදිරියේ සිටින සමූහයේ යම් පුද්ගලයන්ගේ යක්ෂයන් මඟින් ඇති කරන ලද තත්වයක් පිළිබඳව එළිදරව් කිරීමක් හෝ පුද්ගලයන් උදෙසා විශේෂිත යාච්ඤාවන් කිරීමට ඔබව මෙහෙයවීමක් සිදු කරනු ඇත.

සමූහයක් තුළ ඔබ මිදීමේ සේවයේ යෙදෙන විට, සියලුම සේවයන් ඔබ විසින්ම කරනු වෙනුවට ඔබ සමඟ සේවය කිරීමට තවත් අය පුහුණු කිරීම ඉතාම යෝග්‍යය. යේසුස්වහන්සේගේ ආඥාව වූයේ අදහන "අය" කෙරෙහි ලකුණු දක්නට ලැබෙනු ඇත යන්න මිස "ඔහු" යන්න නොවේය. සේවයේ කාර්යයන් ඇදහිලිවන්තයන් හෝ ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් එක් කෙනෙක් හෝ දෙදෙනෙක් මඟින් නොව ශරීරය තුළින් කරනු ලැබිය යුතුය.

5. **විශේෂිත ප්‍රශ්නය තිරණය කරන්න :**

ගැටලුව පහත සඳහන් තත්වයන්ගෙන් කුමන තත්වයේද යන්න තිරණය කිරීමට සාකච්ඡාව තුළින් ලබාගත් තොරතුරු සහ/හෝ දෙවියන්වහන්සේ ඔබට දෙන ප්‍රඥාව පාවිච්චි කරන්න.

**ආත්මික තත්වය :** පාපයට සම්බන්ධ ගැටලුය. මේ සඳහා ආත්මික සුව කිරීමේ සේවයක් අවශ්‍යය වේ. (ගැළවීම, පසුතැවිලිවීම හා පව් සමාව).

**ශාරීරික තත්වය :** යක්ෂ ආත්ම මඟින් ආබාධ ඇති කිරීමේ ශාරීරික රෝගාබාධ.

**හැඟීම් පිළිබඳ තත්වය :** කණස්සල්ල, බිය, තරහව, තික්තකම, අමනාපය, වරදකාරී හැඟීම, සැකය, අසමත්කම්, ඊර්ෂ්‍යාව, ආත්මාර්ථය, වියවුල, නිෂ්ඵල බව, මාංශයේ ශක්තිය තුළ සර්ව සම්පූර්ණත්වය උදෙසා වෙහෙසීම, සමාව නොදීම, අතීත සිදුවීම් ආදිය සම්බන්ධ ගැටලු.

මෙය බොහෝ විට "අභ්‍යන්තර සුවකිරීම" ලෙස හැඳින්වෙන අතර, මෙම පදය බොහෝ විට වැරදි ලෙස යොදාගෙන තිබේ. අතීතයේ සිදුවුනාවූ කරුණු හා හැඟීම් යළි පණ ගැන්වීම අවශ්‍ය නොවේ. එවැනි තත්වයන්ගෙන් යළි යථා තත්වයට පත් වීමට සති, මාස හෝ අවුරුදු ගණන් ගත කිරීම අවශ්‍ය නොවේ. ඔබ එසේ කරන්නේ නම්, ඔබ විසින් කරනුයේ එම පුද්ගලයාට ක්‍රිස්තුස්වහන්සේ තුළ නව පුද්ගලයෙකු වීමට අවස්ථාව ලබා දෙනු වෙනුවට පැරණි පුද්ගලයා සුව කිරීමට උත්සාහ කිරීමය.

හැඟීම් පිළිබඳව ඇතිවන ගැටලු බොහෝ දුරට කෙනෙකුගේ ජීවිතයේ සාමාජීය තත්වයන්ට සම්බන්ධ වේ. ඒවා බොහෝ විට පවුලේ හා සමාජයේ අය සමඟ ඇති සම්බන්ධතාවල ප්‍රතිඵලයක් ලෙස වේ. සුවය පැමිණෙනුයේ ගැටලුව හඳුනාගැනීම, සමාව ඉල්ලීම, හා එයට සම්බන්ධ අන් අයට සමාව දීම තුළිනි. හැඟීම් පිළිබඳ තත්වයන් සුව වීමට ඇති විශාලතම බාධාව සමාව නොදීමයි, එම නිසා හැඟීම් පිළිබඳ තත්වයන් සුව කිරීම තුළ සාමාජීය සම්බන්ධතා යහපත් අතට හරවා ගැනීම ද ඇතුළත් වේ.

අපව කැඳවා ඇත්තේ නැවත සමඟි කිරීමේ සේවය උදෙසාය (2 කොරින්ති 5:18-21). මිනිසුන් දෙවියන්වහන්සේ සමඟ මෙන්ම මිනිසුන් සමඟ ද නැවත සමඟි කරනු ලැබිය යුතු අතර, හැඟීම් පිළිබඳ, මානසික හෝ අභ්‍යන්තර සුවය පැමිණෙන්නේ මේ තුළින් වේ. මේ සියල්ල එකම ආකාරයේ සුව කිරීමකට සමාන විවිධ නම් වේ.

ඔබට යම් පුද්ගලයෙකුට සමාවදීම ගැන ඉගැන්වීමට සිදුවිය හැකිය. සමාව දීම යනු පහත තත්වයන් ගෙන් එකක් නොවේ :

- කෙනෙකු විසින් ඔබට කර ඇති වැරදි දෙයක් සාධාරණීකරණය කිරීම. (උදාහරණයක් ලෙස "ඔවුන් විශාල පීඩනයක සිටියා" යැයි පැවසීම.)

- ඔබගේ හිත් රිදීම සිදු නොවුනා සේ සැළකීම.

- ඔබට සිදු කර ඇති දේ ඉවසීමෙන් දරා සිටීම.

- ඔබට සිදු වූ වේදනාව සුව කිරීමට කාලයට ඉඩදීම

සැබෑ සමාව දීම පැමිණෙනුයේ පහත දේවල් තුළිනි :

- ඔබට සිදු වී ඇති වැරැද්ද , පව්කාර ලෝකයක ජීවත් වන පව්කාර මිනිසෙකු නිසා සිදුවූවක් බව හඳුනා ගැනීම.

- වේදනාව දෙවියන්වහන්සේට පවසා ඔබගේ කරදරකාරී හැඟීම් වලින් ඔබව සුව කරන ලෙස උන්වහන්සේට පවසන්න ( උදා: තරහව, තික්තකම). එම සිදුවීමට සම්බන්ධ කරුණු ඔබට කිසිදාක අමතක නොවනු ඇති නමුත් ඔබට අවශ්‍ය වන්නේ ඊට සම්බන්ධ වැරදි හැඟීම් වලට සුවය වේ.

- ඊට සම්බන්ධ අයට සමාව දීමට උපකාර කරන ලෙස දෙවියන්වහන්සේගෙන් ඉල්ලා සිටින්න. ඉන්පසු ක්‍රිස්තුස්වහන්සේ ඔබට සමාව දුන් ලෙසම ඔවුන්ට සමාව දෙන්න. දෙවියන්වහන්සේ ඔබට සමාව දෙන්නේ ඔබ අන් අයට සමාව දෙන ප්‍රමාණයට බව තේරුම් ගන්න : "අපට වරද කරන අයගේ වැරදි අප කමා කරන ලෙස අපගේ වරද අපට කමා කළ මැනව". අදාළ පුද්ගලයා තමාටම සමාව දීම අවශ්‍ය විය හැකි අතර (තමා විසින් කළ වැරදි පිළිබඳ ඇති වරදකාරී හැඟීම නිසා) අනිවාර්යයෙන්ම හැඟීම් පිළිබඳ තත්වය සුව අතට හැරීමට යාච්ඤා කළ යුතුය.

- වරදකාරී හැඟීම හා පාපී හැඟීම් ඇති කරන පාපය හඳුනාගන්න. එය දෙවියන්වහන්සේට පවසා පසුතැවිලි වන්න. ඔබේ පාපයට සමාව දී ඔබගේ හැඟීම් සුව කරන මෙන් උන්වහන්සේගෙන් ඉල්ලන්න.

- දෙවියන්වහන්සේ සමාව දුන් විට, උන්වහන්සේ එය අමතක කර දමන බව දැනගන්න. (නැගෙනහිර බටහිරින් දුරව තිබෙන්නාක් මෙන් උන්වහන්සේ අපගේ පාපය පහකර දමන සේක.)

- 1 යොහන් 1:8-9 හා රෝම 8:1 ප්‍රකාශ කරන්න.

- ඔබගේ කැමැත්ත භාවිතා කර, ඔබවම වරදට පත්කරන හැගීම් වලින් මිදීම ලබා ගන්න. නිෂ්ඵල සිතුවිලි සිතින් ඉවත්කර දමා අතීතයේ සිදු වූ දේවල් අමතක කර දැමීමෙන් අනාගතයේ ඇතිවිය හැකි සිතුවිලි රටාවන් පාලනය කරන්න.

**මානසික තත්වය :** සෘණාත්මක සිතුවිලි, මනසට ඇති වන සාතන්ගේ ප්‍රහාරයන්, මානසික ආබාධ නිසා ඇති වන ගැටලු මෙහි ප්‍රතිඵලය වේ. මිනිසා ත්‍රි පුද්ගල බැවින්, එක් අංශයක් තුළ ඇතිවන ගැටලුවක් සම්පූර්ණ පුද්ගලයාටම බලපෑම් ඇති කරන බව මතක තබා ගන්න. ඔබ සේවය කරන විට, එක් ක්ෂේත්‍රයක් පිළිබඳව පමණක් නොව සම්පූර්ණ මනුෂ්‍යයා සමඟ ගනුදෙනු කරන්න. මිනිසා යනු ශරීරය, ප්‍රාණය හා ආත්මයයි. මනුෂ්‍යයාගේ සම්පූර්ණත්වය සඳහා මේ සියල්ල සමඟ ගනුදෙනු කිරීම අදාළ වේ.

### 6. එය යාච්ඤා කළ යුතු වේලාව දැයි තිරණය කරන්න.

එය සුවය උදෙසා යාච්ඤා කිරීමට සුදුසු වේලාව දැයි තිරණය කරන්න. බොහෝ අවස්ථා වලදී ඔබ යාච්ඤා කරන නමුත්, ඇතැම් අවස්ථා වලදී යාච්ඤා නොකරන ලෙස හෝ ප්‍රමාද වී යාච්ඤා කරන ලෙස මඟ පෙන්වන්නේ නම් පුදුම නොවන්න.

කානානිය ස්ත්‍රියගේ දියණිය සම්බන්ධ ප්‍රශ්නයේදී හා ලාසරස් සම්බන්ධ සිදුවීමේදී යේසුස්වහන්සේ සුව කිරීම ප්‍රමාද කළ සේක. නොඇදහිල්ල හේතුවෙන් උන්වහන්සේ නාසරෙත් නුවර හාස්කම් නොකළ සේක. තවදුරටත් උපදෙස් ලබා දෙන තුරු ප්‍රමාද වීමටද ස්වාමීන්වහන්සේ ඔබට මඟපෙන්වනු ඇත. එනම්, ඔවුන්ගේ යම් පාපයක් පිළිබඳ තත්වයක් ගැන ගනුදෙනු කළ යුතුව ඇති අතර නිදහස් කිරීම පිළිබඳ තවදුරටත් උපදෙස් අවශ්‍ය විය හැකිය.

### 7. මිදීම උදෙසා යාච්ඤාව කරන්න :

ඔබ හඳුනාගත් විශේෂිත යක්ෂයන් සම්බන්ධ තත්වය කෙරෙහි අවධානය යොමු කරමින් මිදීම උදෙසා යාච්ඤාවක් කරන්න. ඔබගේ යාච්ඤාව තුළින් මිදීම උදෙසා දෙවියන්වහන්සේට ඒත්තු ගැන්වීමක් කළ

යුතු නැත. ගැළවීම, ඕනෑම කෙනෙකුට ලබා ගත හැකි සේම, මිදීමද එසේමය. ගැළවීම, ඇදහිල්ල නමැති කොන්දේසිය මත පදනම්ව ඇතිවා සේම, මිදීම ද එසේමය. මිනිසුන් ගැළවීම ලැබීම දෙවියන්වහන්සේට අවශ්‍ය වනවා සේම මිනිසුන් මිදීම ලැබීම ද උන්වහන්සේට අවශ්‍ය වේ.

ඇතැම් අවස්ථා වලදී මිදීම උදෙසා දෙවියන්වහන්සේගේ බලය විශේෂ ආකාරයකින් පැවතුණ ද (ලූක් 5:17), විශේෂ ආලේපයකින් නොමැති වුවද මිදීම උදෙසා යාච්ඤා කළ හැකිය. හේතුව යේසුස්වහන්සේ ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අණ කළ ලෙසම මිදීම උදෙසා යාච්ඤා කිරීම එලෙසම අණ කළ බැවිනි.

ඔබ කණ්ඩායමක සේවය කරන්නේ නම් ඔබට සේවය කිරීමට උපකාර කිරීමට අන් අයව යොදා ගන්න. බොහෝ අය යාච්ඤා කරන විට ආත්මික බලය වැඩි වීමක් සිදුවේ (මතෙව් 18:19). කණ්ඩායමක් ලෙස කරන සේවය මගින්, මිදීමේ සේවයේ සාර්ථකත්වය අත් දකින පුද්ගලයන් හෝ සේවය ලබන්නන් මිනිසුන්ට ගෞරවය ලබා දීම අධෛර්යයට පත් කරයි.

යේසුස්වහන්සේ ඉගැන්වූ ආකාරයට ඔබ පළමුව සතුරාව බැඳිය යුතු අතර, ඉන්පසුව ඔහු කෙරෙහි බලය යෙදවිය යුතුය :

> **නොහොත් බලවන්තයා පළමුකොට නොබැඳ, යමෙකුට ඔහුගේ ගෙට වැද ඔහුගේ වස්තු කොල්ලකන්ට කෙසේ හැකි වේද? බැඳලාම ඔහුගේ ගෙය කොල්ලකන්නේය. (මතෙව් 12:29)**

පිටතින් සිට බලපෑම් ඇති කරන යක්ෂ බලවේග බැඳ තබන්නේ නම්, ඔවුන් අල්ලා සිටින දේවල් අතහරිනු ලබන ලෙස හා ඔවුන්ගේ බලයන් බිඳිනු ලබන ලෙස යාච්ඤා කරන්න. උදාහරණයක් ලෙස, යේසුස්වහන්සේ සිනගෝගයේ සිටි කාන්තාව ආබාධ සහිත ආත්මයෙන් නිදහස් කළ සේක. ඇයට යක්ෂ ආත්මයක් ආවේශ වී නොතිබුණු නමුත් යක්ෂයා පිටතින් සිට බලපෑම් කරනු ලැබීය. එම අවස්ථාවේදී දුරු කිරීමක් අවශ්‍ය නොවීය.

යක්ෂාවේශ වීම් සම්බන්ධ සිදුවීම් වලදී. යේසුස්වහන්සේගේ නාමයෙන් යක්ෂයන් දුරු කිරීමේ බලය ඔබට ඇත. එය ඔබගේ බලයේ හෝ හැකියාවේ ඇති ආධිපත්‍ය නොවන අතර උන්වහන්සේගේ නාමයෙන් ආධිපත්‍ය වේ. යක්ෂයන් දුරු කිරීමේ යාච්ඤාවේදී සැබවින්ම යේසුස්වහන්සේගේ නාමය පාවිච්චි කිරීම වැදගත් වේ.

යක්ෂයන් දුරු කිරීම සඳහා ඇදහිල්ල, නිරාහාරය හා යාච්ඤාව අවශ්‍ය වේ. (මතෙව් 17:14-21 හි සඳහන් වාර්තාව කියවන්න.) මූලික සූදානම් වීම සඳහා ධෛර්ය කරන්නේ මේ හේතුවෙනි. දේව වචනය (එපීස 5:17; හෙබ්‍රෙව් 4:12), යේසුස්වහන්සේගේ රුධිරය (එළිදරව් 12:11) සහ ශුද්ධාත්මයාණන්ගේ බලය (ක්‍රියා 1:8; 2:38) මිදීම සඳහා දෙවියන්වහන්සේ ඔබට දී තිබෙන ආම්පන්න වේ.

යක්ෂයන්ට මොර ගැසීම හා කෑගැසීම අවශ්‍ය නොවේ. ඔවුන්ව දුරු කරන්නේ යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබට ඇති ආධිපත්‍ය මත මිස මිදීමේ යාච්ඤාවේ ඔබගේ කටහඬෙහි ශබ්දය නොවේ. සැමවිටම යක්ෂයන් නැවත ඇතුළු වීම තහනම් කරන්න. මෙය ඔබගේ මිදීමේ යාච්ඤාවේ වැදගත් කොටසකි :

> **සමූහයක් දුව එමින් රැස්වෙන බව යේසුස්වහන්සේ දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට තරවටුකර: ගොළු බිහිරි ආත්මය, මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවන්ට තට අණකරමියි කීසේක. (මාර්ක් 9:25)**

යක්ෂයා වචන තුළින් ඔහුව ප්‍රකාශ විමට තැත් කළත් යක්ෂයා සමඟ කතා කරමින් කාලය ගත නොකරන්න. යේසුස්වහන්සේ යක්ෂ ආත්ම වලට තරවටු කර නිහඬ වන ලෙස ඔවුන්ට පැවසූ සේක (ලූක් 4:34-35). යක්ෂ ආත්ම බොරුවේ ආත්ම වන බැවින් ඔවුන් සමඟ කරන කතා බහ අනතුරුදායක විය හැකි බව මතක තබා ගන්න.

නිදහස් කිරීමේ යාච්ඤාවේදී ශුද්ධාත්මයාණන් ඔබව මෙහෙයවනු ඇති නමුත්, ඔබ මේ සඳහා අලුත් කෙනෙකු නම් අධ්‍යයනය කිරීම සඳහා ආදර්ශ යාච්ඤා රටාවක් පහත දැක්වේ :

*“යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයෙන් සහ උන්වහන්සේගේ බලයේ, උන්වහන්සේගේ වචනයේ, උන්වහන්සේගේ රුධිරයේ හා ශුද්ධාත්මයාණන්ගේ ආධිපත්‍ය මත පදනම්ව . . .”*

> ***. . . මෙය මිදීම උදෙසා පදනම් වූ බලය පිහිටුවයි . . .***

*". . . මම නුඹ බැඳ තබමි . . ."*

***. . . ශක්තිමත් මිනිසා දුරු කිරීමට උත්සහ කිරීමට පෙර ඔහු බැඳ තබන ලෙස යේසුස්වහන්සේ ඉගැන් වූ සේක.***

*". . . එසේම මම නුඹට අණ කරමි . . ."*

***. . . නිදහස් කිරීමේ සේවය ආධිපත්‍යයේ යාච්ඤාවක් මිස, ආයාචනයක් නොවේ. ඔබට හඬ පාලනය කර කතා කළ හැකි නමුත්, යේසුස්වහන්සේගේ නාමයෙන් ඔබ යක්ෂ ආත්ම වලට ඉහළින් ආධිපත්‍ය ලබා ගත යුතුය. ඔබ කතා කරන විට කෙලින්ම පුද්ගලයාගේ දෑස් දෙස බලන්න.***

*" . . . _____________ ආත්මය "හෝ" ". . . සාතන්ගේ අපවිත්‍ර ආත්මය . . ."*

***. . . ආත්මික හෝ ස්වාභාවික විමසීම තුළින් ආත්මය හඳුනාගෙන තිබේ නම්, එය නිශ්චිතව නම් කරන්න. නොඑසේ නම් පොදුවේ නම් කරන්න.***

*" . . . _____________ (නිදහස් කරනු ලැබූ පුද්ගලයාගේ නම) නම හෝ මෙම නිවසේ සිටින කිසිවෙකුට හෝ හානි නොකර හෝ කිසිඳු ශබ්දයක් හෝ පීඩාවක් ඇති නොකර"*

***. . . ඇතැම් විට යක්ෂ ආත්මය පුද්ගලයාට හානි කිරීමට හෝ බාධාවක් ඇති කිරීමට උත්සාහ කළ හැකිය.***

*" . . . ඉවත්ව යන ලෙසත් . . . "*

***. . . මෙය දුරු කිරීමේ ක්‍රියාවලියයි.***

*"මෙම පුද්ගලයා වෙත නැවත ඇතුළු වීමත් මම නුඹට තහනම් කරමි"*

***. . . යේසුස්වහන්සේ මෙලෙස අණ කළ බව මතක තබා ගන්න . . .***

*" . . . එසේම මෙම පුද්ගලයා පවිත්‍ර බවින් , යේසුස්වහන්සේගේ රුධිරයේ නිදහස් කිරීමේ බලයෙන් පුරවන ලෙස මම ශුද්ධාත්මයාණන්වහන්සේ නිදහස් කරමි."*

***. . . බැඳ තබන ලෙසම නිදහස් කරන ලෙසද අපට පවසා තිබේ. ක්‍රියාකාරී වන නිශ්චිත ආත්මය ඔබ විසින් හඳුනාගෙන තිබේ නම් ඊට ප්‍රතිවිරුද්ධ ආත්මය නිදහස් කරන්න. උදාහරණයක් ලෙස උඩඟු බවේ ආත්මය බැඳ දමා යටහත් බවේ ආත්මය නිදහස් කරන්න.***

මේ ආකාරයේ සේවයක් ප්‍රදර්ශනයක් බවට පත් කර ගනිමින් ජනතාව ආකර්ෂණය කර ගැනීමට උත්සාහ නොකරන්න. යක්ෂයාගේ ක්‍රියාවන් මගින් මිනිසුන් ආකර්ෂණය වන බව යේසුස්වහන්සේ දුටු විට, අදාළ ක්‍රියාව ප්‍රදර්ශනය කරමින් සිටි යක්ෂ ආත්මය උන්වහන්සේ වහාම නතර කළ අතර එය දුරු කළ සේක.

**සමූහයක් දුව එමින් රැස්වෙන බව යේසුස්වහන්සේ දුටු කල, උන්වහන්සේ අශුද්ධාත්මයට තරවටුකර: ගොළු බිහිරි ආත්මය, මොහු කෙරෙන් පහව යව, තවත් මොහුට ආවේශ නොවන්ට තට අණකරමියි කීසේක. (මාර්ක් 9:25)**

යක්ෂ ආත්ම නිරයට එළවා දැමීමට උත්සාහ නොකරන්න. යේසුස්වහන්සේ සහ උන්වහන්සේගේ ගෝලයන් මෙසේ නොකළ සේක. අපට ආධිපත්‍ය ඇත්තේ බැඳ තැබීමට, නිදහස් කිරීමට හා දුරු කිරීමට පමණි. යක්ෂ ආත්ම උදෙසා අවසාන විනිශ්චය සඳහා නියම කරන ලද කාලයක් අනාගතයේදී තිබේ. යක්ෂ ආත්ම යේසුස්වහන්සේට මෙසේ පැවසූහ.

**බලව, ඔව්හු මොරගසමින්: දෙවියන්වහන්සේගේ පුත්‍රයාණෙනි, ඔබට අපෙන් කම මොකද? කාලයට ප්‍රථමයෙන් අපට වදදෙන්ට ඔබ මෙහි ආසේක්දයි කීවෝය. (මතෙව් 8:29)**

යක්ෂ ආත්ම වලින් බලපෑම් ලත් පුද්ගලයන් උදෙසා කරන යාච්ඥාව අත් තැබීමෙන් හා අත් තැබීමෙන් තොරව සිදු කළ හැකිය. ලූක් 13:11-13 හි සඳහන් ආබාධයක් සහිත ආත්මයකින් පීඩා විඳි කාන්තාව සුව කිරීම සඳහා යේසුස්වහන්සේ අත් තැබීම පාවිච්චි කළ සේක. සෙසු අවස්ථා වලදී උන්වහන්සේ අත් තැබීම සිදු නොකළ අතර සරලව යක්ෂ ආත්ම වලට කතා කළ සේක (ලූක් 9:42)

8. **පිළිතුරු උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න :**

යාච්ඥාවෙන් අනතුරුව නිදහස් කිරීම උදෙසා දෙවියන්වහන්සේට ප්‍රශංසා කරන්න. කුෂ්ඨ රෝගීන් දස දෙනා පිළිබඳ බයිබලීය උදාහරණයේදී, සියලු දෙනාම සුවය ලද නමුත් සම්පූර්ණත්වයට පත් කරනු ලැබුවේ ප්‍රශංසා කිරීමට හැරී ආ තැනැත්තා පමණක් බව මතක තබා ගන්න. පෙනෙන දේ අනුව නොව ඇදහිල්ල අනුව ප්‍රශංසා කරන්න. ඔබ කර ඇත්තේ දේව වචනය ඔබට කරන ලෙස පැවසූ දෙයකි. උන්වහන්සේ විසින් කරන බවට පැවසූ දේ උන්වහන්සේ කරනු ඇති බව විශ්වාස කරන්න. ඒ උදෙසා උන්වහන්සේට ස්තුති කරන්න.

## නිදහස් කිරීමේ ලකුණු හඳුනා ගැනීම :

යක්ශාවේශ වීම් සම්බන්ධ තත්වයන් හිදී, ඇතැම් අවස්ථාවලදී හැඬීම සහ අදාළ පුද්ගලයා බිම ඇද දැමීම වැනි පොරබැඳීම් සමඟ යක්ෂයා පිටතට පැමිණෙයි. යක්ෂයා දුරු කරනු ලැබූ විට (යක්ෂාවේශ වීමක් හෝ පිටතින් සිට පීඩා කිරීමකදී) බරකින් නිදහස් වීමක් වැනි නිදහස් බවක්, ප්‍රීතියක් පිළිබඳ හැඟීමක් ඇතිවනු ඇත.

## ගොඩනැංවීමේ සේවය :

නිදහස් කිරීමෙන් අනතුරුව , යක්ෂාවේශව සිටි තැනැත්තාව, පව් කියා දී, පසුතැවිලි වීමකට සහ පාපයක් හෝ යක්ෂයා හා සම්බන්ධ දේවල් සමඟ සම්බන්ධතා අත්හැරීමට යාච්ඥාවෙන් මඟපෙන්විය යුතුය. එම පුද්ගලයා සතුව ගුප්ත දේවල් (පිළිම, මන්ත්‍ර සඳහා යොදාගන්නා දේවල්, ගුරුකම් සඳහා අවශ්‍ය උපකරණ ආදිය) ඇති නම් ඒවා විනාශ කළ යුතුය.

යක්ෂාවේශ වීම් වලින් නිදහස් කරනු ලැබූ පුද්ගලයන්ට අතිරේක ගොඩනැංවීමේ සේවයක් අවශ්‍ය වේ. යක්ෂයන් දුරු කරනු ලැබූ විට, යක්ෂයාට ක්‍රියා කිරීමට ඔහු විසින් තවත් ශරීරයක් සොයනු ඇත. යක්ෂ ආත්ම ඉවත්වූ පසු හිස් තැනක් ඇති කරන බව යේසුස්වහන්සේ පැවසූ සේක. යක්ෂ ආත්මයක් තවත් දරුණු ආත්ම සමඟ තමා පෙර සිටි පුද්ගලයා වෙත හැරී ඒමේ අවධානමක් පවතී :

**අශුද්ධආත්මය මනුෂ්‍යයාගෙන් දුරුව ගිය කල, නිවාඩු සොයමින්, දිය නැති තැන්වල ඇවිද, එය නොලැබුණු බැවින්, ඔහු කථාකොට: මම පිටත්ව ආ මාගේ ගෙට හැරී යමියි කියයි. ඔහු එහි පැමිණි කල, එය අතුගා සරහා තිබෙනවා සම්බවේ. එවිට ඔහු ගොස් තමාට වඩා නපුරුවූ වෙන ආත්මයන් සත් දෙනෙකු තමා කැටුව ගෙන එන්නේය: ඔව්හු ඇතුල්ව එහි වාසයකරති. එවිට ඒ මනුෂ්‍යයාගේ පළමු ස්වභාවට වඩා අන්තිම ස්වභාව නපුරු වන්නේයයි කීසේක. (ලූක් 11:24-26)**

යක්ෂයකු පළවා හරිනු ලැබූ විට, එය අවිවේකී වන අතර මනුෂ්‍ය ශරීරයකින් පිටත සිටීම නිසා අසහනයට පත් වේ. යක්ෂ ආත්මයකට සාතන්ගේ නපුරු අරමුණු ඉටුකරගත හැකි වනුයේ මනුෂ්‍ය ජීවිතයක් තුළ ජීවත් වීමෙන් සහ එය පාලනය කිරීමෙන් පමණි. යක්ෂ ආත්ම දුරු කිරීම පමණක් ප්‍රමාණවත් නොවන්නේ මේ හේතුවෙනි. ආත්මික නිවස නැවත ඉපදීමේ අත්දැකීමෙන් හා ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වීමෙන් පිරවිය යුතුය. පසුව සිදු කෙරෙන උපදේශන හා සේවාවන් අවශ්‍යය. අදාළ පුද්ගලයා දේව වචනයෙන් හා යාච්ඥාවෙන් ගොඩනැංවිය යුතු අතර ඇදහිලිවන්තයන්ගේ ප්‍රජාවේ සාමාජිකයෙකු විය යුතුය.

යක්ෂ ආත්ම වලින් නිදහස අත් දකින පුද්ගලයන්ට තම සාක්ෂිය බෙදා ගැනීමට උනන්දු කළ යුතුය. යේසුස්වහන්සේ ගදරීනයේ යක්ෂාවේශව සිටි පුද්ගලයාට මෙසේ පැවසූ සේක.

**නුමුත් උන්වහන්සේ ඔහුට අවසර නොදී: නුඹ ගෙදර නුඹේ නෑ මිතුරන් ළඟට ගොස්, ස්වාමීන්වහන්සේ නුඹට කොපමණ මහත් දේවල් කළසේක්ද කියාත් උන්වහන්සේ නුඹට**

**කරුණාකළ හැටිත් ඔවුන්ට දන්වාපන්නැයි ඔහුට කීසේක. ඔහු පිටත්ව ගොස්, යේසුස්වහන්සේ තමාට කොපමණ මහත් දේවල් කළසේක්ද කියා දෙකපොලිසෙහි ප්‍රකාශ කරන්ට පටන්ගත්තේය. සියල්ලෝ මවිතවූවෝය. (මාර්ක් 5:19-20)**

## යක්ෂයාගේ බලවේග වලින් ආරක්ෂාවීම

යක්ෂයාගේ බලවේග වල ක්‍රියාකාරකම් වලින් ඔබව ආරක්ෂා කර ගැනීමේ විශේෂිත ක්‍රමවේද තිබේ. සැබෑ ලෙස නැවත ඉපදීම ලද පුද්ගලයෙකුට ආවේශ වීමට යක්ෂයාට නොහැකි බැවින් ඉතාම වැදගත් ආරක්ෂාව නම් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම වේ. පාපය තුළින් "යක්ෂයාට ඉඩක් ලබා දෙන" බැවින් පාපයෙන් ඈත්ව සිටින්න. පාපය සැබවින්ම ඔබට විරුද්ධව යක්ෂයාට පිටතින් සිට බලපෑම් ගෙනෙන ක්‍රියාකාරකම් වලට අවස්ථාව සළසා දෙන්නේය.

ශුද්ධාත්මයාණන්ගෙන් පූර්ණ වන්න. යක්ෂ ආත්ම වලට සහ දෙවියන්වහන්සේගේ ආත්මයට එකම ආත්මික භාජනයක් තුළ වාසය කළ නොහැකිය.

යක්ෂයන් කෙරෙහි ඇති අසාමාන්‍ය උනන්දුව අත්හරින්න. දේව වචනය යක්ෂයන් පිළිබඳව පවසන දේවල් අධ්‍යයනය කිරීමේ වරදක් නැත. එසේම මෙම පාඩමාලාව වැනි දේව වචනය මත පදනම් වූ පාඩමාලා අධ්‍යයනය කිරීමේ ද වරදක් නැත. නමුත් යක්ෂ ආත්ම ගැන තවත් දේවල් ඉගෙන ගැනීමට ලෞකික පොත්පත් කියැවීම හෝ මළවුන් සමඟ කතා කරන තැන්වලට යාම වැනි දේවල් නොකරන්න. ගුප්ත දේවල් සමඟ ඇති ඕනෑම ආකාරයක සම්බන්ධතාවයකින් වැළකී සිටින්න. මන්ත්‍රකරුවන්, යකැදුරන්, ජෝතිශ්‍ය ශාස්ත්‍රඥයින්, හඳහන් බලන්නන්, හස්ත රේඛා බලන්නන්, නිමිති අල්ලන්නන්, ගිරා ශාස්ත්‍ර කියන්නන් වෙත නොයන්න. ව්‍යාජ දෙවිවරුන් ඇදහීම හෝ ඔබගේ නිවසට පිළිම ගෙන ඒමට ඉඩහැරීම සිදු නොකරන්න :

**ඔවුන්ගේ දෙවිවරුන්ගේ රූප ගින්නෙන් දවාදමාපල්ලා. ඒවායේ තිබෙන රන් රිදීවලට ආශාවී ඒවා නොගනින්න. එසේ කළොත් නුඹ මලපතකට අසුවන්නේය. මක්නිසාද ඒවා නුඹේ දෙවිවූ ස්වාමින්වහන්සේට පිළිකුලක්ය. පිළිකුල් දෙයක් නුඹේ ගෙට ගෙනගොස් නුඹ ඊට සමානවී නාස්තියට කැපනොවන්න. නුඹ ඊට ද්වේෂකොට එය සහමුලින්ම පිළිකුල්කොට සිතාපන්න. මක්නිසාද එය නාස්තියට කැපය. (ද්විතිය කතාව 7:25-26)**

ඔබගේ මනස හා දිව පාලනය කර ගැනීම හා ඔබ ඇසුරු කරන අය ප්‍රවේසමෙන් තෝරා ගැනීම වැදගත්ය. ලෝකයෙන් සහ මාංසයෙන් ජය ගැනීම සහ යක්ෂ බලවේග වලට එරෙහිව තමන් ආරක්ෂා වීමේ හා යක්ෂයන්ට විරුද්ධ වීමේ යුද්ධයක් කරගෙන යාමද වැදගත් වේ.

# ස්වයං - පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. මිනිසාගේ ශරීරයට, ප්‍රාණයට හා ආත්මයට පහර දෙන ප්‍රධාන යක්ෂ ආත්ම වර්ග තුන මොනවාද?

3. යක්ෂ බලවේග සමඟ ගනුදෙනු කිරීමේ දී ආත්ම විමසීමේ දීමනාවේ වැදගත්කම කුමක්ද?

4. යක්ෂයා ආවේශවීම යනු කුමක්ද?

5. කෙනෙකුට යක්ෂාවේශ වීමක් සිදුවූ විට එම පුද්ගලයා තුළින් දැක ගත හැකි චරිත ලක්ෂණ කවරේද?

6. යක්ෂයා දැඩි ලෙස සිතෙහි රඳවා ගැනීම යනුවෙන් අදහස්වන්නේ කුමක්ද?

7. යක්ෂයා දැඩි ලෙස සිතෙහි රඳවා ගනු ලැබූ පුද්ගලයෙකුගේ චරිත ලක්ෂණ කවරේද?

8. යක්ෂයා විසින් පිටතින් සිට පීඩා කරනු ලැබීම යනු කුමක්ද?

9. යක්ෂයා විසින් පිටතින් සිට පීඩා කරනු ලැබූ තැනැත්තෙකුගේ චරිත ලක්ෂණ කවරේද?

10. යක්ෂයාගේ බලවේග ජය ගැනීම උදෙසා මෙම පාඩමේ දී ඇති බයිබලීය උපදෙස් සාරාංශගත කරන්න.

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ශුභාරංචි පොත් හතරෙහි ඇති පද 3774 අතුරින් 484 ක්ම විශේෂයෙන්ම ශාරීරික හා මානසික සුවය පිළිබඳව හා මළවුන් නැඟිටුවීම පිළිබඳව සම්බන්ධ වූ ඒවා වේ. මාර්ක් පොතෙහි, පද 666 ක් අතුරින් 209 ක්ම යේසුස්වහන්සේගේ හාස්කම් හා සම්බන්ධ වේ. ශුභාරංචි පොත් වල කතාන්දර වල පද 1257 න් 484 ක්ම (38.5%) සුව කිරීමේ හාස්කම් විස්තර කිරීමට කැපකර තිබේ. යේසුස්වහන්සේගේ සුව කිරීමේ සේවය පිළිබඳව අධ්‍යයනය කිරීමට පහත සඳහන් සටහන පාවිච්චි කරන්න.

   1. යේසුස්වහන්සේගේ අරමුණ :

      A. යේසුස්වහන්සේ පැමිණියේ දෙවියන්වහන්සේගේ වචන කතා කිරීමටය :

      **... මාගේම කැමැත්තෙන් මා කිසිවක් නොකර මාගේ පියාණන්වහන්සේ මට ඉගැන්වූ ලෙස මේ දේවල් කියන බවත් නුඹලා දැනගන්නවා ඇත. (යොහන් 8:28)**

      B. යේසුස්වහන්සේ පැමිණියේ දෙවියන්වහන්සේගේ කාර්යය හා කැමැත්ත ඉටු කිරීමටය :

      **මක්නිසාද මා ස්වර්ගයෙන් බැස ආවේ මාගේ කැමැත්ත නොව මා එවූ තැනන්වහන්සේගේ කැමැත්ත කරන පිණිසය. (යොහන් 6:38-39)**

      **දහවල්ව තිබියදී මා එවූ තැනන්වහන්සේගේ වැඩ අප විසින් කටයුතුය. රාත්‍රිය පැමිණෙයි, එවිට කිසිවෙකුට වැඩකරන්ට නුපුළුවන. (යොහන් 9:4)**

      **යේසුස්වහන්සේද: මාගේ කෑම නම් මා එවූ තැනැන්වහන්සේගේ කැමැත්ත කොට උන්වහන්සේගේ වැඩ ඉෂ්ට කිරීමය. (යොහන් 4:34)**

      C. අරමුණු වූයේ මේවාය :

      **...දෙවියන්වහන්සේගේ පුත්‍රයාණන් ප්‍රකාශකරනු ලැබුවේ මේ පිණිසය, එනම් යක්ෂයාගේ ක්‍රියා විනාශකරන පිණිසය. (1 යොහන් 3:8)**

      **... මක්නිසාද මා විසින් ඉෂ්ටකරන පිණිස පියාණන්වහන්සේ මට භාරදුන්නාවූ මා කරන්නාවූ වැඩම, පියාණන්වහන්සේ මා එවූ බවට මා ගැන සාක්ෂිදෙයි. (යොහන් 5:36)**

      D. උනන්දුව ඇති කළ හැඟීම වූයේ අනුකම්පාවය :

      උදාහරණ සඳහා මතෙව් 9:36; 12:9-13; 14:14; 18:27; 20:29-34; 29:34; මාර්ක් 1:41; 3:1-5; 5:19; ලූක් 6:6-10; 7:12-15; 10:33; 14:1-6; සහ යොහන් 11:38-44 බලන්න.

      සුව කිරීම් වලදී යේසුස්වහන්සේ පෙන්නුම් කළ අනෙකුත් හැඟීම් වූයේ ශෝකය, තරහව, සුසුම් ලෑම සහ වැළපීමයි. අනුකම්පාව යන්න කරුණාවට සමාන වේ. උන්වහන්සේගේ කරුණාවල් සියලු පරම්පරා කෙරෙහි වන අතර ඒවා සදාකාලිකව පවති . . . දෙවියන්වහන්සේගේ අද දවසේදීත් ලෙඩරෝග වලට ඒ අයුරින්ම ප්‍රතිචාර දක්වන බව අප දන්නේ මේ නිසාය. ඔබ කරුණාව ලබා ගන්නේ කරුණාව පෙන්වීම තුළින්ය; කරුණාව දක්වන්නෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු කරුණාව ලබන්නෝය.

**මක්නිසාද ස්වාමින්වහන්සේ කෙරෙහි සම්පූර්ණ සිත් ඇත්තන්ට පිහිටවෙන පිණිස උන්වහන්සේගේ බලය පාමින්, උන්වහන්සේගේ ඇස් පොළොව මුළුල්ලෙහි ඔබමොබ දුවන්නේය... (2 ලේකම් 16:9)**

E. යේසුස්වහන්සේ කළ ක්‍රියාවන් පියාණන්වහන්සේ ප්‍රසන්න කළේය :

**මා එවූ තැනන්වහන්සේ මා සමඟ සිටිනසේක. උන්වහන්සේ මා තනියම සිටින්ට නැරියසේක. මක්නිසාද උන්වහන්සේට ප්‍රසන්නවූ දේවල් මම නිතරම කරමියි කීසේක. (යොහන් 8:29)**

11. යේසුස්වහන්සේ ඔවුන් සියල්ලන්වම සුව කළ අවස්ථා පිළිබඳ සඳහන් වන බයිබල් පද:

- ක්‍රියා 10:38
- ලූක් 4:40 ; 6:17-19
- ලූක් 9:11
- මතෙව් 12:15
- මතෙව් 4:23-25
- මතෙව් 9:6, 35
- මතෙව් 10:1; 14:14, 34-36

111. යේසුස්වහන්සේගේ අවසන් වචන :

උන්වහන්සේගේ අවසන් වචන තුළ රාජ්‍යයේ ශුභාරංචිය ඉගැන්වීමට හා දේශනා කිරීමටත්, සුව කිරීම් තුළින් හා යක්ෂයන් දුරු කිරීම් තුළින් එහි බලය ප්‍රදර්ශනය කිරීමටත් කරන ලද ආඥාවක් අන්තර්ගත විය (මාර්ක් 16:18).

1V. යේසුස්වහන්සේ සුව කළ විශේෂ ලෙඩ රෝග සමහරක් :

- අපස්මාරය
- දිය උදර රෝගය
- බිහිරි හා ගොළු
- අංශභාග රෝගය
- වර්ෂ ගණනාවක් තිස්සේ පැවති මහලේ රෝගය
- යක්ෂාවේශ වූවන්
- වියළි අත (අංග විකල බව හෝ අංශභාගය)
- අන්ධබව
- ආබාධයන්
- කපන ලද කණ
- වෙනස් තලයන් තුනක සිටි මිනිසුන් මළවුන්ගෙන් නැඟිටුවීම
- කොරුන්

V. පාවිච්චි කරන ලද විවිධ ක්‍රමවේදයන් :

A. ඇතැම් අවස්ථාවලදී යේසුස්වහන්සේ රෝගියා තමන් වෙතට කැඳවූ සේක : මාර්ක් 3:1-6

B. අනෙක් අවස්ථා වලදී ඔවුන් උන්වහන්සේට හඬ ගැසුවෝය.

1. ශාතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13; ලූක් 7:1-10
2. යායිරස්ගේ දියණිය : මතෙව් 9:18-19; 23-26

C. උන්වහන්සේ සම්පූර්ණ මිනිසා සමඟ ගණුදෙනු කළ සේක :

1. සුවය සමඟ පව් උදෙසා සමාව
2. පූර්ණත්වයට වඩා පහසුවෙන් මිනිසුන්ට ශාරීරික සුවය පිළිගත හැකිය. ලූක් 8:26-39

3. ඇතැම් අවස්ථාවලදී උන්වහන්සේ මුලින් සුවකර, පසුව පව් සමාව ලබා දුනි : ලූක් 17:9; යොහන් 5:14
4. අනෙක් අවස්ථාවලදී උන්වහන්සේ මුලින් පව් සමාව ලබා දී පසුව සුව කළ සේක : මාර්ක් 2:1-12

D. ඇතැම් අවස්ථාවේදී රෝගියා තුළ ඇදහිල්ලක් නොමැතිව වුවද සුව වීම සිදු විය (ඒ පිළිබඳව සඳහන් කර නැත.)

- ලාසරස් : යොහන් 11:1-44
- මලකස්ගේ කන : ලූක් 22:50-51
- ගෙරසේනයේ යක්ෂාවේශ වූ තැනැත්තා : මාර්ක් 5:1-20
- බිහිරි හා ගොළු මිනිසා : මාර්ක් 7:32-35
- පේත්‍රුස්ගේ නැන්දම්මා : ලූක් 4:38-39
- වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:12-15
- වියළි අතක් සහිත මිනිසා : මාර්ක් 3:1-5
- අන්ධව උපන් මිනිසා : යොහන් 9:1-7
- ආබ්‍රහම්ගේ දියණිය : ලූක් 13:10-13
- රාජ්‍යසේවකයාගේ පුත්‍රයා : යොහන් 4:46-50
- ශතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13
- කානානිය ස්ත්‍රියගේ දියණිය : මතෙව් 15:21-28
- යායිසරස්ගේ දියණිය : මාර්ක් 5:35-43

E. ඇතැම් අවස්ථා වලදී පුද්ගලයාගේ ඇදහිල්ල නිසා සුව වීම සිදුවිය :

- අන්ධ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-31
- කුෂ්ට රෝගියා : මතෙව් 8:2-4; 20:29-34; මාර්ක් 1:40-44
- කුෂ්ඨ රෝගීන් දස දෙනා : ලූක් 17:11-19
- අන්ධ මිනිසුන් දෙනො : මතෙව් 20:29-34
- අන්ධ බර්තිමෙයුස් : මාර්ක් 10:46-52; ලූක් 18:35-43
- මහලේ රෝගී කාන්තාව : මතෙව් 9:20-22; මාර්ක් 5:25-34; ලූක් 8:43-44

F. ඇතැම් අවස්ථා වලදී වෙනත් අයගේ ඇදහිල්ල නිසා සුව වීම සිදුවිය :

- ශතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13
- රාජ්‍යසේවකයාගේ පුත්‍රයා : යොහන් 4:46-53
- අංශභාග රෝගියා ගෙන ආ සතර දෙනා මතෙව් 9:1-8; මාර්ක් 2:1-12; ලූක් 5:17-26
- කානානිය ස්ත්‍රියගේ දියණිය : මතෙව් 15:21-28
- යක්ෂාවේෂ වූ ගොළු මිනිසා : මතෙව් 9:32-33
- යක්ෂාවේෂ වූ අන්ධ ගොළු මිනිසා - මතෙව් 12:22-23
- යාසිරස්ගේ දියණිය : මාර්ක් 5:35-43
- බිහිරි හා ගොළු මිනිසා : මාර්ක් 7:32
- අන්ධ මිනිසා : මාර්ක් 8: 22-26

G. උන්වහන්සේ විවිධ වාචික ක්‍රම පාවිච්චි කළ සේක :

1. ඇතැම් අවස්ථා වලදී උන්වහන්සේ ප්‍රකාශයක් පමණක් කළ සේක :

- ආබ්‍රහම්ගේ දියණිය : ලූක් 13:10-13
- රාජ්‍යසේවකයාගේ පුත්‍රයා : යොහන් 4:46-50
- අන්ධ බර්තිමේයුස් : මාර්ක් 10:46-52

- අන්ධ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-31
- ශතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13

2. ඇතැම් අවස්ථා වලදී උන්වහන්සේ අණ කළ සේක :
    - දිය උදර රෝගියා : ලූක් 5:17-26
    - යායිරස්ගේ දියණිය : මාර්ක් 5:22-24, 35-43

3. උන්වහන්සේ අණ කිරීම හා ස්පර්ශ කිරීම යන දෙකම කළ සේක :

    - කුෂ්ඨ රෝගියා : මතෙව් 8:2-4
    - අන්ධ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-31
    - පේත්‍රුස්ගේ නැන්දම්මා : ලූක් 1:38-39
    - බිහිරි සහ ගොළු මිනිසා : ලූක් 7:32-35
    - වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:12-15
    - ආබ්‍රහම්ගේ දියණිය : ලූක් 13:10-13

4. උන්වහන්සේ යාච්ඤා කළ සේක :

    - පේත්‍රුස්ගේ නැන්දම්මා : ලූක් 4:38-39
    - බිහිරි හා ගොළු මිනිසා : මාර්ක් 7:32-35
    - වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:12-15
    - ලාසරස් : යොහන් 11:38-44
    - වියළි අතක් සහිත මිනිසා : මාර්ක් 3:1-5

H. පෞද්ගලික හැඳුනුම්කමට අමතරව උන්වහන්සේ දුර සිට ද සුව කළ සේක :

- ශතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13
- රාජ්‍යසේවකයාගේ පුත්‍රයා : යොහන් 4:46-50
- කානානිය ස්ත්‍රියගේ දියණිය : මතෙව් 15:21-28

I. සුව කිරීමේ ක්‍රියාවලියේ කොටසක් ලෙස යම් දෙයක් කරන ලෙස උන්වහන්සේ බොහෝ විට රෝගියාට අණ කළ සේක :

1. වියළි අතක් සහිත මිනිසා : එය දිගු කරන ලෙස : ලූක් 6:6-11
2. බෙතෙස්දාවේ කොර මිනිසා : නැගිට, යහන ගෙන ඇවිදින ලෙස : යොහන් 5:1-9
3. රෝගී පුත්‍රයෙකු සිටි රාජ්‍ය සේවකයා : ආපසු යන ලෙස . . . : යොහන් 4:46-54
4. කුෂ්ඨ රෝගීන් දසදෙනා : පූජකයන්ට පෙනී සිටින ලෙස : ලූක් 17:11-19
5. අන්ධ මිනිසා : සිලෝවම් පොකුණෙන් සෝදාගන්නා ලෙස : යොහන් 9:7

J. උන්වහන්සේ ප්‍රසිද්ධ ස්ථාන වලදී (කණ්ඩායම්, සිනගෝග) මෙන්ම පෞද්ගලිකව ද (නිවැස් වල, තනි පුද්ගලයන්ව) සුව කළ සේක.

K. උන්වහන්සේ අසාමාන්‍ය ද්‍රව්‍ය පාවිච්චි කළ සේක :
1. කෙළ
2. මඩ
3. කණ මත ඇඟිලි තැබීම
4. උන්වහන්සේගේ ඇඳුම් දාවල්ල
5. ජලයෙන් සේදීම

L. ඇතැම් අවස්ථා වලදී රෝගියා උන්වහන්සේ ස්පර්ශ කළේය :

- මාර්ක් 5:23-24
- ලූක් 6:17-19
- මාර්ක් 3:10
- මාර්ක් 6:56

M. ඇතැම් අවස්ථා වලදී උන්වහන්සේ රෝගියාව ස්පර්ශ කළ සේක :

1. අන්ධ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-31
2. විවිධ රෝගාබාධ සහිත මිනිසුන් : ලූක් 4:40
3. කුෂ්ඨ රෝගියා : ලූක් 5:13
4. දුර්වලකමේ ආත්මයකින් යුක්ත වූ ස්ත්‍රිය : ලූක් 13:10-13

N. ගොඩනැංවීමේ උපදෙස් විවිධාකාර විය . උදාහරණයක් ලෙස, පේත්‍රුස්ගේ මව යහනින් නැඟිට නිවසේ සිටි අයට සේවය කළාය. යායිරස්ගේ දියණියට සාත්තු කර ඇයට ආහාර සපයන මෙන් යේසුස්වහන්සේ පැවසූ සේක.

O. යේසුස්වහන්සේගේ සුවකිරීම් පහත ස්ථාන වලදී සිදු විය :

- නිවැස් වල (ඉදිරිපස, ඇතුළත)
- විවෘත රැස්වීම් වලදී : වීථි වල, පොකුණු අසල, කඳුකර ප්‍රදේශ වල, බෝට්ටු වල
- අවමංගල්‍ය වලදී
- මළ අයගේ සොහොන් අසල
- දේව මාලිගය
- සොහොන් බිම
- ආහාර ගන්නා අතර
- වෙනත් ස්ථානයකට යන අතර මඟ
- උද්‍යානවල

P. හාස්කම් වලට හා සුව කිරීම් වලට දැක්වූ ප්‍රතිචාර විවිධාකාර විය:

- පුදුමය
- දේව භය
- මත භේද
- පවුලේ අය හා ආගමික නායකයන් විසින් ප්‍රතික්ෂේප කිරීම
- යක්ෂ ආත්ම මොර ගැසීම
- තරහව
- ප්‍රසිද්ධිය
- දෙවියන්වහන්සේ මහිමයට පත් කිරීම
- ප්‍රශ්න ඇසීම ("මෙය කුමක් ද?")
- සාකච්ඡා (වාර්තාගත සහ ජනප්‍රවාදයේ එන)
- නිවැසියන් ගැළවීම ලැබීම

යේසුස්වහන්සේ විසින් සිදුකළ හාස්කම් විස්තරාත්මකව අධ්‍යයනය කිරීමට පහත මාර්ගෝපදේශය පාවිච්චි කරන්න :

# පෞද්ගලික සුව කිරීම්

## විශේෂිතව හඳුනාගත් යක්ෂ ආත්ම වල බලපෑම්

- කොර කාන්තාව : ලූක් 13:10-17
- සිනගෝගයේ සිටි අපවිත්‍ර ආත්මයක් සහිත මිනිසා : මාර්ක් 1:23-28; ලූක් 4:31-37
- ගෙරසේනයේ යක්ෂාවේශ වූ තැනැත්තා :මතෙව් 9:20-23; මාර්ක් 5:25-34; ලූක් 8:26-33
- මහලේ රෝගි කාන්තාව : මතෙව් 9:20-23; මාර්ක් 5:25-34; ලූක් 8:43-48
- කානානිය ස්ත්‍රියගේ දියණිය : මතෙව් 15:21-28; මාර්ක් 7:24-30
- යක්ෂ ආත්මයක් සහිත දරුවා : මතෙව් 17:14-21; මාර්ක් 9:14-29; ලූක් 9:37-45
- යක්ෂාවේශ වූ ගොළුවා : මතෙව් 9:32-33
- යක්ෂාවේශ වූ ගොළු හා බිහිරි මිනිසා : මතෙව් 12:22-30; මාර්ක් 3:22-27; ලූක් 11:14-26

**වෙනත් අවස්ථා :** යේසුස්වහන්සේ මුහුණ දුන් මෙම විශේෂිත අවස්ථාවන්ට අමතරව උන්වහන්සේගේ සේවයේදී උන්වහන්සේ යක්ෂ බලවේග වලින් බලපෑම් ලත් අයට සේවය කළ අවස්ථා ගැන බයිබලයේ පොදුවේ සඳහන් වේ.

- පහත අවස්ථා වලදී යේසුස්වහන්සේ යක්ෂයන් සමඟ ගනුදෙනු කළ අයුරු විස්තර කිරීමට "සුව කළ සේක" යන වචන යොදා ගෙන තිබේ : මතෙව් 4:24; ලූක් 6:18

- පහත අවස්ථා වලදී උන්වහන්සේගේ උපාය විස්තර කිරීමට "දුරු කළ සේක" යන වචනය යොදා ගෙන තිබේ : මාර්ක් 1:32-34, 39; 6:13

- යක්ෂයන් "පිටතට පැමිණි" බව ලූක් 4:41 හි වාර්තා වේ. උන්වහන්සේ ඔවුන් "සුවකළ බව" ලූක් 7:21 හි සඳහන් වේ. උන්වහන්සේ "තම වචනයෙන් ඔවුන් දුරුකළ සේක" යනුවෙන් මතෙව් 8:16 හි වාර්තා වේ.

- මද්ගලායේ මරියාගෙන් යේසුස්වහන්සේ යක්ෂයන් හත් දෙනෙකු දුරු කළ බව මාර්ක් 16:9 හා ලූක් 8:2-3 හි සඳහන් වේ.

- විශාල ජනකායන් හිදී යේසුස්වහන්සේ යක්ෂයන්ට කතා කිරීමට ඉඩ නොදුන් සේක : මාර්ක් 1:32-34

## පෞද්ගලිකව සුව කිරීම් : විශේෂිත යක්ෂ බලපෑමක් ගැන සඳහන් නොවේ.

- පේත්‍රුස්ගේ නැන්දම්මා : මතෙව් 8:14-15; මාර්ක් 1:30-31; ලූක් 4:38-39
- කුෂ්ඨ රෝගියා : මතෙව් 8:2-4; මාර්ක් 1:40-42; ලූක් 5:12-13
- අංගභාග රෝගියා : මතෙව් 9:1-8,35; මාර්ක් 2:1-12; ලූක් 5:17-26
- වියළි අතක් සහිත මිනිසා : මතෙව් 12:9-13; මාර්ක් 3:1-5; ලූක් 6:6-11
- යායිසරස්ගේ දියණිය : මතෙව් 9:18-19; 23-26; මාර්ක් 5:22-24; 35-42; ලූක් 8:41-42, 49-56
- ගොළු හා බිහිරි මිනිසා : මාර්ක් 7:32-37
- බෙත්සයිදාවේ අන්ධ මිනිසා : මාර්ක් 8:22-26
- අන්ධ බර්තිමේයුස් : මතෙව් 20:30-34; මාර්ක් 10:46-52; ලූක් 18:35-43
- ශතාධිපතියාගේ දාසයා : මතෙව් 8:5-13; ලූක් 7:1-10
- අන්ධ මිනිසුන් දෙදෙනා : මතෙව් 9:27-30
- වැන්දඹුවගේ පුත්‍රයා : ලූක් 7:11-15
- දිය උදර රෝගියා : ලූක් 14:1-6
- කුෂ්ඨ රෝගීන් දස දෙනා : ලූක් 17:11-19
- දාසයාගේ කන : ලූක් 22:49-51
- රාජ්‍ය සේවකයාගේ පුත්‍රයා : යොහන් 4:46-53
- දුර්වලකමින් පීඩිත මනුෂ්‍යයා : යොහන් 5:1-47
- අන්ධව උපන් මිනිසා : යොහන් 9:1-14
- අනාචාරයේදී අල්ලාගන්නා ලද කාන්තාව : යොහන් 8:1-11
- පව්කාර කාන්තාව : ලූක් 7:36-50

## මිනිසුන් විශාල සංඛ්‍යාවක් සුව කිරීම

- දේවමාලිගාවේ සිටි අන්ධයන් හා කොරුන් : මතෙව් 21:14
- ගලීලයේදී බොහෝ දෙනෙක් : මතෙව් 4:23-24; මාර්ක් 3:7-12; ලූක් 6:17-19
- පේත්‍රුස්ගේ නිවසේ සිටි මහත් සමූහයා : මතෙව් 8:16-17; මාර්ක් 1:32-34; ලූක් 4:40-41
- බොහෝ යක්ෂයන් : මාර්ක් 1:39
- කුෂ්ඨ රෝගියා සුව කිරීමෙන් පසු සමූහයා : ලූක් 5:14-16
- විවිධ පුද්ගලයන් : ලූක් 13:32
- සමූහයා : මතෙව් 9:35; 12:15-21; මාර්ක් 3:10-11
- යොහන් බව්තිස්තගේ ප්‍රශ්න : මතෙව් 11:2-6; ලූක් 7:18-23
- 5,000 ට කන්න දීමට පෙර : මතෙව් 14:13-14; ලූක් 9:11
- ගෙනසෙරත් හිදී : මතෙව් 14:34-36; මාර්ක් 6:53-56
- 4,000 ට කන්න දීමට පෙර : මතෙව් 15:29-31
- යොර්දානය අසල සිටි සමූහයා : මතෙව් 19:1-2
- දේවමාලිගාවේ සිටි අන්ධයන් හා කොරු: මතෙව් 21:14
- නාසරෙත් හි සිටි රෝගීන් සමහරක් : මතෙව් 13:53-58; මාර්ක් 6:1-6

## සුවය ලබා දෙන්නා ලෙස යේසුස්වහන්සේ පිළිබඳ පොදු ප්‍රකාශයන්

- සියලු ආකාර ලෙඩ හා රෝග සුව කිරීම : මතෙව් 4:23; 9:35-36
- උන්වහන්සේව සපර්ශ කළ සියලු දෙනා සුව කිරීම : මාර්ක් 6:56
- යක්ෂයා විසින් පීඩා කරනු ලැබූ සියලු දෙනා සුව කිරීම : යොහන් 10:38
- තවත් බොහෝ දේ - ඒවා ලියන ලද්දේ නම් ඒවා දරන්ට ලෝකයත් මදි වනු ඇත : යොහන් 20:30-31

2. ගෝලයන්ගේ සේවය අධ්‍යයනයෙන් සුව කිරීම් හා මිදීම ගැන තවත් දේ ඉගෙන ගන්න :

**යේසුස්වහන්සේ ගෝලයන්ට සුව කිරීමේ සේවය උදෙසා අණ කළ අතර ඔවුන්ව පිටත් කර හැරිය සේක :**

| | **මතෙව්** | **මාර්ක්** | **ලූක්** | **ක්‍රියා** |
|---|---|---|---|---|
| 12 දෙනා පිටත් කිරීම | 10:1-42 | 6:7-13 | 9:1-6 | |
| 70 දෙනා පිටත් කිරීම | | | 10:1-24 | |
| බැඳීමට/නිදහස් කිරීමට බලය | 16:17-19 | | | |
| අවසන් ආඥාව | 28:16-20 | 16:14-20 | 24:44-53 | 1:1-11 |

**ඔවුන් අසාර්ථක වීම් අත්දුටු වහුය :** මතෙව් 17:14-21; මාර්ක් 9:14-29; ලූක් 9:37-45

**ප්‍රමාද වී සිදුවන සුවවීම් ඔවුහු අත්දුටුවහුය :** එපප්‍රොදිතස් (පිලිප්පි 2:25-30); තිමෝති (1 තිමෝති 5:23) ; ත්‍රොපිමස් (2 කොරින්ති 8:18-22)

**යේසුස්වහන්සේ ගණුදෙනු කළ ආකාරයේම ප්‍රශ්න සමඟ ගෝලයෝ සාර්ථකව ගණුදෙනු කළෝය :**

| **සිදුවීම** | **පේත්‍රුස්ගේ ක්‍රියා** | **පාවුල්ගේ ක්‍රියා** |
|---|---|---|
| කුෂ්ඨ රෝගීන් සුව කිරීම | දොරටුව අසල ක්‍රියා 3:1 | ලුස්ත්‍රාවේදී ක්‍රියා 14:8 |
| ඔත්පල වූ අය සුව කිරීම | අයිනෙයස් : ඔත්පලව සිටි. අවුරුදු 8 ක්‍රියා 9:32 | උණ රෝගය නිසා ඇඳෙහි සිටි පබ්ලියස්ගේ පියා ක්‍රියා 28:7 |

| | | |
|---|---|---|
| අසාමාන්‍ය ලෙස සම්බන්ධතා ඇතිකරගත් ආකාර | සෙවණැල්ල ක්‍රියා 5:12 | ලේන්සුව/උඩවැස්ම ක්‍රියා 19:11 |
| සමූහයා සුව කරනු ලැබීය | ක්‍රියා 5:16 | ක්‍රියා 28:9 |
| මළවුන් නැඟිටවනු ලැබීය | ක්‍රියා 9:36 | ක්‍රියා 20:7 |

**ඔවුහු පහත තත්වයන් සමඟ ගණුදෙනු කළහ :**

| | | |
|---|---|---|
| - උණ සහ රක්තාතිසාරය : | පබ්ලියස්ගේ පියා | ක්‍රියා 28:8 |
| - අන්ධකම: | පාවුල් | ක්‍රියා 9:8 |
| - හිසට සිදු වූ තුවාල : | යුතිකස් | ක්‍රියා 20:9 |
| - හේතුව නොදත්, නිදන්ගත රෝග : | තබීතා | ක්‍රියා 9:37 |
| - අංශභාගය | අයිනෙයස් | ක්‍රියා 9:33 |
| - කොරබව | බොහෝ කොරුන් | ක්‍රියා 8:7; 3:2; 14:8 |
| - යක්ෂාවේශ වූවන් : | පිලිප්පි | ක්‍රියා 16:16-40 |
| - සර්පයන් දෂ්ඨ කළ අය : | පාවුල් | ක්‍රියා 28:3-6 |

**යේසුස්වහන්සේ කළාක් මෙන් ඔවුන් තනි පුද්ගලයන්ට මෙන්ම කණ්ඩායම් වලට ද සේවය කළහ :**

## පෞද්ගලික සුව කිරීම්

| අවස්ථාව | ක්‍රියා | වර්ගය |
|---|---|---|
| කොර හිඟන්නා සුව කිරීම | 3:1-4; 22 | ශාරීරික |
| පාවුල්ගේ දෑස් | 9:10-19; 22:10-21 | ශාරීරික |
| පේත්‍රුස් අයිනෙයස් සුව කිරීම | 9:32-35 | ශාරීරික |
| පේත්‍රුස් දොර්කස්ව සුව කිරීම | 9:36-43 | මළවුන් නැඟිටුවීම |
| ලුස්ත්‍රාවේ සිටි කොර මිනිසා | 14:8-18 | ශාරීරික |
| ලුස්ත්‍රාවේ පාවුල් නැඟිටුවීම | 14:19-20 | ශාරීරික, නිදහස් වීම |
| පිලිප්පියේ වහල් දැරිය | 16:16-40 | යක්ෂයාගෙන් මිදීම |
| යුතිකස් | 20:7-12 | මළවුන්ගෙන් නැඟිටුවීම |
| පාවුල්ට සර්පයෙක් දෂ්ඨ කිරීම | 28:3-6 | ශාරීරික |
| පබ්ලියස් ගේ පියා | 28:8-9 | ශාරීරික |

## සාමූහික සුව කිරීම්

| අවස්ථාව | ක්‍රියා |
|---|---|
| බොහෝ පුදුම හා ලකුණු | 2:42-47 |
| නිර්භීතවීම හා සුව කිරීමේ ලකුණු උදෙසා යාච්ඤාව | 4:23-31 |
| යෙරුසලමේදී බොහෝ දෙනා සුව කරනු ලැබීම | 5:12-16 |
| ස්තේපන් බොහෝ හාස්කම් කිරීම | 6:8-15 |
| පිලිප් සමාරියේදී බොහෝ දෙනා සුව කිරීම | 8:5-25 |
| පාවුල් හා බාර්ණබස් ලකුණු හා පුදුම දැක්වීම | 14:3 |
| පාවුල් විසින් එපිසයේ රෝගීන් සුව කිරීම | 19:11-12 |
| මෝල්ටාවේදී රෝගීන් සුව වීම | 28:8-9 |

ගෝලයන් තමන්ට අණ කළ දේ කළ අතර, යේසුස්වහන්සේ විසින් කරන බවට පොරොන්දු වූ දේවල් උන්වහන්සේ කරනු ඇතැයි බලාපොරොත්තු වූවාය (ක්‍රියා 3:4-7; 8:48; 28:3-6). සුව කිරීම සඳහා තමන්ට වූ බලය හා ආධිපත්‍ය තමන්ගේ දෙයක් නොව ක්‍රිස්තුස්වහන්සේගෙන් වූ දෙයක් බව ගෝලයන්

තේරුම් ගත්හ : ක්‍රියා 3:4-7; 9:17-18. යාච්ඤාව සුව කිරීමේ සේවයේ කොටසක් විය. ක්‍රියා 4:23-31; 9:40-41; 28:8; යාකොබ් 5:16. මැදහත්කාරකමේ හා ශුද්ධාත්මයාණන් මඟින් කරන සුව කිරීමේ "යාච්ඤා" ක්‍රම දෙකම පාවිච්චි කරනු ලැබීය. ක්‍රියා 3:4-7; යාකොබ් 5:14-16. තමන්ගේ සුව කිරීමේ සේවය නිසා යේසුස්වහන්සේ මෙන්ම ගෝලයන්ද පීඩාවන්ට මුහුණ දුන්හ: ක්‍රියා 4:3,29; 5:17-18; 6:9-15

**ක්‍රියා පොතෙහි වාර්තා වන ආකාරයට ඔවුන්ගේ සේවයට වූ වෙනත් ප්‍රතික්‍රියා තුළ පහත දේවල් ද අන්තර්ගත විය :**

- මහත් ප්‍රීතිය : 8:5-25
- බිය 2:43
- සභාවට සෙනඟ එකතු වීම : 2:42-47; 5:14
- පුදුමය හා ආශ්චර්යයට පත් වීම : 3:10-11
- ශ්‍රේෂ්ඨ නායකයන් නැඟිටුවීම (පාවුල්) : 9:10-19
- ශුභාරංචි ප්‍රකාශ කිරීම : 4:4; 8:5-25; 9:35-43
- ගොඩනැංවීමේ සේවය : 9:35
- දේව වචනය ස්ථිර වීම : 14:3
- දෙවියන්වහන්සේට මහිමය ලැබීම : 4:21
- ඔවුන් අඥාණ හා නූගත් අය වුවත්, සේවයේ හා පුද්ගලයන්ගේ ප්‍රබල බව සනාථ වීම : 4:13
- කිසිඳු තර්කයකට විරෝධය පෑ නොහැකි සාක්ෂි : 4:14-16
- මන්ත්‍රකරුවන් බැහැර කිරීම : 8:5-25
- විශාල සමූහයන්ට කරන ලද සාමූහික සේවාවන් : 5:16; 28:8-9
- වැරදි දේවල් වලට යටත් වීම හා ප්‍රශංසා කිරීම නිවැරදි කළ යුතු විය : 14:8-18; 3:12-13
- ඉහළ නායකයන්ට දේව වචනය දේශනා කිරීමේ අවස්ථා : 3,4 හා 7 පරිච්ජේද

**සුවය සඳහා නියමිත එක් ක්‍රමයක් නොවීය. ඔවුහු පහත ක්‍රම පාවිච්චි කළහ :**

- අත් තැබීම : ක්‍රියා 5:12; 14:3; 19:11; 28:8
- අත් තැබීම සමඟ වචනය : කොර මිනිසා (ක්‍රියා 3:1-10); පාවුල්ගේ දෑස් (ක්‍රියා 9:36-43)
- අත් වලින් එසවීම සමඟ වචනය එකතු විය : කොර මිනිසා (ක්‍රියා 3:1-42); පාවුල්ගේ දෑස් (ක්‍රියා 9:36-43)
- වචනය කතා කිරීම (ආධිපත්‍යයෙන් කරන ලද ආඥාව) : වහල් දැරිය (ක්‍රියා 16:18); ලුස්ත්‍රාවේ කොර මිනිසා (ක්‍රියා 14:10)
- යාච්ඤාව : පාවුල්ගේ දෑස් (ක්‍රියා 9:36-43); පබ්ලියස්ගේ පියා (ක්‍රියා 28:8-9)
- යාච්ඤා කරන ලද රෙදි කඩ : ක්‍රියා 19:11-12
- සෙවනැල්ල : ක්‍රියා 5:12-16
- වැළඳ ගැනීම : ක්‍රියා 19:12
- වටපිටාව : ක්‍රියා 14:19-20
- කිසිඳු ක්‍රමවේදයක් පාවිච්චි නොකිරීම . . . දිගින් දිගටම පවතින ආරක්ෂාව : ක්‍රියා 14:19-20
- වචනය හා ක්‍රියා කිරීමට අණ කිරීම :අයිනෙයස් (ක්‍රියා 9:33-34); කොර මිනිසා (ක්‍රියා 3)

**ඔවුන් රෝගීන්ට ප්‍රතිචාර දැක්වීමේ හේතුව විවිධාකාර විය :**

ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීම :

කොරව සිටි රෝගියාගේ : ක්‍රියා 3:2
මිතුරන්ගේ : තබීතා : ක්‍රියා 9:38

අවශ්‍යතාවයට ප්‍රතිචාර දැක්වීම :

අංශභාගය වැළඳී සිටි අයිනෙයස් : ක්‍රියා 9:33
යුතිකස් : ක්‍රියා 20:10
පබ්ලියස්ගේ පියා : ක්‍රියා 28:8
මෝල්ටාවේ සිටි රෝගියා : ක්‍රියා 28:9

ඇදහිල්ලට ප්‍රතිචාර දැක්වීම :

ලුස්ත්‍රාවේ සිටි කොරා : ක්‍රියා 14:9

හිරිහැරයට ප්‍රතිචාර දැක්වීම :

පිලිප්පියේ සිටි වහල් දැරිය : ක්‍රියා 16:18

ශුභාරංචියට සාක්ෂි දැරීම :

සියලුම සුව කිරීම් මෙහි ප්‍රතිඵලයක් ලෙස සිදු වූ නමුත් ක්‍රියා 8:5-7 හි නිශ්චිතව සඳහන් කරන ලදි.

ඇතැම් අවස්ථා වලදී . . .

- රෝගියා මුල පිරීය : දේවමාලිගාවේ දොරටුව අසල සිටි කොර මිනිසා : ක්‍රියා 3:3
- මිතුරන් මුල පිරීය : තබීතා : ක්‍රියා 9:38
- අපෝස්තළුවරයා මුල පිරීය :

| | | |
|---|---|---|
| පේත්‍රුස් | : ලිද්දායෙහි අයිනෙයස් | : ක්‍රියා 9:34 |
| පාවුල් | : ලුස්ත්‍රාවේ කොර මිනිසා | : ක්‍රියා 14:9 |
| පාවුල් | : පිලිප්පියේ වහල් දැරිය | : ක්‍රියා 16:18 |
| පාවුල් | : යුතිකස් | : ක්‍රියා 20:10 |
| පාවුල් | : පබ්ලියස්ගේ පියා | : ක්‍රියා 28:8 |

සුව කිරීම් හා මිදීම පිළිබඳ ගෝලයන්ගේ සේවය පිළිබඳ අධ්‍යයනය දිගටම කරගෙන යාම සඳහා පහත සඳහන් බයිබල් පද පාවිච්චි කරන්න :

## ක්‍රියා පොතෙහි සඳහන් තනි පුද්ගලයන් සුව කිරීම

### කොර සිඟන්නා සුව කිරීම : 3:1-4: 22

සුවය ලැබූ පුද්ගලයා : කොර මිනිසා

සුවය ලැබූ තත්වය : උපතින්ම වූ කොර භාවය

සේවය කළ තැනැත්තා : පේත්‍රුස් (සහ යොහන්)

සටහන් :

### පාවුල්ගේ දෑස් : 9:10-19: 22:11-13

සුවය ලැබූ පුද්ගලයා : පාවුල්

සුවය ලැබූ තත්වය : ස්වාමින්වහන්සේගේ මහිමය නිසා දෑස් අන්ධ වීම

සේවය කළ තැනැත්තා : දර්ශනයක් දැකීම හා දෙවියන්වහන්සේගෙන් සෘජුව අණ ලැබීමේ ප්‍රතිඵලයක් ලෙස ඔහු වෙතට ගිය, අනනියස්.

සටහන් :

### පේත්‍රුස් විසින් අයිනෙයස් සුව කරනු ලැබීම : 9:32-35

සුවය ලැබූ පුද්ගලයා : අයිනෙයස්

සුවය ලැබූ තත්වය : අංශභාග රෝගය, අවුරුදු අටක් ඔත්පළව සිට ඇත

සේවය කළ තැනැත්තා : පාවුල්

සටහන් :

**පේත්‍රුස් විසින් දෝර්කස් සුව කරනු ලැබීම : 9:36-43**

සුවය ලැබූ තැනැත්තා : දොර්කස් (තබීතා)

සුවය ලැබූ තත්වය : නොදන්නා රෝගයක් නිසා ඇය මිය ගොස් සිටියාය.

සේවය කළ තැනැත්තා : පේත්‍රුස්

සටහන් :

**ලුස්ත්‍රාවේ සිටි කොර මිනිසා : 14:8-18**

සුවය ලැබූ තැනැත්තා : නම සඳහන් නොවන "එක්තරා මනුෂ්‍යයෙක්"

සුවය ලැබූ තත්වය : දෙපා වාරු නැති වීම, උපතින්ම කොර වීම, ඔහු කිසිදාක ඇවිද තිබුණේ නැත.

සේවය කළ තැනැත්තා : පාවුල්

සටහන් :

**ලුස්ත්‍රාවේදී පාවුල් නැඟිටවනු ලැබීම : 14:19-20**

සුවය ලද තැනැත්තා : පාවුල්

සුවය ලැබූ තත්වය : පාවුල්ට ඔහුගේ සතුරන් විසින් ගල් ගසා මැරෙන්නට හැර තිබුණි.

සේවය කළ තැනැත්තා : ගෝලයන්

සටහන් :

**පිලිප්පියේ වහල් දැරිය : 16:16-40**

සුවය ලද තැනැත්තා : නම සඳහන් නොවන නිශ්චිත දැරියන්

සුවය ලැබූ තත්වය : යක්ෂාවේශවීම, ඇයට අනාගතය ගැන පැවසීමේ ආත්මයක් වූ අතර ඇයගේ ස්වාමියා විසින් ලාභ ඉපයීමට සාස්තර කියන පිණිස ඇයව යොදා ගත්තේය.

සේවය කළ තැනැත්තා : පාවුල්

සටහන් :

**යුතිකස් : 20:7-12**

සුවය ලැබූ තැනැත්තා : යුතිකස් නම් තරුණයෙක්

සුවය ලැබූ තත්වය : පාවුල් දේශනා කරන අතරතුර ඔහු උඩුමහලේ ජනේලයෙන් බිමට වැටුණි. උඩට ගන්නා විට ඔහු මිය ගොස් සිටියේය.

සේවය කළ තැනැත්තා : පාවුල්

සටහන් :

## පාවුල්ට සර්පයෙකු දෂ්ඨ කිරීම : 28:3-6

සුවය ලැබූ තැනැත්තා : පාවුල්

සුවය ලැබූ තත්වය : විෂ සර්පයෙකු දෂ්ඨ කිරීම

සේවය කළ තැනැත්තා : කිසිවෙකුත් නොවීය.

සටහන් :

## පබ්ලියස්ගේ පියා : 28:8

සුවය ලැබූ තැනැත්තා : මෙලිතය නම් දිවයිනේ ප්‍රධාන පුද්ගලයෙක් වූ, පබ්ලියස්ගේ පියා

සුවය ලැබූ තත්වය : උණ සහ රක්තාතිසාරය

සේවය කළ තැනැත්තා : පාවුල්

සටහන් :

## ක්‍රියා පොතෙහි සඳහන් කණ්ඩායම් සුව කිරීම්

| | |
|---|---|
| - බොහෝ පුදුම හා ලකුණු | 2:42-47 |
| - නිර්භිතවීම හා සුව කිරීමේ ලකුණු උදෙසා යාච්ඤාව | 4:23-31 |
| - යෙරුසලමේදී බොහෝ දෙනා සුව කරනු ලැබීම | 5:12-16 |
| - ස්තේපන් බොහෝ හාස්කම් කිරීම | 6:8-15 |
| - පිලිප් සමාරියේදී බොහෝ දෙනා සුව කිරීම | 8:5-8 |
| - පාවුල් හා බාර්ණබස් ලකුණු හා පුදුම දැක්වීම | 14:3 |
| - පාවුල් විසින් එපිසයේ රෝගීන් සුව කිරීම | 19:11-12 |
| - මෝල්ටාවේදී රෝගීන් සුව වීම | 28:8-9 |

# විසිවන වන පරිච්ඡේදය

## සභා පිහිටු වීම - ආදර්ශය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "සභාව" යන වචනය නිර්වචනය කිරීමට
- සභාවේ හිස අඳුනා ගැනීමට
- සභාවේ ශරීරය අඳුනා ගැනීමට
- සභාවේ සිටින නායකයන් අඳුනා ගැනීමට
- සභාවේ දූත මෙහෙය සාරාංශගත කිරීමට
- නව ගිවිසුම් සභාවේ ආදර්ශය හඳුනා ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මෙසේ නුඹලා මකිදෝනියෙහි සහ අකායෙහි සිටින සියලු ඇදහිලිවන්තයන්ට ආදර්ශවුණුහුය. මක්නිසාද නුඹලා වෙතින් ස්වාමීන්වහන්සේගේ වචනයේ හඬ මකිදෝනියෙහිත් අකායෙහිත් පැතිර ගියා පමණක් නොව අප විසින් කිසිවක් කියන්ට ඕනෑ නොකරන හැටියට දෙවියන්වහන්සේ කෙරෙහි තිබෙන නුඹලාගේ ඇදහිල්ල සැමතැනම ප්‍රකාශවිය.**
> **(1 තෙසලෝනික 1:7-8)**

## හැඳින්වීම

යේසුස්වහන්සේගේ ආඥාව වූයේ ශුභාරංචිය සමඟ සියලු ජාතීන් වෙත යන ලෙසය. යෙරුසලමෙන් හා යුදයෙන් ආරම්භවී සමාරිය සහ ලෝකයේ සියලු ජාතීන් වෙත පැතිරී යා යුතුය. "ඔබ යන අතර රෝගීන් සුව කරන්න, යක්ෂයන් දුරුකරන්න"යි ද යේසුස්වහන්සේ අණ කළ සේක.

එහෙත් මේ වගකීම් දෙකට අමතරව නවගිවිසුමෙහි ප්‍රකාශ වන ධර්ම ප්‍රචාරණය පිළිබඳ තුන්වන කාරණයක් අපට හමුවේ. ඇදහිලිවන්තයෝ කොතැනකට ගියද, ඔවුහු එහි සිටින අතර නව ඇදහිලිවතුන් පරිණත වන පිණිස ඔවුන් පෝෂණය කිරීම සඳහා සභාවක් පිහිටෙව්වෝය. සභා පිහිටුවීම පිළිබඳ පාඩම් තුනකින් මෙය පළමුවැන්න වේ. සභාවක් ආරම්භ කරන්නේ කෙසේද,යි ඔබට ඉගෙනගන්න පිණිස නව ගිවිසුමේ සභාව ආකෘතියක් ලෙස මෙම පරිච්ඡේදය සලකන්නේය. සභා පිහිටුවීම පිළිබඳ බයිබලීය ක්‍රමෝපායන් ගැන ඊළඟ පාඩම අවධානය යොමු කරන අතර සභාව ගුණනය වන ආකාරය පිළිබඳව 22 පරිච්ඡේදය පැහැදිලි කරන්නේය.

## නව ගිවිසුමේ ආකෘතිය

"ආකෘතියක්" යනු අනුගමනය කරන පිණිස සැලසුම් කරන ලද උදාහරණයකි. පසුව පිහිටුවනු ලබන නව සභාවන් සඳහා ආකෘතියක් සපයන පිණිස නව ගිවිසුම් යුගයේ මුල් සභාව පිළිබඳ වාර්තාව සුරක්ෂිත කොට ඇත.

## සභාව පිළිබඳ නිර්වචනය

"සභාව" යන වචනය "ස්වාමීන්වහන්සේට අයත්වූ ජන සමූහයක්" හෝ "පිටතට කැඳවනු ලැබුවෝ" යනුවෙන් අදහස් කෙරේ. සැබෑ සභාව ගොඩනැගිලි හෝ සංවිධාන නොවේ. එය නැවත උත්පාදනය ලැබූ සියලු ඇදහිලිවතුන්, කැඳවනු ලැබූ සෙනඟ මෙන්ම 1 පේත්‍රැස් 1:5 හි ජීවමාන ගල්ය. සභාව යන

වචනය ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වන විශාල විශ්ව සභාවේ කොටසක් වන පුද්ගලයාගේ ප්‍රාදේශීය සහභාගිත්වයන් සඳහා ද යොදා ගෙන අත.

## සභාවේ හිස

යේසුස්වහන්සේ සභාවේ හිසවන සේක. දෙවියන්වහන්සේ පැවසුවේ,

> **සියලු දේවල් උන්වහන්සේගේ පාදවලට යටත්කොට, සභාව උදෙසා සියල්ලට ප්‍රධානියා වෙන්ට උන්වහන්සේ නියම කළසේක. ඒ සභාව නම්, සියල්ලන් තුළ සියල්ල සම්පූර්ණකරන තැනන්වහන්සේගේ පූර්ණකම වන උන්වහන්සේගේ ශරීරයය. (එපිස 1:22-23)**

සභාව ගොඩනඟා ඇත්තේ පර්වතය වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ මත හා මුල් ප්‍රේරිතයන් හා අනාගතවක්තෲවරුන් විසින් දමන ලද අත්තිවාරම වන "කුඩා ගල්" මතය.

## සභාවේ ශරීරය

නැවත උත්පාදනය ලැබූ ඇදහිලිවතුන් සියලු දෙනාම ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ කොටසකි. දෙවියන්වහන්සේ මේ ලෝකය තුළ ස්වකීය කැමැත්ත සම්පූර්ණ කර ගැනීමකට භාවිත කර ගන්නා සෙනඟ අපය. සභාව ශරීරයක් ලෙස විස්තර කර ඇත්තේ එහි ක්‍රියාකාරීත්වය මිනිස් සිරුරට බොහෝ සෙයින් සමාන වන බැවිනි. මිනිස් සිරුරේ සෑම කොටසකටම සුවිශේෂී ක්‍රියාකාරීත්වයක් ඇති සේම සෑම සාමාජිකයෙකුටම සේවය සඳහා ආත්මික දීමනාවක් සහ දෙවියන්වහන්සේගේ සැළැස්මේ විශේෂ අරමුණක් ඇත (1 කොරින්ති 12).

මිනිස් සිරුර සභාව විස්තර කිරීම සඳහා නව ගිවිසුමේ භාවිත කර ඇති රූපකයන්ගෙන් එකකි. "රූපකයක්" යනු යම් දෙයක් තවත් එකකින් විස්තර කිරීමට යොදා ගන්නා වචනයක් හෝ වාක්‍ය කණ්ඩයකි. නව ගිවිසුමේ සභාව විස්තර කිරීම සඳහා භාවිත කර ඇති රූපක පිළිබඳව මෙම පාඩමේ අතිරේකව යොදා ඇති "තවදුරටත් අධ්‍යයනය සඳහා" යන කොටස බලන්න.

## සභාවේ නායකයෝ

දෙවියන්වහන්සේ දීමනා සහිතව මනුෂ්‍යයන් සභාවේ තබන සේක. මෙයට ප්‍රේරිතයන්, අනාගතවක්තෲවරුන්, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්, සභාපාලකවරුන් සහ ගුරුවරුන් ඇතුළත් වේ (එපිස 4:11-16). සේවයේ වැඩය සඳහා ඇදහිලිවතුන් සන්නද්ධ කිරීම ඔවුන්ගේ අරමුණයි. තමන්ගේ ආත්මික දීමනා හඳුනාගැනීමට ඔවුන්ට උපකාර වීමෙන් ඔව්හු මෙය කරති. සේවයේ ප්‍රායෝගික අංශවලදී වැඩිමහල්ලන් හා උපස්ථායකයෝ සභාවට සේවය කරති. තිතස් 1 හා 1 තිමෝති 3 බලන්න.

## සභාවේ දූත සේවය

එපිස 1:9-11 සහ 3:10-11 හි විස්තර කරන අන්දමට සභාවේ දූත සේවය වන්නේ දෙවියන්වහන්සේගේ අරමුණ සහ සැළැස්ම සම්පූර්ණ කිරීමයි. සභාවේ සියලු ක්‍රියාකාරකම් සාමාන්‍යයෙන් කොටස් දෙකකට බෙදිය හැකි බව නව ගිවිසුමේ වාර්තාව හෙළිකළේය.

> පළමුවැන්න ධර්ම ප්‍රචාරණය හෝ ශුභාරංචිය දේශනා කිරීමයි. ඇදහිලිවන්තයන් ශුභාරංචිය දේශනා කිරීමෙහි සහ ඉගැන්වීමෙහිද, නව ඇදහිලිවතුන් බෞතිස්ම කිරීමෙහි, ශුද්ධාත්ම බෞතිස්මය අත්දකින පිණිස ඔවුන්ට මඟපෙන්වීමෙහි, සුව කිරීමෙහි, මිදීමේ සහ යක්ෂයන් දුරුකිරීමෙහි කාර්යන් වල බහුලව යෙදී සිටියෝය.
>
> දෙවැන්න වර්ධනය කිරීම වේ : වර්ධනය කිරීම යනු ගොඩනැගීමය. ඇදහිලිවතුන් විසින් සභාවන් පිහිටුවනු ලැබ ඇත්තේ නව ඇදහිලිවතුන් ගෝලයන් ලෙස පරිණත වන තුරු ඔවුන්ට ඉගැන්වීමට සහ පෝෂණය කිරීම පිණිසය.

නව ගිවිසුමේ දූත සේවය පිළිබඳව අධ්‍යයනය කිරීමේදී ප්‍රධාන ප්‍රතිපත්ති හයක් (06) හමුවේ.

**පළමු වැන්න :** තමන්ගේම ප්‍රජාව, දේශය සහ ලෝකය වෙත ශුභාරංචිය ගෙනයාමේ වගකීම ඔවුන් සතුව සිටියෝය. සභාව යේසුස්වහන්සේ ස්වාමීන්වහන්සේ සහ ගැළවුම්කරුවාණන් ලෙස ලෝකයට

ඉදිරිපත් කළෝය. ගැළවීම සහ නව ජීවිතය අත් දකින්නට හැකිවන පිණිස ඔවුන් විසින් සෙනඟ යේසුස්වහන්සේ වෙත මඟපෙන්වනු ලැබුවෝය.

**දෙවැන්න** : ඔවුන් සිටියාවූ ස්ථානයේ ගැළවීම නොලැබූවාවූ අයට ශුභාරංචිය දේශනා කළෝය. ප්‍රේරිතයෝ ශාලාවන් කුලියට ගැනීමටත් ගොඩනැගිලි වලටත් තමන් සීමාකර නොගත්තෝය. දේව මාලිගා මළුවේ, නිවෙස්වල හෝ උඩුමහල්වල ඔව්හු රැස්වූවෝය (ක්‍රියා 2:46, 5:42) (ඔව්හු සමූහයන්ට සහ තනි පුද්ගලයන්ට දේශනා කළෝය). ඔව්හු සමූහ ධර්ම ප්‍රචාරණය හා පුද්ගලික ධර්ම ප්‍රචාරණය මගින් දේශනා කළෝය.

**තෙවැන්න** : ආගමික විශ්වාසයන්ගේ ක්‍රමයක් හෝ චාරිත්‍ර අනුව නොව යේසුස්වහන්සේ තුළින් ගැළවීම ලැබීම යනුවෙන් ශුභාරංචිය දේශනා කෙරිණි. එය බයිබලය පදනම් කරගත්, ක්‍රිස්තුස්වහන්සේ කේන්ද්‍ර ගතවූ, අවශ්‍යතාවයන් කෙරෙහි යොමු වූ සහ බලය ප්‍රකාශ වූ එකක් විය.

**සිව්වැන්න** : වැඩිහිටියන් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි දිනාගත් කළ දරුවන් ද එසේ වන බැවින් වැඩිහිටියන් ඉලක්ක කෙරිණි. මේ අයුරින් මුළු පවුලම ඇදහිලිවන්තයන් විය. (කොර්නේලියස්ගේ හැරීමේ වාර්තාව ක්‍රියා 10; පිලිප්පියේ සිර ගෙදර මුලාදෑනියා ක්‍රියා 16:31-33, ලිදියා ක්‍රියා 16:14-15 ස්තේපනස් 1 කොරින්ති 1:16; ඔනේසිපොරස් 2 තිමෝති 1:16 සහ පිලමොන් පිලමොන් 2).

**පස්වැන්න** : නව ඇදහිලිවන්තයෝ සම්පූර්ණයෙන්ම ප්‍රාදේශීය සභාවේ ජීවිතයට එකතු කරනු ලැබුවෝය. ඔව්හු උගන්වනු ලැබ සභාවේ අනෙක් සාමාජිකයන් සමඟ යාච්ඤාවෙන් හා සහභාගීත්වයෙන් පෝෂණය කරනු ලැබුවෝය (ක්‍රියා 2:42). ඇදහිලිවන්තයෝ මූලධර්ම, ප්‍රතිපත්ති සහ කිතුනු දිවියේ ව්‍යවහාරයන් තුළ පිහිටවනු ලැබුවෝය. යේසුස්වහන්සේ විසින් උගන්වනු ලැබූ "සියල්ල පවත්වන්නට" ඔවුන්ට උගන්වනු ලැබිණි.

**හයවැන්න** : අනෙක් ප්‍රදේශවලට ශුභාරංචිය ගෙනයන පිණිස කැඳවනු ලැබූ අය සභාව විසින් හඳුනාගනු ලැබූ අතර පිටත්කර හරිනු ලැබුවෝය (ක්‍රියා 13:1-3).

## තෙසලෝනියේදී ආදර්ශයක්

නව ගිවිසුමේ සභාවන්හි තිබූ ගුණාංගයන් වන ධර්ම ප්‍රචාරණය පිළිබඳ ආදර්ශයන් හා වර්ධනය තෙසලෝනියෙහි පැවති සභාව නිරූපණය කළේය. පාවුලුතුමා එය මෙසේ ලිව්වේය...

> **මක්නිසාද අපේ ශුභාරංචිය නුඹලා වෙතට පැමිණුණේ වචනයෙන් පමණක් නොව බලයත් ශුද්ධාත්මයත් බොහෝ නිසැකකමත් ඇතුවය. එසේය, නුඹලා නිසා අපි නුඹලා අතරෙහි කොයි ආකාර අය වීමුදැයි නුඹලා දන්නහුය. නුඹලාද බොහෝ පීඩාවෙන් යුක්තව ශුද්ධාත්මයාණන්ගේ ප්‍රීතියෙන් වචනය පිළිගැනීමෙන් අපද ස්වාමීන්වහන්සේද අනුවයන්නෝ වූහ. මෙසේ නුඹලා මකිදෝනියෙහි සහ අකායෙහි සිටින සියලු ඇදහිලිවන්තයන්ට ආදර්ශවුණාහුය. මක්නිසාද නුඹලා වෙතින් ස්වාමීන්වහන්සේගේ වචනයේ හඬ මකිදෝනියෙහිත් අකායෙහිත් පැතිර ගියා පමණක් නොව අප විසින් කිසිවක් කියන්ට ඕනෑ නොකරන හැටියට දෙවියන්වහන්සේ කෙරෙහි තිබෙන නුඹලාගේ ඇදහිල්ල සැමතැනම ප්‍රකාශවිය. එසේ නුඹලා වෙතට අපේ පැමිණීම කොයි ආකාරව තිබුණේද කියාත් නුඹලා ජීවමානවූ සැබෑවූ දෙවියන්වහන්සේට මෙහෙකරන පිණිසද, උන්වහන්සේ විසින් මළවුන්ගෙන් නැගුටුවනලද්දාවූ, පැමිණෙන උදහසින් අප ගළවන්නාවූ තමන්ගේ පුත්‍රවූ යේසුස්වහන්සේ ස්වර්ගයෙන් එනවා බලාසිටින පිණිසද, නුඹලා දේවතාරූප කෙරෙන් දෙවියන්වහන්සේ වෙතට හැරුණ හැටිත් ඔව්හුම දන්වති. (1 තෙසලෝනික 1:5-10)**

ඉහත බයිබල් කොටසේ ඇති රටාවන් නිරීක්ෂණය කරන්න.

### "අපේ ශුභාරංචිය නුඹලා වෙත පැමිණියේ"

තෙසලෝනියේ සෙනඟ වෙත පණිවිඩය පැමිණියේ දෙවියන්වහන්සේගේ වචනය තුළින් සහ බලයේ ප්‍රකාශවීමකින් යුතුවය. එය දේශනා කරනු ලැබුවේ පෞද්ගලික වැටහීමකින් සහ ශුද්ධාත්මයාණන්ගේ බලයෙන් යුක්තවය.

**“නුඹලා වචනය පිළිගත්තහුය”**

ශුභාරංචියට සැළකිය යුතු විරුද්ධකම් තිබූ බැවින් ඔවුන් දැඩි පීඩා මධ්‍යයේ එය පිළිගත්තෝය. ඔව්හු ශුද්ධාත්මයාණන්ගේ ප්‍රීතිය ඇතිව පණිවිඩය පිළිගත්තෝය.

**“ඔබ අනුව යන්නෝ වූහ”**

දෙවියන්වහන්සේ වෙතට හැරුණාවූ අය යේසුස්වහන්සේගේ හා ප්‍රේරිතයන්ගේ ඉගැන්වීම් සහ ආදර්ශයන් අනුගමනය කළෝය.

**“නුඹලා සියලු ඇදහිලිවතුන්ට ආදර්ශයක් වුණහුය”**

ඔව්හු ආදර්ශයක් අනුගමනය කළ අතර ඔව්හු අන් අයට ආදර්ශයක් වුණෝය.

**“නුඹලා වෙතින් ස්වාමින්වහන්සේගේ වචනයේ හඬ පැතිරිණි”**

වර්තමානයේ අපට තිබෙන ගුවන්විදුලි යන්ත්‍ර, රූපවාහිනි, වීඩියෝ හෝ කැසට් පට, හෝ ප්‍රචාරණ ක්‍රමයන් මේ සෙනඟට තිබුණේ නැත. ඔවුන් භාවිත කළේ බයිබලිය ක්‍රමය වන පුද්ගලික ධර්ම ප්‍රචාරණයයි.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. "සභාව" යන වචනය විස්තර කරන්න.

3. සභාවේ හිස කවුද?

4. සභාවේ ශරීරය කවුද?

5. දෙවියන්වහන්සේ විසින් සභාවේ තබන ලද නායකයන් කවුද?

6. සභාවේ දූත සේවය කුමක්ද?

7. පාඩමේදී ආදර්ශයක් ලෙස සාකච්ඡා කරනු ලැබුවේ නව ගිවිසුම් කුමන සභාවද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. ක්‍රියා පොත සහ නව ගිවිසුමේ යැවුම්පත්‍ර කියවන්න. සභාව පිළිබඳව සඳහන් කර ඇති සෑම යොමුවක්ම අධ්‍යයනය කරන්න. මේ යොමුවල ධර්ම ප්‍රචාරණය සඳහා “ධ” සහ වර්ධනය සඳහා “ව” යන්න සළකුණු කරන්න. ඔබගේ අධ්‍යයනය මගින් මුල් සභාව දිව්‍යමය දූතන සේවයේ මේ කොටස් දෙක සම්පූර්ණ කළේ කෙසේද යන්න වැඩිදුරටත් නිරූපණය කරනු ඇත.

2. සභාව විස්තර කිරීමට බයිබලයේ භාවිත කර ඇති අනෙක් ඇතැම් “රූපක” මෙන්න :

- ස්වාමින්වහන්සේගේ පවුල : මතෙව් 6:9; ලූක් 11:2; රෝම 8:15; හෙබ්‍රෙව් 2:10-11; එපීස 3:14-15; රෝම 8:17; 1 තිමෝති 3:15
- ඇදහිලිවතුන්ගේ සහභාගීත්වය : 1 යොහන් 1:3; ක්‍රියා 2:42-44
- ක්‍රීඩකයන් කණ්ඩායමක් : 1 කොරින්ති 9:24-26; ගලාති 2:2; 5:7; පිලිප්පි 2:16; 2 තිමෝති 2:5; 4:7; හෙබ්‍රෙව් 12:1, 1 තිමෝති 6:12
- ස්වාමින්වහන්සේගේ හමුදාව : 2 කොරින්ති 10:4-5; එපීස 6:11-12 1 තිමෝති 1:18; 2 තිමෝති 2:3-4; 1 කොරින්ති 9:7, 1 පේත්‍රුස් 2:11
- බැටළු රැළක් : ක්‍රියා 20:28; 1 පේත්‍රුස් 5:2-4
- පාසැලක් (සභාව පාසැලක් යන අදහස පිළිඹිබු වන්නේ එහි සේවය තුළ කොටසක් ලෙස ඉගැන්වීම හා පුහුණු කිරීම පැවතීම යන කරුණ හේතුවෙනි) මතෙව් 28:18-20
- මෙහෙකරුවන් හෝ ගබඩාකරුවන් : (ශුභාරංචියේ) මතෙව් 25:14-30; 1 කොරින්ති 4:1-2; එපීස 4:12
- ගොඩනැගිල්ලක් : 1 කොරින්ති 3:9-15; එපීස 2:20-22; මතෙව් 16:18; 21:42; 1 පේත්‍රුස් 2:4- 7; ලූක් 6:46-49; ක්‍රියා 4:11; රෝම 15:20; ගීතාවලිය 118:22
- අබිරහසක් : එපීස 3:4-6;
- කෙතක් : 1 කොරින්ති 3:6-9; 2 තිමෝති 2:6; මතෙව් 13:3-8, 18-20;
- රාජකීය පූජක වංශයක් : 1 පේදුරු 2:5-9
- ක්‍රිස්තුස්වහන්සේගේ මනාලිය : යොහන් 3:29; 1 කොරින්ති 11:2; එපීස 5:21-32; එළිදරව් 19:7-9.
- ස්වාමින්වහන්සේගේ තානාපතියෝ : එපීස 6:20; 2 කොරින්ති 5:20
- සැබෑවේ කනුව සහ අත්තිවාරම - 1 තිමෝති 3:15
- ස්වාමින්වහන්සේගේ මාලිගාව : ක්‍රියා 17:24; 1 කොරින්ති 3:15-17; එපීස 2:21-22; 1 පේත්‍රුස් 2:4-5
- වන්දනාකරුවන් : පිලිප්පි 3:20; රෝම 12:2; හෙබ්‍රෙව් 11:3
- මාර්ගය : ක්‍රියා 9:2; යොහන් 14:6
- ස්වාමින්වහන්සේගේ උරුමය : එපීස 1:18
- ස්වාමින්වහන්සේගේ නිර්මාණය : එපීස 2:10; 1 යොහන් 3:2
- ලෝකයේ ආලෝකය : මතෙව් 5:14-16; එපීස 5:14
- පොළොවේ ලුණු : මතෙව් 9:49-50; ලූක් 14:33
- මිනිසුන් අල්ලන්නන් : මාර්ක් 1:17; මතෙව් 4:18-20; 13:47
- ගිනිමය පීඩා : 1 පේත්‍රුස් 1:6-7; 4:12-17, යාකොබ් 1:3
- වල් ඔලීව අත්ත : (අන්‍යජාතීන් උන්වහන්සේගේ ශරීරයට බද්ධ කර ඇත) : රෝම 11:16-24

# විසි එක් වන පරිච්ඡේදය

## සභා පිහිටුවීම - ක්‍රම

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු ඔබට :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- සභා පිහිටුවීමේ චක්‍රයේ පියවර දහය හඳුනා ගැනීමට
- පාවුලුතුමා සිය ධර්ම ප්‍රචාරණ උත්සාහයන් වලදී අවධානය යොමු කළ සේවයේ ප්‍රමුඛතාවයන් හත හඳුනා ගැනීමට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

**සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සදාකාලයටම ගෞරවය වේවා . ආමෙන්. (එපීස 3:21)**

## හැඳින්වීම

ආත්මික බෝකිරීමේ චක්‍රය අනුව ක්‍රියා කිරීමට තම සාමාජිකයන් පුහුණු කරන්නාවූ සභාවන් පිහිටුවීමට ධර්ම ප්‍රචාරණය මගපෙන්වන්නේ කෙසේදැයි ඔබට මෙම පාඩමේදී ඉගෙන ගැනීමට හැකිවනු ඇත. මෙම ආදර්ශය අනුගමනය කිරීමෙන් සභා පිහිටුවීම බලවත් හා ධර්ම ප්‍රචාරණයේ නොනැවතෙන බලය වනු ඇත.

සභා පිහිටුවීමේ මේ චක්‍රය ඉගෙනගැනීමට අමතරව සැබවින්ම අලුත් සභාවක් පිහිටුවීමේ ප්‍රායෝගික උපදෙස් "තවදුරටත් අධ්‍යයනය සඳහා" කොටසින් සපයා දෙන්නේය.

## සභා පිහිටුවීමේ චක්‍රය සඳහා ක්‍රමවේදයන්

පාවුලුතුමාගේ සේවය නව ගිවිසුම් කාලයේ සභා පිහිටුවීමේ චක්‍රය පිළිබඳව හොඳම උදාහරණය සපයා දෙන්නේය. පහත දැක්වෙන සටහන පරීක්ෂා කර ඒ සමඟ ඇති සාකච්ඡාව අධ්‍යයනය කරන්න. ඔබගේ බයිබලයේ ඇති ශුද්ධ ලියවිලි කොටස් කියවීමට සහතික වන්න.

| | |
|---|---|
| | 1. සේවකයන්ට අණකරනු ලැබිය |
| 10. චක්‍රය නැවත නැවත සිදුවිය | 2. මිනිසුන් සමඟ සම්බන්ධතා ඇතිකරගනු ලැබිය. |
| 9. සබඳතාවයන් දිගටම පැවතිය | 3. ශුභාරංචිය සන්නිවේදනය කරනු ලැබිය |
| 8. සභාව භාරදෙනු ලැබිය | 4. ඇසූ අය දෙවියන්වහන්සේ වෙතට හැරුණි |
| 7. නායකයන් කැපවිය | 5. ඇදහිලිවන්තයන් රැස්විය |
| | 6. ඇදහිල්ල ස්ථිර විය. |

වර්තමානයේ යොදාගත හැකි, නව ගිවිසුමේ දී යොදාගන්නා ලද සභා පිහිටුවීම් චක්‍රයේ පියවරයන් පහත දැක්වේ :

## 1. සේවකයන්ට අණ කරනු ලැබීය : ක්‍රියා 13:1-4; 15:39-40

නිශ්චිත ප්‍රදේශයක් වෙත ශුභාරංචිය ගෙන යාමට සේවකයන් පුහුණු කරනු ලැබූ අතර ඔවුන්ට එම වගකීම පවරනු ලැබීය. මව් සභාවේ ඇදහිලිවන්තයන් අදාළ කාර්යය සඳහා දෙවියන්වහන්සේ වෙන් කළ අයට උපකාර කිරීම, සූදානම් කිරීම, ඔවුන්ව පිටත් කිරීම, සහයෝගය දීම හා සහජීවනයෙන් කටයුතු කිරීම සිදු කළහ.

## 2. මිනිසුන් සමඟ සම්බන්ධතා ඇති කරගනු ලැබිය : ක්‍රියා 13:14-16; 14:1; 16:13-15

පාවුල් නව ප්‍රදේශයකට ඇතුළු වූ විට, සැමවිටම එහි සිනගෝග වල සිටි ආගමික නායකයන් සමඟ ආචාරශීලී සම්බන්ධතා ඇතිකර ගත්තේය. හැකි උපරිම අයුරින් ප්‍රාදේශීය නායකයන්ගේ තේරුම් ගනු ලැබීම හා සහයෝගය ලබා ගැනීමට ඔහු උත්සාහ කළේය. ඉන් අනතුරුව කණ්ඩායම් හා තනි පුද්ගලයන් සමඟ සම්බන්ධතා ඇති කර ගනු ලැබීය. එහි ඉලක්කය වූයේ ශුභාරංචි පණිවුඩය ඇසීම සඳහා හැකිතරම් සෙනගක් ඇති කර ගැනීමටය.

## 3. ශුභාරංචිය සන්නිවේදනය කරනු ලැබීය: ක්‍රියා 13:17; 16:31

ඉගැන්වීම, දේශනා කිරීම, සාක්ෂි දැරීම හා බලය ප්‍රදර්ශනය කිරීම තුළින් ශුභාරංචිය සන්නිවේදනය කරනු ලැබීය. බලපෑමක් කළ හැකි අයුරින් ශුභාරංචිය සන්නිවේදනය කිරීම උදෙසා විවිධ ක්‍රමවේද යොදාගනු ලැබීය. ඇතැම් නගර වලදී යොදාගත් ක්‍රමවේදය වූයේ සිනගෝගයේ දේශනා කිරීමය (ක්‍රියා 14:1). තවත් නගර වලදී, ප්‍රතිචාරයක් දැක්වීමට සූදානම් පුද්ගලයන් විශේෂ කණ්ඩායම් වලට වෙන් කරනු ලැබීය (ක්‍රියා 19:9). තවත් සමහර ප්‍රදේශ වලදී තනි තනි පුද්ගල කණ්ඩයාම් වලට විශේෂිතව සේවය කරනු ලැබීය (ක්‍රියා 13:42). තවද ශුභාරංචිය නිසි ලෙස සන්නිවේදනය කරනු ලැබූ බව සහතික කිරීමට ක්‍රමවේද මෙන්ම භාෂාව ද අවස්ථාවට ගැළපෙන පරිදි වෙනස් කරගනු ලැබීය (ක්‍රියා 22:2).

## 4. ඇසූ අය දෙවියන්වහන්සේ වෙතට හැරුණි : ක්‍රියා 13:48; 16:14-15

බලවත් ලෙස ශුභාරංචිය ප්‍රකාශ කිරීමේ ප්‍රතිඵලය වූයේ මිනිසුන් දෙවියන්වහන්සේ වෙතට හැරෙනු ලැබීමයි. එහිදී පුද්ගලයන් ගැළවීමේ පණිවුඩය පිළිගත් අතර පව් කමාව ලබා ගත්හ.

## 5. ඇදහිලිවන්තයන් රැස්විය : ක්‍රියා 13:43

ධර්ම ප්‍රචාරණය කිරීමෙන් හා මිනිසුන් දෙවියන්වහන්සේ වෙතට හැරීමෙන් පාවුල් නතර වූයේ නැත. ඔහු ඇදහිලිවන්තයන් ප්‍රාදේශීය සභාවක් තුළ සංවිධානය කළේය. නව ඇදහිලිවන්තයන්ව ඉක්මනින්ම හා ප්‍රාදේශීය සභාවේ සහභාගිත්වයට හා විනයට හඳුන්වා දෙනු ලැබීය. නව සභාවට එකට එකතු වීමට වේලාවන් හා ස්ථාන නියම කරනු ලැබීය.

## 6. ඇදහිල්ල ස්ථිර විය : ක්‍රියා 14:21,22; 15:41

මහා ආඥාව තුළ දක්වා ඇති පරිදි (මතෙව් 28:19-20), දෙවියන්වහන්සේ වෙතට හැරීමෙන් අනතුරුව තවදුරටත් උපදෙස් දිය යුතුය. මෙම ඉගැන්වීම් තුළින්, නව ඇදහිලිවන්තයන් කිතුනු ඇදහිල්ලේ මූලික කරුණු හා දේව රාජ්‍යය තුළ ජීවත් විය යුතු ආකාරය ඉගෙන ගැනීමත් සමඟ ඔවුන් ප්‍රාදේශීය සභාව තුළ පිහිටුවීම සිදු වේ. "ඇදහිල්ල ස්ථිර කරනු ලැබීම" තුළින් ආත්මික පරිණතභාවය වර්ධනය වූ අතර, තම ආත්මික දීමනා හඳුනාගනිමින් ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ ක්‍රියාකාරී සාමාජිකයන් වීමට ඇදහිලිවන්තයන්ට උපකාරී විය.

## 7. නායකයන් කැපවිය : ක්‍රියා 14:23

ඇදහිලිවන්තයන් පරිණත වන විට, දෙවියන්වහන්සේ විසින් ප්‍රාදේශීය නායකයන් නැඟිටවනු ලැබීය. සෑම සභාවක්ම බයිබලයට අනුකූල, ක්‍රියාකාරී හා තම භූගෝලීය පිහිටීම තුළ බලපෑමක් කළ හැකි අන්දමේ බයිබලීය සංවිධානයක් ලෙස ගොඩනැඟුණි. නව සභාවක් තුළින් නායකයන් නැඟිටවනු ලැබීමත් සමඟ, සභාවටම එකවර ආත්මික දිමනා ක්‍රියා කිරීමේ ආධිපත්‍ය දෙනු ලැබිය. පාවුල් නායකයන් තෝරා ගන්නා විට, ඔවුන් එම පුද්ගලයන් අතරින්ම තෝරාගත් අතර වෙනත් ප්‍රදේශ වලින් ගෙන්වා ගත් අය නොවූහ.

> **මා එන විට නුඹ ක්‍රීතෙහි නැවැත්වූ කාරණය නම්, අඩුව තිබුණු දේවල් නුඹ විසින් පිළිවෙළට යොදන පිණිසත් මා නුඹට ආඥාකළ ලෙස නුවරක් පාසා වැඩිමහල්ලන් පත්කරන පිණිසත්ය: (තීතස් 1:5)**

## 8. සභාවට භාරදෙනු ලැබීය : ක්‍රියා 14:23; 16:40

නායකයන් පත් කරනු ලැබ ඔවුන් බලපෑමක් කළ හැකි ලෙස ක්‍රියාත්මක වන විට සභාව පිහිටවූ තැනැත්තා මත යැපීම නතර වේ. සභාව පිහිටවූ තැනැත්තාගෙන් නව ප්‍රාදේශීය නායකයන්ට ක්‍රමානුකූල පැවරීමක් සිදුවේ. සභාව ක්‍රියාකාරී ඇදහිලිවන්තයන්ගේ ශරීරයක් ලෙස, දෙවියන්වහන්සේ වෙතට භාරදෙනු ලැබීය. සහභාගීත්වය හා නායකත්වය අතින් නව සභාවන් මව් සභාවට සම්බන්ධව තිබුණද, ඔවුන් ප්‍රධාන සභාව මත රදා පවතින්නේ නැත. ඔවුන් ස්වයං පෝෂිත සභාවන් වන අතර බාහිර මූල්‍යමය උපකාර වලින් තොරව ශුභාරංචි කාර්යය කරගෙන යාමට සමත් වේ.

නව සභාව උදෙසා සූදානම් කරන ලද සියලුම මූල්‍යමය සැකසීම් කළ යුත්තේ තමන්ටම තම කටයුතු පාලනය කරගත හැකි අන්දමටය. සභාවක් තවත් සභාවකින්, නිකායකින් හෝ වෙනත් රටක සිටින ඇදහිලිවන්තයන්ගෙන් මූල්‍යාධාර ලබා ගන්නේ නම්, එවිට එම සභාව ඒවා මත යැපීමට පටන් ගනී. අනුග්‍රහය දක්වන සභාව හෝ නිකාය අසමත් වුවහොත්, නව සභාවද අසාර්ථක වනු ඇත. එම රටවල් දෙක අතර සම්බන්ධතා බිඳ වැටුණහොත්, අනෙක් රටෙන් ලැබෙන ආධාර කපා හැරෙන බැවින්, සභාවට අපහසුතාවයන්ට මුහුණ දීමට සිදු වනු ඇත.

වතුර මිදියුෂ බවට හැර වූ සහ රොටි කිහිපයක් හා මාළු කිහිපයක් සමූහයකට ආහාරයට ප්‍රමාණවත් තරම් වැඩි කළ ස්වාමීන්වහන්සේට සැබවින්ම ශුභාරංචිය ප්‍රකාශ කිරීමට අවශ්‍ය අරමුදල් රැස්කර දීමේ හැකියාව තිබේ. පාවුල් දේව වචනය මත සහ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ නැමති පර්වතය මත නව සභාවන් ගොඩනැඟුවේය. ඔහු සංවිධානයක් මත, නිකායක් මත හෝ තමාගේ පෞරුෂත්වය මත ඒවා ගොඩනැඟුවේ නැත. යැපීමක් නිර්මාණය කිරීම තුළින් ස්වාධීන වීමට පුහුණුවක් නොලැබේ.

## 9. සබඳතාවයන් දිගටම පැවතිය : ක්‍රියා 15:36; 18:23

නව සහභාගීත්වය, සභාවන් ඇති කළ තැනැත්තා (පාවුල්) හා මව් සභාව (යෙරුසලම) අතර සම්බන්ධතාවය දිගටම පැවතුණි. ශුභාරංචිය තව දුරටත් පතළ කිරීම උදෙසා නව සභාව හා ඒ ප්‍රදේශයේ වූ සෙසු සභාවන් අතර ද සම්බන්ධතාවයක් ඇති කරනු ලැබීය.

## 10. චක්‍රය නැවත නැවත සිදුවිය : 1 තෙසලෝනික 1:8

තෙසලෝනිකයේ සභාව තුළ මෙන්, නව සභාවන් තුළින් ශුභාරංචිය නොලැබූ පුද්ගලයන් වෙත "දේව වචනය ප්‍රකාශ කරනු ලැබූ" අතර තවත් සභාවන් පිහිටු වීමට ධර්ම ප්‍රචාරණ චක්‍රය නැවත නැවත සිදු විය.

# සේවයේ දී ප්‍රමුඛතාවය දිය යුතු දේවල්

ධර්ම ප්‍රචාරණය සඳහා සහ සභාවන් පිහිටු වීම සඳහා පාවුල්ට ලෝකය පුරා විහිදුණු නිශ්චිත උපක්‍රමයක් විය. ආසියාව, ගලාතිය, මකිදෝනිය, අකායි, හා ස්පාඤ්ඤය උදෙසා ඔහුගේ සැළකිල්ල බයිබලය තුළ වාර්තා වන අතර ඒවා ඒ කාලයේදී සම්පූර්ණ පළාත් විය. පාවුල් සභාවන් පිහිටවූ පහත ස්ථාන අධ්‍යයනය කරන්න :

- පිලිප්පිය : (ක්‍රියා 16) මෙය මකිදෝනියේ ප්‍රධාන නගරය විය.

- තෙසලෝනිකය : (ක්‍රියා 17:1-10) මෙය විශාල, බලපෑමක් කළ හැකි අන්දමේ වාණිජ නගරයක් විය.

- කොරින්තිය : (ක්‍රියා 18:1-11) ග්‍රීසියේ වාණිජ අගනුවර

- එපීසිය : (ක්‍රියා 19:1-10) රෝමයේ සිට පෙරදිග දක්වා රෝම අධිරාජ්‍යයේ ප්‍රධාන ගමන් මාර්ගය වැටී තිබුණු ස්ථානය. එපීසිය උපක්‍රමික වරායක් හා වෙළඳ මධ්‍යස්ථානයක් විය.

මෙම උදාහරණ වල සේවයේදී මූලිකත්වය දිය යුතු කරුණු හතක් එළිදරව් කරයි :

## නගර :

පාවුල් සභාවන් පිහිටවූ නගර රෝම පරිපාලනයේ, ග්‍රීක ශිෂ්ඨාචාරයේ, යුදෙව් බලපෑමේ හෝ වාණිජමය වැදගත්කමක් සහිත මධ්‍යස්ථානයක් විය. ජනාකීර්ණ නගරයක දී තමාට මිනිසුන් විශාල පිරිසක් වෙත ළඟා විය හැකි බව පාවුල් දැන සිටියේය. වෙනස්වීමක් සාමාන්‍යයෙන් නගරයෙන් පටන් ගෙන ඉන් අනතුරුව ගම්බද ප්‍රදේශ වෙත පැතිර යන බව ද ඔහු තේරුම් ගත්තේය. මෙම වෙළඳ හා සංචාරක මධ්‍යස්ථාන වල ව්‍යාපාර කටයුතු උදෙසා හා විනෝදය උදෙසා වෙනත් රටවලින් පැමිණෙන පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් වූහ. නගර පිහිටා තිබුණේ මිනිසුන් ස්වභාවයෙන්ම ගැවසෙන ගමනාගමන මාර්ග අසලය. මෙම පිටස්තරයන්ට ශුභාරංචිය දේශනා කළ විට ඔවුන් නැවත නිවසට යන විට එය තමන් සමඟ ගෙන ගියෝය.

මෙලෙස පිහිටුවන ලද මිෂනාරී පදනම මත සිට පාවුල් ඈතට ගමන් කළේය. පාවුල් යෙරුසලමෙන් පිටත්ව ගිය පසු ඔහු සුළු ආසියාව, දෙසට තම අවධානය යොමු කළ අතර, පළමුව තාර්සස් හා අන්තියෝකියේද (ක්‍රියා 11:25-30; 13:1-3), ඉන් අනතුරුව එපීසය තම මධ්‍යස්ථානය ලෙස තබා ගනිමින් බටහිර සුළු ආසියාවේ ද (ක්‍රියා 19:1-20; 16:8) සේවය කළේය. ඉන්පසු පාවුල් බටහිරට ගමන් කරමින් රෝමය කේන්ද්‍රස්ථානය කර ගනිමින් ස්පාඤ්ඤය දුරස්තම ස්ථානය ලෙස ගමන් කළේය (ක්‍රියා 19:21; 23:11; 28:14-31; රෝම 1:9-15; 15:24,28)

## පිළිගන්නා ස්ථාන :

මතෙව් 10 දී, සමාරිතයන් හා අන්‍යජාතීන් වෙත නොගොස් ඉශ්‍රායෙලය වෙත යන ලෙස යේසුස්වහන්සේ තම ගෝලයන්ට පැවසූ සේක. එම අවස්ථාව ඉශ්‍රායෙලය වෙත නියමිත කාලය විය. අනෙක් කාණ්ඩයන් පසුව පිළිගනු ඇත. යුදෙව් වන් අතර පවා ගෝලයෝ සේවය කළ යුතු වූයේ පිළිගන්නා අයටය. යහපත් ප්‍රතිචාරයක් දැක් වූ අය ළඟ නැවති සේවය කිරීමත් නොපිළිගන්නා අය මුණගැසුණු විට නොනවත්වා ඉදිරියට යාමත් ඔවුන් විසින් කළ යුතු විය. බොහෝ ලෙස පිළිගන්නා අය සිටින ප්‍රදේශ වෙත ඔවුන් අවධානය යොමු කළ යුතු විය.

පාවුල් ද මෙම උපක්‍රමය අනුගමනය කළේය. යුදෙව්වන් ශුභාරංචිය ප්‍රතික්ෂේප කළ විට පාවුල් අන්‍යජාතීන් වෙතට හැරුණෝය (ක්‍රියා 13:42-51). ඇතැන්ස් නගරය සූදානම් නොවූ විට පාවුල් කොරින්තියට ගියේය. කොරින්තියේදී, පාවුල් යුදෙව්වන් වෙතින් අන්‍ය ජාතීන් වෙත හැරුණේය. පිළිගත් ග්‍රීකයන් ප්‍රීති වූ අතර බොහෝ අය අදහා ගනිමින් බව්තීස්ම වූවෝය (ක්‍රියා 18:5-11). කොරින්තියේ නැවතී සිට බියකින් තොරව ක්‍රිස්තුස්වහන්සේ ගැන ප්‍රකාශ කිරීම පිළිබඳ දර්ශනයකින් දෙවියන්වහන්සේ පාවුල්ගේ ක්‍රියාවන් අනුමත කළ සේක (ක්‍රියා 18:5-11). සිනගෝගයේ රැස් වූ අය ඔහුව ප්‍රතික්ෂේප කළවිට, පිළිගැනීමට සූදානම් අය සමඟ පාවුල් රැස්වීම් ආරම්භ කළහ. පීඩා කිරීම ඔහුව පිටතට අදින විට, ඔහු වෙනත් නගරයකට ගියේය.

## තමාගේම මිනිසුන් :

තමාගේම මිනිසුන් වෙතට ශුභාරංචිය ගෙන යාම කෙරෙහි පාවුල් අවධානය යොමු කළේය

> **සහෝදරයෙනි, ඔවුන් උදෙසා මාගේ සිතේ ආශාවත් දෙවියන්වහන්සේට කරන කන්නලව්වත් නම් ඔවුන් ගැළවෙන පිණිසය. (රෝම 10:1)**

## ශුභාරංචිය ළඟා නොවූ මිනිසුන් :

ක්‍රිස්තුස්වහන්සේ ගැන ප්‍රකාශ කරනු නොලැබ තිබූ ප්‍රදේශ වලට පාවුල් ප්‍රමුඛස්ථානය දුන්නේය.

> **එසේය, වෙන කෙනෙකුගේ අත්තිවාරම පිට ගොඩ නොනගන පිණිස ක්‍රිස්තුස්වහන්සේගේ නාමය සඳහන්කරනු ලැබූ තැන්වල නොව: උන්වහන්සේ ගැන ආරංචි නොලැබූ අය දකින්නෝය, උන්වහන්සේ ගැන නෑසූ අය තේරුම්ගන්නෝයයි ලියා තිබෙන ලෙස, ශුභාරංචිය දේශනා කරන්ට අභිප්‍රායකෙළෙමි. (රෝම 15:20-21)**

ශුභාරංචිය පිළිබඳව සාක්ෂිදැරීමක් නොමැති ප්‍රදේශ වලට සැම විටම ප්‍රමුඛතාවය දිය යුතුය. ලූක් 15:3-7 හි සඳහන් බැටළුවාගේ උපමාව කියවන්න. ප්‍රමුඛතාව දුන්නේ නැති වූ බැටළුවාට මිස, රැළේ සිටියවුන්ට නොවේ (රෝම 10:13-14 ද බලන්න).

## පුද්ගල කණ්ඩායම් :

නගරයක් හෝ ප්‍රදේශයක් තුළදී පාවුල් විවිධාකාර පුද්ගල කණ්ඩායමක් සමඟ ක්‍රියා කළේය. උදාහරණයක් ලෙස, අන්තියෝකියේදී ඔහු යුදෙව්වන්ට මෙන්ම ග්‍රීකයන්ට ද සේවය කළේය (ක්‍රියා 13:42). ඔබ හය වන පරිච්ඡේදයේ දී ඉගෙන ගත් ආකාරයට පුද්ගල කණ්ඩායමක් යනු, ගෝත්‍රයක්, කුළයක් හෝ සමාන සංස්කෘතියක්, භාෂාවක් හා ජනවර්ග පසුබිමක් ඇති පුද්ගල කණ්ඩායමකි. නගරයක් හෝ ප්‍රදේශයක් ඒ අයුරින් වූ කණ්ඩායමක් ලෙස හඳුනාගෙන ඒ අනුව සභාවන් පිහිටුවීම වැදගත් වේ.

උදාහරණයක් ලෙස, ඇමරිකා එක්සත් ජනපදයේ එක් නගරයක් තුළ, ස්පාඤ්ඤ භාෂාව කතා කරන, ඉංග්‍රීසි භාෂාව කතා කරන සහ මැන්ඩරින් නම් චීන භාෂාව කතා කරන පුද්ගලයන් විශාල සංඛ්‍යාවක් වාසය කරයි. මෙම නගරය තුළ පිහිටුවන ලද සභාවක් වර්ධනය කිරීමට මෙම විශේෂිත පුද්ගල කණ්ඩායම් ඉලක්ක කළ යුතුය. මෙම නගරය තුළ ටැගලොග් භාෂාව කතා කරන පුද්ගලයන් නොමැති බැවින් එවැනි අය උදෙසා වූ සභාවක් පිහිටුවීම ප්‍රයෝජනයක් රහිත වේ. සභාවක් පිහිටුවීමේදී පොදුවේ නගරය පිළිබඳව පමණක් නොව, නිශ්චිත ප්‍රදේශයක ජීවත් වන පුද්ගල කණ්ඩායමක් පිළිබඳව අවධානය යොමු කළ යුතු වූයේ මේ හේතුවෙනි.

නිශ්චිත පුද්ගල කණ්ඩායමක් අතර සභාවක් පිහිටුවීමෙන් ශුභාරංචිය ඉක්මනින් ව්‍යාප්ත වේ. පුද්ගල කණ්ඩායමේ සාමාජිකයන් එකම භාෂාව කතා කරන අතර සමාන සිරිත් විරිත් තිබේ. ශුභාරංචියේ ව්‍යාප්තියට බාධා කරන භාෂාමය හෝ සංස්කෘතිමය බාධාවන් නොමැත. මේ හේතුවෙන් ශුභාරංචිය වේගයෙන් ව්‍යාප්ත විය හැකිය.

සේවය කිරීමට ප්‍රථම ප්‍රදේශය විශ්ලේෂණය කිරීමට උදව් වීම සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය මඟින් *"පරිසරය විශ්ලේෂණය "* නමින් පාඨමාලාවක් ඉදිරිපත් කර තිබේ. සභා පිහිටුවීමේ දී උපකාරී වන පිණිස මෙම පාඨමාලාවක් හදාරන ලෙස අපි ඔබට යෝජනා කරන්නෙමු. පහත කරුණු වලදී පාඨමාලාව ඔබට උපකාරී වනු ඇත :

1. ළඟා විය යුතු පුද්ගලයන් හඳුනා ගැනීම. නගරය හෝ ප්‍රදේශය කුමන ආකාරයේ වෙනස් පුද්ගල කණ්ඩායම් වලින් සමන්විත වේද? ඔබ ළඟා වීමට සැළසුම් කරන්නේ කවුරුන්ටද? ඔවුන්ගේ ආගමික, සංස්කෘතික, ජනවාර්ගික හා භාෂාමය පසුබිම කුමක්ද?

2. ඔවුන්ගේ ආත්මික අවශ්‍යතා හඳුනා ගැනීම. උදාහරණයක් ලෙස, නගරයක ස්පාඤ්ඤ භාෂාව කතා කරන පුද්ගලයන් අතර සභාවක් අවශ්‍යද? ඇතැම් විට ඔවුන්ගේ අවශ්‍යතාවයන් ඉටු වී තිබිය හැකි නමුත් එම නගරයේම ප්‍රංශ භාෂාව කතා කරන පුද්ගලයන් ආත්මිකව නොසළකා හැර තිබීමට හැකිය.

3. ශුභාරංචිය පිළිගැනීමට ඇති සූදානම තීරණය කිරීම.

4. මෙම පුද්ගලයන් වෙත ළඟා වීමට ඔබ පාවිච්චි කරන ක්‍රම තීරණය කිරීම. ඔවුන්ට හොඳින්ම ළඟා විය හැක්කේ කෙසේද? ඔවුන් වෙත යා යුත්තේ කවුරුන්ද?

## සමූහයකට ශුභාරංචිය ප්‍රකාශ කිරීම :

පාවුල් ශුභාරංචිය ප්‍රකාශ කළේ සමූහයන්ට වේ. විශාල සමූහයන් ඇමතීමට ඔහු අවස්ථාව ලබා ගත්තේය.

> **තවද ඉකෝනියේදී ඔව්හු එක්ව යුදෙව්වරුන්ගේ සිනගෝගයට ඇතුල්වී, යුදෙව්වරුන්ගෙන්ද ග්‍රීක්වරුන්ගෙන්ද මහත් සමූහයක් අදහාගන්නා පරිද්දෙන් කථාකළෝය. (ක්‍රියා 14:1)**

## තනි පුද්ගලයන් ගෝලත්වයට ගෙන ඒම :

පාවුල් සමූහයන්ට දේශනා කළ නමුත්, අන් අයට ඉගැන්විය හැකි ප්‍රධාන පුද්ගලයන් කිහිපදෙනෙකු වෙනුවෙන් තම ජිවිතය ආයෝජනය කිරීමේ වැදගත්කම ද ඔහු තේරුම් ගත්තේය. තීතස් මෙන්ම තිමෝතිද මෙම පුද්ගලයන්ගෙන් කෙනෙකු වූ අතර වරක් ගෝලයෙකු ලෙස පුහුණු වීම ප්‍රතික්ෂේප කළ යොහන් මාර්ක් ද ඔවුන්ගෙන් කෙනෙකු විය (ක්‍රියා 15:36-40). සෑම ඇදහිලිවන්තයෙකුටම ගුණනය වීම උදෙසා දෙවියන්වහන්සේගේ සැළැස්ම එළිදරව් කරනු ලැබුවේ පාවුල් තුළින් විය (2 තිමෝති 2:2).

බාර්ණබස් හා සීලස් වැනි ඇදහිලිවන්තයන් සමඟ මෙන්ම, තම ගෝලයන් සමඟ ද කටයුතු කිරීම, අපෝස්තුළුවර පාවුල්ගේ සේවය මහත් ලෙස ගුණනය කළේය. තම දෙවන හා තෙවන ධර්ම දූත ගමන් වලදී, තමන් සේවය කිරීමට සැළසුම් කළ නගර වල සිටි තමා සමඟ කටයුතු කරන අයගේ ලැයිස්තුවක් පාවුල් සකස් කළේය. මෙය වැදගත් ප්‍රතිපත්තියකි. අප්‍රිකානුවන් වෙත හොඳින්ම ළඟා විය හැක්කේ අප්‍රිකානුවන්ටය. ඉන්දියානුවන් වෙත හොඳින්ම ළඟා විය හැක්කේ ඉන්දියානුවන්ටය. ආසියාව හරහා ශුභාරංචිය පැතිරවීම හොඳින්ම කළ හැක්කේ ආසියානුවන්ටය. ඔවුන් භාෂාව කතාකරයි., සිරිත් විරිත් තේරුම් ගෙන තිබෙන අතර දැනටමත් ජිවන රටාවට හැඩගැසී තිබේ.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සභාවන් පිහිටුවීමේ චක්‍රයේ පියවර දහය මොනවාද?

3. අපෝස්තුළුවර පාවුල් සේවයේදී ප්‍රමුඛතාවය දුන් කරුණු හත මොනවාද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ජේදයට පසුව සපයා ඇත.)

## තවදුරටත් අධ්‍යයනය සඳහා

1. අපෝස්තුළුවර පාවුල්ගේ ධර්ම ප්‍රචාරණ කාර්යයන් හා සභා පිහිටුවීම් සාමාන්‍යයෙන් ධර්ම දූත ගමන් තුන යටතේ සාරාංශ කර දක්වයි.

   පළමු ගමන : ක්‍රියා 13:1-14: 28

   දෙවන ගමන : ක්‍රියා 15:36-18: 22

   තෙවන ගමන : ක්‍රියා 18:23-21:14

2. එපීසයේ සිදු වූ සිදුවීම් නැවත මතක් කර ගැනීම තුළින් සෑම නගරයක් තුළම පාවුල් පාවිච්චි කළ සභා පිහිටුවීමේ චක්‍රය පිළිබඳව තවත් දේ අධ්‍යයනය කරන්න :

| | |
|---|---|
| මිනිසුන් සමඟ සම්බන්ධතා ඇති කරගනු ලැබීම : | ක්‍රියා 18:19: 19:1,8,9 |
| ශුභාරංචිය සන්නිවේදනය කරනු ලැබීය : | ක්‍රියා 19:4,9,10 |
| ශුභාරංචිය ඇසූ අය හැරුණි : | ක්‍රියා 19:5,18 |
| ඇදහිලිවන්තයන් රැස් වූහ : | ක්‍රියා 19:9-10 |
| ඇදහිල්ල ස්ථිර කරනු ලැබීය : | ක්‍රියා 20:20,27 |
| නායකයන් කැපවිය : | ක්‍රියා 20:17,28 : 1 තිමෝති 1:3,4 |
| සභාවට භාර දෙන ලදි : | ක්‍රියා 20:17: එපීස 1:1-3,15,16 |

3. සභා පිහිටුවීමේදී අධ්‍යයනය කිරීමට ප්‍රායෝගික පරීක්ෂා කිරීමේ ලේඛනයක් පහත දැක්වේ :

**ආත්මික සූදානම :**

______ මෙම සභාව පිහිටුවීමේදී මම සිතුවිල්ලෙන් හා යාච්ඤාවෙන් බොහෝ කාලයක් ගතකර ඇත්තෙමි.

______ මෙම සභාව පිහිටුවීමට දෙවියන්වහන්සේ මට මඟපෙන්වන බවට ස්ථිරත්වයක් මට ඇත්තේය.

______ මා මෙය කරනුයේ මිනිසුන් සතුටු කිරීමට නොවේ.

______ මෙම සභාව අවශ්‍ය වන්නේ ඇයිද යන්න හා එය විශේෂිත වන්නේ කෙසේද යන්න පිළිබඳ දර්ශනයක් මට තිබේ.

("අරමුණ පිළිබඳව ප්‍රකාශනය" ලෙස මෙය ලියා තබන්න. මුළු ලෝකයටම ශුභාරංචිය ගෙන යාමේ දෙවියන්වහන්සේගේ සියල්ලට ඉහළින් ඇති පොදු ඉලක්කය තුළම සෑම සභාවකටම නිශ්චිත හා විශේෂිත ඉලක්කයක් තිබේ. *"අරමුණු තුළින් කළමණාකරණය"* නමැති හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලා, ඔබේ අරමුණ හඳුනාගෙන එය පැහැදිලිව ඉදිරිපත් කිරීමට ඔබට උපකාරී වනු ඇත.)

_____ මට සභා පිහිටුවන්නෙකුගේ නිසි ආත්මික ගුණාංග ඇති බව මම විශ්වාස කරමි.

සභා පිහිටුවන්නෙකුට වැදගත් ගුණාංග කිහිපයක් පහත දැක්වේ, ඔහු :

- මෙම විශේෂිත සේවය සඳහා දෙවියන්වහන්සේ විසින් කැඳවනු ලැබූවකු විය යුතුය.

- නායකයෙකු ලෙස අන් අය සේවයෙහි යෙදවීමට දෙවියන්වහන්සේගෙන් දීමනාවක් ලත් අයකු විය යුතුය.

- 1 තිමෝති 3:17 හි සඳහන් නායකත්වය පිළිබඳ බයිබලීය සුදුසුකම් සපුරා තිබිය යුතුය.

- ස්වයං - පාලනය ඇත්තෙකි.

- පහසුවෙන් අධෛර්යයට පත්නොවී තනිකම හා එපා වීම් දරාගත හැකිවිය යුතුය.

- වෙනස් අවස්ථාවන්ට හා සංස්කෘතීන්ට අනුව හැඩ ගැසීමට හැකි විය යුතුය.

- අන් අයට නායකත්වය දීමට කැමැත්තක් හා හැකියාව තිබිය යුතුය.

- ඇදහිල්ලේ මිනිසෙකු වන අතර දෙවියන්වහන්සේට මහත් දේ කළ හැකි බව විශ්වාස කරනු ඇත.

- සභා පිහිටුවීමේ කාර්යයට කැප විය යුතුය.

**(විවාහක නම්) :**

________ මගේ පවුල මෙම දර්ශනය සමඟ එකඟ වෙයි.

## ඉලක්කගත ප්‍රදේශයක තෝරා ගැනීම :

______ මෙම සභාව පිහිටවිය යුතු ප්‍රදේශය ගැන මම යාච්ඤා කර තිබේ.

______ මම පරිසරය විශ්ලේෂණයක් කර තිබේ.

(මෙම අරමුණ ඉටුකර ගැනීම සඳහා හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"පරිසරය විශ්ලේෂණය "* නැමති පාඨමාලාව පාවිච්චි කරන්න. එවැනි අධ්‍යයනයක් කිරීමට විවිධ මූලාශ්‍ර යොදා ගන්නා ආකාරය එමඟින් පැහැදිලි කරන අතර ධර්ම ප්‍රචාරණයට හා සභා පිහිටුවීමට සුදානම් ප්‍රදේශ හඳුනා ගැනීමට එය ඔබට උපකාරී වනු ඇත. පුද්ගලයන් කණ්ඩායමක්, භූගෝලීය ප්‍රදේශයක්, රටක් හෝ ලෝකයේ රටවල් කිහිපයක් වෙත ශුභාරංචිය ගෙන යාම සඳහා ඒවා විශ්ලේෂණය කළ යුතු ආකාරය එමඟින් පැහැදිලි කරයි)

----- මෙම සභාවට අයත් භූගෝලීය ප්‍රදේශය පැහැදිලිව තීරණය කර තිබේ.

(පරිසරය විශ්ලේෂණය කිරීමේ දී රැස්කරගත් තොරතුරු සමඟ මෙහිදී ඔබට උපකාරී වීමට සිතියමක් පාවිච්චි කරන්න)

---- මෙම ප්‍රදේශයේ ශුභාරංචිය නොදත් මිනිසුන් 100 කට මා විසින් සමාජයේ අවශ්‍යතා හඳුනා ගැනීමේ සමීක්ෂණයක් කර ඇත්තෙමි.

(පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සහ අදාළ ප්‍රදේශයේ ආත්මික අවශ්‍යතා සහ පිළිගැනීමට ඇති සූදානම තීරණය කිරීමට මෙම සමීක්ෂණය ඔබට උපකාරී වනු ඇත).

ඔබගේ සමීක්ෂණයේදී ඔබට යොදාගත හැකි පෝරමයක් ඊළඟ පිටුවේ දැක්වේ :

# සමාජ සමීක්ෂණය

හමු වූ දිනය : ____________________

නම : ___________________________ ලිපිනය :___________________________

නිවසේ සාමාජිකයන් ගණන :ස්වාමි පුරුෂයා________ බිරිඳ ________දරුවන් ගණන________

(1) ඔබ ප්‍රාදේශිය සභාවක ක්‍රියාකාරී සාමාජිකයෙක්ද? (ධර්ම ප්‍රචාරණයට මුල පිරිමට මෙම ප්‍රශ්නයට හැකිය. ඔබ ධර්ම ප්‍රචාරණයට නව ප්‍රදේශයකට ඇතුළු වනවා මිස, පවතින සභාවන්ගෙන් සෙනඟ ඇද ගැනීමට ක්‍රියා නොකරන බව මතක තබා ගන්න)

(2) මෙම ප්‍රදේශයේ ජනතාවගේ විශාලතම අවශ්‍යතාවය ලෙස ඔබ දකින්නේ කුමක්ද? (මෙම ප්‍රශ්නයට ඔබට ලැබෙන පිළිතුරු මෙම නිශ්චිත භූගෝලිය ප්‍රදේශයට අවශ්‍ය සේවයන් හඳුනා ගැනීමට ඔබට උපකාරී වනු ඇත. එසේම පුද්ගලයන්ගේ අවශ්‍යතාවයන් වෙත ධර්ම ප්‍රචාරණ උත්සහයන් ගලපා ගැනීමට ද එය ඔබට උපකාරී වනු ඇත).

________ ක්‍රියාකාරී සාමාජිකයෙකි ________ ක්‍රියාකාරී සාමාජිකයෙක් නොවේ.

(3) මෙහි සිටින බොහෝ පුද්ගලයන් සභාවකට සහභාගී නොවන්නේ යයි ඔබ සිතන්නේ ඇයි? (මිනිසුන්ගේ අරමුණු සමඟ ගනුදෙනු කිරීමට මෙම ප්‍රශ්නය මඟින් ඔබට අවස්ථාව ලබා දේ.)

______________________________________________________________________

(4) ඔබගේ ප්‍රදේශයේ නව සභාවක සභාපාලකවරයා ලෙස, ඔබට හා ඔබගේ පවුලට මට විශේෂයෙන් කළ හැක්කේ කුමක්ද? (ධර්ම ප්‍රචාරණයේ අවසාන අරමුණ ඇතිව මෙම පවුලට සේවය කිරීම ආරම්භ කිරීමට මෙම ප්‍රශ්නය ඔබට අවස්ථාව ලබා දෙයි.)

______________________________________________________________________

(5) අපගේ සභාව වැනි සභාවක් ගැන උනන්දුවක් දක්වන මිතුරන් හෝ ඥාතීන් ඔබට සිටීද? (ධර්ම ප්‍රචාරණය සඳහා තවත් සම්බන්ධතා මෙමඟින් ඇති කරයි)

______________________________________________________________________

අදාළ කරගත හැකි අංග පරීක්ෂා කර බලන්න : ----- හොඳ බලාපොරොත්තුවකි.

---- වෙනත් සභාවක ක්‍රියාකාරී සාමාජිකයෙකි. ---- තවත් බැහැදැකීමකට ආශාවේ.

---- බයිබලයක් අවශ්‍යය. --------- පිළිබඳ කිතුනු ලියවිලි අවශ්‍යය.

**සභාවේ මූලික කණ්ඩායම සංවිධානය කිරීම :**

නව සභාව උදෙසා යාච්ඤා කණ්ඩායමකට එකතු විය හැකි අයගේ ලැයිස්තුවක් පිළියෙල කරන්න.

______________________________ ______________________________

______________________________ ______________________________

______________________________ ______________________________

නව සභාව නිර්මාණය කළ හැකි මූලික කණ්ඩායම හඳුනාගන්න. ඔවුන් එම ප්‍රදේශය තුළම ගැළවීම ලැබූ නව ඇදහිලිවන්තයන් මෙන්ම නිශ්චිත ප්‍රදේශයක සභාවක් පිහිටුවීම සඳහා උපකාර කිරීමට මව් සභාවක් මඟින් එවනු ලැබූ පරිණත ඇදහිලිවන්තයන් විය හැකිය :

- අප සභාවට නමක් තෝරාගෙන තිබේ.

- අපට අරමුණ පිළිබඳ ප්‍රකාශයක් තිබේ.

- සභාව විශ්වාස කරන දේවල් සඳහන් කරන දේවධර්මානුකූල ප්‍රකාශයක් අපට තිබේ.

- නව සභාවක් ඇති කිරීමේ දී ආණ්ඩුව මඟින් අපේක්ෂා කරන නීත්‍යානුකූල ලියකියවිලි සතුවේ.

- නිකාය සම්බන්ධ අවශ්‍යතා අප සම්පූර්ණ කර තිබේ.

- සාමාජිකත්වය සඳහා අවශ්‍යතා අප විසින් නියම කර තිබේ.

- මූල්‍ය අයවැයක් අප විසින් පිහිටුවා තිබේ.

(හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"අරමුණ තුළින් කළමණාකරණය"* නැමති පාඨමාලාව මෙය කළ යුතු ආකාරය පිළිබඳ විස්තරාත්මකව උපදෙස් ලබාදේ.)

## සභා නායකත්වය ඇති කිරීම :

- සභාව ආරම්භ කිරීමට මුලින්ම අවශ්‍ය නායකයන් අප විසින් තීරණය කර තිබේ.

- සභාවට අවශ්‍ය අනාගත නායකත්වය අප විසින් හඳුනාගෙන තිබේ.

- මූලික කණ්ඩායමේ ආත්මික දීමනා මත ඔවුන්ව සේවයේ කාර්යයන් උදෙසා ක්‍රියාවේ යොදවන්නෙමු.

(*"ක්‍රියාවේ යෙදවීමේ ක්‍රමවේද"* නම් හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ පාඨමාලාව මේ සඳහා ඔබට උපකාර කරනු ඇත.)

හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"අරමුණු තුළින් කළමනාකරණය"* නැමති පාඨමාලාව සභාවේ පහත සඳහන් නායකත්වයන් පිළිබඳ විස්තරයක් සපයයි.

- සභාපාලකවරයා
- සහකාර සභාපාලකවරයා
- ප්‍රේරිතයන්
- ප්‍රොපේතවරු
- ගුරුවරු
- ශුභාරංචිය ප්‍රකාශ කරන්නන්
- වැඩිමහල්ලන්
- උපස්ථායකයන්
- යාච්ඤා සභාපති
- කිතුනු අධ්‍යාපන අධ්‍යක්ෂ
- ධර්ම ප්‍රචාරණය හා සේවා පිළිබඳ අධ්‍යක්ෂ
- මහත්වරුන්ගේ සේවයන් සම්බන්ධ අධ්‍යක්ෂ

- කාන්තාවන්ගේ සේවයන් සම්බන්ධ අධ්‍යක්ෂ
- සංගීත අධ්‍යක්ෂ
- සභාවේ ලේකම්
- මූල්‍ය අධ්‍යක්ෂ
- දේපළ පවත්වාගෙන යාම පිළිබඳ අධ්‍යක්ෂ
- ශ්‍රව්‍ය - දෘෂ්‍ය අධ්‍යක්ෂ
- සහාය කරුවන්
- ප්‍රචාරණ සභාපති
- විශේෂ කමිටු

සභාව උදෙසා නායකයන් තෝරා ගැනීමේදී හා වර්ධනය කිරීමේදී හාවස්ට්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "*බයිබලීය කළමණාකරණ ප්‍රතිපත්ති*" නමැති පාඨමාලාව ඔබට උපකාරී වනු ඇත. යහපත් නායකයකු හා යහපත් අනුගාමිකයෙකු වීමේ බයිබලීය ප්‍රතිපත්ති ද එමඟින් දක්වයි.

## රැස්වීම සඳහා ස්ථානය තෝරා ගැනීම :

- රැස්වීම සඳහා අප තෝරා ගෙන ඇති ස්ථානය හොඳින් පෙනෙන තැනකි (මිනිසුන්ට එය දැකගත හැකි අතර පහසුවෙන් හඳුනාගත හැකිය)

- ඊට ළඟාවිය හැකිය. (පොදු ප්‍රවාහන සේවයකින් සහ/හෝ පයින් එයට ළඟා විය හැකිය)

- එහි වාහන නැවැත්වීමේ පහසුකම් ඇත. (සාමාජිකයන් වාහන මඟින් සභාවට එන්නේ නම්)

- අදාළ දේපළ සභාවේ ප්‍රයෝජනයට ප්‍රාදේශීය ආණ්ඩුව මඟින් වෙන්කර තිබේ.

- ප්‍රමාණවත් කානු පද්ධතියක් තිබේ. (වතුර ගැලීම වැළැක්වීමට)

- අප වගකිව යුතු වන බදු, කල් බදු, නොගෙවූ තක්සේරු වටිනාකම්, හෝ පවතින සහන ආදී කිසිවක් නැත

- පහසුකම් යහපත් තත්වයෙන් පවතී.

(ගොඩනැගිල්ල පාවිච්චියට ගැනීම සඳහා පොළොවට, වහලට, බිත්ති වලට, ජනේල වලට, දොරවල් වලට, කාර්මික අංශයෙන් කළ යුත්තේ මොනවාදැයි සළකා බලන්න. ඔබ ගොඩනැඟිල්ලක් මිළට ගැනීමට අපේක්ෂා කරන්නේ නම්, එය පරීක්ෂා කිරීමට ගොඩනැඟිලි පිළිබඳ විශේෂඥයින්ගේ සහය ලබා ගන්න.)

- අනාගතයේදී වැඩි වන අවශ්‍යතාවයන්ට පහසුකම් ප්‍රමාණවත් ද? පැවතිය යුතු මූලික පහසුකම් සමහරක් පහත දැක්වේ :

- නමස්කාරය, යාච්ඤාව හා සහභාගීත්වය උදෙසා යොදාගත හැකි බහු කාර්ය කාමරයක්
- බව්තීස්ම ටැංකියක්
- දේවගැතිවරයාගේ අධ්‍යයන කාමරය
- ලේකම්වරයාගේ කාර්යාලය
- කුඩා ළමුන් සඳහා කාමරය
- ඉරුදින හෝ බයිබල් පාසල සඳහා පංති කාමර
- මුළුතැන්ගෙය
- වැසිකිලි

- නැවත සකස් කිරීමේ හැකියාව තිබේ ද? "ප්‍රදේශීය ගොඩනැගිලි නියමයන්"පරීක්ෂා කර බලන්න.

සභාවන් විසින් බහුලව පාවිච්චි කරන විවිධ ස්ථාන වල ඇති විය හැකි වාසි සහ අවාසි කිහිපයක් පහත දැක්වේ :

## නිවාස වල පවත්වන සභාවන් :

වාසි :

- සමීප සහභාගිත්වයකට අවස්ථාව සළසයි.
- පහසුකම් පාවිච්චි කිරීම වෙනුවෙන් ගෙවීමක් කළ යුතු නොවේ.
- එය නව ගිවිසුමේ ක්‍රමවේදයකි.
- එය වඩා ජනාකීර්ණ වන විට, වර්ධනයට පහසු වන පරිදි වඩා ඉඩ ඇති ස්ථානයක් සෙවීමට මුල් කණ්ඩායම උනන්දු කරවනු ඇත.

ඇති විය හැකි අවාසි :

- ඇතැම් පුද්ගලයන් හිමි කරුවා හඳුනා ගන්නා තුරු පෞද්ගලික නිවසකට පැමිණීම ප්‍රතික්ෂේප කරයි.
- වාහන නැවැත්වීමේ හා හිඳගැනීමේ පහසුකම් සීමිත වේ.
- ඇතැම් අවස්ථා වලදී තම නිවස අසල සභාවක් පවත්වාගෙන යාම අසල්වැසියන්ට ප්‍රිය දෙයක් නොවනු ඇත.
- තම නිවස සතියකට කිහිපවරක් විවෘත කර තැබීම නිවස ලබා දෙන පවුලට අසීරු දෙයක් වනු ඇත.
- නිවස පිහිටා ඇති ස්ථානය පහසු ස්ථානයක් නොවිය හැකිය. එය සොයා ගැනීම අපහසු විය හැකිය.

## රැස්වීම් ශාලාවක් :

නගරයේ රැස්වීම් ශාලාවක්, පෞද්ගලික හිමිකරුවෙකුගේ සම්මන්ත්‍රණ මධ්‍යස්ථානයක්, සමිති, රැස්වීම් පවත්වන ස්ථානයක්, පාසලක්, අවන් හලක්, හෝ හෝටලයක් සම්මන්ත්‍රණ ශාලාවක් විශ්‍රම හෝ විනෝද මධ්‍යස්ථානයක් මේ ආකාරයේ ස්ථානයක් ලෙස සැළකිය හැකිය. (සටහන: රැස්වීම් ශාලාවක් තෝරා ගැනීමේදී, අවමංගල්‍ය ශාලාවක් යොදා ගැනීම සාමාන්‍යයෙන් සුදුසු යැයි පිළිනොගැනේ. මිනිසුන් අවමංගල්‍ය දේවමෙහෙයන් සඳහා එම ස්ථානය යොදා ගනු ඇති අතර, එය හිතවතුන්ගේ මරණය නිසා දුක්විඳි අයට එම මතකයන් නැවත ගෙන දෙන්නක් වනු ඇත.)

වාසි :

- හිඳ ගැනීමට හා වාහන නැවැත්වීමට ප්‍රමාණවත් පහසුකම් තිබේ.
- සොයාගැනීමට ද සාමාන්‍යයෙන් පහසුය
- එවැනි ශාලාවක් පිහිටා ඇත්තේ කොහේ දැයි බොහෝ දෙනා දනිති.
- ස්ථිර ස්ථානයක් සොයා ගැනීමට පෙර වර්ධනය වීමට ඉඩකඩ තිබේ.

ඇතිවිය හැකි අවාසි :

- එය අන් අය විසින් ද පාවිච්චි කරන බැවින් පවිත්‍රව තබා ගැනීම අසීරුය.
- සැරසිලි හා තබා ඇති ලී බඩු ආදිය නමස්කාර මෙහෙයට සුදුසු ඒවා නොවිය හැකිය.
- අන් අයද පාවිච්චි කරන බැවින් කාල සටහනක් සකස් කිරීමේ දී අපහසුතා ඇති විය හැකිය.
- පහසුකම් ලබා ගැනීමේදී හා නැවත වසා දැමීමේදී ශාලාවේ අයිතිකරු හෝ එහි සේවකයෙකු අවශ්‍ය විය හැකිය.

### අන් අය සමඟ සභා ගොඩනැගිලි බෙදා ගැනීම

වාසි :

- අසුන් ගැනීමට හා වාහන නතර කිරීමට ප්‍රමාණවත් පහසුකම් තිබේ.
- සොයා ගැනීමට ද සාමාන්‍යයෙන් පහසුය.
- ඔබේම දේවස්ථානයක් මිළදී ගැනීමට මුදල් කැපකිරීමට පෙර වර්ධනය වීමට ඉඩකඩ තිබේ.

- දේවස්ථානයක් තුළ නමස්කාරය සඳහා හොඳ වාතාවරණයක් තිබේ.

ඇතිවිය හැකි අවාසි :

- වෙනත් අයද පාවිච්චි කරන බැවින් දේවස්ථානය පිරිසිදුව තබා ගැනීම අපහසු විය හැකිය.
- අන් අය ද දේවස්ථානය පාවිච්චි කරන බැවින් වේලාව පිළිබඳවද ගැටලු ඇතිවිය හැකිය.

## නිවසක් මිළදී ගෙන, එය දේවස්ථානයක් බවටත් පසුව දේවගැතිවරයාගේ නිවස බවටත් පරිවර්තනය කිරීම :

වාසි :

- බොහෝ අවස්ථාවකදී නිවසක් සඳහා ණයක් ගැනීම දේවස්ථානයක් සඳහා ණයක් ගැනීමට වඩා පහසුය. පසුව එය දේවගැතිවරයාට වාසය කිරීමට සකස් කර දිය හැකිය. ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය වන්නේ සීමිත මුදල් ප්‍රමාණයක් පමණී.
- සභාව එය භාවිතා කරන්නේ තාවකාලිකව ලෙස බව අසල් වැසියන් දන්නේ නම්, ඔවුන්ද බොහෝ විට ඒ සඳහා එකඟ වේ.
- නමස්කාරයට යෝග්‍ය වටපිටාවක් ගොඩනඟාගත හැකිය.

ඇතිවිය හැකි අවාසි :

- සැබෑ දේවස්ථානයක් පාවිච්චි කිරීමට සභාව තුළ කැමැත්තක් පැවතිය හැකිය.
- වර්ධනය වීමට ඇති හැකියාවන් සීමා සහිත වේ.
- අතිරේක පහසුකම් මදි වීම

## පළමු දේව මෙහෙය සැළසුම් කිරීම හා මෙහෙයවීම

- පළමු රැස්වීම සඳහා අප දිනය, වේලාව හා ස්ථානය නියම කර තිබේ.

- අප එය සමාජය තුළ ප්‍රසිද්ධ කර තිබේ.

(මෙලෙස ප්‍රසිද්ධ කිරීම කට වචනයෙන්, රූපවාහිනියෙන්, ගුවන් විදුලියෙන්, පත්‍රිකා, පෝස්ටර් මඟින්, පුවත්පත් මඟින්, දුරකථන නාමාවලි තුළින්, ලකුණු හා වෙනත් ක්‍රම මඟින් සිදු කළ හැකිය. එය ඔබගේ භූගෝලීය පිහිටීම හා මූල්‍ය පහසුකම් මත තීරණය වේ.)

- නොඇදහිලිවන්තයන් ඉලක්ක කර නමස්කාර කිරීමට, දේශනා කිරීමට, ප්‍රතිචාර දැක්වීමට ඉඩ සැළසෙන පරිදි අප පළමු රැස්වීම සැළසුම් කර තිබේ.

## සාමාන්‍ය දේව මෙහෙයන් පැවැත්වීම :

දේව මෙහෙය තුළ පහත දේවල් අන්තර්ගත විය හැකිය :

- නමස්කාරය : මෙය දෙවියන්වහන්සේ වෙත කේන්ද්‍රගතවූ, බයිබලය මත පදනම් වූ, ශුද්ධාත්මයාණන් විසින් මඟපෙන්වනු ලැබූ හා අවශ්‍යතාවයන්ට ගැළපෙන එකක් විය යුතුය. සංගීතය සඳහා සම්පූර්ණ සහභාගීත්වයම මෙන්ම තනි පුද්ගලයන්, ගීතිකා කණ්ඩායම් වැනි විශේෂ කණ්ඩායම් වලින්ද සමන්විත විය යුතුය.

- සම්මාදම්

- ශුද්ධ වූ සහභාගීකම

- දේව වචනය කියවීම, දේශනා කිරීම, හා ඉගැන්වීම. ඔබට නොකඩවා නව ඇදහිලිවන්තයන් ගොඩනඟමින් ඔවුන්ව සේවයේ කාර්යයන් සඳහා යෙදවීම සඳහා එය ධර්ම ප්‍රචාරණය සඳහා හා ගෝලත්වය සඳහා වූ සංවිධානාත්මක රටාවක් අනුගමනය කළ යුතුය.

- වතුර බව්තිස්මය

- ඇදහිලිවන්තයන්ට මෙන්ම නොඇදහිලිවන්තයන්ට ද කැපවීම හා භාර වීමට අවස්ථාව ලබා දිය යුතුය.

- ශුද්ධාත්මයන්ගේ දීමනා ක්‍රියාත්මක වීම.

- සාමාජිකයන් එකිනෙකාට සේවය කරන, ශරීරයේ සේවය.

- ශුභාරංචිය සන්නිවේදනය කිරීම සඳහා ශ්‍රව්‍ය හා දෘෂ්‍ය කැසට් පට, චිත්‍රපට, සංවිධානාත්මක විෂය මාලා, ප්‍රසංග ආදී විවිධ නූතන ක්‍රමවේද යොදාගැනීම.

## ගැළවීම නොලත් අය වෙත ළඟා වීම සඳහා දේව මෙහෙයක් සැළසුම් කිරීමට යෝජනා කිහිපයක් පහත දැක්වේ :

- ඔවුන්ගේ අවශ්‍යතා කෙරෙහි අවධානය යොමු කරන්න : “ආත්මයෙන් පිරුණු - රැස්වීම්” පිළිබඳ ප්‍රචාරයන් සැබවින්ම ඇතැම් පුද්ගලයන් ඇත් කරනු ලබන අතර ගැළවීම නොලත් අය ආකර්ෂණය නොකරනු ඇත. ඒ වෙනුවට, ඔවුන්ගේ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කරන්න. උදාහරණයක් ලෙස, “ඔබගේ ජීවිතයේ අසීරු තත්වයන් ජය ගන්නා ආකාරය” යනුවෙන් දේවමෙහෙය ප්‍රචාරය කරන්න.

- ඇතැම් අය දිනාගැනීමට සියලු දේවල් සියල්ලන් උදෙසා වන්න : 1 කොරින්ති 10:19-23 කියවන්න. ගැළවීම නොලත් අය වෙත ළඟා වීමට නියමිත ප්‍රවේශයක් නොමැත. “මම දේශනා කළ යුත්තේ කුමක්ද?” යනුවෙන් යාච්ඤා නොකර, “මා දේශනා කරනු ඇත්තේ කා හටද?” යනුවෙන් යාච්ඤා කරන්න. දෙවියන්වහන්සේ ඔබ වෙත ගෙන එන මිනිසුන් දෙස බලන්න.

- ඔබගේ පණිවුඩය ශුභාරංචියේ “යහපත් ආරංචිය” වෙත කේන්ද්‍රගත කරන්න : එය යහපත් ආරංචියක් නොවනතාක් දුරට එය ශුභාරංචිය නොවේය. පහත සඳහන් ප්‍රශ්න සළකා බලන්න.

- දේශනාවේ මාතෘකාව තුළින් මට බෙදා ගැනීමට සුබ ආරංචියක් ඇති බව ප්‍රකාශ වේද?

- දේශනාව තුළින් දේව වචනයේ ප්‍රායෝගිකව යොදාගැනීමක් ගැන සඳහන් වේද?

- මෙම පණිවුඩය ඉදිරිපත් කළ හැකි ඉතාම ධනාත්මක ආකාරය කුමක්ද?

- එය ඉදිරිපත් කළ හැකි ඉතාම සරල ආකාරය කුමක්ද? (සරල වීම යනු නොගැඹුරු වීම නොවේය. යේසුස්වහන්සේ ඉතාම සරල නමුත් ප්‍රබල දේශනා ඉදිරිපත් කළ සේක.)

- වඩාත්ම බලපෑමක් ඇතිවිය හැකි අයුරින් එය ඉදිරිපත් කළ හැක්කේ කෙසේද? (පරිසිවරු අන් අයගෙන් උපුටාගත් අතර එමඟින් වඩා බලපෑමක් ඇති කළේ නැත. ගෝලයන් අත්දැකීම් වලින් දේශනා කළ අතර එවිට ජීවිත වෙනස් විය. පෞද්ගලිකව, අවංකව, උත්සාහය හා තේරුම් කරදීමේ හැකියාව ඇතිව දේශනා කරන්න)

- එය පැවසිය හැකි වඩාත්ම සිත් ඇදගන්නා සුළු ආකාරය කුමක්ද? (යේසුස්වහන්සේ මනුෂ්‍යයා උනන්දුවක් දක්වන කතාන්දර හා පොදු ජනයාට තේරුම්ගත හැකි උපමා පාවිච්චි කළ සේක.)

සභාවේ දැන්වීම් හැකි තරම් අඩු කරන්න: මුද්‍රිත නිවේදන පත්‍රිකාවක් මඟින් හෝ වෙනත් ආකාරයකින් එය සිදු කළ හැකිය.

ගැළවීම නොලත් පුද්ගලයන් පැමිණෙනුයේ තම ජීවිත තුළ ඔවුන්ට අවශ්‍යතාවයන් ඇති බැවින් මිස සභාවේ සාමාජීය කටයුතු, වැඩසටහන් හා විශේෂ අවස්ථා ගැන දැන ගැනීමට නොවේය.

- බයිබල් කොටස් හා ගීතිකා ප්‍රවේසමෙන් තෝරා ගන්න : ඒවා ගැළවීම නොලත් අය ඉලක්ක කරගත් ඒවා සහ පහසුවෙන් තේරුම් ගතහැකි ඒවා බව හොඳින් දැන ගන්න. උදාහරණයක් ලෙස පැරණි ගිවිසුමේ අනාගත වාක්‍ය තුළ ඇතුළත් "ඔවුන්ගේ ළදරුවෝ බිමගසා මරනු ලබන්නෝය" වැනි බයිබල් කොටසක් ගැළවීම නොලත් අයෙකුට පහසුවෙන් තේරුම්ගත නොහැක. ගීතිකා තේරුම්ගත හැකි බව සහ ගැළවීම නොලත් අය ඉලක්ක කරගෙන ඇති බව හොඳින් දැන ගන්න.

- ප්‍රතිචාර දැක්වීමට අවස්ථාවක් ලබා දෙන්න : සෑම විටම යේසුස්වහන්සේ පිළිගැනීමට අවස්ථාවක් ලබා දී මිනිසුන් එසේ කරනු ඇතැයි බලාපොරොත්තු වන්න.

## සේවයේ කාර්යයන් දිගටම කරගෙන යාම සඳහා සැළසුම් ඇති කිරීම :

සභාවේ අනාගත වර්ධනය සඳහා ඔබ දිගින් දිගටම අරමුණු ඇති කිරීම, ඒවා ක්‍රියාවට නැංවීම සහ ඒවායේ සාර්ථකත්වය මැන බැලීම කළ යුතුය. මෙම සැළසුම් වල මූලික අරමුණු සැබවින්ම ධර්ම ප්‍රචාරණය, ගෝලත්වය හා සභා පිහිටුවීම විය යුතුය. මෙම පාඨමාලාවේ හතරවන පරිච්ඡේදය සහ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"අරමුණු මඟින් කළමණාකරණය"* නැමති පාඨමාලාව සැළසුම් ඇති කිරීමේදී, ක්‍රියාවට නැංවීමේදී හා ඒවායේ සාර්ථකත්වය මැන බැලීමේදී ඔබට උපකාරී වනු ඇත :

4. ඔබ නව සභාව ආරම්භ කිරීමට සැළසුම් කරන ප්‍රදේශයේ දැනටමත් තවත් සභාවන් තිබේ නම්, තරඟකරුවකු නොවන්න. දැනට පවතින සභාවල සභාපාලකවරු වෙත යවන ලිපියකදී හෝ ඔවුන් සමඟ කරන කතා බහකදී පහත දේවල් සහතික කළ යුතුය :

> *"කරුණාකාර මට හඳුන්වා දීමට ඉඩ දෙන්න. මා (ඔබේ සභාවේ නම) සභාව නියෝජනය කරන (ඔබේ නම) ය.*
>
> *අපගේ සභාව නියෝජනය කරන්නන් ශුභාරංචිය බෙදා ගැනීම, නව ඇදහිලිවන්තයන් දිනා ගැනීම හා ප්‍රාදේශීය සභාවක් පිහිටුවීම යන අරමුණු ඇතිව ප්‍රදේශයේ ජනතාව සමඟ අනාගතයේදී සම්බන්ධත වනවා ඇත.*

*(මෙම අවස්ථාවේදී ඔබගේ අරමුණ තවදුරටත් පැහැදිලි කරන්න : නව සභාව විශේෂ පුද්ගලයන් කණ්ඩායමක් හෝ ප්‍රදේශයක් උදෙසා ද? සමාජය තුළ එය අන් ඒවාගෙන් වෙනස් කර දක්වන අරමුණ කුමක්ද?)*

*අප ප්‍රජාව සමඟ සම්බන්ධ වීමේ ක්‍රියාවලියේ දී, ඔබගේ සභාවේ ඇතැම් සාමාජිකයන් සමඟ ද සම්බන්ධතා ඇති විය හැකිය. අපගේ අරමුණ සෙසු සභාවන්ගේ සාමාජිකයන්ට තම සභාව අතහරින ලෙස බලපෑම් කිරීම නොවේය. අපගේ ආශාව ශුභාරංචිය නොඇසූ අය සමඟ එය බෙදා ගැනීම සහ ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ උදෙසා මෙම ප්‍රදේශය දිනා ගැනීමට ඔබේ සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම වේ."*

# විසි දෙවන පරිච්ඡේදය

## සභා පිහිටුවීම : ගුණනය

**අරමුණු :**

මෙම පරිච්ඡේදය අවසන් කිරීමෙන් පසු :

- ප්‍රධාන පදය මතකයෙන් ලිවීමට
- "අභ්‍යන්තර සභා වර්ධනය" විස්තර කිරීමට
- "සංඛ්‍යාත්මක සභා වර්ධනය" විස්තර කිරීමට
- " තම සංස්කෘතියේ තුළ සභා වර්ධනය" විස්තර කිරීම
- "වෙනස් සංස්කෘතියක් තුළ සභා වර්ධනය " විස්තර කිරීමට ඔබට හැකිවනු ඇත.

**ප්‍රධාන පදය :**

> **මුළු ශරීරයට පුරුක් සහ නහර කරණකොටගෙන උපකාර කොට, එය සම්බන්ධකර දෙවියන්වහන්සේගේ වර්ධනයෙන් වර්ධනය කරන්නාවූ හිසට නොබැඳී සිටින්නේය. (කොලොස්සි 2:19)**

## හැඳින්වීම

නව සභාවක් පිහිටුවීමෙන් පසුව නව ගිවිසුමේ ගුණනය වීමේ ක්‍රමය අනුගමනය කරමින් සභාව වර්ධනය විය යුතුය. සභාව ස්වකීය ප්‍රජාව තුළ මෙන්ම ලෝකය තුළ ශුභාරංචිය පැතිරවීම පිළිබඳ ඉතා වැදගත් බලපෑමක් ඇති කිරීමට නම් මෙය අවශ්‍ය වන්නේය. සෑම සභාවක්ම අත්දැකිය යුතු වර්ධන වර්ග හතරක් මෙම පරිච්ඡේදයේ විස්තර කරයි. මේවා අභ්‍යන්තර, "සංඛ්‍යාත්මක, තම සංස්කෘතියේ තුළ සහ වෙනස් සංස්කෘතියක් තුළ වර්ධනයන් වේ.

## අභ්‍යන්තර වර්ධනය

අප සභාවක අභ්‍යන්තර වර්ධනය පිළිබඳව කථා කරන කල ඉන් අදහස් කරන්නේ ආත්මික වර්ධනය හා එහි සාමාජිකයන්ගේ ගොඩනැංවීමයි. සභාව ආත්මිකව වර්ධනය වන්නේ එහි එකිනෙක සාමාජිකයන්ගේ වර්ධනය අනුවය.

පාවුලුතුමා මෙම ක්‍රියාවලිය ස්වාභාවික ශරීරයේ අභ්‍යන්තර වර්ධනය හා සන්සන්දනය කරමින් සඳහන් කළේය.

> **මුළු ශරීරයට පුරුක් සහ නහර කරණකොටගෙන උපකාරකොට, එය සම්බන්ධකර දෙවියන්වහන්සේගේ වර්ධනයෙන් වර්ධනය කරන්නාවූ හිසට නොබැඳී සිටින්නේය. (කොලොස්සි 2:19)**

"දෙවියන්වහන්සේ තුළ වැඩිවීම" ආත්මික වර්ධනයට අදාළ වෙයි. සාමාජිකයන් ආත්මිකව වර්ධනය වන කල සභාව අභ්‍යන්තර වර්ධනය අත්දකී. දෙවියන්වහන්සේ තුළ වැඩිවීමෙන් මුළු ශරීරය පෝෂණය වී වැඩි වන්නේය. ආත්මික වර්ධනය ඇදහිලිවන්තයෙකු තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය වර්ධනය වීමේදී ඇතිවන්නාවූ ආත්මික පරිණතභාවයේ වැඩිවීමකි. එය යේසුස්වහන්සේගේ දැනගැන්මෙහි වර්ධනයකි.

> **එහෙත් අපගේ ස්වාමි වූ ගැළවුම්කාරවූ, යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කරුණාවෙහිද උන්වහන්සේ දැන ගැන්මෙහි ද වර්ධනය වෙයල්ලා. (2 පේතෘස් 3:18)**

එය ක්‍රිස්තුස්වහන්සේ තුළ වර්ධනයයි:

**ප්‍රේමයෙන් යුක්තව ඇත්ත කථා කරමින්, හිසව සිටින ක්‍රිස්තුස්වහන්සේ උදෙසා සියලු දේවලදී වැඩෙන පිණිසත්ය. (එපිස 4:15)**

ආත්මික වර්ධනය යනු ආත්මාර්ථකම අඩුවීමත් ඔබ තුළ ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය වැඩිවීමත්ය.

**උන්වහන්සේ වර්ධනවෙන්ටත් මා අඩුවෙන්ටත් ඕනෑය. (යොහන් 3:30)**

කෙනෙකු ඇදහිලිවන්තයකු ලෙස ගෙවූ කාලයේ දිග අනුව ආත්මික වර්ධනය ඉබේටම පැමිණෙන්නේ නැත. එය ඇදහිලිවන්තයෙකුගේ ජීවිතයේ ක්‍රිස්තුස්වහන්සේගේ ජීවිතය වර්ධනය වීමේ ප්‍රතිඵලයකි.

ආත්මික වර්ධනයට ඇතුළත් සාක්ෂි :

1. ආත්මික දැනගැන්මේ වර්ධනයක්
2. එම ආත්මික දැනගැන්ම ජීවිතය හා සේවය සඳහා නිසිලෙස අදාළ කිරීම
3. ආත්මික දේ සඳහා ගැඹුරු ප්‍රීතියක්
4. දෙවියන්වහන්සේ සහ අන්‍යයන් උදෙසා මහත් ප්‍රේමයක්
5. ක්‍රිස්තුස්වහන්සේට සමාන ආත්මික ගුණය වර්ධනය වීම
6. අන්‍යයන් සමඟ ශුභාරංචිය බෙදාගැනීම සඳහා ආශාව හා හැකියාව වර්ධනය වීම
7. ආත්මික දීමනාවන් වර්ධනය හා බලපෑමකින් යුතුව භාවිත කිරීම

වර්ධනය ජීවිතයේ ස්වාභාවික ප්‍රතිඵලයයි. යම් සභාවක ආත්මික ජීවනය ඇත්තේ නම් අභ්‍යන්තර වර්ධනය මෙන්ම සංඛ්‍යාත්මක වර්ධනය, තම සංස්කෘතියේ තුළ වර්ධනය හා වෙනස් සංස්කෘතියක් තුළ වර්ධනය ඇතිවනු ඇත.

## සංඛ්‍යාත්මක වර්ධනය

ඇදහිලිවතුන් අලුත් අය ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනාගෙන ඔවුන් තම ප්‍රාදේශීය සභාවේ සහභාගීත්වයට ගෙනෙන කල සංඛ්‍යාත්මක වර්ධනය ඇතිවේ. මෙය ප්‍රාදේශීය සභාව සංඛ්‍යාත්මකව වර්ධනයට හේතුවෙයි. සංඛ්‍යාත්මක වර්ධනය දෙවියන්වහන්සේගේ රාජ්‍යය වර්ධනය වීම කෙරෙහි යොමු විය යුතුය. පළමු සභාවෙන් සාමාජිකත්වය මාරු කිරීම නිසා දෙවන සභාවට සාමාජිකයන් 100 දෙනෙකු එකතු වන්නේ නම් දේව රාජ්‍යයේ වර්ධනයක් ඇති නොවේ. දෙවන සභාවේ සාමාජිකත්වය 100 දෙනෙකුගෙන් වැඩිවූ නමුත් දේව රාජ්‍යයේ පැතිරීමක් සිදුවී නැත. දේව රාජ්‍යයේ වර්ධනය පෙන්නුම් කරන්නේ අලුත් අය ක්‍රිස්තුස්වහන්සේ වෙත දිනාගෙන ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරයේ වගකිව යුතු සාමාජිකයන් වන පිණිස ගෝලත්වයට ගෙන එන විට පමණි.

සංඛ්‍යාත්මක සභාවර්ධනය පිළිබඳව ක්‍රියාපොතෙහි නිදර්ශනය කර ඇත:

**මේ දවස්වලදී එකසිය විසිදෙනෙක් පමණ සෙනඟ රැස්ව සිටි කල පේත්‍රුස් සහෝදරයන් මැද නැගිට සිට කියනුයේ : (ක්‍රියා 1:15)**

උඩුමහල් මැදුරේදී සභාව ආරම්භවූයේ 120 දෙනෙකු තරම් කුඩා කණ්ඩායමකිනි. පෙන්තකොස්ත දවසේදී යෙරුසලමේ සභාවට 3000 ක් දෙනා එකතු කරන ලද්දේය.

**එකල ඔහුගේ වචනය පිළිගත් අය බව්තීස්මකරනු ලැබුවෝය. ඒ දවසේදී තුන්දාහක් පමණ මනුෂ්‍යයෝ ඔවුන්ට එකතුකරනලද්දෝය. (ක්‍රියා 2:41)**

පෙන්තකොස්තයෙන් පසුව සංඛ්‍යාත්මක සභාවර්ධනය දිනපතාම සිද්ධවිය.

**ස්වාමීන්වහන්සේ වනාහි ගැළවෙන්නාවූ අය දවස්පතා ඔවුන්ට එක්කළසේක. (ක්‍රියා 2:47)**

යෙරුසලම් සභාවේ සිටි මිනිසුන් ගණන 5000 දක්වා වර්ධනය විය. සභාවේ කොටස්කරුවන් වූ කාන්තාවෝ හා ළමයි මෙම ගණනට ඇතුළත් නොවූහ.

**නුමුත් වචනය ඇසූවන්ගෙන් බොහෝ දෙනෙක් අදහාගත්තෝය: ඒ මනුෂ්‍යයන්ගේ ගණන පන්දහසක් පමණ විය. (ක්‍රියා 4:4)**

අවසානයේදී සභාවට මහත් සමූහයක් එකතු කරන ලදී.

> **අදහාගන්නන් වන පුරුෂයන්ගෙන්ද ස්ත්‍රීන්ගෙන්ද මහත් සමූහයක් වැඩි වැඩිව ස්වාමීන්වහන්සේට එක්කරනලද්දෝය. (ක්‍රියා 5:14)**

එකතුකරන ලද්දේය යන වචනය පළමුව භාවිතා කරන ලද්දේ සභාවේ සංඛ්‍යාත්මක වර්ධනය විස්තර කිරීමටය. වර්ධනය ශීඝ්‍ර වූ විගස "අතිශයින්ම වැඩිවිය" යන වචනය භාවිත විය.

> **තවද දෙවියන්වහන්සේගේ වචනය පතළවී ගියේය: ගෝලයන්ගේ ගණන යෙරුසලමේ අතිශයින්ම වැඩිවිය: පූජකයන්ගෙන් මහත් සමූහයක්ද ඇදහිල්ලට කීකරුවූවෝය. (ක්‍රියා 6:7)**

යෙරුසලමේ ප්‍රාදේශිය සභාවේ සාමාජිකත්වය මෙන්ම සභාවන් අතිශයින්ම වැඩිවීම පිළිබඳව ක්‍රියා පොත මෙතැන් සිට අවධාරණය කරයි. එවකට පැවති ලෝකයේ මිත්‍යාදෘෂ්ටික මධ්‍යස්ථාන වල අවුරුදු 40 කටත් අඩු කාලයක දී නව සභාවක් පිහිටුවන ලදී.
උදාහරණයක් ලෙස සමාරියේදී. . .

> **නුමුත් ඔව්හු දෙවියන්වහන්සේගේ රාජ්‍යයද යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ නාමයද ගැන ශුභාරංචිය දේශනාකළාවූ පිලිප් විශ්වාසකොට, පුරුෂයෝද ස්ත්‍රීහුද බව්තිස්මකරනු ලැබූවෝය. (ක්‍රියා 8:12)**

යුදයෙහි, ගලීලයෙහි, සමාරියෙහි, ලිද්දායෙහි, ෂාරොනෙහි සහ යොප්පාවේ සභාවන් සියල්ලම සංඛ්‍යාත්මක වර්ධනය අත් දැක්කෝය.

> **මෙසේ මුළු යුදයෙහිද ගලීලයෙහිද සමාරියෙහිද සභාව දියුණුවී, සමාදානය ලැබ, ස්වාමීන්වහන්සේ කෙරෙහි භය ඇතුව හැසිරෙමින්, ශුද්ධාත්මයාණන්ගේ පිහිටවීමෙන් වර්ධනයවූවාය. (ක්‍රියා 9:31)**
>
> **ලිද්දායෙහිද ෂාරොනෙහිද විසූ සියල්ලෝ ඔහු දැක, ස්වාමීන්වහන්සේ වෙතට හැරුණෝය. එය යොප්පාව මුළුල්ලෙහි ප්‍රකාශවිය. බොහෝ දෙනෙක් ස්වාමීන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. (ක්‍රියා 9:35,42)**

අන්තියෝකියේ (ක්‍රියා 11:21; 24, 26); ඉකෝනියේ (ක්‍රියා 14:1); දර්බයේ (ක්‍රියා 14:20-21); ගලාතියේ (ක්‍රියා 16:5); පිලිප්පියේ (ක්‍රියා 16:14); තෙසලෝනිකයේ (ක්‍රියා 17:4); බෙරියේ (ක්‍රියා 17:12); සහ කොරින්තියේ (ක්‍රියා 18:8-11). පිහිටි සභාවන්හි වර්ධනයක් ඇති විය.

## සභාව වර්ධනය වූයේ:

- ආත්මික දර්ශනයෙන් (යොහන් 4:25)

- හොඳ ප්‍රතිචාරයක් ඇති ප්‍රදේශවල හා කාලයන් තුළ සේවය කිරීම: මතෙව් 10:5-6,14; ක්‍රියා 9:20-31; 16:6

- "එන්න" වෙනුවට "යන්න" ක්‍රමවේදය : සභාවට සෙනඟ එනතුරු බලා සිටිනවා වෙනුවට ඔව්හු සෙනඟ වෙතට ගියහ.

- සෑම ඇදහිලිවන්තයෙක්ම තවත් ඇදහිලිවන්තයන් ඇති කිරීමෙන්: ක්‍රියා 8:4

- සමාජ සබඳතාවන් භාවිතා කිරීම : සාමාජිකයෝ නෑයන් හා මිතුරන් දිනාගත්හ. ශුභාරංචිය ඉතා සීඝ්‍රයෙන් පැතිර ගියේ පවතින සමාජ සබඳතා වලින්මය.

- යේසුස්වහන්සේගේ ක්‍රම භාවිතා කිරීම : ක්‍රියා පොත පුරාවට මුල් සභාව යේසුස්වහන්සේ විසින් උගන්වන ලද හා ප්‍රදර්ශනය කරන ලද ක්‍රම භාවිත කළේය. ඔව්හු ශුභාරංචිය දේශනා කළෝය. වචනය ඉගැන්වූවෝය. නව ඇදහිලිවතුන් බෞතිස්ම කළෝය. එසේම නව ගෝලයන් පුහුණු කළෝය (මතෙව් 28:19-20).

- නව ගිවිසුම් කණ්ඩායම් : නව ගිවිසුමේ සංඛ්‍යාත්මක වර්ධනය සඳහා කණ්ඩායම් වැදගත්ය. පාවුලුතුමා දුරස්ථ පාසැලක දී විශේෂ කණ්ඩායමකට ඉගැන්වූයේය (ක්‍රියා 19:9). අවස්ථාව ඇතිවූ විට පාවුලුතුමා වෙන්කර ගත් යුදෙව් හා අන්‍යජාතික කණ්ඩායම්වලට ඉගැන්වූයේය. (ක්‍රියා 13:42). කුඩා කණ්ඩායම් නිවෙස්වල හමුවූහ (ක්‍රියා 12 පරිච්ඡේදය).

- සෑම නිවසක්ම ධර්ම ප්‍රචාරයේ මධ්‍යස්ථානයක් බවට පත්විය. සෑම නිවසක්ම යාච්ඤාව, දේශනාකිරීම, ඉගැන්වීම, සුවකිරීම සහ නිදහස් කිරීම සඳහා මධ්‍යස්ථානයක් විය.

- ශුද්ධාත්මයාණන්ගේ මෙහෙය :පණිවිඩය පිළිගන්නා පිණිස මිනිසුන්ට හා කාන්තාවන්ට ඔවුන්ගේ පාපය ඒත්තු ගන්වන බලය ශුද්ධාත්මයාණන්වහන්සේය. මෙමගින් නව ඇදහිලිවතුන් ඇති වන අතර සභාව සංඛ්‍යාත්මකව වර්ධනය වේ.

- ආත්මික දිමනා : මනුෂ්‍ය වර්ධනයේදී සෛල වර්ධනය දරා ගැනිම පිණිස සැකිල්ලේ වර්ධනයක් බලාපොරොත්තු වන්නේය. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය වර්ධනය වීමට සැකිල්ලක් තිබීම ඒ හා සමානවම වැදගත්ය. ගොයම නම් බොහෝය. එහෙත් ගොවියෝ ස්වල්ප දෙනෙක් යයි යේසුස්වහන්සේ පැවසූ සේක. ගොවියෝ ස්වල්ප දෙනෙකු නම්, බලපෑමකින් යුතුව අස්වැන්න නෙලීම සඳහා ඔවුන් සංවිධානය විය යුතුය.

## තම සංස්කෘතියේ තුළ සභා වර්ධනය

සභාවක් එම සංස්කෘතිය තුළම තවත් සභාවක් ආරම්භ කිරීමේදී තම සංස්කෘතියේ තුළ සභා වර්ධනය සිදුවෙයි. ස්වාභාවික ලෝකයේ දරුවකු දෙමාපියන්ගේ භෞතික ශරීරවල වැඩිකිරීමක් වන්නා සේ නව සභාව "මව්" සභාවේ වැඩිකිරීමකි. ක්‍රියා පොතේ සඳහන්වන වාර්තාවෙන් යෙරුසලමේ සභාව යුදයේ, ගලිලයේ, ලිද්දායෙහි, ෂාරොනෙහි සහ යොප්පාවේ ආරම්භ කළ සභාවන් පෙන්වා දෙයි. මේවායේ තිබුනේ සමාන යුදෙව් සංස්කෘතින්ය.

නව සභාවක් ආරම්භ කළ හැකි මාර්ග සතරක් ඇත්තේය

1. එක් සභාවක් තවත් සභාවක් ආරම්භ කිරීම

2. තවත් සභාවක් පිහිටුවීමට සභාවන් කිපයක් සහයෝගය දැක්වීම

3. සභාවන් දෙකක් හෝ වැඩිගණනක් ඇති කරන පිණිස විශාල සභාවන් බෙදා වෙන්කිරීම

4. සභාවන් ආරම්භ කරනු පිණිස එක් එක් ඇදහිලිවන්තයා ප්‍රදේශයකට යොමු කිරීම. අපෝස්තුළු දිමනාව ඇති අය මේ ආකාරයට නිතර භාවිතා වෙයි. අපෝස්තුළු පාවුල් මෙයට උදාහරණයකි. මේ පුද්ගලයා ඇතැම් විට "සභා පිහිටවන්නකු" ලෙස හඳුන්වනු ලබයි.

   මේ සෑම අවස්ථාවකදීම තම සංස්කෘතිය තුළම තවත් සභාවක් ආරම්භ කිරීමෙන් නව ඇදහිලිවතුන්ගේ කණ්ඩායමක් ඇති කරමින් ගුණනය වීමක් සිදුවෙයි.

මෙම නව සභාවන් තුන් ආකාරයක විය හැකිය.

1. විශේෂ ප්‍රජාවකට සේවය කරන සභාවන්

   මේ සභාවන් පිහිටුවා ඇත්තේ ගමක හෝ නගරයේ එක් පෙදෙසක වෙසෙන විශේෂ ජන කොටසකට සේවය කිරීමටය. ධර්ම ප්‍රචාරනය කිරීමේ ප්‍රතිඵලයක් ලෙස එම ප්‍රදේශයේ ගොඩ නැගුණු නව ඇදහිලිවතුන් විය හැකිය. මේවා පිහිටුවා ඇත්තේ ශුභාරංචිය නොඇසූ හෝ යහපත් ප්‍රතිචාරයක් ඇති ප්‍රදේශවලට සේවය කිරීම සඳහා විය හැකිය.

2. විශේෂ ජනවාර්ගික කණ්ඩායමක් සඳහා සේවය කරන සභාවන්:

   එකම සංස්කෘතියක්, පරම්පරාවක් සහ භාෂාවක් ඇති විශේෂ ජනවර්ග කණ්ඩායමකට සේවය සපයන සහභාගිත්වයන්ය. උදා "මව්" සභාවේ ඉංග්‍රිසි භාෂාවෙන් පැවැත්වෙන දේව මෙහෙයන් නොතේරෙන ස්පාඤ්ඤ භාෂාව කථා කරන සෙනඟක් වෙනුවෙන් සභාවක් පිහිටුවිය හැකිය. අනාථ

කඳුවුරුවල වෙසෙන ආසියානුවන් සඳහා හෝ ඇමෙරිකාවේ රක්ෂිතවල සිටින ඉන්දියානුවන් අනෙක් උදාහරණයන්ය.

3. විශේෂ අරමුණු සහිත සභාවන්

විශේෂ අරමුණක් උදෙසා සභාවක් පිහිටුවිය හැකිය. උදාහරණයක් ලෙස: විශේෂයෙන් ශිෂ්‍යයන්ට සේවය සලසන පිණිස පාසැලක් ආසන්නයේ සභාවක් පිහිටුවිය හැක.

## වෙනස් සංස්කෘතියක් තුළ සභා වර්ධනය

සභාවක් ජාති, භාෂාමය හා ජනවර්ග භේදයන් අභිබවා වෙනත් සංස්කෘතියක් තුළ නව සභාවක් පිහිටුවීමේදී වෙනස් සංස්කෘතියක් තුළ සභා වර්ධනයක් සිදු වෙයි. මෙම ක්‍රියාවලිය සිදුවන විට එක් සංස්කෘතියකින් තවත් සංස්කෘතියකට ශුභාරංචිය සන්නිවේදනය කිරීමට පාලමක් ඇති වේ.

නූතන ප්‍රවාහන සහ සන්නිවේදන ක්‍රම වල දියුණුව මගින් බොහෝ ඈත ප්‍රදේශවල පවා වෙනත් සංස්කෘතියක් තුළ නව සභාවක වර්ධනය සඳහා මහත් හැකියාවක් ලබා දෙන්නේය. ලෝකය පුරා ශුභාරංචිය පැතිරවීම සඳහා මෙම ක්‍රමය ස්වාමිවූ යේසුස්වහන්සේගේ සැලැස්මෙහි කොටසකි. ගෝලයන් ඔවුන්ගේ සාක්ෂි දැරීම යෙරුසලමේ පැවති ඔවුන්ගේම සංස්කෘතියෙන් ආරම්භ කොට සමාන සංස්කෘතියක් ඇති අනෙක් පළාත් වලට පතුරවමින් නව සභා පිහිටු විය යුතුවිය. ඉන්පසුව ගෝලයන් ජාතික, භාෂාමය සහ කුල පරතරයන් අභිබවා නව සංස්කෘතියෙන් වෙනස්වූ සමාරිය සහ "පොළොවේ සීමාවන් දක්වා" ප්‍රදේශ වෙත පාලම් ඇති කළ යුතුව තිබිණි (ක්‍රියා 1:8). ගෝලයන් තමන්ගේ සංස්කෘතිය තුළ "අතිශයින් වැඩි වීම" සඳහා වූ ආඥාව ඉක්මනින් ඉටු කළෝය (ක්‍රියා 2). පීඩාවේ ප්‍රතිඵලයක් ලෙස සමාන සංස්කෘතීන් ඇති අනෙක් පළාත් වලට පැතිරීම සිදුවිය.

> **. . . ඒ දවසේදී යෙරුසලමෙහිවූ සභාවට විරුද්ධව මහත් පීඩාවක් අටගත්තේය: එවිට ප්‍රේරිතයන් හැර ඔවුන් සියල්ලෝ යුදයේද සමාරියේද පළාත්වල විසුරුවනු ලැබුවෝය. සමාරියයන් දෙවියන්වහන්සේගේ වචනය පිළිගත් බව යෙරුසලමේ සිටියාවූ ප්‍රේරිතයෝ අසා, පේත්‍රුස් සහ යොහන් ඔවුන් ළඟට යැවුවෝය. . . . . (ක්‍රියා 8:1,14)**

ක්‍රියා 8 හි සඳහන් වන සමාරියේ ඇති වූ පිබිදීමෙන් පළමුව සංස්කෘතික පරතරය බිඳ හෙළමින් පිලිප් පාලමක් ඉදිකළ බව පෙන්වයි. පේත්‍රුස් හා යොහන් එම ප්‍රදේශයේ පැවති සේවය ඉදිරියට ගෙන ගියෝය. අන්තර් සංස්කෘතික සේවයට යොමු කිරීමට එකඟවීම ප්‍රේරිත පේත්‍රුස්ට දුෂ්කර කටයුත්තක් විය. ඔහු භක්තිමත් යුදෙව්වෙකු වූ අතර පෙර යුදෙව් නොවන අනෙක් ජාතීන් සමඟ තිබුනාවූ සම්බන්ධකම් සීමා සහිතව පැවතිනි. ක්‍රියා 10 වන පරිච්ඡේදයේ සඳහන් වන ආකාරයට දර්ශනයකින් දෙවියන්වහන්සේ පේත්‍රුස්ට කථා කළ අතර කායිසරියේ සිටි විජාතිකයන් වෙත ශුභාරංචිය ගෙන ගියේය. වෙනත් සංස්කෘතියක් තුළ වර්ධනය පිළිබඳ නවගිවිසුමේ ඇති හොඳම නිදර්ශනය වන්නේ ප්‍රේරිත පාවුලුගේ සේවයයි. දෙවියන්වහන්සේ විශේෂයෙන් පාවුලුතුමා මේ සේවයට කැඳවූ සේක. පාවුලුතුමා යුදෙව්වකු වූ අතර දෙවියන්වහන්සේ ඔහුට කිවේ,

> **. . . ඔහු මාගේ නාමය අන්‍යජාතීන්ද රජුන්ද ඉශ්‍රායෙල් පුත්‍රයන් ද ඉදිරියට ගෙනයන්ට මා විසින් තෝරා ගන්නා ලද භාජනයක්ය. (ක්‍රියා 9:15).**

## සභා පිහිටුවීම සඳහා ප්‍රමුඛතාවන්

ධර්ම ප්‍රචාරණය සඳහා වන ප්‍රමුඛතාවන් පිළිබඳව ඔබ කලින් ඉගෙන ගත්තේය. සභා පිහිටුවීම සඳහා වන ප්‍රමුඛතාවන් ද ඊට සමානවේ. නව ගිවිසුමේ වාර්තා වන අයුරින් තම සංස්කෘතියේ තුළ සභාවන් ආරම්භ කිරීමේදී ශුභාරංචිය නොඇසූ, යහපත් ප්‍රතිචාරයක් ඇති ප්‍රදේශ හා නගර වෙත මුල් තැන දිය යුතු අතර ඉන්පසුව ඈත ප්‍රදේශවලට යා යුතුය.

# ස්වයං පරීක්ෂණය

1. ප්‍රධාන පදය මතකයෙන් ලියන්න.

2. සභාවේ "අභ්‍යන්තර වර්ධනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

3. සභාවක " සංඛ්‍යාත්මක වර්ධනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

4. සභාවක "තම සංස්කෘතියේ තුළ වර්ධනය" යනු කුමක්ද?

5. සභාවක "වෙනත් සංස්කෘතියක් තුළ වර්ධනය" යන්නෙන් අදහස් කරන්නේ කුමක්ද?

(ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු මෙම අත්පොතේ අවසාන පරිච්ඡේදයට පසුව සපයා ඇත.)

# තවදුරටත් අධ්‍යයනය සඳහා

1. අභ්‍යන්තර, සංඛ්‍යාත්මක , තම සංස්කෘතියේ තුළ හා වෙනස් සංස්කෘතියක් තුළ සභා වර්ධනය පිළිබඳව වැඩිදුර අධ්‍යයනය සඳහා හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනය ඉදිරිපත් කරන "*ගුණනය ක්‍රමවේදයන්*" නමැති පාඨමාලාව ලබාගන්න.

2. නිසි ලෙස පරිණත වීමට අලුතින් පිහිටු වන ලද සෑම සභාවක්ම,

## එහි අරමුණු හා පරමාර්ථයත් අවබෝධ කර ගත යුතුය:

සභාව තුළ ආරම්භ කළ සෑම වැඩ සටහනක් හෝ කණ්ඩායමක් අරමුණු හා පරමාර්ථ සමඟ එකඟතාවයකින් පැවතිය යුතුය. හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"අරමුණු මඟින් කළමනාකරණය "* නමැති පාඨමාලාවෙන් මෙය විස්තරාත්මකව පැහැදිලි කරන්නේය.

## සංවිධානයවීමේ බයිබලීය ප්‍රතිපත්ති අවබෝධ කර ගැනීම

ආත්මික දීමනා, හා තනතුරු හා තම දීමනා භාවිත කිරීමට නව ඇදහිලිවතුන් පුහුණු කිරීම මෙයට ඇතුළත්ය. *"බයිබලීය කළමනාකරණය ප්‍රතිපත්ති"* සහ " *"අරමුණු මඟින් කළමනාකරණය "* නමැති පාඨමාලාවන් මෙය ඉටු කිරීමේදී ඔබට උපකාර කරන්නේය.

## නායකත්වය සඳහා වන බයිබලීය සුදුසුකම් අවබෝධ කර ගැනීම

හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ *"බයිබලීය කළමනාකරණය ප්‍රතිපත්ති"* නමැති පාඨමාලාව මෙය විස්තර සහිතව පැහැදිලි කරන්නේය.

## ඇදහිල්ලේ පදනම් පිළිබඳව උගන්වනු ලැබීම

මෙම ඉලක්කයන් සපුරාලීමට හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයේ "නියෝජනය" මොඩියුලයේ පාඨමාලාවන් ඔබට උපකාර කරන්නේය.

## ප්‍රයෝගික ප්‍රශ්න විසඳීම

මෙයට පහත කාරණා ඇතුළත්ය

- දේවධර්ම ප්‍රකාශනයක් ක්‍රමවත්ව සැකසීමෙන් අමුත්තන් සභාවේ බයිබලීය විශ්වාසයන් දැනගනු ඇත.
- නව සභාවන් සඳහා රජය විසින් අපේක්ෂා කරන නීතිමය කරුණු
- නායකයන්, නිලධාරීන් සහ සභාවේ මූල්‍ය පිළිවෙත ඇතුළත් සභාවේ සංවිධානය
- සභාවේ දේපලවල පිහිටීම සහ අයිතිය
- නව සභාව සමඟ "මව්" සභාවේ සම්බන්ධතාව.

# උප ග්‍රන්ථ

## අවසාන වචනයක්

හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයට ඇතුළු වී ඇති අය උදෙසා........

ඔබ හාවස්ටයිම් ජාත්‍යන්තර ආයතනයට ඇතුලත්ව,සම්පූර්ණ පාඨම් මාලාවම හදාරන්නේ නම්, අනිවාර්ය පාඨමාලා පුහුණුවේ අවසාන මොඩියුලයේ, අවසාන පාඨමාලාව මෙය වේ. හාවස්ටයිම් පුහුණුව තුලින් දැනුම් සහ අත්දැකීම් සම්භාරයක් රැස්කර ගෙන තිබෙන අතර එය නිසි ලෙස යොදාගනු ලැබුවහොත් ඔබගේ ජාතියට ශුභාරංචිය ගෙන යාමට එය ඔබට හැකියාව ලබා දෙනු ඇත.

යමක් ලබා ගැනීමට වඩා එය පවත්වාගෙන යාම අසීරු බව හැම විටම මතක තබා ගන්න. යමක් ලබා ගැනීම යනු යමක් "හිමිකර" ගැනීමකි. "පවත්වාගෙන යාම" යනු එය තබා ගෙන පාවිච්චි කිරීමය. පවත්වාගෙන යාම ජීවිතයේ ඕනෑම දෙයක කේන්ද්‍රගත කරුණ වේ. වඩා වැදගත් වනුයේ ඔබ ලබා ගන්නා දේවල් නොව ඔබ පවත්වාගන්නා දේවල්ය. උදාහරණයක් ලෙස, ස්වාමීන්වහන්සේ ඔබගේ ගැළවුම්කරු ලෙස පිළිගැනීම පමණක් ප්‍රමාණවත් නොවන අතර, සදාකාලික ඉරණම සහතික කර ගැනීම සඳහා ඔබ උන්වහන්සේ තුළ පැවතිය යුතුය.

ලූක් 19:12-26 හි සඳහන් යේසුස්වහන්සේ විසින් පවසන ලද උපමාවකින් පවත්වාගෙන යාම පිළිබඳව බයිබලය කතා කරයි. ඔබගේ බයිබලයෙන් මෙම කොටස කියවන්න. තමාට ලැබුණු මුදල් පාවිච්චි කර වර්ධනය කළ දාසයින්ට තවත් මුදල් ලැබුණු ආකාරය ඔබට දැකගත හැකිය. තමාට ලැබුණු දෙයින් කිසිවක් නොකළ පුද්ගලයාට එය අහිමි විය. ඔබට ලැබුණු දේ ඔබ විසින් පාවිච්චි කළ හොත් එය වැඩි වන බව මෙම කතාන්දරයෙන් දැක්වේ. එය පාවිච්චි කළ යුතුය. නැතිනම් නැති වේ :

> **ඇත්තාවූ සියල්ලන්ට දෙනු ලැබේ: නැති අයගෙන් ඔහුට ඇති දේත් පැහැරගනු ලැබේයයි නුඹලාට කියමි. (ලූක් 19:26)**

හාවස්ටයිම් ආයතනයේ ලබා දෙන පුහුණුවේ අරමුණ ඔබට ඉතා ඉහළ මට්ටමේ ආත්මික අත්දැකීම් ලබා දී නැවත ඔබ සිටි තැනටම යැවීම නොවේ. මෙහිදී ලබා ගන්නා අත්දැකීම්, මෝසෙස් සීනයි කන්දේ දී ලැබූ ඒවා මෙන්, ඔබ සිටින ස්ථානයේ ජීවත් වීමට ඔබව සූදානම් කිරීම උදෙසා වේ.

හාවස්ටයිම් පුහුණුවේදී ඔබ ලබා ගත් දේවල් පවත්වාගෙන යාමට නම්, ඔබ එය ඔබගේ දෛනික ජීවිතය වෙත හා සේවය වෙත ගෙන ගොස් පාවිච්චි කළ යුතුය. දේව වචනය අධ්‍යයනය කිරීම හා යාච්ඤා කිරීම ඔබ දිගටම කරගෙන යා යුතුය. ඔබ ඉගෙනගත් ආත්මික අස්වැන්නේ උපක්‍රම ඔබ අදාළ කර ගත යුතු අතර ඇදහිල්ලේ පදනම, දේව රාජ්‍යයේ ජීවත් වන ආකාරය, දෙවියන්වහන්සේගේ හඬ දැන ගන්නා ආකාරය හා ආත්මික සටනේදී යොදාගන්නා ප්‍රතිපත්ති ඔබ භාවිත කර අන්‍යයන් වෙතට යා යුතුය.

ආත්මික අස්වැන්නේ සේවකයන් මද බැවින්, ඔබ නොකඩවා බලය ප්‍රදර්ශනය කිරීමත් සමඟ ශුභාරංචිය ඉගැන්වීම හා දේශනා කිරීම සිදු කළ යුතුය. අන් අයට තම ආත්මික දීමනා සොයා ගැනීමට ඔබ මඟපෙන්විය යුතුය. නැවත ඵල දරන කිතුනුවන් වීමට ඔවුන්ට අභියෝග කරමින් බලයේ ප්‍රතිපත්ති ඔවුන් සමඟ බෙදා ගන්න. ලෝකයේ ජාතීන් නමැති ආත්මික අස්වැන්න නෙළා ගැනීම උදෙසා ආත්මික සම්පත් වැඩි කිරීම, සංවිධානය කිරීම හා ක්‍රියාවෙහි යෙදවීම ඔබ විසින් කිසිදාක නතර නොකළ යුතුය.

"වැඩිපුර දෙන ලද්දා ගෙන්, වැඩිපුර බලාපොරොත්තු වේ" යනුවෙන් බයිබලය උගන්වයි. හාවස්ටයිම් පුහුණුව තුළින් අප ඔබේ දෑත් වලට බොහෝ දේ බාර දී තිබේ. මෙම සම්පූර්ණ වැඩසටහනම "හැම කෙනෙක්ම එක් කෙනෙක් දිනා ගැනීමට එක්කෙනෙක්ට උගන්වන්න" යන ප්‍රතිපත්තිය මත පදනම්ව ඇති බව ඔබට වැටහෙනු ඇත. මෙම පුහුණුව ඔබට ලැබී ඇත. දැන් ඔබගේ වගකීම අන් අයට ඉගැන්විය හැකි අයට ඉගැන්වීමයි :

> **බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න. (2 තිමෝති 2:2)**

ඔබ හාවස්ටයිම් පුහුණුව ආරම්භ කරන විට වැදගත් පියවරක් තැබුවේය. ඔබ ඇතුළු වූයේ නිකායකට හෝ සංවිධානයකට අයත් වැඩසටහනකට නොවේ. ඔබ ඇතුළු වූයේ "ආත්මයාණන්ගේ පාසැලටය". එය ශුද්ධාත්මයාණන්වහන්සේ ඔබගේ ආත්මයට කරන ඉගැන්වීමක් වන අතර එම ඉගැන්වීම කිසිදාක නිම නොවේ.

එබැවින්, ඔබ හාවස්ටයිම් ආයතනයේ ඔබගේ පුහුණුව අවසන් කරන විට එය අවසානයක් නොව, ආරම්භයකි. එය උපාධි ප්‍රධානයක් නොව ආරම්භයකි. ඔබ ඔබගේ ආත්මික "දෑකැත්ත" මුවහත් තබාගෙන ඇති අතර කුඹුරට ඇතුළු වීමට සූදානමින් සිටී.

ඔබගේ අධ්‍යයනයන් තුළින් ඔබ ඉගෙන ගත් ආකාරයට, අස්වැන්න නෙළන්නන් පැසුණු හා සූදානම් වූ අස්වැන්න ඇති තැනට ගමන් කරති. අස්වැන්න උදෙසා වූ මෙම කැඳවීම ඔබව ගෙන යන්නේ කොතනටදැයි දන්නේ දෙවියන්වහන්සේ පමණි. නමුත් ඔබ තනිව සේවය නොකරන බවට සහතික විය හැකිය. ඔබ එකතු වී ඇත්තේ මහත් වූ සේවක හමුදාවකටය. එහි ආරම්භය, මෙම කැඳවීම අසා ප්‍රතිචාර දැක්වූ යේසුස්වහන්සේගේ ගෝලයන් දක්වා දිවයයි :

"මා පසු පස එන්න" කැඳවීම ඇසුණි
. . . එපමණයි.
ලෝකයේ තෘප්තින් තුනී විය
මාගේ ආත්මය උන්වහන්සේ වෙතට ගියේය.
මම නැගිට පසු පස ගියෙමි.
. . . එපමණයි

මෙම කැඳවීමට ප්‍රතිචාර දැක්වීම වෙනුවෙන් ඔබ ගෙවිය යුතු මිළය කුමක්දැයි දන්නේ දෙවියන්වහන්සේ පමණි. නමුත් ඔබ සැම විටම . . .

**ක්‍රිස්තුස් යේසුස්වහන්සේගේ යහපත් භේවායෙකු මෙන් දුක් විඳීමට පංගුකාරයෙක් වෙයන්න. (2 තිමෝති 2:3)**

බව මතක තබා ගන්න.

අවසාන අරමුණට මෙහා ඇති කිසිවකින් සෑහීමකට පත් නොවන්න. සෑම මනුෂ්‍ය කණ්ඩායමකටම, සෑම ගෝත්‍රයකටම හා සෑම ජාතියකටම ශුභාරංචිය පවසන තුරු, වපුරන කාලයේ දී හා අස්වැන්න නෙළන කාලයේ දී වැපිරීමට හා අස්වැන්න නෙලීම සිදු කරන්න.

ආත්මික අස්වැන්න පිළිබඳ දර්ශනය කිසිදා අත් නොහරින්න :

*"ලෝකයේ කෙළවර දක්වා පැතිර ගිය සුදුවන් අස්වැන්න සහිත කුඹුරක් පිළිබඳ දර්ශනයක් මා ඉදිරියෙහි විය. මා බලා සිටියදීම සෑම තිරිඟු කරලක්ම මනුෂ්‍ය මුහුණක් බවට පත් වූ අතර, සෑම ඉහළට හැරුණු කොළයක්ම, ඉහළට එසවුණු අතක් බවට පත්විය.*

*දෙවියන්වහන්සේ උන්වහන්සේගේ වචනය නමැති තියුණු දෑකැත්ත මට දුන් සේක. ධාන්‍ය එකතු කිරීමට, නමුත් කිසිදාක තවත් අස්වැන්න නෙළන්නෙකු කපා දමන්නට හෝ තුවාළ කරන්නට මගේ දෑකැත්ත යොදා නොගන්නා ලෙසත්, කිසිදාක විවේචනයකට ප්‍රතිචාර නොදක්වන ලෙසත් . . . ඉදිරියේ ඇති කාර්යයන් කරන ලෙස හා එළිය ඇති විට වැඩ කරන ලෙසත් උන්වහන්සේ මට අණ කළ සේක."*

- ඇමී සෙම්පල් මැක්ෆර්සන් - ප්‍රාරම්භකයා
- ජාත්‍යාන්තර සිව් චතුරස්‍ර සභාව

# ස්වයං පරීක්ෂණ සඳහා පිළිතුරු

## පළමුවන පරිච්ඡේදය :

1. නැවතත් උන්වහන්සේ කියනසේක්: දෙවියන්වහන්සේගේ රාජ්‍යය කුමකට සමානකරම්ද? ස්ත්‍රියෙකු විසින් පිටිනැළි තුනක් සහමුලින්ම පිපෙන තෙක් එහි දමා තිබූ මුහුන්වලට එය සමානයයි කීසේක. (ලූක් 13:20-21)

2. මුහුන් වැනි වූ ධර්ම ප්‍රචාරණය යනු, පිටි පිඩක් තුළ මුහුන් ව්‍යාප්ත වන පරිදි දේව රාජ්‍යය තුළ වූ බලය නිසා දේවරාජ්‍යයේ ශුභාරංචිය ලෝකය නමැති පිටි "පිඩ" තුළ ව්‍යාප්ත වීමයි.

3. "විනාශ වූ අය පිළිබඳ නිර්වචනය" යනුවෙන් අදහස් වනුයේ, තම පාපයට පසුතැවිලි වී නොමැති සහ යොහන් 3 වන පරිච්ඡේදයේ යේසුස්වහන්සේ සඳහන් කළ ආකාරයට නැවත ඉපදීම අත්දැක නොමැති සියලු පුද්ගලයන් විනාශ වූ අය ලෙස සැළකීම වේ. එයට හේතුව දෙවියන්වහන්සේ මනුෂ්‍යයා මැවීමේදී පැවති පව් රහිත ස්වභාවය ඔවුන්ට අහිමි වී තිබීමය. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ගැළවුම්කරු ලෙස විශ්වාස නොකිරීම නිසා ඔවුන් තම පව් වලින් ගැළවීම ලබා නොමැති බැවින් අපට ඔවුන් "ගැළවීම නොලත් අය" හෝ "නොඇදහිලිවන්තයන්" ලෙස හැඳින්විය හැකිය.

4. " විනාශ වූ අයගේ ඉරණම" යනුවෙන් අදහස් වනුයේ, ගැළවීම නොලත් අය දෙවියන්වහන්සේගෙන් සදාකාලිකව වෙන්වීම නැමති ආත්මික මරණයට මුහුණ දෙන බව තේරුම් ගැනීම වේ. ඔවුන්ගේ ඉරණම නිරයයි.

5. - හැඩහුරුකම
   - ප්‍රකාශ කිරීම
   - කැමති කරවා ගැනීම
   - පිහිටුවීම
   - සම්පූර්ණකරවීම
   - සහභාගිවීම

## දෙවන පරිච්ඡේදය :

1. එම්බා දුෂ්ටය, නුඹ නසිනවාම ඇතැයි මා විසින් දුෂ්ටයාට කී කල්හි, තමාගේ මාර්ගයෙන් හැරෙන ලෙස දුෂ්ටයාට අවවාදකිරීමට නුඹ කථා නොකර සිටියොත්, දුෂ්ටවූ ඔහු තමාගේ අයුතුකම නිසා නසිනවා ඇත. එහෙත් ඔහුගේ ලේ නුඹ අතින් අය කරන්නෙමි. (එසකියෙල් 33:8)

2. - නියෝගය
   - තත්වය
   - සැළකිල්ල
   - තරඟය
   - අවසානය

3. ධර්ම ප්‍රචාරණය සඳහා වූ ආඥාව සම්පූර්ණ කිරීමට අවශ්‍ය කරුණු තුන නම් :

   - ඊට ප්‍රමුඛත්වය දිය යුතුය
   - එය ශුද්ධාත්මයාණන් තුළින් බල ගැන්විය යුතුය
   - එය නව ගිවිසුමේ රටාවන් අනුගමනය කළ යුතුය

## තුන්වන පරිච්ඡේදය :

1. ඉතින් මාත් ලබාගත් දේ සියල්ලට පළමුවෙන් නුඹලාට භාරදුනිමි, එනම්, ලියවිලිවල ප්‍රකාරයට අපේ පව් නිසා ක්‍රිස්තුස්වහන්සේ මැරුණු බවත්, උන්වහන්සේ තැන්පත්කරනු ලැබූ බවත්, ලියවිලිවල ප්‍රකාරයට තුන්වෙනිදා උන්වහන්සේ නැගිටුවනු ලැබූ බවත්,
(1 කොරින්ති 15:3-4)

2. "ශුභාරංචිය" නමැති වචනයේ සැබෑ අදහස "යහපත් ආරංචිය" යන්නයි. බයිබලීය කෝණයකින් අප ශුභාරංචිය ගැන කතා කරන විට, ඉන් අදහස් වන්නේ දේව රාජ්‍යයේ ශුභාරංචිය හා යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් වූ ගැළවීමයි.

3. ශුභාරංචියේ මූලිකාංග නම්, ශුද්ධ ලියවිල්ල අනුව අපගේ පව් උදෙසා ක්‍රිස්තුස්වහන්සේ මරුණු බවත්, උන්වහන්සේව තැන්පත් කරනු ලැබූ බව සහ ශුද්ධ ලියවිල්ලට අනුව උන්වහන්සේ නැවත නැඟිටුනු බවත්ය. ඉතාම පටු ලෙස බැලූ විට, යොහන් 3:16 හි සඳහන් පණිවුඩයෙන් ශුභාරංචිය සාරාංශ කර දැක්විය හැකිය. ඉතාම පුළුල් ලෙස බැලූ විට, යේසුස්වහන්සේ තම ගෝලයන්ට ඉගැන් වූ සියලුම දේවල් ඒ තුළ ඇතුළත් වේ.

4. (1) පාපය විශ්වීය වේ : රෝම 3:23
(2) ගැළවීම උදෙසා වූ අවස්ථාව විශ්වීය වේ : 1 තිමෝති 2:4
(3) පසුතැවිලි වීම උදෙසා වූ ආඥාව විශ්වීය වේ : ක්‍රියා 17:30
(4) අදහාගැනීම උදෙසා වූ ආරාධනය විශ්වීය වේ : රෝම 10:9-11

5. ශුභාරංචිය බලවත් වනුයේ පහත කරුණු හේතුවෙනි :

- එය දෙවියන්වහන්සේගේ බලය මනුෂ්‍යයාට එළිදරව් කිරීමකි.
- ජාතිය, වර්ණය හෝ ආගම නොසළකා හරිමින් එය සියලු මිනිස්සුන්ට ගැළවීම ගෙනදේ.
- දෙවියන්වහන්සේ මනුෂ්‍යයන් ගැන දැන ගත යුතු දේ එමඟින් එළිදරව් කරයි.
- පාපයට එරෙහි දෙවියන්වහන්සේගේ විනිශ්චය හා උදහස එළිදරව් කරයි.
- එය දෙවියන්වහන්සේගේ ධර්මිෂ්ඨකම එළිදරව් කරයි.
- ඇදහිල්ලෙන් ධර්මිෂ්ඨ වන ආකාරය එමඟින් පෙන්වා දේ (සමාව ලැබීම, දෙවියන්වහන්සේ සමඟ නිවැරදි සම්බන්ධතාවයෙහි නැවත පිහිටුවීම)
- අප ජීවත් වන ඇදහිල්ලේ පදනම එයයි.

## හතර වන පරිච්ඡේදය :

1. මක්නිසාද මම ශුභාරංචිය ගැන ලජ්ජා නොවෙමි. අදහන්නාවූ සියල්ලන්ටම, එනම් පළමුකොට යුදෙව්වාටද එසේම ග්‍රීකයාටද, ගැළවීම පිණිස එය දෙවියන්වහන්සේගේ බලයව තිබෙන නිසාය (රෝම 1:16).

2. ඔබගේ පිළිතුර හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

3. ඔබගේ පිළිතුර හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

4. ඔබගේ පිළිතුර හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

5. ඔබගේ පිළිතුර හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

6. ඔබගේ පිළිතුර හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

7. ඔබගේ පිළිතුර හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

8. සාක්ෂි දැරීම යනු ඔබ දුටු, ඇසූ හෝ අත්දුටු දේ පැවසීමයි. උසාවයකදී සාක්ෂිකරුවකු යනු යම් කෙනෙකු හෝ යම් දෙයක් පිළිබඳව පවසන කෙනෙකි. සාක්ෂිකරුවන් ලෙස, අප

යේසුස්වහන්සේ ගැන හා සියලු මනුෂ්‍ය වර්ගයාට ගැළවීම ගෙන දීමට උන්වහන්සේට ඇති සැළැස්ම ගැන සාක්ෂි දැරිය යුතුය.

9. "ගිහියන්" යන වචනයේ අර්ථය "දෙවියන්වහන්සේගේ තෝරාගත් පිරිසට අයිති" යන්නයි. මෙම වචනයේ මූලික අර්ථය "දෙවියන්වහන්සේගේ සියලු සෙනග" යන්නයි. "ගිහියන්" යන වචනය භාවිතයට පැමිණියේ සභාවේ විශේෂ සම්පූර්ණ කාලීන සේවයක් නොකරන අය හැඳින්වීම සඳහාය.

10. "පූජක" යන වචනය වෘත්තිය දේව සේවකයන් හඳුනාගැනීම සඳහා භාවිත විය. පූජක පක්ෂය යනුවෙන් හැඳින්වෙන්නේ තම සේවය වෘත්තිය ලෙස කරගෙන යන සහ සාමාන්‍යයෙන් සභාවේ සම්පූර්ණකාලීනව සේවය කරන අය හැඳින්වීම උදෙසාය.

11. ගිහිබවේ කැඳවීම යනුවෙන් අදහස් වනුයේ, සෑම ඇදහිලිවන්තයෙකුටම පූජකයෙකු වීමට ඇති වගකීම හා නොඇදහිලිවන්තයන් උදෙසා ශුභාරංචි සේවකයකු වීමට ඇති වගකීම වේ.

## පස්වන පරිච්ඡේදය :

1. නුඹ තුළ පවතින සියලු යහපත් දේ ගැන දැනගැනීමෙන් නුඹේ ඇදහිල්ලේ හවුල්කාරකම ක්‍රිස්තුස්වහන්සේ උදෙසා බලවත්වන පිණිස, මාගේ යාච්ඤාවලදී නුඹ ගැන මතක්කරමින් නිතරම මාගේ දෙවියන්වහන්සේට ස්තුතිකරමි (පිලමොන් 5,6).

2. ධර්ම ප්‍රචාරණ සන්නිවේදනය තුළ පහත දේවල් ඇතුළත් විය යුතුය :

   - මානුෂික හා දිව්‍යමය අංග ඇතුළත් විය යුතුය.
   - සියලුම පංතිවල මිනිසුන් උදෙසා විය යුතුය.
   - කණ්ඩායම් හා තනි පුද්ගලයන් අතර සමබරතාව රැක ගත යුතුය.
   - සංස්කෘතිකමය පසුබිම හඳුනාගන්න.
   - වචන වල සීමාවෙන් එපිටට යන්න..
   - ඔබගේ ජීවන රටාවට අනුකූල විය යුතුය.

3. ක්‍රියා 26:18

## හයවන පරිච්ඡේදය :

1. බොහෝ සාක්ෂිකාරයන් ඉදිරියෙහි නුඹ මාගෙන් ඇසූ දේම වෙන අයටත් උගන්වන්ට සමර්ථවූ විශ්වාසවූ මනුෂ්‍යයන්ට භාරදීපන්න (2 තිමෝති 2:2).

2. දෙවියන්වහන්සේගේ සැළැස්ම ක්‍රියා 1:8 හි සාරාංශ කර දැක්වේ. ගුණනය වීමේ ක්‍රියාවලිය පිටුපස ඇති දිව්‍යමය බලවේගය ශුද්ධාත්මයාණන්ය. පණිවුඩය තුළ අන්තර්ගත විය යුතු දේ වන්නේ යේසුස්වහන්සේ වන අතර පණිවුඩය ලැබිය යුතු අය වන්නේ සමස්ත ලෝකමය. ඇදහිලිවන්තයන් ගුණනය වීමේ නියෝජිතයන් විය යුතුය. සෑම ඇදහිලිවන්තයෙකු උදෙසා දෙවියන්වහන්සේගේ ක්‍රමවේදය නම් ශුභාරංචි පණිවුඩය ගැන "සාක්ෂිදැරීම", අන් අයට ඉගැන්වීමේ හැකියාව ඇති අයට ඉගැන්වීම වේ. (2 තිමෝති 2:2).

3. ඇන්ඩෲ හා අනනියස්

4. ධර්ම ප්‍රචාරණයේදී මූලිකත්වය ලබා දිය යුතු කරුණු නම් :

   - පවතින සමාජීය ජාල
   - නිවැසියන්
   - ළඟා නොවූ පුද්ගලයන්
   - යහපත් ප්‍රතිචාර දක්වන්නාවූ අංග
   - නගර

5. බයිබලය තුළ පව්කරුවන් වර්ග හතරක් විස්තර කර තිබේ :

- තර්කාන්විත පව්කරුවන්
- ප්‍රතිසංස්කෘත පව්කරුවන්
- ආගමික පව්කරුවන්
- ප්‍රතික්ෂේප කරනු ලැබූ පව්කරුවන්

## හත්වන පරිච්ඡේදය :

1. ...ලෝකය පෙරළුවාවූ මොව්හු මෙහිත් ඇවිත් සිටිති (ක්‍රියා 17:6)

2. ඔබගේ පිළිතුරු හත්වන පරිච්ඡේදයේ සාකච්ඡාව කළ කරුණු සමඟ සසඳන්න.

3. ශුභාරංචියෙන් ඔවුන් සැබවින්ම "ලෝකය උඩුයටිකුරු කළ බව" බයිබලය පවසයි.

## අටවන පරිච්ඡේදය :

1. ඔවුන්ට දරන්ට පුළුවන් ප්‍රමාණයට මෙබඳු බොහෝ උපමාවලින් උන්වහන්සේ වචනය ඔවුන්ට කීසේක. (මාර්ක් 4:33)

2. උපමාවක් යනු ආත්මික සත්‍යයක් විස්තර කිරීමට ස්වාභාවික ලෝකයෙන් උදාහරණයක් පාවිච්චි කරන කතාන්දරයකි. "උපමාව" යන වචනයේ සබෑ අර්ථය "සැසඳීම සඳහා එක ළඟ තැබීම" යන්නයි. උපමා කතා වලදී යේසුස්වහන්සේ ස්වාභාවික උදාහරණය පාවිච්චි කළ අතර ඒවා ආත්මික සත්‍යයන් සමඟ සැසඳු සේක. උපමාවක් යනු ස්වර්ගික අර්ථයක් ඇති ලෞකික කතාන්තදරයකි.

3. ගෝලයන්ට ආත්මික මනසක් තිබූ බැවින් උපමා කතාවල ඇති ආත්මික සත්‍යයන් පිළිබඳ වැටහීම ඔවුන්ට දෙන ලද්දේය. ආත්මික මනසකින් තොර වූ අය උපමාවට සවන් දුන් නමුත් ආත්මික සත්‍යය තේරුම් ගැනීමට අසමත් විය.

4. අටවන පරිච්ඡේදයේ ඇති උපමා පිළිබඳ කරුණු බලන්න.

## නව වන පරිච්ඡේදය :

1. මා කළ සියල්ල උන්වහන්සේ මට කීසේකැයි සාක්ෂිදුන් ස්ත්‍රියගේ වචන නිසා ඒ නුවර සමාරියයන්ගෙන් බොහෝ දෙනෙක් උන්වහන්සේ කෙරෙහි අදහාගත්තෝය. (යොහන් 4:39)

2. පෞද්ගලික ධර්ම ප්‍රචාරණය යනු එහි නමින්ම කියැවෙන දේය : එනම් තනි පුද්ගලයන් සමඟ පෞද්ගලිකව ශුභාරංචිය බෙදා ගැනීමයි. එය පුද්ගලයෙක් - පුද්ගලයෙකුට, එක්කෙනෙක් - තවත් කෙනෙකුට කරන ධර්ම ප්‍රචාරණයයි.

3. පහත දේවල් තුළින් පෞද්ගලික ධර්ම ප්‍රචාරණය සිදුකළ හැකිය :

- නිහඬ සාක්ෂි දැරීම
- ශුභාරංචි පත්‍රිකා
- වාචික සාක්ෂි දැරීම

4. ඔබගේ පැහැදිලි කිරීම නව වන පරිච්ඡේදයේ ඇතුළත් කරුණු සමඟ සසඳා බලන්න.

## දහවන පරිච්ඡේදය :

1. මක්නිසාද ලෝකය මැවූ තැන් පටන් දෙවියන්වහන්සේගේ අදෘශ්‍යමාන දේ වන උන්වහන්සේගේ සදාකාලිකවූ බලය හා දෙව්කම මවනලද දේවලින් තේරුම් ගොස් පැහැදිලි ලෙස පෙනියන්නේය: එබැවින් ඔව්හු නිරුත්තරව සිටිති. (රෝම 1:20)

2. ඇතැම් අවස්ථාවලදී සාතන් මිනිසුන්ගේ මනසට ගැටලු හෝ විරෝධතා ඇතුළු කරයි. ඇතැම් පුද්ගලයන් ගෙන එන විරෝධතා ඔවුන් තුළින්ම හටගත් ඒවා නොවේ. වෙනත් අය ඒවා ඉදිරිපත් කරනු ඔවුන් අසා ඇති අතර ඔවුන් ඒවා සොරකම් කිරීම හෝ ඔබව අදාළ විෂයෙන් වෙනතකට යොමු කිරීමට උත්සාහ කිරීම සිදු කරයි සෙසු අය ඉදිරිපත් කරන විරෝධතා සැබවින්ම ක්‍රිස්තුස්වහන්සේ උදෙසා තිරණයක් ගැනීමේදී ඔවුන්ට බාධා කරන ඒවාය. ඔවුන්ට ශුභාරංචිය පිළිගැනීමට හැකි වීමට හෝ මේවා සාර්ථකව විසඳිය යුතුය.

3. සෑම මාතෘකාවක් පිළිබඳවම දහවන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ ඔබේ පිළිතුරු සසඳන්න.

## එකළොස්වන පරිච්ඡේදය :

1. ක්‍රිස්තුස්වහන්සේ විසින් මා කරණකොටගෙන කරවනලද කාරණා ගැන මිස, අන් කිසිවක් ගැන කථාකරන්ට සිතටවත් නොගතිමි. එසේම යෙරුසලම පටන් ඉල්ලූරිකය දක්වා අවට රටවල ක්‍රිස්තුස්වහන්සේගේ ශුභාරංචිය සම්පූර්ණ වශයෙන් දේශනාකළෙමි. (රෝම 15:19)

2. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණය යනු, පිටි පිඩක මුහුන් වල ක්‍රියාකාරීත්වයට සමීප අයුරින් ශුභාරංචිය ප්‍රචාරය කිරීමේ ප්‍රවේශයකි. එහි අරමුණ සම්පූර්ණ ප්‍රදේශයක්ම ආවරණය කර බලපෑමක් ඇති වන තුරු ධර්ම ප්‍රචාරණය කිරීමයි. සන්තෘප්ත ධර්ම ප්‍රචාරණයේදී, ප්‍රාදේශිය සමාජයකින් ආරම්භ කර ඔබගේ ප්‍රාන්තය හෝ පළාතත් ක්‍රමානුකූලව ඔබේ රටත් ආවරණය වන පරිදි ශුභාරංචිය ප්‍රකාශ කෙරේ.

3. ඔබගේ පිළිතුරු එකළොස්වන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

4. ඔබගේ පිළිතුරු එකළොස්වන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

5. ඔබගේ පිළිතුරු එකළොස්වන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

6. ඔබගේ පිළිතුරු එකළොස්වන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

## දොළොස්වන පරිච්ඡේදය :

1. ජාතීන් අතරෙහි බලා, කල්පනාකර, ඉතා විස්මපත්වෙයල්ලා, මක්නිසාද නුඹලාට කීවත් නුඹලා විශ්වාස නොකරන ක්‍රියාවක් නුඹලාගේ දවස්වලදී කරමි. (හබක්කුක් 1:5)

2. සාමුහික ධර්ම ප්‍රචාරණ රැස්වීමක අවුරුදු ගණනාවක් තිස්සේ දෙවියන්වහන්සේව සොයමින් සිටි මිනිසුන් වෙත ළඟා වේ. කිසිදාක සභාවකට නොයන පුද්ගලයන්ව එමඟින් ස්පර්ශ කරයි. නොඇදහිලිවන්තයන්ට දෙවියන්වහන්සේගේ බලය ප්‍රදර්ශනය කිරීමට එමඟින් අවස්ථාව ලබා දේ. එය ඉක්මනින් පුද්ගලයන් වෙත ශුභාරංචිය ගෙන යන අතර වේගයෙන් වැඩි වන ලෝක ජනගහනය වෙත ශුභාරංචිය ගෙන යාමේදී වැදගත් ක්‍රමවේදයකි. ප්‍රසිද්ධ ධර්ම ප්‍රචාරය රැස්වීම් තුළින් අස්වැන්න නෙලීමට සුදානම් ආත්මික භූමිය හඳුනා ගැනීමට උපකාරී වන අතර බොහෝ විට එහි ප්‍රතිඵලය නව සභාවන් පිහිටුවීමයි. එම ප්‍රදේශයේ දැනටමත් පවතින සභාවන් තිබේ නම්, ඔවුන්ගේ සහභාගීත්වයට නව ඇදහිලිවන්තයන් එකතු වන විට වර්ධනය අත්දැකිය හැකිය.

3. සෑම මාතෘකාවක් පිළිබඳවම දොළොස්වන පරිච්ඡේදයේ සකච්ජා කළ කරුණු සමඟ ඔබගේ පිළිතුරු සසඳන්න.

## දහතුන් වන පරිච්ඡේදය :

1. ඔහු එහි කලක් පසුකොට පිටත්ව පිළිවෙළින් ගලාතියේ සහ පිරිගියේ පළාත මැදින් ගොස් සියලු ගෝලයන් ස්ථිරකෙළේය. (ක්‍රියා 18:23)

   අප විසින් දෙවියන්වහන්සේගේ රාජ්‍යයට බොහෝ දුක් විඳිමින් ඇතුල්වෙන්ට ඕනෑයයි කියා ගෝලයන්ගේ සිත් සවිකොට, ඇදහිල්ලේ පවතින්ට ඔවුන්ට අවවාදකළෝය. (ක්‍රියා 14:22)

2. "හැරෙනු ලැබූ අය" යන වචනයෙන් අදහස් වනුයේ, ඇදහිල්ලෙන් නැවත උත්පාදනය ලැබ, දේව රාජ්‍යයේ කොටසක් බවට පත් වූ යේසුස්වහන්සේ තුළ නව ඇදහිලිවන්තයන්ය.

3. "ගෝලයකු" යනු කිතුණු ඇදහිල්ලේ මූලිකාංග මත පිහිටුවනු ලැබූ, නව ඇදහිලිවන්තයන් ඇති කිරීමට හා ඔවුන්ව ගෝලයන් කිරීමට සමත් ඇදහිලිවන්තයන්ය. "ගෝලයා" යන වචනයේ අර්ථය සිසුවා, ශිෂ්‍යයා, අනුගමනය කිරීම තුළින් ඉගෙන ගන්නා තැනැත්තා යන්නයි. එය දැනුමට වඩා වැඩි යමකි. එය කෙනෙකුගේ ජීවිත රටාව වෙනස් කරන ඉගැන්වීමකි.

4. ඉක්මනින් ගොඩනැඟිය යුතු කරුණු හය නම් :

   - ගැළවීම පිළිබඳ සහතිකය
   - ප්‍රසිද්ධියේ ක්‍රිස්තුස්වහන්සේ ගැන කියා සිටීම
   - ජලයෙන් බව්තිස්ම වීම
   - ශුද්ධාත්මයෙන් බව්තිස්ම වීම.
   - නිහඬකාලයක් ගත කිරීම වර්ධනය කිරීම
   - ප්‍රාදේශීය සභාවක කොටසක් බවට පත්වීම

5. යේසුස්වහන්සේ හා උන්වහන්සේගේ ගෝලයන් පිළිබඳ අවසානයේදී ගෝලත්වය පිළිබඳ ප්‍රතිපත්ති නවයක් ඉදිරිපත් කර තිබේ. එනම් :

   - තෝරා ගැනීම
   - සම්බන්ධතාවය
   - කැපවීම
   - දර්ශනය
   - පවරාදීම
   - උපදෙස්
   - ප්‍රදර්ශනය
   - සහභාගිත්වය
   - අධීක්ෂණය

6. ගෝලත්වයේ සැබෑ පරීක්ෂණ සිදු වනුයේ ඔබ ගෝලත්වයට පත් කළ අය සමඟ ඔබ නොසිටින විටය. ඔවුන් දිගටම විශ්වාසවන්තව හිඳිමින් ගුණනය වීමේ ක්‍රියාවලිය දිගටම කරගෙන යාමට සමත් අයට ඔවුන් උගන්වන්නේද?

## දහ හතරවන පරිච්ඡේදය :

1. ස්වාමින්වහන්සේගේ ආත්මය මා කෙරෙහිය: මක්නිසාද දිළිඳුන්ට ශුභාරංචිය දේශනාකරන්ට උන්වහන්සේ මා ආලේපකළසේක: වහලුන්ට මිදීම සහ අන්ධයන්ට පෙනීම ලැබෙන බව ප්‍රකාශකරන්ටද මඩනාලද්දවුන් නිදහස්කර හරින්ටද (ලූක් 4:18)

2. ශුභාරංචිය හා ගොඩනැඟිලි, දේපළ හා උපකරණ, මුදල් හා ඔබගේ භාරයේ සිටින ඇදහිලිවන්තයන්ගේ ආත්මික දීමනා වැනි සේවය සඳහා වූ සම්පත් පිළිබඳය. යහපත් ගබඩාකාරයකු වීමට සැළසුම් කිරීම ඔබට උපකාරී වේ. සැළසුම් කිරීම ඔබට මඟ පෙන්වයි. හොඳ තීරණ ගැනීමට උපකාරී වේ. සේවයේදී ප්‍රමුඛතාවයන් ඇති කරයි. එසේම සාර්ථකත්වය ඔබව ගණන් බැලීමෙන් ඔබව ගණන් දීමකට පොළොඹවයි. ඒ තුළින් අර්බුදකාරී අවස්ථාවන්ට ප්‍රතිචාර දක්වනු වෙනුවට ස්ථිර ලෙස කටයුතු කිරීමට ඉඩ සළසයි.

3. ඔබගේ පැහැදිලි කිරීම දහ හතරවන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

## පහළොස්වන පරිච්ඡේදය :

1. නුඹලා එක ප්‍රේමය ඇතුව, එකඟව සිට, එක කාරණයම අභිප්‍රායකරගෙන එක්සිත්ව සිටීමෙන්, මාගේ ප්‍රීතිය සම්පූර්ණකරපල්ලා. පක්ෂවාදීකමෙන්වත් නිෂ්ඵල පාරට්ටුකාරකමෙන්වත් කිසි දෙයක් නොකොට, එකිනෙකා තම තමාට වඩා වෙන කෙනෙක් උතුමැයි යටහත්කමින් සිතාවා. නුඹලා එක් එක්කෙනා තම තමාගේම කාරණා නොව අනුන්ගේ කාරණාත් බලාපල්ලා. (පිලිප්පි 2:2-4)

2. “ජාලයක්” යනු සම්පූර්ණ යමක් සෑදීම සඳහා කොටස් රැසක් එකට එක් කිරීමයි. සරලව දැක් වූ විට, පොදු ඉලක්කයන් ළඟා කර ගැනීමට, එකිනෙකාට කතා කරමින්, අදහස්, තොරතුරු හා සම්පත් බෙදා ගන්නා මිනිසුන් කණ්ඩායමකින් ජාලයක් සමන්විත වේ.

3. 1 කොරින්ති 12:4-31 කියවන්න. මෙහිදී සේවය හා මෙහෙය උදෙසා එක්සත්ව ක්‍රියා කරන දීමනා ලත් ඇදහිලිවන්තයන් ගෙන් සමන්විත කොටස් රැසකින් යුත් එක්සත් ශරීරයක් ලෙස සභාව විස්තර කර තිබේ. මෙය ජාලයක් ලෙස ක්‍රියා කිරීම සඳහා උදාහරණයකි.

4. පහළොස්වන පරිච්ඡේදයේදී සාකච්ඡා කළ කරුණු සමඟ ඔබේ පිළිතුර සසඳන්න.

5. පහළොස්වන පරිච්ඡේදයේදී සාකච්ඡා කළ කරුණු සමඟ ඔබේ පිළිතුර සසඳන්න.

6. ආත්මයෙන් එක්සත් වීම.

7. පහළොස්වන පරිච්ඡේදයේ දී ඇති පැහැදිලි කිරීම සමඟ ඔබේ පැහැදිලි කිරීම සසඳන්න.

## දහසය වන පරිච්ඡේදය :

1. අදහන්නන්ට ඇත්තාවූ ලකුණු නම්: ඔව්හු මාගේ නාමයෙන් යක්ෂයන් දුරුකරන්නෝය. අන් භාෂාවලින් කථාකරන්නෝය. සර්පයන් අල්ලාගන්නෝය, යම් මරණීය වස ජාතියක් බීවත් එයින් කිසිසේත් ඔවුන්ට අනතුරක් නොවන්නේය. ඔවුන් රෝගීන් පිට අත් තැබූ කල්හි, ඔව්හු සුවය ලබන්නෝයයි කීසේක. (මාර්ක් 16:17-18)

2. දහසය වන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ ඔබේ පැහැදිලි කිරීම සසඳන්න.

3. රෝගාබාධ වර්ග පහ නම් :

   - ආත්මික රෝගාබාධ
   - ශාරීරික රෝගාබාධ
   - හැඟීම්වල රෝගාබාධ
   - මානසික රෝගාබාධ
   - යක්ෂ ආත්ම නිසා ඇති වන තත්වයන්

4. දිව්‍යමය සුව කිරීම යනු සැබෑ වූ එකම දෙවියන්වහන්සේ තම ස්වාභාවය පැහැදිළි කරමින්, තම පොරොන්දු ඉටු කරමින්, ශරීරය, ප්‍රාණය හා ආත්මය තුළින් පුද්ගලයකු සම්පූර්ණත්වයට පත්කර සුව කිරීමෙන් ක්‍රිස්තුස්වහන්සේගේ දුක්විඳීම තුළින් තම සැපයීම අනුව ක්‍රියා කිරීමයි.

5. රෝගාබාධ වල මූලාරම්භය සාතන්ය.

6. ඔබගේ ලැයිස්තුව දහසය වන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

7. මරණය උදෙසා වූ රෝගයක් හෝ දෙවියන්වහන්සේගේ මහිමය උදෙසා වූ රෝගයක්.
8. ඔබගේ ලැයිස්තුව දහසය වන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

## දහහත් වන පරිච්ඡේදය :

1. **පොළොවෙහි ඔබගේ මාර්ගයද සියලු ජාතීන් අතරේ ඔබගේ ගැළවීමද ප්‍රකාශවෙන පිණිස දෙවියන්වහන්සේ අපට කරුණා කරනසේක්වා, ආශිර්වාදකරනසේක්වා, ස්වකීය මුහුණ අප කෙරෙහි බබළවනසේක්වා. (ගීතාවලිය 67:1,2)**

2. "විචලයයක්" යනු විවිධ ප්‍රතිඵල ගෙන දෙන්නාවූ කරුණකි.

3. ඔබගේ පිළිතුර දහ හත්වන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

4. ඔබගේ පිළිතුර දහ හත්වන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

## දහ අටවන පරිච්ඡේදය :

1. නුඹලා යමින් - ස්වර්ගරාජ්‍යය ළංවී තිබේය කියා දේශනාකරපල්ලා. රෝගීන් සුවකරපල්ලා, මළවුන් නැගුටුවාපල්ලා, කුෂ්ඨ රෝගීන් පවිත්‍රකරපල්ලා, යක්ෂයන් දුරුකරපල්ලා. නුඹලා නොමිලයේ ලැබුවහුය, නොමිලයේ දීපල්ලා. (මතෙව් 10:7-8)

2. ඔබගේ පිළිතුර දහ අටවන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

3. ඔබගේ පිළිතුර දහ අටවන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

4. ඔබගේ පිළිතුර දහ අටවන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

5. ඔබගේ පිළිතුර දහ අටවන පරිච්ඡේදයේ සාකච්ජා කළ කරුණු සමඟ සසඳන්න.

## දහනව වන පරිච්ඡේදය :

1. දෙවියන්වහන්සේ ශුද්ධාත්මයෙන්ද බලයෙන්ද නාසරිය යේසුස්වහන්සේ ආලේපකළ බවත්, දෙවියන්වහන්සේ උන්වහන්සේ සමග සිටි බැවින් උන්වහන්සේ යහපත්කම් කරමින්ද යක්ෂයා විසින් පීඩාකරනලද සියල්ලන් සුවකරමින්ද හැසුරුණු බවත්ය. (ක්‍රියා 10:38)

2. මුළා කරවන ආත්ම, අබාධ ඇති කරවන ආත්ම, අපවිත්‍ර ආත්ම

3. යක්ෂ බලවේග සමඟ ගණුදෙනු කිරීමේදී ආත්ම විමසීමේ දීමනාව ඉතා වැදගත් වේ. පුද්ගලයෙකු තුළ හෝ ඔහුට විරුද්ධව යක්ෂ ආත්මයක් ක්‍රියාත්මක වේද නොවේද යන්න හඳුනාගැනීමට එය ඔබට උපකාරී වේ. මුළා කරවන හෝ බොරුකාර ආත්ම වලින් රවටනු ලැබීම එමඟින් වළකාලයි. මෙම ආත්මික දීමනාව සහිත පුද්ගලයාට නපුරාගේ උපක්‍රම හා යක්ෂ බලවේග වල උත්සාහයන් හඳුනාගත හැකිය.

4. යක්ෂා වේශ වීම යනු, යක්ෂ ආත්ම එකක් හෝ කිහිපයක් මනුෂ්‍ය ශරීරයක වාසය කරමින් තම පීඩාව ලබන්නාගේ කැමැත්ත සම්පූර්ණයෙන් තම පාලනයට ගැනීමයි.

5. ඔබගේ ලැයිස්තුව දහනව වන පරිච්ඡේදයේ දී ඇති ලැයිස්තුව සමඟ සසඳන්න.

6. යක්ෂයා දැඩිලෙස සිතෙහි රඳවා තබා ගැනීම යනු, යක්ෂ ආත්ම, සාතන් හා ගුප්ත දේවල් පිළිබඳ ආශාවයි.

7. ඔබගේ පිළිතුර දහනව වන පරිච්ඡේදයේ සාකච්ජා කරන ලද කරුණු සමඟ සසඳන්න.

8. යක්ෂයා විසින් පිටතින් සිට පීඩා කරනු ලැබීම යනු, යක්ෂ ආත්ම මඟින් පීඩා කිරීම, විරුද්ධව සිටීම හෝ පිටතින් සිට බැඳ තැබීමය.

9. ඔබගේ ලැයිස්තුව දහනව වන පරිච්ඡේදයේ දී ඇති ලැයිස්තුව සමඟ සසඳන්න.

10. ඔබගේ සාරාංශය දහනව වන පරිච්ඡේදයේ සාකච්ඡා කළ කරුණු සමඟ සසඳන්න.

## විසිවන පරිච්ඡේදය :

1. මෙසේ නුඹලා මකිදෝනියෙහි සහ අකායෙහි සිටින සියලු ඇදහිලිවන්තයන්ට ආදර්ශවුණහුය. මක්නිසාද නුඹලා වෙතින් ස්වාමීන්වහන්සේගේ වචනයේ හඬ මකිදෝනියෙහිත් අකායෙහිත් පැතිර ගියා පමණක් නොව අප විසින් කිසිවක් කියන්ට ඕනෑ නොකරන හැටියට දෙවියන්වහන්සේ කෙරෙහි තිබෙන නුඹලාගේ ඇදහිල්ල සෑමතැනම ප්‍රකාශවිය. (1 තෙසලෝනික 1:7-8)

2. "සභාව" යන වචනය "ස්වාමීන්වහන්සේට අයත් වූ ජන සමූහයක්" හෝ "පිටතට කැඳවනු ලැබූවෝ" යනුවෙන් අදහස් කෙරේ. ක්‍රිස්තුස්වහන්සේගේ ශරීරය නම් විශාල, විශ්විය සංවිධානයේ කොටසක් වන ප්‍රාදේශිය ඇදහිලිවන්තයන්ගේ සහභාගිත්වයන් සඳහාද යොදාගෙන තිබේ.

3. සභාවේ හිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේය.

4. එහි සියලු දෙනා 1 ප්‍රේත්‍රැස් 1:5 හි "ජිවමාන ගල්" ලෙස හඳුන්වන නැවත උත්පාදනය ලද ඇදහිලිවන්තයන්ය.

5. ප්‍රේරිතයන්, අනාගතවක්තෘවරු, ශුභාරංචිය ප්‍රකාශ කරන්නන් හා ගුරුවරු (එපීස 4:11-16)

6. සභාවේ සේවය නම් :

   ධර්ම ප්‍රචාරණය : ඇදහිලිවන්තයන් ශුභාරංචිය දේශනා කිරීමෙහි හා ඉගැන්වීමෙහි, නව ඇදහිලිවන්තයන් බෞතිස්ම කිරීමෙහි, ශුද්ධාත්ම බව්තිස්මය අත්දකින පිණිස ඔවුන්ට මඟ පෙන්වීමෙහි, සුව කිරීමෙහි, නිදහස් කිරීමෙහි හා යක්ෂයන් දුරු කිරීමෙහි නිරන්තරයෙන් යෙදී සිටියහ.

   වර්ධනය කිරීම : වර්ධනය කිරීම යනු ගොඩනැඟීමයි. ඇදහිලිවන්තයන් සභාවන් පිහිටුවූයේ නව ඇදහිලිවන්තයන් ගෝලයන් බවට පත්වන තුරු ඔවුන්ට ඉගැන්වීමට හා හැඩගැස්වීමට ය.

7. තෙසලෝනිකයේ සභාව.

## විසි එක් වන පරිච්ඡේදය :

1. සියලු පරම්පරාවන් දක්වා සභාවෙහි ක්‍රිස්තුස් යේසුස්වහන්සේ තුළ සදාකාලයටම ගෞරවය වේවා. ආමෙන් (එපීස 3:21)

2. සභා පිහිටුවීමේ චක්‍රයේ පියවර දහය නම් :

   - සේවකයන්ට අණ කිරීම
   - මිනිසුන් සමඟ සම්බන්ධතා ඇති කර ගැනීම
   - ශුභාරංචිය සන්නිවේදනය කිරීම
   - ඇසූ අය හැරීම
   - ඇදහිලිවන්තයන් රැස්වීම
   - ඇදහිල්ල ස්ථිර වීම
   - නායකයන් කැපවීම
   - සභාව භාර දීම
   - සම්බන්ධතා දිගටම පැවතීම

- චක්‍රය නැවත නැවත සිදු වීම

3. අපෝස්තුළුවර පාවුල් සේවයේදී ප්‍රමුඛත්වය දුන් කරුණු හත නම්

- නගර
- වැළඳගන්නා ස්ථාන
- තමන්ගේම ජනතාව
- ළඟානොවූ ජනතාව
- පුද්ගල කණ්ඩායම්
- ප්‍රසිද්ධියේ ශුභාරංචිය ප්‍රකාශ කිරීම
- තනි පුද්ගල ගෝලත්වය

## විසි දෙවන පරිච්ඡේදය :

1. මුළු ශරීරයට පුරුක් සහ නහර කරණකොටගෙන උපකාර කොට, එය සම්බන්ධකර දෙවියන්වහන්සේගේ වර්ධනයෙන් වර්ධනය කරන්නාවූ හිසට නොබැඳී සිටින්නේය. (කොලොස්සි 2:19)

2. අභ්‍යන්තර වර්ධනය යනු එහි සාමාජිකයන්ගේ ආත්මික වර්ධනය හා සංවර්ධනයයි. සභාවේ සාමාජිකයන්ගේ වර්ධනයට සමානුපාතිකව සභාව ආත්මිකව වර්ධනය වේ.

3. පිටතට වර්ධනය වීම සිදු වනුයේ, ඇදහිලිවන්තයන් ක්‍රිස්තුස්වහන්සේ වෙතට නව ඇදහිලිවන්තයන් දිනා ගෙන තම ප්‍රාදේශීය සභාව සමඟ සහභාගිත්වයට ඔවුන් ගෙන ආ විටය. මෙහි ප්‍රතිඵලය ප්‍රාදේශීය සභාව ගණනින් වර්ධනය වීමයි.

4. ව්‍යාප්ත වීමේ වර්ධනය සිදු වනුයේ සභාව සමාන සංස්කෘතියක් තුළ තවත් සභාවක් ආරම්භ කළ විටය.